# ඉතිහාසය

## ගුරු මාර්ගෝපදේශය

(2017 සිට ක්‍රියාත්මක වේ)

# 12 ශ්‍රේණිය



සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# අ.පො.ස (උසස් පෙළ)

# ඉතිහාසය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල: info@nie.lk

ඉතිහාසය
12 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2017

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN ..............

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : nifo@nie.lk

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයක අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන්ගේ හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුශලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය**

ඩී.එච්.චන්ද්‍රිමා නිෂානි ධර්මපාල : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

**විෂය විශේෂඥ සහාය** :

| | |
|---|---|
| මහාචාර්ය හඟුරන්කෙත ධිරානන්ද හිමි | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය මාලනී ඇදගම | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය ඉන්ද්‍රාණි මුණසිංහ | කොළඹ විශ්ව විද්‍යාලය (සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය යූ.බී කරුණානන්ද | කැලණිය විශ්ව විද්‍යාලය (සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය කේ.එම්.පී කුලසේකර | කැලණිය විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය එම්. සෝමතිලක | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය පත්මසිරි කන්නන්ගර | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි | කොළඹ විශ්ව විද්‍යාලය |
| ආචාර්ය රෝහිත දසනායක | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| ආචාර්ය අනුත්තරා දේවි විද්‍යාලංකාර | කොළඹ විශ්ව විද්‍යාලය |
| කථිකාචාර්ය ආර්.එස්. සතියකුමාර් | යාපනය විශ්ව විද්‍යාලය |

**ලේඛක මණ්ඩලය (බාහිර)**

| | |
|---|---|
| එම්.ඩොනේටා කන්‍යා සොයුරිය | නි. විදුහල්පති (විශ්‍රාමික) |
| ආර්.ඩබ්.එස් දැල එදිරිවීර මිය | ගුරු සේවය I (විශ්‍රාමික) |
| ඩබ්.ඩී.කේ.ඩී පිටිගල මිය | නි.විදුහල්පති (විශ්‍රාමික) |
| නන්දා මනම්පේරි මිය | ගුරු සේවය I (විශ්‍රාමික) |
| යූ.එල්.එන් බසීර් මයා | ගුරු සේවය I (විශ්‍රාමික) |
| යූ.එල්.එම් මරික්කාර් මයා | ගුරු උපදේශක<br>කලාප අධයාපන කාර්යාලය, වත්තේගම |
| ඒ.ඉන්ද්‍රානි මිය | කරවිට මධ්‍ය මහා විද්‍යාලය |
| එච්.එම් නලින් බණ්ඩාර මයා | කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය |
| ජීවන සුරංග ගමගේ මයා | වලල්ලාවිට මහා විද්‍යාලය |
| සමන්ත පියදාස මයා | ශ්‍රී බුද්ධජයන්ති මධ්‍ය මහා විද්‍යාලය, බලංගොඩ |
| තිමති ඒකනායක මයා | ගල්නෑව මහා විද්‍යාලය |
| පී.එල්.ඒ.යූ.ජී පෙරේරා මයා | සදර්ඩෝදය පිරිවෙණ, දේවාලේගම |

**ව්‍යාපෘති කමිටුව**

ඩී.එච්.චන්ද්‍රිමා නිෂානි ධර්මපාල : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,

ඩබ්. සමන්ති ශිරෝමාලා ගුණවර්ධන කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

**භාෂා සංස්කරණය**

ශ්‍රීනාත් ගනේවත්ත මයා කජුවත්ත, ගොතටුව, අංගොඩ,

පටුන


| | | |
|---|---|---|
| අධ්‍යක්‍ෂ ජනරාල්තුමියගේ පණිවිඩය | | i |
| නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | | ii |
| විෂයමාලා කමිටුව | | iii |
| **ශ්‍රී ලංකාවේ ඉතිහාසය** | | 01-94 |
| 1.0 | ඉතිහාසය හැඳින්වීම | 02-07 |
| **2.0** | අවකාශය | 08-17 |
| 3.0 | මූලාශ්‍රය විභාගය | 18-31 |
| 4.0 | ජනාවාසවල ආරම්භය හා ව්‍යාප්තිය | 32-46 |
| 5.0 | රජරට ශිෂ්ටාචාරය (පොළොන්නරුව අවසානය දක්වා) | 47-76 |
| 6.0 | රජරට ශිෂ්ටාචාරයෙන් පසු අවධිය | 77-94 |
| **ඉන්දියාවේ ඉතිහාසය** | | 95-178 |
| 1.0 | ඉන්දිය ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය | 96-111 |
| 2.0 | භූගෝලීය පිහිටීම , භෞතික සාධක හා මානව හැසිරීම | 112-122 |
| 3.0 | ඉන්දු නදිය කේන්ද්‍ර කොට බිහිවූ නාගරික ශිෂ්ටාචාරය | 123-140 |
| 4.0 | ගංගා නිම්න ඔස්සේ පැතිර ගිය මානව ජනාවාස රටාව | 141-150 |
| 5.0 | දේශපාලන හා මානව චින්තිවලියේ වර්ධනය | 151-162 |
| 6.0 | අධිරාජ්‍යවාදී සංකල්ප හා මෞර්ය අධිරාජ්‍යය | 163-178 |
| **යුරෝපා ඉතිහාසය** | | **179-261** |
| 1.0 | නූතන යුරෝපා ශිෂ්ටාචාරයේ පදනම | 180-205 |
| 2.0 | නූතන යුරෝපයේ ආරම්භය | 206-216 |
| 3.0 | ආගමික ප්‍රතිසංස්කරණ හා ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය | 217-228 |
| 4.0 | බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය | 229-237 |
| 5.0 | කාර්මික විප්ලවය | 238-243 |
| 6.0 | අමෙරිකානු නිදහස් සටන | 244-254 |
| 7.0 | ප්‍රංශ විප්ලවය | 255-262 |
| **නූතන ලෝක ඉතිහාසය** | | **263-328** |
| 1.0 | නූතන ලෝකයේ උදාව | 264-278 |
| 2.0 | යුරෝපා බල ව්‍යාප්තිය හා අධිරාජ්‍ය ගොඩනැගීම | 279-286 |
| 3.0 | නූතන ලෝකය හැඩගැස්වූ විප්ලව | 287-304 |
| 4.0 | කාර්මික විප්ලවය | 305-310 |
| 5.0 | ලිබරල්වාදී සහ ජාතිකවාදී සංකල්පවල වර්ධනය | 311-317 |
| 6.0 | පළමුවෙනි ලෝක යුද්ධය | 318-323 |
| 7.0 | රුසියන් විප්ලවය | 324-329 |
| **ග්‍රන්ථ නාමාවලිය** | | 330-331 |



# ශ්‍රී ලංකාවේ ඉතිහාසය

# 1. ඉතිහාසය හැඳින්වීම

කවර විෂයයක් වුව ද අධ්‍යයනය කිරීමේ දී විෂයයේ ස්වභාවය, එහි අර්ථකථනයන්, එම විෂයය ඉගෙනීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන සහ විෂය හැදෑරීම කළ යුතු සීමා පිළිබඳ අවබෝධයක් ලබා ගත යුතු වේ. මෙම ඒකකය හැදෑරීමෙන් බලාපොරොත්තු වන්නේ එම අරමුණ ඉටු කර ගැනීම යි. ඒ අනුව පළමු ව විෂයය පිළිබඳ අර්ථකථන හා විෂයයේ ස්වභාවය පිළිබඳව ද පසු ව ඉතිහාසය ඉගෙනීමෙන් තම ජීවිතයට ළඟාකර ගත හැකි ප්‍රයෝජන සහ ඉතිහාසය හැදෑරිය යුතු සීමා ද පෙන්වා දී ඇත.

**නිපුණතාව** : • ඓතිහාසික හර පද්ධතීන් හා කාලානුපිළිවෙළ පිළිබඳ අධ්‍යයනය කර ඉන් ලැබෙන ශික්ෂණය ජීවිතයට ආදේශ කර ගනියි

**නිපුණතා මට්ටම:** 1.1 ඉතිහාසය යනු කුමක් දැයි පැහැදිලි කරයි

**කාලච්ඡේද** : 03 යි

**ඉගෙනුම් පල** :
- ඉතිහාසය පිළිබඳ අර්ථකථන රැස් කරයි
- ඉතිහාසය පිළිබඳ අර්ථකථනයක් ගොඩනගයි

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

**ඉතිහාසය හැඳින්වීම**
**1.1 ඉතිහාසය අර්ථකථනය**

- හිස්ට්‍රි (History) යන්න ග්‍රීක භාෂාවෙන් බිඳී ආවකි. එහි තේරුම විමර්ශනය යන්න යි. ''ඉතිහාසය යනු මිනිසාගේ අතීතය පිළිබඳ අධ්‍යයනය'' ලෙස ක්‍රිස් හර්ට්ස් (Kris Hirst") මහතා පෙන්වා දෙයි
- ඉතිහාසය යනු ජාතීන්ගේ නැගීම හා වැටීම මෙන් ම මානව වර්ගයාගේ දේශපාලන තත්ත්වය කෙරෙහි බලපෑ අනෙකුත් ශ්‍රේෂ්ඨ පරිවර්තන ද ඇතළත් වූ මානව වර්ගයා අතර සිදු වූ සිදුවීම්වල කතාන්දරය බව ජෝන් ජේ (John J) පවසයි.
- ඉතිහාසය යනු මිනිසා පිළිබඳ අධ්‍යයනයක් යැයි ආර්.ජී. කොලින්වුඩ් ප්‍රකාශ කරයි.
- මෙම අර්ථකථනයන් අනුව ඉතිහාසය විෂයය මඟින් මිනිස් සංහතියේ ආරම්භයේ සිට වර්තමානය දක්වා තොරතුරු විස්තර වේ
- විවිධ කාල වකවානු තුළ මිනිසාගේ ආගමික, දේශපාල, ආර්ථික, සමාජ හා සංස්කෘතික තොරතුරු විස්තර කිරීම මේ විෂයය මඟින් සිදු කෙරේ.
- ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යයනය කිරීම පහත දැක්වෙන යුග බෙදීම ඇසුරින් කළ හැකිය.
- ඉතිහාසය විෂයයේ ස්වභාවය අනුව එය ක්ෂේත්‍ර රාශියකින් යුත් විෂයයක් වීම
- ඉතිහාසය කාලානුරූපව ගොඩනැගෙන විෂයක් වීම
- කාලානුරූපී ව යනු සියලු සිදුවීම් ඒවා සිදු වූ කාලානුපිළිවෙළට ගොනු කිරීම යි.

  උදායරණඃ ශ්‍රී ලංකාවේ ඉතිහාසය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමානය තෙක් ක්‍රමික විකාශනය පෙන්වා දීම

ඉතිහාසය

- ප්‍රාග් ඓතිහාසික (ක්‍රි.පූ.100000-ක්‍රි.පූ. 1800)
- පූර්ව ඓතිහාසික (ක්‍රි.පූ. 1800-ක්‍රි.පූ. 600)
- ඓතිහාසික ක්‍රි.පූ. 600 - වර්තමානය
  - පැරණි ක්‍රි.පූ. 600- ක්‍රි.ව.500
  - මධ්‍යකාලීන ක්‍රි.ව.500 - ක්‍රි.ව. 1500
  - නූතන ක්‍රි.ව. 1500 - වර්තමානය

- ජී.එම්. ට්‍රෙවිලියන් නමැති ඉතිහාසඥයාගේ විග්‍රහය අනුව ඉතිහාසය යනු විෂය ගණනාවක එකතුවකි. ඒ අනුව ඔහු ඉතිහාසය විෂයය සියල්ල අඩංගු ගෘහයක් ලෙස පෙන්වා දෙයි. එනම් ආගම, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, විද්‍යාව, තාක්ෂණය, කලාව සහ නීතිය ආදි සෑම විෂය ක්ෂේත්‍රයක්ම ඉතිහාසය විෂයයේ අඩංගුව ඇත.

උදාහරණඃ

| | | |
|---|---|---|
| දේශපාලන විද්‍යාව | - | වර්තමාන දේශපාලනය අනාගතයේ ඉතිහාසය යි. |
| භූගෝල විද්‍යාව | - | ඓතිහාසික සිදුවීම් කෙරෙහි බලපෑ භූගෝලීය සාධක විස්තර කිරීම |
| විද්‍යාව හා තාක්ෂණය | - | විවිධ කාල වකවානුවල භාවිත වූ විද්‍යාව හා තාක්ෂණය මනුෂ්‍ය සභ්‍යත්වයේ වූ වෙනස්කම් ඇති කිරීමට තුඩු දුන් ආකාරය පිළිබඳ ව සාකච්ඡා කිරීම |
| ආගම | - | කවර රටක වුව ද සභ්‍යත්වයට එම රටේ ජනතාව අදහන ආගම පදනම් වන ආකාරය සහ ස්වභාව ධර්මය වන්දනා කිරීමේ සිට විවිධ ආගම් කතුවරුන් විවිධ දර්ශනවාද පදනම් කොට ගෙන දේශනා කළ ධර්මය සහ ජනතාව විසින් පිළගනු ලැබ ඒ අනුව වන්දනා මාන කිරීමට පුරුදු පුහුණු වීම ඔවුන්ගේ සභ්‍යත්වයේ වර්ධනයට බලපෑ ආකාරය විමර්ශනය කිරීම |

- මෙලෙස විවිධ විෂයයන්ට අනන්‍ය වූ මූලධර්ම හා සංකල්ප පිළිබඳ ව ගැඹුරින් කථා නොකළ ද ඉතිහාසය විෂයයට අදාළ යම් යම් කරුණු සාකච්ඡා වීම
- ඉතිහාසය යනු ඔබේ සිතිවිලි නොව ඔබේ මතකයයි. (W.C. Sellar & R.J. Yeatman)
  මෙම හැඳින්වීම මඟින් ඉතිහාසය යනු ප්‍රබන්ධයක් නොවන බවත් එය සත්‍ය වශයෙන් සිදු වූ දේ මත ගොඩ නඟනුලබන විෂයයක් බවත් අර්ථවත් වේ.

ඒ අනුව ඉතිහාසය යනු අතීතයේ සිට වර්තමානයතෙක් මිනිසා කළ කී දෑ අන්තර්ගත ඔහුගේ සභ්‍යත්වය බව ද එසේ කළ කී දෑ ඉගෙනීමේ පහසුව සඳහා ආගම, දේශපාලනය, භූගෝල විද්‍යාව ආර්ථිකය, සමාජය, සංස්කෘතිය, විද්‍යාව, තාක්ෂණය වැනි විෂය ක්ෂේත්‍රවලට ගොනු කොට ඇති බව ද ඒ සියලු ම ක්ෂේත්‍රයන්ගෙන් එකට ගත් ඓතිහාසික විකාශනයට අදාළ කොටස්වලින් ඉතිහාසය විෂය යසමන්විත වන බව ද පැහැදිලි වේ.

**ඇගයීම - 01**

- ඉතිහාසය විෂය පිළිබඳ නිර්වචනයක් ගොඩනගන්න
- ඉතිහාසය යනු කුමක්ද? උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න

**නිපුණතා මට්ටම** : 1.2. ඉතිහාසය හැදෑරීමෙන් ලැබෙන ප්‍රයෝජන පෙන්වා දෙයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :
- ඉතිහාසය හැදෑරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන විස්තර කරයි.
- ඉතිහාසය විෂය ඉගෙනීමේ වටිනාකම අගයමින් කථා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

1.2. **ඉතිහාසය හැදෑරීමේ ප්‍රයෝජන**

- තමා ජීවත් වන සමාජය පිළිබඳ මෙන්ම ලෝකය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම
  - යම් රටක, සමාජයක, ජන වර්ගයක, සංස්කෘතියක, නීතියක ආදියේ වර්තමාන තත්ත්වය නිසි ලෙස තේරුම් ගැනීමට නම් ඒවායේ කලින් පැවති තත්ත්වය අවබෝධ කරගත යුතු ය. ඉතිහාසය විෂය මගින් යමක් මුල පටන් හැදෑරීමේ මඟ සැලසීම
  - දැනුම ශීඝ්‍රයෙන් වර්ධනය වීම හේතුවෙන් වේගයෙන් වෙනස් වන සංකීර්ණ ලෝකය පිළිබඳ අවබෝධ කරගත හැකි වීම
  - තමා ජීවත් වන සමාජය මෙන්ම බාහිර ලෝකය පිළිබඳ අවබෝධයක් නොමැති වීමෙන් වැරදි තීරණ ගැනීමට පෙලඹීමෙන් වළක්වා ගැනීම
  - ඉතිහාසය නිවැරදි ව හැදෑරීමෙන් අද අප සමාජය මුහුණ පා සිටින බෙදුම්වාදය, තරුණ අසහනය වැනි ගැටලු අවම කර ගැනීමට හැකි වීම

- වර්තමානය හොඳින් අවබෝධ කර ගැනීමට හැකි වීම
  - වර්තමාන සමාජය, ලෝකය ක්‍රමික විකාශනයක ප්‍රතිඵලයකි. එනම් වර්තමානය තේරුම් ගැනීමට, අනාගතය දැකීමට එම ක්‍රමික විකාශනය අවබෝධ කරගත යුතු ය.
  - මේ නිසා ඉතිහාසය මනුෂ්‍ය සමාජයේ විකාශනයේ කේන්ද්‍රය ලෙස හඳුන්වා ඇත.

- අනාගතය හැඩ ගසාගැනීම සඳහා අතීතයෙන් ආදර්ශ ලබා ගැනීම
  - ඊ.එච්. කාර් නම් ඉතිහාසඥයා 'වර්තමානය තේරුම් ගැනීමට යතුර වශයෙන් අතීතය දැනගතයුතු බව පැහැදිලි කොට ඇත

- සමාජයේ, ලෝකයේ දේශපාලන සිද්ධි හා බලවේග අවබෝධ කර ගැනීම
  - රටේ අනාගත නායකයන්ට එය ආදර්ශයක් වනු ඇත
  - ඉතිහාසය විෂයයට අනාවැකි පළ කළ නොහැකිය. එමෙන්ම ඉතිහාසය පුනරාවර්ථනය ද නොවේ එහෙත් සමාන අවස්ථා එක හා සමාන ප්‍රශ්න ගැටලු මතුවේ.

    උදාහරණ : අතීතය පිළිබඳ හැදෑරීමේ දී විවිධ රටවල් මුහුණ දුන් යුද්ධ, එහි පසුබිම එහි ජය පරාජය, ආක්‍රමණ විප්ලව ආදි වශයෙන් අධ්‍යයනය කෙරෙයි. නැවත ප්‍රංශ විප්ලවයක් එලෙසින් ඇති නොවුණ ත් වෙනත් රටක පාලකයන්ගේ දූෂණ, වංචා, අසාධාරණකම් මත පටවනු ලබන බදු බර ආදි හේතු නිසා පාලකයන්ට විරුද්ධ ව විප්ලවයක් ඇති විය හැකි ය. එ නිසා එවැනි පසුබිම් තේරුම් ගැනීමට ඉන් සිදුවන විනාශයන් වළක්වා ගැනීමට ඉතිහාසය හැදෑරීමෙන් හැකි වනු ඇත.

- ජාතික අනන්‍යතාව හඳුනා ගැනීම පහසු වීම
- ජාතික සමගිය ගොඩනැඟීමට හා අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදු පුහුණු වීම

- මිනිස් ස්වභාවය හඳුනා ගැනීමට සහ ඒ ආශ්‍රයයෙන් තමා පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි වීම
  - ආර්.ජී. කොලින්වුඩ් නම් ඉතිහාසඥයා තම කෘතිය (Idea of History) මඟින් ප්‍රකාශ කරන්නේ ***"ඉතිහාසය කුමක් සඳහා ද? ඉතිහාසය මිනිසාගේ පෞද්ගලික අවබෝධය සඳහා යි"*** යනුවෙනි
  - ඉතිහාසය විෂයයේදී ඉහළ ම රාජතාන්ත්‍රිකයාගේ සිට සාමාන්‍ය පුරවැසියා තෙක් එනම් පාලකයින් දාර්ශනිකයන්, ආගම් කර්තෘන්, විද්‍යාඥයන්, කලාකරුවන්, සාහිත්‍ය කරුවන්, ව්‍යාපාරිකයන්, කාන්තාවන්, ගොවියන් , සාමාන්‍ය මිනිසුන් ආදි වශයෙන් සමාජයේ සෑම තරාතිරමකම පුද්ගලයන් පිළිබඳව සාකච්ඡා කරනු ලැබේ.
  - මෙහි දී ශ්‍රේෂ්ඨ චරිත මෙන් ම අයහපත් චරිත හඳුනා ගැනීමට හැකි වේ. එමෙන් ම මනුෂ්‍යයන්ගේ හැඟීම් හා අදහස් උදහස් සිතුම් - පැතුම් ආදිය පිළිබඳ ව ද අධ්‍යයනයට යොමු වේ. ඒ අනුව අන් අය පිළිබඳ ව මෙන් ම තමන් පිළිබඳ ව ද අවබෝධයක් ලබාගත හැකි වේ.

- **ඉතිහාසය වෙනස් වන තත්ත්වයන් පැහැදිලි කරන්නක් වීම**
  - ඉතිහාසය යනු නිරන්තරයෙන් වෙනස්වන පරිණාම පිළිවෙතක වාර්තාව යි. එම නිසා වෙනස්වීම්වලට හා වෙනස්කම්වලට මුහුණ දීම පිළිබඳ අවබෝධයක් එමගින් ලැබෙනු ඇත.

- **කාලය හා අවකාශය පිළිබඳ අදහස් වර්ධනය වීම**
  - ඉතිහාසය, යනු කාලය හා අවකාශය සම්බන්ධයෙන් තමාට හිමි ස්ථානය මැන බැලීමේ ස්වාභාවික ක්‍රමයකි. ඉතිහාසයේ පදනම එය යි.
  - ඉතිහාසයට අදාල කාළනිර්ණයන් මිනිස් ඉතිහාසයේ අති විශේෂ දින හා සම්බන්ධ කරගෙන ඇති බව දැනගැනීම

  උදාහරණ: – සම්බුද්ධ පරිනිර්වාණය ඇසුරින් බුද්ධ වර්ෂ ක්‍රමය ආරම්භ වීම
  – ක්‍රිස්තුන් වහන්සේගේ උපත ඇසුරින් ක්‍රිස්තු වර්ෂ ක්‍රමය ආරම්භ වීම
  – ඉන්දියාවේ ශක සහ සාතවාහන යුද්ධයේ ජය ඇසුරින් ශක වර්ෂ ක්‍රමය ආරම්භ වීම
  – නබි තුමන්ගේ මදීනා නුවර ගමන ඇසුරින් හිජ්රා වර්ෂ ක්‍රමය ආරම්භ වීම

  මෙම වර්ෂ ක්‍රම ඇසුරින් විවිධ ඓතිහාසික සද්ධි විස්තර කිරීම
  - * සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 218කට පසු අශෝක රජුගේ අභිෂේකය සිදු වීම
  - * ක්‍රිස්තුන් ස්වහන්සේගේ උපතට වසර 1815කට පසුව ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන් ම බ්‍රිතාන්‍යයන් යටතට පත්වීම

- **අවකාශය හඳුනා ගැනීම**

  අවකාශය යනු භෞතික පරිසරය යි.
  - දේශගුණය, කඳු, ගංගා, ඇළ දොළ, වර්ෂාපතනය, තැනිතලා ආදි භෞතික සාධක අවකාශයට අයත් ය.
  - රටක ඓතිහාසික සද්ධි විස්තර කිරීමේ දී ඊට අදාළ භූගෝලීය සාධක ද විස්තර වේ.

- **විවේචනාත්මක චින්තනය වර්ධනය වීම**
  - ඉතිහාසය ගොඩනැගෙන්නේ සිදුවීම් සම්බන්ධ මූලාශ්‍රය පදනම් කරගෙන ය.
  - මෙහි දී මූලාශ්‍රය කිහිපයකින් එම සිදුවීම් තහවුරු වේ. නම් ඒවා ඓතිහාසික සද්ධී ලෙස පිළිගැනේ.
  - ඉතිහාසය හදාරන්නන් ඉහත ශික්ෂණයට පුරුදු වන බැවින් ඔවුන් තුළ විමර්ශනශීලී ධාවය ඇති වේ.

**ඇගයීම - 01**

1. ඉතිහාසය විෂය හැදෑරීමෙන් ලබාගතහැකි ප්‍රයෝජන මොනවාද? පැහැදිලි කරන්න
2. ඉතිහාසය විෂයේ ස්වභාවය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න
3. 'ඉතිහාසය යනු විෂයන් සියල්ල අන්තර්ගත ගෘහයයි' මෙම ප්‍රකාශය උදාහරණ සහිතව පැහැදිලි කරන්න

**නිපුණතා මට්ටම** : 1.3. ඉතිහාසය අධ්‍යයනය කළ යුතු කාල පරාසය පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01යි.

**ඉගෙනුම් පල** :
- ඉතිහාසය සඳහා වූ අධ්‍යයන කාල පරාසය පෙන්වා දෙයි.
- ඉගෙනීමේ පහසුව සඳහා කාල පරාසය වර්ග කර දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

උසස් පෙළ ඉතිහාසය විෂයය සඳහා හැදෑරිය යුතු විෂය අන්තර්ගතය හා කාල පරාසය පිළිබඳ සරලව සිසුන් දැනුවත් කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.

1.3. අධ්‍යයන කාලය

- ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යයනය සඳහා යොමු කර ඇති කාල සීමා
  - ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ තෙක් කාල සීමාව දක්වා අධ්‍යයනය කල යුතු වීම

**ප්‍රාග් ඓතිහාසික යුගය**
- මෙය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එනම් පුරා ශිලා යුගය හා මධ්‍ය ශිලා යුගය වශයෙනි.
- පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අනුව මෙම යුගය ගොඩ නඟනු ලැබේ.

**පූර්ව ඓතිහාසික යුගය**
- ප්‍රාග් හා ඓතිහාසික යුග අතර කාල සීමාව පූර්ව ඓතිහාසික යුගය වශයෙන් හැඳින්වීම
- ක්‍රි.පූ. 5000 පමණ සිට මේ යුගයට අදාළ ලක්ෂණ පහළ වීම
- ස්ථිර ජනාවාස, මැටි වළං නිපදවීම, යකඩ තාක්ෂණය, සත්ත්ව පාලනය විශේෂ ලක්ෂණ විය
- බොහෝ දුරට පුරාවිද්‍යාත්මක සාධක මත මෙම යුගය ගොඩනැගීම

**ඓතිහාසික යුගය**
- ක්‍රි.පූ. 600 සිට මෙම යුගය ආරම්භ වීම
- පුරාවිද්‍යාත්මක හා සාහිත්‍ය මූලාශ්‍ර මඟින් මෙය විස්තර කිරීම
- ඓතිහාසික යුගය ප්‍රධාන අවධි කිහිපයකට බෙදීම
  - දේශීය රාජාණ්ඩු යුගය
  - අපරදිග ජාතීන් යටතේ පැවැති යුගය
  - නිදහසින් පසු ශ්‍රී ලංකාව ආදි වශයෙනි.

- මෙම යුගවලට අදාළ දේශපාලන, සමාජ, ආර්ථික, හා සංස්කෘතික තොරතුරු අවධානයට යොමු කර ඇති බව සිසුන්ට දන්වන්න. ඒ අනුව ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට දහසයවෙනි සියවස දක්වා 12 ශ්‍රේණියටත්, දහසයවෙනි සියවසේ සිට 1978 දක්වා 13 ශ්‍රේණියේදීත් අධ්‍යයනය සඳහා යොමු කර ඇත.

## 2. අවකාශය

අවකාශය යනු භෞතික පිහිටීම හා දේශගුණික සාධක වේ. රටක ඉතිහාසය තීරණය වීමේ දී අවකාශය බෙහෙවින් ම බලපාන සාධකයකි. රටේ අභ්‍යන්තර හා බාහිර පිහිටීම, භූ විෂමතාව මෙන් ම දේශගුණික සාධක ද ඊට අයත් වේ. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගො නැඟීමේ දී අවකාශයේ බලපෑම මෙම ඒකකයේ දී අධ්‍යනය සඳහා යොමු කර ඇත.

**නිපුණතාව** : • රටක ඉතිහාසය ගොඩනැඟීමේ දී භෞතික සාධක බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි

**නිපුණතා මට්ටම** : 2.1. දේශගුණය ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය විස්තර කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 07 යි

**ඉගෙනුම් පල** :
- ඉන්දියන් සාගරයේ ශ්‍රී ලංකාවේ පිහිටීම පැහැදිලි කරයි
- ශ්‍රී ලංකාවේ ඉතිහාසයට භූගෝලීය පිහිටීම බලපෑ ආකාරය විස්තර කරයි
- ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර භූගෝලීය පිහිටීම සිතියමක ලකුණු කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

### 2. අවකාශය

#### 2.1 ශ්‍රී ලංකාවේ භූගෝලීය සාධක

- බාහිර පිහිටීම
  - ඉන්දියාවට ආසන්න ව පිහිටීම
  - ඉන්දායාවෙන් වෙන් ව දූපතක් වශයෙන් පිහිටීම
  - ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටීම

- අභ්‍යන්තර පිහිටීම
  - තැනිතලා
  - ගංගා හා ගංගා නිම්න
  - මධ්‍ය කඳුකරය
  - කලපු සහ වරායවල්
- භූගෝලීය සාධක ඉතිහාසය කෙරෙහි ඇති කළ බලපෑම
  අක්ෂාංශ 5.55 ක් 9.51 හා දේශාංශ 79.42 ක් 81.52 අතර පිහිටි නිවර්තන කලාපීය එකට රටක් වීම.

- ඉන්දියාවට ආසන්නයේ පිහිටීම නිසා ඇති වූ බලපෑම
  - ඉන්දියානු ජන කණ්ඩායම් පැමිණීම හා ජනාවාස පිහිටුවීම
  - වරින් වර එල්ල වූ සංක්‍රමණ හා ආක්‍රමණ
  - දේශපාලන හා සංස්කෘතික බලපෑම
  - ආධාර සේනා ලබා ගැනීම
  - ඉන්දියාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍ය ආරක්ෂා කර ගැනීම ශ්‍රී ලංකාවේ වරායයන් යටතට ගැනීමේ අවශ්‍යතාව

- **ඉන්දියාවෙන් වෙන් ව දූපතක් වශයෙන් පිහිටීම**

  - ස්වාධීන රාජ්‍යක් ලෙස වර්ධනය වීම
  - ශ්‍රී ලංකාවට ම ආවේණික වූ සභ්‍යත්වයක් බිහිවීම හා වර්ධනය වීම
  - ඉන්දියාවට එල්ල වූ ඇතැම් ආක්‍රමණ හා දේශපාලන බලපෑම එක එල්ලේ ලංකාවට බලනොපෑම
  - ථේරවාද බුදු දහම රාජ්‍ය ආගම බවට පත්වීම හා ආරක්ෂා වීම

- **ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටීම**

  - විවිධ ජන කණ්ඩායම් සංක්‍රමණය වීම
    උදාහරණ : ආර්ය, ද්‍රවිඩ, මුස්ලිම්,
  - වාණිජ මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය වීම හා වාණිජ කටයුතු පුළුල් වීම
  - ඇතැම් වෙළෙඳුන් මෙරට දේශපාලන බලය අල්ලා ගැනීම
    උදාහරණ : සේන ගුත්තික ආක්‍රමණය, එළාර ආක්‍රමණය
  - විවිධ රටවල දේශාටකයන්ගේ ආගමනය
    උදාහරණ : පාහියන් හිමි, ඉබන් බතුතා
  - වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීමට පෘතුගීසි හා ලන්දේසීන් පැමිණීම
  - බ්‍රිතාන්‍යන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු වීම

**අභ්‍යන්තර භූගෝලීය පිහිටීම**

- තැනිතලා

  - ජනාවාස බිහිවීම හා ව්‍යාප්තිය
  - උතුරු නැගෙනහිර තැනිතලාව කේන්ද්‍ර කරගත් රාජධානි
  - වාරි ශිෂ්ටාචාරයේ අභිවෘද්ධියට පදනම වැටීම

- **ගංගා හා ගංගා නිම්න**

  - ලංකාවේ ජලවහන පද්ධතිය අරිය රටාවක් ගැනීම
  - ජනාවාස බිහිවීම හා ව්‍යාප්ත වීම
    උදාහරණ : මල්වතු ඔය - අනුරාධගාම
    කලා ඔය - උරුවේල ගාම
    ගල් ඔය - දීඝ ගාම
  - දේශ සීමා ලෙස ගංගා භාවිත කිරීම
    උදාහරණ : කලා ඔය හා මහවැලි ගඟ රජරට දේශ සීමාව වීම
  - ප්‍රවාහණ මාර්ග ගංගා ඔස්සේ වැටී තිබීම
    උදාහරණ : මාගම සිට රජරට තෙක් වැටී තිබූ මාර්ගය මහවැලි ගඟ ඔස්සේ වැටී තිබීම
  - වාරි කර්මාන්තය නිර්මාණය කිරීම
    උදාහරණ : කලා ඔය - කලා වැව
    මහවැලි ගඟ - මිණිපේ අමුණ
  - රාජධානීන්හි අගනුවර ගංගාශ්‍රිත ව බිහි වීම
    උදාහරණ : අනුරාධපුරය, පොළොන්නරුව
  - ගංගා මුවදොර ආශ්‍රිත ව වරායවල් හා වෙළෙඳ මධ්‍යස්ථාන බිහි වීම




ලෝකය තුළ ශ්‍රී ලංකාවේ පිහිටීම



ඉන්දියාවට ආසන්නව හා ඉන්දායාවෙන් වෙන්ව දූපතක් වශයෙන් පිහිටීම

## ශ්‍රී ලංකාවේ භූ විෂමතාව සහ ජල වහනය





මිනිපේ අමුණ

- මධ්‍ය කඳුකරය

  - භූගෝලීය බෙදීම්වලට පාදක ස්ථානයක් වීම
  - ගිරි දුර්ග, ජල දුර්ග, වන දුර්ග ආදියෙන් ආරක්ෂාව පැවතීම
  - මධ්‍ය කඳුකරය මුල් කරගනිමින් බිහි වූ රාජධානි
    උදා : ගම්පොළ, මහනුවර
  - මධ්‍ය කඳුකරය නිසා මුළු රටෙහි ම දේශපාලන ඒකාබද්ධතාව ඇති කිරීම අපහසු වීම
  - විදේශ ආක්‍රමණ හා සිවිල් අරගල ඇතිවූ අවස්ථාවල දී ආරක්ෂක ස්ථානයක් වීම
  - ශ්‍රී ලංකාවේ ගංගා පද්ධතියේ පෝෂක ප්‍රදේශය වීම
  - මධ්‍ය කඳුකරය පාදක කරගනිමින් බ්‍රිතාන්‍යයන් වතු වගාව ඇරඹීම ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංස්කෘතික පෙරළියකට මුල පිරීම
  - අතරමැදි කලාපයේ රබර් වගාව ද, වෙරළබඩ කලාපයේ පොල් වගාව ද ව්‍යාප්ත කිරීම
  - අගනුවරට දුරින් පිහිටි මධ්‍ය කඳුකරය ශ්‍රී ලංකාවේ නිදහස් අරගලවල මූලස්ථානය වීම
    උදාහරණ : 1818 ඌව වෙල්ලස්ස නිදහස් සටන
    1848 මාතලේ නිදහස් සටන

- වරායයෝ

  - දිවයින වටා පිහිටි වරායයන්
    උදාහරණ : පුරාතන යුගයේ - මහාතිත්ථ, ගෝකණ්ණ, ගොඩවාය, දඹකොළපටුන, ඌරාතොට, දේවනගර
    නූතන යුගයේ - ගාල්ල, කොළඹ, මඩකලපුව ත්‍රිකුණාමලය
  - මුල් ආර්ය ජන සංක්‍රමණ
    උදාහරණ : භද්දකච්චායනා ඇතුළු පිරිස ගොකණ්ණ වරායෙන් පැමිණීම



මධ්‍ය කඳුකරය - නකල්ස් කන්ද




ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරය



මධ්‍ය කඳුකරයේ වතු වගාව

- දකුණු ඉන්දියානු ආක්‍රමණ එල්ල වීම
  උදාහරණ : මහාතිත්ථය හරහා විවිධ ආක්‍රමණ එල්ල වීම
  වෙළෙඳ සබඳතා පැවැත්වීම - ඉන්දියාව, බුරුමය, චීනය, අරාබිය, ඊජිප්තුව, රෝමය, ග්‍රීසිය
- සිංහල රජවරුන් යුද්ධ ආධාර ලබා ගැනීම
- ඉන්දියාව සමඟ සංස්කෘතික සබඳතා පැවැත්වීම
  උදාහරණ : ගජබා රජු පත්තිනි ඇදහිල්ල ගෙන ඒම
- මධ්‍යකාලීන යුගයේ වෙළෙඳාමේ දියුණුවට වැදගත් වූ වරායයෝ
  උදාහරණ : කොළඹ, මීගමුව, කල්පිටිය
- යුරෝපා ජාතීන්ගේ ආගමනය කෙරෙහි ශ්‍රී ලංකාවේ ස්වභාවික වරායවල බලපෑම
  උදාහරණ : ත්‍රිකුණාමල වරාය බ්‍රිතාන්‍යයන් සතු වූ විශාලතම හා සුරක්ෂිතම ස්වාභාවික වරායක් වීම




ත්‍රිකුණාමල වරාය

**අගැයීම - 01**

1. ශ්‍රී ලංකාවේ ඉතිහාසය තීරණය කිරීමෙලා භූගෝලීය සාධක බලපෑ ආකාරය පහත සඳහන් මාතෘකා ඇසුරින් සාකච්ඡා කරන්න.
   (1) ඉන්දියාවට ආසන්නයෙහි පිහිටීම
   (2) ඉන්දියාවෙන් වෙන් ව පිහිටීම
   (3) මධ්‍ය කඳුකරය පිහිටීම
   (4) වරායවල පිහිටීම

2. ලංකාවේ සිතියමක පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.
   මධ්‍ය කඳුකරය, සමන්ත කූටය, මිහින්තලාව, රිටිගල, දිඹුලාගල, ඇතුගල, ගෝවින්ද මලය, සීගිරිය, යාපහුව

3. ශ්‍රී ලංකාවේ සිතියමක පහත දැක්වෙන ගංගා සහ ඔයවල් ලකුණු කර නම් කරන්න.
   මල්වතු ඔය, කලා ඔය, දැදුරු ඔය, කැලණි ගඟ, කළු ගඟ, ගිං ගඟ, නිල්වලා ගඟ, වලවේ ගඟ, කිරිඳි ඔය, මැණික් ගඟ, කුඹුක්කන් ඔය, ගල් ඔය, මහවැලි ගඟ

4. ශ්‍රී ලංකාවේ සිතියමක පහත දැක්වෙන වරාය ලකුණු කර නම් කරන්න.
   දඹකොළ පටුන, ඌරාතොට, මහාතිත්ථ, ගොකණ්ණ, කල්පිටිය, කොළඹ, කාලතිත්ත, ගාල්ල, මාතර, දේවනගර, ගොඩවාය, මඩකලපුව

**නිපුණතා මට්ටම** : 2.2. දේශගුණය ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය විස්තර කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි

**ඉගෙනුම් පල** :
- ශ්‍රී ලංකාවේ පවතින දේශගුණික සාධක පෙන්වා දෙයි
- දේශගුණික සාධක ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පැහැදිලි කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

**2.2. දේශගුණ සාධක**

- ශ්‍රී ලංකාව ආසියාවේ පිහිටි නිවර්තන කලාපික රටක් වීම
- ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන වර්ෂා ක්‍රමය මෝසම් වර්ෂාව වීම
- ප්‍රධාන මෝසම් වර්ෂා වර්ග දෙක ලැබෙන කාල වකවනු පිළිබඳ අවබෝධය
  උදා : නිරිතදිග මෝසම - මැයි - සැප්තැම්බර්
  ඊසාන දිග මෝසම - දෙසැම්බර් - පෙබරවාරි
- සංවහන හා වාසුළි සෙසු වර්ෂාව ලැබෙන ක්‍රම දෙක වීම
- මෝසම් වර්ෂාව පදනම් කරගෙන ශ්‍රී ලංකාව ප්‍රධාන දේශගුණික කලාප දෙකකට බෙදීම - තෙත් කලාපය, වියළි කලාපය

- දේශගුණ සාධක ඉතිහාසය කෙරෙහි ඇති කළ බලපෑම

  - අන්තර් මෝසම් සුළං ප්‍රවාහ ආධාර කරගනිමින් සංක්‍රමණිකයන්, වෙළෙඳුන් හා සංචාරකයන් ආදීන් ගේ නාවික ගමන් සිදු වීම
  - වියළි කලාපයට වර්ෂාව ලැබෙන ප්‍රධාන වර්ෂා ක්‍රමය වූ ඊසාන දිග මෝසමට අනුව ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ කෘෂිකාර්මික ජීවන රටාව ගොඩනැඟීම
  - ඊසාන දිග මෝසමින් ලද වර්ෂා ප්‍රමාණය මත රජරට වාරි ශිෂ්ටාචාරයේ ආරම්භය හා විකාශය සිදු වීම
  - තෙත් කලාපීය දේශගුණික සාධක මත කෘෂිකාර්මික ජීවන රටාව ක්‍රමයෙන් වෙනස් වීම
    උදාහරණ : ශ්‍රී ලාංකිකයන් අතිරේක ආහාර බෝග වගාවට යොමු වීම
  - නිවර්තන කලාපීය දේශගුණය පදනම් කරගනිමින් ශ්‍රී ලංකාවේ වැවුණු බෝග වර්ග සොයා යුරෝපීයයන් මෙරටට පැමිණීම
    උදාහරණ : කුරුඳු
  - යුරෝපා ජාතිකයන් නිවර්තන කලාපීය බෝග වර්ග මෙරටට හඳුන්වා දීම
    උදාහරණ : ලන්දේසින් විසින් කෝපි, රඹුටන්, දූරියන්, මැංගුස්, ගඩිගුඩං වැනි බෝග වර්ග හඳුන්වා දීම
  - බ්‍රිතාන්‍යයන් තෙත් කලාපික ප්‍රදේශයන්ට වතුබෝග හඳුන්වා දීම
    උදාහරණ : තේ,රබර්, කොකෝවා, සිංකෝනා



සිංකෝනා

**ඇගයීම -01**

1. ශ්‍රී ලංකාවේ ඉතිහාසය තීරණය කිරීමෙහි ලා දේශගුණ සාධක බලපා ඇති ආකාරය උදාහරණ ඇසුරින් විස්තර කරන්න

2. පහත දැක්වෙන උපදෙස් පරිදි ශ්‍රී ලංකාවේ සිතියමක ලකුණු කරන්න

    1. පියවර - මධ්‍ය කඳුකරය හා ශ්‍රී ලංකාවේ ගංගා දැක්වෙන සිතියමක් පිටපත් කරගන්න
    2. පියවර - ශ්‍රී ලංකාවට නිරිත දිග මෝසම හා ඊසාන දිග මෝසම හමා එන දිශාව ඇඳ දක්වන්න.
    3. පියවර - මි.මී. 2000 සම වර්ෂා රේඛාව අඳින්න
    4. පියවර - නිරිත දිග මෝසම් සමයේ සුළං මුවාව සේයා කර දක්වන්න.
    5. පියවර - ඒ අනුව තෙත් කලාපය හා වියළි කලාපය නම්කර දක්වන්න.
    6. පියවර - පහත දැක්වෙන ශ්‍රී ලංකාවේ අගනගරයන් එහි ලකුණු කර නම් කරන්න.
    අනුරාධපුරය, පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, මහනුවර

## 3. මූලාශ්‍රය විභාගය

රටක ඉතිහාසය නිවැරදි ව අවබෝධ කර ගැනීම සඳහා දැනට ශේෂ ව තිබෙන ඊට අදාළ මූලාශ්‍රය පිළිබඳ ව විග්‍රහ කර බැලීම අත්‍යවශ්‍ය වේ. ලංකා ඉතිහාසය හැදෑරීම සඳහා ඉවහල් වන ප්‍රධාන මූලාශ්‍රය වර්ග හතරක් හඳුනාගත හැකි ය. ඒවා සාහිත්‍ය මූලාශ්‍රය, පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, අභිලේඛන සහ නාණක ලෙස නම් කර ඇත. පොදුවේ සලකන විට සාහිත්‍ය මූලාශ්‍රය දිවයිනේ ඉතිහාසය අඛණ්ඩ ව ලිවීම සඳහා උපයෝගී කරගත හැකි වේ. එසේ වුවත් ඓතිහාසික සිද්ධිවල කාලයත් එම සිද්ධි විස්තර කරන සාහිත්‍ය මූලාශ්‍රය රචනා වූ කාලයත් අතර බොහෝ පරතරයක් ඇත. එමෙන් ම සාහිත්‍ය මූලාශ්‍රය රචනා කිරීමේ දී එම ග්‍රන්ථ කතුවරුන්ගේ රුචිඅරුචිකම් හා ඔවුන් වාසය කළ වටපිටාව වැනි කරුණු ද බලපා ඇත. මෙවැනි හේතු නිසා ඒවායේ අන්තර්ගත ඓතිහාසික බීජය වටා නොයෙක් කරුණු ද එකතුවී ගෙතී ඇති බව පැහැදිලි වේ. එනිසා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වඩා විශ්වසනීය මූලාශ්‍රය ලෙස සලකනු ලැබේ.

**නිපුණතාව** : • මූලාශ්‍රය විශ්ලේෂණයෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය ප්‍රායෝගික ජීවිතයට භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** 3.1. ඉතිහාසය ගොඩනැගීමට දායක වන මූලාශ්‍රය විමසා බලයි.


**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- ඉතිහාසය ගොඩනැගීමට දායක වන මූලාශ්‍රය නම් කරයි.
- මූලාශ්‍රයේ ස්වභාවය අනුව ඒවා වර්ග කරයි.
- මූලාශ්‍රයවල වර්ගය අනුව ඓතිහාසික කරුණු ගොඩනඟාගත හැකි ආකාරය පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

**.1. ශ්‍රී ලංකා ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය**

- මූලාශ්‍රය වර්ග කිරීම
  - සාහිත්‍ය මූලාශ්‍රය
  - පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය
  - අභිලේඛන
  - කාසි



- **දේශීය සාහිත්‍ය මූලාශ්‍රය**

  **වංසකථා**

  - කිසියම් රටක, පුද්ගලයෙකුගේ හෝ වස්තුවක හෝ පරම්පරාගත කථාව විස්තර කරනු ලබන ග්‍රන්ථ වංසකථා ලෙස හැඳින්වේ.
  - වංසකථා ශ්‍රී ලංකාවේ පැරණිත ම ඉතිහාස රචනා සම්ප්‍රදාය වේ.
  - වර්තමානයේ ඉතිරි ව ඇති වංසකථා ඒවා ලියා ඇති භාෂා සම්ප්‍රදාය ගැන සලකන විට දෙවදෑරුම් ය.
  - ශ්‍රී ලංකාවේ ඉතිහාස කථාව අඛණ්ඩ ව ලියවෙන මහාවංසය දේශීය සාහිත්‍ය මූලාශ්‍රය අතර ප්‍රධාන වේ.

| වෙළුම | කාලවකවානුව | කතුවරයා |
|---|---|---|
| මහාවංසයේ පළමු වනි වෙළුම | ඉතිහාසයේ මුල් කාලයේ සිට මහසෙන් රාජ්‍ය සමයයේ අවසානය දක්වා - පරිච්ඡේද 36 සහ 37 පරිච්ඡේදයේ 50වෙනි ගාථාව දක්වා | දික්සඳ සෙනෙවියා පිරිවෙන් වාසී මහානාම හිමි |
| මහාවංසයේ දෙවෙනි වෙළුම - පළමුවෙනි කොටස | ක්‍රි.ව 302 - ක්‍රි.ව 1186 දක්වා 37වන පරිච්ඡේදයේ 51වන ගාථාවේ සිට 79වන පරිච්ඡේදය දක්වා | දඹදෙණියේ විසූ ධරමකීර්ති නමැති හිමි නමක් යැයි සැලකේ |
| එම වෙළුම - දෙවෙනි කොටස | ක්‍රි.ව 1186 - 1357 දක්වා 80 වෙනි පරිච්ඡේදයේ සිට 91 වෙනි පරිච්ඡේදය දක්වා | කර්තෘ අවිනිශ්චිතය |
| එම වෙළුම - තෙවෙන කොටස | ක්‍රි.ව 1357 - 1815 දක්වා 92 වෙනි පරිච්ඡේදයේ සිට 101 වෙනි පරිච්ඡේදය දක්වා | තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත තෙරණුවෝ බව සැලකේ |
| මහාවංසයේ තෙවෙනි වෙළුම | 1815 - 1935 දක්වා 102 පර්ච්ඡේදයේ සිට 114 පර්ච්ඡේදය දක්වා | පූජ්‍ය යගිරල පඤ්ඤානන්ද හිමි |
| මහාවංසයේ සිවුවෙනි වෙළුම | 1936 - 1956 දක්වා 115 පර්ච්ඡේදයේ සිට 124 පර්ච්ඡේදය දක්වා | ආචාර්ය නන්දදේව විජේසේකර ප්‍රධාන සම්පාදක මණ්ඩලය විසින් |
| මහාවංසයේ පස් වෙනි වෙළුම | 1956 -1978 දක්වා 125 පරිච්ඡේදයේ සිට 129 දක්වා | පූජ්‍ය බෙල්ලන ශ්‍රී ඥානවිමල හිමි ප්‍රධාන සම්පාදක මණ්ඩලයක් විසිනි |
| මහාවංසයේ හයවෙනි වෙළුම | ක්‍රි.ව 1978 - 2010 දක්වා 130 පරිච්ඡේදයේ සිට 133 පරිච්ඡේදය දක්වා | සම්පාදනය වෙමින් පවතියි |

**සිංහල වංසකථා**
උදාහරණ : පූජාවලිය, සිංහල ථූපවංසය, සිංහල බෝධිවංසය, දළදා සිරිත, රාජාවලිය

- අටුවා ග්‍රන්ථ
  - අට්ඨකථා හෙවත් අටුවා යනු ත්‍රිපිටක ග්‍රන්ථවල කරුණු විස්තර කිරීමට ලියන ලද ග්‍රන්ථ සමූහයකි.
  - අට්ඨකථා පළමුවෙන් ම ලියා තිබුනේ සිංහල භාෂාවෙනි. (සීහළට්ඨකථා) පසුව ඒවා ද අවශ්‍ය සංශෝධන සහිත ව පාලි භාෂාවට පරිවර්තනය කරන ලදී.
  - ක්‍රි.ව. පස්වෙනි සියවසේදී පමණ ලංකාවට පැමිණි බුද්ධඝෝෂ තෙරුන් විසින් මුලින් ම සීහළට්ඨකථා පාලි භාෂාවට පරිවර්තනය කරන ලදැයි සැලකේ. උදා : සමන්තපාසාදිකාව, සම්මෝහවිනෝදනිය, සාරත්ථදීපනී, මනෝරථපූරණී
  - ධම්මපාල තෙරුන්, උපසේන තෙරුන් ආදි හිමිවරු ද අටුවා ග්‍රන්ථ ලියූ කතුවරු වෙති.

- ධර්ම ග්‍රන්ථ
  - බණකථා ස්වරූපයේ පුවත් පැහැදිලි කිරීමට ලියවී ඇති ග්‍රන්ථ සමූහයකි.
    උදාහරණ: සීහලවත්ථු, රසවාහිනී, සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාවලිය

- වෙනත් සාහිත්‍ය
  උදාහරණ: කඩයිම් පොත්, සංදේශ කාව්‍යය, හටන් කාව්‍ය

**විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය**

ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් සහ රට පිළිබඳව තොරතුරු අසා දැනගත් විදේශිකයන් විසින් ලියන ලද ග්‍රන්ථ, වාර්තා, දිනපොත්, සිතියම් ආදිය විදේශීය මූලාශ්‍රය වශයෙන් සැලකිය හැකි ය.

- **ග්‍රීක රෝම මූලාශ්‍රය**
  - ඇරිස්ටෝටල් - ඩෙමුණ්ඩෝ
  - මෙගස්තිනීස් - ඉන්ඩිකා
  - ටොලමි - භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය
  - කොස්මස් ඉන්ඩිකොප්ලෙවුස්ටස් - ටෙපොග්‍රැපියා ක්‍රිස්ටියානා
  - ප්ලිනි - නැචුරාලිස් හිස්ටෝරියා
  - ප්‍රොකෝපියස් - පර්සියානු යුද්ධ
  - ඔනසික්‍රීටස්, ස්ට්‍රාබෝ, හිපාකස්, ආටිමිඩෝරස් ආදි ලේඛකයෝ

- **අරාබි මූලාශ්‍රය**
  - සුලයිමන්
  - අබුසයිද් - සිල්සිලාත් අල් තවාරිං
  - අල්බිරූනි, මසූදි, බුර්දාද්බේ ආදී ලේඛකයන්ගේ වාර්තා

- **චීන මූලාශ්‍රය**
  - ෆාහියන් වාර්තාව - ක්‍රි.ව. පස්වෙනි සියවස
  - හියුං-සාං හා ඉත්සිං ගේ දේශාටන වාර්තාව
  - පාඕචාං - පි-චියු-නි චුවාන්

- **ඉන්දියානු මූලාශ්‍රය**
  - රාමායණය, ලංකාවතාර සූත්‍රය
  - මහා භාරතය, දිව්‍යාවදානය, රාජතරංගිණිය, සිලප්පදිකාරම්, මණිමේකලෛ, පදිර්රුප්පත්තු, පට්ටිනප්පාලෙයි

- **යුරෝපීය මූලාශ්‍රය**
  - පෙරදිග රටවල් සෙවීමෙහි නිරත වූ පුරාණ යුරෝපීය සංචාරකයන් ද ක්‍රිස්තියානි පූජකයන් ද ලංකාව පිළිබඳ ව තොරතුරු කෙටියෙන් සඳහන් කර ඇත.
    උදා : මාර්කෝ පෝලෝ, ජෝන් ඩී මැරිඥ්ඤෝලි
  - පෘතිගීසීන්, ලන්දේසීන් හා ඉංග්‍රීසීන් ලංකාවට පැමිණි පසු ඔවුන් විසින් ලියන ලද කෘති
    උදාහරණ : රිබෙයිරෝ - ලංකා ඉතිහාසය
    ක්වේරෝස් - ලංකාධිපත්‍යය
    බැල්දියස් - ලංකා පුරාවෘත්තය
    ද කූටෝ, වැලන්ටයින් වැනි ලේඛකයෝ
  - පෘතුගීසින් හා ලන්දේසින් සම්පාදනය කරන ලද තෝම්බු
  - ඉංග්‍රීසි ලේඛකයෝ
    * රොබට් නොක්ස්
    * මේජර් ඩේවි
    * එමර්සන් ටෙනන්ට්
    * ජෝන් ඩොයිලිගේ දිනපොත

- **අග්නිදිග ආසියාතික මූලාශ්‍රය**

  ජිනකාලමාලි - රතනපඤ්ඤ හිමි - සියම (තායිලන්තය) යසවන්ජෝ නම් බුරුම වංසකථාවෙහි ලංකාවේ හා ඉන්දියාවේ ශාසන ඉතිහාසය පිළිබඳ ව සඳහන් ය.

- **පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය**

- අතීත සමාජයේ සංස්කෘතියට අයත් ඉතිරිව පවතින අවශේෂයන් (නටබුන්) පුරා විද්‍යාත්මක මූලාශ්‍රය ලෙස අර්ථ දැක්විය හැකිය.

පුරාවිද්‍යාත්මක නටඹුන්

- ආගමික
  - ගොඩනැගිලි: බෝධිසර, දාගැබ්, ආරාම, ස්ථූප, පිළිමගේ, උපෝසථාගාර (පොහොය ගෙය), දානශාලා
  - ගොඩනැගිලි උපාංග: සඳකඩපහණ, මුරගල, කොරවක්ගල, වාහල්කඩ
  - වෙනත් කලාත්මක නිර්මාණ: චිත්‍ර, මූර්ති, කැටයම්
- ආගමික නොවන
  - වැව්
  - වාරි නිර්මාණ
  - රාජ මාලිගා
  - උයන්
  - පොකුණු
  - රාජ සභා
  - රෝහල්
  - පාලම්
  - අම්බලබම්
  - බලකොටු

- **අභිලේඛන**
  - සෙල්ලිපි
  - රන්පත්
  - තඹපත්
  - තුඩපත්
  - මැටි පුවරු, බිත්ති, දැව හා විවිධ භාජන ආදියෙහි ලියා ඇති පැරණි ලේඛන

**සෙල්ලිපි**

- ශිලා ලිපි හෙවත් සෙල් ලිපි ඒවා ලියා ඇති ගල්වල ස්වරූපය අනුව ලෙන් ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි ගිරි ලිපි ලෙස වර්ග



මිහින්තලා පුවරු ලිපිය

- **නාණක**

**දේශීය කාසි**

- අනුරාධපුර යුගයේ මුල සිට ලංකාවේ කාසි භාවිතය පැවතීම. මෙරටින් හමු වූ පැරණි ම කාසි කහාපණ ලෙස හැඳින්වීම
  උදාහරණ : ඇතා හා ස්වස්තික කාසි, ලක්ෂ්මී කාසි, රන් කහාපණ කාසි, සිංහ කාසි,
- මෙරටට අවශ්‍ය කාසි රට තුළ ම නිපදවීම හා එම කාසි නිපද වූ අච්චු කැණිම් මඟින් හමු ව තිබේ.
- මෙරටින් හමු වූ විදේශීය කාසි
  උදාහරණ : රෝම කාසි, චීන කාසි, අරාබි ඉන්දියානු කාසි




ලංකාවේ පැරණි කාසි



මෙරටින් හමු වූ පැරණි රෝම කාසි

**ජනප්‍රවාද හා පුරාවෘත්ත**

- සාම්ප්‍රදායික ව ජනතාව අතර මුඛපරම්පරාවෙන් පැවැතගෙන එන ඉතිහාසගත තොරතුරු හා ඒවා සම්බන්ධ කතා පුවත් ජනප්‍රවාද හා පුරාවෘත්ත ලෙස හැඳින්වේ.
- ජනප්‍රවාද හා පුරාවෘත්ත ඉතිහාසය ගොඩනැඟීමේ දී වැදගත් වන බව
- ජනප්‍රවාද හා පුරාවෘත භාවිත කරන්නේ
  - ඉතිහාසයේ තහවුරු වී නොමැති දෙයක් පිළිබඳ ව ඉඟියක් ලබා ගැනීමට
  - කතා පුවතක්, සිද්ධියක් පිළිබඳව විචාරශීලී ව විමසා බැලීමට
  - කිසියම් පුද්ගලයකු, සිද්ධියක්, ස්ථානයක් පිළිබඳ ව අමතර දැනුමක් ලබා ගැනීමට
  - පාලකයන්ගේ පෞරුෂ පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට

**නිපුණතා මට්ටම** : 3.2 මූලාශ්‍රය විශ්ලේෂණයෙන් ඓතිහාසික කරුණු ගොඩනඟන ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද** : 08 යි

**ඉගෙනුම් පල** : • ඓතිහාසික මූලාශ්‍රය විචාරශීලී ව විමර්ශනය කරයි.
• මූලාශ්‍රය භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

**3.2 මූලාශ්‍රය විචාරශීලී ව විමසීම**

- සාහිත්‍ය මූලාශ්‍රය, දේශීය සාහිත්‍ය මූලාශ්‍රය හා විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදේ
- දේශීය සාහිත්‍ය මූලාශ්‍රය යටතේ එන වංසකථා ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ වැදගත් ග්‍රන්ථ විශේෂයකි

- **දීපවංසය**

* දැනට ඉතිරි ව ඇති ශ්‍රී ලංකාවේ පැරණි ම වංසකතාව දීපවංසය යි. මෙය පාලි භාෂාවෙන් රචනා කර ඇත. පරිච්ඡේද 22ක් ඇත. ගාථා 1350 කින් යුක්ත ය.
* ක්‍රි.ව. 4-5 සියවස් අතර මෙය ලියන ලදැයි සැලකේ.
* බුදුන් වහන්සේගේ චරිතයේ ඇතැම් සිදුවීම් හා උන් වහන්සේගේ ලංකා ගමන් විස්තර කිරීමෙන් පසු ව විජයගේ සිට මහසෙන් රාජ්‍ය සමයේ අවසානය තෙක් ලංකා ඉතිහාසයේ තොරතුරු රැසක් මෙහි විස්තර කර ඇත.
* දීපවංසය මහාවංසයට වඩා කුඩා කෘතියක් වුවත් මෙහි අන්තර්ගත ඇතැම් කරුණු මහාවංසයේ දක්නට නොලැබේ.

**දීපවංසයේ අන්තර්ගතයේ සාරාංශය**

* මහා සම්මත රජ පරම්පරාව
* බුද්ධ චරිතයේ සුවිශේෂ සිදු වීම් හා උන්වහන්සේගේ ලංකා ගමන්
* ශ්‍රී ලංකාවේ මුල් ආර්ය ජනාවාස පිහිටුවීම
* පණ්ඩුකාභය කතා පුවත
* ලක්දිවට බුදුසමය හඳුන්වා දීම
* මහසෙන් රජුගේ අවසානය දක්වා රජවරුන් පිළිබඳ ව තොරතුරු

**මහාවංසය**

- මහාවංසය අද වන තෙක් ම අඛණ්ඩව ලියවෙන කෘතියකි. එහි මෙරට ඉතිහාසය අඛණ්ඩව ලිය වී ඇත. එබැවින් එය අඛණ්ඩ කෘතියකි. මහාවංසයේ පළමු කොටස පරිච්ඡේද 37කින් සමන්විත වේ. මෙහි කතුවරයා මහා විහාරයට අනුබද්ධ දික්සඳ සෙනෙවියා පිරිවෙන් වාසී මහානාම හිමියන් ලෙස සැලකේ.
- මෙම කෘතිය ක්‍රි.ව. 5-6 සියවස් අතර කාලයේ ලියවෙන්නට ඇතැයි සැලකේ.

- මහසෙන් රාජ්‍ය සමයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා මහාවංසයේ වැදගත්කම
  - * මහාවංස පළමුවන වෙළුමේ කතුවරයා තම කෘතිය ලිවීමේ දී වෙනත් කෘති හා ජනප්‍රවාද මූලාශ්‍රය කර ගැනීම
    උදාහරණ : දීපවංසය, සීහළට්ඨකථා මහාවංසය, විනයට්ඨකථාව, උත්තර විහාරට්ඨ කථාව

**මහාවංසයේ සඳහන් දේශපාල තොරතුරු**

- මහසෙන් රාජ්‍ය සමය තෙක් රාජ වංසයේ අඛණ්ඩ පැවැත්ම විස්තර කිරීම
- විදේශීය ආක්‍රමණිකයන්ගෙන් හා අභ්‍යන්තර කැරලිවලින් රටවැසියා මුදාගත් පාලකයන්ගේ තොරතුරු විස්තර කිරීම
- ගොවිතැන් කටයුතුවලට විශාල සේවා සැලසූ රජවරුන්ගේ තොරතුරු
- බුදු සසුනේ අභිවෘද්ධියට පාලකයන් විසින් ඉටු කරන ලද සේවා
- මහජනතාවගේ සුභසාධනය සඳහා පාලකයන් ගත් ක්‍රියාමාර්ග

**ආගමික තොරතුරු**

- මහාවංසය ආගමික පදනමකින් රචනා වී තිබීම
- බුදුරදුන්ගේ ලංකා ගමනයේ සිට මහාසේන රාජ සමයේ අවසානය තෙක් මහාවිහාරය කේන්ද්‍රකොටගත් ආගමික ඉතිහාසය ද මහාවිහාරයට උදවු කළ පාලකයන් හා ඔවුන් විසින් සිදු කරන ලද මෙහෙය විස්තර කර තිබීම
- මහාවිහාරීය ජයග්‍රහණ ගැන වැඩි විස්තර අන්තර්ගත ව ඇති නිසා මහාවංසය මහාවිහාරයේ වංසකථාව ලෙස අර්ථ දැක්වීමට ඇතැම් අය පෙලඹීම
- අභයගිරිය, ජේතවනය හා වෙනත් නිකාය පිළිබඳ ව ද විස්තර දක්වා තිබීම

**සමාජීය හා සංස්කෘතික තොරතුරු**

- ලංකාවේ ජීවත් වූ විවිධ සමාජ කොටස්, වෘත්තීය කණ්ඩායම්, උත්සව ඇතුළු විවිධ අංග පිළිබඳව තොරතුරු ඇතුළත් වීම
- ආවාහ විවාහ සම්බන්ධතා, ආහාරපාන, ඇඳුම් පැළැඳුම් ආදිය පිළිබඳ තොරතුරු

**ආර්ථික තොරතුරු**

- ගොවිතැන් කටයුතු, වාරි කර්මාන්තය, වෙළෙඳාම, ශිල්පීය කටයුතු ඇතුළු ආර්ථික තොරතුරු

**තාක්ෂණික තොරතුරු**

- වාරි තාක්ෂණය , ගොඩනැගිලි තාක්ෂණය, ප්‍රතිමා නෙළීම, දාගැබ් ඉදිකිරීම, මාර්ග පාලම් ඉදිකිරීම, යනා දී විවිධ ක්ෂේත්‍රවල භාවිත කළ තාක්ෂණය පැහැදිලි කිරීම
- මහාවංසයේ හා අනෙකුත් වංසකථාවල තොරතුරු හා සිද්ධි, අභිලේඛන හා වෙනත් මූලාශ්‍රයවලින් සනාථ වීම
- ආගමික පදනම මත මහාවංසය රචනා වුවත්, එහි දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික තොරතුරු අන්තර්ගත වී ඇත

**ආගමික හා සංස්කෘතික කරුණු සනාථ වීම**

- මහින්දාගමනයේ ඓතිහාසිකත්වය සනාථ වීම, ඉන්දියාවේ සාංචි ස්තූපයේ කැණීම්වලින් ලැබුණු කරඬු කිහිපයකින් හමු වූ ලිපි මඟින් ධර්මදූත ව්‍යාපාරයට සම්බන්ධ භික්ෂූන් කිහිප නමකගේ නම් සනාථ වීම. (කස්සපගොත්ත, මජ්ඣිම, දුන්දුභිස්සර) එමෙන් ම අසෝක රජුගේ දෙවෙනි හා දහතුන් වෙනි ගිරිලිපි මඟින් ධර්ම ප්‍රචාරය කළ ප්‍රදේශ සනාථ වීම
- ලංකාවේ මිහින්තලේ හා රජගල ශිලා ලිපිවලින් මහින්ද, ඉට්ඨිය, උත්තිය, භද්දසාල, යන හිමිවරුන්ගේ ඓතිහාසිකත්වය සනාථ වීම
- සංඝමිත්තාගමනය හා භික්ෂුණී ශාසනය පිහිටුවීමට ශ්‍රී මහා බෝධිය වැඩ කිරීම සඳහන් ලේඛන හමුව තිබීම
- වංසකථාවල සඳහන් ඓතිහාසික ස්ථාන පුරාවිද්‍යා කැණීම් මඟින් තහවුරු වීම
  උදාහරණ : රුවන්වැලි සෑය, අභයගිරිය, ජේතවනය, මිරිසවැටිය, මිහින්තලය, ඉසුරුමුණිය

**දේශපාලන හා පරිපාලන තොරතුරු සනාථ වීම**

- රජවරුන්, යුවරජවරුන්, ප්‍රාදේශික රජවරුන් පිළිබඳ ව මහාවංසයේ ඇති තොරතුරු අභිලේඛන මඟින් සනාථ වීම
  - * උත්තිය රජු - මිහින්තලේ ලෙන් ලිපි
  - * සද්ධාතිස්ස, ලඤ්ජිතිස්ස - රජගල ලිපි
  - * මහාචූළිකමහානාග, කුටකණ්ණතිස්ස, මහාදාඨිකමහානාග - මහරත්මලේ ලිපිය
  - * වසභ රජු හා ඔහුගේ පුතුන් පිළිබඳ ව - වල්ලිපුරම්, පෙරිමියන්කුලම, හැබැස්ස, තම්මැන්නාකන්ද ලිපි
  - * බුද්ධදාසරින්ද රජු බුදුදහමට අනුගත වූ බව - රුවන්වැලි සෑ ලිපිය
  - * තිරිතර රජු - කතරගම ලිපිය
  - * කුමාරදාස රජු - නාගිරිකන්ද ලිපිය
  - * සිවුවන මිහිඳු රජු - මිහින්තලය පුවරු ලිපිය

  - * ඇමතිවරු හා රාජ්‍ය නිලධාරි
    - ඇමතිවරු - පරමාකන්ද ලිපිය
    - භාණ්ඩාගාරික - මිහින්තලය ලිපි
    - ගණකවරු - මහඇලගමුව ලිපිය
    - සෙන්පතිවරු - (දසමහා යෝධයන්) වැල්එල්ලුගොඩකන්ද, මහඇලගමුව, සිතුල්පව්ව
    - උපරජ - හැබැස්ස ලිපිය

**ආර්ථික තත්ත්වය පිළිබඳ තොරතුරු සනාථ වීම**

- වෙළෙඳ ශ්‍රේණි ගැන - සැස්සේරුව ලිපිය
- වෙළෙන්දන් ගැන තොරතුරු - සැස්සේරුව ලිපිය
- බදු වර්ග ගැන - ගොඩවාය ලිපිය
- වෙළෙඳපළ පිළිබඳ ව හා වෙළෙඳ නීති පිළිබඳ ව - හෝපිටිගමුව ටැම් ලිපිය (බදුලු ටැම් ලිපිය) ගොඩවාය, හැබැස්ස, තිඹිරිවැව
- මහාතිත්ථයේ කළ කැණීම් මඟින් වෙළෙඳාම හා සම්බන්ධ තොරතුරු ලැබීම

**තාක්ෂණික තොරතුරු සනාථ වීම**

- රුවන්වැලිසෑය , ලෝවාමහාපාය වැනි නිර්මාණ තැනූ ආකාරය පිළිබඳ දැක්වෙන විස්තර

**සමාජ තොරතුරු සනාථ වීම**

- සමාජයේ පැවැති විවිධ කුල හා විවිධ ජන කණ්ඩායම් ගැන අභිලේඛනවල තොරතුරු සඳහන් වීම
- සමාජයේ විවිධ වෘත්තීය කණ්ඩායම් පිළිබඳ ව තොරතුරු ඇතුළත්ව තිබීම
  උදාහරණ : තඹකර, පෙහෙකර, වෙජ ආදි නම් සෙල්ලිපිවල සඳහන් වීම

**මූලාශ්‍රයයක් වශයෙන් මහාවංසයේ දුර්වලතා**

- ආගමික ඉතිහාසයට වැඩි ඉඩක් ලබා දී තිබීම නිසා දේශපාලන කරුණු ප්‍රමාණවත් ව සඳහන් නොවීම
- ඉන්දියානු ඉතිහාසයේ බෞද්ධ තොරතුරු වාර්තා කර තැබීමට මුල් පරිච්ඡේද පහම යොදා ගැනීම
- කතුවරයාගේ පෞද්ගලික ආකල්ප, රුචිඅරුචිකම් අනුව ඇතැම් සිද්ධි වාර්තා කර තිබීම නිසා ඇතැම් විටෙක සාධාරණත්වයක් ඉටු නොවීම
- කතුවරයාගේ එක් පරමාර්ථයක් වූයේ මහාවංසයට මූලාශ්‍රය ක් වූ කෘතිවල පැවති විස්තරාත්මක කරුණු සංක්ෂිප්ත කිරීම යි. එ නිසා ඇතැම් වැදගත් තොරතුරු ගිලිහී තිබීම
- අනුරාධපුර රාජධානියට සමකාලීන ව පැවැති වෙනත් ප්‍රාදේශික රාජ්‍යයන් පිළිබඳව තොරතුරු ප්‍රමාණවත්ව සඳහන් නොවීම
- මහාවිහාරයට පක්ෂපාත ව කටයුතු කළ දේවානම්පියතිස්ස, දුටුගැමුණු සහ කුටකණ්ණතිස්ස වැනි රජවරුන් මහත් අභිරුචියෙන් වර්ණනා කැරෙන අතර මහාවිහාරය කෙරෙහි යහපත් ආකල්පයක් නොදැක්වූ මහසෙන් වැනි පාලකයන් පිළිබඳ ව කතුවරයා උදාසීන ආකල්පයක් දක්වා තිබීම
- දුටුගැමුණු චරිතය හා ඔහුගේ කාර්ය සංසිද්ධිය වර්ණනා කිරීමට මහාවංසයේ පරිච්ඡේද 37න් 11 ක් ම වෙන් කර තිබීම මෙන් ම දුටුගැමුණු චරිතය ඉස්මතු කිරීම සඳහා කාවන්තිස්ස වැනි රජවරුන්ගේ වැදගත්කම යටපත් කර තිබීම
- අතිශයෝක්ති සිද්ධි හා වර්ණනා ඇතුළත් ව තිබීම

**පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය**

**අභිලේඛන**

- සෙල්ලිපි, රන්පත්, තඹපත්, තුඩපත්,සන්නස් මැටිපුවරු, බිත්ති, දැව හා විවිධ භාජන ආදියෙහි ලියා ඇති පැරණි ලේඛන අභිලේඛන ලෙස හැඳින් වේ.
- සෙල්ලිපි ප්‍රධාන කොටස් කිහිපයකට බෙදේ. ලෙන් ලිපි, ටැම් ලිපි, ගිරි ලිපි, පුවරු ලිපි, වශයෙනි.
- මුල් අවධියේ දී ලියන ලද සෙල්ලිපි මූල බ්‍රාහ්මීය ලිපි ලෙස හැඳින්වේ. භික්ෂුණී වහන්සේට ලෙන් පූජා කිරීම සම්බන්ධව ඒවායේ වැඩි වශයෙන් සඳහන් වේ.
- ක්‍රි.ව. දෙවෙනි සියවසින් පසු විස්තරාත්මක සෙල්ලිපි දක්නට ලැබේ. විහාරාරාමවලට ගම්බිම් පිදීම, විහාරාරාම පාලනය, රජයේ නීති මහජනයාට දැනුම් දීම, බදු අය කිරීම, වෙළෙඳාම, වැරදිකරුවන්ට සමාව දීම, පුද්ගල සේවය ඇගයීම වැනි නොයෙක් කරුණු වාර්තා කර තැබීමට එම සෙල්ලිපි පිහිටුවා ඇත.
- වර්තමානයේ හමු ව ඇති පැරණි ම ශිලා ලිපිය ලෙස හඳුනාගෙන ඇත්තේ උත්තිය රජුගේ නම සඳහන් මිහින්තලේ පිහිටි ලිපියකි.

## ශිලා ලේඛනවල අන්තර්ගත කරුණුවල ඇති වැදගත්කම

- මහාවංසය ඇතුළු අනෙකුත් සාහිත්‍ය මූලාශ්‍රයයන්හි අන්තර්ගත තොරතුරු තහවුරු කිරීමෙහි ලා සෙල්ලිපි වැදගත් වීම

  උදාහරණ:
  * දුටුගැමුණු රජුගේ දසමහා යෝධයෝ පිළිබඳ ව වංසකථාවල දක්වෙන කරුණු සෙල්ලිපිවලින් තහවුරු වීම
    කොරවග්ගල සෙල්ලිපිය හා සිතුල්පව්ව (සෙනපති මිතශ - නන්දිමිත්‍ර යෝධයා)
    වැල්එල්ලුගොඩකන්ද ලිපිය, සංඛපාල විහාර ලිපිය (සෙනපති පසදේව-පුස්සදේව යෝධයා, මීට අමතර ව පල්ලෙබැද්ද හා එගොඩපත්තුව ආදී සෙල්ලිපිවලින් ද මොවුන් පිළිබඳව සනාථ වීම
  * මහින්දාගමනය පිළිබඳ ව සෙල්ලිපිවලින් සනාථ වී තිබීම
  * වංසකථාවල සඳහන් දේශපාලන හා පරිපාලන තොරතුරු, ආර්ථික තොරතුරු, සමාජ හා සංස්කෘතික තොරතුරු රාශියක් සෙල්ලිපිවලින් සනාථ වීම

- වංසකතාවල සඳහන් ව නොමැති තොරතුරු ලබා ගැනීමට මෙන් ම ඒවා පිටපත් කිරීමෙහි දී සිදු වූ ඇතැම් වැරදි නිවැරදි කර ගැනීමට ශිලා ලේඛන වැදගත් වීම

උදාහරණ ඃ
  * උපරජවරුන් හා ප්‍රාදේශක රජවරුන් පිළිබඳ ව (කුසලානකන්ද, හෙන්නන්නේගල, බඹරගල, යටහලෙන ආදි ලිපි)
  * කදුරුවැව ලිපියෙහි ඇමති පරම්පරා පහක් පිළිබඳ ව සඳහන් වීම
  * විහාර පාලනය පිළිබඳ ව තොරතුරු (මිහින්තලේ පුවරු ලිපිය, කළුදිය පොකුණ ලිපිය)
  * වසභ රජුගේ පුතුන් දෙදෙනකු වූ උතර (හැබැස්ස ලිපිය) හා දුටග(තම්මැන්නාකන්ද ලිපිය) යන දෙදෙනා මහරජ යන විරුදය දරමින් මෙරට පාලනය ගෙනයාම
  * සාහිත්‍ය මූලාශ්‍රයවලින් අනාවරණය නොවන ක්‍රි.පූ. දෙවෙනි සියවසට පෙර පැවැති ප්‍රාදේශීය පාලන ඒකක රැසක් ගැන සෙල්ලිපිවලින් තොරතුරු ලැබීම

උදාහරණ ඃ
  * බඹරගල, ගෝණවත්ත, ඇඹුල්ඇඹේ, නැට්ටුකන්ද, පෙරියපුලියන්කුලම, කුසලානකන්ද, සිතුල්පව්ව
  * ශ්‍රී ලංකාවේ රාජත්වයේ ආරම්භය සාහිත්‍ය මූලාශ්‍රයවල ඉන්දියානු මූලයකට සම්බන්ධ කොට ඇත. එහෙත් සෙල්ලිපිවල සඳහන් තොරතුරු අනුව පැහැදිලි වන්නේ ලංකාවේ රාජත්වය දේශීය වශයෙන් පරිණාමයට හසුවෙමින් ඇති වූවක් බව යි.

උදාහරණ:
  * ගමණි, පරුමක, මපරුමුක, රජ, මහරජ යන නාමයන්
  * ශිලා ලේඛනවල ව්‍යාප්තිය අනුව රජෙකුගේ බලය විහිදීගිය ප්‍රදේශ පිළිබඳ ව නිගමනය කිරීම පහසු වීම

උදාහරණ ඃ
  * වසභ රජුගේ නම සඳහන් සෙල්ලිපි යාපනයේ වල්ලිපුරම්හි ද, මඩකලපුවේ කාසිමොටෙයිහි ද, දකුණේ තිස්සමහාරාමයේ ද, කුරුණෑගල ගලඋඩ නම් ස්ථානයේද, තම්මැන්නාවේ හා හබැස්සේ ද හමුව තිබීමෙන් වසභ රජුගේ බලය ලංකාව පුරා ම පැතිර තිබූ බව පැහැදිලි වීම
  * මෙරට පැවැති දේශීය හා විදේශීය වෙළෙඳාම පිළිබඳ ව, ආර්ථික තත්ත්වය පිළිබඳ ව තොරතුරු හැදෑරීමට ශිලා ලේඛන වැදගත් වීම

* තෝනිගල ලිපිය - වී, මුං, උඳු වැනි ධාන්‍ය වර්ග වර්තමාන බැංකුවලට සමාන ආයතනවල තැන්පත් කර තිබූ බවත් ඒ සඳහා පොළී ගෙවූ බවත් සඳහන් වීම

* ලබුඇටබැඳිගල ලිපිය - වෙළෙඳ ශ්‍රේණි හා ඒවායේ ක්‍රියාකාරිත්වය
* හෝපිටිගමුව ලිපිය - වෙළෙඳපළක පාලනය හා නීතිරීති

- ගොවිතැන් කටයුතු හා වෙනත් කර්මාන්ත පිළිබඳ ව සෙල්ලිපිවල සඳහන් වීම
  උදාහරණ :
  * තෝනිගල සෙල්ලිපිය - වසරකට කන්න තුනක් වී වගා කිරීම
  * වෙස්සගිරි සෙල්ලිපිය - එක් එක් කන්නවල වගා කළ යුතු ධාන්‍ය වර්ග පිළිබඳ ව රටේ පාලකයා විසින් තීරණය කර ඇති බවට සාධක තිබීම. (සිහිනැටි වපුරනු මිස මුං ඇට නොවපුරනු ඉසා)
  * අනුරාධපුර යුගයේ වැව් අමුණු පාලනය සඳහා යොදාගත් ආයතනයක් පිළිබඳ ව ශිලා ලේඛන වල තොරතුරු සඳහන් වීම. එමෙන් ම ජලසම්පාදනය වෙනුවෙන් අය කළ බොජකපති, දකපති වැනි බදු වර්ග පිළිබඳ ව සඳහන් වීම

- ලංකාවේ පැවති වෙනත් කර්මාන්ත පිළිබඳ ව සෙල්ලිපිවල සඳහන් වීම

  * කෝන්ගල ලිපිය - මනෝකර (මැණික් කපන්නන්)
  * මේගිරිය හා පහතමුල්ල විහාර ලිපි - කුබකර (කුඹල් කරුවෝ)
  * තලදර (ස්වර්ණාභරණ නිපදවන්නන්, කබර (යකඩ වැඩ කරන්නන්) දටික (ඇත් දළ කැටයම් කරුවන්) පෙහෙකර (රෙදි නිපදවන්නන්) ගැන ශිලා ලිපිවල සඳහන් වීම

**අධිකරණ කටයුතු**

* සිතුල්පව්ව ශිලා ලේඛනය - අධිකරණයෙන් ලද දඩ මුදල් සිතුල්පව්ව විහාරයට පූජා කිරීම
* වේවැල්කැටියශිලාලේඛන-ගමකයුක්තියපසිඳලීමපිළිබඳ නීතිරීති



තෝනිගල සෙල්ලිපිය

**ඇගයීම -01**

**අංක 01 සිට 03 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය කුමක් දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න.**

01. 1. සිලප්පදිකාරම් 2. පට්නප්පාලෙයි 3. පදිර්රුප්පත්තු 4. තිරුවාලංගාඩු 5. මණිමේකලයි (.......)

02. 1. වල්ලිපුරම් රන් සන්නස 2. පනාකඩුව සන්නස 3. කොණ්ඩට්ටවාන් ලිපිය
4. අලහබාද් ප්‍රශස්තිය 5. පුලියන්කුලම ටැම් ලිපිය (.......)

03. 1. ආර්පාක්කම් ලිපිය 2. පල්ලවරායන් පෙට්ටෙයි ලිපිය 3. තිරුවාලංගාඩු ලිපිය
4. විදම්බරම් ලිපිය 5. රාමේශ්වරම් ලිපිය (.......)

**අංක 04 - 05 ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

04. පළමුවෙනි පරාක්‍රමබාහු හා දෙවෙනි ගජබාහු අතර ඇති වූ ආරවුල සමථයකට පත් කිරීම පිළිබඳ ව ඇති කර ගන්නා ලද ගිවිසුමක වාර්තාව සඳහන් වන්නේ පහත සඳහන් කවර අභිලේඛනයේ ද?

1. දෙවනගල පර්වත ලිපිය 2. ගල්විහාර ලිපිය 3. අඹගමු සෙල්ලිපිය
4. සංගමු විහාර සෙල්ලිපිය 5. මිනිපේ සෙල්ලිපිය (.......)

05. ලංකා පුරාවෘත්තය නැමැති ග්‍රන්ථයේ කතුවරයා කවරෙක් ද?
1. රිබෙයිරෝ 2. ක්වේරෝස් 3. ද කුටෝ 4. බැල්දියස් 5. වැලන්ටයින් (.......)

**අංක 06 - 07 ප්‍රශ්නවල නාම ප්‍රකාශන සමූහයක් x හා y තීරුවල දී ඇත. එම තීරු එකිනෙක ගැළපූ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි, නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා තිත් ඉරමත ලියන්න.**

06.

| X | Y |
|---|---|
| i. රසවාහිනිය | A. මයිල්වාක්නපුලවර් |
| i. පරෙවි සන්දේශය | B. වේදේහ හිමි |
| iii. සද්ධර්මරත්නාවලිය | C. වීදාගම මෛත්‍රිය මහානාහිමි |
| iv. ලෝවැඩ සඟරාව | D. ශ්‍රී රාහුල හිමි |
| v. යාල්පාන වෛපවමාලෛ | E. ධර්මසේන හිමි |

1. BEDAC 2. BADCE 3. BACDE 4. BEDCA 5. BDECA (.........)

07.

| X | Y |
|---|---|
| i. වල්ලිපුරම් | A. රන්සන්නස |
| i. හෝපිටිගමුව | B. කතිකාවත |
| iii. ගල්විහාර | C. ටැම් ලිපිය |
| iv. තෝනිගල | D. තඹ සන්නස |
| v. පණාකඩුව | E. පර්වත ලිපිය |

1. ABCDE 2. AEBDE 3. ACDEB 4. ACBED 5. ADECB (.........)

**අංක 09 -10 ප්‍රශ්නවල නාම ප්‍රකාශන අතර එකිනෙකට නොගැළපෙන නාම යුගලයක් ඇත. නොගැළපෙන නාම යුගලය හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

09.

1. වේවැල්කැටිය ලිපිය - ගම් සමූහවල යුක්තිය පසිඳලීම පිළිබඳ තොරතුරු
2. මිහින්තලා පුවරු ලිපිය - භික්ෂූන් සඳහා උපදෙස් හා නීතිරීති
3. බදුල්ල (හෝපිටිගමුව) පුවරු ලිපිය - වෙළෙඳපළක කළමනාකරණය
4. ගොඩවාය ලිපිය - මහායාන ධර්ම පිටපත්
5. වල්ලිපුරම් රන්පත - යාපන අර්ධ ද්වීපයේ විහාරයක් ඉදි කිරීම සම්බන්ධ ව

(.........)

10.

1. විසුද්ධිමග්ග - මහානාම හිමි
2. නිකාය සංග්‍රහය - දේවරක්ඛිත ජයබාහු ධම්මරක්ඛිත හිමි
3. සිංහල බෝධිවංසය - විල්ගම්මුල හිමි
4. සාරාර්ථ සංග්‍රහය - බුද්ධඝෝෂ හිමි
5. දම්පියා අටුවා ගැටපදය - පස්වැනි කාශ්‍යප රජු (.........)

**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. ''මහාවංසයේ ප්‍රථම වෙළුම මහාවිහාරයේ වංසකථාව වේ''

i. මහාවංසයේ ප්‍රථම වෙළුමේ කර්තෘවරයා නම් කරන්න. (ලකුණු 01)
ii. මහාවංසයේ ප්‍රථම වෙළුමේ අන්තර්ගත පරිච්ඡේද සංඛ්‍යාව කොපමණ ද? (ලකුණු 02)
iii. මහාවංසයේ ප්‍රථම වෙළුමට ලියන ලද ටීකාව නම් කරන්න. (ලකුණු 02)
iv. මහාවංසයේ විස්තර කර ඇති පරිදි මෙරට ඉදි කරන ලද ප්‍රථම ස්තූපය නම් කරන්න. (ලකුණු 02)
v. ඉහත සඳහන් ප්‍රකාශය විචාරාත්මක ව විස්තර කරන්න. (ලකුණු 08)

02. අනුරාධපුර යුගය අවසානය දක්වා ශ්‍රී ලංකා ඉතිහාසය හැදෑරීමෙහිලා පාලි වංසකතාවලින් ලැබෙන තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවලින් කහවුරුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 14)

03. මහසෙන් රාජ්‍ය කාලය අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමෙහි ලා පාලි වංසකථාවල වැදගත්කම ප්‍රමාණ කරන්න. (ලකුණු 14)

04. අනුරාධපුර සමයේ දේශපාලන ඉතිහාසය හැදෑරීමෙහි ලා මූලාශ්‍රයයක් වශයෙන් සෙල්ලිපිවල වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 14)

## 4. ජනාවාසවල ආරම්භය සහ ව්‍යාප්තිය

කවර සමාජයක වුව ද අකුරු ලිවීම ආරම්භ කිරීමට පෙර තිබූ යුගය ප්‍රාග් ඉතිහාස අවධිය ලෙස හැඳින්වේ. මිනිසාගේ එදිනෙදා භාවිතයට අවශ්‍ය වන මෙවලම් තනා ගැනීම සඳහා ගල් භාවිත කළ බැවින් එම අවධිය ගල් යුගය හෙවත් ශිලා යුගය නමින් හැඳින්වේ. මානව පරිණාමයේ සිට (අදින් වසර මිලියන 2 , 4 පෙර සිට) නූතන අවධිය තෙක් මානව ගමන් මගේ වැඩි ම කාල පරිච්ඡේදයක් ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් වේ. මෙම කාල වකවනුව තුළ මානවයන් භාවිත කළ ගල් ආයුධවල තාක්ෂණික වර්ධනය පදනම් කොටගෙන ප්‍රධාන අවධි දෙකකට බෙදා දක්වා ඇත. එහි පුරාණතම අවධියේ විශාල ගල් මෙවලම් භාවිතා වූ අතර එය පුරාතන ශිලා යුගය ලෙස ද මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ ශිලා මෙවලම් භාවිත වූ දෙවෙනි අවධිය මධ්‍යම ශිලා යුගය ලෙස ද හැඳින්වේ.

මෙරට ජීවත් වූ මුල් ම ප්‍රාග් ඓතිහාසික මානවයා හෝමෝ සේපියන් (සාපියන්) නමින් හැඳින්වේ. මීට වසර එක් ලක්ෂ විසිපන්දහසකට පමණ පෙර ආසියානු මහාද්වීපය හරහා හෝ ඉන්දියානු සාගරය හරහා හෝ මුල් මානව ජන කණ්ඩායම් මෙරටට සංක්‍රමණය වන්නට ඇතැයි සැලකේ. දනට සිදු කරන ලද පර්යේෂණයන්ට අනුව මෙරට ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයා දඩයමින් හා තැනින් තැනට ඇවිද යමින් අහාර එක් රැස් කරමින් ජීවත් වූ පිරිසක් බව අනාවරණය වී ඇත.

ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පසු මිනිසා පූර්ව ඓතිහාසික අවධියට අවතීර්ණ විය. ගල් ආයුධ භාවිතය අවම කොට ඒ සඳහා ලෝහ භාවිත කිරීමත්, ගොවිතැන් කටයුතු ආරම්භ කිරීමත්, සංචාරක ජීවිතයෙන් මිදී ස්ථිර ජනාවාස ඉදි කර ගැනීමට උත්සාහ දැරීමත් මෙම අවධියේ දී කැපී පෙනුණ ප්‍රධාන ලක්ෂණ විය. මළවුන් වෙනුවෙන් සුසාන ඉදි කිරීම සංස්කෘතියේ විශේෂ ලක්ෂණයකි. ක්‍රි.පූ. 6 වන සියවස පමණ කාල වකවානුවක සිට ඉන්දියාවේ සිට මුල් ජන කණ්ඩායම් පැමිණීම හා මෙරට ගංගා ආශ්‍රිත ව ජනපද පිහිටුවා ගැනීම ඓතිහාසික යුගයේ ආරම්භය ලෙස සැලකේ.

**නිපුණතාව** : • ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම්** : 4.1. ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : **05 යි.**

**ඉගෙනුම් පල** :
- ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික අවධිය පැහැදිලි කරයි.
- ඉතා පැරණි කාලයේ සිට ශ්‍රී ලංකාවේ ජනාවාස තිබූ බව අගය කරයි.
- ප්‍රාග් ඓතිහාසික මානවයා හා ඔවුන්ගේ සංස්කෘතික ලක්ෂණ විස්තර කරයි.
- ප්‍රාග් ඓතිහාසික ජනාවාස සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

පුරා ශිලා යුගය
- පහළ පුරා ශිලා යුගය (හමු වී ඇති සාධක අවිනිශ්චිත වේ)
- මධ්‍ය පුරාශිලා යුගය(අදින් වසර 125000 පෙරසිට)
- ඉහළ පුරා ශිලා යුගය (සාධක හමු නොවේ)

## 4.1 ප්‍රාග් ඓතිහාසික යුගය

- ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සහ ජනාවාස පිහිටුවීමට අදාළ ප්‍රධාන අවධි දෙක කි.
  මධ්‍ය ශිලා යුගය ඃ අදින් වසර 40,000ට පමණ පෙර සිට

## ප්‍රාග් ඓතිහාසික යුගය හා ජනාවාස

- පුරා ශිලා යුගය
  - පහළ පුරා ශිලා යුගය
  * පහළ පුරා ශිලා යුගය ලෙස හැඳින්වෙන මෙරට මුල් කාලීන ප්‍රාග් ඓතිහාසික ජනාවාස ව්‍යාප්ත වූ ප්‍රධාන පාරිසරික කලාප දෙකකි.
    - අර්ධ ශුෂ්ක කලාපයේ වෙරළාශ්‍රිත ප්‍රදේශ (ඉරණමඩු පාංශු කලාපය)
    - පහත රට තෙත් කලාපයට අයත් රත්නපුර අවට නිම්න ප්‍රදේශ
  * පුරාතන ශිලා යුගයේ ජනාවාස වලින් මෙතෙක් හමු ව ඇත්තේ එම මානවයන් භාවිතා කරන ලද ශිලා මෙවලම් පමණි.
  * වැලි සහ බොරළු මිශ්‍ර වූ තද රතු පාංශු කලාපයකින් සමන්විත ඉරණමඩු සංයුතිය හා වැලි, රොන්මඩ හා මැටි වලින් සමන්විත රත්නපුර පස් ස්ථර මීට වසර ලක්ෂ ගණනකට පෙර නිර්මාණය වී තිබේ.



ඉරණමඩු පාංශු කලාපය

* මෙරට මුල් කාලීන මානවයන් භාවිත කළ රළු ගල් මෙවලම් හා මෙරට විසූ දැනට වඳ වී ගිය සතුන්ගේ අස්ථි කොටස් රාශියක් මෙම පැරණි පස් ස්ථර වලින් හමු ව ඇත.
* එහෙත් මෙතෙක් ලැබී ඇති සාධක මෙම යුගය පිළිබඳ විවරණය කිරීමට ප්‍රමාණවත් නැත.

- මධ්‍ය පුරා ශිලා යුගය
  * අදින් වසර 125000 සිට 75000ක පෙර කාල සීමාව මෙරට ආදි ම ප්‍රාග් ජනාවාස පිළිබඳ සාධක හමු වී ඇත. එම ජනාවාස මධ්‍ය පුරාතන ශිලා යුගයට අයත් වේ.
  * එම ජනාවාස සියල්ල ම හමු වී ඇත්තේ බූන්දල, පතිරාජවෙල, වැල්ලෙගංගොඩ, මිනිහාගල්කන්ද යන අර්ධ ශුෂ්ක ප්‍රදේශවල වෙරළබඩ විවෘත ජනාවාස වශයෙනි.

- ඉහළ පුරා ශිලා යුගය
  * මේ පිළිබඳ සාධක හමු වී නැත

- **මධ්‍ය ශිලා යුගය හා ජනාවාස**

  - ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා යුගය අදින් වසර 40,000කට පමණ පෙර ආරම්භ වීම
  - මධ්‍ය ශිලා අවධිය වන විට දිවයිනේ සෑම පාරිසරික කලාපයක ම ප්‍රාග් ඓතිහාසක ජනාවාස ව්‍යාප්ත වී තිබූ බව අනාවරණය වී ඇත
  - මධ්‍ය ශිලා යුගයේ ජීවත් වූ මානවයා පොදුවේ බලංගොඩ මානවයා නමින් හැඳින්වේ
  - මූලික ලක්ෂණයන්ට අනුව ප්‍රාග් ඓතිහාසික ජනාවාස වර්ග දෙකකි.
    * ස්වාභාවික ගල්ලෙන්
    * විවෘත එළිමහන් ස්ථාන



බෙලිලෙන


- ජනාවාස තෝරා ගැනීමේ දී (ආහාර සපයා ගැනීමේ පහසුව හා ජලය සපයා ගැනීමේ පහසු ව යන) ප්‍රධාන කරුණු දෙකක් පිළිබඳ ව සලකා බලා ඇත.
- මධ්‍ය ශිලා යුගය වන විට ප්‍රාග් ඓතිහාසික ජනාවාස විවිධ පාරිසරික කලාපයන් තුළ ව්‍යාප්ත ව තිබූ බව අනාවරණය වී තිබේ.
  * බූන්දල, විල්පත්තු, පල්ලෙමලල ආදි වෙරළාශ්‍රිත විවෘත ජනාවාස
  * පාහියන්ගල, බටදොඹ ලෙන, බෙලිලෙන, අලවල ලෙන ආදී පහත රට තෙත් කලාපීය ස්වාභාවික ගල්ලෙන් තුළ වූ ජනාවාස
  * පොතාන, අලිගල වැනි වියළි කලාපීය ස්වාභාවික ගල්ලෙන් තුළ වූ ජනාවාස
  * බෙල්ලන්බැඳිපැලැස්ස, හුංගම, මාන්කුලම් ආදි පහත රට වියළි කලාපීය විවෘත ජනාවාස
  * බණ්ඩාරවෙල, වැලිමඩ, නාවලපිටිය වැනි මධ්‍යම කඳුකරය ආශ්‍රිත විවෘත දඩයම් ස්ථාන
  * හෝර්ටන් තැන්න, නකල්ස් වැනි ඉහළ කඳුකර තණ බිම්



කුරුවිට බටදොඹලෙන

- මධ්‍ය ශිලා යුගයේ ප්‍රධාන ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන හා කාල වකවානු
  - පාහියන්ගල අදින් වසර 41,000
  - කුරුවිට බටදොඹලෙන අදින් වසර 36,000
  - කිතුල්ගල බෙලිලෙන අදින් වසර 31,000
  - ගම්පහ අලවලලෙන අදින් වසර 14,000
  - බෙල්ලෙන්බැඳිපැලැස්ස අදින් වසර 12,000
  - සීගිරිය පොතාන අදින් වසර 5800
  - මාතොට (මන්නාරම) අදින් වසර 3,800

## මුල් ජනාවාස


යොමුව
කැණීම් කරන ලද ස්ථාන
ප්‍රාග් ඓතිහාසික ස්ථාන
A - අර්ධ ශුෂ්ක කලාපය
B - පහතරට වියළි කලාපය
C - පහතරට අතරමැද වියළි කලාපය
D - තෙත් කලාපය
E - කඳුරට අතරමැදි කලාපය
F - ශුෂ්ක කලාපය
මාතොට
අලිගල
පොතාන
පිදුරංගල
අත්තනගොඩ අළුලෙන
කිතුල්ගල බෙලිලෙන
මානියම්ගම
බටදොඹලෙන
පාහියන්ගල
බෙල්ලන්බැඳිපැලැස්ස
දියවින්න
රාවණාඇල්ල
මිනිහාගල්කන්ද
බුන්දල
79°30'0"E
80°0'0"E
80°30'0"E
81°0'0"E
81°30'0"E
82°0'0"E
9°30'0"N
9°0'0"N
8°30'0"N
8°0'0"N
7°30'0"N
7°0'0"N
6°30'0"N
6°0'0"N

**ප්‍රාග් ඓතිහාසික තාක්ෂණ**

- ප්‍රාග් ඓතිහාසික මානවයාගේ තාක්ෂණය මුළුමනින් ම පාහේ ශිලා මෙවලම් මත ගොඩනැගී ඇත
- පුරාතන ශිලා යුගයට අයත් විශාල ප්‍රමාණයේ රළු මෙවලම් රත්නපුර මැණික් පතල්වලින් හා ඉරණමඩු සංයුතියෙන් හමු වේ.
- මධ්‍ය ශිලා යුගයේ ක්ෂුද්‍ර ශිලා මෙවලම් පිළිබඳ සාධක මීට වසර 40,000ට පමණ පෙර සිට හමු වේ. ඒවා ඉතා කුඩාවට හා සියුම් ව නිර්මාණය කර ඇති නිසා ක්ෂුද්‍ර මෙවලම් ලෙස හැඳින්වේ.
- ත්‍රිකෝණාකාර, චන්ද්‍රාකාර ආදි විවිධ ජ්‍යාමිතික හැඩතලවලින් යුත් ක්ෂුද්‍ර මෙවලම් සුවිශේෂී තාක්ෂණික දක්ෂතාවන් විදහාපාන නිර්මාණ ලෙස සැලකේ.
- මෙවලම් නිපදවා ගැනීම සඳහා බහුල වශයෙන් තිරිවාණා අමුද්‍රව්‍ය යොදාගනෙ ඇති අතර සුළු වශයෙන් වර්ණවත් කහඳ ගල් භාවිත කර ඇත.
- සතුන් දඩයම් කිරීමේ සිට කැපීම්, සීරීම්, තැළීම්, හැරීම වැනි කටයුතු සඳහා උචිත වන අයුරින් මෙවලම් ගොනුව සකසා තිබේ.
- සතුන්ගේ අස්ථි කොටස් යොදා ගනිමින් තියුණු උල් ආයුධ නිපදවා තිබේ.

**ජීවන රටාව**

- දඩයම් දිවි පෙවෙත ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ ප්‍රධාන ලක්ෂණය විය
- දඩයමට අමතර ව ආහාරයට ගත හැකි වෙනත් ශාකමය ආහාර එකතු කරමින් සංචාරක ජීවිකාවක් ගතකොට ඇත.
- ඔවුහු වර්ෂා කාලයේ දී ආරක්ෂාව පතා ස්වාභාවික ගල්ලෙන් තුළට ඒකරාශි වූහ.
- දඩයම් කිරීම බොහෝ විට සිදු කරන්නට ඇත්තේ පිරිමින් විසින් වූ අතර ඔවුහු තනි තනි ව හෝ කණ්ඩායම් වශයෙන් හෝ එම කටයුතුවල යෙදෙන්නට ඇත.
- මධ්‍ය ශිලා යුගයේ මානව ජන ඝනත්වය සැම වර්ග කි.මී. 10ට තනි පුද්ගලයෙකු හෝ සැම වර්ග කි.මී. 50 කට තනි න්‍යෂ්ටික පවුලක් ලෙස සිටින්නට ඇතැයි විශ්වාස කෙරේ.
- ස්වාභාවික ගල්ලෙන් තුළ වාසය කළ ජනගහනය ඉතා සීමිත වූ අතර කුඩා පවුලක් ලෙස ජීවත් ව ඇත.
- වියළි කාලයේදී විවෘත ස්ථානවල තාවකාලික ව අටවාගත් කඳවුරුවල කල් ගත කළ බවට සාධක තිබේ.
- බොහෝ අවස්ථාවල දී තමන්ගේ මියගිය ඥාතීන්ගේ මළ සිරුරු ගුහා ඇතුළත වළ දමා තිබේ කිතුල්ගල බෙලි ලෙන තුළින් එලෙස මිහිදන් කළ පුද්ගලයන් 12 දෙනෙකුවගේ ඇටසැකිලි සොයා ගෙන ඇත.


**ආහාර රටාව**

- ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාරයේ ස්වභාවය ඔවුන් ජීවත් වන පරිසරයෙන් ලබා ගත හැකි ව තිබූ සම්පත්වල ස්වභාවය අනුව තීරණය වී ඇත.
- මාංසමය ආහාර අතර දඩයමින් ලබා ගත් ඌරා, ඉත්තෑවා, ගෝනා, මුවා, තලගොයා, වඳුරා, වළි කුකුළා යන සතුන්ගේ මස් ප්‍රධාන විය.
- මීට අමතර ව මිරිදිය මසුන්, කකුළුවන්, ඉබ්බන් මෙන් ම විවිධ පක්ෂි වර්ග ද ආහාරය සඳහා යොදා ගැනිණ.
- මුහුදු බෙල්ලන් සහ ගස් ගොළු බෙල්ලන් මෙකල ජනප්‍රිය ආහාරයක් ලෙස යොදා ගෙන ඇත.
- කලපු ආශ්‍රිත ව ජීවත් වන මුහුදු බෙල්ලන් රට අභ්‍යන්තරයට ගෙන ගොස් ඇත්තේ ලුණු අවශ්‍යතාව සපුරාගැනීම සඳහා වන්නට ඇතැයි විශ්වාස කෙරේ.

- ශාකමය ආහාර වශයෙන් වල්දෙල්, වල් කෙසෙල් 'කැකුණ ඇට' කටු අල, ගෝනල වැනි අල වර්ග හා මී පැණි ද භාවිත කොට ඇත.
- මීට වසර 13,000කට පමණ පෙර කඳුකරය ආශ්‍රිත ව ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයන් බාර්ලි වගා කොට ආහාර සඳහා යොදා ගත් බව හෝර්ටන් තැන්න ආශ්‍රිත ව සිදු කෙරුණු පරාග විද්‍යාත්මක පර්යේෂණවලින් අනාවරණය වී තිබේ.
- බලංගොඩ මානවයා ගින්දර භාවිතය දැන සිටි බැවින් මස් මාංස ආදිය පුලුස්සා ආහාරයට ගන්නට ඇති බව සිතිය හැකි ය.

### අභිචාර ක්‍රම

- අභිචාර ක්‍රම පිළිබඳ පැහැදිලි සාධක හමු වන්නේ මළවුන් තැන්පත් කිරීමේ දී ය.
- කෙනෙකු මිය ගිය පසු සිරුරේ මාංස දිය වන තුරු කැලයට දමා ඇට සැකිල්ල ගුහාව තුළට ගෙනවිත් වළ දමා තිබේ.
- සැකිල්ල වළ දැමීමට පෙර හිස් කබලේ සහ අස්ථි මතු පිට ගුරු ගල් වර්ණ (රතු) ආලේප කර ඇත්තේ ආගමික ඇදහිලි විශ්වාස අනුව බව විශ්වාස කෙරේ.
- ගුරු ගල් ආලේප කළ බවට පාහියංගල හා රාවණා ඇල්ල ගුහා ආශ්‍රිත ව සාධක හමු වී ඇත.



දෙදණ ලඟින් නමා වකුටු වකුටු කර මිහිදන් කල සැකිල්ලක්

- ලී දඬුවක් හෝ අං කැබැල්ලක් හෝ ආධාරයෙන් නොගැඹුරු වටකුරු කුඩා වළක් හාරා ඒ තුළ සිරුර තැන්පත් කොට කෙළ රොඩුවලින් හෝ පස්වලින් හෝ වසා දමා තිබේ.
- කිතුල්ගල බෙලිලෙනෙන් එලෙස මිහිදන් කළ මානවයන් 12 දෙනෙකුගේ ඇටසැකිලි සොයා ගෙන තිබේ.
- මෙතෙක් හමු වී ඇති සෑම සැකිල්ලක් ම වළ දමා ඇත්තේ දෙදණ ළඟින් නමා වකුටු කිරීමෙනි.
- එසේ වකුටු කරන්නට ඇත්තේ කිසියම් අභිචාරයක් ලෙසින් හෝ ලෙන තුළ ඉඩ කඩ සීමිත වූ නිසාවෙන් විය හැකි ය.
- බෙලිකටුවලින් හා සත්ත්ව අස්ථි කොටස්වලින් තැනූ පබළු වැනි දෑ ආභරණ ලෙස භාවිත කර ඇත.

**ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ශරීර ස්වභාවය**

- මේ වන විට කැණීම් මඟින් සොයා ගෙන ඇති බලංගොඩ මානවයන්ගේ ඇටසැකිලි ප්‍රමාණය 75 ක් පමණ වේ.
- ඒවා සියල්ල ම අදින් වසර 38,000 සිට 5,500 කාල සීමාවක මෙරට ජීවත් වූ පුද්ගලයන්ගේ බව පිළිගනු ලැබේ.
- හිස් කබලේ ප්‍රමාණය පිරිමි පුද්ගලයකුගේ ඝන සෙ.මී. 1600ක් ද ගැහැනු අයගේ ඝන සෙ.මී. 920ක් ද පමණ වේ.
- පිරිමි පුද්ගලයකුගේ උස උපරිම සෙ.මී. 174ක් ද ගැහැනු අයෙකුගේ උපරිම උස සෙ.මී. 166ක 'ද වේ. වැඩුණු පුද්ගලයකුගේ හිස් කබලේ අස්ථි ඝනකමය. ඇහිබැම ඉදිරියට නෙරා ඇත. නහය පැතලිය. හකු සහ දත් විශාල ය. බෙල්ල කෙටි ය.
- සමස්තයක් ලෙස බලංගොඩ මානවයා මිටි මහත ස්වරූපයකින් යුක්ත ව සිටි පුද්ගලයෙකි.
- බලංගොඩ මානවයාගේ උපරිම ආයු කාලය වසර 35 - 40 ක් පමණ වන්නට ඇත.

ඇගයීම -01

1. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ජනාවාසයන්හි ස්වභාවය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

2. ප්‍රාග් ඓතිහාසික යුගය යනුවෙන් අදහස් වන්නේ කුමක් දැයි පැහැදිලි කොට ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාව කෙබඳු දැයි විමර්ශනය කරන්න.

3. පහත සඳහන් ස්ථාන ශ්‍රී ලංකාවේ සිතියමක ලකුණු කරන්න.
   ඉරණමඩු , බුන්දල, පතිරාජවෙල, මිනිහාගල්කන්ද, පාහියන්ගල, අලවල, පොතාන, අලිගල , මාන්කුලම්, මාතොට

**නිපුණතා මට්ටම :** 4.2. පූර්ව ඓතිහාසික යුගයේ මානව ක්‍රියාකාරීත්වය පිළිබඳ සොයා බලයි.

**කාලච්ඡේද : 05 යි.**

**ඉගෙනුම් පල :**
- ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික අවධිය පැහැදිලි කරයි.
- පූර්ව ඓතිහාසික යුගයේ දියුණුව අගය කරයි.
- පූර්ව ඓතිහාසික යුගයට අයත් ස්ථාන සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

**පූර්ව ඓතිහාසික අවධිය**

- ප්‍රාග් ඓතිහාසික අවධියත් ඓතිහාසික අවධියත් අතර කාල සීමාව පූර්ව ඓතිහාසික අවධිය ලෙස සැලකේ.
- මෙම අවධියේ ඓතිහාසික යුගයේ ජීවන රටාවට මිනිසා හැඩ ගැසීම ආරම්භ විය.
- ක්‍රි.පූ. 5000 යේ කාල සීමාවෙන් පසු ව මෙම අවස්ථාවට මිනිසා යොමු වීම සිදු වූ බව සැලකේ.
- ක්‍රි.පූ. 1800 පමණ සිට මැටි වළන් භාවිතය, ශාකමය වගාව හා පරිභෝජනය පිළිබඳ සාධක දොරවක, පොතාන, අලිගල යන ස්ථාන හමු වී ඇත.
- ස්ථිර ජනාවාස ඇතිකර ගැනීම, යකඩ තාක්ෂණය, මැටි බඳුන් නිපදවීම, ගෘහස්ථ ගව සහ අශ්ව පාලනය, වී වගාව ආදිය මෙම යුගයේ කැපී පෙනුණ ලක්ෂණ විය.

**පූර්ව ඓතිහාසික ජනාවාස**

- ප්‍රාග් ඓතිහාසික යුගයේ ගත කළ සංචාරක දඩයම් ජීවිතයෙන් මිදී මෙම අවධියේ කෘෂිකාර්මික කටයුතු සඳහා ස්ථිර වාසස්ථාන ගොඩනගා ගැනීම සිදු කෙරේ.
- බොහෝ ජනාවාස වියළි කලාපයේ ගංගා ආශ්‍රිත ව මෙන්ම කඳුකර ප්‍රදේශ ආශ්‍රිත ව ද ව්‍යාප්ත වී පැවති බවට සාධක ඇත.
- ක්‍රි.පූ. 900 දී අනුරාධපුරයේ පැවති පූර්ව ඓතිහාසික ජනාවාසය හෙ.යා. 10ක් පමණ ප්‍රදේශයක ව්‍යාප්තව පැවති අතර ක්‍රි.පූ. 700-600 වන විට හෙ.යා. 50 දක්වා වර්ධනය වි තිබිණි.
- උඩරංචාමඩම ප්‍රදේශයෙන් හමු වූ ජනාවාස වරිච්චි මැටියෙන් තැනූ බිත්ති හා වහල කොළ අතු යොදා සරල ව ඉදිකර තිබූ බවට සාධක ලැබී ඇත.
- අනුරාධපුර ඇතුළු නුවරින් හමු වූ නිවාස වෘත්තාකාර සහ හතරැස් ආකාරයෙන් තිබී ඇත

**තාක්ෂණය**

- ගල් ආයුධ තාක්ෂණයෙන් මිදී යකඩ තාක්ෂණයට යොමු වීම කැපී පෙනේ.
- කෘෂි කර්මාන්තයේ දී අවශ්‍ය උදළු, නගුල, පිහිය ආදි උපකරණ යකඩ භාවිතයෙන් නිපදවා ඇත.
- සකපෝරුව භාවිතයෙන් උසස් තාක්ෂණයෙන් යුත් විචිත්‍රවත් මැටි බඳුන් නිපදවා ඇත.
- මැටි බඳුන් ආහාර පිසීම සඳහා මෙන් ම මළවුන්ගේ භස්මාවශේෂ තැන්පත් කිරීම සඳහා ද යොදා ගෙන ඇත.
- තඹ ලෝහය භාවිත කරමින් පබළු ආදි පළඳනාවන් ද නිර්මානය කර තිබිණි.
- මෙරට නිපදවූ කාලරක්ත මැටි බඳුන් ඉන්දියානු කාලරක්ත මැටි බඳුන් හා සමාන කමක් දක්වයි.



අනුරාධපුර ඇතුල් නුවරින් හමු වූ නිවාසවක්



පොම්පරිප්පු වලින් හමුවූ මැටි බඳුනක්



රංචාමඩම මැටි බඳුනක්

**සංස්කෘතිය**

- විශාල ශිලා පදනම් කරගනිමින් මළවුන් වෙනුවෙන් සොහොන් නිර්මාණය කිරීම පූර්ව ඓතිහාසික සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණය විය
- දනට පූර්ව ඓතිහාසික යුගයට අයත් සොහොන් බිම් 50කට වැඩි ප්‍රමාණයක් සොයා ගෙන ඇත
- මියගිය අයගේ භස්මාවශේෂ ඔහු භාවිත කළ උපකරණ හා ආහාර ද්‍රව්‍ය කුඩා හෝ විශාල හෝ මැටි බඳුන් තුළ බහා විශාල පාෂාණ පතුරුවලින් ආවරණය කිරීම ප්‍රධාන චාරිත්‍ර විධිය වූ බවට සාධක ඇත
- මළවුන් තැන්පත් කිරීම ක්‍රම කීපයකට සිදු වී ඇත

| | |
|---|---|
| * ශිලා මංජුසා ක්‍රමය | * විස්තෘත ක්‍රමය |
| * බරණී ක්‍රමය | * වල ක්‍රමය |
| * මැටි ඔරු ක්‍රමය | * ශිලා කේතුක ක්‍රමය |

- වාර්තා වී ඇති වැඩි ප්‍රමාණය ශිලා මංජුසා සොහොන්, බරණී සොහොන් සහ මැටි ඔරු සොහොන් වේ
- ශිලා මංජුසා සෙහොන් යනුවෙන් හැඳින්වෙන්නේ ගල් පතුරු 4ක් හතර අතට තබා ඒ තුළ භස්මාවශේෂ සහිත බඳුන් තැන්පත් කොට උඩින් පැතලි ගල් පුවරුවකින් ආවරණය කිරීම යි. මෙම ක්‍රමයේ සොහොන් ඉබ්බන්කටුව, රඹෑව, යාන්ඔය නිම්නය ආදි ප්‍රදේශවලින් හමු වී ඇත.
- බරණී සුසාන ක්‍රමයට අනුව විශාල මැටි බඳුන් තබා ඒ තුළ කුඩා මැටි බඳුන් තැන්පත් කොට ගල් පියස්සකින් ආවරණය කෙරේ. මෙම වර්ගයේ සොහොන් පොම්පරිප්පුවෙන් හමු වී ඇත.
- මැටි ඔරු සුසාන ක්‍රමයේදී මැටිවලින් නිර්මාණය කරන ලද ඔරුවකට සමාන නිර්මාණයක් තුළ දේහය බහා ආදාහනය කර තිබේ. මෙම වර්ගයේ සොහොන් රංචාමඩම, නිකවලමුල්ල, හල්දුම්මුල්ල යන ප්‍රදේශ වලින් හමු වී ඇත.
- ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික සුසාන ක්‍රමවේද හා මැටි බඳුන් ඉන්දියානු සංස්කෘතිය හා සමාන බවක් දක්වයි.



ඉබ්බන්කටුව සුසාන - ශිලා මංජුසා ක්‍රමය



මැටි ඔරු ක්‍රමය



බරණී ක්‍රමය
**අනුව භාවිත කළ මැටි බඳුනක්**




ශිලා මංජුසා ක්‍රමය අනුව භස්මාවශේෂ හා භාවිත කළ භාණ්ඩ



ඉබ්බන්කටුව සොහොන් භූමිනේ හමු වූ මාලයක්

**ජීවන රටාව**

- දඩයම් ජීවිතය මුළුමනින් ම අතහැර නොදමූ නමුත් ප්‍රධාන වශයෙන් දඩයම් ජීවිතයෙන් මිදී ආහාර නිෂ්පාදනය හෙවත් ගොවිතැන පදනම් වූ ජීවිතයකට අවතීර්ණ විය.
- වී වගාව සහ හේන් වගාව ක්‍රමයෙන් ආරම්භ කොට ව්‍යාප්ත කෙරිණි.
  ආහාර භෝග වගාවත් සමඟ ස්ථිර ජනාවාස තනාගැනීම මඟින් කුඩා ගම්මාන ආරම්භ විය.
- ගොවිතැන, ප්‍රවාහණය හා ආහාර අවශ්‍යතා සඳහා ගවයා, අශ්වයා, එළුවා, යන සතුන් ගෘහාශ්‍රිතව ඇති කරනලදි.

ඇගයීම -01

1. ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පූර්ව ඓතිහාසික යුගය වෙන්කොට හඳුනාගත හැකි ලක්ෂණ පැහැදිලි කරන්න.

2. පහත මාතෘකා ඇසුරින් පූර්ව ඓතිහාසික යුගය පිළිබඳ විස්තර කරන්න.
   (1) ජනාවාස (2) තාක්ෂණය (3) ජීවන රටාව

3. පහත සඳහන් ස්ථාන ශ්‍රීලංකාවේ සිතියමක ලකුණු කරන්න
   ඉබ්බන්කටුව, රඹෑව, යාන්ඔය, පොම්පරිප්පු, රංචාමඩම, නිකවලමුල්ල

**නිපුණතා මට්ටම්** : 4.3. ඓතිහාසික යුගය හා එහි ජනාවාස පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : **05 යි.**

**ඉගෙනුම් පල** :
- ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගය පැහැදිලි කරයි.
- ඓතිහාසික යුගය ජනාවාස වූ ආකාරය විස්තර කරයි.
- ඓතිහාසික යුගයේ ජනාවාස සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

4.3. ඓතිහාසික යුගය

- ක්‍රි.පූ. 600-500 අතර කාල සීමාව ඓතිහාසික යුගයේ ආරම්භක කාල වකවනු ලෙස පිළිගැනේ.
- ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල සිට ජන කණ්ඩායම් මෙරටට සංක්‍රමණය වීම මෙකල කැපී පෙනෙන ලක්ෂණයකි.
- ඔවුන් මෙරටට පැමිණෙන විට සංවිධානාත්මක සමාජයක් මෙකල තිබී ඇත.
- මහාවංසය ප්‍රමුඛ වංසකථාවල සඳහන් වන ආකාරයට යක්ෂ, නාග, දේව සහ රාක්‍ෂ යන ගෝත්‍ර ජනතාව පූර්ව ඓතිහාසික යුගයේ සිට මෙරට වාසය කළ බව පෙනේ.
- වෙළෙඳාමට සහ ගොවිතැන් කටයුතුවලට උචිත පරිසරය හේතු කොට ඉන්දියානු ජන කණ්ඩායම් මෙරටට සංක්‍රමණය විය.
- ශ්‍රී ලංකාවට ඉන්දියානු ජන කණ්ඩායම් පැමිණීම හා ව්‍යාප්තිය පිළිබඳ ව සාහිත්‍යමය මූලාශ්‍රයන්හි තොරතුරු ඇතුළත් වේ.
  - දේශීය මූලාශ්‍රය - මහාවංසය, බෝධිවංසය වැනි කෘති
  - විදේශීය මූලාශ්‍රය - හියුං-සාංගේ වාර්තා, පාහියන්ගේ වාර්තා, රාමායණය, මහාභාරතය, දිව්‍යාවදානය
- ඉන්දියානු ජන කණ්ඩායම් මෙරටට පැමිණෙන කාල වකවනුවේ දී මෙරට ගොවිතැන මත පදනම් වූ ලෝහ තාක්ෂණය දන සිටි දියුණු සමාජයක් තිබූ බව සාහිත්‍යමය හා පුරා විද්‍යාත්මක සාධක අනුව සනාථ වී ඇත.
- මහාවංසයේ සඳහන් විජය ඇතුළු පිරිස මෙරටට පැමිණි අවධිය වන විට අනුරාධපුරය ජනාවාස හෙ.යා. 50 කට වඩා වැඩි ජනාවාසයක් ලෙස වර්ධනය වී තිබූ අතර එය නගරයක් දක්වා දියුණු වෙමින් පැවති බවට සාධක තිබේ.
- ඉන්දියානු ජන කණ්ඩායම් පැමිණි අනුපිළිවෙළ
  - විජය ඇතුළු පිරිස
  - මධුරාපුර කුමරිය ඇතුළු පිරිස
  - පණ්ඩුවාසදේව ඇතුළු පිරිස
  - භද්දකච්චායනා ඇතුළු පිරිස
  - මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන පිරිස
  - සංඝමිත්තා මෙහෙණින් වහන්සේ සමග පැමිණි පිරිස

- ඉන්දියානු ජන කණ්ඩායම් ගංගා නිම්න ආශ්‍රිත ව ප්‍රථමයෙන් මෙරට ජනපද පිහිටුවා ගත්හ.
- ගොවිතැනට උචිත වීම, ජලය සපයා ගැනීමේ පහසුව, වනාන්තර බහුල වීම, ජනාවාස ව්‍යාප්තිය කෙරෙහි හිතකර ලෙස බලපාන ලදි.

- මුල් කාලීන ජනපද ව්‍යාප්ත වූ ගංගා නිම්න
  මල්වතු ඔය, කලා ඔය, දැදුරු ඔය, මහවැලි ගඟ, ගල් ඔය, මැණික් ගඟ, වලවේ ගඟ, කැලණි ගඟ

ජනපද නාම - අනුරාධග්‍රාම, උරුවෙල ග්‍රාම, උපතිස්ස ග්‍රාම, විජිත ග්‍රාම, රාම ග්‍රාම, දීඝ ග්‍රාම, කාචර ග්‍රාම, කල්‍යාණි ග්‍රාම

## මූල ඓතිහාසික අවධිය

- ඓතිහාසික යුගයේ මුල් අවධිය මූල ඓතිහාසික අවධිය ලෙස සැලකේ
- මුල් ම ජනපද ජලාශ්‍රිත ශිෂ්ටාචාරයක් තෙක් වර්ධනය වීම ආරම්භ වන්නේ මූල ඓතිහාසික යුගයේ දී ය.(ක්‍රි.පූ. 4 සිට ක්‍රි.ව. 3 තෙක්)
- ගංගා නිම්න ආශ්‍රිත ව තිබූ ජනාවාස රට අභ්‍යන්තරයට ව්‍යාප්ත වී කුඩා වැව් ගම්මාන තෙක් වර්ධනය විය.
- බොහෝ ජනාවාස වියළි කලාපයේ ව්‍යාප්ත වූයේ රතු දුඹුරු පස ගොවිතැනට වඩාත් උචිත වීම නිසාය.
- ජනගහනය වර්ධනය වීමත් සමඟ වැසි ජලය ප්‍රමාණවත් නොවූ නිසා කුඩා වැව් ඉදිකොට ජලය එක් රැස් කර ගන්නා ලදි.

## ජනාවාසවල ස්වරූපය

- එක් කුඩා වැවක් කේන්ද්‍ර කර ගනිමින් එක් ගමක් ලෙසින් ජනාවාස පැවතිණ.
- මේවා වාපි ගාම (වැව්ගම්) නමින් හැඳින්වේ.
- වැව, කුඹුරු යාය, හේන, කැලෑව, නිවාස ආදිය වැව් ගමක ප්‍රධාන ලක්ෂණ විය.
- එක් ගමක පවුල් 5 - 25 ත් අතර ප්‍රමාණයක් ජීවත් වූ බව අනුමාන කෙරේ.
  ගමක ප්‍රධානියා ගමික යනුවෙන් හැඳින්විණි.
- මුල් කාලීන ව වැව් ගමක් ස්වාධීන ව කටයුතු කළ නමුදු පසු කාලීන ව ගම්මාන ඒකාබද්ධ වී නාගරීකරණය තෙක් වර්ධනය විය.
- ජනගහනය වර්ධනය වීමත් සමඟ කුඩා වැව්වල ජලය ප්‍රමාණවත් නොවූ හෙයින් ක්‍රි.ව. පළමුවෙනි ශත වර්ෂයේ සිට විශාල වැව් නිර්මාණය කෙරිණි.
- ක්‍රි.ව. 3 වෙනි ශත වර්ෂය වන විට මධ්‍යගත අගනගරය වශයෙන් අනුරාධපුරය වඩාත් දියුණුවට පත් ව තිබිණි.

## ජීවන රටාව

- මුල් කාලීන ව ගොවිතැන් පදනම් වුව ද පසු කාලීන ව වෘත්තීන් අනුව ගම්මාන බෙදී ගිය ආකාරය දක්නට තිබිණි.
- වී ගොවිතැන හා හේන් ගොවිතැන ආශ්‍රයයෙන් ආහාර භෝග වගාව සිදු කළ ගම් ගොවිගම් යනුවෙන් හැඳින්විණි.
- වෘත්තීන් අනුව වෙළෙඳ ගම්, ධීවර ගම්, කුඹල් ගම් යනුවෙන් බෙදී ගියේ ය.

**ඇගයීම-01**

1. ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගය පිළිබඳ පැහැදිලි කරන්න.
2. පහත මාතෘකා ඇසුරින් ඓතිහාසික යුගය පිළිබඳ පැහැදිලි කරන්න.
   (1) ජනාවාස වීම (2) ජීවන රටාව
3. පහත සඳහන් ස්ථාන ලංකාවේ සිතියමක ලකුණු කරන්න
   මල්වතුඔය, කලාඔය, දැදුරුඔය, මහවැලි ගඟ, ගල් ඔය, මැණික් ගඟ, වලවේ ගඟ, කැලණි ගඟ
   අනුරාධගාම, උරුවෙල ගාම, උපතිස්ස ගාම, විජිත ගාම, රාම ගාම, දීඝ ගාම, කාචරගාම,
   කල්‍යාණි ගාම

## 5. රජරට ශිෂ්ටාචාරය (පොළොන්නරුව අවසානය දක්වා)

අතීතයේ දී ශ්‍රී ලංකාව රුහුණු, පිහිටි, මායා වශයෙන් උපප්‍රදේශ තුනකට බෙදා තිබිණි. වර්ෂ 1215 දක්වා පිහිටි රට ප්‍රදේශයේ අගනුවර හෙවත් රජුගේ පාලන මධ්‍යස්ථානය ද පැවතිණි. මෙසේ පිහිටි රට ප්‍රදේශයේ රජුගේ මධ්‍යස්ථානය වූ නිසා එයට රජරට යන ව්‍යවහාරය යෙදිණි. අනුරාධපුර හා පොළොන්නරු රාජධානි පැවති සමයේ පිහිටි රට හෙවත් රජරට ඇසුරෙන් සභ්‍යත්වය ගොඩනැඟුණු බැවින් එම රාජ්‍ය පැවති වකවානුව රජරට ශිෂ්ටාචාර සමය ලෙස ද හැඳින්වේ. ක්‍රි.පූ. හයවෙනි සියවසේ දී ඉන්දියාවෙන් පැමිණි පිරිස් මෙරට නව ජනාවාස පිහිටුවීම, ක්‍රි.පූ තුන්වෙනි සියවසේ දී බුදු දහම මෙරටට ලැබීම, රට පුරා එය ව්‍යාප්ත වීම හා ඊට ගැළපෙන ආකාරයේ පාලන ක්‍රමයක් ස්ථාපිත වීම, ක්‍රි.ව. හයවෙනි සියවස පමණ වන විට වාරි ශිෂ්ටාචාරයක් ගොඩනගමින් කෘෂිකාර්මක ආර්ථික ක්‍රමයකට ශක්තිමත් පදනමක් දැමීම, හා සමකාලීන අභියෝග ජයගැනීමට සමත් කණ්ඩායමක් ගොඩනගාගැනීම රජරට ශිෂ්ටාචාර සමයේ වැදගත් ලක්ෂණ වේ. එසේම බුදුදහම හා හින්දු ආගම් ඇසුරින් යහපත් සමාජ ක්‍රමයක් හා සංස්කෘතියක් බිහි වීම, පෙරදිග හා අපරදිග රටවල් සමඟ යහපත් විදේශ සබඳතා පවත්වමින් අන්‍ය දේශයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ආදියෙන් රජරට ශිෂ්ටාචාර සමයේ දී ලෝකයේ සමකාලීන දියුණු ජාතීන්ට නොදෙවෙනි ආකාරයේ සභ්‍යත්වයත් ගොඩනැඟීමට ලාංකිකයෝ පොහොසත් වූහ. රජරට ශිෂ්ටාචාර සමයේ පැවති එකී දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික තත්ත්වයන් කෙරෙහි අවධානය යොමුකරමින් අතීතය අධ්‍යයනයෙන් වර්තමාන සමාජයට ලබාගත හැකි පාඩම් හා ආදර්ශ කෙරෙහි සිසුන් යොමු කරවීම මෙම විෂය ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : • ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි

**නිපුණතා මට්ටම** : 5.1. රජරට ශිෂ්ටාචාරයේ දියුණු තාක්ෂණික පදනම හඳුන්වා දෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :
- රජරට ශිෂ්ටාචාරයේ පදනම පහදයි
- රජරට ශිෂ්ටාචාරයේ දියුණුවට එහි පදනම දායක වූ ආකාරය පහදයි
- රජරට ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

රජරට ශිෂ්ටාචාරයේ පදනම

- පණ්ඩුකාභය රජු අනුරාධපුර රාජධානිය ගොඩනැගු අවධියේ (ක්‍රි.පූ. හතරවෙනි සියවස) සිට වර්ෂ 1215 පොළොන්නරුව රාජධානිය බිඳවැටීම දක්වා අනුරාධපුරය හා පොළොන්නරුව පිළිවෙලින් මෙරට අගනුවර වීම
- ශත වර්ෂ 15ක් පමණ එකී දීර්ඝ කාල පරිච්ඡේදයේ දී මෙම නගර අගනුවර කරගත් පාලකයන් යටතේ වියළි කලාපය ආශ්‍රිත ව මෙරට ශිෂ්ටටාචාරය ගොඩනැඟීම
- එම නිසා මේ කාල පරිච්ඡේදය 'රජරට ශිෂ්ටාචාර සමය' ලෙස හැඳින්වීම
- 12වෙනි ශත වර්ෂයේ සිට මෙරට පැවති ප්‍රාදේශීය බෙදීම් අනුව දිවයින රුහුණු, පිහිටි, මායා යනුවෙන් කොටස් තුනකට බෙදීම

- අනුරාධපුරය හා පොළොන්නරුව පිහිටි රටට අයත් වීම

- එහෙත් අනුරාධපුරය හා පොළොන්නරුව රාජධානි මුල් කරගනිමින් වර්ෂ 1215 දක්වා මෙරට ඉතිහාසය විස්තර කිරීමට රජරට ශිෂ්ටාචාරය යන ව්‍යවහාරය යෙදීම

**රජරට ශිෂ්ටාචාරයේ පදනම**

- රජරට ශිෂ්ටාචාරය මූලික වශයෙන් කෘෂිකර්මාන්තය හා වෙළෙඳම සහිත ආර්ථික ක්‍රමයක් පදනම් කරගෙන පැවැති සභ්‍යත්වයක් වීම
- වර්ෂ 1215 දක්වා බහුල වශයෙන් මෙරට ජනාවාස ව්‍යාප්තිය පැවතියේ පහතරට වියලි ප්‍රදේශයේ බැවින් ඊසාන දිග මෝසමෙන් (ඔක්තෝම්බර් - අප්‍රේල්) වර්ශයේ එක් කාලයකදී ලැබෙන ජලය එක් රැස් කර කෘෂිකර්මාන්තයට යොදා ගැනින. වියලි කලාපයේ පැවැති භූ විෂමතාවය දක්ෂ ලෙස කෘෂිකර්මාන්තයට යොදා ගැනීමට එකළ ජනතාව දැන සිටි බැවින් උස් භූමිවල වැව් තනා පහත විශාල තැනිතලා ප්‍රදේශය කෘෂිකර්මාන්තයට යොදා ගත්හ. මෙහිදී වැව් වාර්මාර්ග මගින් සම්බන්ධ කළ අතර වැව්වල සිට කෘෂිබිම්වලට ජලය ගෙනයාමට වාරිමාර්ග තනවන ලදි. එමගින් ජලාශ්‍රිත ශිෂ්ටාචාරය ගොඩනැඟිණි. එය රජරට ශිෂ්ටාචාරයේ ආර්ථිකයේ මූලික පදනමයි.
- ශ්‍රී ලංකාවේ පිහිටීම අනුව එය යුරෝපය, ඉන්දියාව හා ඈත පෙරදිග අතර පැවැති පැරණි මුහුදු ආශ්‍රිත සංධිස්ථානයක් ලෙස පැවතිණි. මේ තත්ත්වය විදේශ වෙළෙඳමට බෙහෙවින් හිතකර විය. එකල වෙළෙඳමේ දී යොදාගත් රුවල් නැව්වලට ගැළපෙන මුහුදු බොක්ක හා නැංගුරම් පොළවල් සහිත වරාය රැසක් දිවයින වටා පැවතුණි. එම වරායවල සිට ප්‍රධාන නගරවලට ගමන් කළ හැකි මාර්ග පද්ධතියක් ද ගොඩනැගුණ හෙයින් වරායවලට භාණ්ඩ ප්‍රවාහණයද පහසු විය. මෙම පසුබිම තුළ රජරට ශිෂ්ටාචාර සමයේදී ලෝකය් නොයෙක් රටවල් සමඟ වෙළෙඳ සම්බන්ධතා පවත්වාගෙන යාමට ලාංකිකයෝ සමත් වූහ. මෙසේ වෙළෙඳමට ද ආර්ථිකයේ මූලික තැනක් ලැබුණි.
- රජරට ශිෂ්ටාචාර සමයේ සංස්කෘතික පදනම සකස් වූයේ බොහෝදුරට ඉන්දියානු ආභාසයෙනි. එහෙත් ඉන්දියාවේ පැවැති විවිධ සංස්කෘතිකකාංග ශ්‍රී ලංකාවේ ආගමික හා සමාජ පරිසරයට ගැළපෙන ලෙස මෙරට තුළ වර්ධනය වීම.

  උදාහරණඃ


  ආගම, කලාව, ගෘහ නිර්මාණ, සිරිත් විරිත්, අධ්‍යාපනය හා පාලනය වැනි අංග මේ පිළිබඳ තොරතුරු රජරට ශිෂ්ටාචාරයේ දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික හා තාක්ෂණික කටයුතු අංශය අධ්‍යයනය කිරීමේ දී ලැබෙනු ඇත.

**ඇගයීම - 01**


1. රජරට ශිෂ්ටාචාරයේ පදනම පැහැදිලි කරන්න.

ඪ

## අනුරාධපුර යුගය


යොමුව
නගර
ග්‍රාම
ජම්බුකොලපට්ටන
ප්‍රාචීනාරාම
මහාතිත්ථ
කුරුන්දි
උපතිස්සගාම
අනුරාධපුරය
උරුවෙල
අරිට්ඨගිරි
පොළොන්නරුව
විජිතපුර
මහියංගන
දීඝවාපි
දකුණු මණ්ඩලය
රුහුණ
ගිරිකුම්භිල
පේලගාම
සෙරුවාවිල
ගොකණ්ණ
කලිංගන
කල්‍යාණි
කාලතිත්ථ
ගිම්හතිත්ථ
තිස්සමහාරාමය
මහාගාම
තිස්සවාපි
කතරගාම
චිත්තල පබ්බත
නාගපබ්බත
මහාවැලිගඟ
බදුලු ඔය
දෙවිනුවර
කිරිම් මණ්ඩලය
මලයදේශය
N
S
E
W
0 10 20 30 40
Kilometers
79°30'0"E
80°0'0"E
80°30'0"E
81°0'0"E
81°30'0"E
82°0'0"E
9°30'0"N
9°0'0"N
8°30'0"N
8°0'0"N
7°30'0"N
7°0'0"N
6°30'0"N
6°0'0"N

පොලොන්නරු යුගය


79°30'0"E
80°0'0"E
80°30'0"E
81°0'0"E
81°30'0"E
82°0'0"E
9°30'0"N
9°0'0"N
8°30'0"N
8°0'0"N
7°30'0"N
7°0'0"N
6°30'0"N
6°0'0"N
යොමුව
නගර
ග්‍රාම
රජරට
දක්ඛිණ දේශය
මලයරට
රුහුණුරට
රජරට
(පිහිටි රට)
අනුරාධපුර
පොළොන්නරුව
උත්තර මලය
මලයරට
දක්ඛිණ මලය
අටදහස් රට
දොළොස්දහස්රට
මහාතිත්ථ
කලුතිත්ථ
මහාගාම
මහානාගහුල

**නිපුණතා මට්ටම :** 5.2. රජරට ශිෂ්ටාචාරයේ දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික සහ තාක්ෂණය විස්තර කරයි.

**කාලච්ඡේද** : 90 යි

**ඉගෙනුම් පල** :
- රජරට ශිෂ්ටාචාරයේ පදනම ශක්තිමත් කිරීමට දායක වූ රජවරුන් පෙන්වා දෙයි.
- රජරට ශිෂ්ටාචාරයේ සංවර්ධනය අගය කරයි.
- රජරට ශිෂ්ටාචාරයේ ඓතිහාසික ස්ථාන, වැව්, අමුණු සිතියමක ලකුණු කරයි.
- රටේ ඉතිහාසය හැදෑරීම මඟින් වර්තමාන සමාජයට අතීතයෙන් ලබාගත හැකි පාඩම් හා ආදර්ශ අගය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

5.2. රජරට ශිෂ්ටාචාරයේ දේශපාලන, ආර්ථික, තාක්ෂණික හා සමාජ සංස්කෘතික ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කර ඇත.

5.2 **අනුරාධපුර රාජධානිය**

**දේශපාලන කටයුතු**

අනුරාධපුර හා පොළොන්නරුව රාජ්‍ය සමයන්හි මෙරට සිටි කැපී පෙනෙන රජවරු ඔවුන් මුහුණ දුන් අභියෝග, පාලන තන්ත්‍රය සකස් ව තිබූ ආකාරය, රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ නිළධාරීන්, රටේ ආරක්ෂක කටයුතු හා යුද්ධෝපක්‍රම හා එකල පැවැති විදේශ සම්බන්ධතාවල මූලික ලක්ෂණ ආදිය මෙහි දී සැලකිල්ලට ගත යුතුය.

රාජ්‍ය පාලකයෝ

අනුරාධපුර යුගයේ පණ්ඩුකාභය රජුගේ සිට අවසාන පාලකයා වූ පස්වෙනි මිහිඳු රජු තෙක් පහත සඳහන් වන රජවරුන්ගේ දේශපාලන කාර්ය සාඵල්‍යය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් අනුරාධපුර රාජධානියේ දේශපාලන ඉතිහාසය පිළිබඳ ව සිසුන්ට අවබෝධයක් ලබාදීම අපේක්ෂා කෙරේ.

- **පණ්ඩුකාභය රජු**
  - පණ්ඩුකාභය කුමාරයාගේ ළමා කාලය පිළිබඳ ව ඇති පුරාවෘත්ත
  - යක්ෂ ගෝත්‍රික ජන කණ්ඩායම්වල සහයෝගය ලැබීම
  - බලය ලබා ගැනීම සඳහා කළ සටන්
  - ප්‍රථම වරට අනුරාධග්‍රාමය අනුරාධපුර නගරය බවට පත් කොට එය රාජ්‍යයේ අගනුවර බවට පත්කර ගැනීම
  - ග්‍රාම සීමා නියම කිරීම
  - ආර්ය ජනකොටස් හා දේශීය ජනකොටස් අතර අතර සම්මිශ්‍රණයක් සිදු වූ ආකාරය පරීක්ෂා කිරීම

- මුටසිව රජු
  - පණ්ඩුකාභය රාජ්‍ය සමයේ දී රාජ්‍ය ශක්තිමත් තත්ත්වයට පත් කර තිබීම මුටසිව රජුට වාසිදායක වීම
  - මහමෙවුනා උයන ඉදි කිරීම

- **දේවානම්පියතිස්ස රජු (ක්‍රි.පූ. 250 - 210 තෙක්)**

  - අශෝක අධිරාජයා සමඟ පැවැත්වූ සම්බන්ධතා
  - අභිෂේකය සඳහා මෞර්ය අධිරාජයාගෙන් රාජ කකුධ භාණ්ඩ ලැබීම
  - මෞර්ය අභිෂේක ක්‍රමය මෙරට ස්ථාපිත වීම
  - 'දෙවනපිය' විරුද නාමය ලැබීම
  - බුද්ධාගම හඳුන්වාදීම සහ රට පුරා එය ව්‍යාප්තවීම
  - භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවණක් පිරිස බිහි වීම
  - ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය කිරීම
  - බුදු රජාණන් වහන්සේගේ ධාතු නිදන් කළ චෛත්‍ය ඉදි කිරීම (ථූපාරාමය)
  - බුද්ධාගම රාජ්‍ය ආගම බවට පත් වීම
  - උපරාජ මහානාග යටතේ මාගම මුල්කොටගත් රෝහණ රාජ්‍යය බිහිවීම

- **උත්තිය, මහාසිව, සූරතිස්ස රජවරු**

  - සූරතිස්ස රාජ්‍ය සමයේ සේන ගුත්තික ආක්‍රමණය
  - අසේල රජු පරදවා එළාර රජු අනුරාධපුරයේ බලය අල්ලා ගැනීම සහ රාජත්වයට පත්වීම

- **අනුරාධපුර යුගයේ මුල් භාගයේ පැවති ප්‍රාදේශකය රාජ්‍යය (රෝහණ රාජ්‍යය)**

  - කාවන්තිස්ස රාජ්‍ය සමය තෙක් රෝහණයේ ඉතිහාසය
  - රෝහණ රාජ්‍යය පිළිබඳ ව ඇති අභිලේඛන
  - කැලණි රජ පෙළපත
  - සමකාලීන අනෙකුත් රාජ්‍යයන්
  - කාවන්තිස්ස රජු යටතේ රෝහණය එක්සේසත් වීම
  - එළාර රජුට විරුද්ධ ව රෝහණයේ සේනා සංවිධානය කිරීම

- **එළාර රජු**

  - අනුරාධපුරය ආක්‍රමණය කොට රාජ්‍ය බලය ලබා ගැනීම සහ අවු. 44ක් රජරට ප්‍රදේශ පාලනය කිරීම
  - නීති ගරුක, සාධාරණ, ජනහිතකාමී පාලකයෙකු වීම
  - එළාර රජුට සමකාලීන ව රෝහණයේ කාවන්තිස්ස රජුගේ බලය ව්‍යාප්ත වීම

- **දුටුගැමුණු රජු (ක්‍රි.පූ. 161 - 137 තෙක්)**

  - දුටුගැමුණු රජු මහාවංසයේ ප්‍රධාන වීරයා බවට පත් කොට තිබීම
  - දුටුගැමුණු රජුගේ ජයග්‍රහණයට කාවන්තිස්ස රජුගේ ක්‍රියා කලාපය බලපෑ ආකාරය
  - එළාර රජුට විරුද්ධ ව ගෙනගිය සටන් ව්‍යාපාරය හා ජයග්‍රහණ
  - දිවයින එක්සේසත් කිරීම

- ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ රජකු ලෙස ඉතිහාසගත වීම
- රජුගේ ආගමික සේවා - මිරිසවැටිය, ලෝවාමහාප්‍රාසාදය, රුවන්වැලි සෑය, ඉදි කිරීම



ලෝවාමහාප්‍රාසාදය

- **වළගම්බා රජු - (ක්‍රි.පූ. 89 - 77 තෙක්)**

  - බල්ලාට නාග රජුගෙන් බලය පැහැරගත් මහාරත්තක මරා වළගම්බා රජු සිහසුනට පත් වීම
  - වළගම්බා රජු සිහසුනට පත්වීමේ දී මුහුණ පෑ ගැටලු
  - වළගම්බා රජුට විරුද්ධ ව ඇති වූ කැරලි කෝලාහල - තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල
  - දකුණු ඉන්දියාවෙන් එල්ල වූ ආක්‍රමණ - සත් ද්‍රවිඩ ආක්‍රමණය
  - බැමිණිතියා සාගතය
  - සේනා සංවිධානය කොට නැවත රාජ්‍යය ලබා ගැනීම
  - අභිලේඛනවල 'පිතිමහරජ' යනුවෙන් සඳහන් ව තිබීම
  - වළගම්බා රජුගේ ආගමික කටයුතු
  - අභයගිරි චෛත්‍ය ඉදි කරවීම, මෙය භික්ෂූන් වහන්සේ නමකට සිදු කළ ප්‍රථම පෞද්ගලික පූජාවවීම
  - වළගම්බා රාජ්‍ය සමයේ ප්‍රථම වරට නිකාය භේදයක් ඇති වීම
  - වළගම්බා රාජ්‍ය සමයේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

- **වසභ රජු (ක්‍රි.ව. 65 - 109)**
  - ලම්බකර්ණ පෙළපතේ ප්‍රථම පාලකයා වීම
  - වසභ රාජ්‍ය සමයට අයත් අභිලේඛන දිවයින පුරා විවිධ ප්‍රදේශවලින් හමු වීම
    යාපනය, සිතුල්පව්ව, තිස්සමහාරාමය නැඟෙනහිර හා කුරුණෑගල ආදී ස්ථානවලින් ඔහුගේ ලිපි හමු වී තිබීම නිදසුන් ලෙස දැක්විය හැකි ය.
  - වල්ලිපුරම් සන්නසින් හා ගොඩවාය ලිපිවලින් හෙළි වන තොරතුරු
  - ආගමික කටයුතු - බොහෝ විහාරාරාම තිබූ බව සඳහන් වේ.
  - වසභ රජුගෙන් ඇරඹුණු රාජවංශය සියවස් හතරකට ආසන්න කාලයක් රට පාලනය කිරීම
  - විශාල වැව් තැනවීමේ පුරෝගාමියා වීම


- **මහසෙන් රජු බලයට පත්වීම**
  - මහාවිහාර භික්ෂූන් වහන්සේලා හා රජු අතර මතභේද ඇති වීම
  - රජුගේ මහාවිහාර විරෝධී කටයුතු නිසා ජනතාව රජුට විරුද්ධ ව නැඟී සිටීම
  - නිකාය භේදයකට මඟ පෑදීම
  - ආගමික හා සංස්කෘතික දියුණුවට කටයුතු කිරීම
    මින්නේරිය විහාරය, ගෝකණ්ණ විහාරය, කලන්දක විහාරය ඇතුළු විහාර දහයක් සහ මෙහෙණවර දෙකක් ඉදි කිරීම
  - වැව් හා වාර්මාර්ග තැනවීම හා වාරි කර්මාන්තයට විශිෂ්ඨ සේවාවක් කරවීම
  - වාරිකර්මාන්තයට කල සේවාව නිසා මින්නේරිය දෙවියෝ නාමයෙන් හැඳින්වීම

- **සිරිමේඝවණ්ණ රජු**
  - මහාවිහාරය යථා තත්ත්වයට පත් කිරීම සඳහා කටයුතු කිරීම
  - දන්ත ධාතුව වැඩම කරවීම හා එය අභයගිරිය තුළ තැන්පත් කිරීම
  - උතුරු ඉන්දියාවේ සමුද්‍රගුප්ත රජු සමඟ සම්බන්ධතා පැවැත්වීම
  - බුද්ධගයාවේ වන්දනා පිණිස ගිය වන්දනාකරුවන් සඳහා විශ්‍රාම ශාලාවක් කරවීම

- **දෙවෙනි ජෙට්ඨ තිස්ස රජුගේ සිට මිත්තසේන රජු දක්වා පාලකයෝ (ක්‍රි.ව. 331 - 433 දක්වා)**
  - දෙවෙනි ජෙට්ඨ තිස්ස, බුද්ධදාස, පළමුවෙනි උපතිස්ස
  - මිත්තසේන රාජ්‍ය සමයේ පණ්ඩු ප්‍රමුඛ ෂඩ් ද්‍රවිඩ ආක්‍රමණ එල්ල වීම

- **ධාතුසේන රජු**
  - අවු. 27 කට ආසන්න කාලයක් ලංකාවේ පැවති විදේශ බලය අවසන් කොට නැවත රට නිදහස් කොට ගැනීම
  - මෝරිය පෙළපත නැවත බලයට පැමිණීම
  - ආර්ථික සංවර්ධනය සඳහා විශිෂ්ට සේවාවක් සිදු කිරීම

- **කාශ්‍යප රජු**
  - අනුරාධපුරයේ සිට තාවකාලිකව අගනුවර සීගිරියට මාරු වීම
  - ආරක්ෂක බලකොටුවක් ලෙස සීගිරිය ගොඩනැංවීම
  - දෙවෙනි ආලකමන්දාවක් ලෙස සීගිරිය නිර්මාණය කිරීම හා විශිෂ්ඨ නිර්මාණශීලීත්වය කැටපත් පවුර, බිතුසිතුවම්, පියගැටපෙළ, උද්‍යාන, පොකුණු



ආරක්ෂක බලකොටුවක් ලෙස සීගිරිය ගොඩනැංවීම



සීගිරිය උද්‍යානය

- **මානවම්ම රජු**

  - මානවම්ම පෙළපතේ ආරම්භක පාලකයා වීම
  - පල්ලව රජුගේ ආධාර ලබාගෙන අනුරාධපුරයේ බලයට පත් වීම
  - ආගමික ගොඩනැගිලි රාශියක් සහ පිරිවෙන් රාශියක් කරවීම
  - සංස්කෘතික වශයෙන් බලපෑම් ඇතිවීම. උදා: අනුරාධපුරයේ ඉසුරුමුණිය හා තිරියායේ සමහර කැටයම්වල පල්ලව බලපෑම් දක්නට ලැබීම. සිංහල අක්ෂර මාලාවට පල්ලව ග්‍රන්ථාක්ෂරවල බලපෑම් ඇති වීම
  - රජුගේ නමේ අග කොටස වූ 'වර්මන්' යන්න පවා පල්ලව බලපෑම් නිසා අතිවූවක් බව සිතීමට පුළුවන

- **පළමුවෙනි සේන රජු**

  - ඉන්දියාවට පලාගොස් සිටි මහින්ද කුමරු මරවා තම රාජ්‍යත්වය තහවුරු කොට ගැනීම
  - එවකට දකුණු ඉන්දියාවේ බලවත් ව සිටි පාණ්ඩ්‍ය රාජ්‍යයෙන් ආක්‍රමණයක් එල්ලවීම - ශ්‍රීමාර ශ්‍රී වල්ලභ නම් පාණ්ඩ්‍ය පාලකයා යටතේ
  - සිංහල ඇමතිවරුන් අතර පැවති අසමගිය නිසා සිංහල හමුදා පරාජයට පත් වීම හා උතුරු ප්‍රදේශය ආක්‍රමණිකයින් සතු වීම
  - අනුරාධපුර භාණ්ඩාගාරය ඇතුළු සියලු වස්තු ආක්‍රමණිකයන් විසින් කොල්ල කනු ලැබීම
  - පාණ්ඩ්‍ය රජු හා පළමුවෙනි සේන රජු අතර මිත්‍ර ගිවිසුමක් ඇති වීම
  - පාණ්ඩ්‍ය හමුදා ආපසු ඉන්දියාව බලා ගිය අතර අනුරාධපුර රාජ්‍යය නැවත පළමුවෙනි සේන රජු අතට පත් වීම
  - පාණ්ඩ්‍ය ආක්‍රමණය නිසා විනාශ වූ ආගමික ගොඩනැගිලි හා පිරිවෙන් යථා තත්ත්වයට පත්කොට නව විහාරාරාම කර වීම

- **දෙවෙනි සේන රජු**

  - පාණ්ඩ්‍ය පාලක ශ්‍රී මාර ශ්‍රී වල්ලභ ගේ පුත් දෙවෙනි වරගුණ වර්මන් තම පියාට විරුද්ධ ව ආධාර පතා ලංකාවට පැමිණීම
  - පළමුවෙනි සේන රජුගේ කාලයේ ලංකාවට එල්ල වූ අපකීර්තිය මකා ගැනීමට මෙය අවස්ථාවක් කොටගත් දෙවෙනි සේන රජු කුට්ඨක සෙනෙවි සමග ඉන්දියාවට හමුදා යැවීම
  - කුට්ඨක සෙනෙවි, ශ්‍රී මාර ශ්‍රී වල්ලභ පරාජයට පත් කොට වරගුණ වර්මන් පාණ්ඩ්‍ය සිංහාසනයේ හිඳුවීම
  - පළමුවෙනි සේන රජු සමයේ මෙරටින් පැහැරගෙන ගිය වස්තුව ඇතුළු බොහෝ වස්තු ආපසු මෙරටට ගෙන ඒම
  - පාණ්ඩ්‍ය ජයග්‍රහණය සනාථ කෙරෙන අභිලේඛන මූලාශ්‍රය තිබීම
  - සාමකාමීව පැවති මෙම කාලයේ ශාසනයේ මෙන් ම මහජන ශුභ සිද්ධිය සඳහා ද විවිධ සේවාවන් කිරීම

- **පස්වෙනි කාශ්‍යප රජු**

  - දෙවෙනි සේන රජුගේ පුත්‍රයා වූ මොහු මහාවංසයේ (දෙවෙනි කොටසේ) ඉතා උසස් ලෙස වර්ණනා කොට තිබීම
  - ශ්‍රේෂ්ඨ උගතකු බව - ධම්පියා අටුවා ගැටපදය මොහු විසින් රචනා කරන ලද්දකි

- පාණ්ඩ්‍ය පාලකයා වූ මාරවර්මන් පළමුවෙනි පරන්තක නම් සොළී රජුට විරුද්ධ ව ආධාර ඉල්ලා ලංකාවට පැමිණීම
- පස්වෙනි කාශ්‍යප රජු සක්කසේනාපති යටතේ පාණ්ඩ්‍යට ආධාර හමුදා යැවීම
- සිංහල හමුදාවේ අයට වසංගත රෝගයක් බෝවීම නිසා ආක්‍රමණය අසාර්ථක වීම
- විශිෂ්ට ආගමික සේවාවක නිරතවීම

  උදා: - සංඝ ශාසනයේ සංශෝධනයක් සිදු කිරීම
  - අභිධර්ම පිටකය රන්පත් වල ලිය වීම
  - මහාවිහාරයට, අභයගිරියට හා ජේතවනාරාමයට එක සේ අනුග්‍රහ දැක්වීම
  - නොයෙකුත් ආගමික වෙහෙර විහාර ගොඩනැගීම හා ගම්බිම් පූජා කිරීම
  - අභයගිරි විහාරයේ පාලනය පිළිබඳ නීති මාලාවක් සකස් කිරීම

- **හතරවෙනි මහින්ද රජු**

  - අනුරාධපුර යුගයේ අවසාන ශ්‍රේෂ්ඨ පාලකයා මොහු ය.
  - තුන්වෙනි ක්‍රිෂ්ණ හෙවත් වල්ලභ රාජ නම් රාෂ්ට්‍රකූට පාලකයෙකු විසින් ලංකාවට ආක්‍රමණයක් එල්ල කරනු ලැබීම
  - සේන සෙනෙවියා යවා එම ආක්‍රමණය මර්දනය කිරීම
  - සිරියවේලාර් නම් සොළී සෙනෙවියකු ලංකාවේ උතුරු ප්‍රදේශයට ආක්‍රමණයක් එල්ල කිරීම
  - සේන සෙනෙවි විසින් එම ආක්‍රමණය ද මර්දනය කරවීම

- **පස්වෙනි සේන රජු**

  - ඉතා ළාබාල වියේ සිහසුනට පත් වීම
  - සේන සෙනෙවියා හා රජු අතර ගැටුම් ඇති වීම
  - පසු ව දෙදෙනා සමාදාන විම
  - මත්පැන් පානයට ඇබ්බැහි වීම නිසා රාජ්‍ය පාලන කටයුතු අතපසු වීම
  - ඉතා අඩු වයසින් මරණයට පත් වීම

- **පස්වෙනි මිහිඳු රජු**

  - අනුරාධපුර රාජධානියේ අවසාන පාලකයා වීම
  - ඉතා දුර්වල පාලකයකු වූ බැවින් රට වැසියන් බදු ගෙවීම පවා ප්‍රතික්ෂේප කිරීම
  - හමුදාවට වැටුප් ගෙවීමට පවා නොහැකි වූ බැවින් කුලී හමුදාවේ කේරළ භටයන් මාලිගාව වටලා රජුට විරුද්ධ ව කැරලි ගැසීම
  - රජු අනුරාධපුරය අතහැර රුහුණට පලා යාම
  - පස්වෙනි මිහිඳු රජු රුහුණු ප්‍රදේශයේ ආධිපත්‍යය පතුරුවා ගනිමින් වාසය කිරීම
  - පළමුවෙනි රාජ රාජ නම් සොළී පාලකයා විසින් අනුරාධපුරයට ආක්‍රමණයක් එල්ල කිරීම
  - සොළීන් විසින් අනුරාධපුරය කොල්ල කා විනාශ කිරීම
  - අනුරාධපුරය අතහැර පොළොන්නරුව තම මධ්‍යස්ථානය කොටගෙන සොළීන් විසින් රජරට පාලනය කිරීම
  - පළමුවෙනි රාජේන්ද්‍ර යටතේ නැවත ආක්‍රමණයක් එල්ල වීම
  - රුහුණ දක්වා ආක්‍රමණය කළ සොළීන් පස්වෙනි මිහිඳු රජු ඇතුළු රජ පවුලේ අය සිරකරුවන් ලෙස ඉන්දියාවට ගෙන යාම

**පොළොන්නරු රාජධානිය**

- පාලන මධ්‍යස්ථානය පොළොන්නරුවට මාරු වීමට හේතු
  - දකුණු ඉන්දියාවෙන් තර්ජන එල්ල වීමට ඇති ඉඩකඩ අඩු වීම
  - පොළොන්නරුවේ සිට රජරට හා රුහුණු රට පහසුවෙන් පාලනය කළ හැකි වීම
  - පොළොන්නරුව අවට ප්‍රදේශ ආර්ථික අතින් දියුණු මට්ටමක පැවතීම
  - ක්‍රි.ව. 992 දී රජරට ආක්‍රමණය කළ සොළීන් අනුරාධපුරය විනාශ කොට අතහැර දමා පොළොන්නරුව අගනුවර බවට පත් කොට ගැනීම
  - පොළොන්නරුව ''ජනනාථ මංගලම්'' නමින් හැඳින්වීම
  - රජරට ප්‍රදේශය මුම්මුඩි චෝළ මණ්ඩලම් නමින් හැඳින්වීම
  - 1070 තෙක් සොළී අධිරාජ්‍යයේ ප්‍රාන්තයක් ලෙස ලංකාවේ උතුරු ප්‍රදේශය පාලන වීම

- **පළමුවෙනි විජයබාහු රජුගේ සිට මාඝ ආක්‍රමණය තෙක් දේශපාලන ඉතිහාසය**

  - රුහුණේ පැවති දේශපාලන තත්ත්වය
  - පස්වෙනි මිහිඳු රජුගේ පුත්‍රයකු වූ කස්සප පළමුවෙනි වික්‍රමබාහු නමින් රුහුණේ බලයට පත්වීම
  - පළමුවෙනි වික්‍රමබාහු රජරට සොළීන්ගෙන් නිදහස් කර ගැනීමට ගත් උත්සාහය අසාර්ථක වීම
  - පළමුවෙනි වික්‍රමබාහුගෙන් පසු රුහුණේ දේශපාලන වශයෙන් ව්‍යාකූල තත්ත්වයක් උදා වීම
  - කිත්ති, මහාලාන කිත්ති, ලොකේශ්වර, කේශධාතු කාශ්‍යප ආදි දේශීය කුමාරවරුන් මෙන් ම වික්‍රම පාණ්ඩ්‍ය, ජගතිපාල, පරාක්‍රම පාණ්ඩ්‍ය වැනි විදේශීය කුමාරවරු ද චෝළ ආධිපත්‍යයට විරුද්ධව රුහුණේ නායකත්වය ගෙන කටයුතු කිරීම
  - රජරට චෝළ ආධිපත්‍යයෙන් මුදවා ගැනීම
  - බුද්ධරාජගේ ද සහාය ඇති ව කිත්ති කුමරු රුහුණ එක්සේසත් කිරීම හා කිත්ති විජයබාහු නමින් රුහුණේ බලයට පත් වීම
  - විජයබාහු රජුට විරුද්ධව චෝළවරු ගෙනගිය සටන් ව්‍යාපාරය
  - විජයබාහු රජු මලය රටට පසුබැසීම
  - විජයබාහු රජුගේ චෝළ විරෝධී සටන් ව්‍යාපාරය
  - තම්බලගාමයේ සිට චෝළ විරෝධී සටන් සඳහා සූදානම් වීම
  - චෝළ ආක්‍රමණ එල්ල වීම නිසා පලුට්ඨගිරියට පලායාම
  - චෝළයන්ට එරෙහිව පොළොන්නරුව වෙත ආක්‍රමණයක් එල්ල වීම හා පොළොන්නරුව අල්ලා ගැනීම
  - වීර රාජේන්ද්‍ර විසින් එවන ලද හමුදාවන්ට මුහුණ දීමට නොහැකි ව විජයබාහු රජු වාකිරිගල තෙක් පසු බැසීම
  - මහානාගහුල මධ්‍යස්ථාන කොටගෙන නැවත චෝළ විරෝධී සටන මෙහෙයවීම
  - චෝළ දේශයේ දේශපාලන තත්ත්වය විජයබාහු රජුට වාසි සහගත වීම
  - මහානාගහුල සිට තුන් පැත්තකින් හමුදා යවා පොළොන්නරුව වට කොට පහර දීමට කටයුතු කිරීම
  - ක්‍රි.ව. 1070 දී චෝළයන් පරාජය කොට පොළොන්නරුව අල්ලා ගැනීම

- **පළමුවෙනි විජයබාහු රජුගේ කාර්ය සාපල්‍යය**
  - දිවයින චෝළ ආධිපත්‍යයෙන් මුදවා ගැනීම
  - පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම
  - පාලන තන්ත්‍රය ප්‍රතිසංවිධානය කිරීම
  - ආගමික කටයුතු, විහාරාරාම ප්‍රතිසංස්කරණ කොට බුරුමයෙන් උපසම්පදාව ගෙන්වා ශාසනය නැවත ප්‍රතිසංවිධානය කිරීම
  - පනාකඩුව තඹ සන්නස

- **පළමුවෙනි විජයබාහු රජුගෙන් පසු පළමුවෙනි පරාක්‍රමබාහු රජු දක්වා ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වය**

  - පළමුවෙනි විජයබාහු රජුගේ අභාවයෙන් පසු රට තුළ දේශපාලන වශයෙන් අවුල් සහගත තත්ත්වයක් හට ගැනීම
  - විජයබාහු රජුගේ පුත් වික්‍රමබාහු (කස්සප) කුමරු නොසලකා හරිමින් මිත්තා කුමරියගේ පුත් මානාභරණ උපරාජ තනතුරට පත් කිරීම නිසා නොසන්සුන්තාවක් හට ගැනීම
  - ශ්‍රී ලංකාව පාලකයින් හතර දෙනෙකු අතර බෙදී යාම
    * වික්‍රමබාහු - රජරට - පොලොන්නරුව
    * මානාභරණ - දක්ෂිණ දේශය - පුංඛගාම
    * කිත්සිරි මේඝ - දොලොස් දහස් රට - මහානාගහුල
    * සිරිවල්ලභ - අටදහස් රට - උදුන්දොර
  - ක්‍රි.ව. 1153 දක්වා ලංකාවේ අවුල් සහගත තත්ත්වයක් පැවතීම

- **පළමුවෙනි පරාක්‍රමබාහු රජුගේ කාර්ය සාපල්‍යය (1140 - 1186 තෙක්)**
  - පරාක්‍රමබාහු කුමරුගේ ළමා කාලය හා තරුණ වියට එළඹීම
  - දේශපාලන භූමියට ප්‍රවිෂ්ට වෙමින් දක්ෂිණ දේශයේ පාලකයා බවට පත් වීම
  - රජරට අල්ලා ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග
  - රජරට අල්ලා ගැනීම සඳහා ගජබාහු රජු සමඟ කරන ලද සටන් ව්‍යාපාර
  - මලය දේශය යටත් කොට ගැනීම
  - වයඹදිග ප්‍රදේශය සහ නැගෙනහිර ප්‍රදේශය සමඟ ගෙනගිය සටන්
  - පොළොන්නරුව අල්ලා ගැනීම
  - ගජබාහු රජු සමඟ සමගි සම්මුතියකට එළඹීම - සංගමු ලිපිය
  - මානාභරණට එරෙහි ව පරාක්‍රමබාහු රජු විසින් ගෙනයන ලද සටන් ව්‍යාපාර
  - ක්‍රි.ව. 1153 දී පොළොන්නරුවේ සිහසුනට පත් වීම
  - සුගලා බිසවගේ නායකත්වයෙන් රුහුණේ කැරලි ඇති වීම
  - සුගලා බිසව පරාජය කොට කැරලි මර්දනය කිරීම හා දළදාව සහ පාත්‍ර ධාතුව ලබා ගැනීම
  - ක්‍රි.ව. 1154 දී මුළු රටේ ම අසහාය පාලකයා ලෙස අභිෂේක වීම
  - බුරුම ආක්‍රමණය හා පාණ්ඩ්‍ය ආක්‍රමණය
  - එයට බලපෑ හේතු සහ ඒවායේ ප්‍රතිඵල

- **දෙවෙනි විජයබාහු බලයට පත් වීම**
  - පරාක්‍රම රජුට පුතුන් නොවූයෙන් ඔහුගේ සොහොයුරියගේ පුත්‍රයා වූ දෙවන විජයබාහු සිහසුනට පත් වීම
  - කාලිංග පෙළපතට සිහසුන උරුම වීම

- **නිශ්ශංකමල්ල රාජ්‍ය කාලය**
  - දෙවෙනි විජයබාහු රජුගෙන් පසු ඔහුගේ ආදිපාද ධූරය දරූ නිශ්ශංකමල්ල බලයට පත් වීම
  - පරාක්‍රමබාහු රජුගෙන් පසු පොළොන්නරුවේ බලයට පත් ශ්‍රේෂ්ඨ පාලකයා වීම
  - සිහසුනට පත්වීමේ දී ඔහුට මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතා
  - එම දුෂ්කරතා ජයගත් ආකාරය
  - තම බලය තහවුරු කොට ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග. බුදු දහමට සැලකීම, රට වටා සංචාරය කිරීම, තුලාභාර දාන දීම, වැසියා බදුබරින් මුදවා ගැනීම, වැසියාට සහන සැලසීම

- **නිශ්ශංකමල්ල රජුගෙන් පසු පොළොන්නරු රාජධානියේ දේශපාලන තත්ත්වය**

  - සෙනෙවිවරුන් බලවත් වීම, සිහසුනට රජවරුන් පත් කිරීමට පවා සෙනෙවිවරුන් බලවත් වීම, පාලකයින් රූකඩ තත්ත්වයට පත්ව සිටීම (කීර්ති සෙනෙවි, පරාක්‍රම සෙනෙවි, ආයුෂ්මන්ත සෙනෙවි)
  - කාලිංග - පාණ්ඩ්‍ය පෙළපත් අතර සිංහාසනය සඳහා වූ අරගලය
  - ලීලාවතී රැජන හා කල්‍යාණවතී රැජනගේ කාලය තරමක් දුරට ස්ථාවර තත්ත්වයක පැවතීම

- **කාලිංග මාඝ ආක්‍රමණය**

  - පොළොන්නරු රාජධානියේ අවසාන පාලකයා වූ පරාක්‍රම පාණ්ඩ්‍ය කාලයේ කාලිංග දේශයෙන් පැමිණි මාඝ නැමැත්තාගේ ආක්‍රමණය
  - 24000ක කේරළ හමුදාවක් සමග 1215 දී පොළොන්නරුවට කඩා වැදුණු මාඝ, පරාක්‍රම පාණ්ඩ්‍ය බලයෙන් පහ කොට පොළොන්නරුවේ බලය අල්ලා ගැනීම
  - කාලිංග මාඝගේ කෲර ක්‍රියාකලාපය නිසා රජරට කුලීන ජනතාවත්, භික්ෂූන් වහන්සේලාත් රජරට අතහැර රුහුණට, මලය ප්‍රදේශයට හා නිරිත දිග ප්‍රදේශවලට සංක්‍රමණය වීම
  - රජරට ශිෂ්ටාචාරයේ පදනම වූ වාරිපද්ධතිය හා බුද්ධාගම පරිහානියට පත් වීම
  - රුහුණු ප්‍රදේශය මර්දනය කොට පැවති බැවින් මාඝට එරෙහි ව රුහුණෙන් ප්‍රබල විරෝධතාවක් එල්ල වීම
  - දේශීය පාලන මධ්‍යස්ථානය නිරිතදිග ප්‍රදේශවලට සංක්‍රමණය වීම

- **පාලන තන්ත්‍රය - අනුරාධපුර යුගය**

  - රාජාණ්ඩු ක්‍රමය බෙහෙවින් ජන සම්මත වාදී වීම
  - පණ්ඩුකාභය රජු නගර හා ගම් පාලනය විධිමත් කරමින් සංවිධානාත්මක පාලනයකට පදනම දැමීම
  - දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දී ඉන්දියානු පරිපාලන මූලධර්ම මෙරට පරිපාලන තන්ත්‍රය කෙරෙහි බලපෑම
  - පරිපාලනයට සම්බන්ධ නිල නාම අභිලේඛනවලින් හෙළි වීම
  - මධ්‍ය පාලනයේ පහසුව සඳහා රාජ්‍යය ප්‍රදේශීය පරිපාලන ඒකකවලට බෙදා තිබීම
  - රෝහණයේ පාලනය පැවරුන උපරාජ තනතුර රජ පවුලේ කෙනෙකුට භාර වීම
  - සේනාපති, බඩගරික, පුරෝහිත, අමාත්‍ය වැනි ඉහළ තනතුරු මධ්‍ය පාලනය හා සම්බන්ධව පැවතීම
  - දෝවාරික, අදෙක, අණික, අසිග්ගාහක, දණ්ඩනායක වැනි අය මධ්‍ය පාලනයේ දී සහාය වූ අනෙකුත් නිලධාරීන් ලෙස සඳහන් වීම
  - ගම් පාලනයේ දී ගාමිණී, ගමික, පරුමක, මපුරුමුක යන තනතුරු දැරූ නිලධාරීන් සිටීම
  - අනුරාධපුර යුගය අවසාන භාගය වන විට පාරිපාලන තන්ත්‍රයට මාපා, ඈපා, මහලේ, වෙද් සම්දරුවන්, වෙලසුන් සම්දරුවන්, දෙමෙල් අධිකාරී, මෙය්කප්පර් වැනි තනතුරු එක් වීම

- **චෝළ පාලනය - චෝළ පාලන සමයේ ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වය**

  - රජරට චෝළ පාලනය පැහැදිලි කිරීම
  - චෝළයන් පොළොන්නරුව තම අගනුවර ලෙස තෝරා ගෙන එය 'ජනනාථ මංගලම්' නමින් නම් කිරීම
  - රජරට ප්‍රදේශය චෝළ අධිරාජයාගේ ප්‍රාන්තයක් බවට පත් කොට එය ''මුම්මුඩි චෝළ මණ්ඩලම්'' නමින් හැඳින්වීම

- චෝළ සෙන්පතියෙකු එම ප්‍රදේශ පාලනය කිරීම සහ ඉහළ නිලතලවලට චෝළ නිලධාරීන් පත් කිරීම
- චෝළ පාලනය බොහෝ දුරට හමුදා ස්වරූපයක් ගැනීම
- ලංකාවේ රජරට ප්‍රදේශයේ සියලු ධන සම්පත් චෝළයන් අයිති කොට ගැනීම
- වාරිමාර්ග වැනි දේශීය සම්පත් විනාශ කිරීම චෝළ පාලන ප්‍රතිපත්තියේ අංගයක් නොවන බවට සාධක දක්නට ලැබීම
- ශ්‍රී ලංකාවේ සම්පත් චෝළ රාජ්‍යයේ ප්‍රයෝජනයට යොදා ගැනීම
- තන්ජෝර් දේවාලයයේ නඩත්තුව සඳහා ගම්වර ප්‍රදානය කිරීම
- වාර්ෂික ව නියමිත කප්පම්, පුද පඬුරු චෝළ අගනුවරට යැවීම
- චෝළ අධිරාජයාගේ මැදිහත් වීම්වලින් තොර ව චෝළ නිලධාරීන් තම අභිමතය පරිදි පාලන කටයුතු මෙහෙය වීම
- ශ්‍රී ලංකාවේ උතුරු කොටස පාලනය කිරීමට චෝළ අධිරාජයා විසින් යුද්ධාධාර එවනු ලැබීම

- **පොළොන්නරු යුගයේ පාලන තන්ත්‍රය**
  - පළමුවෙනි විජයබාහු රජු අනුරාධපුර යුගයේ පැවති පාලන ක්‍රමය ඒ අයුරින්ම පවත්වා ගෙන යාමට උත්සාහ දැරීම
  - ප්‍රදේශීය බෙදීම් වන දක්ෂිණ දේශය හා රෝහණ දේශය යන ප්‍රදේශ මාපා හා ඈපා විසින් පාලනය කිරීම
  - පසු ව රෝහණය කොටස් දෙකකට බෙදීම අටදහස් රට හා දොළොස්දහස් රට වශයෙන්
  - රට රුහුණු, පිහිටි, මායා වශයෙන් පරිපාලන ප්‍රදේශ තුනකට බෙදුණු බවට පැහැදිලි සාධක ලැබීම

- **යුද්ධෝපක්‍රම**
  - පූර්ව ආරක්ෂක ක්‍රම භාවිතය
    * බලකොටු තැනවීම (විජිතපුර, සීගිරිය, යාපහුව)
    * දිය අගල් තැනවීම (සීගිරිය, යාපහුව)
    * නගර ප්‍රාකාර තැනවීම (වසභ රජු)
  - විධිමත් ලෙස සේනා සංවිධානය හා හැසිරවීම
    * දුටුගැමුණු රජු, පරාක්‍රමබාහු රජු
  - චතුරංගිණී සේනාව (ඇත්, අස්, රිය, පාබල)
  - රජවරු යුද්ධ හා යුද්ධ උපක්‍රම ගැන සඳහන් ග්‍රන්ථ හැදෑරීම
    * පළමුවෙනි පරාක්‍රමබාහු රජු කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය හැදෑරීම
  - සතුරා මුළා කිරීමට උපාය භාවිතය
    * දුටුගැමුණු රජු, පරාක්‍රමබාහු රජු
  - පෙරදිග යුද්ධ ආචාර ධර්ම භාවිතය
    * දුටුගැමුණු - එළාර ද්වන්ද්ව සටන
    * පළමුවෙනි පරාක්‍රමබාහු රජු - අත්අඩංගුවට පත් සතුරාට (දෙවෙනි ගජබාහු රජුට) නිසි ගෞරව අනුව සැලකීම

- **විදේශ සම්බන්ධතා**
  - විදේශ රටවල් සමඟ පැවති සම්බන්ධතා හා ඒවායේ ප්‍රතිඵල
  - ලංකාවේ පිහිටීම විදේශ සම්බන්ධතා කෙරෙහි විශේෂ වැදගත්කමක් ගත් ආකාරය
  - පෙර අපර දෙදිග අතර මධ්‍යස්ථානයක් වීම
  - ඉන්දියාවට ආසන්න ව පිහිටීම නිසා ඉන්දියාව සමඟ සම්බන්ධතා ප්‍රමුඛස්ථානයක් ගැනීම
  - දේශපාලන, ආර්ථික, සංස්කෘතික වශයෙන් පැවති සම්බන්ධතා.
  - අපරදිග සම්බන්ධතා වාණිජ පදනමක් මත පැවතීම

- **අනුරාධපුර අවධියේ ඉන්දියානු සම්බන්ධතා**
  - බුදු දහම පැමිණීම - මෞර්ය අභිශේකයට අදාළ භාණ්ඩ එවීම
  - ඉන්දියාවේ රජවරුන් භාවිත කළ තනතුරු, විරුදනාම ආදිය ලංකාවේ රජවරුන් ද භාවිතා කිරීම
  - මෞර්ය හා ගුප්ත අවධිවල පැවති සම්බන්ධතා
  - ආක්‍රමණ හා සංක්‍රමණ පදනම් කොටගත් සම්බන්ධතා
  - අනුරාධපුර යුගයේ දී ඉන්දියාවෙන් ආක්‍රමණ රැසක් එල්ල වීම
    - * සේන ගුත්තික, එළාර, පුලහත්ථ ප්‍රමුඛ පංච ද්‍රවිඩයෝ, කරිකාලන්, පණ්ඩු ප්‍රමුඛ ෂඩ් ද්‍රවිඩයෝ, ශ්‍රී මාර ශ්‍රී වල්ලභ, පළමුවෙනි පරාන්තක, තුන්වෙනි ක්‍රිෂ්ණ, පළමුවෙනි රාජ රාජ, පළමුවෙනි රාජේනද්‍ර
  - සංක්‍රමණ
    - * සංඝමිත්තා මෙහෙණිය සමග කුල 18ක ශිල්ප ශ්‍රේණි පැමිණීම
  - ලංකාවේ රජවරුන් ඉන්දියානු ආධාර පැතීම

    උදාහරණ: ඉළනාග, පළමුවෙනි මුගලන්, අභයනාග, තුන්වෙනි අග්ගබෝධි, මානවම්ම යන රජවරුන්
  - ඉන්දීය රජවරුන් ශ්‍රී ලංකාවෙන් යුධ ආධාර පැතීම
    - * දෙවෙනි වරගුණ වර්මන්, මාර වර්මන්, දෙවෙනි රාජසිංහ වැනි පාණ්ඩ්‍ය පාලකයින්, දෙවෙනි සේන රජු පාණ්ඩ්‍ය රාජ්‍යයට ආක්‍රමණයන් මෙහෙයවීම
  - විවාහ සම්බන්ධතා
    - * මධුරා කුමරිය, භද්දකච්චානා කුමරිය, හතරවෙනි මිහිඳු රජු කාලිංග කුමරියක් විවාහ කොට ගැනීම
  - මිත්‍ර සම්බන්ධතා
    - * ගජබාහු රජු සොළීන්ට විරුද්ධ ව කේරළ රාජ්‍යයේ රජු සමග සම්බන්ධතා පැවැත්වීම
  - ඉන්දියානු කුලී හමුදා පැමිණීම හා ඒ නිසා ඇති වූ බලපෑම්
  - රෝමයේ ක්ලෝඩියස් රජු රුවන්වැලි සෑය අලංකාර කිරීම සඳහා භාතිකාභය රජු සමයේ පබලු පලසක් ලංකාවට එවීම

- **පොලොන්නරු යුගයේ විදේශ සම්බන්ධතා**
  - පළමුවෙනි විජයබාහු, පළමුවෙනි පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල යන ප්‍රධාන රජවරුන් පැවැත්වූ සම්බන්ධතා
  - දේශපාලන, ආර්ථික, සංස්කෘතික යන අංශ වල පැවැත්වූ සම්බන්ධතා
  - පළමුවෙනි විජයබාහු රජු චෝල විරෝධී රාජ්‍ය සමග සම්බන්ධතා පැවැත්වීම

    උදාහරණ: ජගතීපාලගේ දියණිය වූ ලීලාවතී තම අග මෙහෙසිය කොට ගැනීම, කාලංගගේ තිලෝක සුන්දරී කුමරිය විවාහ කොට ගැනීම. තම සොහොයුරිය මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමරෙකුට විවාහ කර දීම. තම පුත් වික්‍රමබාහු කුමරුට සුන්දරී නම් කාලිංග කුමරිය විවාහ කරදීම, බටහිර චාලුක්‍ය රාජ්‍යයට පුද පඬුරු යවා මිත්‍ර සම්බන්ධතා ඇතිකොට ගැනීම
  - මෙම විවාහ සම්බන්ධතා නිසා කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන්ට සිංහල සිංහාසනයට අයිතිවාසිකම් කීමට අවස්ථාව ලැබීම
  - මේ නිසා කාලිංග පාණ්ඩ්‍ය අරගලය පොළොන්නරු යුගය පුරාම ව්‍යාප්තව පැවතීම
  - බුරුමය සමඟ වෙළෙඳ සම්බන්ධතා පවත්වමින් ආර්ථිකය ශක්තිමත් කොට ගැනීම
  - බුරුමයෙන් උපසම්පදාව ගෙන්වා නැවත බුදු සසුන නගා සිටුවීම

- **පළමුවෙනි පරාක්‍රමබාහු රජුගේ විදේශ සම්බන්ධතා**
  - බුරුම ආක්‍රමණය
  - මුල් කාලයේ බුරුමය සමඟ සුහද සම්බන්ධතා පැවතියත් පසු කාලයේ දී එම සම්බන්ධතා පලුදු වී බුරුමය ආක්‍රමණය කිරීම

- බුරුම ආක්‍රමණයෙන් පසු නැවත වෙළෙඳ හා ආගමික සම්බන්ධතා තහවුරු වීම
- පාණ්ඩ්‍ය ආක්‍රමණය
  චෝළයන්ට විරුද්ධ ව පාණ්ඩ්‍ය වාංශිකයන් පරාක්‍රමබාහු රජුගෙන් ආධාර ඉල්ලා සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් පරාක්‍රමබාහු රජු පාණ්ඩ්‍ය දේශයට ආධාර හමුදා යැවීම. දිගු කලක් තිස්සේ චෝළයන්ට විරුද්ධ ව සටන් මෙහෙය වීම
- කාම්බෝජය සමඟ සම්බන්ධතා පැවැත්වීම - සිංහල කුමරියක කාම්බෝජය වෙත යැවීම
- පොළොන්නරු රාජමාලිගයේ සහ පොලොන්නරු රාජධානියේ තිබී චීන කාසි හා චීන වළන් කැබලි හමු වී තිබීම නිසා චීනය සමඟ ද සම්බන්ධතා පැවැත්වූ බවට සාධක තිබීම

- **නිශ්ශංකමල්ල රජුගේ විදේශ සම්බන්ධතා**
  - චෝළ විරෝධී දකුණු ඉන්දියානු රාජ්‍ය සමඟ සම්බන්ධතා පැවැත්වීම. චාලුක්‍ය, කාලිංග ගුජරාට්, ආන්ද්‍රා, බුරුම යන රටවල් සමඟ සම්බන්ධතා පැවැත්වූ බව නිශ්ශංකමල්ල රජු තම සෙල්ලිපි වල සඳහන් කොට තිබීම
  - චතුරංගිණී සේනා පිරිවරා දකුණු ඉන්දියාවට ගිය බව රාමේශ්වරම් ලිපියේ සඳහන් ව තිබීම
  - පරාක්‍රමබාහු රජු මෙන් ම නිශ්ශංකමල්ල රජු ද චෝල විරෝධී පාණ්ඩ්‍ය කුමාරවරුන්ට සහාය දැක්වීම

- **ආගම හා සංස්කෘතිය**
  - ශ්‍රී ලංකාවේ බුදු දහම පිහිටුවීම හා ව්‍යාප්තිය
  - ඉන්දියානු පසුබිම
    * අශෝක අධිරාජයා තුන්වෙනි ධර්ම සංගායනාව පැවැත්වීම හා ධර්ම ප්‍රචාරය
    * අශෝක අධිරාජයා සමග දේවනම්පියතිස්ස රජු පැවැත්වූ දේශපාලන සම්බන්ධතා
    * අශෝක අධිරාජයාගේ විශේෂ අවධානය ලංකාව කරා යොමු වීම

- **ශ්‍රී ලංකාවේ බුද්ධාගම ස්ථාපිත කිරීම**
  - මහින්දාගමනය
  - අරිට්ඨ කුමරු ඇතුළු පිරිස සසුන් ගත වීම සහ භික්ෂු ශාසනයේ ආරම්භය
  - මහමෙවුනා උයන පූජා කිරීම හා මහාවිහාරයේ ආරම්භය
  - ථූපාරාමය ගොඩනැංවීම
  - ශ්‍රී මහා බෝධිය වැඩම කිරීම හා බෝධි රෝපණය කිරීම
  - බෝධීන් වහන්සේ වෙනුවෙන් පුද පූජා, ආවතේව පැවැත්වීමට දහඅට කුලයක ජනයා පැමිණීම
  - අනුලා දේවිය සසුන්ගත වීම හා භික්ෂුණී ශාසනය පිහිටුවීම
  - වෙහෙර විහාර සහ බෞද්ධ ගොඩනැගිලි ඉදි වීම

- **බුද්ධාගම ව්‍යාප්තියට තුඩුදුන් හේතු**
  - දේවානම්පියතිස්ස රජු බුද්ධාගම වැලඳගැනීම
  - බෞද්ධාගම සඳහා රාජ අනුග්‍රහය ලැබීම
  - එය අවිහිංසක දහමක් වීම
  - ඒ වන විට මෙරට සංවිධානාත්මක ආගමයක් නොතිබීම
  - රජවරු හා මැතිඇමතිවරු විසින් බෞද්ධ වෙහෙර-විහාර තැනවීම

- **බුද්ධාගම ව්‍යාප්තිය**
  - බුද්ධාගම රාජ්‍ය ආගම ලෙස පිළිගැනීම
  - භික්ෂු - භික්ෂුණී ශාසන පිහිටුවීම හා ඒවා රට පුරා ව්‍යාප්ත වීම

- මහාවිහාරය, අභයගිරිය සහ ජේතවනය කේන්ද්‍ර කොට භික්ෂු ශාසනය හා අධ්‍යාපනය ව්‍යාප්ත වීම
- කිත්සිරිමෙවන් රාජ්‍ය සමයයේ දළදාව වැඩම කර වීම
- ලංකාවට මහායාන බලපෑම් ඇති වීම
- පෙරදිග ථේරවාද මධ්‍යස්ථානය බවට ලංකාව පත් වීම
- භික්ෂු ශාසනයෙහි විවිධ නිකාය වර්ධනය වීම
- දිවයින පුරා බුද්ධාගම පැවති බවට සාධක හමු වීම

- **වෙනත් ආගම්**
  - ජෛන ආගම
    * වළගම්බා රජු සමයේ ගිරි නිගණ්ඨයා ගැන සඳහන් ව තිබීම

  - හින්දු ආගම
    * මහසෙන් රජු සමයේ ශිව දේවාල, ආරාම විනාශ කළ බව සඳහන් ව තිබීම
    * පොළොන්නරු යුගයේ දී හින්දු ආගම හා සම්බන්ධ ඇදහිලි හා විශ්වාස පැතිර වීම
    * ශිව දේවාල හතරක් තිබීම
    * ශිව, පාර්වතී, ලක්ෂ්මී ප්‍රතිමා තිබීම

  - බ්‍රාහ්මණ බලපෑම්
    * වළගම්බා රජුගේ කාලයේ තීය බ්‍රාහ්මණයා කැරලි ඇති කිරීම
    * අනුරාධපුර අග භාගයේ දකුණු ඉන්දියානු පිරිස් මෙරටට පැමිණීම සමඟ එරට ඇදහිලි හා විශ්වාස මෙරට ප්‍රචලිත වීම



පොළොන්නරුව ශිව දේවාලය

- **කලාව හා සංස්කෘතිය**
  - වාස්තු විද්‍යාව - චෛතියඝර, බෝධිඝර, ප්‍රතිමාඝර, විහාරාරාම, ආරෝග්‍යශාලා, දාන ශාලා, පොකුණු, සන්නිපාත ශාලා
  - ගොඩනැගිලි හා ඒ පිළිබඳ මූලාශ්‍රය තොරතුරු
  - ලෙන් නිර්මාණ - උදාහරණඃ දඹුල්ල




පොළොන්නරුව වටදාගේ ඉදිරිපිට පිහිටි සඳකඩපහන



ගණපති ප්‍රතිමාව ක්‍රි.ව 1065 - 1120



නටරාජා ප්‍රතිමාව

- ස්තූප - ස්තූපයේ ප්‍රභවය, ප්‍රධාන අංග, රජරට ප්‍රධාන ස්තූප, ස්තූපයට එක්වූ නවාංග, ස්තූප ඉදිකරවූ රජවරු
- චිත්‍ර කලාව - සීගිරි චිත්‍ර, හිඳගල චිත්‍ර, තිවංක පිළිමගේ චිත්‍ර



දානශාලා



තිවංක පිළිමගේ සිතුවමක්

- මූර්ති කලාව - බුදු පිළිමය හා එහි විකාශනය සුප්‍රකට බුද්ධ ප්‍රතිමා, බෝධි සත්ත්ව ප්‍රතිමා
  උදාහරණ: සමාධි පිළිමය, ගල්විහාර ප්‍රතිමා, දඹේගොඩ බෝධිසත්ව ප්‍රතිමාව
- සැරසිලි හා මූර්ති - සඳකඩ පහණ, වාමන රූප, දොරටුපාල රූප, කොරවක් ගල්, වාහල්කඩ, දේව, මිනිස් රූප



මිහින්තලේ කණ්ඨක චෛත්‍යයේ වාහල්කඩ



මුරගල

- අධ්‍යාපනය

  - පන්සල හා පිරිවෙන් හා භික්ෂූන් වහන්සේ ආශ්‍රයයෙන් පැතිරගිය අධ්‍යාපනය
  - පාලි සංස්කෘත, සිංහල භාෂා භාවිතය
  - මහාවිහාරය, අභයගිරිය, ජේතවනාරාමය, සිතුල්පව්ව වැනි බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන

- භාෂාව

  - බුදුදහම පැමිණීමත් සමග භාෂාවේ හා ලේඛන කලාවේ වර්ධනය
  - අක්ෂර මාලාවේ පරිණාමය
  - ලේඛන කලාව
  - දෙමළ භාෂාව වර්ධනය වීම
  - පොළොන්නරු යුගයේ භාෂාවේ ඇති වූ වෙනස් වීම

- සාහිත්‍යය

  - පාලි සංස්කෘත සිංහල සාහිත්‍යය
  - සාහිත්‍ය ග්‍රන්ථ
  - හෙළ අටුවා ග්‍රන්ථ
  - පලි සාහිත්‍යය - සීගිරි ගී, දොළොස් මහා කවීන් පළමුවෙනි අග්බෝ රජු දවස වාසය කළ බව සඳහන් ව තිබීම. ජානකීහරණය
  - වංසකථා
  - සාහිත්‍යය කටයුතු සඳහා රජවරුන් අනුග්‍රහය සහ දායකත්වය
    උදාහරණ: කුමාරදාස රජු (ජානකීහරණය), දෙවෙනි මුගලන් රජු, පළමුවෙනි අග්බෝධි රජු, හතරවෙනි සේන රජු (සියබස් ලකර) , පස්වෙනි කාශ්‍යප (ධම්පියා අටුවා ගැටපදය) පළමුවෙනි විජයබාහු රජු
  - රජරට ශිෂ්ටාචාරයේ ගද්‍ය, පද්‍ය, සාහිත්‍ය නිර්මාණ හා නිර්මාණකරුවෝ

- ආර්ථිකය
  - කෘෂිකර්මය
    * ආර්ථිකය, කෘෂිකර්මාන්තය පදනම් කොට පැවති බව මූලාශ්‍රය සාධකවලින් හෙළි වීම
    * කෘෂිකර්මාන්තය ආර්ථිකයේ ප්‍රධාන ස්ථානයක් ගැනීමට බලපෑ හේතු
    * ගොවිතැන් ක්‍රම - මඩ ගොවිතැන හා ගොඩ (හේන්) ගොවිතැන
    * කෘෂි මෙවලම් හා ශිල්පීය ක්‍රම
    * ගොවිතැන සඳහා ජලය ලබාගත් ක්‍රම
    * වගා කළ ධාන්‍ය වර්ග හා බෝග වර්ග - අභිලේඛන මගින් ඒ පිළිබඳව තොරතුරු ලැබී තිබීම
      උදාහරණ: තෝනිගල ලිපිය
    * කෘෂිකර්මාන්තය හා සම්බන්ධ නිලධාරීන්
    * කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා අනුග්‍රහ දැක්වූ පාලකයෝ

- වාරිමාර්ග

  - කෘෂිකර්මාන්තයේ දියුණුවට වාරිමාර්ග ක්ෂේත්‍රයෙන් ලද සහාය
  - වාරිමාර්ග පිළිබඳ ව උනන්දු වූ රජවරු
  - වසභ රජු මහ වැව් ඉදි කොට - වැව් 11ක් සහ ඇළවල් 12ක් ඉදි කිරීම

- මහසෙන් රජු මින්නේරිය, හුරුලු වැව, කවුඩුලු වැව, මහකනදරා වැව ඇතුළු වැව් 16ක් ඉදි කර වීම සහ විශාල ප්‍රමාණයේ ඇළක් කර වීම
- ධාතුසේන රජු කලා බලලු වැව් ඇතුළු මහා වැව් 18ක් සහ වාරි තාක්ෂණයේ ශ්‍රේෂ්ඨ නිර්මාණයක් වන ජය ගඟ හෙවත් යෝධ ඇළ ඉදි කරවීම
- පළමුවෙනි අග්බෝ රජු මිහින්තලා, කුරුන්දි හා හිරිවඩුන්න වැව ද මණිමේඛලා බැම්ම සහ මණිමේඛලා ඇළ ද ඉදි කරවීම
- දෙවෙනි අග්බෝ ගිරිතලේ, කන්තලේ වැව් කරවීම
- මානවම්ම රජු වැව් අටක් ඉදි කරවූ බව
- පොළොන්නරු රාජධානි සමයේ පළමුවෙනි විජයබාහු පරිහානියට පත් වී තිබූ වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම
- මහා පරාක්‍රමබාහු රජු පරාක්‍රම සමුද්‍රය ඇතුළු මහ වැව් සහ ඇළ මාර්ග ඉදි කොට වාරි කර්මාන්තයේ ඇති කළ සංවර්ධන

- **වෙළෙඳාම හා කර්මාන්ත**
  - වෙළෙඳාම
    * ඉන්දියන් සාගරය අවට පිහිටි වෙළෙඳ මාර්ග
    * වෙළෙඳාම හා ලක්දිව ජනාවාස වීම පිළිබඳ අදහස්
    * අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම සහ වෙළෙඳ පොළ
    * ශ්‍රී ලංකාව සමඟ සමීප වාණිජ සම්බන්ධතා පැවැත්වූ රටවල්
    * ආනයන හා අපනයන භාණ්ඩ
    * ප්‍රධාන වරායයෝ
    * වෙළෙඳ භාණ්ඩ ප්‍රවාහණය කළ ක්‍රම
    * කාසි භාවිතය පැවතීම
    * වෙළෙඳ සංවිධාන හා වෙළෙඳ ශ්‍රේණි
    * විදේශීය වෙළෙඳාම නිසා මතු වූ ගැටලු
  - කර්මාන්ත
    * කුල දහඅටක ශිල්පීන්ගේ පැමිණීම (වංසකථා තොරතුරු)
    * අභිලේඛන හා සාහිත්‍ය මූලාශ්‍රයවලින් හෙළි වන කර්මාන්ත
    * පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂ
    * කර්මාන්ත සහ ඒ සඳහා යොදාගත් උපකරණ

- **විද්‍යාව හා තාක්ෂණය**
  - වාරි තාක්ෂණය
    * වැවක ප්‍රධාන කොටස් - බිසෝ කොටුව, වැව් බැම්ම, සොරොව්ව, පිටවාන, රළපනාව, කලිඟු බැමි, කුළු වැව්
  - වාස්තු විද්‍යාව
    * චෛතියඝර, පටිමාඝර, බෝධිඝර, විහාර ආරාම, අරෝග්‍යශාලා දාගැබ්, පිළිම ගෙවල්, රජමාලිගා



වාරි තාක්ෂණය



රජ මාළිගා

- වෛද්‍ය විද්‍යාව
    * මිහින්තලේ හා පොළොන්නරුවේ රෝහල්වල නිෂ්ටාවශේෂ හමු වීම
    * වෛද්‍ය උපකරණ ශල්‍ය උපකරණ
    * බුද්ධදාස රාජ්‍ය සමයේ වෛද්‍ය ක්‍රමයක් පැවතීම
    * අනුරාධපුර යුගයේ වෛද්‍ය කටයුතු (රෝහල්) සඳහා අනුග්‍රහ දක්වූ රජවරු
- ලෝහායනය
- නාවික තාක්ෂණය
    * ඉන්දියාව ඇතුළු අනෙකුත් විදේශ රටවල් සමග සම්බන්ධතා පැවැත් වීම සඳහා දියුණු නාවික තාක්ෂණයක් තිබිම

      උදාහරණ: ඉන්දියාවට තානාපති පිරිස් යැවීම
      රෝමයට දූත පිරිස් යැවීම
      ඉළනාග වැනි රජවරුන් ඉන්දියාවට පලා යාම
      ගජබාහු ඉන්දියාව ආක්‍රමණය කිරීම
      විජයබාහු, පරාක්‍රමබාහු වැනි රජවරුන් බුරුමය වැනි රටවල් සමග සම්බන්ධතා පැවැත්වීම
      බුරුම ආක්‍රමණ, පාණ්ඩ්‍ය ආක්‍රමණ සඳහා පරාක්‍රමබාහු රජු, නැව් තැනවූ බව සඳහන් ව තිබීම



පොලොන්නරුව ආළාහන පිරිවෙන් රෝහල





ඇගයීම - 01
**පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

**අංක 01 සහ 02 දක්වා ඇති ප්‍රශ්න සඳහා X හා Y තීරු ඇත. මෙම තීරු ගැලපෙන ආකාරයට සැකසූ විට අදාළ පිළිතුරෙහි අංකය තිත් ඉරමත ලියන්න.**

1.

| (X) | (Y) |
|---|---|
| (i) වේවැල්කැටිය සෙල්ලිපිය | (A) වෙළෙඳ ගමක කළමණාකරන නීතිරීති |
| (ii) කොන්ඩවට්ටවාන් සෙල්ලිපිය | (B) පාලකයින් දෙදෙනෙකු ඇතිකරගත් සාම ගිවිසුම |
| (iii) හෝපිටිගමු ටැම්ලිපිය | (C) ගම්වල අධිකරණ පරිපාලන නීතිරීති |
| (iv) ගොඩවාය සෙල්ලිපිය | (D) ගමක පාලනය පිළිබඳ නීතිරීති |
| (v) සංගමු විහාර සෙල්ලිපිය | (E) නැව් තොටකින් ලැබුණු තීරුබදු |

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDEAB (5) BEADE (…….....)

2.

| X | Y |
|---|---|
| (i) දුටුගැමුණු | (A) රිවිදේව |
| (ii) වලගම්බා | (B) කපිසීස |
| (iii) ධාතුසේන | (C) නන්දිමිත්‍ර |
| (iv) පළමුවන විජයබාහු | (D) මිගාර |
| (v) පළමුවන පරාක්‍රමබාහු | (E) ලංකාපුර |

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDEAB (5) BEADE (…….....)

**අංක 03 සහ 04 දක්වා ප්‍රශ්න වලට මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැලපේ. එය තෝරා ඊට අදාළ අංකය තිත් ඉරමත ලියන්න.**

03. **රජරට චෝළ ආධිපත්‍යය**
(1) පළමුවෙනි රාජේන්ද්‍ර විසින් ශ්‍රී ලංකාව ආක්‍රමණය කර පස්වෙනි මිහිඳු රජු අල්ලා ගෙන ඉන්දියාවට ගෙනයන ලදි.
(2) චෝළයන්ගේ පරිපාලන මධ්‍යස්ථානය වූයේ පොළොන්නරුවයි
(3) ශ්‍රී ලංකාවේ චෝළ ආධිපත්‍යයට යටත් ව පැවැති ප්‍රදේශ ඇතුලත් පාලන ඒකකය 'මුම්මුඩි ෂෝල මණ්ඩලම්' ලෙස හැඳින්වින
(4) ත්‍රිකුණාමලයේ වෙල්ගම් විහාරය චෝළ පාලනය යටතේ රාජරාජපෙරුම්පල්ළෙයි යනුවෙන් හැඳින්විය
(5) චෝළයන් දිවයිනෙන් පලවා හැරි කාලිංග මාඝ රජරට සිය ආධිපත්‍ය පිහිටු වීය
(...... .....)

03. **පොළොන්නරුවේ ආර්ථිකය**
(1) අනුරාධපුර සමයේ ආරම්භ වූ ලංකාවේ වාරිමාර්ග පද්ධතිය පොළොන්නරු සමයේ දී එහි ඉහළ ම දියුණුවට පත් විය.
(2) පොළොන්නරු සමයේ විශාල වැව් ඉදිකළ ශ්‍රේෂ්ඨත ම පාලකයා නිශ්ශංකමල්ල රජතුමා ය
(3) තෝපා වැව, දුඹුටුලු වැව හා එරමුදු වැව එක්කර පරාක්‍රම සමුද්‍රය ඉදිකරන ලදි
(4) විදේශ වෙළෙඳාම මුල් කරගෙන පැවැති ගැටුමක් පළමුවෙනි පරාක්‍රමබාහු රජුගේ බුරුම ආක්‍රමණයට හේතු විය.
(5) ඌරාතොට, පොළොන්නරු යුගයේ වෙළෙඳාම කරගෙන ගිය වැදගත් වරායක් විය (...... .....)

**නිවැරදි ප්‍රකාශය තෝරා එහි අක්ෂරය තිත් ඉරමත ලියන්න**

**(5) පළමුවෙනි විජයබාහු රජතුමා**
- (A) රට එක්සේසත් කිරීම
- (B) උපසම්පදා විනය කර්මය සිදුකර භික්ෂු සාසනය යලි පිහිටු වීම
- (C) කාලිංස මාඝ පරාජය කිරීම
- (D) තිබ්බතය සමග ආගමික සම්බන්ධතා පැවැත්වීම (...... .....)

**(6) වළගම්බා රජතුමාගේ පාලන සමය**
- (A) දන්තධාතූන් වහන්සේ ලක්දිවට වැඩම කිරීම
- (B) හත්දෙමිළ ආක්‍රමණය
- (C) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
- (D) මෝරිය-ලම්බකර්ණ ගැටුම් ඇති වීම

(...... .....)

(7) අනුරාධපුරයේ ඉදිකර ඇති ස්තූපවල නිවැරදි අනුපිළිවෙල කුමක් ද?
- (1) ථූපාරාමය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, අභයගිරිය, ජේතවනය
- (2) ථූපාරාමය, රුවන්වැලිසෑය, අභයගිරිය, මිරිසවැටිය, ජේතවනය
- (3) ථූපාරාමය, මිරිසවැටිය, අභයගිරිය, රුවන්වැලිසෑය, ජේතවනය
- (4) ථූපාරාමය, අභයගිරිය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, ජේතවනය
- (5) ථූපාරාමය, ජේතවනය, මිරිසවැටිය, අභයගිරිය, රුවන්වැලිසෑය (...... .....)

(8) අනුරාධපුර රජවරුන් නිවැරදි අනුපිළිවෙල වන්නේ කුමක් ද?
- (1) සද්ධාතිස්ස, ථූලත්ථන, බල්ලාටනාග, ලඤ්ජතිස්ස, වට්ටගාමිණී අභය
- (2) සද්ධාතිස්ස, බල්ලාටනාග, ථූලත්ථන, ලඤ්ජතිස්ස, වට්ටගැමිණි අභය
- (3) සද්ධාතිස්ස, ථූලත්ථන, බල්ලාටනාග, වට්ටගාමිණී අභය, ලඤ්ජතිස්ස
- (4) සද්ධාතිස්ස, වට්ටගැමිණී අභය, බල්ලාටනාග, ථූලත්ථන, ලඤ්ජතිස්ස
- (5) සද්ධාතිස්ස, ථූලත්ථන, ලඤ්ජතිස්ස, බල්ලාටනාග, වට්ටගැමිණී අභය (...... .....)

**ඇගයීම -02**
**පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

(1) i වට්ටගාමිණී අභය රජුට මුහුන දීමට සිදුවූ අභියෝග කවරේ ද? (ලකුණු 07යි)
ii ඔහු අභියෝග ජයගත් අයුරු පැහැදිලි කරන්න (ලකුණු 07යි)

(2) මහාපරාක්‍රමබාහු රජුගේ විදේශ සම්බන්ධතා විචාරාත්මක ව විමසන්න (ලකුණු 14යි)

(3) පළමුවෙනි විජයබාහු රජු පොළොන්නරු යුගයේ සිට රජකළ ශ්‍රේෂ්ඨ පාලකයෙකි. පහත සඳහන් මාතෘකා ඇසුරින් මෙම කියමන සාකච්ඡා කරන්න.
i විදේශ ආධිපත්‍යයෙන් රට මුදා ගැනීම සහ රට එක්සේසත් කිරීම
ii ඔහුගේ සාසනික කටයුතු (ලකුණු 14යි)

(4) පහත සඳහන් තේමා යටතේ දේවානම්පියතිස්ස රජුගේ රාජ්‍ය සමයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න

i මෞර්ය අධිරාජ්‍ය සමග රජුගේ දේශපාලන සම්බන්ධතා
ii බුද්ධ ශාසනය පිහිටු වීම
iii සංස්කෘතික වර්ධනය

(5) 'දුටුගැමුණු රජතුමාගේ කාර්යසාපල්‍යය උත්කෘෂ්ඨ ලෙස මහාවංසයෙහි දක්වා ඇත.'
i දුටුගැමුණු රජු උත්කෘෂ්ඨ ලෙස සැලකූ මහවංස කතුවරයා නම් කරන්න (ලකුණු 01යි)
ii දුටුගැමුණු රජුට පෙර මාගම පාලනය කළ රජවරු දෙදෙනෙකු නම් කරන්න (ලකුණු 02යි)
iii දුටුගරමුණු රජුගේ කාර්යසංසිද්ධිය සැකවින් දක්වන්න (ලකුණු 04යි)
iv මහාවංස කතුවරයා විසින් දුටුගැමුණු රජුගේ කාර්යසංසිද්ධිය උත්කෘෂ්ඨ තත්ත්වයට පත්කරඇති ආකාරය පරීක්ෂා කරන්න (ලකුණු 07යි)

(6) ක්‍රි.පූ. තුන්වෙනි සියවසේ සිට හයවෙනි සියවසේ අවසානය දක්වා වාරිමාර්ග ක්‍රමය වර්ධනය වූ ආකාරය පහත සඳහන් ශීර්ෂ යටතේ පරීක්ෂා කරන්න.
i වැව් හා ඇළමාර්ග තැනීමේලා රජවරුන් ඉටුකළ කාර්යභාරය
ii වාරි තාක්ෂණය (ලකුණු 14යි)

(7) රජරට ශිෂ්ටාචාරයේ පැවැති තාක්ෂණය පැහැදිලි කරන්න (ලකුණු 14)

**ඇගයීම - 03**

**පහත සඳහන් ස්ථාන ශ්‍රී ලංකාවේ සිතියමක ලකුණු කරන්න**

අනුරාධපුරය, සිතුල්පව්ව, කුරුණෑගල, තිස්සමහාරාමය, සීගිරිය, පොළොන්නරුව, වාකිරිගල, මහානාගහුල, මින්නේරි වැව, හුරුලු වැව, තිසාවැව, යෝධ වැව , කලාවැව, ගිරිතලේ වැව, කන්තලේ වැව, පරාක්‍රම සමුද්‍රය, ජයගග, මිණිපේ ඇල

**නිපුණතා මට්ටම** : 5.3. රජරට ශිෂ්ටාචාරයේ පදනම දුර්වල වීමෙන් එහි පරිහානිය හා බිඳවැටීම සිදුවූ ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද** : **08 යි.**

**ඉගෙනුම් පල** :
- රජරට ශිෂ්ටාචාරයේ පදනම දුර්වල වීමට හේතු විස්තර කරයි.
- රජ රට ශිෂ්ටාචාරයේ බිඳවැටීම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුමට උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

සියවස් ගණනාවක් තිස්සේ දියුණු ව පැවති රජරට ජලාශ්‍රිත ශිෂ්ටාචාරය ක්‍රි.ව. 13 වන සියවස පමණ වන විට ක්‍රමයෙන් බිඳවැටී ශ්‍රී ලංකාවේ නිරිත දිග ප්‍රදේශවලට රාජධානි සංක්‍රමණය වීමක් දක්නට ලැබේ. එසේ දියුණුව පැවති රජරට ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පිරිහීමට හා බිඳවැටීමට හේතු වූ කරුණු සාකච්ඡා කිරීම මෙම ඒකකයේ අරමුණයි.

**රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳවැටීම**

- **අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳවැටීම**

  - අනුරාධපුර රාජධානියේ අවසාන භාගයේ රජ්‍යත්වයට පත් වූ ඇතැම් පාලකයන් දුර්වල වීම
    උදාහරණ: පස්වෙනි සේන, පස්වෙනි මිහිඳු වැනි රජවරුන්
  - රජ පෙළපත් අතර බලය ලබා ගැනීම සඳහා නිරන්තරයෙන් ඇති වූ ගැටුම් (මෞර්ය - ලම්බකර්ණ ගැටීම්)
  - පාණ්ඩ්‍ය, චෝළ, වැනි දකුණු ඉන්දියානු ආක්‍රමණ එල්ල වීම
  - දකුණු ඉන්දියානු ආක්‍රමණ හා සිංහල රජවරුන් දකුණු ඉන්දියානු ආධාර පැතීම නිසා ලංකාවේ ද්‍රවිඩ බලය වර්ධනය වීම
  - ආක්‍රමණිකයන් විසින් රාජ්‍ය භාණ්ඩාගාරය කොල්ල කෑම, බෞද්ධ ආගමික ස්ථාන විනාශ කිරීම
  - යුද්ධ නිසා වාරිකර්මාන්තයේ පිරිහීම හේතුකොට ඇති වූ ආර්ථික පරිහානිය
  - කුලී හමුදා වල ක්‍රියාකලාපය
  - චෝළ අධිරාජ්‍යයේ බල ව්‍යාප්තිය
  - ක්‍රි.ව. 992 දී පමණ පළමුවෙනි රාජ රාජ ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීම හා අනුරාධපුරය විනාශකොට පොළොන්නරුව අගනුවර කොට ගැනීම

- **පොලොන්නරුව රාජධානියේ පරිහානිය හා බිඳවැටීම**

  - පොළොන්නරු රාජධානිය අවසාන කාලයේ බලවත් පාලකයන් නොසිටීම
  - මහා පරාක්‍රමබාහු රජු විසින් ගොඩනගන ලද දැඩි සංකේන්ද්‍රගත පාලනය පවත්වා ගෙන යාමට කාර්ය ශූර දක්ෂ පාලකයින් බිහි නොවීම
  - පරාක්‍රමබාහු රජු විසින් ගොඩනගන ලද යුදමය පාලනයන්ත්‍රය නිසා ඇති වූ අයහපත් ප්‍රතිඵල
  - මහා පරාක්‍රමබාහු රජු රට එක්සේසත් කිරීම සඳහා ගෙනගිය යුද්ධ මාලාවේ හා විදේශ ආක්‍රමණ වල බලපෑම්
  - යුධ සෙනෙවියන් බලවත් වීම
    උදාහරණ: තාවුරු, කිත්ති, අයුෂ්මන්ත, පරාක්‍රම වැනි සෙනෙවිවරුන් රජුන් ඉවත් කොට වෙනත් අයකු සිහසුන් ගත කිරීමට කටයුතු කිරීම

- විදේශීය සම්භවයක් ඇති පාලකයන්ට රුහුණු ජනතාව අකමැති වූ නිසා නිතර කැරලි ඇති වීම
- මධ්‍ය පාලනය අවුල් වීම නිසා කෘෂිකාර්මික කටයුතු පවත්වා ගෙන යාම අපහසු වීම
- සතුරු ආක්‍රමණ නිසා වාර්මාර්ගවලට සිදු වූ හානිය

- **කාලිංග මාඝ ආක්‍රමණය**

  - ක්‍රි.පූ. හයවෙනි සියවසේ සිට ක්‍රි.ව. දහතුන්වෙනි සියවස දක්වා පැවති ජලාශ්‍රිත ශිෂ්ටාචාරය ක්‍රි.ව. 1215 මාඝගේ ආක්‍රමණයත් සමඟ බිඳවැටීම
  - මාඝගේ කෲර ක්‍රියා කලාපය නිසා කුලීන ජනතාව හා භික්ෂූන් වහන්සේ රජරට අතහැර දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම
  - මාඝගේ ක්‍රියා කලාපය නිසා රජරට ප්‍රදේශ ජනශූන්‍ය වී වල් බිහි වන්නට වීම
  - වසංගත ආදිය පැතිර යාම
  - වාරිමාර්ග පද්ධතිය හා බුදු දහම පරිහානියට පත් වීම
  - රුහුණු ප්‍රදේශය දැඩි ලෙස මර්දනය කොට තිබූ බැවින් මාඝට එරෙහිව ප්‍රබල විරෝධතාවක් රුහුණෙන් පැන නොනැඟීම
  - පාලන මධ්‍යස්ථාන නිරිත දිගට සංක්‍රමණය වීම

**ඇගයීම - 01**

1. අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳ වැටීමට හේතු පැහැදිලි කරන්න.
2. පොළොන්නරුව රාජධානියේ පරිහානිය හා බිඳ වැටීමට හේතු පැහැදිලි කරන්න.
3. රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳ වැටීමට හේතු පැහැදිලි කරන්න.

## 6. රජරට ශිෂ්ටාචාරයෙන් පසු අවධිය

වර්ෂ 1215 කාලිංග මාඝගේ ආක්‍රමණයත් සමඟ පොළොන්නරුවේ අවසාන දේශීය පාලකයා වූ පරාක්‍රම පාණ්ඩ්‍යගේ රාජ්‍ය කාලය අවසන් විය. කාලිංඝ මාඝ විසින් පොළොන්නරුව අවටත්, රජරට සහ වයඹ දිග ප්‍රදේශයේත්, මන්නාරම වැනි ප්‍රදේශයන්හිත්, සිය සෘජු බලය පිහිටුවන ලදි. ඉන් පසු මාඝ කෘෘර පාලනයක් ගෙන ගිය අවධියේ දී රජරටින් නික්ම ගිය බොහෝ පිරිස් ආරක්ෂා ව පතා දුර්ග හා පර්වත ආශ්‍රිත ව ජනාවාස ගොඩනගා ගත්හ. එම පිරිස්වලට නායකත්වය දුන් සිව් දෙනෙකු පිළිබඳ ව මහාවංසයේ සඳහන් වේ.

- බුවනෙක ආදිපාද - ගෝවින්ද මලය
- සුභ සෙන්පති - සුභ පබ්බතය හෙවත් යාපහුව
- සංඛ සෙනෙවි - මිණිපේ
- තුන්වෙනි විජයබාහු - දඹදෙණිය

මේවායින් ඇතැම් පාලන මධ්‍යස්ථාන ලංකාවේ රාජධානි බවටත් පත් විණි. රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු ලංකාවේ බිහි වූ දඹදෙණිය, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ යන රාජධානිවල දේශපාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ව මෙම ඒකකයේ අවධානය යොමු කෙරේ. දහතුන්වන සියවසෙන් පසු උතුරේ බිහිවූ යාපන රාජ්‍යයේ දේශපාලන කටයුතු ද මෙහි දී අවධානයට යොමු කෙරේ.

**නිපුණතාව** : • ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 6.1. ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරය මුල් පදනමින් වෙනස් වූ යුගයක් වෙත පිවිසීම හා එහි ක්‍රියාකාරීත්වය විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : **35 යි**

**ඉගෙනුම් පල** :
- පොළොන්නරු යුගයෙන් පසු බිහි වූ රාජධානි හඳුන්වා දෙයි.
- රජරට රාජධානි හා පොළොන්නරු යුගයෙන් පසු බිහි වූ රාජධානි අතර වෙනස පහදයි.
- පොළොන්නරු යුගයෙන් පසු බිහි වූ රාජධානි සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**
**6.1. පාලන මධ්‍යස්ථාන**

**දඹදෙණි රාජධානිය**
තුන්වෙනි විජයබාහු රජු - (ක්‍රි.ව. 1232 - 1236)

- මෙතුමා පිළිබඳ ව හැදෑරීමට ඇති මූලාශ්‍රය
  මහාවංසය, පූජාවලිය, රාජරත්නාකාරය, ඇතැම් සෙල්ලිපි සාධක

- **තුන්වෙනි විජයබාහු රජුගේ පරම්පරාව පිළිබඳ ව තොරතුරු අපහැදිලි වීම**
  - දිවයිනේ ප්‍රධාන රාජවංස පරම්පරාව පුරුක ලෙස වංසකථාවන්හි දක්වා තිබේ.
  - රාජරත්නාකරයට අනුව ඔහුගේ පියා කාලිංග වාංශිකයෙකි.
  - ඇතැම් සෙල්ලිපි සාධක අනුව මොහු පාණ්ඩ්‍ය වංශයට අයත් වේ
  - ඔහු සිරිසඟබෝ පරපුරින් පැවත එන බව ඇතැම් මූලාශ්‍රයයක දැක්වේ.



දඹදෙණිය රාජධානියේ පියගැටපෙළ

- දේශපාල වැදගත්කම
  - තුන්වෙනි විජයබාහු සිය කාර්ය සංසිද්ධිය ආරම්භ කළේ වන්නි ප්‍රධානියකු ලෙස බව මහාවංසයේ හා පූජාවලියේ දැක්වේ.
  - දිවයිනේ විවිධ ප්‍රදේශවල සිටි නායකයන් අතරින් මාඝට එරෙහි ව මැනවින් සංවිධානය වීමට ශක්තිය තිබුණේ, තුන් වන විජයබාහු රජුට ය. සමකාලීන මූලාශ්‍රයවල මෙතුමා හඳුන්වා ඇත්තේ **වන්නි නිරිඳු** නමිනි
  - මායා රට හෙවත් දක්ඛිණ දේශය එක්සත් කොට එහි දේශපාලන ස්ථාවර බවක් ගොඩනඟාගැනීමට සමත් වීම හා දඹදෙණිය (ජම්බුද්‍රෝණි) සිය පාලන මධ්‍යස්ථානය බවට පත් කර ගැනීම
  - දඹදෙණියේ පවුරු සහ අගල් ආදියෙන් යුක්ත ව ආරක්ෂක මධ්‍යස්ථානයක් ලෙස ඉදි කොට සතුරු බලවේගයකට එරෙහි ව නැගී සිටිය හැකි මූලස්ථානය බවට පත් කර ගැනීම

- ආගමික වැදගත්කම
  - කොත්මලේ ප්‍රදේශයේ සඟවා තිබූ, දන්ත ධාතුන් වහන්සේ හා පාත්‍ර ධාතුව බෙලිගලට වැඩම වා දළදා මැඳුරක් තනවා තැන්පත් කිරීම
  - දඹදෙණියේ විජයසුන්දරාරාමය හා වත්තල විජයබාහු විහාරය කරවීම
  - කැලණි විහාරයේ චෛත්‍ය හා එහි ජරාවාස වූ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කරවීම

**දෙවෙනි පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1236 - 1270)**

- මෙතුමා පිළිබඳව හැදෑරීමට ඇති මූලාශ්‍රය
  මහාවංසය, පූජාවලිය, දඹදෙණි අස්න, කඳවුරු සිරිත
- මෙතුමාගේ වැදගත්කම දේශපාලන, ආගමික, අධ්‍යාපනයේ උන්නතිය හා ශාස්ත්‍රීය නවෝදය යන තේමා තුන යටතේ අධ්‍යයනය කළ හැකි ය.

**දේශපාලන වැදගත්කම**

- චන්ද්‍රභානුගේ පළමු ආක්‍රමණය
  - මාඝගෙන් රට මුදවා ගැනීමට රජු කටයුතු සංවිධානය කරමින් සිටිය දී, අග්නිදිග ආසියාවේ තාම්‍රලිංග දේශයෙන් (ලිගෝර් ප්‍රදේශය) පැමිණි චන්ද්‍රභානු ලංකාව ආක්‍රමණය කළේය.
  - රජුගේ එකොළොස් වන රාජ වර්ෂයේදී හෙවත් 1247 දී මෙම ආක්‍රමණය සිදු ව ඇත.
  - මෙම ආක්‍රමණයේ දී දෙවෙනි පරාක්‍රමබාහු රජු සිය බෑණනුවන් වූ වීරබාහු කුමරු යවා චන්ද්‍රභානු පරාජයට පත් කළේ ය.
  - චන්ද්‍රභානුගේ මෙම ආක්‍රමණය සිදු වන්නට ඇත්තේ නිරිතදිග වෙරළ ඔස්සේ බව සිතිය හැකි ය. ඇතැමුන්ගේ මතය වන්නේ දකුණු ලංකාවේ වරායයකින් ගොඩබට බව යි.
  - වීරබාහු විසින් චන්ද්‍රභානු පරාජය කරනු ලැබීමෙන් පසු චන්ද්‍රභානු ආපසු සිය රට බලා ගිය බවක් වාර්තා නොවේ. මූලාශ්‍රයගත තොරතුරු අනුව නිගමනය කළ හැක්කේ චන්ද්‍රභානු සිය පරාජිත හට පිරිස් ද සමග යාපන අර්ධද්වීපයේ දේශපාලන බලයක් ගොඩනඟාගත් බව යි. යාපන අර්ධද්වීපයේ දක්නට ලැබෙන චාවකච්චේරි, චාවන් කොට්ටෙයි සහ යාපන අර්ධ ද්වීපයේ දකුණේ ඇති ජාවක කොට්ටෙයි වැනි නම් එම කාලයේ සිට පැවත එන බව සිතිය හැකි යි.

- **කාලිංග මාඝ පරාජයට පත් කිරීම**
  - දෙවෙනි පැරකුම්බාවන් විසින් මාඝ පරාජයට පත් කළේ, ක්‍රි.ව. 1255 වසරේ දී ය.
  - මාඝ රජු පරාජයට පත් කිරීමේ දී පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය ගේ ආධාරය දෙවෙනි පරාක්‍රමබාහුට ලැබුණ බව දකුණු ඉන්දීය සෙල්ලිපිවලින් අනාවරණය වේ. එහෙත් මෙම ආධාර පිළිබඳ ව දේශීය මූලාශ්‍රයවල දක්නට නොලැබේ.

- **චන්ද්‍රභානුගේ දෙවන ආක්‍රමණය**
  - ක්‍රි.ව. 1261/62 වර්ෂවල දී චන්ද්‍රභානු දකුණු ඉන්දියාවෙන් ද බළ සෙනඟක් රැස් කරගෙන යාපහුවට ප්‍රහාරයක් එල්ල කළ බව සඳහන් වේ. මෙම අවධියේ යාපහුවේ සිට ඇත්තේ විජයබාහු හා ඔහුගේ ඥාති සොහොයුරු වීරබාහු යි. මෙම ආක්‍රමණයේ දී දඹදෙණි පාලකයාගෙන් දන්ත ධාතුව හා පාත්‍ර ධාතුව ඉල්ලා සිටි බව දක්වේ.
  - ජටාවර්මන් වීර නම් පාණ්ඩ්‍ය රජු විසින් පිහිටුවන ලද කුඩ්ඩියාමලෙයි සෙල්ලිපියේ දැක්වෙන කරුණු අනුව පැහැදිලි වන්නේ ලංකාවේ සිටි රජුන් දෙදෙනා අතරින් එක් අයකු සටන් බිමේදී මරුමුවට පත් වූ බව යි.
  - මෙම රජුන් දෙදෙනාගෙන් එක් අයෙකු වූ දෙවෙනි පරාක්‍රමබාහු විසින් චන්ද්‍රභානු පරාජයට පත් කිරීමට පාණ්ඩ්‍යයන්ගෙන් ආධාර ඉල්ලා ඇත. සටන් බිමේ දී චන්ද්‍රභානු මරණයට පත් විය. මින් පසු චන්ද්‍රභානුගේ පුතකුට උතුරු ලංකාවේ පාලනය භාර දී, පාණ්ඩ්‍යන්ට ගැති රජකු ලෙස තබාගෙන ඇත.
  - දෙවෙනි පරාක්‍රමබාහු විසින් චන්ද්‍රභානු පරාජයට පත් කිරීමෙන් පසු පොළොන්නරුවට ගොස් එහි නැවත රාජාභිෂේකයක් පැවැත්වී ය. කෙසේ වුවත් රජු පොලොන්නරුවේ වැඩි කාලයක් වාසය නොකළ අතර සිය බෑණනුවන් වූ වීරබාහුට පොළොන්නරුව බාර දී ආපසු දඹදෙණියට පැමිණීම

- **ආගමික සේවය**

  - බෙලිගල සිට දඹදෙණියට දළදා වහන්සේ වැඩම වීම හා පූජා පැවැත්වීම
  - ශාසන ශෝධනයක් ඇති කොට සංඝ සමාජය ක්‍රමවත් කිරීම, දිඹුලාගල මේධංකර වැනි මහ නා හිමිවරුන්ගේ මූලිකත්වයෙන් ශාසන ශෝධනයක් ඇති කොට, භික්ෂූන් වහන්සේලාගේ යහ පැවැත්මට අදාළ නීතිරීති ඇතුළත් කතිකාවතක් සකස් කිරීම. දඹදෙණි කතිකාවත යනු එය යි.
  - තම පුත් විජයබාහු කුමරුගේ අධීක්ෂණය යටතේ රුවන්වැලි සෑය ඇතුළු වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කරවී ය. මෙම ප්‍රතිසංස්කරණවලින් පසු අනුරාධපුර නගරයේ නඩත්තුව හා ආරක්ෂාව වන්නි ප්‍රධානින්ට පවරන ලදි. පොළොන්නරු නගරය ද ප්‍රතිසංස්කරණය කරන ලදි.
  - මහවැලි ගඟේ දාස්තොටේ දී උපසම්පදා උත්සවයක් පැවැත්වීම
  - තාම්‍රලිංග දේශයෙන් ධර්මකීර්ති මහාස්ථවිරයන් මෙරටට වැඩම කොට උන්වහන්සේගේ අනුශාසනා පරිදි වනවාසී භික්ෂු පරම්පරාව මෙරට පිහිටුවීම
  - කැලණි විහාරය, බෙන්තොට විහාරය, ගලපාත විහාරය, බෙලිගල විහාරය, වාකිරිගල විහාරය හා දෙවිනුවර උපුල්වන් දේවාලය ප්‍රතිසංස්කරණය කිරීම
  - විවිධ ස්ථානවල පිරිවෙන් පිහිටුවීම හා භික්ෂු අධ්‍යාපනයේ දියුණුවට කටයුතු කිරීම
  - රත්නපුර මහ සමන් දේවාලයය ඉදි කිරීම
  - වාර්ෂික ව කඨින පූජෝත්සව පැවැත්වීම හා පෙරහැර ආදිය පැවැත්වීමට අනුග්‍රහය ලබා දීම (බෙන්තර පෙරහැර, ඇසළ පෙරහැර)
  - මාඝ විසින් පැහැර ගන්නා ලද විහාර දේපළ නැවත එම විහාරවලට ලබා දීම

- **අධ්‍යාපනයේ උන්නතිය හා ශාස්ත්‍රීය නවෝදය**

  - පිරිවෙන් ඉදි කිරීම හා ඒවා ශාස්ත්‍රීය මධ්‍යස්ථාන බවට පත් කිරීම (නන්දන පිරිවෙන, කුරුණෑගල මහේන්ද්‍ර පිරිවෙන, පරාක්‍රම පිරිවෙන, පළාබද්දල, වාකිරිගල, දඹදෙණිය විජයසුන්දරාරාමය)
  - විදේශයෙන් ත්‍රිපිටකධාරී භික්ෂූන් ගෙන්වා පාලි සාහිත්‍යයේ උන්නතියට කටයුතු කිරීම
  - රජු උගත් පඬිවරයකු වීම හා ග්‍රන්ථ රචනයෙහි නියැළීම - (විසුද්ධි මග්ග සන්නය, වනවිනිස සන්නය, කව්සිළුමිණ) මෙතුමා කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධියෙන් පිදුම් ලැබීම
  - ග්‍රන්ථකරණයට අනුග්‍රහ දැක්වීම, මේ නිසා සිංහල, පාලි, සංස්කෘත ආදි භාෂාවන්ගෙන් විවිධ ක්ෂේත්‍ර අලළා ග්‍රන්ථ සම්පාදනය වීම

- **දඹදෙණි යුගයේ අධ්‍යාපනය හා සාහිත්‍යය**

  **අධ්‍යාපනය**

  - දඹදෙණි යුගයේ අධ්‍යාපනය පිළිබඳ ව සැලකීමේ දී දොළොස් වන සියවසේ පැවැති අෂ්ටමූලායතනවලට සමාන ව මෙම යුගයේ පැවැති පංචමූල පිරිවෙන් නැමැති අධ්‍යාපන ආයතන පිළිබඳ ව මූලාශ්‍රයවලින් තොරතුරු ලැබේ
  - මයුරපාද පිරිවෙන හා දේවපතිරාජ පිරිවෙන මෙම යුගයේ පැවැති දීප්තිමත් අධ්‍යාපන මධ්‍යස්ථාන දෙකකි.

**සාහිත්‍යය**

– සිංහල භාෂාවෙන් රචිත ග්‍රන්ථ

| ග්‍රන්ථය | කතුවරයා |
|---|---|
| 1. පූජාවලිය | මයුරපාද පරිවෙණාධිපති බුද්ධපුත්‍ර හිමියෝ |
| 2. කව්සිළුමිණ, වනවිනිස සන්නස | දෙවන පරාක්‍රමබාහු රජතුමා |
| 3. විසුද්ධිමග්ග සිංහල සන්නස | වේදේහ හිමියෝ |
| 4. සද්ධර්මරත්නාවලිය | ධර්මසේන හිමියෝ |

| ග්‍රන්ථය | කතුවරයා |
|---|---|
| 1. රසවාහිනී, සමන්තකූට වණ්ණනාව | වේදේහ හිමි |
| 2. භේසජ්ජමඤ්ජුසා | පඤ්චමූල පරිවෙණාධිපති |
| 3. දෛවඥකාමධේනු | අනෝමදස්සි හිමි |
| 4. හත්ථවනගල්ල විහාරවංසය | අනෝමදස්සි හිමිගේ ගෝලයෙක් |

**යාපහුව රාජධානිය**



- **පළමුවෙනි බුවනෙකබාහු රජු (ක්‍රි.ව. 1272 - 1284)**

  - ක්‍රි.ව. 1272 දී දඹදෙණියේ රාජත්වයට පත් වී කලක් එහි රාජ්‍ය විචාරා සිය පාලන මධ්‍යස්ථානය බවට යාපහුව තෝරා ගැනීම
  - කදලිවාට, ඇපාණ, තිප, හිමියානක යන නම්වලින් හැඳින්වුණු සිංහල වන්නි ප්‍රධානින්ගෙන් එල්ල වුණු තර්ජනයකට මුහුණ දීමට සිදු වීම
  - කාලිංගරායර හා චෝඩගංග යන අය මෙහෙයවූ දකුණු ඉන්දියානු ආක්‍රමණයකට ද මුහුණ දීමට සිදු වීම
  - විදේශ රටවල් සමඟ සබඳතා ගොඩනගා ගැනීම
    උදාහරණ: ඊජිප්තුවට යැවූ දූත ගමනක් පිළිබඳ ව අරාබි ලේඛනයක සඳහන් වීම

- **පළමුවෙනි බුවනෙකබාහු රජුගෙන් පසු අවධිය**

  - පළමුවෙනි බුවනෙකබාහු රජුගේ මරණය ආසන්නයේ හෝ ඉන් අනතුරු ව හෝ ලංකාවේ සාගතයක් ඇති වූ බව වංසකථාවෙහි සඳහන් වීම
  - බුවනෙකබාහු රජුගේ මරණයෙන් පසු ලංකාවේ අරාජක කාලයක් ඇති වූ බව සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වීම
  - පාණ්ඩ්‍යයන්ගේ ආධාර ලැබූ ආර්ය චක්‍රවර්තී නම් ද්‍රවිඩ අධිපතියා යාපහුව ආක්‍රමණය කොට දළදාව හා පාත්‍ර ධාතුව පැහැරගෙන ගොස් කුලසේකර නම් පාණ්ඩ්‍ය රජුට භාරදුන් බව සඳහන් වේ.

- මෙම අරාජික කාලයෙන් පසු තුන්වෙනි පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව.1287 - 1293) යාපහුවේ රාජ්‍ය බලය ස්ථාපිත කර ගැනීම
- වර්ෂ 1292 දී මාර්කෝ පෝලෝ නම් ඉතාලි ජාතික දේශගවේෂකයා ලංකාවට පැමිණීම
- තුන්වෙනි පරාක්‍රමබාහු රජු පාණ්ඩ්‍ය දේශයට ගොස් එහි බොහෝ කලක් වාසය කොට යළි දළදාව හා පාත්‍ර ධාතුව රැගෙන ලංකාවට පැමිණ පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය කරගෙන රජ විය.
- දෙවෙනි බුවනෙකබා රජු (ශ්‍රී නිවාස බුවනෙකබාහු) තෙවෙනි පරාක්‍රමබාහු රජු සිටි පොළොන්නරුව ආක්‍රමණයක් කොට ඔහු නෙරපා දමා යාපහුවේ රාජත්වයට පත් වීම

**කුරුණෑගල රාජධානිය**

- දෙවෙනි බුවනෙකබාහු රජු පසු ව සිය පාලන මධ්‍යස්ථානය කුරුණෑගලට ගෙන ඒම

- **හතරවෙනි පරාක්‍රමබාහු රජු (පණ්ඩිත පරාක්‍රමබාහු) ක්‍රි.ව. 1302 - 1326**

  - සාමකාමී රාජ්‍ය කාලයක් වීම නිසා රටේ ශාසනික හා ශාස්ත්‍රීය උන්නතියක් ඇති වීම
  - කුරුණෑගල නගරයේ විචිත්‍ර දළදා මැඳුරක් කරවා දන්ත ධාතූන් වහන්සේ එහි තැන්පත් කරවීම
  - දෙවුන්දර දෙමහල් විහාරයක් කරවීම
  - වැලිගම අග්‍රබෝධි විහාරය හා වීදාගම සනානන්ද පිරිවෙන ඉදි කිරීම
  - මහනුවර නගරයේ අස්ගිරි විහාරය කරවීම
  - විවිධ මූලාශ්‍රයවල පාලි බසින් ලියවී තිබූ ජාතක කථා එකතු කොට එම ජාතක කතා සිංහලයට පරිවර්තනය කරමින් පන්සිය පනස් ජාතක කතා පොත සකස් කළේ මෙතුමාගේ කාලයේ ය. වීරසිංහ පතිරාජ ඇමතිවරයා මෙම කාර්යයේ මූලිකත්වය ගෙන ඇත.
  - බෝධා මාපාණ නම් ප්‍රභුවරයා ඇති කළ කැරැල්ලකින් රජු මරණයට පත් වීම තුන්වෙනි විජයබාහුගෙන් ආරම්භ වූ දඹදෙණි රජ පෙළපත මින් නිමාවට පත් වීම
  - හතරවෙනි පරාක්‍රමබාහුගෙන් පසු තුන්වෙනි බුවනෙකබාහු (වන්නි බුවනෙකබාහු) හා පස්වෙනි විජයබාහු (සවුළු විජයබාහු) කුරුණෑගල රාජත්වයට පත් වීම

- **කුරුණෑගල යුගයේ සාහිත්‍යය**

  - සිංහල ජාතක කතා පොත සම්පාදනය කිරීම
  - එළු බෝධි වංසය හා අනාගත වංසය - විල්ගම්මුළ ශ්‍රී පරාක්‍රමබාහු හිමි
  - දළදා සිරිත - දෙව්රදදම්පසඟිනාවන්
  - ධාතුමංජුසාව

- **ගම්පොළ රාජධානිය**

  - හතර වන බුවනෙකබාහු රජු (ක්‍රි.ව. 1341 - 1351) ගම්පොළ කරා සිය රාජධානිය මාරු කිරීම
  - 1344 දී අරාබි ජාතික දේශාටකයකු වූ, ඉබන් බතූතා ලංකාවට පැමිණීම
  - මෙම අවධියේ දී උතුරේ ආර්ය චක්‍රවර්තීවරුන් බලවත් වී සිටි බව, ඉබන් බතූතාගේ වාර්තා අනුව පැහැදිලි වීම
  - හතරවන බුවනෙකබාහු රජු ගම්පොළ රජ කරන අවධියේ දී පස්වෙනි පරාක්‍රමබාහු රජු කෑගලු දිස්ත්‍රික්කයේ දැදිගම කේන්ද්‍රකොටගෙන රාජධානියක් පවත්වාගෙන ගියේ ය. පස්වෙනි බුවනෙකබාහු හා පස්වෙනි පරාක්‍රමබාහු යන දෙදෙනා ම කුරුණෑගල පස්වෙනි විජයබාහුගේ සවුළු විජයබාහුගේ පුත්‍රයෝ වූහ

- **දැදිගම**

  - දැදිගම ප්‍රදේශීය පාලන මධ්‍යස්ථානයක් ලෙස මුලින් ම වැදගත් වන්නේ දොළොස් වන සියවසේ ය. පළමුවෙනි පරාක්‍රමබාහුගේ පියා වූ මාණාභරණ දක්ඛිණ දේසය පාලනය කරද්දී පාලන මධ්‍යස්ථානය ලෙස පැවැති පුංඛගාමය දැදිගම ලෙස හඳුනාගෙන ඇත.
  - පස්වෙනි පරාක්‍රමබාහු දැදිගම බලයට පත්වී, ක්‍රි.ව. 1351 දී ගම්පොළ රජ වන තෙක්, වසර දහයක් පමණ දැදිගම ස්වාධීන ප්‍රදේශීය පාලන මධ්‍යස්ථානයක් ලෙස පැවැති බව විශ්වාස කෙරේ.
  - හතරවෙනි බුවනෙකබාහුගේ මරණින් පසු පස්වෙනි පරාක්‍රමබාහු රජු ගම්පොළට පැමිණ රාජ්‍ය විචාරීම
  - පෙර කාලවල දී රජ පවුල් සමඟ කිසිදු සම්බන්ධයක් නොතිබූ අලුත දෙපිරිසක් මෙම අවධියේ දී දේශපාලන ක්ෂේත්‍රයේ, ඉස්මතු වීම. සේනාධිලංකාර සෙනෙවිරත් පවුල හා අලගක්කෝණාර පෙළපත යනු එම පෙළපත් දෙක යි.

**01. සේනාධිලංකාර සෙනෙවිරත් පවුල**

- මෙම පරපුරේ නායකයා සේනාධිලංකාර යි. වෙළෙඳ කටයුතු මඟින් මහත් ධනයක් උපයාගෙන සිටි අයෙකි. හතරවෙනි බුවනෙකබාහු හා පස්වෙනි පරාක්‍රමබාහු යන රජ කාලවලදී මන්ත්‍රීශ්වරයාණ කෙනෙකු ලෙස හා සේනාධිපති ලෙස කටයුතු කර ඇත.
- සේනාධිලංකාර සිදු කළ වැදගත් කාර්ය ලෙස ලංකාතිලක විහාරය ඉදි කරවීම දැක්විය හැකි ය.
- ලංකාතිලකයෙහි අලවල පර්වත ලිපියේ සේනාධිලංකාර විසින් ලංකාතිලක විහාරය කරවීම හා එම විහාරයට ඔහු හා තවත් අය විසින් කරන ලද ප්‍රදානයන් පිළිබඳ ව දැක්වේ.

**02. අලගක්කෝණාර හෙවත් අලකේශ්වර පරපුර**

- වෙළෙඳ කටයුතු මඟින් විශාල ධනයක් උපයාගත් පිරිසක් වීම. කිත්සිරිමෙවන් කැලණි සෙල්ලිපියට අනුව මෙම පෙළපතේ ආරම්භකයන් පැමිණ ඇත්තේ ඉන්දියාවේ කේරලයේ පිහිටි වැදගත් නගරයක් වූ වංචි පුරයේ සිට ය.
- රයිගම මධ්‍යස්ථානය කොටගෙන විශාල බලයක් භුක්ති විඳි නිශ්ශංක අලගක්කෝණාර (අල්කොණාර්) ඉබන් බතූතා විසින් හඳුන්වනු ලැබ ඇත්තේ සුල්තාන් හෙවත් රජු ලෙස යි. එමෙන් ම ඔහුට රාජ්‍ය බලයේ සංකේතයක් වූ සුදු අලියකු අයත් ව සිටි බව දක්වා ඇත.
- ඉබන් බතූතාගේ ග්‍රන්ථයත්, වෙනත් මූලාශ්‍රයත් පරිශීලනය කිරීමෙන් නිගමනය කළ හැක්කේ වර්ෂ 1344 වන විට අලගක්කෝණාර පරපුරේ ප්‍රභූවරයකු රයිගම කේන්ද්‍ර කොටගෙන විශාල බලයක් ගොඩනගාගෙන සිටි බව යි. එහෙත් ඔහු ගම්පොළ හෝ දැදිගම හෝ පාලකයන්ට විරුද්ධ ව කටයුතු කළ පාලකයෙක් නොවී ය.
- පස්වෙනි පරාක්‍රමබාහු රජුගෙන් පසු ගම්පොළ රජු වූ තුන්වෙනි වික්‍රමබාහු ඉතාම දුර්වල පාලකයකු වීම
- මෙම අවධිය වන විට සේනාධිලංකාරගේ බලය දුර්වල වී පැවැති අතර, වික්‍රමබාහුගේ අවසන් රාජ්‍ය කාලයේ දී, අලගක්කෝණාර පරපුරේ, නිශ්ශංක අලගක්කෝණාර රාජ සභාවේ අග්‍ර මන්ත්‍රීවරයාණන් බවට පත් වීම
- කෙසේ වෙතත් මොහු ප්‍රභූරාජ යන විරුදයෙන් තමා හඳුන්වා ගනිමින් විශාල බලයක් භුක්ති විඳ ඇත. නිශ්ශංක අලගක්කෝණාර විසින් වික්‍රමබාහු රජුගේ සොහොයුරියක වූ ජයසිරි කුමරිය විවාහ කරගනිමින් රජ පවුල සමඟ ද සම්බන්ධතා ගොඩනගාගෙන තම බලය තවත් ශක්තිමත් කරගෙන තිබේ.

- මෙම අවධිය වන විට උතුරේ සිටි ආර්ය චක්‍රවර්තී රජු බලවත් වී සිටි අතර, ඔහුගේ බදු නිලධාරීන් මීගමුව, හලාවත, වත්තල, කොළඹ ආදි බටහිර වෙරළේ තොටුපළවලින් බදු අයකිරීමේ නිරතව සිටීම, මේ නිසා ආනයන අපනයන වෙළෙඳාමේදී ගම්පොළ රජුට විශාල අලාභයක් සිදු වීම
- ආර්ය චක්‍රවර්ති රජුගේ මෙම ක්‍රියාකලාපය මැඩලීම සඳහා නිශ්ශංක අලගක්කෝණාර විසින් කෝට්ටේ බලකොටුව ගොඩනැගීම
- ප්‍රමාණවත් පරිදි අහාර තොග කොටුව තුළ ගබඩා කළ නිශ්ශංක අලගක්කෝණාර ඇමතිවරයා අනතුරු ව ආර්යචක්‍රවර්තිගේ එම බදු නිලධාරීන් එළවා දැමූ බව රාජාවලියේ හා අලකේශවර යුද්ධයේ සඳහන් වේ. මින් කෝපයට පත් ආර්ය චක්‍රවර්තී පාලකයා සේනාව එවූ අතර අලගක්කෝණාරගේ සේනාව විසින් ඔවුහු පලවා හරින ලදහ. අලගක්කෝණාරගේ මෙම ජයග්‍රහණවලින් පසු ව ගම්පොළ රජු ලෙස නාමමාත්‍රික ව පස්වෙනි බුවනෙකබාහු රාජත්වයට පත් වුවත්, නිශ්ශංක අලගක්කෝණාර රාජ්‍ය පාලන කටයුතුවල මූලිකත්වය ගැනීම
- එළු අත්තනගලු වංසයේඅලගක්කෝණාර ශ්‍රී ලංකාධීශ්වර ලෙස හැඳින්වීම. ක්‍රි.ව. 1382 දී පමණ අලගක්කෝණාර මිය යාම. එයින් පසු ව සිටි අලගක්කෝණාර පෙළපතේ ප්‍රභූන් එතරම් බලවත් පුද්ගලයන් නොවීම
- නිශ්ශංක අලගක්කෝණාරගෙන් පසු ව, කුමාර අලකේශ්වර නැමැත්තෙක් රයිගම පරිපාලන කටයුතු මෙහෙය වීය. අනතුරු ව වීර අලකේශ්වර එතැනට පත් වීම
- චීනයේ යුං ලෝ නම් අධිරාජයා විසින් එවන ලද චෙන් හෝ සෙනෙවියා වර්ෂ 1405, 1409 හා 1411 යන වසරවල ලංකාවට ගොඩබැස ඇත. ඔහු 1409 ලංකාවට පැමිණි විට රයිගම අලකේශ්වර චෙන් හෝ සෙන්පතියා නිසි පරිදි පිළිගෙන නැත. මේ නිසා තමා ගෙන ආ පුද පඬුරු දෙවුන්දර දේවාලයයට පුදා ගාල්ලේ ත්‍රෛභාෂා ශිලා ලේඛනය පිහිටුවා (චීන, පර්සියන්, දෙමළ භාෂාවලින් ලියා ඇත.) ආපසු ගොස් ඇත. අනතුරු ව ක්‍රි.ව. 1411 දී විශාල හමුදාවක් සමඟ නැවත මෙරටට පැමිණ වීර අලකේශ්වර හා ඔහුගේ ඥාතීන් ඇතුළු පිරිසක් සිරකරුවන් ලෙස අල්ලා ගෙන ගොස් ඇත. මෙම සිදුවීමත් සමග අලකේශ්වර පෙළපත ලංකා දේශපාලන ක්ෂේත්‍රයෙන් ඉවත් වීම

**ගම්පොළ යුගයේ සංස්කෘතික කටයුතු**

මෙම යුගයේ සංස්කෘතික කටයුතු කෙරෙහි තේමා කිහිපයක් ඔස්සේ අවධානය යොමු කළ හැකි වීම

- **භාෂාව හා සාහිත්‍ය**

  **සිංහල භාෂාවෙන් රචිත ග්‍රන්ථ**

  - සද්ධර්මාලංකාරය
  - නිකාය සංග්‍රහය
  - බාලාවතාර සන්නය
  - මයුර සන්දේශය
  - තිසර සන්දේශය
  - එළු අත්තනගලු වංසය

- **පාලි භාෂාවෙන් රචිත ග්‍රන්ථ**

  - පාරමී මහා ශතකය
  - ජනානුරාග චරිත
  - වුත්තමාලා සන්දේශ ශතක
  - විමුක්ති සංග්‍රහය

- **ගෘහ නිර්මාණ හා කලා ශිල්ප**

  - දකුණු ඉන්දියානු කලාකරුවන් මෙරටට පැමිණීම හා ඔවුන් මෙරට කලා කටයුතුවල නිරත වීම
    උදාහරණ: ධර්මකීර්ති නම් හිමි සමග පැමිණි ගණේශ්වරාචාර්ය ඇතුළු කලාකරුවන් පිරිස ගඩලාදෙණිය, ලංකාතිලකය, විජයෝත්පාය, නියම්ගම්පාය ආදි වෙහෙර විහාර ඉදිවීම
  - විහාරවල හා දේවාලයවල දැව හා ශෛලමය කැටයම් මෙකල ජනප්‍රිය වීම
  - ඇම්බැක්කේ කැටයම් මෙම යුගයට අයත් සේ සැලකේ



ඇම්බැක්කේ දේවාලය



ඇම්බැක්කේ කැටයම්

**නිපුණතා මට්ටම** : 6.2. යාපන රාජධානි පිළිබඳ විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05 යි

**ඉගෙනුම් පල** :
- යාපන රාජධානියේ ආරම්භය හා වර්ධනය විස්තර කරයි.
- යාපන රාජධානියේ පරිහානිය විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

6.2 යාපන රාජධානිය

- යාපන රාජධානිය පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රය
  - යාල්පාන වෛපවමාලෙ, ෂෙකරාජ ජේකරමලෛ, කෛලාසමාලෛයි
- 13 වෙනි සියවස මැද දී පමණ ජාවක චන්ද්‍රභානු විසින් උතුරේ යාපන අර්ධද්වීපයේත් ඇතැම් වන්නි ප්‍රදේශවලත් බලය පතුරවමින් පාලනයක් ගෙන ගිය බව මූලාශ්‍රය ගත තොරතුරු අනුව නිගමනය කළ හැකි වීම
- පාණ්ඩ්‍යයන්ගේ පූර්ණ උදවු ඇති ව දෙවෙනි පැරකුම්බා විසින් චන්ද්‍රභානු පරාජය කළ අතර, ඉන් පසු ව පාණ්ඩ්‍යයන් විසින් උතුරු ප්‍රදේශයේ තම නියෝජිතයා ලෙස චන්ද්‍රභානුගේ පුතකු පත් කිරීම
- පාණ්ඩ්‍යයන්ගේ බලය දුර්වල වීමත් සමඟ වර්ෂ 1310-1311 දී පමණ ආර්ය චක්‍රවර්තීහු උතුරු ප්‍රදේශයේ පාලනය සියතට ගැනීම, සමකාලීන දෙමළ ලේඛනවල ආර්ය චක්‍රවර්තීන් කන්කේයන්, කණකෙයි ආරියන්, කන්කෙයි තානන්, චින්කෙයි ආරියන් ලෙස හඳුන්වා ඇත
- මොවුන් පාණ්ඩ්‍ය රාජධානියෙහි දකුණු ප්‍රදේශයක් වූ චෙච්චරුක්කයිනාටු නම් ප්‍රදේශයේ ප්‍රදේශීය අධිපතීන්ගේ පවුලකින් පැවත ඒම
- මෙම පෙළපතට අයත් පාලකයන් දොළොස් දෙනෙකු පිළිබඳ තොරතුරු හමු වේ. ඔවුන් සියල්ලන්ගේ ම නමට අගින් චින්කෙයි ආරියන් යන නාමය දක්වා තිබේ
- විජයකුලන්කෙයි, කුලසේකර ආරියන්, වික්කිරම, වරෝදය, මර්තාණ්ඩ, කුණපූෂණ, වීරෝදය, ජයවීර, කුණවීර, කණකසූරිය, පරරාජසේකරන්, සංකිලි
- වර්ෂ 1344 දී, දිවයිනට පැමිණි ඉබන් බතුතා ආර්ය චක්‍රවර්තීන් ලංකාවේ සුල්තාන් ලෙස හඳුන්වා තිබීම
- තුන්වෙනි වික්‍රමබාහු රජ දවස ගම්පොළ රාජධානියට පහර දී, එහි ඇතැම් ප්‍රදේශවලින් බදු අය කරගැනීමට සමත් වීම
- පස්වෙනි පරාක්‍රමබාහු රජතුමා, සපුමල් කුමාරයා යවා ආර්යචක්‍රවර්තීන් පරාජය කොට යාපනය අල්ලා ගැනීම
- පෘතුගීසින් විසින් වර්ෂ 1619 දී පමණ යාපනය අත්පත් කොට ගැනීම

**නිපුණතා මට්ටම** : 6.3. කෝට්ටේ රාජධානිය පිළිබඳ විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10 යි.

**ඉගෙනුම් පල** :
- කෝට්ටේ රාජධානියේ ආරම්භය හා වර්ධනය පැහැදිලි කරයි.
- කෝට්ටේ රාජධානියේ විශිෂ්ට රජවරුන් අගය කරයි.
- කෝට්ටේ රාජධානියේ පරිහානිය විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

6.3 කෝට්ටේ රාජධානිය

**හයවෙනි පරාක්‍රමබාහු රජතුමා**

- කෝට්ටේ රාජධානිය හයවෙනි පරාක්‍රමබාහුගේ රාජපදවි ප්‍රාප්තියත් සමඟ ආරම්භ වේ. ක්‍රි.ව. 1412 දී රයිගම දී බලයට පත් වන මෙතුමා, ක්‍රි.ව. 1415 දී, ජයවර්ධනපුර කෝට්ටේ සිය පාලන මධ්‍යස්ථානය බවට පත් කර ගැනීම
- මෙතුමා පිළිබඳ ව හැදෑරීමට ඇති මූලාශ්‍රය

  - සාහිත්‍ය

    - රාජාවලිය, අලකේශ්වර යුද්ධය, පැරකුම්බා සිරිත, සන්දේශ කාව්‍ය, කාව්‍යශේඛරය, කුටෝගේ වාර්තාව

  - පුරාවිද්‍යාත්මක

    - පැපිළියාන ලිපිය, සමන් දේවාල ලිපිය, දෙණවක සන්නස, ගඩලාදෙණිය සෙල්ලිපිය, මඩවල සෙල්ලිපි
    - රජුගේ ළමා කාලය, රාජ්‍ය පදවිප්‍රාප්තිය හා රජකමට වූ උරුමය පිළිබඳ ව විවිධ ජනප්‍රවාද, පසුකාලීන ලේඛකයන්ගේ කෘතිවලට ඇතුළත් වී ඇත.
    - පැරකුම්බා සිරිතට අනුව එතුමාගේ පියා ගම්පොළ රජ කළ, පස්වෙනි පරාක්‍රමබාහුගේ මුණුබුරකු වූ ළමැණි ජයමහලෑන (ජයපාල මහීපති) නැමැත්තෙකි. මව සුනේත්‍රා දේවිය යි. හයවෙනි පැරකුම්බා සමයේ දී ලංකාවට පැමිණි බෙංගාල සංස්කෘත ලේඛකයකු වූ ශ්‍රී රාමචන්ද්‍ර භාරතී ද මේ බව සනාථ කොට ඇත.
    - රාජාවලියේ සඳහන් අන්දමට ගම්පොළ යුගයේ ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ චෙන්-හෝ සෙන්පතියා විසින් වීර අලකේශ්වර හා ඔහුගේ නෑයන් චීනයට රැගෙන යන අවස්ථාවේ, සිටි සුළු පිරිසට ජයමහලෑන ද අයත් වී ඇත. පසු ව පරාක්‍රමබාහු කුමරු සිය මව සමඟින් ප්‍රදේශාධිපතියෙකුගේ රැකවරණය යටතේ වාසය කොට ඇත.
    - චීන සෙන්පතියා විසින් පරාක්‍රමබාහු කුමරු ද චීනයට රැගෙන යන ලද බවත් පසු ව අධිරාජයා විසින් කුමරුට අභය දානය දී ලංකාවට එවා රජ කරවන ලද බවත් පෘතුගීසි ඉතිහාසඥයෙක් වූ දියොගු ද කුතෝ සඳහන් කර ඇත.

- **දේශපාලන වැදගත්කම**
  - පළමුවෙනි පරාක්‍රමබාහු රජුගෙන් පසු ශ්‍රී ලංකාව එක්සේසත් කිරීමට සමත් වීම හා එම එක්සත්භාවය පවත්වාගෙන යාම, ඒ සඳහා එතුමා අනුගමනය කළ ක්‍රියාමාර්ග පහත පරිදි ය.

01. මෙම කාලය වන විට සමාන්තර බල වර්ධනයක් ඇති කරගෙන සිටි දෑදිගම පරාක්‍රමබාහු රජු අවනත කර ගැනීමට කටයුතු කිරීම
   - බුදු දහමට විශාල අනුග්‍රහයක් දක්වමින් භික්ෂූන් වහන්සේලාගේ සිත් දිනාගෙන ජනප්‍රිය පාලකයෙකු බවට පත් වීමට උත්සුක වීම, මේ අනුව දෑදිගම නැවතී සිටි මහාතෙරුන් වහන්සේලා කෝට්ටේ හා ඒ අවට ප්‍රදේශවලට පැමිණ පදිංචි වීම
   - ලංකාවට පැමිණි සියම් හා කාම්බෝජ භික්ෂු කණ්ඩායමකට සිංහල උපසම්පදාව ලබාදීමේ උත්සවයක් රජුගේ අනුග්‍රහයෙන් පැවැත්වීම
   - දෑදිගම පරාක්‍රමබාහු රජු හයවෙනි පරාක්‍රමබාහු රජුගේ යුව රජු ලෙස කටයුතු කොට ඇති බව පරෙවි සන්දේසයේ තොරතුරුවලින් පැහැදිලි වීම, මේ මගින් දෑදිගම ඇතුළු සතර කෝරලය හා උඩරට ප්‍රදේශවල බලය පැතිරවීමට රජුට හැකි වීම

02. වියළි කලාපයේ හා රුහුණු රටේ පැවති ස්වාධීන පාලන ඒකක හා වන්නි ජනපදවල විසූ වන්නියාර්වරු අවනත කිරීම. වන්නි නායකයන් 18ක් අවනත කළ බව ගිරා සන්දේශයේ සඳහන් වීම

03. සපුමල් කුමරු ප්‍රමුඛ සේනාවක් යවා, උතුරේ ආර්ය චක්‍රවර්තීන් යටතේ පැවති යාපන රාජධානිය අත්පත් කර ගැනීම

04. උඩරට ජෝතිය සිටු ඇති කළ කැරැල්ල අම්බුළුගල කුමරු යවා මර්දනය කිරීම

05. උඩරට බලය ලබාගෙන සිටි වික්‍රමබාහු සාමන්තයාගේ අවනත භාවය ලබාගැනීම

- **විදේශීය යුද්ධ ජයග්‍රහණ**
  - දකුණු ඉන්දියාවේ අද්විරරාම පටුනට ආක්‍රමණයක් දියත් කිරීම
  - විජයනගර් අධිරාජ්‍යයේ තොටුපළ ආක්‍රමණය කිරීම

- **සංස්කෘතික දියුණුව**
  - පැරණි පූජ්‍යස්ථාන දියුණු කිරීමට කටයුතු කිරීම
  - ශ්‍රී පාදස්ථානය, අත්තනගලු විහාරය, ගඩලාදෙණිය, ලංකාතිලකය, මහියංගණය, කැලණි විහාරය ආදි බෞද්ධ සිද්ධස්ථාන නගා සිටුවීම
  - සිය මැණියන්ගේ නමින් පැපිළියානේ සුනේත්‍රා දේවී පිරිවෙන කරවා එහි නඩත්තුවට ගම්වර පූජා කළ බව පැපිලියාන සන්නයේ සඳහන් වීම
  - පිරිවෙන් රාශියක් දියුණුවට පත් ව තිබීම හා උගත් පඬිවරුන් විශාල පිරිසක් සිටීම
  - රජු මෙන් ම ඇමතිවරු ද ග්‍රන්ථකරණයේ නියැළීම
  - ශ්‍රී රාමචන්ද්‍ර භාරතී වැනි උගත් පඬිවරුන් ලංකාවට පැමිණීම

- **හයවෙනි පරාක්‍රමබාහු රජුගෙන් පසු කෝට්ටේ දේශපාලන තත්ත්වය**

  - හයවෙනි පරාක්‍රමබාහුගේ දියණි වූ උලකුඩය දේවියට හා නන්නුර්තුනයාට දාව උපන් ජයබාහු කුමරු,වීර පරාක්‍රමබාහු නමින් සිහසුනට පත් වීම
  - යාපනයේ පාලකයා ව සිටි සපුමල් කුමරු හයවන බුවනෙකබාහු නමින් රාජත්වයට පත්වීම රජුගේ හතරවෙනි රාජවර්ෂයේ දී සිංහල පෙරළිය (රාජාවලිය), සිංහල සංගය (දෑදිගම සෙල්ලිපිය) නමින් හඳුන්වන කැරැල්ලකට මුහුණ දීමට සිදු වීම
  - අම්බුළුගල කුමරු අට වන වීර පරාක්‍රමබාහු නමින් රාජත්වයට පත් වීම
  - නමවෙනි ධර්මපරාක්‍රමබාහු රාජත්වයට පත් වීම
  - හයවෙනි විජයබාහු රජුගේ රාජ්‍ය කාලය හා විජයබා කොල්ලය
  - ධර්මපාල කුමරුගේ රාජ්‍ය කාලය හා කෝට්ටේ රාජධානියේ පරිහානිය

- **කෝට්ටේ යුගයේ අධ්‍යාපනය හා සාහිත්‍යය**

  අධ්‍යාපනය

  - හයවෙනි පරාක්‍රමබාහු රජුගේ සාමකාමී පාලන කාලය තුළ අධ්‍යාපනයේ විශාල දියණුවක් ඇති වීම
  - වීදාගම ශ්‍රී ඝනානන්ද, තොටගමුවේ විජයබා, දෙවුන්දර ඉරුගල්කුලතිලක, කෑරගල පද්මාවතී, පැපිළියානේ සුනේත්‍රා දේවී, එරබත්තොට ධර්මරාජ ආදි පිරිවෙන් රැසක් දියුණුවට පත් ව තිබීම
  - මෙම අධ්‍යාපන මධ්‍යස්ථානවල සිටි භික්ෂූන් විශාල ශාස්ත්‍රීය සේවයක නිරත වීම
  - මෙම අධ්‍යාපන මධ්‍යස්ථානවල සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත හා දෙමළ ආදි භාෂා ද, කාව්‍ය, නාටක, ජ්‍යෝතිශ්ශාස්ත්‍රය විද්‍යා වැනි විෂය ඉගැන්වීම
  - වනවාසී හා ග්‍රාමවාසී භික්ෂූන් තරගයට ග්‍රන්ථකරණයේ නියැළීම නිසා සාහිත්‍ය ප්‍රබෝධයක් හට ගැනීම
  - මෙකල පැවැති අධ්‍යාපන මධ්‍යස්ථාන ජාත්‍යන්තර කීර්තියට පත් ව තිබූ බැවින්, සංස්කෘත විශාරදයකු වූ ශ්‍රී රාමචන්ද්‍ර භාරතී පඬිවරයා දිවයිනට පැමිණීම

- සාහිත්‍යය

  - විවිධ වර්ගයේ ග්‍රන්ථ රාශියක් රචනා වීම
    * සන්දේශ කාව්‍ය, භක්ති කාව්‍ය, හටන් කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය, සිලෝ කාව්‍ය, අස්න කාව්‍ය, උපදේශ කාව්‍ය, කෝෂ ග්‍රන්ථ, ධර්ම ග්‍රන්ථ
  - ගිහි පැවිදි උගත් පඬිවරුන් රාශියක් ග්‍රන්ථකරණයේ නියැළීම

| ග්‍රන්ථය | කතුවරයා |
|---|---|
| 1. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි | කාව්‍යශේඛරය, පඤ්චිකා ප්‍රදීපය සැළලිහිණි සන්දේශය, පරෙවි සන්දේශය |
| 2. වීදාගම මහා මෛත්‍රිය හිමි | බුදුගුණ අලංකාරය, ලෝවැඩ සඟරාව, හංස සන්දේසය |
| 3. වැත්තෑවේ හිමි | ගුත්තිල කාව්‍යය |
| 4. ඉරුගල්කුලතිලක පිරිවෙන්පති හිමි | කෝකිල සන්දේශය |
| 5. ධම්මදින්න විමලකිත්ති හිමි | සද්ධර්මරත්නකාරය |
| 6. රණස්ගල්ලේ හිමි | ලෝකෝපකාරය |
| 7. හයවෙනි පරාක්‍රමබාහු රජු | රුවන්මල් නිඝණ්ඩුව |
| 8. ශ්‍රී රාමචන්ද්‍ර භාරතී | භක්ති ශතකය |
| 9. නන්නූරුතුනෙය්යාර් | පුරාණ නාමාවලිය |
| 10. කර්තෘ අඥාත | සරන ජෝතිමාලෙ නම් දෙමළ ජ්‍යෝතිෂ ග්‍රන්ථය<br>පැරකුම්බා සිරිත, ගිරා සන්දේශය, කුවේණි අස්න, එළු සිලෝ ශතකය |

**ඇගයීම - 01**

**පහත සඳහන් ආකාරයේ බහුවරණ ප්‍රශ්න ලබාදෙමින් සිසුන් ඇගයීමට ලක් කරන්න.**

**අංක 01 හා 02 සඳහා වූ ප්‍රශ්නවල ඇති නොගැළපෙන නාමය තෝරන්න.**

01) 1. පුංඛගාම 2. අනුරාධපුරය 3. පොළොන්නරුව 4. කුරුණෑගල 5. දඹදෙණිය (............)

02) 1. සරජෝතිමාලෙ 2. සද්ධර්මරත්නාවලිය 3. පූජාවලිය 4. කව්සිළුමිණ
5. සමන්තකූටවණ්ණනාව (............)

**අංක 03 - 04 තෙක් ප්‍රශ්නවල නාම යුගල පහක් දැක්වේ. ඒ අතර එකිනෙකට නොගැළපෙන නාම යුගලක් ඇත. නොගැළපෙන නාම යුගලය හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

03) 1. මුල් සික හා සිකවලඳ විනිස - භික්ෂූන් සඳහා වූ විනය නීති මාලා එකතුවකි
2. දම්පියා අටුවා ගැටපදය - ධම්මපදට්ඨ කතාවට ලියන ලද අටුවාවකි
3. පැරකුම්බා සිරිත - හයවෙනි පරාක්‍රමබාහු රජුගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ වර්ණනාවකි
4. සමන්තපාසාදිකාව - විනය පිටකය අටුවාවකි
5. සද්ධර්මරත්නාවලිය - ජ්‍යෝතිෂ ග්‍රන්ථයකි (............)

04) 1. වංසත්ථප්පකාසිනී - මහාවංසයට ලියන ලද අටුවාව
2. සරජෝතිමාලෙ - ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රය දෙමළ භාෂාවෙන් රචිත ග්‍රන්ථයකි
3. කඳවුරු සිරිත - දඹදෙණි යුගයේ රජවරුන් එදිනෙදා ජීවිතය ගැන විස්තරයකි
4. වීර සෝලියම් - දෙමළ ව්‍යාකරණ ග්‍රන්ථයකි
5. පූජාවලිය - ශ්‍රී මහා බෝධිය ගැන ලියවුන වංසකතාවකි (............)

**අංක 05 - 06 ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරන්න.**

05) හයවෙනි පරාක්‍රමබාහු රජුගේ කාර්ය සංසිද්ධීන් සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය නිවැරදි වේද?
1. කාලිංග මාඝ පරාජය කිරීම 2. කෝට්ටේ බෙදා වෙන් කිරීම
3. ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම 4. චන්ද්‍රභානු පරාජයට පත් කිරීම
5. පාණ්ඩ්‍ය රාජ්‍ය පදවිප්‍රාප්ති උරුමය සඳහා වූ යුද්ධයට සහභාගි වීම
(.............)

06) කව්සිළුමිණ රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
1. වෛදේහ හිමි 2. අනෝමදස්සී හිමි 3. දෙවෙනි පරාක්‍රමබාහු රජු
4. ධර්මසේන හිමි 5. බුද්ධපුත්‍ර හිමි

(.............)

**අංක 07 සිට 08 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එම කරුණ තෝරා එහි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

07) දඹදෙණි රාජවංසය
1. තුන්වෙනි විජයබාහු රජු දඹදෙණිය රාජවංසයේ ආරම්භකයා විය.
2. ඊට පෙර සිටි රජුන් තුන් වන විජයබාහු රජුට ඥාති සම්බන්ධතා නොතිබිණි.
3. තුන්වෙනි විජයබාහු රජුට පසු ව රාජ්‍යය හිමි වූයේ දෙවන පරාක්‍රමබාහු රජුට ය.
4. චීන සෙන්පති චෙන් හෝ විසින් මෙම පෙළපතේ අවසාන රජු චීනයට අල්ලාගෙන යන ලදි.
5. හතරවෙනි පරාක්‍රමබාහු රජුගේ අභාවයත් සමඟ ම දඹදෙණි පෙළපත අවසන් විය.

(..............)

08) කෝට්ටේ නගරය
1. කෝට්ටේ නගරය බිහි වූයේ නිශ්ශංක අලගක්කෝනාර විසින් ඉදි කරන ලද බලකොටුවක් ඇසුරෙනි.
2. කෝට්ටේ නගරය ශ්‍රී ජයවර්ධනපුර යනුවෙන් ද හැඳින් වේ.
3. කෝට්ටේ නගරයේ උපරිම සංවර්ධනය ඇති වූයේ හයවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ දී ය.
4. ලන්දේසීහු 1565 දී කෝට්ටේ නගරය අල්ලා ගත්හ.
5. 1551 දී දොන් ජුවන් ධර්මපාල කෝට්ටේ රජු බවට පත් විය. (..............)

**අංක 09 - 10 තෙක් වූ එක් එක් ප්‍රශ්නවල නාම/ප්‍රකාශන සමූහයක් ඕ හා ශ තීරුවල දී ඇත. X හා Y තීරුව එකිනෙකට ගැළපූ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා තිත් ඉර මත ලියන්න.**

09)

| X | Y |
|---|---|
| (i) පළමුවෙනි විජයබාහු රජු | A. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත |
| (ii) පළමුවෙනි පරාක්‍රමබාහු රජු | B. යාපා පටුන ජය ගැනීම |
| (iii) නිශ්ශංකමල්ල රජු | C. ශ්‍රී ලංකාවෙන් චෝලයන් පලවා හැරීම |
| (iv) දෙවන පරාක්‍රමබාහු රජු | D. බුරුම ආක්‍රමණය |
| (v) හයවෙනි පරාක්‍රමබාහු රජු | E. තුලාභාර දන් දීම |

1. CABED 2. CDEBA 3. CDEAB 4. CEABD 5. CDAEB (..............)

10)

| X | Y |
|---|---|
| (i) රසවාහිනී | A. මයිල්වාහනපුලවර් |
| (ii) පරෙවි සන්දේශය | B. වේදේහ හිමි |
| (iii) සද්ධර්ම රත්නාවලිය | C. වීදාගම මෛත්‍රිය හිමි |
| (iv) ලෝවැඩ සඟරාව | D. ශ්‍රී රාහුල හිමි |
| (v) යාල්පාන වෛපවමාලෛ | E. ධර්මසේන හිමි |

1. BEDAC 2. BADCE 3. BDCAE 4. BEDCA 5. CDAEB (..............)

ඇගයීම- 02

**පහත දැක්වෙන ආකාරයේ විචාර ප්‍රශ්න හා ව්‍යුහගත ප්‍රශ්න ලබා දෙමින් සිසුන් ඇගයීමට ලක්කරන්න**

01. දෙවෙනි පරාක්‍රමබාහු රජුගේ දේශපාලන හා සංස්කෘතික කාර්ය සංසිද්ධි සැකෙවින් සාකච්ඡා කරන්න.

02. ''හයවෙනි පරාක්‍රමබාහු රජුගේ දීර්ඝ රාජ්‍ය සමය යුද්ධය මෙන්ම සාමය සම්බන්ධ කාර්ය සංසිද්ධින් අතින් ශ්‍රී ලංකා ඉතිහාසයේ අවසාන කීර්තිමත් අවධිය විය''. සාකච්ඡා කරන්න.

03. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑ ම දෙකක ඓතිහාසික වැදගත්කම ප්‍රමාණ කරන්න
   (i) දඹදෙණි යුගයේ සාහිත්‍ය කටයුතු
   (ii) යාපන රාජ්‍යයේ නැඟීම
   (iii) කෝට්ටේ යුගයේ සංස්කෘතික අභිවර්ධනය

04. කොට්ටේ යුගයේ අධ්‍යාපන හා සාහිත්‍ය කටයුතු විමසීමට ලක් කරන්න.

05. දෙවෙනි පැරකුම්බා රජු විදේශීය ග්‍රහණයෙන් දිවයින මුදවා ගනිමින් ශක්තිමත් පාලනයක් ගොඩනැගූ ශ්‍රේෂ්ඨ පාලකයෙකි.
   (i) දෙවෙනි පරාක්‍රමබාහු රජුගේ පියා නම් කරන්න
   (ii) මෙතුමා විසින් රචනා කරන ලදැයි සැලකෙන ග්‍රන්ථ දෙකක් නම් කරන්න
   (iii) දෙවෙනි පැරකුම්බා රජුගේ ආගමික සේවාව පැහැදිලි කරන්න
   (iv) ඉහත ප්‍රකාශයට අවධානය යොමු කරමින් දෙවෙනි පැරකුම්බාවන්ගේ ශ්‍රේෂ්ඨත්වය විමසීමට ලක් කරන්න.

**පහත සඳහන් ස්ථාන සිතියමක ලකුණු කරන්න.**

සුබපබ්බත, ගෝවින්දමලය, මිණිපේ, දඹදෙණිය, යාපහුව, බෙලිගල, කැලණිය, දෙවිනුවර, රත්නපුර, කුරුණෑගල, ගම්පොල, දැදිගම, රයිගම, යාපනය, කෝට්ටේ, අත්තනගල්ල



# ඉන්දියාවේ ඉතිහාසය

## 1. ඉන්දියා ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය

රටක ඉතිහාසය ගොඩනැගෙනුයේ විවිධ මූලාශ්‍රය මඟින් ලබාගත් තොරතුරු තර්කානුකූල ව විවරණය කිරීමෙනි. මේ සඳහා ප්‍රමාණවත් තරම් ලිඛිත මූලාශ්‍රය සේ ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ද තිබීම වැදගත් වේ. එහෙත් ඉන්දීය ඉතිහාසය මුහුණ දෙන ගැටලුවක් වන්නේ එරට අඛණ්ඩ ඓතිහාසික සම්ප්‍රදායයක් දක්නට නොලැබීම යි. මේ තත්ත්වය ආදි ම යුගයේ සිට දහතුන් වන සියවසේ දී එල්ල වූ මුස්ලිම් ආක්‍රමණ දක්වා වූ යුගය තුළ වඩාත් ප්‍රබල ව දක්නට ලැබේ. අශෝක රාජ්‍ය සමයට පෙර ලියවුණා යැයි නිශ්චිත ව පිළිගත් ශිලා ලේඛන ද විරල ය. විදේශීය මූලාශ්‍රයයන්ගේ ඓතිහාසිකත්වය ද ක්‍රි.පූ හතර වන සියවසේ ඇලෙක්සැන්ඩර් ඉන්දියාව ආක්‍රමණය කළ යුගයට සීමා වී පවතී. එසේ ම ඉන්දියානු ඉතිහාසය පුරා පැතිරුණු බ්‍රාහ්මණ, දේව නිර්මාණවාදය යථාර්ථවාදී ඉතිහාසයෙන් ඉන්දියානුවන් ඈත් කරන්නට හේතු වන්නට ඇත. ඉන්දියාවේ භෞමික විශාලත්වය මේ සඳහා බාධා වූ තවත් කරුණකි. මේ සියල්ල මඟින් පෙනී යන්නේ ඉතිහාසය පිළිබඳ ව ඉන්දියානු සංකල්පය සාපේක්ෂ ව දුර්වල බව යි. එසේ වුවත් සාහිත්‍ය මූලාශ්‍රයන්හි සීමාරහිතභාවය පුරාවිද්‍යා මූලාශ්‍රය මඟින් අවම කර ගනිමින් ඉන්දීය ඉතිහාසය ගොඩනඟා තිබේ.

**නිපුණතාව :** කාලානුපිළිවෙළ, මූලාශ්‍රය විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරින් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** ඉන්දියා ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය විග්‍රහ කරයි.

**කාල පරිච්ඡේද :** 08

**ඉගෙනුම් පල**
- ඉන්දීය ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය නම් කරයි.
- ඉන්දීය ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය වර්ග කරයි.
- ඉන්දීය ඉතිහාසය ගොඩනැගීමේ දී මූලාශ්‍රය උපයෝගී කරගන්නා ආකාරය පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**මූලාශ්‍රය වර්ගීකරණය**
- පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය
- සාහිත්‍ය මූලාශ්‍රය
- අභිලේඛන
- නාණක

**පුරාවිාත්මක මූලාශ්‍රය**

පැරණි ඉන්දියාව විශාල භූගෝලීය කලාපයක පැතිරී තිබූ රාජ්‍ය කිහිපයකින් සමන්විත විය. ඒවායේ අඛණ්ඩ ඉතිහාසය ගොඩනඟා ගැනීමට ප්‍රමාණවත් සාහිත්‍ය මූලාශ්‍රය විරල ය. ඉන්දියානුවන්ගේ ඉතිහාසයේ අභිමානය ලොවට හෙළි කළ හරප්පා ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු මුළුමනින් ම පුරාවිද්‍යා මූලාශ්‍රය මඟින් ගොඩනඟා ගැනීමට සිදු වී තිබේ. එසේ ම ඓතිහාසික තොරතුරු ගළපා ගැනීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් ලැබෙන පිටුවහල සුළු කොට තැකිය නොහැකි ය.

**අභිලේඛන**

අභිලේඛන යනු ගල්, මැටි, තඹ, රන්, ලෝකඩ, පිත්තල ආදි මාධ්‍යයකින් සැකසූ ලිපියක, භාණ්ඩයක හෝ වෙනත් නිර්මාණයක හෝ ලියන ලද ලේඛනයකි. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අතුරින්

වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබාදෙන වැදගත් ම මූලාශ්‍රය ප්‍රභේදය වන්නේ ද මේවා ය. ''පැරණි ඉන්දියාවේ දේශපාලන ඉතිහාසය පිළිබඳ දැනීම සහමුලින් ම ලබාගෙන ඇත්තේ අභිලේඛන ඉවසිලිවන්ත ව පරීක්ෂා කිරීමෙනි''. ෆ්ලීට්.

**සෙල් ලිපි**

අභිලේඛන අතර සෙල් ලිපි ප්‍රධාන වේ. නියමිත යුගය පිළිබඳ ව ඉතිහාසය ගොඩනඟා ගැනීමේ දී සෙල්ලිපි රාශියක් ඉවහල් වේ. සෙල් ලිපි ලියා ඇති ගල්වල ස්වරූපය අනුව ඒවා ලෙන් ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි, ගිරි ලිපි ලෙස ද ප්‍රභේද කිහිපයකට බෙදිය හැකිය. ඒවායින් තෝරාගත් වැදගත් නිදර්ශන කීපයක් පහත දැක්වේ.

උදාහරණ ඃ අශෝක සෙල් ලිපි - මෞර්ය යුගය පිළිබඳ ව තොරතුරු හෙළි වන ප්‍රධාන මූලාශ්‍රය ප්‍රභේදය යි. අශෝක සෙල් ලිපි ප්‍රධාන වර්ග තුනකි.

- ගිරි/පර්වත ලිපි
- ලෙන් ලිපි
- ටැම් ලිපි/ස්තම්භ ලිපි

- ප්‍රාකෘත, මාගධී, ග්‍රීක සහ ඇරමයික් ආදි භාෂාවන්ගෙන් රචනා වීම
- අශෝක ධර්මය පිළිබඳ ව බොහෝ තොරතුරු අනාවරණය වීම
- කලිංගය ජය ගැනීම, මෞර්ය අධිරාජ්‍යයේ ව්‍යාප්තිය ආදි දේශපාලන තොරතුරු රැසක් සඳහන් ව තිබීම
- ගිර්නාර්, කාල්සි, ෂහාස්සරි, බරාබර්, ජෞගඩා, යෙරගුඩි, සෝපාරා, දෞලි, රූප්නාත්, මාන්සේරා, සාරානාත්, බයිරාත්, මස්කි වැනි ප්‍රකට ශිලා ලේඛන රැසක් හමු වී තිබීම

සමුද්‍ර ගුප්ත සමයේ සෙල්ලිපි




අලහබාද් ප්‍රශස්තිය සහිත ටැඹ

- අලහබාද් ප්‍රශස්තිය (ප්‍රයාග)
- සමුද්‍රගුප්ත රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධිය අධ්‍යයනය කිරීමේ දී වැදගත් වේ.
- අශෝක රජුගේ අලහබාද් ටැම් ලිපියේ ප්‍රතිමුඛයේ කොටවා ඇත.
- සමුද්‍රගුප්තයන්ගේ සටන් ව්‍යාපාරය අවසානයේ ඔහු 'සටන් සියයක වීරයා' ලෙස මෙහි හඳුන්වා දෙයි.
- ගද්‍ය හා පද්‍ය දෙයාකාරයට රචිත මෙහි ඇතැම් කොටස් විනාශ වී තිබේ.
- මෙහි දක්වෙන ප්‍රධාන ප්‍රශස්ති කවි අටෙන් පහත තොරතුරු හෙළි වේ.
    * පළමු හා දෙවන කවිවලින් 1 වන චන්ද්‍රගුප්තගේ සටන්
    * තෙවන කවියෙන් සමුද්‍රගුප්තගේ ප්‍රඥාවන්ත බව
    * සිව් වන කවියෙන් පියා විසින් ඔහු රාජ්‍යත්වයට නම් කිරීම
    * පස්වන, හය වන කවිවලින් රාජ්‍යත්වය තහවුරු කරගැනීමට ගෙනගිය සටන් ව්‍යාපාර
    * හත් වන සහ අට වන කවිවලින් ඔහුගේ යුද්ධ ප්‍රයානයන්හි අවස්ථා හතරක් දක්වයි.
        * ආර්යාවර්තය අල්ලා ගැනීම
        * අටවික රාජ්‍ය යටත් කිරීම
        * දක්ෂිණාපථය ආක්‍රමණය
        * දේශසීමා අසල රාජ්‍ය යටත් කිරීම

මේ හැර ඒරාන් ලිපිය, ගයා ලිපිය, නාලන්දා ලිපිය යන සෙල් ලිපි ද සමුද්‍රගුප්ත සමයට අයත් ය.

**වෙනත් වැදගත් සෙල්ලිපි**

- කණිෂ්ක - සාරානාත්
- ඛාරවේල - හථිගුම්ඵා
- රුද්‍රදාමන්ගේ ජුනාගාඩ් (පළමු සංස්කෘත අභිලේඛනය)
- 2 වන චන්ද්‍රගුප්ත - මෙහෙරාවුලි අයස්තම්භය, උදයගිරි ප්‍රශස්තිය
- පළමු වන පුලකේශීන් - අයිහෝල්
- හර්ෂ - බ්‍රෝච්
- 1 වන රාජේන්ද්‍ර - තිරුවාලන්ගාඩු සන්නස



ජුනාගාඩ් (පළමු සංස්කෘත අභිලේඛනය)

**නාණක මූලාශ්‍රය**

- වෙළෙඳාම, ආර්ථික තත්ත්වය, ජන ජීවිතය, ආක්‍රමණ, රාජධානි බිඳ වැටීම ආදි තොරතුරු රැසක් අනාවරණය කර ගත හැකි වීම
- කාසිවල සඳහන් රූප සටහන්, සංකේත සහ පාඨ ආදිය මගින් ඒවා නිකුත් කළ රජුන්, ප්‍රධානින්, වෙළෙඳ ශ්‍රේණි, නාගරිකයන් ගැන තොරතුරු ලැබීම
- රන්, රිදී, තඹ සහ ලෝකඩ ආදි යොදාගත් මාධ්‍ය අනුව තත්කාලීන ආර්ථික තත්ත්වයේ ස්වරූපය අනාවරණය වීම
- නාණක මූලාශ්‍රය අතුරින් වැදගත් නිදර්ශන කීපයක් පහත දැක්වේ.

- බැක්ට්‍රියානු, ග්‍රීක කාසි

ශතවර්ෂ දෙකකට ආසන්න කාලයක් වයඹදිග ඉන්දියාව පාලනය කළ බැක්ට්‍රියන් - ග්‍රීක රජවරු තිස්දෙනකු ගැන තොරතුරු ලැබෙන එක ම මූලාශ්‍රය වීම

දියොඩෝටස්ට අයත් රන් කාසි




- කුෂාණ කාස
  * රෝම ශෛලියකට අනුව නිපදවා තිබීම
  * දේවතා රූප මෙන්ම බුද්ධ රූප ද තිබීම
  * කුජුල, තැඩ්ෆයිසීස්, කණිෂ්ක, හුවිශ්ක වාසුදේව යන පාලකයන්ට අයත් කාසි හමු වීම

කණිෂ්ක රජුට අයත් රන් කාසි




- ගුප්ත කාසි
- ගුප්ත යුගයේ ආර්ථික, දේශපාලන, සංස්කෘතික තොරතුරු රැසක් මෙමගින් හෙළි වීම
- විවිධ ප්‍රභේද ගණනාවකට බෙදූ කාසි හඳුනාගත හැකි වීම
  * දණ්ඩධර වර්ගය
  * ධනුද්ධර වර්ගය
  * පරශුව වර්ගය
  * ව්‍යාඝ්‍රපරාක්‍රම වර්ගය
  * වීණාවාදක වර්ගය
  * අශ්වමේධ වර්ගය

සමුද්‍රගුප්තට අයත් රන් කාසියක්



ගණ රාජ්‍යයන්ට අයත් කාසි

- මාලව, යෞධේව, මිද්‍ර, පංචාල යන ගණ රාජ්‍යයන් පිළිබඳව තොරතුරු අනාවරණය වන එක ම මූලාශ්‍රයය වීම

පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂ ස්මාරක

- ඒ ඒ යුගයන්හි දී පැවති ශිෂ්ටාචාරව ජන ජීවිතය හා ජීවන තත්ත්වය පිළිබඳ අවබෝධයක් ලැබිය හැකි වීම
- හරප්පා ශිෂ්ටාචාරයට අයත් නටබුන් මඟින් සමකාලීන නාගරික ලක්ෂණ පිළිබඳ ව හෙළි වීම
- ආර්ථික තත්ත්වය, දේශීය හා විදේශීය වාණිජ කටයුතු පිළිබඳ තොරතුරු හෙළි වීම
- මේ යුගයේ තිබූ විද්‍යා හා තාක්ෂණික ඥානය පිළිබඳ ව අවබෝධයක් ලැබිය හැකි වීම

නිදසුන්

- ඉන්දු නිම්නයෙන් හමු වූ විවිධ රූප සලකුණු සටහන් වූ සිය ගණනක් වන මුද්‍රා
- පූජක රුව, රතු වැලිගලෙන් නෙළූ නග්න මිනිස් රූප දෙක ලෝකඩෙන් සැදූ නිරුවත් නළඟන රූපය ඇතුළු විවිධ මානව හා වෙනත් ප්‍රතිමා
- ඉන්දු නිම්නයේ චිත්‍රාක්ෂර හා වෙනත් මානව අවශේෂ






හරප්පා ශිෂ්ටාචාරයට අයත් මැටි කරත්තයක් සහ ආභරණ


* බෞද්ධ මධ්‍යස්ථාන - ශ්‍රාවස්ති, සාංචි, කුසිනාරා, සාරානාත්
* පැරණි නගර - පාටලීපුත්‍ර, තක්ෂිලා, කෞශම්බි, ඉන්ද්‍රප්‍රස්ථ, සාංචි, මාවල්ලපුරම්, තංජෝර් සහ මධුරා
* පැරණි ඓතිහාසික ස්ථාන - මථුරා, බාරාණසී, ශ්‍රාවස්ති සහ කෞශම්බි
* චෛත්‍ය ගුහා - නාසික්, කාර්ලේ, අජන්තා සහ එල්ලෝරා




කෞෂම්භි නගරයේ නටබුන්





ඉන්ද්‍රප්‍රස්ථ නගරයේ නටඹුන්



එල්ලෝරා ගුහා



නාසික් ගුහා



කාර්ලේ ගුහා

**සාහිත්‍ය මූලාශ්‍රය**

මේ යුගයට අයත් විවිධ තේමාවන් ඔස්සේ රචනා වූ සාහිත්‍ය මූලාශ්‍රය රාශියක් හඳුනාගත හැකි ය. මේ සියල්ල ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය.

- දේශීය සාහිත්‍ය මූලාශ්‍රය
- විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය

**දේශීය සාහිත්‍ය මූලාශ්‍රය**

- **ආගමික**

  වෛදික සාහිත්‍යය

  - වේද ග්‍රන්ථ ඇතුළු ව ක්‍රි.පූ. 5 වන සියවස තෙක් කාලය තුළ රචනා වූ පොත්පත් ය.
  - ඍග් වෛදික යුගයේ දී රචනා වූ ඍග් වේදය හා පශ්චාද් වෛදික යුගයේ ලියැවී ඇති වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යක උපනිෂද්, පුරාණ, වේදාංග, උපවේද සහ සූත්‍ර
  - ආර්යයන්ගේ දේශපාලන, ආර්ථික, ආගමික හා සමාජීය තොරතුරු රැසක් හෙළි වීම
  - බ්‍රාහ්මණ ග්‍රන්ථ - වෛදික මන්ත්‍රයන්ට අර්ථ විවරණ සපයමින් ගද්‍යයෙන් ලියැවී තිබීම
  - ආරණ්‍යක ග්‍රන්ථ - දෙවියන්, ආත්මය, ලෝකය හා මිනිසා පිළිබඳ දැනීම ආදි විවරණය කිරීම

  උපනිෂද් - භාරතීය දර්ශනය ඒකරාශී වී තිබීම වේදාන්ත යනුවෙන් ද හැඳින්වීම
  කර්ම හා ඥාන යන අංශ දෙකක් පිළිබඳ අවධානය යොමු කර තිබීම
  දාර්ශනික අගයකින් යුක්ත වීම

  පුරාණ ග්‍රන්ථ

  * පුරාණ යන්නෙහි අර්ථය පරම්පරා කතා යන්න යි
  * පුරාණ ග්‍රන්ථ 18ක් පිළිබඳ ව සඳහන් වීම
  * විශ්වයේ උපත දෙවියන්ගේ ප්‍රභවය, ඓතිහාසික කරුණු මෙන් ම මිථ්‍යා කල්පිතයන් ද මෙම ග්‍රන්ථයන්හි ඇතුළත් වීම
  * උතුරු ඉන්දියානු රාජ වංශ පිළිබඳ ව සුළු දැනුමක් ද මෙමගින් ලැබිය හැකි වීම
  * විෂ්ණු, කර්ම, වරාහ, භාගවත, මත්ස්‍ය, බ්‍රහ්මාණ්ඩ සහ අග්නි ආදි පුරාණ ග්‍රන්ථ රැසක් මෙයට අයත් වීම

බෞද්ධ ග්‍රන්ථ

* අංගුත්තර නිකාය - බුදුන් දවස ඉන්දියාවේ දේශපාලන තත්ත්වය
* අග්ගඤ්ඤ සූත්‍රය - ඉන්දීය රාජ්‍ය පාලන තන්ත්‍රය හා ආර්ථික ක්‍රමයේ විකාශනය
* කූටදන්ත සූත්‍රය - ධාර්මික රාජ්‍යයක සැලැස්ම
* චක්කවත්ති සීහනාද සූත්‍රය - බෞද්ධ චක්‍රවර්ති සංකල්පය විශ්ලේෂණය කර තිබීම
* ජාතක කතා පොත - භාරතීය සමාජ සංවිධානය
* විනය පිටකය - සමාජ - ආර්ථික විෂමතා හා නීතිරීති පිළිබඳ තොරතුරු
* මහාපරිනිබ්බාණ සූත්‍රය - සමකාලීන උතුරු ඉන්දියානු ඉතිහාසය
* වංස කථා - මහාවංසය, දීපවංසය - මෞර්ය යුගය ඇතුළු පසුකාලීන යුගවලට අයත් ආගමික, දේශපාලන තොරතුරු

ජෛන සාහිත්‍යය

* ක්‍රි.පූ. 6 වන සියවසේ සිට ක්‍රි.පූ. 4 වන සියවස තෙක් ඉන්දියානු ආගමික පරිසරයේ විකාශනය
* දේශපාලන, ආර්ථික, සංස්කෘතික තොරතුරු
* භගවතී සූත්‍ර, වෛතුංග සූත්‍ර, සමාවතී සූත්‍ර ප්‍රධාන ග්‍රන්ථයන් වීම

ලෞකික මූලාශ්‍රය ග්‍රන්ථ

- ධර්ම ශාස්ත්‍ර, ධර්ම සූත්‍ර ග්‍රන්ථ, ස්මෘති ග්‍රන්ථ, තර්ක ශාස්ත්‍රය වෛද්‍ය ග්‍රන්ථ යනාදිය මෙයට අයත් වීම

ඓතිහාසික ග්‍රන්ථ

- පංච තන්ත්‍රය - විෂ්ණු ශර්මන්
- රාජතරංගිණී - කල්හණ
- චරිතාපදාන
    * වික්‍රමාංකදේව චරිතය - බිල්හාන
    * නවහායාපොං චරිතය - පත්මගුප්ත
    * රාම චරිතය - සන්ධ්‍යානන්දි
    * කුමාරපාල චරිතය - ජයසිංහ
    * හර්ෂ චරිතය - භාණ භට්ට
    * ගෞඩවහෝ (යශෝවර්මන් චරිතය) - වාක්පති

- **වෙනත් සාහිත්‍ය ග්‍රන්ථ**

සංගම් සාහිත්‍යය

- ක්‍රි.ව. 1 වන සියවසේ සිට 3 සියවස තෙක් දකුණු ඉන්දීය පාණ්ඩ්‍ය රාජ්‍යයන්හි දී ඒකරාශි වූ සංගම් මඟින් රචිත සාහිත්‍ය ග්‍රන්ථ සමූහයකි
- පළමුවැන්න තෙන්මදුරෙයිහිදීත්, දෙවැන්න කබාඩපුරම්බි දීත් තුන්වැන්න මධුරෙයිහි දීත් පැවැත්වුණි
- උපදේශාත්මක කාව්‍ය කීල්කනක්කු ලෙසත්, වෘත්තාන්තමය කාව්‍ය මේල්කනක්කු ලෙසත් හැඳින්වේ.
- සාහිත්‍ය ග්‍රන්ථ මෙන් ම තත්කාලීන ආර්ථික, දේශපාලන, සංස්කෘතික තොරතුරු අනාවරණය වන මූලාශ්‍රය වීම
- රාජ්‍ය අනුග්‍රහය ලැබූ 500 කට අධික කවීන් මෙකල සිටීම
- එම කවීන් අතර රජවරුන් මෙන්ම කාන්තාවන් ද වීම
    * පළමු වන සංගම් - අගත්තියර්, මුරන්ජියුර්, මුඩිනගරායර්
    * දෙ වන සංගම් - තොල්කාප්පියර්, වල්ලුර්ක්කාප්පියර්
    * තුන් වන සංගම් - තබිලර්, පරකර්, නකීකීරර්
- පළමු සංගමයේ දී ඉදිරිපත් කළ සාහිත්‍ය නිර්මාණ ශේෂ ව නොමැති අතර, දෙවැන්නේ දී තොල්කාප්පියම් ග්‍රන්ථය නිර්මාණය වී ඇත.

- සෙසු ග්‍රන්ථ නිර්මාණය වූයේ තුන් වන සංගම්හි දී ය.
- එට්ටුත්තොහයි (සංහිතා අට)
    * අගනාහුරු
    * පුරනාහුරු
    * නට්රිණයි නාහුරු
    * තුරුන්තොගයි නාහුරු
    * අයිංගුරුනුරු
    * පදිට්ටුප්පත්තු
    * පර්පාඩල්
    * කලිත්තොගයි

- මේ හැර දෙ වන සංගමයේ දී ඉදිරිපත් වූ ගීත දහයක් ද හඳුනාගෙන තිබේ.
  පත්කුප්පාට්ටු (ගීත දහය)
    * තිරු මුරුගාට්ටුප්පඩෛ
    * පොරුනරාට්ටුප්පඩෛ
    * සිරුපානාට්ටුප්පඩෛ
    * පෙරුම් පානාට්ටුප්පඩෛ
    * මුල්ලයිප්පාට්ටු
    * මදුරයික්කාන්චි
    * නෙඩුනල්වාඩෛ
    * කුරුන්ජිප්පාට්ටු
    * පට්ටිනප්පාඩෛල්
    * මලයිපඩුකඩාම්

- තුන් වැනි සංගමයේදී ඉදිරිපත් වූ ග්‍රන්ථ දෙකකි
    * තුරාල්
    * අරුල්
- මෙම බෙදීම් ඉතිහාසඥයන් බහුතරයකගේ අදහස් අනුව සිදු කර තිබීම

**සංගම් සාහිත්‍යයෙන් හෙළි වන ඓතිහාසික තොරතුරු**

- දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යය පිළිබඳ අඛණ්ඩ රාජ නාමාවලියක් ලබාගත හැකි වීම
- චෝල, පාණ්ඩ්‍ය, කේරළ ප්‍රදේශවල ඔටුනු පලන් රජුන් තිදෙනෙකු හා ප්‍රදේශීය පාලකයන් ද සිටි බව සඳහන් වීම
- අමාත්‍යවරුන්ගේ හා පඬිවරුන්ගේ ද, අදහස් විමසමින් ගෙනගිය රාජාණ්ඩු ක්‍රමයක් පැවති බව සඳහන් වීම
- සමාජීය වශයෙන් ආර්ය හා ද්‍රවිඩ ජනකොටස් සම්මිශ්‍රණය වූ සමාජයක් පැවති බව හෙළි වීම
- කෘෂිකර්මය, වෙළෙඳාම, විවිධ වෘත්තීන් සහිත ස්වයංපෝෂිත ආර්ථිකයක් පැවති බව සඳහන් වීම
- බාහිර හා අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ ව තොරතුරු සඳහන් වීම
- කාව්‍ය ගායනා, නැටුම්, වීණා වාදනය, මල්ලවපොර, දාදු කෙළිය, පන්දු ක්‍රීඩාව, මදටිය ඇට ක්‍රීඩාව, ජල ක්‍රීඩා වැනි ක්‍රීඩා හා විනෝද කටයුතු රැසක් ගැන සඳහන් වීම
- හින්දු ආගමික අදහස් ව්‍යාප්ත ව පැවති බවත් සමාජයේ ඉහළ ම තලය බ්‍රාහ්මණයන්ට ලැබුණු බවත් සඳහන් වීම

- **නාට්‍ය ග්‍රන්ථ**

    - කාලිදාස - මාලවිකාග්නිමිත්‍ර, වික්‍රමෝර්වශී, ශාකුන්තලය
    - විශාකදත්ත - දේවී චන්ද්‍රගුප්තා, මුද්‍රාරාක්ෂසය
    - ශුද්‍රක - මෘච්ඡකටිකා

- **ව්‍යාකරණ ග්‍රන්ථ**

    - පාණිනිගේ ව්‍යාකරණ ග්‍රන්ථ
    - පතඤ්ජලීගේ ව්‍යාකරණ ග්‍රන්ථ
    - තොල්කාප්පියම් නම් දෙමළ ව්‍යාකරණ ග්‍රන්ථය

- **කාව්‍ය ග්‍රන්ථ**

  - කාලිදාස - ඍතු සංහාරය, මේඝදූතය, රඝුවංශය, කුමාරසම්භවය
  - භාරවී - ශිශුපාලවය, කිරාතාර්ජුන
  - දණ්ඩින් - දශකුමාර චරිතය
  - නවරත්න කවීන් පිළිබඳව ගුප්ත යුගයේදී සඳහන් වීම
    * ධන්වන්තරී * ඝටකර්පර
    * වේතාල * ශඞ්කු
    * ක්ෂපණක * කාලිදාස
    * භට්ට

- **දේශපාලන න්‍යාය ග්‍රන්ථ**
  කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය

  - චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ අමාත්‍ය කෞටිල්‍ය (විෂ්ණු ගුප්ත/චාණක්‍ය, වාත්ස්‍යාංගන) විසින් රචනා කරන ලද්දකි.
  - දේශපාලන න්‍යාය ග්‍රන්ථයක් ලෙස ද වැදගත් වේ.
  - සමකාලීන ඉන්දීය ඉතිහාසයේ තොරතුරු රැසක් දක් වේ.
  - ගුප්ත යුගයේ දී අවසන් වරට සංස්කරණය වී ඇත.
  - මෙහි රාජ්‍යත්වය, රජුගේ යුතුකම් සහ වගකීම්, අමාත්‍ය මණ්ඩලය, අධිකරණය, ප්‍රදේශ පාලනය, රජයේ ආදායම, වරප්‍රසාද සේවා ආදි විවිධ අංශ රැසකට අයත් තොරතුරු සඳහන් වේ.
  - ඉන්දියානු මෙන් ම ශ්‍රී ලාංකික පාලකයන් ද (මහා පරාක්‍රමබාහු) මෙය දේශපාලන න්‍යාය ග්‍රන්ථයක් ලෙස පරිශීලනය කළ බව සඳහන් වේ.

- **වෙනත් න්‍යාය ග්‍රන්ථ**

  - මනුස්මෘතිය, ශුක්‍රනීතිසාරය, කාමණ්ඩකීය නීතිසාරය, ගෞතම ධර්ම ශාස්ත්‍රය, බෞද්ධායන ධර්ම සූත්‍රය, ආපස්තම්භ ධර්ම සූත්‍රය, විෂ්ණු ස්මෘති, බෘහස්පති ස්මෘති සහ නාරද ස්මෘති

- **වීර කාව්‍ය**
  රාමායණය

  - වාල්මීකි නම් ඍෂිවරයකු විසින් රචනා කරන ලද්දකි.
  - සංස්කෘත භාෂාවෙන් ලියා ඇති මෙහි පද්‍ය 24,000ක් අඩංගු ය.
  - රාමායණයේ වීරයා වන රාම විෂ්ණුගේ අවතාරයක් ලෙස සඳහන් වේ.
  - රාම-රාවණා කතා පුවතේ බොහෝ ඓතිහාසික තොරතුරු ඇතුළත් වේ.

  මහා භාරතය

  - ව්‍යාස නම් පඬිවරයා විසින් රචිත මෙහි කාණ්ඩ තුනකින් ද, ශ්ලෝක ලක්ෂයකින් ද තොරතුරු ගොනු කර ඇත.
  - කෞරවයන් හා පාණ්ඩවයන් අතර ඇති වූ සටන මෙයින් විස්තර කෙරේ.
  - මෙහි සඳහන් ශ්‍රී කෘෂ්ණ, විෂ්ණුගේ අවතාරයක් ලෙස හඳුන්වා ඇත.

- **වීර කාව්‍යයන්හි ඓතිහාසික වැදගත්කම**
  - පැරණි භාරතයේ සමාජීය ලක්ෂණ, ආචාර ධර්ම පිළිබඳ ව තොරතුරු අනාවරණය වීම
  - ආර්ය සභ්‍යත්වය උතුරු ඉන්දියාවේ සිට රාජස්ථානය හරහා දකුණු ඉන්දියාවට පැතිර ගිය ආකාරය හෙළි වීම
  - පරමාදර්ශී පවුල් ජීවිතය හා ආචාර ධර්මානුකූල සමාජය පිළිබඳ තොරතුරු සඳහන් වීම
  - මෙම නිර්මාණයන් මුල් කරගනිමින් භාරතීය සංගීත ක්ෂේත්‍රය, නාට්‍ය කලාව, නැටුම් ශිල්පය ආදියේ විකාශනය පිළිබඳ තොරතුරු හෙළි කර ගත හැකි වීම
  - අසල්වාසී රටවල් ගණනාවකටම එහි බලපෑම තිබීම

- **විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය**

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ මූලාශ්‍රය | - | දීපවංසය, මහාවංසය, සමන්තපාසාදිකාව, මහාවංස ටීකාව |
| ග්‍රීක මූලාශ්‍රය | - | ජස්ටින්, ප්ලූටාච්, මෙගස්තිනිස්, හෙරඩෝටස්, ස්ටෙඩියස්, ස්ට්‍රාබෝ යන අයගේ වාර්තා හා පෙරිප්ලස් ඔෆ් ද එරිත්‍රියන්සී ග්‍රන්ථය |
| රෝම මූලාශ්‍රය | - | ප්ලිනිගේ නැචුරාලිස් හිස්ටෝරිය<br>ටොලමිගේ භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය |
| චීන මූලාශ්‍රය | - | ෆාහියන් වාර්තා, හ්‍යුං-සාන් වාර්තා, ඉත්-සිං වාර්තා |
| අරාබි මූලාශ්‍රය | - | අල්බිරූනි, අල් මසුදි, ඉබන් කුර්දාද් බේහ්, ඉබන් ෂහිරිහාහ් |
| ටිබෙට් මූලාශ්‍රය | - | තාරානාථගේ වාර්තා |

- කැපී පෙනෙන මූලාශ්‍රය විදේශීය

මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා
- චන්ද්‍රගුප්ත මෞර්ය රාජ සභාවට පැමිණි සෙලියුකස් නිකේටර්ගේ තානාපතිවරයා වූ මෙගස්තිනිස් විසින් මෙය රචනා කරන ලදි.
- ඔහු ලියූ ඉන්ඩිකා ග්‍රන්ථයේ මුල් පිටපත ලැබී නොමැත.
- පසු කාලීන ග්‍රීක, රෝම ලේඛකයන් එම මුල් කෘතියෙන් උපුටා ගෙන සටහන් කළ දේ ඉතිරි වී තිබේ.
- විවිධ පුද්ගලයන්ගෙන් අසා දැනගත් තොරතුරු ද තිබෙන නිසා ඇතැම් තොරතුරු විශ්වසනීය නොවේ (කුල ක්‍රමය, වහල් ක්‍රමය)
- එහෙත් සමකාලීන ඉන්දියාව පිළිබඳව වැදගත් තොරතුරු රැසක් අන්තර්ගත වේ.
- ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණ, සමාජය, පාලනය, මෞර්ය රජ මාලිගය, පාටලීපුත්‍ර නගරය හා එහි පාලනය ආදි වැදගත් තොරතුරු රැසක් අන්තර්ගත වේ.

හියුං - සාංගේ වාර්තාව
- භ්‍රමණවෘත්තාන්තය ලෙස මෙය හඳුන්වයි
- ඉන්දීය ඉතිහාසය පිළිබඳ ව වැදගත් ම සටහන් ලියා ඇත්තේ මුන්වහන්සේ විසිනි
- වින්සන්ට් ස්මිත් දක්වන පරිදි ඉන්දීය ඉතිහාසයේ අඳුරු කාලපරිච්ඡේද ගණනාවකට ආලෝකය මෙමඟින් ලැබේ.
- ක්‍රි.ව. 603 දී චීනයේ හෝනං ප්‍රදේශයේ චිං ලිවු නගරයේ ඉපදී ක්‍රි.ව. 629 දී ඉන්දියාවට ඒමට පිටත් විය.
- තක්ෂිලා, සිංහපුර, කාශ්මීර, සාගල, ජලන්ධාර, මථුරා, කනෞජ්, අයෝධ්‍යා, ප්‍රයාග, කෞශම්බි, ශ්‍රාවස්තිය සහ වජ්ජි යන වැදගත් ස්ථාන රැසක් පිළිබඳ ව මෙම වාර්තාවේ දැක්වේ.

- හර්ෂවර්ධන රාජසමයේ දී පැවැත්වූ ආගමික පෙරහැර හා කනෞජ් සම්මේලනය පිළිබඳ වැදගත් තොරතුරු රැසක් දක්වෙයි.
- නාලන්දා විශ්ව විද්‍යාලයයේ අධ්‍යාපනය ලබමින් එහි තොරතුරු ද දක්වා ඇත.
- මිහිරකුලගේ ආක්‍රමණය, ධර්මාශෝක, කණිෂ්ක සහ 2 වන පුලකේශීන් යන පාලකයන් පිළිබඳව ද තොරතුරු රැසක් සඳහන් වේ.
- නාලන්දා විශ්ව විද්‍යාලයයේ තොරතුරු ලැබෙන එක ම ග්‍රන්ථය
- කාංචියේ බෞද්ධ විහාරාරාම පිළිබඳ වත්, ලංකා ඉතිහාසයේ තොරතුරු රැසක්ත් මෙහි සඳහන් වේ.

**මූලාශ්‍රය භාවිතයේ දී පැන නගින ගැටලු**

- ඉන්දියාවේ අඛණ්ඩ ව පවත්වාගෙන ආ මූලාශ්‍ර යසම්ප්‍රදායයක් නොවීම
- ඉන්දු නිම්නයෙන් හමු වූ රූපාක්ෂර (චිත්‍රාක්ෂර) තව මත් කියවාගැනීමට නොහැකි වීම
- ඉන්දියානු සමාජයේ මුල් බැසගෙන තිබූ නිර්මාණවාදී සංකල්පය යථාර්ථවාදී ඓතිහාසික සම්ප්‍රදායයකට බාධාවක් වීම
- ''ඉන්දියානුවන් ඉතිහාසය කෙරෙහි දක්වූයේ අල්ප උනන්දුවකි'' යනුවෙන් අල්බරූනි සඳහන් කර තිබීම
- ඉන්දියාවේ භෞමික විශාලත්වය මෙන් ම භූගෝලීය බාධකයන් අඛණ්ඩ පරිපූර්ණ ඉතිහාසය සම්ප්‍රදායයක් ගොඩනැඟීමට බාධාකාරී වීම
- එක් පොදු වර්ෂ ක්‍රමයකින් තොර ව විවිධ රාජවංශ විවිධ වර්ෂ ක්‍රම භාවිත කිරීම කාල නිර්ණය කෙරෙහි බාධාවක් වීම
- බෞද්ධ, ජෛන, බ්‍රාහ්මණ ආදි මූලාශ්‍රය තත්කාලීන සමාජ රටාව පිළිබඳ විවරණය කරන තොරතුරු ආගමික දෘෂ්ටි කෝණයකින් දක්වීම නිසා විශ්වසනීයත්වය ගිලිහී තිබීම

**මූලාශ්‍රය සංසදනාත්මක අධ්‍යයනයේ වැදගත්කම**

- කුමන රටක වුව ද පවතින ඓතිහාසික සම්ප්‍රදායේ සීමිතතාවන් මගහරවා ගැනීමේ දී සංසන්දනාත්මක ව මූලාශ්‍ර යඅධ්‍යයනය කිරීම සිදු වේ.
- කාශ්මීර වංශකථාව වූ රාජතරංගිණියේ දී කල්හනයන් විසින් අතීත පුවත් විවරණය කරන්නකු ක්‍රියා කළ යුතු නිවැරදි ආකාරය දක්වන්නේ මෙසේ ය.

  '' විනිසකරුවකු සේ රාගයෙන්, ද්වේශයෙන් බැහැර ව සිට අතීත පුවත් කථනය කළ යුතු ය.''

- ඉන්දීය මූලාශ්‍රයයන්හි පවතින විවිධ සීමිතතාවන් නිසා මෙලෙස සංසන්දනාත්මක අධ්‍යයනය ඉතාමත් අත්‍යවශ්‍ය කරුණක් වී තිබීම
- අඛණ්ඩ ඉතිහාස සම්ප්‍රදායයක් නොවීම නිසා ඉතිහාසයේ ඇතැම් අඳුරු තැන් ආලෝකවත් කරගැනීමේ දී සංසන්දනාත්මක අධ්‍යයන ක්‍රමය බෙහෙවින් වැදගත් වීම

ඇගයීම - 01

**අංක 01 සිට 10 තෙක් වූ ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.**

(1) 1. ඍග් 2. විශ් 3. අතර්වන් 4. යජුර් 5. සාම (------)
(2) 1. සංහිතා 2. බ්‍රාහ්මණ 3. ආරණ්‍යක 4. උපනිෂද් 5. වායු පුරාණ (------)
(3) 1. මේඝදූතය 2. ඍතුසංහාරය 3. ශාකුන්තලය 4. මෘච්ඡකටිකා 5. රඝුවංශය (------)
(4) 1. ෆාහියන් 2. තාරානාථ 3. හ්‍යුං-ත්සාං 4. ඉට්සිං 5. සං-යුං (------)
(5) මස්කි 2. ගිර්නාර් 3. ලුම්බිණි 4. දෞලි 5. හථිගුම්ඵා (------)

**අංක 6 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා නාම යුගල පහක් දක්වේ. ඒ අතර එහි නොගැළපෙන නාම යුගලයක් ඇත. නොගැළපෙන නාම යුගල හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

6. (1) හථිගුම්ඵා ශිලා ලිපිය - කාලිංග ඛාරවේල
(2) රුම්න්දෙයි ශිලා ලිපිය - චන්ද්‍රගුප්ත මෞර්ය
(3) ගිර්නාර් ශිලා ලිපිය - රුද්‍රදාමන්
(4) මථුරා ශිලා ලිපිය - 2 වන චන්ද්‍රගුප්ත
(5) හාන්ස්වේරා ශිලා ලිපිය - හර්ෂවර්ධන (------)

7. (1) සුත්‍රාලංකාර - තන්ත්‍රයාන
(2) භගවද්ගීතා - හින්දු
(3) භගවතීසූත්‍ර - ජෛන
(4) මහා ප්‍රඥා පාරමිතා - මහායාන
(5) කථාවත්ථුප්පකරණ - ථේරවාදි (------)

8. (1) ගද්‍ය කෘතියකි - කථාසරිත් සාගර
(2) වංශකථාවකි - රාජතරංගිණී
(3) තාරකාශාස්ත්‍ර කෘතියකි - බෘහද්සංහිතා
(4) වෛද්‍ය කෘතියකි - සුශ්‍රැත සංහිතා
(5) නාට්‍ය කෘතියකි - පංචතන්ත්‍රය (------)

9. (1) මෙගස්තිනිස් - ඉන්ඩිකා
(2) කෞටිල්‍ය - අර්ථ ශාස්ත්‍රය
(3) වාල්මිකී - රාමායනය
(4) කාලිදාස - මෙඝදූතය
(5) හර්ෂවර්ධන - මෘච්ඡකටිතා (------)

10. (1) හෙරඩෝටස් - ග්‍රීක
(2) තාරානාථ - චීන
(3) අල්බිරූනි - අරාබි
(4) කොස්මස් - බයිසන්තියන්
(5) ස්ට්‍රාබෝ - රෝම (------)

**අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා අදාළ අංකය, තිත් ඉර මත ලියන්න.**

| පළමුවැනි ප්‍රකාශය | | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය | නිවැරදි ය |
| 2. | නිවැරදි ය | වැරදි ය |
| 3. | වැරදි ය | වැරදි ය |
| 4. | වැරදි ය | නිවැරදි ය |
| 5. | නිවැරදි ය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 11. පාටලීපුත්‍රයේ නගර පිළිබඳ දීර්ඝ විස්තරයක් මෙගස්තිනිස් ඉදිරිපත් කරයි. | නගරයේ පාලන කටයුතු මණ්ඩල හයකට පවරා තිබුණු බවත්, ඒ සැම මණ්ඩලයක් ම සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වූ බවත් ඔහු සඳහන් කරයි. (..................) |
| 12. රාජතරංගිණිය කාශ්මීර ඉතිහාසය විස්තර කරයි. | රාජතරංගිණියේ කර්තෘවරයා භාණය (..................) |
| 13. අර්ථ ශාස්ත්‍රය චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ පුරෝහිත චානක්‍ය විසින් රචිත කෘතියකි. | අශෝක ශිලා ලිපි මෞර්ය අධිරාජ්‍ය අධ්‍යයනය කිරීමේ වැදගත් මූලාශ්‍රයකි. (..................) |
| 14. ෆාහියන් ඉන්දියාවට පැමිණියේ මහාපද්මනන්ද රජුගේ පාලන සමයේ දී ය. | හ්‍යුං-ත්සාං ඉන්දියාවට පැමිණියේ ස්කන්දගුප්ත රජුගේ පාලන සමයේ දී ය. (..................) |
| 15. අශ්වඝෝෂ වාසය කළේ ක්‍රි.ව. හතර වන සියවසේ දී ය. | ඔහු විසින් මහා භාරතය හා ස්වප්නවාසවදත්තා රචනා කරන ලදි. (..................) |

ඇගයීම - 02



1. **පහත දී ඇති කවර හෝ මාතෘකා දෙකක් පිළිබඳ ව ඓතිහාසික සටහන් ලියන්න.**
   1. ආදි ම ආර්යයන් සම්බන්ධයෙන් හැදෑරීමේ දී ඍග්වේදය වැදගත් වන අයුරු
   2. මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා
   3. සමුද්‍රගුප්ත අධිරාජයාගේ අලහබාද් ප්‍රශස්තිය (ප්‍රයාග)
   4. හ්‍යුං - ත්සාං වාර්තාව (ලකුණු 7 x 2 = 14)

2. දකුණු ඉන්දීය රාජ්‍ය පිළිබඳ අධ්‍යයනයේ දී සංගම් සාහිත්‍යය ලබාදෙන දායකත්වය පරීක්ෂා කරන්න (ලකුණු. 14)

3. ''පැරණි ඉන්දියා ඉතිහාසය ගොඩනගා ගැනීමේ දී ප්‍රමුඛත්වය ලැබෙනුයේ පුරාවිද්‍යා මූලාශ්‍රයවලටය''
   i. හරප්පා ශිෂ්ටාචාරයෙන් හමු වූ ධාන්‍යාගාරය කුමන නගරයට අයත් දැයි නම් කරන්න. (ලකුණු. 1)

   ii. හරප්පා ශිෂ්ටාචාරයේ පැවති ආගමික තත්ත්වය හෙළි වන කලා නිර්මාණ 2 ක් නම් කරන්න. (ලකුණු 2)

   iii. නාණක මූලාශ්‍රයවල ඓතිහාසික වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

   iv. ඉන්දීය ඉතිහාසය හැදෑරීමට ඉවහල් වන ඓතිහාසික මූලාශ්‍රය ඇසුරින් ඉහත ප්‍රකාශය විමසන්න. (ලකුණු 7)

4. සමකාලීන ඓතිහාසික තොරතුරු අධ්‍යයනයේ දී අශෝක රජුගේ සෙල්ලිපිවල ඇති වැදගත්කම ප්‍රමාණ කරන්න. (ලකුණු 14)

5. ඉන්දීය ඉතිහාසය ගොඩනගා ගැනීමේ දී විදේශීය මූලාශ්‍රවයලින් ලැබෙන දායකත්වය ප්‍රමාණ කරන්න. (ලකුණු 14)

## 2. භූගෝලීය පිහිටීම, භෞතික සාධක හා මානව හැසිරීම

ඕනෑම රටක ඉතිහාසය හැදෑරීමේ දී එම රටේ පිහිටීම මෙන් ම භූගෝලීය පරිස්ථිතිය හා භෞතික සාධක ඉතා වැදගත් තැනක් ගනියි. ඉන්දියාව ආසියා මහාද්වීපයට අයත් විශාල අර්ධද්වීපයක් ලෙස දේශ සීමාවලින් වෙන් වූ රටකි. ඇෆ්ගනිස්ථානයේ සිට ඇසෑමය තෙක් විහිදී ඇති කි.මී. 2560ක් පමණ වූ හිමාලය කඳු වැටිය ආසියා මහාද්වීපයෙන් ඉන්දියාව පැහැදිලි ව ම වෙන් කරයි.

දකුණින්, නැගෙනහිරින් හා බටහිර දෙසින් ඉන්දියන් සාගරයෙන් වට වී ඇති ඉන්දියාව වයඹ දෙසින් හින්දුකුෂ් කඳු පෙළින් ද, සුලයිමාන් හා කිර්තාර් කඳුවැටිවලින් ද, ආරක්ෂා වී ඇත. හිමාලයේ නැගෙනහිර කෙළවරින් දකුණට විහිදෙන ඇරකොන්යොමා සහ නාගාලන්ත වැනි කඳුවැටිවලින් බුරුමයෙන් (මියන්මාරයෙන්) වෙන් වේ.

ඉන්දියාව උතුරේ සිට දකුණට කි.මී. 3200ක් පමණ වන අතර නැගෙනහිර සිට බටහිරට කි.මී. 4000 පමණ වේ. මේ අනුව ඉන්දියාව (වර්ග සැතපුම් 1800000) පමණ භූමි ප්‍රදේශයක පැතිර තිබේ. කඳුවලින් වට වූ දේශ සීමාව කි.මී. 9000වන අතර සාගරයෙන් වට වූ දේශ සීමාව කි.මී. 8000ක් පමණ වේ. මෙසේ අතිවිශාල භූගෝලීය කලාපයක පැතිර තිබෙන ඉන්දියාව භූගෝලීය විවිධත්වයකින් යුතුවේ. ඉන්දියාවේ භූගෝලීය විවිධත්වය හා එම භූගෝලීය සාධක ඉන්දීය ඉතිහාසය හැඩගැසීමට බලපෑ ආකාරය මෙම පාඩම් ඒකකයෙන් සාකච්ඡා කරනු ලැබේ.

**නිපුණතාව :** • රටක ඉතිහාසය ගොඩනැගීමේ දී භූගෝලීය හා භෞතික සාධක බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි

**නිපුණතා මට්ටම :** 2.1 භූගෝලීය පිහිටීම ඉන්දියා ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය විමර්ශනය කරයි

**ඉගෙනුම් ඵල :**
- ඉන්දියාවේ බාහිර හා අභ්‍යන්තර පිහිටීම විස්තර කරයි
- ඉන්දියාවේ පිහිටීම දේශීය මානව සබඳතා කෙරෙහි කළ බලපෑම පෙන්වා දෙයි
- විවිධ භූගෝලීය විෂමතා පැවතිය ද පැරණි ඉන්දියාව එක ම සංස්කෘතික ප්‍රවාහයක පැවති ආකාරය පැහැදිලි කරයි
- ඉන්දියාවේ පිහිටීම සිතියමක ලකුණු කරයි

**කාලච්ඡේද :** 15

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**ඉන්දියාවේ බාහිර පිහිටීම**
- මධ්‍ය ආසියාවෙන් වෙන් ව පිහිටීම
  - අක්ෂාංශගත හා දේශාංශගත පිහිටීම
  - උපමහාද්වීපයක් ලෙස පිහිටීම


**ඉන්දියාවේ අභ්‍යන්තර පිහිටීම**
- කඳුවැටි
  - හිමාලය, හින්දුකුෂ්, කාර්කොරම්, සුලයිමාන්, කිර්තාර්, අරවල්ලි, වින්ධ්‍යා, සත්පුර, නිල්ගිරි, නැගෙනහිර ඝාට්ස්, බටහිර ඝාට්ස් ආදි කඳුවැටි

- දුර්ග මාර්ග
  - ඛයිබර්, බෝලාන්, මක්‍රාන්, හේරාත්, බැරෝඩා, පල්ගාට් ආදි දුර්ග මාර්ග

- කාන්තාර හා සානු - ඩෙකාන් සානුව, ථාර්කාන්තාරය, රාජ්පුටානා

- ගංගා
  - සින්දු, නර්මදා, තප්ති, බ්‍රහ්මපුත්‍ර නදිය, යමුනා නදිය, ගංගා නම් ගඟ, මහානදිය, ගෝධාවරී නදිය, ක්‍රිෂ්ණ නදිය, තුංගභද්‍ර නදිය, කාවේරි නදිය ආදි ගංගා

- වරාය
  - භාරුකච්ච/බ්‍රෝච්/භෘගුකච්ඡ
  - සුප්පාරක(සොපාරා)
  - තාම්‍රලිප්ති
  - ලෝතාල්



**ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණ ඉතිහාසය කෙරෙහි ඇති කළ බලපෑම**

- **කඳුවැටි**

  **හිමාලය කඳුවැටිය**

  – හිමාලය කඳුවැටිය ඉන්දියාව හුදෙකලා කිරීමට සමත් වූයේ යැයි මුල් කාලීන අදහසක් විය. එහෙත් එය ඉන්දියාව ආරක්ෂා කිරීමට හේතු වූවා මෙන් ම කිසිඳු විටෙක ඉන්දියානුවන්ට බාධකයක් නොවී ය. උදාහරණ ඃ

  * කුෂාණ පාලකයෝ හිමාලය පසු කර චීන දේශ සීමාව දක්වා ම පාලනය කළහ.
  * ඉන්දීය බෞද්ධ සංස්කෘතිය හිමාල යෙන් එපිට සේද මාවත පුරා පැතිර ගිය අතර චීනයට බුදු දහම ව්‍යාප්ත වීමට හේතු විය.
  * වර්තමානයේ හමු වී ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව බෞද්ධ සංස්කෘතිය මොංගෝලියාව තෙක් ම තදින් ව්‍යාප්ත වී තිබූ බවට කහවුරු වේ.
  * හූණ ආක්‍රමණිකයන්ට ඉන්දීය පාලකයන් ඉතා හොඳින් මුහුණ දුන් අතර ගුප්ත අධිරාජ්‍යය පිරිහෙන අවස්ථාවේ දී පහර දුන් බැවින් ඇතැම් ප්‍රදේශ යටත් වීම
  * ඉන්දියාවේ ආරක්ෂකයා වූ හිමාලය කඳුවැටිය ඉන්දියාවේ ඉතිහාසය ගොඩනැගීමේ දී අතිශය වැදගත් වීම. අඩි 20,000කට වඩා උස් වූ ශිඛර 114කින් පමණ සමන්විත වේ. උස ම ශිඛරය අඩි 29,140ක් උස් වූ එවරස්ට් හෙවත් ගෞරි ශංකර් ය.
  * ඉන්දියාව, ආසියා මහද්වීපයේ සෙසු රටවලින් වෙන් කරන්නේ හිමාලය කඳුවැටියයි. ආසියානු මහද්වීපයේ සිට ගොඩබිම් මාර්ගයකින් ඉන්දියාවට සංක්‍රමණය වීමේ දී හෝ ආක්‍රමණයක් මෙහෙයවීමේ දී ප්‍රධානත ම බාධාව වූයේ හිමාලය කඳුවැටිය යි.
  * එහෙත් හිමාලය ඔස්සේ වැටී ඇති මාර්ගවලින් වෙළෙඳුන්, සංචාරකයන් හා ධර්ම ප්‍රචාරකයන් ඉන්දියාවෙන් විදේශවලටත්, චීනය, මධ්‍ය ආසියාව හා මොංගෝලියාව වැනි ප්‍රදේශවලින් ඉන්දියාවටත් සුළු වශයෙන් ආ ගිය බවට තොරතුරු ලැබේ.
  * උතුරු දෙසින් ඉන්දියාවට මහා ආරක්ෂාවක් සපයමින් ආසියාවෙන් වෙන් කිරීමට සමත් වූ හිමාලය පර්වතය නිසා ම පැරණි ඉන්දියානුවන් තමාට මත් ආවේණික සංස්කෘතියක් ගොඩනැගීමට හැකි විය.
  * හිමාලය කඳු විදේශීය ආක්‍රමණිකයන්ට මහා බාධකයක් වූවා පමණක් නො ව ටිබෙටය හරහා හමා එන වියළි වුවත් දැඩි සීත සුළඟින් ඉන්දියාවට ආරක්ෂා වීමට එය පවුරක් විය. එමෙන් ම ධාරාණිපාත මෝසම් වර්ෂාව සෑහෙන දුරකට සීමා කොට ඉන්දු ගංගා තැනිතලාවන්හි පසෙහි සරුසාරත්වය රැකගෙන ඒවා මුළු ඉන්දියාවේම සශ්‍රීක ප්‍රදේශ බවට පත් කිරීමට ද එමගින් සැලැසුණු සේවය අති විශාල ය.

**හින්දු කුෂ් කඳුවැටිය**

- ජන සංක්‍රමණවලින් මෙන් ම විදේශීය ආක්‍රමණවලින් ද ඉන්දියානු ඉතිහාසය ප්‍රබල වෙනස්කම්වලට භාජනය වීමේ දී වයඹ දිගින් ඇති හින්දුකුෂ් කඳු පෙළේ වැදගත්කම
- ඉන්දියාවේ වයඹදිග ආරක්ෂකයා හින්දුකුෂ් කඳු පෙළ යි. සුලයිමාන් හා කිර්තාර් යන නම්වලින් හැඳින්වෙන කඳු වැටි ද මෙම හින්දුකුෂ් කඳු පෙළටම අයත් සේ සැලකෙ යි.
- මෙම කඳු පෙල නිසා, පැරණි ඉන්දියාව පර්සියාව හෙවත් ඉරානයෙන් වෙන් විය. මෙම කඳු පෙළ ඉන්දියාවට ආරක්ෂාව සැපයූ මහා ආරක්ෂකයකු වුවත්, මෙම කඳු පෙළේ තැන තැන පහත් දුර්ග පිහිටා තිබිණි. ඛයිබර් හා බෝලාන් දුර්ග ඒ අතරින් වඩා වැදගත් වේ. මෙම දුර්ග හරහා ඉන්දියාවට ආක්‍රමණ හා සංක්‍රමණ රැසක් සිදු වූ අතර ඒවා ඉන්දියානු දේශපාලන, සමාජ හා සංස්කෘතික ක්ෂේත්‍රයට බෙහෙවින් බලපෑම් කළේය.
- එසේම මෙම කඳු පෙළේ උතුරෙන් පටන්ගෙන ඇද හැලෙන ස්වාත්, චිත්‍රාල්, ගුමාල්, කාබුල්, තෝචි, කුරාම් ආදි නදි නිම්න ද, ඉන්දියාවට පිවිසීමේ මාර්ග ලෙස ප්‍රයෝජනයට ගැනිණි.

**වින්ධ්‍යා හා සත්පුර කඳු**

- වින්ධ්‍යා කඳු වැටිය කතියවාරේ සිට ඊසාන දිගට විහිදෙමින් සැතපුම් දහස් ගණනක් පැතිර තිබෙන සුවිශාල කඳුවැටියකි. සත්පුර කඳු වැටිය නර්මදා නදියට දකුණින් පිහිටා ඇත. උතුරු ඉන්දියාවත්, දකුණු ඉන්දියාවත්, වෙන් කරන ප්‍රධානතම භූගෝලීය පිහිටීම වින්ධ්‍යා කඳු වැටිය යි.
- වින්ධ්‍යා කඳු වැටියෙන් උතුරු ඉන්දියාව හා ඩෙකානය වෙන් කිරීම නිසා මෙම ප්‍රදේශ දෙක අතර සබඳතා හා ගැටුම්, සැලකිය යුතු මට්ටමකින් අඩු විය. එමෙන් ම උතුරේ සිට පැමිණි ආක්‍රමණිකයන්ට දකුණු ඉන්දියාවට පිවිසීමේ ප්‍රධානතම බාධකය වූයේ වින්ධ්‍යා කඳු වැටිය යි.
- එහෙත් මෙම කඳු පෙළේ බටහිරත්, කැම්බේ බොක්කත් අතර සරුසාර තැනිතලාවක් පිහිටා ඇත. එය බැරෝඩා කපොල්ල යි. සාතවාහන, බටහිර චාලුක්‍ය සහ හර්ෂවර්ධන වැනි පාලකයන් මෙම තැනිතලාවේ සටන් මෙහෙයවා ඇත.

**අරවල්ලී කඳුවැටිය**

- තාර් කාන්තාරය සීමා වූයේ මෙම කඳු වැටිය නිසාවෙනි. එමෙන් ම මෙම කඳු වැටිය, වයඹ දිගින් පැමිණි ආක්‍රමණිකයන්ට උතුරු ඉන්දියාවට පිවිසීමේ දී විශාල බාධකයක් ද විය.

**නැගෙනහිර සාට්ස් හා බටහිර සාට්ස් කඳුවැටි**

- දකුණු ඉන්දියාවේ පිහිටි සාට්ස් කඳු වැටි ද වැදගත් භූගෝලීය පිහිටීම් ය. නැගෙනහිර සාට්ස් හා බටහිර සාට්ස් කඳුවැටි දෙක අතර පිහිටි තැනිතලා භූමිය ඩෙකාන් සානුව නමින් හඳුන්වයි.
- බටහිර සාට්ස් කඳුවැටිය අතිශය උස් කඳුවැටියකි. මෙය මුහුදට දැඩි ලෙස සමීප ව පිහිටා තිබීම නිසා සැතපුම් දහස් ගණනක් යන තෙක් ම මිනිස් වාසයක් බිහි වීමට ප්‍රමාණවත් ඉඩක් නොවීය.
- බටහිර සාට්ස් කඳු වැටිය බටහිර වෙරළට සමාන්තරව දළ බෑවුමකින් යුතු ව නිම්න, කඩතොලු, කපොළු, තැනිතලා සීමිත වෙමින් කඳු වැටි පිහිටීම නිසා ගංගා බිහි වීමට බාධාවක් විය. මේ නිසා ම නර්මදා හා තප්ති නදී දෙක හැරුණු විට ඉන්දියාවේ බටහිර වෙරළට කිසිඳු ගංගාවක් ගලා නොබසී.
- නැගෙනහිර සාට්ස් කඳුවැටිය ඊට හාත්පසින් ම වෙනස් වීම
- මෙම කඳු වැටිය හා වෙරළ අතර විශාල පරතරයක් තිබීම, ගංගා කීපයක් ගලා යාම ආදි හේතු සාධක නිසා මෙම ප්‍රදේශයේ රාජවංශ ගණනාවකට සිය බලය ගොඩනඟාගැනීමට උපකාරී විය.

- **දුර්ග මාර්ග**

- හින්දුකුෂ්, සුලයිමාන්, කිර්තාර් ආදි කඳු වැටිවලින් වයඹදිග ඉන්දියාව ආරක්ෂා වුව ද, එම කඳු වැටි අතර පිහිටි ස්වාභාවික කපොලු නිසා ආක්‍රමණික හා සංක්‍රමණික පිරිස්වලට ඉන්දියාවට පිවිසීමේ අවස්ථාව හිමි විය.

**වයඹ දිග දුර්ග මාර්ග**

| | | |
|---|---|---|
| * බයිබර් දුර්ගය | - | කාබුල් නදී නිම්නයේ සිට පෙෂාවෝර් දක්වා පිහිටා ඇත |
| * බෝලාන් දුර්ගය | - | සුලයිමාන් කඳුවලට බටහිරින් පිහිටා ඇත |
| * මක්‍රාන් දුර්ගය | - | කිර්තාර් කඳු හා අරාබි මුහුද අතර පිහිටා ඇත |
| * හේරත් දුර්ග මාර්ගය | - | ඇෆ්ගන් කඳු ආශ්‍රිත ප්‍රදේශයේ පිහිටා ඇත |

- මීට අමතර ව වයඹදිග පිහිටි කුඩා දුර්ග මාර්ග කිහිපයක් ඇති අතර ඉතා කුඩා වෙළෙඳ කණ්ඩායම් පමණක් මෙම දුර්ග ප්‍රයෝජනයට ගෙන ඇත.

බෝලාන් දුර්ගය




ඛයිබර් දුර්ගය



මක්‍රාන් දුර්ගය



- ඉහත දුර්ග මාර්ග අතරින් හින්දුකුෂ් හා කෙහිබබා කඳු වැටි අතර පිහිටි ඛයිබර් දුර්ගය ඉන්දියාවේ දොරටුව ලෙස හඳුන්වන අතර අතීතයේ සිට ම බොහෝ ආක්‍රමණික හා සංක්‍රමණික පිරිස් ප්‍රයෝජනයට ගනු ලැබුවේ මෙම දුර්ගය යි. මේ සඳහා බලපෑ ප්‍රධානතම කරුණ වූයේ, ඛයිබර් දුර්ගය තරණය කර ඉන්දියාවට පැමිණෙන්නන්ට සරුසාර පංජාබ් ප්‍රදේශයට එක වර ම පැමිණිය හැකි වීම යි.
  උදහරණ:- මුල් සංක්‍රමණිකයන් ආර්යයෝ, ඇලෙක්සැන්ඩර්, බැක්ට්‍රියන් ග්‍රීක, කුෂාණ, හූණ, තුර්කී හා මෝගල් පිරිස්
- ඛයිබර් දුර්ගයට කි.මී. 800ක් ඈතින් පිහිටි බෝලාන් දුර්ගය වයඹදිග ඉන්දියාවේ තවත් දුර්ග මාර්ගයකි. පර්සියාවේ හෙල්මැන්ඩ් ගංගාධාරය වෙත පැමිණි ආක්‍රමණික හා සාංක්‍රමණික කණ්ඩායම්වලට ඉන්දියාවට ඇතුළු වීමට තිබූ ළඟ ම දුර්ගය මෙය යි.
- මෙම දුර්ගය තරණය කිරීම පහසු කටයුත්තක් නොවූ නිසා ම, ආක්‍රමණික හා සාංක්‍රමණික පිරිස් ප්‍රයෝජනයට ගෙන ඇත්තේ ඉතා ම කලාතුරකිනි.
  උදාහරණ:- ශකවරුන් ඉන්දියාවට පැමිණියේ මෙම දුර්ගයෙනි.
- විවිධ දුක් ගැහැට විඳිමින් මෙම දුර්ගය ඔස්සේ ඉන්දියාවට පැමිණි පිරිස්වලට එකවරම හමුවූයේ කටුක දේශගුණයකින් යුත් සින්ද් ප්‍රදේශය හා රාජ්පුටානා කාන්තාරය යි. දැඩි උෂ්ණත්වය, අහිතකර දේශගුණය ආදි හේතූන් නිසා මෙම ප්‍රදේශය පදිංචියට නුසුදුසු විය.
- බෝලාන් දුර්ගයට කි.මී. 480ක් පමණ දුරින් මක්‍රාන් දුර්ගය පිහිටා ඇත. අතිශය දුෂ්කර මාර්ගයක් වූ මෙය මක්‍රාන් වෙරළ ඔස්සේ විහි දී යයි. මෙම දුර්ගය ඔස්සේ පැමිණි පිරිස්වලින් විශාල සංඛ්‍යාවක් මියගොස් ඇත. ඉන්දියාව ආක්‍රමණය කළ ඇලෙක්සැන්ඩර් අධිරාජයා ආපසු ගොස් ඇත්තේ මෙම දුර්ගයෙන් බවත් එහි දී ඔහුගේ සේනාවෙන් විශාල පිරිසක් මියගිය බවත් කියවේ.
- මෙම දුර්ගය ඔස්සේ ඉන්දියාව ආක්‍රමණය කොට සාර්ථක ප්‍රතිඵල ලබාගත්තේ ක්‍රි.ව. 8 වන සියවසේ ඉන්දියාවට පැමිණි මොහොමඩ් බින් කාසිම් පමණි.

**දුර්ග මාර්ග ඉන්දීය ඉතිහාසයට බලපෑම් කළ ආකාරය**

- දුර්ග මාර්ග ඔස්සේ ඉන්දියාවට පැමිණි විජාතික පිරිස් ඉන්දියාව තුළ දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමත් සමඟ ඉන්දීය රාජවංශවල බලය දුර්වල කිරීමට සමත් වීම
- එමෙන් ම ඔවුන්ගේ පාලන ක්‍රම හා පරිපාලන ව්‍යුහයන් ඉන්දියාව තුළ මුල් බැස ගැනීම
- ඉහත විජාතික පිරිස් ඉන්දියාවට පැමිණ බලය ව්‍යාප්ත කිරීමත් සමඟ ඔවුන්ගේ සංස්කෘතිකාංග ඉන්දීය ජන සමාජයට එකතු වීම
- මධ්‍ය ආසියාවේ සිට පැමිණි මුල් සාංක්‍රමණිකයන් (ආර්යයන්) නිසා යාග හෝම, දේව වන්දනය, ගිනි ජල, වෘක්ෂ වන්දනය ආදිය ඇති වීම. එමෙන් ම ඉන්දියාවට පැමිණි මුල් සාංක්‍රමණිකයන් (ආර්යයන්) පැමිණීමෙන් පසු එවක ඉන්දියාවේ පැවති සමාජ ක්‍රමය මුළුමනින් ම වෙනස් වීමට ලක් වීම
උදාහරණ: ගෝත්‍රික දේශපාලනය, වර්ණ ක්‍රමය, රාජත්වයේ වර්ධනය ආදිය
- මීට අමතර ව පිතෘ මූලික සමාජ ක්‍රමයක් ඉස්මතු වීම සිදු වූයේ ඉන්දියාවට පැමිණි මුල් ජන සංක්‍රමණවලිනි.
- ග්‍රීක, චීන, උර්දු, පර්සියන් හා රෝම වැනි භාෂා ඉන්දියාව තුළ ව්‍යවහාරයට පත් වීම හා ගෘහනිර්මාණ, මූර්ති ශිල්පය, චිත්‍ර කලාව, වෛද්‍ය හා ජ්‍යෝතිෂය වැනි සංස්කෘතිකාංග ඉන්දියා සමාජයට එකතු වීම

  උදාහරණ: ගන්ධාර කලා සම්ප්‍රදායය
  අමරාවතී කලා සම්ප්‍රදායය

- ඉන්දියාවට පැමිණි විදේශීය ජන කණ්ඩායමක් වූ කුෂාණයන් ඉන්දීය සංස්කෘතිය පෝෂණය කිරීමෙහි ලා විශාල දායකත්වයක් ලබා දීම

  උදාහරණ: සිවුවන ධර්ම සංගායනාව පැවැත්වීම, සංස්කෘත භාෂාව හා සාහිත්‍යය දියුණු වීම, ගන්ධාර සහ මථුරා අමරාවතී කලා සම්ප්‍රදායන් වර්ධනය වීම, බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීම
- චීනය, මධ්‍ය ආසියාව, පර්සියාව, ග්‍රීසිය, අරාබිය වැනි පෙර අපර දෙදිග රටවල් සමඟ වෙළෙඳ සබඳතා පවත්වාගෙන යෑම මගින් වාණිජ රටාවේ ප්‍රබල වර්ධනයක් සිදු වීම
- මුස්ලිම්වරුන් ඉන්දියාව ආක්‍රමණය කොට සියවස් කිහිපයක් බලය පිහිටුවීම නිසා ඉස්ලාම් ආගමික චින්තනය හා ඔවුන්ගේ බොහෝ සංස්කෘතිකාංග ඉන්දීය ජන සමාජයට එකතු වීම

**කාන්තාර හා සානු**

**ථාර් කාන්තාරය**

- ථාර් කාන්තාරය වයඹදිග ඉන්දීය කලාපයේ පිහිටි තවත් සුවිශේෂ භූමි භාගයකි. රාජ්පුටානා කාන්තාරය ලෙසින් ද හැඳින්වේ. කච්හිරානය නම් ප්‍රදේශයෙන් පටන්ගෙන ඊසාන දිගින් පැතිර යන මෙම කාන්තාරයේ දිග කි.මී. 640කි. එහි පළල කි.මී. 240ක් වේ.
- මෙම කාන්තාරයේ පිහිටීම ඉන්දියාවට වාසි සහ අවාසි ගෙනදුන් බව හඳුනාගත හැකි ය.
- වයඹදිග දුර්ග මාර්ගවලින් පැමිණි ආක්‍රමණික හා සංක්‍රමණික පිරිස්වලට උතුරු ඉන්දියාවට පිවිසීමේ දී ථාර් කාන්තාරය හා ආරවල්ලී කඳුවැටිය විශාල බාධාවක් විය.
- මෙහි පිහිටීම නිසා උතුරු ඉන්දියාව හා වයඹ දිග ඉන්දියාව ලෙස උක්කරාපථය කොටස් දෙකකට බෙදුණු අතර, මෙය නිසා ම උතුරු ඉන්දීය පාලකයන්ට වයඹදිග ප්‍රදේශය තම අණසකට ගැනීමට විශාල වෙහෙසක් දැරීමට සිදු විය.

## ඩකාන් සානුව



- බටහිර ඝාට්ස් කඳු වැටියත්, නැගෙනහිර ඝාට්ස් කඳු වැටියත් අතර පිහිටි ප්‍රදේශය ඩෙකාන් සානුව නමින් හඳුන්වයි. මෙය ඉතා විශාල බිම් පෙදෙසක් වුවත්, එහි අඩකට වැඩි ප්‍රමාණයක් නිසරු ශුෂ්ක භූමියෙන් සහ කුඩා කුඩා කඳුවැටිවලින් සමන්විත ය.
- මෙය නැඟෙනහිර ඩෙකානය හා බටහිර ඩෙකානය ලෙස කොටස් දෙකක් යටතේ හැඳින්වේ.
- බටහිර ඩෙකානය තුළ රාෂ්ට්‍රකූට, චාලුක්‍ය, සාතවාහන වැනි රාජවංශ වරින් වර බලය පිහිටුවා ගන්නා ආකාරය දක්නට ලැබේ.
- නැඟෙනහිර ඩෙකානයේ තත්ත්වය මීට හාත්පසින් ම වෙනස් ය. මහානදී, ගෝදාවරී නදී, ක්‍රිෂ්ණ තුංගභද්‍ර නදී, කාවේරි නදී වැනි දකුණේ සියලුම ගංගා නැගෙනහිර තැනිතලාවේ විශාල පෙදෙසක් සරුසාර කරමින් මුහුදට ගලා බසියි. මේ නිසාම මෙම ප්‍රදේශය තුළ චාලුක්‍ය, රාෂ්ටකූට, චෝළ, පල්ලව වැනි රාජවංස ගණනාවක් ම බලය පිහිටුවා ගන්නා ආකාරය ඉතිහාසයෙන් පැහැදිලි වේ.
- ඩෙකාන් සානුව තුළ පිහිටි වියලි, නිසරු ප්‍රදේශ, නිසරු කඳු බෑවුම් හා ගංගා නිසා ඇති වූ බෙදීම් නිසා එම ප්‍රදේශය තුළ ඒකීය දේශපාලන ආධිපත්‍යයක් බිහි නොවුණි. ඒ වෙනුවට ඉතිහාසයේ සෑම අවස්ථාවක ම කුඩා කුඩා රාජවංශ මෙම ප්‍රදේශය තුළ බලය පිහිටුවා ගන්නා ආකාරය හඳුනාගත හැකි ය.



තුංගභද්‍ර නදී


## ගංගා පද්ධතිය



සින්දු නදිය

- ඉන්දියාවේ පිහිටි ගංගා පද්ධතිය, ඉන්දීය ඉතිහාසය ගොඩනැඟීමේ දී අතිශය වැදගත් සාධකයක් වේ.
- වයඹදිග ඉන්දියාවේ පිහිටි ප්‍රධානතම ගංගාව සින්දු නදිය යි. සින්දු නදිය කේන්ද්‍ර කරගෙන පිහිටි පංජාබ් තැනිතලාව වයඹ දිග ඉන්දියාවේ පිහිටි සුවිශේෂ ම කලාපය යි. ලොව බිහි වූ දියුණුත ම ශිෂ්ටාචාරයක් වන හරප්පා ශිෂ්ටාචාරය සින්දු නදිය කේන්ද්‍ර කරගෙන බිහි වුණි.
- ක්‍රි.පූ. 1500න් පමණ පසු ව ඉන්දියාවට පැමිණි මුල් සංක්‍රමණිකයින් ද (මුලින් ආර්යයන් ලෙස හැඳින්වූ) ජනාවාස ගොඩනගා ගත්තේ මෙම තැනිතලාවේ දී ය.
- කුෂාණවරුන් ඉන්දියාවට පැමිණ සිය පාලනය මෙහෙයවූයේ මෙම ප්‍රදේශයේ ය. එම රාජවංසයේ සිටි කණිෂ්ක රජු සිය අගනගරය බවට පත් කරගත්තේ පුරුෂපුරය යි. (පෙෂවෝර්)
- උතුරු ඉන්දියාවේ පිහිටි ගංගා සහ යමුනා ඉන්දීය නදී ඉතිහාසය වෙනස් කිරීමට බලපෑ ප්‍රධාන ගංගා දෙකකි.
- මෙම ගංගා දෙක සහ ඒවායේ ශාඛාවන්ගෙන් පෝෂණය වන තැනිතලාව ගංගා යමුනා තැනිතලාවයි. (හින්දුස්ථාන් තැනිතලාව) මෙම තැනිතලාව නැගෙනහිර සිට බටහිරට කි.මී. 3200 ක් විහිදේ.
- මෙම තැනිතලාව ඉතා වටිනා, සරුසාර භූගෝලීය ඒකකයක් වූ නිසා ම මෙම කලාපය කේන්ද්‍ර කරගෙන සුවිශාල රාජ්‍ය හා අධිරාජ්‍ය බිහිවීම.
  උදාහරණ: මහා ජනපද, මගධ අධිරාජ්‍යය, මෞර්ය අධිරාජ්‍යය, ගුප්ත අධිරාජ්‍යය, හර්ෂවර්ධන රජුගේ රාජ්‍යය
- ආර්ථික වශයෙන් ද මෙම ප්‍රදේශයේ වැදගත්කම අසීමිත ය. ගංගා, යමුනා නදීන්ගේ ශාඛා - ප්‍රශාඛාවන් පිටාර ගැලීමෙන් ඇති වූ සරුසාර කෘෂිකාර්මික ප්‍රදේශ, විශාල නැව්වලට වුවත් ගමන් කළ හැකි ගංගා ආශ්‍රිත ව බිහිවූ වෙළෙඳ තොටුපළවල්, මහා වනාන්තරවලින් ලැබෙන දැව හා ඛනිජ සම්පත් වැනි සාධක නිසා ඉන්දියානු ඉතිහාසයේ සැම යුගයක ම ගංගා යමුනා තැනිතලාව සෞභාග්‍යවත් තත්ත්වයක පැවතිණි. ලුණු නිධි සහ යකඩ නිධි පිහිටා තිබීම මෙන් ම ලොව වැඩි ම වර්ෂාපතනයක් ලැබෙන ප්‍රදේශයක් ලෙසද වැදගත් විය.
- පංජාබ් තැනිතලාවේ සිට ගංගා-යමුනා තැනිතලාවට පිවිසීමේ දොරටුවක් ලෙස පැවැති, දිල්ලි තැනිතලාව ද, ඉන්දීය ඉතිහාසයේ අතිශය වැදගත් වී ඇත.

- ඉන්දීය ඉතිහාසයේ තීරණාත්මක පනිපත් වැනි සටන් සිදු වූයේ දිල්ලි තැනිතලාවේ දී ය. මෙම තැනිතලාවේ වැදගත්කම නිසා ම තුර්කි ආක්‍රමණිකයෝ දිල්ලිය අල්ලාගෙන එය අගනුවර කරගෙන දිල්ලි සුල්තාන් රාජ්‍යය පිහිට වූහ.
- ක්‍රිෂ්ණා - තුංගභද්‍රා ගඟබඩ පිහිටි රායිචූර් දෙගම්මැදිය ඉන්දීය ඉතිහාසයේ තීරණාත්මක සටන් ඇති වූ ස්ථානයකි. බටහිර චාලුක්‍යයන් හා චෝළයන් අතර ඇති වූ කොප්පම්, කූදල්, සංගම් වැනි තීරණාත්මක සටන් මෙම දෙගම්මැදි භූමියේ දී සිදු විය.
- ඩෙකානයේ මුස්ලිම් රාජ්‍යයේ ද දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය, විජයනගර් වැනි රාජ්‍යවල ද ඉතිහාසය රායිචූර් දෙගම්මැදියේ ඉතිහාසය හා බැඳී පවතී.



රායිචූර් ද්වාබය

**වරාය පද්ධතිය**

- ඉන්දියාවේ පිහිටි වරාය ඉන්දීය දේශපාලන වෙනස්වීම්වලට බෙහෙවින් බලපා ඇත. භාරුකච්ඡ, සුප්පාරක, කල්‍යාණි, තාම්‍රලිප්ති, කාවේරි පට්ටන, විශාකපට්ටන වැනි වරායවල් දේශපාලන, ආර්ථික හා සංස්කෘතික වශයෙන් ද වැදගත් විය. විශේෂයෙන් ජාත්‍යන්තර සබඳතා පැවැත්වීමේ දී මෙම වරායවල් බෙහෙවින් ඉවහල් විය.

**ඉන්දියාවේ විශාලත්වය හා විවිධත්වය**

- ඉන්දියාව තුළ දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික වශයෙන් විවිධත්වයක් දැකිය හැකි වීම
  උදාහරණ - භූගෝලීය, විවධ ආගමික, විවිධ සංස්කෘති, විවිධ භාෂා, විවිධ ජන වර්ග

- විවිධත්වය තුළින් ඒකීයභාවය ගොඩනඟා ගැනීම
  * ඉන්දියානුකරණය

ඇගයීම - 01

**අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් ඒවා සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න.**

01. 1. කාවේරි 2. ක්‍රිෂ්ණා 3. රාවි 4. නර්මදා 5. තුංගභද්‍රා (................)
02. 1. සුප්පාරක 2. චම්පා 3. කෞශම්බි 4. වාරාණසී 5. මථුරා (................)
03. 1. බෝලාන් 2. ඛයිබර් 3. මක්‍රාන් 4. බැරෝඩා 5. කාරකෝරම් (................)
04. 1. ජේලම් 2. ගුමාල් 3. රාවී 4. චේනාබ් 5. බියස් (................)
05. 1. හින්දුකුෂ් 2. සුලෙයිමාන් 3. ථාර් කාන්තාරය 4. රාජ් මහල් 5. කිර්තාර් (................)
06. 1. වින්ධ්‍යා 2. නිල්ගිරි 3. ධෞලගිරි 4. සත්පුර 5. මහාදේවෝ (................)
07. 1. ජේලම් 2. ගුමාල් 3. රාවී 4. චේනාබ් 5. බියස් (................)
08. 1. හින්දුකුෂ් 2. සුලෙයිමාන් 3. ථාර් කාන්තාරය 4. රාජ් මහල් 5. කිර්තාර් (................)
09. 1. වින්ධ්‍යා 2. නිල්ගිරි 3. ධෞලගිරි 4. සත්පුර 5. මහාදේවෝ (................)

**පහත එක් එක් ප්‍රශ්නයකට දක්වා ඇති ABC හා D අතරින් දක්වා ඇති ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාර හෝ ප්‍රතිචාරය තෝරා, A සහ B පමණක් නිවැරදි නම් 1 ද, B හා C පමණක් නිවැරදි නම් 2 ද, C සහ D පමණක් නිවැරදි නම් 3 ද, A හා C පමණක් නිවැරදි නම් 4 ද ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් 5 ද වරහන් තුළ තෝරා ලියන්න.**

11. ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණවලට අදාළ ව පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
    - A උතුරු කඳුවැටි වැදගත් වන්නේ ප්‍රධාන ගංගා දෙකක මූලය එම කඳු ආශ්‍රිත ව වීම නිසා ය.
    - B ගෝධාවරී නදිය පැහැදිලි ස්වාභාවික දේශ සීමාවකි.
    - C ගංගා - යමුනා තැනිතලාව විශාල අධිරාජ්‍යවල මධ්‍යස්ථානය විය.
    - D මක්‍රාන් දුර්ගය පහසුවෙන් ඉන්දියාවට පිවිසිය හැකි මඟ යි. (................)

12. වයඹදිග කපොලු ඔස්සේ සිදු වූ විදේශ ආක්‍රමණ වළකාලීමට ඉන්දියානුවන්ට නොහැකි වූයේ
    - A වයඹදිග ආරක්ෂාව පිළිබඳ ව ඉන්දියානු පාලකයන් තුළ පැවැති නොසැලකිලිමත් භාවය නිසාය.
    - B වයඹදිග දේශසීමා ප්‍රදේශය එවකට කාන්තාරයක් වූ නිසාය.
    - C ආක්‍රමණිකයන්ට එරෙහි ව විශාල යුද්ධ හමුදාවක් සකස් කිරීමට ඉන්දියානු පාලකයන් අපොහොසත් වීම නිසා ය.
    - D විදේශ ආක්‍රමණිකයන්ට විරුද්ධ ව එක්සත් වීමට ඉන්දියානු පාලකයන් අපොහොසත් වූ නිසාය.

(................)

ඇගයීම - 02

**පහත සඳහන් ආකාරයේ විචාර ප්‍රශ්න ලබාදෙමින් සිසුන් ඇගයීමට ලක් කරන්න.**

01. වයඹදිග ඉන්දියාවේ දුර්ග මාර්ග නියමිත යුගයේ ඉතිහාසය හැදෑරීමට උපකාරී වන ආකාරය පැහැදිලි කරන්න.
02. පැරණි ඉන්දීය ඉතිහාසය හැඩගැසීම කෙරෙහි භූගෝලීය සාධකවල බලපෑම සාකච්ඡා කරන්න.
03. භූගෝලීය විවිධත්වය මඟින් ඉන්දියාව ඒකීය රටක් ලෙස ගොඩනැඟුණ ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න

## 3. ඉන්දු නදිය කේන්ද්‍ර කොට බිහි වූ හරප්පා නාගරික ශිෂ්ටාචාරය

දැනට ලැබී ඇති නවතම පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය අනුව ඉන්දියාවේ පමණක් නොව ලොව පැරණි ම ශිෂ්ටාචාරය හරප්පා ශිෂ්ටාචාරය යැයි සැලකේ. ඉන්දු නිම්නයේ ආරම්භ වූවා යැයි සැලකෙතත් මෙය වර්ග සැතපුම් විසි ලක්ෂයක් පුරා පැතිර ගිය ශිෂ්ටාචාරයක් බව හඳුනාගෙන ඇත. එම නිසා මෙම ශිෂ්ටාචාරය ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ලෙස හැඳින්වීම යෝග්‍ය නොවන නිසා පළමු ව කැණීම් කර හමුවූයේ හරප්පා නගරය බැවින් ඒ නමින් ශිෂ්ටාචාරය හැඳින්වීමට එකඟ වී තිබේ. මෙම ශිෂ්ටාචාරයේ මුල් ම සලකුණු ක්‍රි.පූ 7000 දක්වා දිවෙන අතර ක්‍රි.පූ 1650 +_ දී පමණ බිඳවැටී තිබේ. මෙහි අක්ෂර කියවා ගත නොහැකි බැවින් එය පූර්ව ඓතිහාසික යුගයට අයත් වේ. එසේ ම මෙහි යකඩ නිෂ්පාදනය නොකළ බැවින් ලෝකඩ යුගයට අයත් ය. ලොව විශාලත ම මෙන් ම දියුණුම ශිෂ්ටාචාරය මෙය වේ. මෙහි දියුණු ම අවස්ථාව ක්‍රි.පූ 3000 සිට 1800 දිවෙන බවට සාක්ෂ්‍ය හමුවේ. ආර්යයන් යැයි සඳහන් කළ මුල් සාංක්‍රමණික පිරිස් හා මේ ශිෂ්ටාචාරය අතර කිසිඳු සම්බන්ධයක් නොමැති බව අනාවරණය වී තිබේ.

**නිපුණතාව:** • ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි

**නිපුණතා මට්ටම ඃ** 3.1 ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙහි ආරම්භය, වර්ධනය හා පරිහානිය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි

**කාලච්ඡේද ගණන ඃ** 30

**ඉගෙනුම් ඵල**
- හරප්පා ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු විස්තර කරයි
- හරප්පා ශිෂ්ටාචාරයේ විශිෂ්ටත්වය අගය කරයි
- හරප්පා ශිෂ්ටාචාරය සිතියමක ලකුණු කරයි


**පාඩම සැලසුම සඳහා උපදෙස්**


**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**හරප්පා ශිෂ්ටාචාරය හැඳින්වීම**

- ආර්යයන් ඉන්දියාවට පැමිණීමට පෙර වයඹ දිග ඉන්දියාවේ ඉන්දු නදිය කේන්ද්‍ර කරගත් දියුණු ශිෂ්ටාචාරයක් තිබූ බව
  - ක්‍රි.ව 1826 දී චාල්ස් මාසන් විසින් පළමු වරට මෙහි සලකුණු සොයා ගනු ලැබීය.
- 1853 දී බ්‍රිතාන්‍යයන් විසින් ලාහෝර් සිට කරච්චි තෙක් දුම්රිය මාර්ගයක් තැනීමේ කටයුතු කරන අතර වාරයේ දී මෙම ශිෂ්ටාචාරය පිළිබඳ නටබුන් තව දුරටත් හමු වීම
- බ්‍රිතාන්‍ය ජාතික ඇලෙක්සෙන්ඩර් කනින්හැම් ප්‍රථම වතාවට මෙම ශිෂ්ටාචාරය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම
- 1921 දී දයා රාම් ශානි මහතා විධිමත් පර්යේෂණ මෙහෙයවූ බව
- 1921 දී ඉන්දු නදියේ ශාඛාවක් වූ රාවි නදිය ආශ්‍රිත ව මොන්ට්ගෝමරි දිස්ත්‍රික්කයෙන් හරප්පා නගරය සොයා ගැනීම
- ඒ අනුව හරප්පා ශිෂ්ටාචාරය යනුවෙන් හැඳින්වීම
- 1922 දී ආර්.ඩී. බැනර්ජි මහතා විසින් සින්ද්ලර්කානා දිස්ත්‍රික්කයෙන් මොහෙන්ජොදාරෝ නගරය සොයා ගැනීම
- ඉන් පසු ව මෙය මොහෙන්ජොදාරෝ - හරප්පා ශිෂ්ටාචාරය ලෙස හැඳින්වීම


හරප්පා පුරාවිද්‍යාත්මක ස්ථාන






චාල්ස් මාසන් විසින් අඳින ලද ඉන්දු නිම්නය දැක්වෙන සිතුවමක්






ඇලෙක්සෙන්ඩර් කනින්හැම්

ජෝන් මාෂල්
(1902-1921 තෙක් ඉන්දියාවේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්)

- හරප්පාවට සමාන කුඩා නගර 14ක් ද මොහෙන්ජොදාරෝ සමාන කුඩා නගර 17ක් ද පසු ව සොයා ගැනීම නිසා නාගරික ශිෂ්ටාචාරයක් බව තහවුරු වීම


- රූපාක්ෂර සහිත සෙල්ලිපි කියවා ගත නොහැකි නිසා පුරාවිද්‍යාත්මක නටබුන්වලින් පමණක් මෙම ශිෂ්ටාචාරය පිළිබඳ අධ්‍යයනය කරන්නට සිදු ව තිබීම
  මෙම ශිෂ්ටාචාරය පිළිබඳ පර්යේෂණ පැවැත්වූ පුද්ගලයෝ

| | |
|---|---|
| - දයා රාම් ශානි | - බී.බී. ලාල් |
| - ආර්.ඩී. බැනර්ජි | - එම්.එස් වත්ස් |
| - ඒ. සෝෂ් | - මැකේ |
| - ජෝන් මාෂල් | - සුරප් ධනන් |
| - එම්.කේ. දවාලිකර් | - මෝටිමර් වීලර් |
| - පොෂෙලි | - එස්.ආර් රාවෝ |
| - වසන්ත් සින්දේ | - ෂෙරීන් රත්නගර් |

මෝටිමර් වීලර්



එස්.ආර් රාවෝ මහතා



**ආරම්භය හා ව්‍යාප්තිය**


- ශිෂ්ටාචාරයේ ආරම්භය පිළිබඳ ප්‍රධාන මතවාද දෙකක් පැවතීම
  - දේශීය ජන කණ්ඩායම් විසින් ආරම්භ කරන ලද බව ගිලීන් ඩැනියෙල්, නෙයාර් සර්විස් වැනි උගතුන්ගේ මතය වීම
  - විදේශීය ග්‍රාමීය ශිෂ්ටාචාරයන්හි සිටි ජන කණ්ඩායම් විසින් ආරම්භ කරන ලද බව මෝටිමර් වීලර්, වින්සන්ට් ස්මිත් වැනි අයගේ මතය වීම
- එහෙත් 2016 වසන්ත් සින්දේ මහතා කරන ලද කැණීම්වලට අනුව මේ ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගරය රඛිගාර්හි නගරය බව හඳුනාගෙන ඇත. එය හරප්පා නගරය මෙන් තුන් ගුණයක් විශාල ය. එහි කැණීම් අනුව මේ ශිෂ්ටාචාරය ස්වාධීන ව ඇති වූ එකක් බව අනාවරණය විය.
- මෙසපොතේමියාවේ හා බටහිර ආසියාවේ ග්‍රාමීය ශිෂ්ටාචාරවල ඇතැම් ලක්ෂණ හරප්පා ශිෂ්ටාචාරයේ ද දක්නට ලැබීම පළමු මතය සඳහා හේතු වූ බව
- හරප්පා ශිෂ්ටාචාරයේ දක්නට ලැබෙන අවේණික නිර්මාණ ලක්ෂණ පළමුවන මතයට හේතු වූ බව. හරප්පා ශිෂ්ටාචාරය පැවති ප්‍රදේශවලට බටහිර හා වයඹ දෙසින් පිහිටි කඳුකර ප්‍රදේශවලින් හමු වූ ග්‍රාමීය සංස්කෘති අධ්‍යයනය මඟින් පර්යේෂකයන් පෙන්වා දෙන්නේ එමග්‍රාමීය සංස්කෘතීන් ක්‍රමයෙන් වර්ධනය වී නගර බිහි වූ බවත් එලෙස බිහි වූ නගර මුල් කරගෙනහරප්පා ශිෂ්ටාචාරය බිහිවූ බවත් ය.

**රඛිගාර්හි**



වර්තමාන හරියානා ප්‍රාන්තයේ හිසාර් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මෙම නගරය 1997 සොයාගන්නා ලදි. 2016 මහාචාර්ය වසන්ත් සින්දේ ඇතුළු පුරාවිද්‍යාඥයන් කණ්ඩායමක් සිදු කළ කැණීම්වලින් හරප්පා ශිෂ්ටාචාරයේ ප්‍රධාන අගනගරය මෙය බව සොයා ගනු ලැබී ය. වර්තමාන පකිස්තානයේ මොහෙන්ජොදාරෝ පිහිටා තිබුණ ද රඛිගාර්හි ඉන්දියාවේ පිහිටා ඇත. මෙම නගරය හෙක්ටයාර 350ක ප්‍රමාණයෙන් යුක්ත ය. දිල්ලියේ සිට කි.මී 160 දුරින් පිහිටි මෙය අනෙක් ප්‍රධාන නගර දෙක හා සමාන ව නිර්මාණය කර ඇත. හරප්පා ශිෂ්ටාචාරයේ කාර්මික ජනපදය මෙය බව හමු වී ඇති නිෂ්පාදන භාණ්ඩ අනුව හඳුනාගෙන ඇත. බොහෝ සාධක දියුණු ම හරප්පා යුගයට අයත් ය. වළලු, මුදු, සතත්ව රූප, මිනිස් රූප ඉතා හොඳින් නිර්මාණය කොට ඇත.

රබිගාර්හි ටෙරාකෝටා වළලු



රබිගාර්හි හමුවූ බඳුන්



රබිගාර්හි හමුවූ පබළු




හරප්පා ශිෂ්ටාචාරය යුග තුනක් පෙන්නුම් කරයි


- ආරම්භක අවධිය ක්‍රි.පූ 3500 - 2600
- දියුණු ම අවධිය ක්‍රි.පූ 2600 - 2000
- පසුකාලීන අවධිය ක්‍රි.පූ 2000 - 1600

හරියානා ප්‍රාන්තයෙන් හමු වූ තවත් පුරාවිද්‍යා ස්ථාන පහක් (කුනාල්, හිර්රණ, ෆාමනා, ගිරිවාද්, මිකාථාල්) ක්‍රි.පූ 5000ට අයත් වේ. එනිසා හරප්පා ශිෂ්ටාචාරය වෙනත් මූලයකින් වර්ධනය වී නොමැති ඉන්දියාවේ ම වැඩුණු ශිෂ්ටාචාරයක් මෙන් ම ලොව පැරණි ම ශිෂ්ටාචාරය බව ද විශාලතම, දියුණු ම ශිෂ්ටාචාරය බව ද කැණීම්වලින් පසු ව අනාවරණය විය. ගග්ගාර නදී නිම්නය මෙයට අවශ්‍ය පෝෂණය සපයා ඇත. එම නිසා මෙය අගනගරය ලෙස ද භාවිත වී ඇත.



රබිගාර්හි හමු වූ සෙල්ලම් භාණ්ඩ

- වර්තමාන සාක්ෂ්‍ය අනුව මෙය ක්‍රි.පූ 3000 දී පමණ දියුණුවට පත් ව ඇත. එම දියුණුව වසර 1000 කටත් වඩා පැවති අතර ක්‍රි.පූ 1800 දී පමණ පරිහානිය ආරම්භ වී තිබේ. ක්‍රි.පූ 1650 දී රබිගාර්හි බිඳ වැටේ.
- හරප්පා ශිෂ්ටාචාරයේ ආරම්භක කාල වකවනු පිළිබඳ විවිධ මතවාද පවතී.
  - මෝටිමර් වීලර් - ක්‍රි.පූ. 2500 - 1500 අතර කාලයේ පැවති බව
  - ජෝන් මාෂල් - ක්‍රි.පූ. 3250 - 2750 අතර කාලයේ පැවති බව
  - එම්.එස්. වත්ස් - ක්‍රි.පූ. 3500 - 2500 අතර කාලයේ පැවති බව
- උතුරින් හිමාලය කඳු පාමුල රූපාර් තෙක් දකුණින් මහාරාෂ්ට්‍රයේ දයිමාබාද් තෙක් නැගෙනහිරින් ගංගා නදියේ අලම්ගීර්පූර් තෙක් හා බටහිරින් බලුකිස්ථානයේ සුත්කජෙන්දෝර් තෙක් ව්‍යාප්ත තිබූ බව
- මෙසපොතේමියානු මැටි පුවරු අනුව එකල හරප්පාව හැඳින්වූයේ **මෙල්ලුහ** නමින් ය.
- මෙසපොතේමියාව හැඳින්වූයේ සුමේර් නමින් ය.
- මෙම ශිෂ්ටාචාරයේ ආර්ථිකය රඳා පැවතුණේ විදේශ වෙළෙඳාම මත බව දැනට තහවුරු වී තිබේ.
- ලෝතාල් නම් වූ කෘත්‍රිම වරාය ප්‍රධාන වරාය විය.
- මෙම වරාය දැනට කි.මී 20කට ආසන්නව ගොඩබිමෙහි පිහිටා ඇත.
- ගුජරාටයෙහි අහමදාබාද්හි සරග්වලා ගමෙහි පිහිටා අණීම් කර සොයා ගනු ලැබීය.
- මෙම ශිෂ්ටාචාරය මෙසපොතේමියාව සමඟ පැවති වෙළෙඳාමේ දි අතරමැදි ස්ථානය ලෙස භාවිත කරනු ලැබුවේ පර්සියන් ගල්ෆ් කලාපය යි.



ලෝතාල් වරාය දැක්වෙන පසුකාලීන සිතුවමක්




කෘත්‍රිම ව ඉදි කර ඇති තටාකාංගණය

**සමකාලීන ශිෂ්ටාචාර අතර සබඳතා**

- විවිධ ජන වර්ග වාසය කළ සාධක හමු වීම නිසා වෙනත් ශිෂ්ටාචාර සමඟ සබඳතා පැවැත්වූ බවට මතයක් පැවතීම
- වෙළෙඳාම හා වාණිජ සම්පත් ලබා ගැනීම. අරමුණු කර ගනිමින් වෙනත් ශිෂ්ටාචාර සමඟ සබඳතා පැවැත්වූ බව
- නෞකා මගින් ලෝතාල් වරාය කේන්ද්‍ර කර ගනිමින් මෙසපොතේමියාව වැනි ශිෂ්ටාචාර සමඟ සබඳතා පැවැත්වූ බව
- මෙසපොතේමියාවෙන් හරප්පා සභ්‍යත්වයට අයත් මුද්‍රා හමු වීම
  වාණිජ සම්පත් ලබා ගැනීම අරමුණු කර ගනිමින් පහත දැක්වෙන ප්‍රදේශ සමඟ සබඳතා පැවැත්වූ බව
  - රත්රන් - මයිසූරය
  - තඹ - අරාබිය, රාජ්පුටානා, බලුකිස්ථානය
  - රිදී - ඉරානය
- ලොම් මෙසපොතේමියාවෙන් ද මුතු සහ කානීලියානු පබළු හරප්පාවෙන් ද ගෙන යන ලද බව
- කානීලියන් පබළු ඉන්දියාවට ආවේණික නිෂ්පාදනයක් වීම.
- බටහිර ආසියාවේ ග්‍රාමීය හා නාගරික ශිෂ්ටාචාරයන්හි භාවිත වූ මැටි බඳුන් හරප්පාවෙන් හමු වූ බව.

**නගර සැලසුම් හා නාගරික ලක්ෂණ**

- දැනට ලැබී ඇති නවතම පුරාවිද්‍යාත්මක දත්ත අනුව (2016) රඛිගාර්හි ප්‍රධාන වානිජ නගරය මෙන්ම පරිපාලන ලෙස ක්‍රියාත්මක වී තිබීම.
- මොහෙන්ජොදාරෝ සහ හරප්පා යන නගර ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර දෙක වීම
- නගර සැලසුමේ ප්‍රධාන ලක්ෂණය මාර්ග පද්ධතිය වීම හා ප්‍රධාන නගර තුනෙහි ලක්ෂණ එක සමාන වීම
- පළල අඩි 10 - 30 අතර වූ සැතපුම් 2ක් පමණ විහිදුනු ඍජු මාර්ග පැවතීම
- ප්‍රධාන මාර්ගයන්ට දෙපසින් විහිදී ගිය පටු අතුරු මංමාවත් පැවතීම හා ඒවා ප්‍රධාන මාවතට සම්බන්ධ ව පැවතීම



ප්‍රධාන වීථි



පටු මාර්ග

- මාර්ග ඉදි කිරීම සඳහා පුළුස්සන ලද ගඩොලු යොදා ගෙන තිබීම
- ප්‍රධාන මාවතට දෙපසින් සමාන්තර ව විහිදී ගිය කාණු පද්ධතියක් තිබූ බව
- නගර සැලසුම්කරණයට අමතර ව පහත දැක්වෙන නාගරික ලක්ෂණ කැපී පෙනෙන බව
  - නිවාස පද්ධතිය
  - ඇතුළු නගරය
  - හරප්පාවේ ධාන්‍යාගාරය
  - මොහෙන්ජොදාරෝවේ ස්නානාගාරය
  - ආලෝක කලුණු
  - රබිගාර්හි විශාල ස්නානාගාරය
- දියුණු ම නාගරිකරණ සැලසුම් හමුවනුයේ රබිගාර්හිය

වැසිකිළි හා ස්නානාගාර





ළිං හා කාණු පද්ධති



## නිවාස පද්ධතිය

- ප්‍රධාන නගර ආශ්‍රිත ව මහල් නිවස ඉදි කර ඇති බව
- බොහෝ නිවාසයන්හි මැද මිදුලක් දක්නට ලැබීම
- නාගරික නිවාසයන්හි ප්‍රධාන කවුළු මාවතට පිටුපා ඉදි කර තිබීම මඟින් පිරිසිදු වාතාශ්‍රය ලබා ගැනීමට සැලැකිලිමත් වූ බව
- මහල් නිවාසයන්ට අමතර ව කුඩා ප්‍රමාණයේ කම්කරු නිවාස ලෙස සැලැකිය හැකි නිවාස පද්ධතීන් ද පැවති බව

## ඇතුළු නගරය

- අනෙක් ප්‍රධාන නගර දෙකෙහි ම ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථාන ලෙසින් පැවති බව
- අඩි 30ක පමණ උසින් යුත් ප්‍රාකාරයකින් එය ආරක්ෂා කොට ඇති බව
- නගර තුනෙහි ම බටහිර දෙසට වන්නට මෙම ඇතුළු නගරය පිහිටා තිබූ බව

- මාලිගය යැයි සැලකෙන ගොඩනැගිල්ල
  - * අඩි 230 x 78 ක ප්‍රමාණයෙන් යුතු මාලිගාවක් යැයි සිතිය හැකි ගොඩනැගිල්ලක නටබුන් මොහෙන්ජෝදාරෝ ප්‍රදේශයෙන් හමු වූ බව

- රකිගාර්හි හරප්පා නගරය මෙන් දෙගුණයක් ද මොහෙන්ජොදාරෝ මෙන් තුන් ගුණයක් ද විශාල ය.
- වර්ග සැතපුම් 550ක් කරම් විශාල බව
- අනෙක් නගර දෙකට වඩා මෙහි සැම ස්ථානයක් ම ක්‍රමානුකූල ව සකස් කර ඇති බව
- පාලක පන්තිය මෙහි සිට පාලනය කරන්නට ඇති බව


- හරප්පාවේ ධාන්‍යාගාරය
  - * මීටර් 45 x 15 ප්‍රමාණයෙන් යුත් මෙය ප්‍රධාන ධාන්‍ය තැන්පත් කරන්නා වූ ස්ථානය ලෙස සැලැකෙන බව
  - * ධාන්‍ය කෙටීම සඳහා යොදා ගත් වංගෙඩි වැනි වළවල් පිළිබඳ සාධක හමු වීම
  - * තිරිඟු බාර්ලි යන ධාන්‍යවල අවශේෂ හමු වූ බව
  - * ධාන්‍ය තැන්පත් කිරීම සඳහා උස් වේදිකාවක් තිබූ බව

- මොහෙන්ජෝදාරෝවේ ස්නානාගාරය
  - * ස්නානාගාරයේ මුළු ප්‍රමාණය අඩි 180 x 108ක් වන අතර ජලය සහිත පොකුණ අඩි 39 x 23 ක ප්‍රමාණයක් බව
  - * මෙය නාගරික ජීවිතයක තිබූ ප්‍රධාන ලක්ෂණයක් වූ බව
  - * අවශ්‍ය අවස්ථාවන්හි දී ජලය පුරවාගැනීම සඳහා බෝක්කුවක් තනා තිබූ බව
  - * ඇතැමුන්ට අනුව මෙය ජලය සම්බන්ධ ආගමික පූජාවන් සඳහා ඉදි කරන්නට ඇති බව

- ආලෝක කුලුණු
  - * රාත්‍රි කාලයේ නගරය ආලෝකවත් කිරීම සඳහා ආලෝක කුලුණු යොදා තිබූ බව
  - * දිවා රාත්‍රි දෙකෙහි ම කාර්ය බහුල නොනිඳන නගරයක් ලෙසින් පැවති බව

- රකිගාර්හි, හරප්පා සහ මොහෙන්ජොදාරෝ යන ප්‍රධාන නගරයවල අමතර ව පහත දැක්වෙන සුළු නගර පැවති බව

| | |
|---|---|
| - ලෝතාල් | - බනාවලි |
| - රූපාර් | - දොලවීර |
| - චන්හුදාරෝ | - බලාකොට් |
| - කලිබංගන් | - කොට්ඩිජි |
| - රංග්පූර් | - අල්ලාර්දිනෝ |
| - කුනාල් | - දෙසල්පූර් |




අපවිත්‍ර ජලය බැහැර කිරීම සඳහා ඉදි කර ඇති කාණු පද්ධතියක්

**ආර්ථික තත්ත්වය**

- උසස් නාගරික ලක්ෂණයන්ට සමාන්තර ව දියුණු ආර්ථිකයක් ද පැවති බව
- ආර්ථිකයේ ප්‍රධාන කොටස් 4ක් තිබූ බව
  - * කෘෂිකර්මාන්තය * සත්ත්ව පාලනය
  - * වෙළෙඳාම * විවිධ කර්මාන්ත
- කෘෂිකර්මාන්තය දියුණු ලෙස පැවති බව ධාන්‍යාගාරය හමු වීම මඟින් පැහැදිලි වන බව
- තිරිඟු සහ බාර්ලි ආදිය ද බහුල ලෙස වගා කළ බව හා වී වගාව සුළු වශයෙන් පැවති බව
- ධාන්‍ය වගාවට අමතර ව කෙසෙල් සහ දොඩම් වැනි පලතුරු වගාව ද සිදු කළ බව
- කපු රෙදි නිෂ්පාදනය සඳහා කපු වගාව සිදු කළ බව
- ඉඳි ගස් වගා කර ඇති බව

- **වෙළඳාම**

  - ආර්ථිකයේ ප්‍රධාන අංශයක් ලෙස වෙළෙඳාම පැවති බව
  - විදේශ වෙළෙඳාම වැදගත් ම ආර්ථික ඒකකය බව
  - අභ්‍යන්තර හා බාහිර වශයෙන් වෙළෙඳාම ව්‍යාප්ත ව තිබූ බව
  - අභ්‍යන්තර වෙළෙඳාම ගැල් මඟින් සිදු වූ අතර බාහිර වෙළෙඳාම ගොඩබිම හා මුහුදු මාර්ග හරහා සිදු වූ බව
  - වෙළෙඳාමෙහි භාවිත කළ තරාදි, පඩි ආදිය පිළිබඳ සාධක හමු වීම
  - ප්‍රධාන නගර හා සුළු නගර කේන්ද්‍ර කර ගනිමින් වෙළෙඳ ජාලයක් වශයෙන් පැවති බව
  - ඉන්දියාවේ සිට පර්සියානු ගල්ෆ්, බහරේන් දූපත් හරහා මෙසපොතේමියාවට වැටී තිබූ ප්‍රධාන වෙළෙඳ මාර්ගය විදේශීය වෙළෙඳාමේ දී වැදගත් වූ බව
  - මෙසපොතේමියාව, පර්සියානු ගල්ෆ් කලාපයේ රටවල් බහරේන්, ඉරානය හරහා වෙළෙඳ ගනු දෙනු සිදු කළ බව
  - අභිලේඛනවලට අනුව හරප්පාව සහ නැන්ටි මෙල්ලුහ ප්‍රකට වාණිජ නගරයක් වූ බව
  - ලෝතාල් සහ සුක්තජෙන්දෝර් විදේශීය වෙළෙඳාමේ දී ප්‍රධාන වරායවල ලෙස පැවති බව

- **සත්ත්ව පාලනය**
  - සත්ත්ව පාලනය ද ආර්ථිකයේ තවත් අංශයක් ව තිබූ බව
  - සත්ත්ව පාලනයේ දී ගවයා ප්‍රධාන වූ අතර ඌරන්, කුකුළන් සහ එළුවන් මස් පිණිස යොදා ගත් බව
  - ගවයා කෘෂිකර්මාන්තය, ප්‍රවාහණය හා පස්ගෝරස ලබා ගැනීම සඳහා ද ප්‍රයෝජනවත් වූ බව.

- **විවිධ කර්මාන්ත**

  - හරප්පා සභ්‍යත්වයේ ආර්ථිකය ගොඩනැගූ තවත් අංශයක් ලෙස විවිධ කර්මාන්ත හඳුනාගත හැකි බව
  - බොහෝ කර්මාන්තයන් අභ්‍යන්තර වෙළෙඳාමේ දී අත්‍යවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීම
    * පේෂ කර්මාන්තය * මුතු කර්මාන්තය
    * කුඹල් කර්මාන්තය * ඇත් දළ කරමාන්තය
    * ලෝහ කර්මාන්තය * නැව් සහ බෝට්ටු කර්මාන්තය
    * ධීවර කර්මාන්තය

- **සමාජ සංවිධානය**

  - මාතෘ මූලික සමාජයක් ලෙස පැවති බව
  - පහත දැක්වෙන සමාජ කොටස් එකල නියෝජනය වූ බව
    * ආගමික පන්තිය * වෙළෙනදෝ
    * පාලක පන්තිය * ඉංජිනේරුවෝ
    * කම්කරුවෝ * සාමාන්‍ය ජනතාව

- පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව ප්‍රධාන මානව වර්ග 4ක් විසූ බව
  - මොන්ගෝලියානු
  - ඇල්ෆයින්
  - ප්‍රොටෝ ඔස්ට්‍රොලොයිඩ්
  - මධ්‍යධරණී

- ඉදි කර තිබූ නිවාස අනුව ධනපති හා කම්කරු යන ප්‍රධාන සමාජ පන්ති දෙකක් වූ හයි විවරණය කළ හැකි බව

- සාමාන්‍ය ජනයා නිරත වූ වෘත්තිය අනුව පන්ති භේදයක් තිබෙන්නට ඇති බව
- ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂය ම ආභරණ පැලැඳි බව
- ඇඳුම් අතර පුරුෂයන් යටිකය වැසීමට දෝතියක් වැනි දෙයක් භාවිත කළ අතර කාන්තාවන් කෙටි හෝ දිගු හෝ සායක් භාවිත කළ බව
- විනෝදාංශ වශයෙන් දාදු ක්‍රීඩාව, මල්ලව පොර මෙන් ම නැටුම් හා ගැයුම් පැවති බව
- කෙනෙකු මියගිය පසු ආදාහනය කිරීමේ, භූමදානය කිරීමේ හෝ අස්ථි කොටස් බරණිවල දමා තැන්පත් කිරීමේ හෝ අභිචාරයන් පැවති බව

**ආගමික විශ්වාස**

- ශිෂ්ටාචාරයෙන් හමු වූ පුරාවිද්‍යාත්මක සාධක අනුව පහත දැක්වෙන ආගමික විශ්වාසයන් පැවතිණැයි බව විශ්වාස කෙරෙන බව
  - ජගන්මාතා වන්දනය
  - වෘක්ෂ වන්දනය
  - ජල වන්දනය

- ජගත් මාතා වන්දනය
  - මේවා සෑම ගෙදරක ම තබා තිබුණු බව 2000කට වඩා ටෙරාකොටා මූර්ති හමු වී තිබූ බව
  - සශ්‍රීකත්වයේ හා සෞභාග්‍යයේ සංකේතයක් ලෙස වන්දනා කළ බව
  - විශ්වයේ හා භූමියේ දෙවඟන ලෙස ජගත් මාතා වන්දනය කළ බව
  - විවිධ ඉරියව්වලින් යුත් කාන්තා ප්‍රතිමා ජගත් මාතාව ලෙස සලකා වන්දනා කළ බව
  - ඇතැම් කාන්තාවන් විසින් පාලන කාර්යයෙහි යෙදුණු බවටද ඉඟි පවතින බව

- වෘක්ෂ වන්දනාව
  - වෘක්ෂයට හෝ වෘක්ෂයන්ට හෝ අධිපති දෙවිවරුන් සිටිතියි විශ්වාසයෙන් යුතු ව වන්දනා කළ බව
  - ඇසතු, සියඹලා, නුග යන ශාකයන්ට වන්දනා කළ බවට සාක්ෂ්‍ය වීම

- ජල වන්දනය
  - ශිෂ්ටාචාරයේ සියලු ම වැසියන් ජලයට ගෞරව දැක්වූ බව
  - මොහෙන්ජෝදාරෝවේ ස්නානාගාරය ජල වන්දනය සඳහා යොදා ගත් බවට සාධක හමු වීම

**කලාත්මක හැකියා**

- ශිෂ්ටාචාරයේ වැසියන් උසස් කලාත්මක හැකියාවක් තිබූ පිරිසක් වූ බව
- කලා නිර්මාණ සඳහා ලෝහ, මැටි, ගල් යන අමු ද්‍රව්‍ය යොදා ගත් බව
- මොහෙන්ජෝදාරෝවෙන් හමු වූ සෙ.මී. 19ක් පමණ උස වූ පුරුෂ උඩුකය දැක්වෙන ප්‍රතිමාව කලාත්මක අතින් ඉහළ බව
- මොහෙන්ජෝදාරෝවෙන් හමු වූ අඟල් 4 ක් පමණ උස ලෝඩකවලින් තැනූ නළඟනගේ රුව ප්‍රතිමා නෙළීමේ කුසලතාව ඉස්මතු කරන්නක් බව
- හරප්පාවෙන් ලැබී ඇති රතු වැලිගල් පාෂාණයෙන් නිර්මිත පුරුෂ කවන්ධක රූප සජීව කලා නිර්මාණ ලෙස පෙන්වා දිය හැකි බව
- ක්‍රීඩා භාණ්ඩ හා විසිතුරු භාණ්ඩ ලෙස නිර්මාණය කර ඇති විවිධ සත්ත්ව රූප කලාත්මක අතින් වැදගත් වූ බව
- හරප්පාවෙන් හමු වූ විචිත්‍රවත් ලෙස සිතුවම් කරන ලද මැටි බඳුන් ආකර්ෂණීය කලා නිර්මාණ වූ බව

**පරිහානිය හා ඒ පිළිබඳ විචාරක මත**

- ක්‍රි.පූ. 3500 දී පමණ ආරම්භ වූ හරප්පා සභ්‍යත්වය ක්‍රි.පූ. 1650 +_ දී පමණ පරිහානිය ආරම්භ වී ක්‍රි.පූ 1500 දී පමණ මුළුමනින් ම බිඳ වැටුණු බව
- පරිහානිය සඳහා පහත දැක්වෙන හේතු සාධක බලපෑ බව පර්යේෂකයන් අතර මත පවතින බව
  - ආර්ය ආක්‍රමණ
  - දේශගුණ විපර්යාස
  - ජල ගැලීම්
  - වසංගත රෝග බෝ වීම
  - හදිසි ගිනි ගැනීම්
  - ඉන්දු ගඟේ ජල මාර්ගයන්හි සිදු වූ වෙනස් කම්
- ක්‍රි.පූ. 1500 දී පමණ එල්ල වූ ආර්ය ආක්‍රමණ හරප්පා සභ්‍යත්වය විනාශ වීමට ප්‍රබල හේතුවක් වූ බවට තිබූ මතය අභියෝගයට ලක්ව ඇත.
- නවීන විද්‍යාත්මක පර්යේෂණ අනුව ඇටසැකිලි පරීක්‍ෂා කිරීමේ දී ඔවුන් ටිකෙන් ටික හුස්ම හිරවී මිය ගොස් ඇති බව
- දියෙහි ගිලී මිය ගිය බවට සාධක හමුවී ඇත
- මුලින් තැන් තැන්වල අක්‍රමවත් ලෙස වැටී තිබූ ඇටසැකිලි අනුව එය ආක්‍රමණයක් බව තහවුරු කළ හැකි බව පැවසුව ද ඒවා ආක්‍රමණ නොවන බව සනාථ වීම
- දේශගුණ විපර්යාස මඟින් ජල චක්‍රය අක්‍රමවත් වීම හා කාන්තාරික දේශගුණයක් ඇති වීම ජන ජීවිතය බිඳ වැටීමට හේතු වන්නට ඇති බව
- ඇතැම් ප්‍රදේශවල ඇති වූ ජල මට්ටම් වෙනස් වීම් හා ගංවතුර තර්ජන හේතුවෙන් ජන ජීවිතය අඩාල වූ බව
- නිරන්තර ගංවතුර තර්ජන හේතුවෙන් මැලේරියාව සහ පාචනය වැනි වසංගත රෝග පැතිරීම ජන ජීවිතයට බලපෑම් ඇති කරන්නට ඇති බව
- ඒ මඟින් ඇතැම් ප්‍රදේශ ජන ශූන්‍ය ප්‍රදේශ බවට පත් වන්නට ඇති බව
- ඉන්දු ගඟේ ජල මාර්ගයන්හි ඇති වූ වෙනස්කම් හේතුවෙන් ඇතැම් ප්‍රදේශ ජීවත් වීමට නුසුදුසු වූ බව
- ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගර අවසාන කාලය වන විට හදිසි ගිනි ගැනීම්වලට ලක් වීම හේතුවෙන් පරිපාලන අඩපණ වීම පරිහානිය වේගවත් කළ බව
- ෂාහි-තුම්ප් කැණීම් මඟින් ආර්යයන් ලෙස සැලකූ පිරිස් හා හරප්පා වැසියන් අතර සම්බන්ධයක් නොමැති බව
- විදේශ වෙළෙඳාම ආර්ථිකයේ ප්‍රධාන ධනය ඉපයීම් මාර්ගය වූ බවත් එය පරිහානියට පත් වූ නිසා නැවත ජල ගැලීමක දී ශිෂ්ටාචාරය ගොඩනැඟීමට ධනය නොමැති වූ බව
- මුලින් හරප්පාව බිඳ වැටුණු පසු මොහෙන්ජොදාරෝව, ලෝතාල් 1750 දී ද රබ්ගාර්හි 1650 දී ද බිඳ වැටීමෙන් ශිෂ්ටාචාරය බිඳ වැටුණු බව



මොහෙන්ජොදාරෝහි ඇටසැකිලි

ඇගයීම - 01

**පහත දැක්වෙන ආකාරයේ බහුවරණ ප්‍රශ්න සකස් කොට ඇගයීම් සඳහා යොදා ගන්න.**
**පහත ප්‍රශ්න සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක සමග නොගැළපේ. නොගැළපෙන නම කුමක් දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

(1) 1. චන්හුදාරෝ 2. මොහෙන්ජෝදාරෝ 3. හරප්පා 4. කොට්ඩිජි 5. සුප්පාරක (...............)

(2) 1. ආර්.ඩී. බැනර්ජි 2. මෝර්ටිමර් වීලර් 3. ස්ටුවර්ට් පිගොට් 4. ජෝන් මාෂල් 5. කේ.ඒ. නීලකණ්ඨ ශාස්ත්‍රී (...............)

(3) 1. රූපාර් 2. හරප්පා 3. ඉන්ද්‍රප්‍රස්ථ 4. චන්හුදාරෝ 5. මොහේන්ජෝදාරෝ (..............)

**පහත දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

(4) හරප්පා ශිෂ්ටාචාරයට අයත් සුළු නගරයකි
1. දොලවීර 2. රබිගාර්හි 3. හරප්පා 4. මෙහෙන්ජෝදාරෝ 5. ලෝතාල් (...............)

(5) හරප්පා ශිෂ්ටාචාරයේ ප්‍රධාන ම වාණිජ නගරය ලෙස පිළිගෙන ඇත්තේ කුමන නගරය ද?
1. ලෝතාල් 2. රබිගාර්හි 3. චන්හුදාරෝ 4. රූපාර් 5. හරප්පා (...............)

**පහත දක්වා ඇති ප්‍රශ්නයට එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් දී ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

(6) රකිගාර්හි
1. හරප්පා ශිෂ්ටාචාරයේ විශාලතම නගරය
2. හරප්පාවේ ප්‍රධාන ම වාණිජ නගරය වීම
3. එස්.ආර් රාඕ විසින් කැණීම් කර සොයා ගැනීම
4. ක්‍රි.පූ 1650 දී බිඳ වැටීම
5. පාලක පන්තිය මෙහි සිට පාලනයට කරන්නට ඇති බව හා පරිපාලන නගරය වූ බව

(...............)

(7) හරප්පා ශිෂ්ටාචාරයේ විනාශයට මුල් වූ හේතු
1. රාවී ගඟේ ගමන් මාර්ගය වෙනස් වීම
2. නිරන්තර ගංවතුර තර්ජන
3. ථාර් කාන්තාරය දෙසින් පැමිණි කුණාටු
4. ආර්ය ආක්‍රමණ
5. ජනගහනය වර්ධනය වීම

(...............)

(8) හරප්පා වැසියන්ගේ සමාජ ජීවිතය
1. මොහෙන්ජෝදාරෝවෙන් හමු වී ඇති ඇටසැකිලි අවශේෂ කැල්කොලිතික යුගයට අයත් යැයි සැලැකේ.
2. එහි වැසියෝ බාර්ලි, වී, තිරිඟු හා මෑ ආදි ධාන්‍ය වගා කළහ.
3. ස්ත්‍රීහු මාල, වළලු, මුදු ආදි ආභරණ පැලැන්දාහ.
4. එහි වැසියෝ මවු දෙවඟන වන්දනා කළහ.
5. ඉන්දු නිම්න වැසියෝ මෙසපොතේමියාවෙන් කපු ආනයනය කළහ.

(...............)

**පහත ප්‍රශ්න සඳහා පද යුගළ පහ බැගින් දී ඇත. ඒවා අතුරින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

(9) 1. රූපාර් - සත්ලෙජ් 3. මොහොන්ජෝදාරෝ - සින්ධු
2. හරප්පා - රාවි 4. ලෝතාල් - සුවාස්තු
5. කලිබංගන් - ගග්සර්

(10) 1. පුර - ඉන්දුනිම්නයේ බලකොටු 4. ජන - රාජන්
2. විශ්පති - ගවයන් ආරක්ෂකයා 5. මුක්ත - ගම්පති
3. යඥය - පූජාව/යාගය

**පහත ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4, හා 5 යන ප්‍රකාශ යුගලඅතුරින් කුමක් දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | | |
|---|---|---|
| 1. | නිවැරදි ය | නිවැරදි ය |
| 2. | නිවැරදි ය | වැරදි ය |
| 3. | වැරදි ය | වැරදි ය |
| 4. | වැරදි ය | නිවැරදි ය |
| 5. | නිවැරදි ය | නිවැරදි ය පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

| පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|
| 1. හරප්පා ශිෂ්ටාචාරයේ මුද්‍රාවලින් එහි ජනතාවගේ ආගමික පිළිවෙත් හෙළි වේ. | හරප්පා ශිෂ්ටාචාරය ලෝකයේ ඉපැරණි ශිෂ්ටාචාරය ලෙස පිළිගැනේ. (................) |
| 2. මොහෙන්ජෝදාරෝ අවසාන අදියරේ දී පිරිමින්, ගැහැනුන් හා ළමයින් මාර්ගවල දී හා ගෙවලදී ඝාතනයට ලක් වූ බවට මතයක් ඇත. | මෝටිමර් වීලර් විග්‍රහ කරන්නේ මෙයින් හරප්පා සභ්‍යත්වය විනාශ කළ ආර්ය ආක්‍රමණයක් පිළිබිඹු වන බව යි. (................) |

ඇගයීම - 02

1. හරප්පා ශිෂ්ටාචාරයේ ආර්ථික හා සමාජ තත්ත්වය කෙටියෙන් සමාලෝචනය කරන්න.
2. හරප්පා ශිෂ්ටාචාරයේ ප්‍රභවය හා පරිහානිය පිළිබඳ ව පවතින විවිධ මතවාද විවේචනාත්මක ව පරීක්ෂා කරන්න.
3. ''හරප්පා ශිෂ්ටාචාරය නාගරික ශිෂ්ටාචාරයකි''
   1. හරප්පා ශිෂ්ටාචාරයට අයත් අලුතෙන් සොයාගත් ප්‍රධාන ම නගරය නම් කරන්න. ලකුණු 02
   2. එම ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශවලින් සොයාගත් වැදගත් පුරාවස්තු දෙකක් නම් කරන්න. ලකුණු 02
   3. හරප්පා වැසියන්ගේ ආගමික විශ්වාස කෙටියෙන් විස්තර කරන්න. ලකුණු 03
   4. ඉහත සඳහන් ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද ? හේතු දක්වන්න. ලකුණු 07

4. ''හරප්පා සභ්‍යත්වය ලොව පැරණි නාගරික ශිෂ්ටාචාරවලින් එකකි.''
   1. හරප්පා ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශ පිළිබඳ කැණීම් කළ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. ලකුණු 01
   2. මොහෙන්ජෝදාරෝ හා හරප්පා නගර අසලින් ගලා යන ගංගා දෙක නම් කරන්න. ලකුණු 01
   3. හරප්පා වැසියන්ගේ කලාත්මක නිර්මාණ ඇගයීමට ලක් කරන්න. ලකුණු 04
   4. හරප්පා නගර සැලැස්ම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න. ලකුණු 08

ඇගයීම - 03

- පහත සඳහන් ස්ථාන ඉන්දියානු සිතියමක ලකුණු කර දෙකක් පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.
- (මොහෙන්ජොදාරෝ, හරප්පා, ලෝතාල්, සින්දු නදිය, රාවී නදිය, රඛිගාර්හි, දොලවීර, රූපාර්)

## 4. ගංගා නිම්න ඔස්සේ පැතිරගිය මානව ජනාවාස රටාව

ඉන්දියාවේ හරප්පා ශිෂ්ටාචාරයට පසු එළඹි යුගය වෛදික යුගය ලෙස හඳින්වේ. මූලාශ්‍රයවල සඳහන් තොරතුරු අර්ථකථනය කළ මුල්කාලීන විද්වත්තු හරප්පාව ආක්‍රමණය කළේ වෛදික ආර්යයන් බව පෙන්වා දෙති. මෙලෙස ස්වදේශීය ශිෂ්ටාචාරය යටපත් කරමින් සිය බලය තහවුරු කර ගත් මුල් සාංක්‍රමණිකයෝ තමන් සෙස්සන්ට වඩා උසස් ලෙසින් හඳුන්වා දෙති. ඒ අනුව උතුම් යන අර්ථය දෙන ආර්ය යන වචනයෙන් තම වර්ගයා හඳුන්වා ගෙන ඇත. එසේ වුව ද කිසි විටෙක ආර්ය යනු ජාතියකැයි නොහැඟවෙන බව වර්තමාන පර්යේෂණවලින් පෙන්වා දී ඇත.

වෛදික සාහිත්‍යය අනුව වේදය ශුද්ධ වූ ග්‍රන්ථය ලෙස පිළිගත්, ඉන්ද්‍ර ප්‍රමුඛ දෙවියන් ඇදහූ පිරිස ආර්ය ජන කොටසට අයත් බව පෙන්වා දෙනු ලැබේ. කෙසේ වෙතත් මැක්ස් මුලර් පඬිවරයා පෙන්වා දෙන්නේ ආර්ය යනු එක් ජන කොටසක් පමණක් හැඳින්වීමට යොදන ලද්දක් නොවන බව යි. ආර්ය-අයිර්ය යන්න ආර්යයන්ට මෙන් ම ඉරානයටත් නම් කළ හැකි බව පෙන්වා දෙයි. මොවුන් හොඳින් වැඩුණු ශරීර ඇති, දික් වූ නාසයක් ඇති, පැහැපත් මිනිස් කොට්ඨාසයක් වශයෙන් හඳුන්වා දෙනු ලැබේ. මෙසේ පැමිණි මෙම ජන කොටස් මුල් භූමියෙන් පිටවන විට එඬේර යුගය ඉක්මවා කෘෂි ජීවිතයකට පිවිසී තිබුණු බව පෙනේ. ගම්මානවල ලොකු පවුලක් ලෙස හෝ ගෝත්‍ර වශයෙන් හෝ ඔවුන් ජීවත් වූ බවට සාධක ලැබේ.

මෙවැනි පසුබිමක් සහිත ව ආරම්භ වූ ආර්ය ජනාවාස ඒවායේ විකාශනයත් සමග ස්වදේශික සංස්කෘති සමග සම්මිශ්‍රණය විය. එසේ ම භූගෝලීය පාරිසරික තත්ත්වය ද ඔවුනගේ ජනාවාස රටාව තීරණය වීමට බලපා ඇත.

**නිපුණතාවය :** • ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම :** 4.1 වෛදික යුගය පිළිබඳ තොරතුරු විස්තර කරයි.

**කාලච්ඡේද ගණන :** 25

**ඉගෙනුම් පල :**
- වෛදික යුගය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- වෛදික යුගය ඉන්දියානු ශිෂ්ටාචාරයේ පදනම බවට තොරතුරු ඉදිරිපත් කරයි
- ඍග් හා පශ්චාත් වෛදික ජනාවාස ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**වෛදික යුගයේ දී මානව ජනාවාස රටාවේ ආරම්භය හා ව්‍යාප්තිය**

- **ආර්යයන්ගේ මුල් භූමිය**
  - ආර්යයන්ගේ මුල් භූමිය පිළිබඳ ව එක් නිශ්චිත මතයක් ඉදිරිපත් වී නොමැත
  - එහෙත් පුරාවිද්‍යාඥයෝ හා වාග් විද්‍යාඥයෝ එකතු වී ආර්යයන්ගේ මුල් භූමිය පිළිබඳ විවිධ මත ඉදිරිපත් කරති.
    * දකුණු රුසියාවේ ස්ටෙප්ස් පෙදෙසින් සංක්‍රමණය වූ බව
    * බොහිමියාවේ හංගේරියන් තැන්න මුල් භූමිය බව
    * ආර්යයන් ඉන්දීයයන් බව
    * කාශ්මීරය සහ හිමාලය ආර්යයන්ගේ මුල් භූමිය බව
    * ඍග් වේදය හා ඉරාන පාරම්පරික අවෙස්තාවට අනුව ආර්යයන් ඉන්දියාවට පැමිණීමට පෙර ඉන්දු - ඉරානීය ජනයා සමග එක් ව ඉරානය අවට ප්‍රදේශයේ ලැගුම් ගන සිටි බව
    * සුළු ආසියාවේ කැප්පඩෝසිය ප්‍රදේශයේ බෝඝස්කෝයි සෙල්ලිපිය අනුව ආර්යයන් ක්‍රි.පූ. 15 වන සියවසේ දී ඉන්දියාවට පැමිණි බව

- **ජනාවාස පිහිටුවීම හා ව්‍යාප්තිය**
  - ඍග් වේදයේ නදීස්මෘති කාණ්ඩයේ දැක්වෙන ආකාරයට ආර්යයන් ප්‍රථමයෙන් සප්ත සින්ධු ප්‍රදේශයේ ස්ථාන ගත වූ බව
  - සප්ත සින්ධු යනු ජේලම් (විතස්තා) චේනාබ්, රාවී (ප්‍රුෂ්නී) බියස් (විපාශ්) සත්ලේජ් (ශුතුද්‍රි) සරස්වතී, දෘෂද්වතී යන ගංගා හතෙන් සමන්විත ප්‍රදේශය බව
  - මේවායින් සරස්වතී හා දෘෂද්වතී ගංගා මුළුමනින් ම සිඳී ගිය පසු එම ප්‍රදේශය ගංගා පහේ රට යන අරුතින් පංජාබ් යනුවෙන් හැඳින්වුණු බව
  - ඍග් වේදයේ සඳහන් තොරතුරු අනුව ඔවුන් පංජාබයේ විසූ බව
  - අනු, පුරු, යදු, තුර්වස, ඍටි වැනි ගෝත්‍රිකයන් පරුෂ්නි (රාවි) හා ශුතුද්‍රි (සත්ලේජ්) ගංගා අතර ප්‍රදේශයේ ව්‍යාප්ත වී සිටි බව
  - භරත ගෝත්‍රයේ සුදාස් රජු පරුෂ්නි හා ශුතුද්‍රි ගංගා අතර ලැගුම් ගෙන සිටි ගෝත්‍ර දහයකින් සමන්විත පෙරමුණක් සමග දසරාඥය නම් යුද්ධයකට පිවිසි බව
  - මෙලෙස ඍග් වේදයෙන් අනාවරණය වන තොරතුරු අනුව ඍග් වෛදික ආර්යයන් ඇෆ්ගනිස්ථානය, පංජාබය, සින්ද් ප්‍රදේශයේ කොටසක්, රාජ්පුතානා, ඉන්දියාවේ වයඹදිග දේශසීමාව, කාශ්මීරය, නැඟෙනහිර සරසු නදිය යන ප්‍රදේශයන්හි ව්‍යාප්ත ව සිටි බව පෙනේ.
  - මූලාශ්‍රයයන්හි සඳහන් ආකාරය සහ ජනාවාසයන්හි මූලික ලක්ෂණ සැලකිල්ලට ගෙන වෛදික යුගය ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්වීම
    - * ඍග් වෛදික යුගය - ඍග් වේදයෙන් තොරතුරු ලැබෙන යුගය
    - * පශ්චාද් වෛදික යුගය - යජුර්, සාම, අතර්වන්, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද්, පුරාණ, වේදාංග, උපවේද, සූත්‍ර ආදියෙන් තොරතුරු ලැබෙන යුගය

- **ඍග් වෛදික යුගය**
  - ඍග් වේදය මංඩල 10 න් යුත් ගීතිකා 1028කින් සමන්විත බව
  - බ්‍රාහ්මණයන් විසින් ලියන ලද මෙය ආගමික ග්‍රන්ථයක් නිසා ඉතිහාසය හැදෑරීමට මූලාශ්‍රයයක් ලෙස භාවිත කිරීමේ දී ගැටලු පවතී
  - ඍග් වෛදික යුගය හැදෑරීමට ඇති එක ම මූලාශ්‍රයය මෙය බැවින් එය මත රඳා පැවැත්මට සිදු වේ.
  - ආර්යයන් ඉන්දියාවට පැමිණ ගත කල මුල් යුගය ඍග් වෛදික යුගය ලෙස හැඳින්වේ. ඍග් වේදය මෙම මුල් ම යුගයේ තොරතුරු ලබාගැනීමට ඉවහල් වේ. එසේම ඍග් වෛදික යුගය හඳුනාගැනීමේ දී දේශපාලන, ආර්ථික සහ ආගමික යන අංශයන්ගේ කැපී පෙනෙන වෙනස්කම් ද සැලකිල්ලට ගෙන ඇත. ඒවා පහත ආකාරයට වෙන් වෙන් ව විග්‍රහ කළ හැකි ය.

- **ඍග් වෛදික දේශපාලන රටාව**
  - ගෝත්‍රික කණ්ඩායම් වශයෙන් ජනාවාස ආරම්භ වීම
  - 'රාජන්‍ය' යන පොදු නාමයෙන් ගෝත්‍ර නායකයා හැඳින්වීම
  - බලවත් ගෝත්‍ර සහ කුඩා ගෝත්‍ර ගණනාවක් පිළිබඳ ව සඳහන් වීම
    - * බලවත් ගෝත්‍ර - භරත, පුරු, යදු, තුර්වාශ, අනු, දෘහසු
    - * කුඩා ගෝත්‍ර - අලීන, පක්ෂ, බහලානස්, ශිව, විශානි
  - එකිනෙක ගෝත්‍ර අතර බල අරගල ඇති වී ජය ගන්නවුන් බලවත් වීම
  - මෙවැනි ප්‍රකට බල අරගලයක් ලෙස භරත ගෝත්‍රයේ රාජන් වූ සුදාස්ට එරෙහි ව වෙනත් ගෝත්‍ර දහයක් සටනට පැමිණීම දැක්විය හැකි විම
  - මෙය වෛදික ගීතිකාවල දසරාඥය යුද්ධය ලෙස හඳුන්වා තිබීම
  - මෙම යුද්ධය ජයගත් සුදාස් පසු ව අජ, ශිශ්රු, යක්ෂ යන අනාර්ය ගෝත්‍ර තුනක්ද ජය ගැනීම
  - මේ අනුව ඉන්දියාව භාරත දේශය ලෙස හැඳින්වීමේ දී මෙම බලවත් භරත ගෝත්‍රයේ කීර්තිය හේතු වූ බවට මතයක් ඉදිරිපත් වී තිබේ.
  - ඍග් වෛදික පාලන ඒකක පහත ආකාරයට ගොඩනැගී තිබීම

- * ගම් - කුඩා ම ඒකකය වීම, ගම පවුල්වලට සීමා වීම, ග්‍රාමණී එහි ප්‍රධානයා විය.
  * විශ් - ගම් කීපයක් එකතු වී නිර්මාණය වීම, විශ්පති එහි ප්‍රධානියා වීම
  * ජන - විශ් කීපයක් එකතු වීමෙන් නිර්මාණය වීම. 'රාජන්‍ය' එහි ප්‍රධානයා වීම
- එසේ ම සභා හා සමිති යනුවෙන් මණ්ඩල දෙකක් පාලනයේ දී වැදගත් වීම
  * සභා - ගෝත්‍රයේ වැඩිහිටියන්ගෙන් සමන්විත මණ්ඩලය
  * සමිති - සියලු ම ගෝත්‍රික ප්‍රජාව නියෝජනය වූ මණ්ඩලය
- රාජ්‍ය පාලනයට සහාය වූ නිලධාරීන් හා ඔවුන්ට අයත් කාර්ය රැසක් පිළිබඳ ව සඳහන් වීම
- පුරෝහිත, සේනානි, විශ්පති, ග්‍රාමණී එවැනි නලධාරීන්ට අයත් වේ.
- රජු රාජ්‍ය දේපළවල අයිතිකරුවා නොවන බවත් යුද්ධයට අධිපතියා බවත් වේද ගීතිකාවල සඳහන් වීම
- රාජ්‍යයේ ආරක්ෂාවට ක්‍රමානුකූල ආරක්ෂක සංවිධානයක් ගොඩනගා තිබීම
  * සංග්‍රාමවල දී සහභාගි වූ හමුදා ඒකක ශ්‍රද්ධා, ව්‍රෘත, ගණ ලෙස හඳුන්වා තිබීම
  * ප්‍රධාන යුද්ධායුධ ලෙස දුන්න සහ ඊතලයත්, සෙසු ආයුධ ලෙස කුන්තායුධ, කඩු, පොරෝ, කැටපොලු, හෙල්ල ආදි ආයුධත් සඳහන් වීම
  * සෙසු ආරක්ෂක උපක්‍රම ලෙස යුද්ධ ඇඳුම්, යුද්ධ බලකොටු ආදිය පිළිබඳ ව තොරතුරු රැසක් සඳහන් වීම
- රාජ්‍ය පාලන කටයුතු මනා ව පවත්වාගෙන යාමේ දී 'චාර' නම් වූ චරපුරුෂ සේවාවක් පවත්වාගෙන යාම
- රටේ නීතිය හා සම්ප්‍රදායය 'ධර්මන්' ලෙසත්, දඬුවම 'දණ්ඩ' ලෙසත් හඳුන්වා තිබීම

- **ඍග් වෛදික සමාජ රටාව**

- ගෝත්‍රික හා ග්‍රාමීය ලක්ෂණවලින් යුක්ත සමාජයක් පැවතීම (එහෙත් දැනට ලැබී ඇති පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය අනුව ප්‍රාථමික ගණයේ සමාජයක් නොවන බව තහවුරු වී ඇත)
- පිතෘ මූලික සමාජයක් පැවතීම
- ඍග් වේදය අනුව පුතුන්ගේ ඉපදීම වඩාත් අගය කිරීම
- බහු ස්ත්‍රී සේවනය පැවති පිළිබඳ ව ඍග් වේදයේ දැක්වීම
- එහෙත් ළමා විවාහ නොපැවතීම
- වැන්දඹු ස්ත්‍රියට යළි විවාහ වීමට අයිතිය පැවතීම
- විවාහයේ දී සහකරු හෝ සහකාරිය හෝ තෝරාගැනීමේ අයිතිය ඔවුන්ට හිමි වීම
- ආගමික කටයුතුවලට ස්වාමියා හා සමාන ව සහභාගි වීමට ස්ත්‍රියට හැකි වීම
- විශ්වවාරා, අපාලා, ඝෝෂා වැනි ස්තෝත්‍ර ප්‍රබන්ධයට දක්ෂ උගත් කාන්තාවන් පිළිබඳ ව සඳහන් වීම
- ප්‍රධාන රජ බිසව (පලාගලි) සහ ඇයගේ දුව රාජ සභාවේ අනිවාර්යයෙන් සිටිය යුතු බව
- පැහැදිලි වර්ණ භේදයක් නොවූව ද ආර්ය හා අනාර්ය භේදයක් දක්නට ලැබීම
- කිරි, ගිතෙල්, පලතුරු, තිරිඟු, බාර්ලි සහ ධාන්‍ය වර්ග ප්‍රධාන ආහාර වශයෙනුත් විශේෂ උත්සව අවස්ථාවන්හි දී මස් මාංසත් අනුභවයට ගැනීම
- සුරාව පැවති අතර උත්සව අවස්ථාවල සෝම යුෂ පානය කිරීම
- කොටස් 4කින් යුක්ත වාම් ඇඳුමක් දක්නට ලැබීම
  * නිවි - යටි කය ඇඳුම
  * පරිදෝන - උඩුකය ඇඳුම
  * අධිවාස - උතුරු සළුව
  * හිස්වැස්ම
- ලෝම, කපු, මුවහම් ආදියෙන් වස්ත්‍ර සැකසීම
- පිරිමින් හිස් ආවරණය කර සිටීම

- ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම ආභරණ පැලඳීම
  * කර්ණ සොභන - කර්ණාභරණයක්
  * කුරිර - ස්ත්‍රී හිස් පලඳනාවක්
  * න්‍යොචානි - මනාලියන් පැලඳ සිටි ආභරණයක්
  * නික්ෂ - ගෙල මාලයක්

- **ඍග් වෛදික ආර්ථික රටාව**

- කෘෂි කර්මාන්තය ප්‍රධාන කොටගත් ග්‍රාමීය කෘෂි ආර්ථිකයක් පැවතීම
- කෘෂි කටයුතුවලට ජලය ලබාගැනීමට වාරික්‍රම භාවිත කළ බව හෙළි වීම
- එහි දී සත්ත්ව පාලනයට ද වැදගත් තැනක් ලැබීම
  * වගා කළ බෝග වර්ග - වී, තිරිඟු, කපු, බාර්ලි සහ තෙල් ලබා ගත හැකි ධාන්‍ය වර්ග
  * ඇති කළ සත්තු - ගවයෝ, අශ්වයෝ, එළුවෝ, බල්ලෝ, බැටළුවෝ
- ගවයන් කෘෂි කටයුතුවලට විශාල දායකත්වයක් ලබා දුන් අතර, පවුලක වත්පොහොසත්කම මනින ඒකකයක් ලෙස ද වැදගත් වීම
- විවිධ කර්මාන්ත හා වෘත්ති රැසක් පිළිබඳ ව සඳහන් වීම
  * විවිධ කර්මාන්ත - පේෂ කර්මාන්තය, ලෝහ කර්මාන්තය, හම් කර්මාන්තය
  * විවිධ වෘත්ති - වෛද්‍ය වෘත්තිය, රන් කරු වෘත්තිය, ලෝකුරු වෘත්තිය
- භාණ්ඩ හුවමාරු ක්‍රමය මූලික කර ගත් වාණිජ රටාවක් පවත්වාගෙන යාම
- ගංගා ඉවුරු ඔස්සේ විහිදුණු ගොඩබිම් මාර්ග මෙන් ම ගංගා ඔස්සේ විහිදුණු ජල මාර්ගයන් ද භාණ්ඩ ප්‍රවාහනයට යොදා ගැනීම
- ඍග් වේදයේ 'නිෂ්ක' නමින් හැඳින්වූ කිසියම් මුදල් ඒකකයක් පිළිබඳ ව සඳහන් වීම
- වෙළෙඳ කටයුතුවලදී ඉන්ද්‍ර දෙවියාගේ පිළිමයකට දෙනුන් දහයක් දීම පිළිබඳ ව සඳහන් වීම
- එසේම තෑගි දීමේදී නිෂ්ක 100ක් හෝ අශ්වයින් 100දෙනකුගේ දුන් අවස්ථා ඍග් වේදයේ සඳහන් කිරීම
- ඍග් වේදයෙහි 'සමුද්‍ර' යන්න සඳහන් වීමත්, 'බුජ්ජු' නැමැත්තකුගේ හබල් සීයකින් යුක්ත යාත්‍රාවක් මුහුදේ දී අනතුරට ලක් වූ විට අස්වින් දේවතාවා ඔහු ගලවාගත් බව සඳහන් වීමත් නිසා විදේශ වෙළෙඳාම පවතින්නට ඇතැයි විද්වතුන් පෙන්වා දීම
- ක්‍රි.පූ 1500ට අයත් හෝසස්කෝයි අභිලේඛන අනුව ඔවුන් වෛදික යුගයේ දී ඔවුන් ෆිනීසියානුවරුන් සමඟ වාණිජ සම්බන්ධතා තිබූ බව පැහැදිලි ව ම හඳුනාගෙන ඇත.

- **ඍග් වෛදික ආගමික තත්ත්වය**

- ස්වභාව ධර්මයේ විවිධ වස්තූන්ට බලවේගයන්ට දේවත්වයක් ආරෝපණය කර වන්දනා කිරීම
- මෙලෙස දේව මණ්ඩලයක් පිළිබඳ ව සඳහන් වන හෙයින් බහු දේවවාදී ආගමික රටාවක් ඉස්මතු වීම
- මෙම දේව පිරිස් ප්‍රධාන කොටස් තුනකට බෙදා තිබීම
  * ආකාශ - වරුණ, චිත්‍ර, සාවිත්‍රී, සුසාන්, සූර්ය, විෂ්ණු, උෂා
  * අන්තරීක්ෂ - ඉන්ද්‍ර, රෞද්‍ර, වායු, පර්ජන්‍ය
  * පෘථිවි - පෘථිවි, අග්නි, සෝමා, බ්‍රහස්පති, ගංගා
- මේ එක් එක් දෙවියා ස්වභාව ධර්මයේ විවිධ අංග නියෝජනය කිරීම
  * ඉන්ද්‍ර - ශක්තිය, වැස්ස, මේඝ ගර්ජනා යනාදියට අධිපති
  * වරුණ - ජලයට අධිපති හා ශාක හා සත්ත්ව ජීවිත පවත්වාගෙන යාමට
  * අග්නි - ගින්නට අධිපති නිවසට අධිගෘහිත දෙවියා
  * යම - මරණයට අධිපති
  * සූර්ය - දවසට අධිපති
  * පෘථිවි - පොළොවට අධිපති
  * උෂා - උදෑසනට අධිපති
  * සෝම - සඳු දෙවියා

- බොහෝ දෙවිවරුන්ට පූජා කරන ජනප්‍රිය පූජා ද්‍රව්‍යයක් වූ සෝම පානය සෝම දෙවියා ලෙස ද වන්දනයට පාත්‍ර වීම
- දෙවිවරුන් බහුතරයක් යහපත් ක්‍රියාවන්ට ආරූඪ කොට තිබුණත් රුද්‍ර පමණක් අයහපතට ආරූඪ කර තිබීම
- වෛදික දෙවිවරුන් පිදීමට ඍග් වේදයේ විවිධ ස්තෝත්‍ර ගීතිකා 1028 කින් වැඩි ප්‍රමාණයක් යොදාගෙන තිබීම
- යඥය නම් වූ ආගමික කාර්යය ඉතා කුඩාවට 'ගෘහ යාග' ලෙස මෙකල ආරම්භ වීම
- පවුලේ සියල්ලන් සමඟින් ගෘහ මූලිකයා පවත්වන මෙවැනි යාගයක දී වේද ගීතිකා ගයමින් දෙවියන් වෙත කිරි හා සෝම පැළෑටියේ යුෂ පූජා කිරීම
- දෙවියන් හා මිනිසුන් සම්බන්ධ කළ අතරමැද දෙවියා ලෙස අග්නි දෙවියා වැදගත් වීම
- මෙම ආගමික සංකල්ප තව දුරටත් විකාශනය වීමෙන් පශ්චාද් වෛදික යුගයේ ආගමික තත්ත්වය සකස් වීම

**පශ්චාද් වෛදික යුගය**

ඍග් වෛදික ආර්යයන් ක්‍රමයෙන් තම බලය ස්ථාවර කර පරිපාලන සංවිධානය සකස් කර ගනිමින් ස්ථාවර තත්ත්වයට පත් වීමත් සමඟ පශ්චාද් වෛදික යුගය ආරම්භ වේ. සප්ත සින්දු ප්‍රදේශයේ සිටි ජනයා නැඟෙනහිර ගංගා නිම්නයට සංක්‍රමණය වීම පශ්චාද් වෛදික යුගයේ ප්‍රධාන වෙනස වේ. එසේ ම රාජ්‍යයකට නිශ්චිත භූගෝලීය සීමාවන් නිර්ණය වීම අනෙක් වැදගත් කරුණ වේ. රජු කේන්ද්‍ර කොට ගනිමින් පරිපාලන තන්ත්‍රයක් ගොඩනැඟීම මෙකල සිදුවන අතර සමාජය නිශ්චිත ලෙස චතුර්වර්ණයට අනුව ගොඩනැඟීම ද මෙකල සිදු වේ. ක්‍රි.පූ 900 සිට ක්‍රි.පූ 600 ආසන්න කාලයට මෙම අවධිය අයත් වේ. යජුර්, සාම, අථර්වන් යන වේද ග්‍රන්ථත්, බ්‍රාහ්මණ, ආරණ්‍යක මෙන් ම උපනිෂද් යන ග්‍රන්ථ මේ යුගය පිළිබඳ ව තොරතුරු රැසක් අනාවරණය කරයි. ඒවා පහත සඳහන් තේමාවන් ඔස්සේ වෙන් වෙන් ව පෙන්වා දිය හැකි ය.

- **පශ්චාද් වෛදික දේශපාලන රටාව**
  - ඍග් වෛදික යුගයේ පැවති සරල පාලන රටාව සංකීර්ණ තත්ත්වයට පත් වීම
  - රජවරුන්ගේ බල පරාක්‍රමය වැඩි වී ඔවුන් සුවිශේෂ ආකාරයට වර්ග කරනු ලැබීම.
  - ඓතරීය බ්‍රාහ්මණයේ පහත ආකාරයට රජුන් බෙදා දක්වයි
    - * සම්‍රාට් (අධිරාජ) - පෙරදිග රජවරු
    - * භෝජ - දකුණේ රජවරු
    - * විරාට් - උතුරේ රජවරු
    - * රාජන් - මධ්‍යම ප්‍රදේශයේ රජවරු
  - පාලකයන්ට දේවත්වය ආරෝපණය කිරීම (රජු පෘථිවියේ දෙවියා ලෙස මනුස්මෘතියේ සඳහන් වීම
  - රාජ්‍යත්වය පාරම්පරික ව උරුම වීමේ සම්ප්‍රදායයක් ඇති වීම
  - අශ්වමේධ, රාජසූය වැනි මහා යාග හෝම චාරිත්‍ර හරහා පාලකයාගේ බලය ඉස්මතු කොට පෙන්වනු ලැබීම
  - ග්‍රාම, විශ්, ජන යන පාලන බෙදීම් තව දුරටත් පුළුල් වීම
  - සමිති හා සභා යන පාලන සංවිධාන තව දුරටත් පැවති නමුත් රජුට ඒවා යටත් වීම.
  - රජුගේ පාලනයට සහාය දක්වූ රත්නීන් හෙවත් රාජකර්ණඃ යනුවෙන් හැඳින්වූ නිලධාරීන් රැසක් සිටි බව ශතපථ බ්‍රාහ්මණයේ සඳහන් වීම
    - * පුරෝහිත - රජුගේ උපදේශක
    - * සේනානි - සෙන්පතිවරයා
    - * ග්‍රාමණී - රජුගේ බලතල ගම්වල ක්‍රියාත්මක කරන්නා
    - * සංග්‍රහිත්‍රි - භාණ්ඩාගාරික
    - * භාගදුග - ආදායම් නිලධාරී
    - * අක්ෂාවාෂ - සුදු පාලක
    - * උග්‍ර - පොලිස් නිලධාරී

  * ගොවිකර්තන - රජුට දඩයමේ දී සහයවන නිලධාරියා
  * ක්ෂත්‍රී - ඡත්‍ර දරන්නා
  * චාර - චර පුරුෂයා

- රජුට ගෙවිය යුතු බදු (බලි) සිය නිෂ්පාදනයන්ගෙන් හෝ ගවයන් ගෙන් හෝ ගෙවිය යුතු වීම
- අධිකරණයේ ප්‍රධානයා රජු බව සඳහන් වීම
- රජුගේ නියෝගයන් අනුව ග්‍රාමණීවරුන් විසින් මෙම දඬුවම් ක්‍රියාත්මක කරන ලදි.

- **පශ්චාද් වෛදික සමාජ රටාව**

- ගෝත්‍රික සමාජය තව දුරටත් ස්ථාවර තත් ත්වයට පත් වීම
- ඍග් වේදයේ දහ වන මණ්ඩලයේ පුරුෂ සුක්ත වේදයෙන් චතුර් වර්ණ ක්‍රමයේ ආරම්භය පිළිබඳ ව අදහසක් ඉදිරිපත් කිරිම
- මෙම සංකල්පය නිසා බ්‍රාහ්මණයන්ගේ බලය බෙහෙවින් වර්ධනය වීම
- ක්ෂත්‍රියන් රාජ්‍ය පාලනයත්, වෛශ්‍යයන් ගොවිතැන හා වෙළෙඳාමත් ශුද්‍රයන් ඉහළ වර්ණවලට සේවා කිරීමත් සිදු වීම
- මේ හැර නේෂාද නම් කුලයක් පැවති අතර එය තවත් කොටස් අටකට බෙදා තිබිණි.

  * ව්‍රත * තක්ෂාන්
  * පංජිෂ්ඨ * රථකාර
  * ගවානිස් * කුළාල
  * මෘගාසු * කර්ථාර

- මෙකල සමාජය හැඩ ගැස්වූ තවත් සංකල්පයක් වන්නේ බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසී යන වර්ණාශ්‍රම ධර්මය
- වර්ණාශ්‍රම ධර්ම අනුව ජීවිතයේ විවිධ අවස්ථාවලදී සිදු කළ සංස්කාර විධි රැසක් පිළිබඳ ව සඳහන් වීම
  * ගර්භ පරිධාන කර්මන් - දරුවෙකු කුස තුළ පිළිසිඳ ගැනීම
  * නාමකරණ කර්මන් - නම් තැබීම
  * චූඩා කර්මන් - කෙස් කැපීම
  * අන්නප්‍රාසාන කර්මන් ඉඳුල් කටගෑම
  * උපනයන කර්මන් - බ්‍රහ්මචාරී ජීවිතයේ ආරම්භය
  * චතුර්හි කර්මන් - විවාහය
  * අන්ත්‍යෝෂ්ටී කර්මන් - අවමංගල්‍යය
- කාන්තාවට තිබූ නිදහස වේගයෙන් අහිමි වී යාම
- ඒකභාර්යා සේවනය මෙන් ම බහුභාර්යා සේවනය ද දක්නට ලැබීම
- වැන්දඹු ස්ත්‍රියකට නැවත විවාහ වීමට තිබූ නිදහස අහිමි වී ගිය බව ඇතැම් මූලාශ්‍රයවල සඳහන් කළද එය තදින් නොපැවති බව හඳුනාගත හැකි වීම
- ඇඳුම් පැලඳුම් ඍග් වෛදික යුගයේ පැවති තත්ත්වයෙන් යම් යම් වෙනස්කම් සිදු වීම
- විනෝදාංශ ලෙස ගායනය, වාදනය, නර්තනය, දූ කෙළිය, රිය ධාවනය පැවතීම
- ආහාර රටාව ඍග් වෛදික යුගයේ ස්වරූපයට ම පැවති අතර සෝම පානය පෙරට වඩා ජනප්‍රිය වීම

- **පශ්චාත් වෛදික ආර්ථික රටාව**

- ඍග් වෛදික යුගයේ පැවති ආකාරයටම කෘෂිකර්මය, සත්ත්ව පාලනය, වෙළෙඳාම යන ආර්ථික කටයුතුවලට ප්‍රධානත්වය ලැබීම
- එහෙත් පෙරට වඩා මෙම ආර්ථික කටයුතු සංවිධානාත්මක ව හා පුළුල් ව සිදු කිරීම
- ජනගහනයේ වර්ධනය, ජනාවාස ව්‍යාප්තියත් සමඟ ගංගා නිම්න ආශ්‍රිත දියුණු කෘෂිකර්මාන්තයක් සිදු කිරීම

- ගවයන් 24 දෙනෙකු බඳින ලද නඟුලක් පිළිබඳ ව මූලාශ්‍රයවල සඳහන් වීම
- අස්වැන්න දියුණු කරගැනීමට යාගහෝම, මන්ත්‍ර ආදිය යොදා ගැනීම
- කෘෂිකාර්මික කටයුතුවලට මෙන් ම යාග හෝම කටයුතු සඳහා ද, සතුන් යොදා ගැනීම නිසා සත්ත්ව පාලනය පෙරටත් වඩා පුළුල් ව සිදු කිරීම
- යජුර් වේදයෙහි මසුන් ඇල්ලීම, රෙදි විවීම, ලණු ඇඹරීම, ලෝහ කර්මාන්තය යන ජීවනෝපාය පිළිබඳ ව සඳහන් කර තිබීම
- කෘෂිකාර්මික නිෂ්පාදනයන්ගෙන් 1/6ක්, 1/8ක්, 1/10ක් ආදි කොටසක් රජයට බදු ලෙස අය කර ගැනීම
- ගව සම්පතින් 1/5ක් හා වාණිජ භාණ්ඩවලින් 1/20ක් ලෙස බදු අය කළ බව සඳහන් වීම
- වෙළෙඳාමේ දී භාණ්ඩ හුවමාරුව මෙන් ම මුදල් භාවිතය ද පැවතීම
- තඹ, යකඩ, මැටි හා පාෂාණ ඇදියෙන් සෑදූ උපකරණ හා මෙවලම් භාවිත වූ බව සඳහන් වීම
- වෛදික ග්‍රන්ථයන්හි පහත සඳහන් වෘත්තීන් පැවති බව සඳහන් වීම

  * පැදුරු විවීම
  * කම්මල් වැඩ
  * ජ්‍යොතිෂ කටයුතු
  * මසුනු මැරීම
  * එඬරු වෘත්තිය
  * බෝට්ටු පැදැවීම
  * රෙදි සේදීම
  * හම් කර්මාන්තය
  * වඩුකම
  * රන් කරුවන්
  * මැණික් වෙළෙඳාම
  * මැණික් ගැරීම
  * මැටි භාණ්ඩ නිෂ්පාදනය
  * පණිවිඩ ගෙනයාම

- අභ්‍යන්තර මෙන් ම බාහිර වෙළෙඳාම ද පැවති බව සඳහන් වීම
- ගොඩබිම් ප්‍රවාහන කටයුතුවලට අලි, ඇතුන්, අශ්වයන් හා ගවයන්ද, අශ්වයන් යෙදූ රෝද දෙකේ රථ ද යොදා ගැනීම
- උදේනි, කෞශම්බි, බරණැස, ශ්‍රාවස්ති, අහිච්ඡත්‍ර වැනි කුඩා වෙළෙඳ නගර බිහිවීම

- **පශ්චාද් වෛදික යුගයේ ආගමික තත්ත්වය**

- ඍග් වෛදික ආගමික සංකල්ප තව දුරටත් විකාශනය වී බහුදේවවාදය ඒක දේවවාදයක් බවට පත් වීම
- ඍග් වෛදික පැරණි දෙවිවරුන් රාශියකගේ බලවත් බව නැති වී ඔවුන් නොවැදගත් තත්ත්වයට පත් වීම
- විෂ්ණු, ඊශ්වර, බ්‍රාහ්ම යන දෙවිවරුන් **(ත්‍රිමූර්තිය)** ජනප්‍රිය සංකල්පයක් බවට පත් වීම
- ඒ අතරින් ද ප්‍රජාපති හෙවත් මහා බ්‍රහ්මයා පෙරමුණට පැමිණීම
- මේ සමඟ ම ඍග් වෛදික සරල යාගය සංකීර්ණ තත්ත්වයට පත් වීම
- සරල ගෘහ යාගය මහා යාගයක් වී සතුන් පමණක් නොව මිනිසුන් ද බිලි දීම තෙක් වර්ධනය වීම
- මේ මගින් බ්‍රාහ්මණයාගේ තත්ත්වය ඉහළ යෑම නිසා ඔහු පොළොව මත හැසිරෙන දෙවියන් යන අරුත දෙන '**භූසුරු**' යන නමින් හැඳින්වීම
- දෙවිවරුන් තමන් කියන ආකාරයට කටයුතු කරන සේවක පිරිසක් ලෙසට සලකා බ්‍රාහ්මණයන් ක්‍රියා කිරීම
- න්‍යාය ග්‍රන්ථවල එසේ සඳහන් වුවත් ප්‍රායෝගික ව සමාජයේ එසේ සිදු නොවූ බව වෙනත් මූලාශ්‍රයවලින් පෙනී යෑම.
- ආරණ්‍යක හා උපනිෂද් වැනි යුගයක් කරා එළඹීමත් සමග බ්‍රාහ්මණ සංකල්පයට එරෙහි ව ශ්‍රමණ සම්ප්‍රදායක් ඉස්මතු වීම
- ඒ අනුව හිංසාකාරී යඥය පදනම් කරගත් 'කර්ම මාර්ගය' වෙනුවට (භක්තිවාදය) චින්තනයෙහි නව ප්‍රවණතාවයක් ඇති කරමින් ඥාන මාර්ගය ඉස්මතු වීම
- එහි දී බ්‍රාහ්මණ බලය පිරිහී ධ්‍යාන වඩන තවුසන්ට ප්‍රමුඛතාව ලැබීම
- ක්ෂත්‍රියයන් උපනිෂද් දර්ශනයේ පුරෝගාමීන් වීම

- උපනිෂද් දර්ශනයට අනුව මෝක්ෂය ලැබීමට ඉන්ද්‍රියයන් පිනවීමෙන් මුළුමනින් ම වැළකිය යුතු බව සඳහන් වීම
- යාඥවල්ක්‍ය මුනිවරයා උපනිෂද්වලින් පිළිබිඹු වන ගුණ දහම්වල උත්තරීතර අවස්ථාව තම භාර්යාවට පෙන්වා දුන් බව එහි උපදේශාවලියේ සඳහන් වීම
- මිනිස් ජීවිතයට මරණින් මතු සිදු වන්නේ කුමක් ද යන දාර්ශනික ප්‍රශ්නය ගැන ද වැඩි අවධානයක් යොමු වීම
- මේ පසුබිම මඟින් පසු කාලීන ව දාර්ශනික හා ආගමික මතවාද රාශියක් ඉස්මතු වීම
- බුදුන් වහන්සේගේ දර්ශනයට පවා බලපෑවේ උපනිෂදය යි.

ඇගයීම - 01

**අංක 01 සිට 03 තෙක් එක් එක් ප්‍රශ්න සඳහා නම් පහ ඉගින් දී ඇත. ඒවා එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුල ලියන්න.**

(1) 1. ස්ටෙප්ස් 2. හංගේරියන් තැන්න 3. හිමාලය 4. ඉරානය 5. සප්ත සින්දු
(..............)

(2) 1. භරත 2. තුර්වෂ 3. අලීන 4. යදු 5. පුරු
(..............)

(3) 1. පෘථිවි 2. අග්නි 3.බ්‍රහස්පති 4.ඉන්ද්‍ර 5. ගංගා (..............)

**අංක 04 සිට 06 තෙක් සැම ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුල ලියන්න.**

(4) වර්ණාශ්‍රම ධර්මවලට අනුව අන්නප්‍රාසාන කර්මන් යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
1. කෙස් කැපීම 2. විවාහය 3. ඉඳුල් කට ගෑම 4. අවමංගල්‍යය 5. බ්‍රහ්මචාරී ජීවිතයේ ආරම්භය
(..............)

(5) පශ්චාද් වෛදික යුගයේ ආර්ථික කටයුතුවල දී වැදගත් වූ වෙළෙඳ නගරයකි.
1. අහිඡත්‍ර 2. රජගහ 3. ඉන්ද්‍රපස්ථ 4. පාටලීපුත්‍ර 5. ගන්ධාර (..............)

(6) ත්‍රිමූර්තිය ලෙස හඳුන්වන්නේ මින් කවරක් ද?
1. බ්‍රහ්ම, ඉන්ද්‍ර, විෂ්ණු 2. විෂ්ණු, ඊෂ්වර, බ්‍රහ්ම 3. ඊෂ්වර, වරුණ, විෂ්ණු
4. බ්‍රහ්ම, ඉන්ද්‍ර, වරුණ 5. වරුණ, විෂ්ණු, ඊෂ්වර
(..............)

**අංක 07 සිට 08 තෙක් සැම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය වරහන තුල ලියන්න.**

(7) ඍග් වෛදික යුගය
1. රටේ නීතිය හා සම්ප්‍රදාය ධර්මන් ලෙසත් දඬුවම දණ්ඩ ලෙසත් හැඳින්වීම
2. ළමා විවාහය පැවතීම
3. පුරුෂයන්ට හා සමාන ව ස්ත්‍රියට ද ආගමික කටයුතුවලට සහභාගි විය හැකි වීම
4. දෙවියන් හා මිනිසුන් සම්බන්ධ කළ අතරමැදියා වුයේ අග්නි දෙවියන් ය.
5. පාලන කටයුතුවල දී සභා හා සමිති නම් මණ්ඩල දෙකක් පැවතීම

(..............)

(8) පශ්චාද් වෛදික යුගය
1. රාජ්‍යත්වය පාරම්පරික ව උරුම වීමේ සමප්‍රදාය ඇති වීම
2. චතුර්වර්ණ ක්‍රමය පිළිබඳ අදහස් ඉස්මතු වීම
3. අධිකරණයේ ප්‍රධානියා රජු ය.
4. ත්‍රිමූර්තිය ජනප්‍රිය සංකල්පයක් බවට පත් වීම
5. බහු දේවවාදය තවදුරටත් ක්‍රියාත්මක වීම

(..............)

**අංක 09 සිට 10 තෙක් ප්‍රශ්නවලනාම x හා y තීරුවල දක්වා ඇත. y තීරුවේ දී ඇති නාම x තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ අනුපිළිවෙළට නොවේ. y තීරුව x නිවැරදි ව ගලපා ඇති පිළිතුර තෝරා කඩ ඉරි මත ලියන්න.**

**09.**

| | x | | y |
|---|---|---|---|
| (i) | උතුරු සළුව | A | බෘහස්පති |
| (ii) | පෘථිවි | B | සාවිත්‍රි |
| (iii) | ආකාශ | C | අධිවාස |
| (iv) | වර්ණාශ්‍රම | D | ව්‍රත |
| (v) | නෛෂාද | E | සන්‍යාසි |

**(1)** BAECD **(2)** CDAEB **(3)** BACDE **(4)** CABED **(5)** DECBA (................)

**10.**

| | x | | y |
|---|---|---|---|
| (i) | ප්‍රජාපති | A | මහා බ්‍රහ්ම |
| (ii) | බ්‍රාහ්මණ | B | රාජකර්ණ |
| (iii) | රත්නීන් | C | මේස |
| (iv) | ඉන්ද්‍ර | D | නිෂ්ක |
| (v) | මුදල් | E | භූසුර |

**(1)** ABECD **(2)** DACBE **(3)** AEBCD **(4)** BDAEC **(5)** DBCAE (................)

ඇගයීම - **02**

1. වෛදික යුගයේ සමාජ රටාව පශ්චාද් වෛදික යුගය වන විට වෙනස් වන ආකාරය විස්තර කරන්න.

   (ලකුණු 14)

2. ''වෛදික යුගයේ පැවැති බහුදේව වාදය ඒක දේවවාදයක් බවට පත් විය''.

   i. වෛදික යුගයේ පූජෝපහාරයට පාත්‍ර වූ දෙවවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

   ii. බහුදේවවාදය හා ඒකදේවවාදය පැහැදිලි කරන්න. (ලකුණු 04)

   iii. ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 07)

## 5. දේශපාලන හා මානව චින්තාවලියේ වර්ධනය

ක්‍රි.පූ. හවන සියවස වන විට ඉන්දියාවේ ගොඩනැඟී තිබූ දේශපාලන හා පරිපාලන රටාව ක්‍රමික ව වර්ධනය වූවක් බව මූලාශ්‍රය මගින් තහවුරු වේ. ඍග් වෛදික යුගයේ දී ගෝත්‍ර වශයෙන් සංවිධානය වූ කණ්ඩායම් පසු ව ගම් හා ජනපද බිහිකර ගන්නා අයුරු ද ඉක්බිති ජනපද රාජ්‍ය, අධිරාජ්‍ය වශයෙන් වර්ධනය වන අයුරු ද දක්නට ලැබේ. ගෝත්‍ර නායකත්වය රාජ්‍යත්වය දක්වාත්, රාජ්‍යත්වය අධිරාජ්‍යත්වය දක්වාත් වර්ධනය වීමේ දී පාලකයාගේ සහයට කාර්ය මණ්ඩලයක් ද වර්ධනය විය. එසේ ම තත්කාලීන ආර්ථික, සමාජ රටාවන්ට සංවේදී වෙමින් දේශපාලන රටාව කාලානුරූප ව හැඩ ගස්වා ගැනීමට පාලකයන් විසින් ක්‍රියා කරන ලදි. ඉන්දියාවේ මුල් වෛදික යුගයේ පැවති ආගමික පසුබිම තුළ දාර්ශනික ප්‍රවේශයක් දක්නට නොලැබිණි. එහෙත් පශ්චාත් වෛදික යුගයේ අවසන් භාගයේ දී කිසියම් දාර්ශනික සංකල්ප සහිත ආගමික පරිසරයක් ගොඩනැගුණි. මේ වන විට සමාජයේ විශාල පිරිසක් වර්ණ භේදවාදය මුල්කර ගත් බ්‍රාහ්මණ සංකල්ප නිසා පීඩාවට පත් වී සිටියහ. එතෙක් ක්‍රමික ව වර්ධනය වූ දාර්ශනික සංකල්පයන් ක්‍රි.පූ. හවන සියවසේ දී සංවිධානාත්මක ආගම් තෙක් වර්ධනය විය. එම බොහෝ දර්ශනයන් මඟින් බ්‍රාහ්මණ සංකල්ප පැවති හිංසාකාරී සංකල්පයන් ප්‍රතික්ෂේප කරන ලදි.

**නිපුණතාව :**
- ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවනතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම:** 5.1 සොළොස් මහා ජනපද ව්‍යාප්තිය පිළිබඳ විස්තර කරයි.

**කාලච්ඡේද ගණන:** 15

**ඉගෙනුම් පල:**
- සොළොස් මහා ජනපද පිළිබඳ ව විස්තර කරයි.
- සොළොස් මහා ජනපදවල බලවත් රාජ්‍ය පෙන්වා දෙයි.
- සොළොස් මහා ජනපද සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**සොළොස් මහා ජනපද බිහි වීමට බලපෑ ඓතිහාසික පසුබිම**

- පශ්චාද් වෛදික යුගයේ අවසානය වන විට ආර්යයන් ගංගා නම් ගං නිම්නයේ විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වීම
- එහි දී ස්ථිර ජනාවාස ගොඩනගා ඒවායේ ගෝත්‍රිකත්වය ඉක්මවූ ස්ථාවර වූ පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාව මතු වීම
- එසේ ස්ථාවරත්වයට පත් වීමේ දී දුර්වල ගෝත්‍ර යටපත් කර ප්‍රබල ගෝත්‍ර ඉස්මතු වී පසු ව ඒවා මහා ජනපද තෙක් විකාශනය වීම
- එසේ පුළුල් දේශපාලන ඒකක ගොඩනැඟීමට උතුරු ඉන්දියාවේ භූගෝලීය පසුබිම ඉවහල් වීම.
- උතුරු ඉන්දියාවේ පැවති වටිනා ආර්ථික සම්පත් රැසක් භාවිතයට ගැනීම
- කෘෂි හා වාණිජ කටයුතුවලින් ධනවත් වූ සමකාලීන සමාජයට ස්ථාවර දේශපාලන ඒකකයන්හි අවශ්‍යතාව දැඩි ව දැනීම
- ඒ අනුව ක්‍රි.පූ. හවන සියවස වන විට උතුරු ඉන්දියාවේ ස්ථාවර දේශපාලන ඒකක දහසයක් (සොළොස් මහා ජනපද) ඉස්මතු වීම

- **සොළොස් මහා ජනපද හඳුනා ගැනීම**

  - බෞද්ධ, ජෛන සහ වෙනත් සාහිත්‍ය මූලාශ්‍රය සඳහන් තොරතුරු මඟින් වැදගත් ජනපද දහසයක් හඳුනාගත හැකි වීම
  - අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේදි, වත්ස, කුරු, පංචාල, මත්ස්‍ය, සූරසේන, අවන්ති, ගන්ධාර, කාම්බෝජ ලෙස ඒවා හඳුනාගෙන තිබීම
    * අංග : මෙහි අගනුවර චම්පා නගරය යි. ඉන්දියාවේ නැගෙනහිර සීමාවට ආසන්න ව පිහිටා තිබිණි.
    * මගධ : මෙහි අගනුවර අවස්ථා තුනක දී වෙනස් විය. එනම් ගිරිව්‍රජ, රාජගෘහ (රජගහ නුවර) පාටලීපුත්‍ර වශයෙනි. සියලු ජනපද අතුරින් බලවත් ම රාජ්‍ය බවට මෙය පත් විය.
    * කාසි : බරණැස අගනුවර කර ගත් කාසි ජනපදයට ඉතා ඉහළ ආර්ථික වටිනාකමක් හිමි වී තිබුණි. කෝසලයට අයත් ව තිබූ මෙය පසු ව මගධය සතු විය.
    * කෝසල : භූගෝලීය වශයෙන් උතුරු හා දකුණු ලෙස දෙකඩ වූ මෙහි කුසාවතී හා සාවත්ති ලෙස පාලන මධ්‍යස්ථාන දෙකක් විය. ප්‍රසේනජිත් කොසොල් රජු විසින් මෙය ප්‍රබල රාජ්‍යයක් බවට පත් කරන ලදි.
    * වජ්ජි : වේසාලිය අගනුවර කර ගත් මෙහි සමූහාණ්ඩු පාලනයක් ක්‍රියාත්මක විය
    * මල්ල : කුසිනාරා හා පාවා යනුවෙන් අගනගර දෙකක් තිබිණි.
    * චේදි : සොත්ථිමතී මෙහි අගනුවර විය.
    * වත්ස : කෝසම්බිය අගනුවර කර ගත් මෙහි කැපී පෙනෙන පාලකයා වූයේ උදයන රජු ය.
    * කුරු : ඉන්ද්‍රප්‍රස්ථය හෙවත් ඉඳිපත් නුවර අගනුවර කර ගත් මෙහි බුද්ධකාලීන පාලකයා කෞරව්‍ය නම් විය.
    * පංචාල : අහිච්ඡත්‍ර හා කම්පිල්‍ය ලෙස අගනගර දෙකක් විය.
    * මත්ස්‍ය : අගනුවර මධුරා නගරය යි.
    * සූරසේන : මථුරා අගනුවර කර ගත් මෙය අවන්ති පුත්‍ර නම් පාලකයකු විසින් පාලනය කරන ලදි.
    * අස්මක : අස්මක ප්‍රතිෂ්ඨානය ඉහළ ප්‍රදේශයේ පිහිටා තිබිණි.
    * අවන්ති : මාහිෂ්මතී මුල් යුගයේ අගනුවර ලෙස තිබී පසු ව උජ්ජයිනියට මාරු විය. චණ්ඩපජෝත රජු මෙහි විසූ ප්‍රකට පාලකයෙකි.
    * ගන්ධාර : තක්ෂිලාව අගනුවර කර ගත් මෙහි වැදගත් පාලකයකු වූයේ පුක්කුසාති රජු ය.
    * කාම්බෝජ : ගන්ධාරයට උතුරින් හිමාලය ආසන්නයේ පිහිටි මෙම රාජ්‍යය පිළිබඳ තොරතුරු සීමිත ය.

**සොළොස් මහා ජනපදවල ක්‍රියාත්මක වූ පාලන ක්‍රම**

- **රාජාණ්ඩු පාලන ක්‍රමය**

  - ක්‍රි.පූ 6 වන සියවස වන විට මගධ, කෝසල, වත්ස, අවන්ති යන රාජ්‍යයන් ප්‍රධාන රාජාණ්ඩු ලෙස ඉස්මතු වීම
  - පාලනයේදී රජු ප්‍රධානයා ලෙස ක්‍රියා කිරීම
  - ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන අංශ තුනේ ම බලය රජු සතු වීම
  - එහෙත් පාලකයා ඒකාධිපතයකු ලෙස ක්‍රියා කිරීමට ඇති අවස්ථාව අවුරාලමින් 'මන්ත්‍රී පර්ෂද්' නම් මණ්ඩලය මඟින් රජුගේ බලය සීමා කිරීම
  - ඇත්, අස්, රිය, පාබල යන චතුරංගිණී සේනාවන් මඟින් මෙම රාජ්‍යයන්හි බලය ස්ථාවර කර ගැනීමට ක්‍රියා කිරීම
  - පශ්චාද් වෛදික යුගයේ දී රජුට සහය වූ නිලධාරි පිරිස මේ යුගය වන විට තව දුරටත් විකාශය වීම

- සබ්බත්ථක (විධායක), වෝහාරික (අධිකරණ) සේනානායක (හමුදා ප්‍රධාන) වැනි ඉහළ නිලධාරීන් පිළිබඳ ව සඳහන් වීම
- රාජාණ්ඩු පාලකයන් සිය බල ව්‍යාප්තියේ දී 'මත්ස්‍ය න්‍යායය' ඇතුළු විවිධ දේශපාලන න්‍යාය අනුගමනය කිරීම
- ආර්ථික සම්පත් මැනවින් උපයෝජනය කළ දක්ෂ පාලකයන් සෙසු සියලු ජනපද යටපත් කර සිය රාජ්‍ය බලවත් කිරීම

- **සමූහාණ්ඩු පාලන ක්‍රමය**

  - ගණ හා සංඝ යන නම්වලින් ද මෙම පාලන ක්‍රමය හඳුන්වන ලදි.
  - වජ්ජි හා මල්ල ජනපදවල මෙම පාලන ක්‍රමය ක්‍රියාත්මක විය.
  - මේ හැර බෞද්ධ සාහිත්‍යයෙහි වෙනත් සමූහාණ්ඩු 9ක් ගැන සඳහන් වේ.
    * කපිලවස්තුවේ ශාක්‍යයෝ
    * අල්ලකප්පයේ බුල්ලිවරු
    * කුසිනාරාවේ හා පාවාහි මල්ලයෝ
    * කේශපුත්තයේ කාලාමයෝ
    * වෛශාලියේ ලිච්ඡවීන්
    * පිප්ඵලී වනයේ මෝරියවරු
    * මිථිලාවේ විදේහයෝ
    * සුංසුමාරගිරියේ වග්ගයෝ
    * රාම ග්‍රාමයේ කෝලියයෝ
  - මෙම රාජ්‍යයන් පාලනය වූයේ සෑම ප්‍රදේශයකින් ම තෝරාගත් නියෝජිතයන්ගෙන් සමන්විත 'විධායක සභාවන්' මගින් ය.
  - එලෙස පාලකයින් 7707 කි සිටි බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ.
  - සප්ත අපරිහානීය ධර්ම නම් ආචාර ධර්ම හතක් අනුව ඔවුන්ගේ පාලන ප්‍රතිපත්ති ගොඩනැඟී තිබිණි.
  - පාලක මණ්ඩලය රැස් වූ ශාලාව 'සන්ථාගාර' නම් විය.
  - 'ප්‍රවේණි පුස්තකය' අනුව රාජ්‍යයේ අධිකරණ කටයුතු සිදු කරන ලදි.

- **මගධ අධිරාජ්‍යයේ ප්‍රභවය හා ව්‍යාප්තිය**

  - මුල් ජනපද යුගයේ දී මගධය අබිබවා කෝසලය බලවත් වී සිටීම
  - එහෙත් පහත සඳහන් හේතු සාධකවල බලපෑම නිසා මගධය බලවත් වීම

  - **භූ භෞතික සාධක**

    * සරු පසක් තිබීම සහ හිතකර දේශගුණයක් තිබීම නිසා දියුණු කෘෂි ආර්ථිකයක් ගොඩනැඟීමට හැකි වීම
    * ගංගා ගං නිම්නය ඔස්සේ විහිදුණු දීර්ඝ තැනිතලාව ගමනාගමනයට මෙන් ම විවිධ ආර්ථික කටයුතුවලට වැදගත් වීම
    * පංචමහා පර්වත ඇතුළු ස්වාභාවික භූගෝලීය පිහිටීම් රැසක් මගින් මගධය ආරක්ෂා වී තිබීම
    * ගංගා - යමුනා ඇතුළු අතු ගංගා රාශියක් තිබීම
    * වැඩි ම වර්ෂාපතනයක් ලැබෙන ප්‍රදේශයක් වීම

- **දේශපාලන සාධක**

  * හර්යංක පරපුරේ බිම්බිසාර, අජාසත්ත වැනි කාර්යශූර, උපක්‍රමශීලී පාලකයන් බිහි වීම
  * ඔවුන් සිය රාජ්‍යය බලවත් කිරීම සඳහා නිරන්තරයෙන් උපාය - උපක්‍රමයන් යෙදීම
  * 'මත්ස්‍ය න්‍යායය' විවාහ සබඳතා, මිත්‍ර සබඳතා, ආගමික සබඳතා ආදි විවිධ උපක්‍රමයන් මඟින් රාජ්‍යය පුළුල් කිරීම
  * බිම්බිසාර රජු මගධයේ සේනා බලය සංවිධානාත්මක ව ගොඩනැඟූ පසු, අජාසත්ත එයට ශිලාකණ්ඨා හා රථමුසල නම් වූ නවීන යුද්ධායුධ ද එක් කරමින් තව දුරටත් ශක්තිමත් කිරීම
  * වෙනස් වන දේශපාලන, ආර්ථික හා සමාජීය තත්ත්වයන්ට සංවේදී වෙමින් අගනුවර වරින් වර මාරු කිරීම ගිරිව්‍රජ → රාජගෘහ → පාටලී පුත්‍ර
  * දක්ෂ උපදේශක අමාත්‍යවරුන් සිටීම (සුනීධ, වත්සකාර,කෞටිල්‍ය)

- **ආර්ථික සාධක**

  * කෘෂිකර්මාන්තයට හා සත්ත්ව පාලනයට යෝග්‍ය පාරිසරික සාධක රැසක් මගධයේ දක්නට ලැබීම
  * වාණිජ කටයුතු බාහිර හා අභ්‍යන්තර වශයෙන් ව්‍යාප්ත කිරීමට යෝග්‍ය මාර්ග පහසුව හා වරාය තොටුපළ ආදිය පිහිටා තිබීම
  * යපස්, රන්, මැණික් ඇතුළු වටිනා වාණිජ සම්පත් රැසක් මගධ රාජ්‍යයට අයත් ව තිබීම
  * මගධය සතු වනාන්තරවලින් දැව, අලි ඇතුන් ඇතුළු සම්පත් රැසක් ලබාගත හැකි වීම

- **සමාජීය සාධක**

  * ගංගා-යමුනා තැනිතලා ප්‍රදේශයේ දී භූගෝලීය වශයෙන් බාධාවන් නොවූ නිසා සමාජ ඒකාබද්ධතාවක් ගොඩනැඟීම
  * වර්ණ ක්‍රමය තදින් ක්‍රියාත්මක නොවීම
  * වෙළෙඳාම, විවිධ කර්මාන්ත, කෘෂිකර්මාන්තය වැනි අංග මඟින් ධනවත් වූ ප්‍රජාවක් (සෙට්ටීන්) බිහි වීම
  * මෙම සමාජ පසුබිම ඔස්සේ ම වඩාත් ශක්තිමත් හා පුළුල් දේශපාලන රටාවක් ගොඩනැඟීමේ අවශ්‍යතාව පැන නැඟීම
  * දේශපාලන බලය ලබා ගැනීමට ක්ෂත්‍රිය පදනම අවශ්‍ය නොවීම (හර්යංක, සිශුනාග, මෞර්ය, ශුංග යන කිසිදු පාලන වංශයක් ක්ෂත්‍රිය කුලයට අයත් නොවී ය.)

ඇගයීම - 01

**අංක 1 සිට 8 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක් දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.**

1. (1) අවන්ති (2) කෝසල (3) වස්ස (4) මල්ල (5) මගධ (................)
2. (1) බිම්බිසාර (2) උදයන (3) චණ්ඩපජ්ජෝත (4) කොසොල් (5) සූරසේන (................)
3. (1) හර්යංක (2) ශිශුනාග (3) නන්ද (4) මෞර්ය (5) පුෂ්‍යමිත්‍ර (................)

**අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවලනාම x හා y තීරුවල දක්වා ඇත. y තීරුවේ දී ඇති නාම x තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ අනුපිළිවෙළට නොවේ. y තීරුව x නිවැරදි ව ගළපා ඇති පිළිතුර තෝරා කඩ ඉරි මත ලියන්න.**

**4.**

| x | y |
|---|---|
| (i) අංග | A කුසිනාරා |
| (ii) කාම්බෝජ | B ඉන්ද්‍රප්‍රස්ථ |
| (iii) කුරු | C චම්පා |
| (iv) මල්ල | D මථුරා |
| (v) සූරසේන | E ගන්ධාර |

**(1)** CEBAD **(2)** BCEAD **(3)** ADECB **(4)** DAECB **(5)** ECDAB (................)

**5.**

| x | y |
|---|---|
| (i) හමුදා ප්‍රධානී | A වෝහාරික |
| (ii) අධිකරණ | B සේනානායක |
| (iii) විධායක | C මන්ත්‍රිපර්ෂද් |
| (iv) පාලක මණ්ඩලය | D සබ්බත්ථක |
| (v) මණ්ඩලය | E සන්ථාගාර |

**(1)** CEDAB **(2)** ABCDE **(3)** BADEC **(4)** ACEBD **(5)** BCDAE (................)

**6.**

| x | y |
|---|---|
| (i) මෝරියවරු | A රාම ග්‍රාම |
| (ii) ලිච්ඡවිහු | B මිථිලා |
| (iii) මල්ලයෝ | C පාවා |
| (iv) විදේහයෝ | D වෛශාලි |
| (v) කෝලියයෝ | E පිප්පලීවන |

**(1)** DCAB **(2)** DECBA **(3)** BCDEA **(4)** AEBDC **(5)** EDCBA (................)

**අංක 07 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A B C D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර යෝ තෝරා**

1. A සහ B **පමණක් නිවැරදි නම් 1 ද**
2. B සහ C **පමණක් නිවැරදි නම් 2 ද**
3. C සහ D **පමණක් නිවැරදි නම් 3 ද**
4. A සහ C **පමණක් නිවැරදි නම් 4 ද**
5. **ප්‍රතිචාර එකකට හෝ දෙකකට වැඩි හෝ නම් 5 ද, වරහන තුළ ලියන්න.**

7. A. පශ්චාද් වෛදික යුගයේ දී ආර්යයන් ගංගා නිම්නයේ ව්‍යාප්ත විම
   B. ගෝත්‍ර පාලනයෙන් පසු මහා ජනපද ලෙස පාලන ඒකක වර්ධනය විම
   C. පශ්චාද් වෛදික යුගයේ ස්ථාවර පාලන තන්ත්‍රයක් ගොඩනැගීම
   D. පුක්කුසාති රජු ගන්ධාරයේ සිටි වැදගත් පාලකයෙකි. (................)

8. A. බිම්බිසාර රජු මගධයේ යුද්ධ සේනාවට ශිලාසණ්ඨාර නම් නවීන යුද්ධායුධ එක් කිරීම
   B. සුනීධ, වත්සකාර මගධයේ සිටි වැදගත් නිලධාරිහු
   C. රාජ්‍ය බලය ලබා ගැනීමට ක්‍ෂත්‍රිය කුල පදනම අවශ්‍ය නොවීය
   D. මගධයේ අගනුවර එක් අවස්ථාවක දී බරණැසට මාරු විය (................)

ඇගයීම - **02**

09. පශ්චාද් වෛදික යුගයේ දේශපාලන ප්‍රවණතාවල වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 14)

10. ''ක්‍රි.පූ. හවන සියවසේ ඉන්දියාවේ ක්‍රියාත්මක වූ පාලන ක්‍රම අතුරෙන් වඩාත් ප්‍රජාතන්ත්‍රීය පාලන ක්‍රමය සමූහාණ්ඩු ක්‍රමය යි''.
    1. සොළොස් මහා ජනපදවලට අයත් නොවූ ගණ රාජ්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 2)
    2. ගණ රාජ්‍යවල පාලන ක්‍රමයේ විශේෂතා පරීක්ෂා කරන්න. (ලකුණු 5)
    3. ඉහත ප්‍රකාශයට ඔබ එකග වන්නේ ද ? හේතු දක්වන්න. (ලකුණු 7)

11. සොළොස් මහා ජනපද අතුරින් බලවත් රාජ්‍යය ලෙස ඉස්මතු වූ රාජ්‍ය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් කරන්න. (ලකුණු 14)

12. මගධයේ නැගීමට බිම්බිසාර, අජාසත්ත රජුන්ගේ දායකත්වය ප්‍රමාණය කරන්න (ලකුණු 14)

ඇගයීම - **03**

**පහත සඳහන් ස්ථාන ඉන්දියාවේ සිතියමක ලකුණු කර දෙකක් පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.**

(සප්ත සින්ධු ප්‍රදේශය, ඉන්ද්‍රපස්ථ, පාටලීපුත්‍ර, යමුනා, අංග, කාසි, මථුරා. තාමුලිප්ත, හිමාලය,තක්ෂිලා)

(ලකුණු 18)

**නිපුනතා මට්ටම ඃ** 5.2 ආගමික හා දාර්ශනික චින්තනය ඉන්දීය ශිෂ්ටාචාරය ගොඩනැගීමට දායක වී ඇති ආකාරය විමර්ශනය කරයි.

**කාල පරිච්ඡේද :** 10

**ඉගෙනුම් පල :**
- ඉන්දියාවේ වර්ධනය වූ නව ආගමික චින්තාවන් විස්තර කරයි.
- නව ආගමික චින්තාවේ දේශපාලනය කෙරෙහි බලපෑම පෙන්වා දෙයි.
- නව ආගමික චින්තාවන් මානව සමාජය කෙරෙහි බලපෑ ආකාරය විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**ආගමික චින්තනයේ වර්ධනය**

- ක්‍රි.පූ. හවන සියවසේ ආගමික හා දාර්ශනික චින්තාවන් කෙරෙහි බලපෑ ඓතිහාසික පසුබිම
- පශ්චාද් වෛදික යුගයේ දී බ්‍රාහ්මණයන් ගොඩනගා තිබූ ආගමික සංකල්ප විශාල පිරිසකගේ පීඩාවට හේතු වීම
- යාඥ පැවැත්වීම, වර්ණාශ්‍රම ධර්ම, ඇතුළු බොහෝ සංකල්ප නිසා බලවත් හිරිහැරයට ලක් වූ සමාජ කොටස් සිටීම
- ක්‍රමයෙන් දේශපාලන හා ආර්ථික, සමාජීය රටාවන්ගේ ඇති වූ ප්‍රබෝධය නිසා බ්‍රාහ්මණ නිර්මාණවාදයෙන් බැහැර වී කර්ම මාර්ගය වෙනුවට ඥාන මාර්ගය අනුගමනය කළ පිරිසක් බිහි වීම
- ඔවුන් ලෝකය, විශ්වය, ජීවිතය, ආත්මය, මරණය වැනි ගැඹුරු දාර්ශනික කථිකාවන් ඉස්මතු කොට සාකච්ඡාවට බඳුන් කිරීම
- ඒ අනුව ක්‍රි.පූ. හවන සියවස වනවිට බ්‍රාහ්මණ සම්ප්‍රදායය ඉක්මවා ගිය ආගමික හා දාර්ශනික චින්තාවන් රැසක් ඉස්මතු වීම

**ඉන්දියාවේ වර්ධනය වූ නව ආගමික චින්තා**

- බ්‍රාහ්මණවාදය
    - ක්‍රි.ව 8 වන සියවසින් පසු හින්දු ආගමය ලෙස ව්‍යවහාර විය.
    - සමාජයේ ඉහළ ම වරප්‍රසාද හිමි වන ආකාරයක සිට ඉගැන්වීම් ඉදිරිපත් කිරීම
    - නිර්මාණවාදී සංකල්පය මගින් ඔවුන්ට වාසිදායක සංකල්ප සමාජගත කිරීම
    - වේදය ඉගෙන ගැනීම, ඉගැන්වීම, යාග හෝම පැවැත්වීම, දන් පිළිගැනීම වැනි කාර්යයන් ඔවුන් විසින් සිදු කරනු ලැබීම
    - ජීවිතයේ විවිධ අවස්ථාවන් සහ පැවැත්මට යාගය අත්‍යවශ්‍ය බව අවධාරණය කරමින් මහා යාගයන් තෙක් යාග හෝම වර්ධනය කර බ්‍රාහ්මණ පූජකයන් සමාජයේ ඉහළ ම වැදගත්කමක් හිමි කර ගැනීම
- ජෛනාගම
    - නිගණ්ඨ පරපුරට අයත් විසිහතර වැනි තීර්ථංකර වූ ජෛන මහාවීර මෙහි ශාස්තෘවරයා විය.
    - උතුරු බිහාරයේ වෛශාලි පුරයේ උපන් ක්ෂත්‍රිය වංශික ඔහු විසින් බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට මුළුමනින් ම පටහැණි දහමක් ඉදිරිපත් කරන ලදි

- ඒ අනුව ඒ දහමේ පහත සඳහන් මූලික ලක්ෂණ දක්නට ලැබිණි.
  * යඥය හා වෛදික ආගමික චාරිත්‍ර ප්‍රතික්ෂේප කිරීම
  * දෙවියන් විශ්වාස කිරීම
  * අවිහිංසාවාදය අනුගමනය කිරීම
  * ශරීරයට දැඩි දුක් දීමෙන් කෙලෙස් ප්‍රහීණ කළ හැකි බව විශ්වාස කිරීම
  * අහිංසාව, දානය හා සත්‍ය වචනය, සොරකමින් වැළකී සිටීම, වචනයෙන් සිතින් හා ක්‍රියාවෙන් යුත් බ්‍රහ්ම චර්යාව, සියලු ලෞකික ආශාවන්ගෙන් ඈත් වීම යන පස් වැදෑරුම් ශික්ෂාපද අනුගමනය කිරීම
- ක්‍රි.පූ. හවන සියවසේ දී රාජ්‍ය අනුග්‍රහය ද ලැබීම නිසා ජෛනාගමයේ පුළුල් ව්‍යාප්තියක් සිදු වීම
- ක්‍රි.ව. 5 වන සියවස වන විට ගුජරාටයේ වලභි ස්ථානයේ ජෛන සංගායනාවක් ද පැවැත්වීම
- පසුකාලීන ව චන්ද්‍රගුප්ත මෞර්ය වැනි පාලකයන්ගේ අනුග්‍රහය ජෛනාගම ට ලැබුණු බව සඳහන් වීම
- මේ අනුව මධ්‍ය ඉන්දියාව, මාල්වා, රාජ්පුටානා යන ප්‍රදේශවලත් දකුණු ඉන්දියාවේත් ජෛනාගම ව්‍යාප්ත වීම
- භාගවතී සූත්‍ර, වෛතුංග සූත්‍ර, සමාවතී සූත්‍ර වැනි ජෛන සාහිත්‍ය ග්‍රන්ථ රැසක් නිර්මාණය වීම

• බෞද්ධාගම

- ගෞතම බුදු රජාණන් වහන්සේ ඉදිරිපත් කළ ධර්මය බුදු දහම ලෙස හැඳින්වේ.
- කපිලවස්තුවේ සුදොවුන් රජුට හා මහාමායා දේවියට දාව උපන් සිදුහත් කුමරුන් වයස 29 දී අභිනිෂ්ක්‍රමණය කොට වසර 6ක් තාපස ජීවිතයක් ගත කරමින් එහි අවසාන කාලයේ දුෂ්කර ක්‍රියා කොට අනතුරු ව මධ්‍යම ප්‍රතිපදාවෙහි පිහිටා 35 වැනි වියේ දී බුද්ධත්වයට පත් වී ඇත.
- උපාසකයන්ට අෂ්ටාංග ශීලයක් ද, ගිහියන්ට පංචශීලයක් ද හඳුන්වා දෙන ලදි.
- සසර දුකින් මිදීමට සමථ හා විදර්ශනා භාවනා ක්‍රමයක් ද ඉදිරිපත් කරන ලදි.
- ඒ අනුව බුදු දහමේ මූලික ඉගැන්වීම් පහත ආකාරයට දැක්විය හැකි ය.
  * මධ්‍යම ප්‍රතිපදාව
  * ආර්ය අෂ්ටාංගික මාර්ගය
  * චතුරාර්ය සත්‍යය
  * වෛදික යාග හෝම ප්‍රතික්‍ෂෙප කිරීම
- බුදු දහම කෙරෙහි ලැබුණු ජන ප්‍රසාදය හා රාජ්‍ය අනුග්‍රහය නිසා කෙටි කලකින් එය විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වී ඉන්දියාවේ රාජ්‍ය ආගම බවට ද පත් විය

**ඉන්දියාවේ සමකාලීන වෙනත් නව ආගමික චින්තා**

- ක්‍රි.පූ. හවන සියවස වන විට මෙවැනි දෘෂ්ටි 62ක් පිළිබඳ ව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ.
- ඒ අතුරින් ෂට් ශාස්තෘවරුන් ලෙස ප්‍රසිද්ධියට පත් පහත සඳහන් ශාස්තෘවරුන්ගේ දර්ශන කැපී පෙණුනි.

• පූර්ණ කස්සප

- කුසලාකුසල කිසි දු කර්මයක විපාක නොලැබෙන බව මෙන් ම උත්සාහයෙන් ක්‍රියා කිරීමේ අර්ථයක් නොමැති බව ද කියවෙන අකිරියවාදී දර්ශනයක් ඉදිරිපත් කළේය.
- අශ්වමේධ, පුරුෂමේධ, වාජපේය වැනි යාග හෝම පූරණ කස්සප විසින් අවඥාවට ලක් කරන ලදී.
- අජාසත් රජු පවා පැමිණි බව සඳහන් වේ.

- මක්ඛලී ගෝසාල
    - උණ දඬුවක් අතැති ව සිටි නිසා මක්ඛලී ගෝසාල නම් වූ බව සඳහන් වේ.
    - ඔහුගේ ඉගැන්වීම නියතිවාදයක් හෙවත් නාස්තිකවාදයක් ලෙස සඳහන් වේ.
    - එනම් මෙලොව සිදුවන සියලු දෑ හේතු රහිත ව ම සිදුවන බවත් ඒවා වෙනස් කිරීම කිසිවකුටත් නොහැකි ය යන්න කියවේ.
    - බුදුන් වහන්සේ මෙම දර්ශනය විවේචනයට ලක්කර එය මිනිසුන්ගේ දියුණුවට අහිතකර බව දේශනා කළහ.

- අජිතකේස කම්බල
    - උච්ඡේදවාදී දෘෂ්ටියක් ඉදිරිපත් කරන ලදි.
    - ආපෝ, තේජෝ, වායෝ හා පඨවි යන මූලධර්ම එක් වී සත්ත්වයා හටගන්නා බවත් මරණින් පසු ඒවා සතර මහා භූතයන්ට ම එක්වන බවත් ඉගැන්වී ය.
    - මේ නිසා භෞතිකවාදයක් ලෙස ද එතුමාගේ ඉගැන්වීම හඳුනාගත හැකි ය.

- පකුධ කච්චායන
    - බ්‍රාහ්මණ වාංශිකයෙකු වූ මෙතුමා, මුල දී නිගණ්ඨයන් ඇසුරු කළ තීර්ථංකරයකු විය.
    - අනතුරු ව අකිරියවාදයක් (ශාස්වත වාදය) ඉදිරිපත් කරමින් පෘථිවිකාය, ජලකාය,
    - අග්නිකාය, වායුකාය, සුඛදුක්ඛ කාය යන මේවා කිසිවෙකුත් නිර්මාණය නොකළ බව ඉගැන්වීය.

- සංජය බෙල්ලට්ඨිපුත්ත
    - ඔහු ඉගැන්වූ දර්ශනය අමරාවික්ඛේපවාදය නම් විය.
    - එනම් කිසි දු ස්ථිර පදනමක් නොමැති දර්ශනයක් ඉදිරිපත් කරමින් ලෝකය හෝ විමුක්තිය පිළිබඳ ව තමා ස්ථිරව කිසිවක් ප්‍රකාශ නොකරන බව සඳහන් කළේය.
    - නිගණ්ඨනාත පුත්ත (ජෛන ආගම ශීර්ෂය යටතේ තොරතුරු දක්වා ඇත)

- **නව ආගමික චින්තාවන් දේශපාලනය කෙරෙහි බලපෑ අයුරු**
    - ඉන්දියාවේ වෛදික යුගයේ සිට පැවත ආ කුලභේද ආගම් භේද ආදි පටු සංකල්ප ඉක්මවා යාමට මෙකල බිහි වූ නව ආගම් ඉවහල් විය.
    - සමාජ ප්‍රගමනයට මෙන් ම සමාජ ඒකාබද්ධතාවට රුකුල් දුන් සමානාත්මතාව, පංචශීලය ආදි ඉගැන්වීම් ඇතුළත් වීම ද පුළුල් දේශපාලන ඒකක බිහි වීමට හේතු විය.
    - සතර සංග්‍රහ වස්තු, දස සක්විතිවත්, දසරාජ ධර්ම වැනි සංකල්ප ධාර්මික රාජ්‍ය පාලනයකට ඉවහල් විය.

- **නව ආගමික චින්තාවන් මානව සමාජය කෙරෙහි බලපෑ අයුරු**
    - බ්‍රාහ්මණ ඉගැන්වීම්වලින් පීඩාවට පත් විශාල පිරිසක් ක්‍රි.පූ. හවන සියවසේ ඉන්දීය සමාජයේ දක්නට ලැබීම
    - ඔවුන් අපේක්ෂා කළ අහිංසාවාදී, සමානාත්මතා ලක්ෂණ නව බොහෝ ආගම්වල දක්නට ලැබීම
    - ආර්ථික හා දේශපාලන රටාවන්ගේ අභිවෘද්ධියට හේතු වන ප්‍රායෝගික කරුණු රැසක් තිබීම ජන සමාජයේ යහපතට ඉවහල් වීම
    - 'පංචශීලය' බුදු දහමේ මෙන්ම ජෛනාගමේද ප්‍රධාන සංකල්පයක් වූ අතර, සමාජයේ යහපැවැත්මට මෙය ඉතා වැදගත් වීම.

ඇගයීම - 01

**අංක 01 සිට 05 දක්වා ඇති සැම ප්‍රශ්නයක ම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

1. බෞද්ධ සාහිත්‍ය අනුව ගණ රාජ්‍ය නොවන ආණ්ඩුක්‍රමයක් පැවතියේ කොහි ද?
   1. කෝලිය 2. ලිච්ඡවී 3. විදේහ 4. මල්ල 5. අවන්ති ( ..........)

2. පළමුවන ධර්ම සංගායනාවේ ප්‍රධානත්වය දරන ලද්දේ කවුරුන් විසින් ද?
   1. මොග්ගලීපුත්තතිස්ස තෙරුන් 2. මහා කාශ්‍යප තෙරුන් 3. ආනන්ද තෙරුන්
   4. වසුමිත්‍ර තෙරුන් 5. සාරිපුත්ත තෙරුන් ( ..........)

3. මගධ රාජ්‍යය පාලනය කළ රාජවංශ අනුපිළිවෙළින් දැක්වෙන්නේ පහත කවර ලැයිස්තුවේ ද?
   1. ශිශුනාග, හර්යංක, නන්ද, මෞර්ය, ශුංග 2. හර්යංක, නන්ද, මෞර්ය, ශුංග, ශිශුනාග
   3. හර්යංක, ශිශුනාග, මෞර්ය, නන්ද, ශුංග 4. ශිශුනාග, හර්යංක, ශුංග, නන්ද, මෞර්ය
   5. නන්ද, හර්යංක, මෞර්ය, ශිශුනාග, ශුංග ( ..........)

4. හතර වන සංගායනාව පවත්වන ලද්දේ කුමන රජුගේ කාලයේ දී ද?
   1. අජාතශත්‍රු 2. කාලාශෝක 3. අශෝක 4. කණිෂ්ක 5. හර්ෂවර්ධන ( ..........)

5. පළමු වන බෞද්ධ සංගායනාව පවත්වන ලද්දේ,
   1. බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් මාස තුනකට පසුව ය
   2. බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු සියයකට පසුව ය.
   3. බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුද් දෙසීයකට පසුව ය.
   4. අශෝක රජුගේ රාජ්‍ය සමයේ දී ය.
   5. කණිෂ්ක රජුග් රාජ්‍ය සමයේ දී ය. ( ..........)

ඇගයීම - 02

**අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා අදාළ අංකය, තිත් ඉර මත ලියන්න.**

| පළමු වැනි ප්‍රකාශය | | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය | නිවැරදි ය |
| 2. | නිවැරදි ය | වැරදි ය |
| 3. | වැරදි ය | වැරදි ය |
| 4. | වැරදි ය | නිවැරදි ය |
| 5. | නිවැරදි ය | නිවැරදි වන අතර පළමු වැන්න මැනවින් පහදා දෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 6. බ්‍රාහ්මණවාදය මඟින් ගොඩනගා තිබූ ආගමික සංකල්ප නිසා භාරතීය ජනතාවට සහනදායී තත්ත්වයක් උදා විය. | බ්‍රාහ්මණවාදය ක්‍රි.පූ 8 වන සියවසින් පසු හින්දු ආගම ලෙස ව්‍යවහාර විය. (..................) |
| 7. පශ්චාද් වෛදික යුගයේ දී බ්‍රාහ්මණවාදය මඟින් ඇති කළ නිර්මාණවාදී කර්ම මාර්ගය බැහැරලා ඥාන මාර්ගය අගය කළ පිරිසක් ඇති විය. | පශ්චාද් වෛදික යුගයේ නව දාර්ශනික චින්තනය මඟින් ලෝකය, මරණය, ආත්මය, විශ්වය පිළිබඳ කතිකාවක් ගොඩනැඟිණ (..................) |
| 8. ක්‍රි.පූ 6 වන සියවසේ බිහි වූ නව ආගමික චින්තාවන් අතරින් ජෛනාගම පංචශීල ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. | දෙවියන් පිළිබඳ විශ්වාසය ජෛනාගම මගින් ප්‍රතික්ෂෙප කර ඇත. (..................) |
| 9. පූර්ණ කස්සපගේ ඉගැන්වීම් මෙලොව සිදුවන සියල්ල හේතුඵල රහිත ව නියතිවාදයට අනුව සිදු වන බව පෙන්වා දෙයි. | පකුධ කච්ඡායනට අනුව සතර මහා භූත රූප පිළිබඳ අදහස් ඉදිරිපත් කර ඇත. (..................) |
| 10. බුදු දහම මඟින් ගිහි හා පැවිදි දෙපිරිස සඳහා පංචශීල හා අෂ්ටාංගික ශීල ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. | බුදු දහම මඟින් අනුමත කර ඇති ශීලය මෙලොව, පරලොව, සුහසිද්ධිය සඳහා ඉවහල් වන බව පෙන්වා දෙනු ලබයි. (..................) |

ඇගයීම - 03

1. ක්‍රි.පූ. හවන සියවසේ වර්ධනය වී පැවති නව ආගමික චින්තාවන් පිළිබඳ ව සංක්ෂිප්ත ව කරුණු දක්වයි.
2. ක්‍රි.පූ. හවන සියවසේ දී පහළ වූ නව ආගමික සංකල්පයන් නිසා භාරතීය සමාජයේ සිදු වූ දේශපාලනික හා සමාජීය වර්ධනයන් පිළිබඳ ඇගයීමක් කරන්න.
3. ''ක්‍රි.පූ. හවන සියවසේ ඉන්දීය ශිෂ්ටාචාරය හැඩ ගැන්වූ තීරණාත්මක බලවේගය බුදු දහමයි''
   i ක්‍රි.පූ. හයවන සියවසේ දී බුදු දහමේ දියුණුවට ක්‍රියා කළ පාලකයන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 2)
   ii. ක්‍රි.පූ. හවන සියවසේ දී ඉන්දියාවේ පැවති බුදු දහමේ සංකල්පවලට සමීප ඉගැන්වීම් ඉදිරිපත් කළ නව ආගමික චින්තාවන් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 5)
   i. ඉහත දැක්වෙන ප්‍රකාශය විචාරාත්මක ව පරීක්ෂා කරන්න. (ලකුණු 7)
4. ක්‍රි.පූ. හවන සියවසේ සමාජ තත්ත්වය හැඩ ගැසීමට බ්‍රාහ්මණ ඉගැන්වීම් බලපෑ ආකාරය විමසීමක් කරන්න. (ලකුණු 14)
5. ක්‍රි.පූ. හවන සියවසේ දී ෂට් ශාස්තෘවරුන් ඉදිරිපත් කළ දර්ශනයන් පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් කරන්න. (ලකුණු 14)

ඇගයීම - 03

**පහත සඳහන් ස්ථාන ඉන්දියාවේ සිතියමක ලකුණු කර ඉන් දෙකක් පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.**

- ගුජරාටය, වලභි, රාජ්පුටානා, මාල්වා, කපිලවස්තු, වෛශාලි, බිහාර්, මධ්‍ය ඉන්දියාව

(ලකුණු 18)

## 6. අධිරාජ්‍යවාදී සංකල්පය හා මෞර්ය අධිරාජ්‍යය

ක්‍රි. පූ. 6 වන සියවසේ ඇරඹි සොළොස් මහා ජනපද යුගයේ කූට ප්‍රාප්තිය එළඹෙනුයේ මගධය මුල් කරගෙන බිහි වූ අධිරාජ්‍යය සමඟ යි. උතුරු ඉන්දියාවේ ප්‍රථම වරට අධිරාජ්‍යයක් ගොඩනැඟීම සිදු වන්නේ මගධය මුල් කරගෙන ය. අධිරාජ්‍යයක් තෙක් සෙසු ජනපද අබිබවා මගධය නැඟී ඒමට බලපෑ හේතු සාධක කීපයක් පවතී. ඒ අතර මගධ රාජ්‍යයේ ස්වාභාවික සම්පත් බහුලත්වය හා මගධයේ බලයට පත් වූ ප්‍රබල රාජවංශ හා රජවරුන් අනුගමනය කළ ප්‍රතිපත්ති ප්‍රධාන වශයෙන් බලපාන ලදි. හර්යංක, ශිශුනාග, නන්ද, මෞර්ය, ශුංග යන රාජවංශ මගධයේ බලයට පත් විය. හර්යංක හා මෞර්ය යන රාජවංශයන්හි පාලකයෝ කැපී පෙනෙති. මගධ බල වර්ධනයේ මූලික පදනම හර්යංක පෙළපතේ බලයට පත් වූ බිම්බිසාර හා අජාසත්ත යන පාලකයන් විසින් ක්‍රියාවට නංවන ලදි. වයඹදිග ඉන්දියා සෙලියුකස් නිකේටර්ගේ පාලනයෙන් නිදහස් කර ගත් චන්ද්‍රගුප්ත මෞර්ය විසින් උතුරු ඉන්දියාව අධිරාජ්‍යයක් තෙක් පුළුල් කරන ලදි. ඔහු විසින් වයඹ දිගින් පර්සියාව දක්වාත් බටහිරින් සෞරාෂ්ට්‍රය දක්වාත් දකුණින් මයිසූරය දක්වාත් අධිරාජ්‍ය ගොඩනැංවූ බව සඳහන් වේ. ඒ අනුව උතුරු ඉන්දියාවේ ප්‍රථම වරට අධිරාජ්‍යයක් ගොඩනගනු ලබන්නේ චන්ද්‍රගුප්ත මෞර්ය විසිනි. චන්ද්‍රගුප්තගේ පුත් බින්දුසාර එම අධිරාජ්‍යය ආරක්ෂා කර ගත් අතර ඔහුගේ පුත් අශෝක විසින් දකුණු ඉන්දියාවේ මුවදොර වූ කාලිංගය යටත් කර ගනිමින් අධිරාජ්‍යය උච්ඡතම අවස්ථාවකට පත් කරන ලදි. අශෝකගෙන් පසු බලයට පත් වූ පාලකයන් හා ශුංග රාජවංශය දුර්වල වීම හේතුවෙන් මෞර්ය අධිරාජ්‍යයේ පරිහානිය සිදු වන්නට විය. අධිරාජ්‍යය සමෘද්ධිමත් ව පැවතුණු සමයේ විධිමත් පාලන තන්ත්‍රයක් පැවතුණු බව පෙනේ.

**නිපුණතාව:** • ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම:** 6.1 අධිරාජ්‍යය සංකල්පය මෞර්ය අධිරාජයා ඇසුරෙන් පැහැදිලි කරයි.

**කාලච්ඡේද ගණන:** 30

**ඉගෙනුම් පල:**
- අධිරාජ්‍යය සංකල්පය විස්තර කරයි.
- ශක්තිමත් මෞර්ය අධිරාජ්‍යයක් ගොඩනැගු ආකාරය පැහැදිලි කරයි.
- අධිරාජ්‍යයක පවතින සුවිශේෂී ලක්ෂණ මෞර්ය පාලනය ඇසුරෙන් විස්තර කරයි.
- මෞර්ය අධිරාජ්‍යයේ පරිහානියට හේතු දක්වයි.
- මෞර්ය අධිරාජ්‍යයේ ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

- **අධිරාජ්‍යය සංකල්පය හා මෞර්ය අධිරාජ්‍යය**

  - සොළොස් මහා ජනපද යුගයේ අවසාන කාලය වන විට සෙසු ජනපද අබිබවා මගධය ඉදිරියට ඒම
  - උතුරු ඉන්දියාවේ ප්‍රථම වරට අධිරාජ්‍යයක් ගොඩනැඟීම සිදු වන්නේ මගධය මුල් කරගෙන යි.
  - මගධ රාජ්‍යය පිළිබඳ ව ප්‍රථමවරට මූලාශ්‍රයක සඳහන් වන්නේ අථර්වන් වේදයේ ය.
  - මගධ රාජ්‍යයේ ප්‍රථම අගනුවර වූයේ ගිරිව්‍රජය ය.

- **ඉන්දියාවේ ප්‍රථම අධිරාජ්‍යය ලෙස මගධය වර්ධනයට බලපෑ හේතු**

  - විවිධ සංස්කෘතීන්ගේ බලපෑම් නිසා සමාජ ක්‍රමය ලිහිල් වීම (සමාජ සුධනම්‍යතාව)
  - බෞද්ධ හා ජෛන වැනි විවිධ ආගමික දර්ශනයන් පහළ වීම නිසා නිදහස් චින්තනයට මඟ පෑදීම

- වෛදික යුගයේ පැවති සමාජ සම්මතය එතරම් බලපෑමත් ඇති නොකිරීම
- ස්වාභාවික පිහිටීම මගින් අත්කර ගත් වාසි
- මගධයේ පාලනය ගෙන ගිය රාජවංශ හා පාලකයන් විසින් අනුගමනය කරන ලද දේශපාලන ප්‍රතිපත්ති
- ඔවුන්ට උපදෙස් ලබා දුන් පිරිස (චානක්‍ය, සුනීධ, වත්සකාර)

- **ස්වාභාවික පිහිටීම**

  - වින්ධ්‍යා කඳුවැටිය, මහා සාගරය සහ ආරවල්ලි කඳුවැටියෙන් මගධයට ස්වාභාවික ආරක්ෂාව ලැබීම
  - ගංගා නදියෙන් ලද සශ්‍රීකත්වය (රන් හා යපස් බහුල වීම මෙන් ම කෘෂිකර්මාන්තයට යෝග්‍ය වීම)
  - ගිජ්ජකූට, ඉසිගිලි, පාණ්ඩව, වේභාර වේපුල්ල යන පර්වතවලින් ප්‍රධාන නගරයට ස්වාභාවික ආරක්ෂාව ලැබීම
  - තාම්‍රලිප්ත වරායේ සිට පාටලීපුත්‍රය තෙක් තිබූ වෙළෙඳ මාර්ගය මගධය හරහා වැටී තිබීම
  - ස්වභාවික වාණිජ සම්පත් සතුවීම (ලුණු සහ යකඩ නිධි)

- **දේශපාලන ප්‍රතිපත්ති**

  - හර්යංක රජ පෙළපතේ බිම්බිසාර හා අජාසත්ත යන රජවරුන්ගේ දේශපාලන ප්‍රතිපත්තිවල බලපෑම
  - බිම්බිසාර රජ මගධය පුළුල් කර ගැනීම උදෙසා ගෙන ගිය ප්‍රතිපත්ති
    - විවාහ සබඳතා
    - පරිපාලන ප්‍රතිපත්ති
    - යුද්ධමය ප්‍රතිපත්ති
    - තානාපති සබඳතා

- **විවාහ සබඳතා**

  - කෝසල දේවිය විවාහ කර ගැනීම  නිසා කාසි ජනපදය මගධයට හිමි වීම
  - චේතක රජුගේ දුව වූ චෙල්ලනා විවාහ කර ගැනීම

- **පරිපාලන ප්‍රතිපත්ති**

  - ග්‍රාම පාලනයත් මධ්‍ය පාලනයත් අතර සබඳතාව වර්ධනය කිරීම සඳහා ග්‍රාමණීවරුන් සෑම ගමකට ම පත් කිරීම

- **යුද්ධමය ප්‍රතිපත්ති**

  - නැගෙනහිර ඉන්දියාවේ පැවති අංග රාජ්‍යය ආක්‍රමණය කොට යටත් කර ගැනීම

- **තානාපති සබඳතා**

  - ගාන්ධාරයේ පුක්කුසාති රජු වෙත දූත පිරිස් පිටත් කර හැරීම
  - අවන්තියේ චණ්ඩප්පජ්ජෝත රජු රෝගාතුර වූ විට ජීවක වෛද්‍යවරයා පිටත් කර යැවීම
  - අජාසත්ත රජුගේ ලිච්ඡවී රාජ්‍යය යටත් කර ගැනීම මගධයේ බල වර්ධනයට හේතු වූ බව
  - අජාසත්ත රාජ්‍ය සමය වන විට මගධ රාජ්‍යය ප්‍රමාණයෙන් වර්ග සැතපුම් 2300ක් පමණ වීම
  - ශිශුනාග රාජවංශය යටතේ මගධයේ බල වර්ධනය

- ශිශුනාග විසින් අවන්තිවර්ධන පරාජයට පත් කොට අවන්ති රාජ්‍යය මගධයට එක් කර ගැනීම
- කාලාශෝක රජු යටතේ පාටලීපුත්‍ර නගරය මගධයේ ස්ථාවර අගනගරය බවට පත් වීම
- ශිශුනාග රාජවංශයෙන් පසු නන්ද රාජවංශය බලයට පත් වීම
- නන්ද රාජවංශයේ ආරම්භකයා මහාපද්මනන්ද රජු වීම
- නන්ද රාජවංශය ප්‍රධාන පාලකයන් 9 දෙනෙකු පිළිබඳ ව මහා බෝධිවංශයේ සඳහන් වීම
- මහා පද්මනන්ද ක්ෂත්‍රිය කුල විනාශ කළ බව සඳහන් වීම
- ධන නන්දගෙන් පසු නන්ද රාජවංශය අවසන් වීම
- පුරාණ ග්‍රන්ථ අනුව නන්ද රාජවංශය වසර 88ක් මගධය පාලනය කළ බව

- **මෞර්ය අධිරාජ්‍යයේ ආරම්භය හා වර්ධනය**

  - මගධ අධිරාජ්‍ය සංකල්පය උච්ඡතම අවස්ථාවට පත් වන්නේ මෞර්ය පාලන සමය තුළ වීම මෞර්ය යුගය පිළිබඳ හැදෑරීමට පවතින මූලාශ්‍රය

- **මෞර්ය අධිරාජ්‍යය වර්ධනයට දායක වූ ප්‍රමුඛ පාලකයෝ**

  - චන්ද්‍රගුප්ත මෞර්ය
  - බින්දුසාර රජු
  - අශෝක රජු

- **චන්ද්‍රගුප්ත පාලන සමය (ක්‍රි.පූ. 324 - 300)**

  - මෞර්ය අධිරාජ්‍යගේ ආරම්භකයා හා නිර්මාපකයා වීම
  - ඉන්දියාවේ ප්‍රථම මහා අධිරාජ්‍යය නිර්මාණය කිරීමේ ගෞරවය ඔහුට හිමි වීම
  - හින්දු මූලාශ්‍රයවලට අනුව චන්ද්‍රගුප්ත යනු නන්ද රජකුට දාව මුරා නම් වූ ශුද්‍ර කාන්තාවකට දාව උපන් අයකු වීම.
  - මෞර්යයන් ක්ෂත්‍රියන් බව මහාවංශයේ හා බෞද්ධ මූලාශ්‍රයවල සඳහන් වන අතර නන්දන්ගර් ස්ථානයේ සිදු කරන ලද කැණීම්වලින් ද එය සනාථ වීම

- **චන්ද්‍රගප්තයන්ගේ ජයග්‍රහණ**

  - චන්ද්‍රගුප්තගේ ප්‍රථම දේශපාලන ජයග්‍රහණය ලෙස සැලකෙන්නේ නන්දවරුන්ගෙන් මගධය මුදා ගැනීම යි.
  - කෞටිල්‍ය හෙවත් චානක්‍ය නම් දේශපාලන චින්තකයා ඔහුට උපදෙස් ලබා දීම
  - දෙවන දේශපාලන ජයග්‍රහණය වන්නේ වයඹ දිග ඉන්දියාව ග්‍රීක ආධිපත්‍යයෙන් මුදවා ගැනීමයි.
  - ඒ වන විට වයඹදිග ප්‍රදේශ පාලනය කළ සෙලියුකස් නිකේටර් සමග යුද වැදී ජයග්‍රහණය කිරීම හා සෙලියුකස් සමග ගිවිසුමක් අස්සන් කිරීම
  - නිකේටර්ට අයත් ව තිබූ හිරාත්, කන්දහාර්, කාබුල් සහ බලුකිස්ථාන් යන ප්‍රදේශ ගිවිසුමක් මඟින් චන්ද්‍රගුප්තට පවරා දීම
  - මෙම ජයග්‍රහණයෙන් පසු මෞර්ය අධිරාජ්‍යයේ බලය පර්සියාව තෙක් ව්‍යාප්ත වීම බටහිරින් සෞරාෂ්ට්‍රය දක්වා බලය පැතිර තිබූ බව හා සෞරාෂ්ට්‍රයේ යටත් පාලකයා ලෙස වෛශ්‍ය පුෂ්පගුප්ත නම් අයකු කටයුතු කිරීම
  - එහි සුදර්ශන වැව චන්ද්‍ර ගුප්ත විසින් පිළිසකර කරන ලද බව ජුනාගාද් ලිපියේ සඳහන් වීම
  - චන්ද්‍රගුප්තයන්ගේ බලය දකුණු ඉන්දියාව තෙක් ද පැතිර තිබූ බවට සාධක පැවතීම
    * චන්ද්‍රගුප්තයන් මයිසෝරය පාලනය කළ බව මයිසූර් ශිලා ලිපියක සඳහන් වීම
    * චන්ද්‍රගුප්ත රජු යැයි අනුමාන කෙරෙන චම්බ මෝරියාර් නම් රජෙක් විසින් දකුණු ඉන්දියාවේ
    * තින්නවෙලි ප්‍රදේශයට එල්ල කරන ලද ආක්‍රමණයක් ගැන පැරණි දෙමළ සාහිත්‍ය කෘතියක සඳහන් වීම

– මයිසෝරයේ ජෛන ලෙනක දී භද්‍රභානු නම් මුණිවරයා සමඟ උපවාසයක යෙදී චන්ද්‍රගුප්තයන් මියගිය බව ජෛන පුරාවෘත්තවල සඳහන් වීම
- ප්ලූටාච් පවසන්නේ සෙබළුන් හය ලක්ෂයක සේනාව සමඟ ඉන්දියාව පුරා ගමන් කරමින් රජු විසින් ඉන්දියාව ම යටත් කර ගන්නා ලද බව යි. මේ අනුව චන්ද්‍රගුප්තයන් නන්දයන්ගෙන් හා ග්‍රීකයන්ගෙන් රට මුදාගෙන මෞර්ය රාජධානියේ බලය වයඹදිග ඉන්දියාවේ, උතුරු ඉන්දියාවේ හා දකුණු ඉන්දියාවේ ඇතුළු විශාල ප්‍රදේශයක පතුරුවමින් ඉන්දියාවේ පළමු අධිරාජයා වූ බව පැහැදිලි වේ
- මිසරය (ඊජිප්තුව) සිරියාව වැනි රටවල් සමඟ තානාපති සබඳතා පවත්වා ගැනීම මගින් බටහිර රටවල් ද චන්ද්‍රගප්තගේ බලය පිළිගෙන තිබීම

- **බින්දුසාරගේ රාජ්‍ය සමය (ක්‍රි.පූ. 300 - 273)**

– චන්ද්‍රගුප්ත රජුගේ මරණින් පසු ඔහුගේ පුත් බින්දුසාර බලයට පත් වීම
– සතුරා විනාශ කරන්නා හෙවත් අමිත්‍රඝාත යන අන්වර්ථ නාමයෙන් ඔහු හඳුන්වා තිබීම
– කෞටිල්‍ය සමඟ එක් ව පාලකයන් කීප දෙනෙකුගේ සහ නගර 16ක බලය බිඳලූ බව ටිබෙට් මූලාශයවල සඳහන් වීම

- **මෞර්ය අශෝක හා ඔහුගේ ප්‍රතිපත්ති**
  - රාජත්වයට පත් වීම

    * බින්දුසාර රාජ්‍ය සමයේ දී තක්ෂිලාවේ ඇති වූ කැරැල්ලක් මර්දනය කිරීම සඳහා අශෝක පිටත් කර හැරීම
    * තක්ෂිලාවේ කැරැල්ල මැඩපවත්වා අවන්තියට (උජ්ජේනියට) පැමිණ යුව රජු වශයෙන් ක්‍රියා කිරීම
    * බින්දුසාරගේ මරණයෙන් පසු වැඩිමහල් පුත්‍ර සුෂීම මෞර්ය පාලකයා බවට පත් වීම
    * අශෝක හට පාටලීපුත්‍රයේ රාජ්‍යත්වය සඳහා සුෂීම අභියෝගයක් වීම
    * සුෂීම ඝාතනය කොට ක්‍රි.පූ. 269 දී පාටලීපුත්‍රයේ බලයට පත් වූ බව මහාවංසයේ සඳහන් වීම
    * අශෝක බලය ලබා ගැනීම සඳහා සොහොයුරන් 99 දෙනෙකු ඝාතනය කළ බව දීපවංසයේ සඳහන් වීම
    * දිව්‍යාවදානයේ සඳහන් කරන්නේ සුෂීම පමණක් මරා රජ වූ බව යි.
    * තාරානාථ සඳහන් කරන්නේ සහෝදරයන් හය දෙනෙක් ඝාතනය කොට රජ වූ බව යි.
    * අශෝක රාජත්වයට පත් වී වසර හතරකින් පමණ අභිෂේක වූ බව මහාවංසය සඳහන් කරයි. එසේ වන්නට ඇත්තේ සිංහාසනය පිළිබඳ අරගල පැවැති නිසා වන්නට ඇත.


- **අශෝක රජු යටතේ අධිරාජ්‍යයේ ව්‍යාප්තිය**

– රාජත්වයෙන් අට වන රාජවර්ෂයේ දී කලිංග දේශය යටපත් කිරීම
– එය අශෝකගේ එක ම හා අවසන් දිග්විජය ප්‍රතිපත්තිය වීම
– මෙම සංග්‍රාමය නිසා සිදු වූ ජීවිත හානි සහ ඒ හේතුවෙන් ඇති වූ චිත්ත පීඩාව නිසා දිග්විජය ප්‍රතිපත්තිය අතහැර දැමූ බව 13 වන ගිරි ලිපියේ සඳහන් වීම. මෙම ජයග්‍රහණයත් සමඟ අශෝක අධිරාජ්‍යයේ සීමාව පහත දැක්වෙන පරිදි හඳුනාගත හැකි වීම
    * උතුරු සීමාව - හිමාලය
    * නැඟෙනහිර සීමාව - ඇසෑමය හා වෙරළ තීරය
    * ගිනිකොන සීමාව - බෙංගාලය
    * දකුණු සීමාව - කාවේරි නදිය හා අවට ප්‍රදේශ
    * බටහිර සීමාව - අරාබි මුහුදේ වෙරළ තීරය
    * වයඹ සීමාව - ගන්ධාර හා පුරුෂපුර

- **අශෝක රජුගේ ධර්ම විජය ප්‍රතිපත්තිය**
  - දිග්විජය ප්‍රතිපත්තිය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තියට යොමු වූ බව 13 වන ගිරි ලිපියේ සඳහන් වීම
  - සිය රාජ්‍යයේ ජනතාව ධාර්මික පිරිසක් බවට පත් කිරීම ධර්ම විජය ප්‍රතිපත්තියේ මූලික අරමුණ වීම
  - සියලු ලෝකවාසීන්ගේ යහපත පිණිස කටයුතු කිරීම සිය අරමුණ බව 5 වන ගිරි ලිපියේ සඳහන් වීම
  - සියලු ම ආගම් හා දර්ශනයන් පැවති කරුණුවල එකතුවක් ලෙස අශෝක ධර්මය සැලකීම
  - ධර්ම ප්‍රචාරණය සඳහා මාධ්‍යයක් ලෙස සෙල්ලිපි භාවිත කිරීම

මෞර්ය අධිරාජ්‍යය

මෞර්යය අධිරාජ්‍යය



- මහජනතාවට වඩාත් සමීප වීම සඳහා ධර්ම මහාමාත්‍යවරුන් පත් කළ බව 6 වන ගිරි ලිපියේ සඳහන් වීම
- සියලු ම ආගම්වලට ගරු කිරීම යහපත් බව 12 වන ගිරි ලිපියේ සඳහන් වීම
- රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී ජනතා සුභසාධනය පදනම් කර ගත් සිදු කළ බව
- කලිංග යුද්ධයෙන් පසු බුදු දහම වැලඳ ගනිමින් බුදු දහම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්වීම
- අශෝක විසින් ප්‍රථම වරට බුදු දහම ඉන්දියාවේ රාජ්‍ය ආගමය බවට පත් කිරීම
- තුන්වන ථේරවාදී බෞද්ධ ධර්ම සංගායනාව සඳහා පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබා දීම
- බුදු දහම ජාත්‍යන්තර වශයෙන් ප්‍රචාරය කිරීම සඳහා පියවර ගැනීම
- සාංචි ස්තූපය ඇතුළු වෙහෙර විහාර 8400ක් ඉදි කළ බව බෞද්ධ මූලාශ්‍රයවල සඳහන් වීම
- බුදු දහම ප්‍රචාරය හා අශෝක ධර්මය දෙකක් බව වටයා ගැනීම

- **අශෝක ධර්මය**

- අශෝක රජු බුදු දහම වැලඳ ගැනීමෙන් පසු, සිය රට වැසියා වෙත ඔහුගේ ම
  දහමක් ඉදිරිපත් කරන ලදි. එය අශෝක ධර්මය ලෙස හඳුන්වනු ලැබේ. අශෝක ධර්මය යනු කුමක් ද යන්න පිළිබඳ ව විද්වතුන් අතර විවිධ මත පවතී.
  - * ප්ලීට් සහ බියුලර් - අශෝක ඉගැන්වූ ධර්මය දේශපාලන සහ සදාචාර ප්‍රතිපත්ති ඇතුළත් ධර්මයකි
  - * රාජ් කුමුද් මුඛර්ජි - අශෝක ධර්මය යනු සියලු ආගම්වල සාරය යි.
  - * බී.එම් බරුවා - බුදු දහමේ ලෞකික අංශයට අදාල ඉගැන්වීම් ඇතුළත් ය.
  - * වින්සන්ට් ස්මිත් - ඉන්දියානු සැම ආගමකටම පොදු වූ දහමකි.

- බොහෝ විද්වතුන්ගේ මතය වන්නේ අශෝක ධර්මය බොහෝ විට ආභාසය ලබා ඇත්තේ බුදු දහමින් බව යි. සිගාලෝවාද, ව්‍යග්ඝපජ්ජ, පරාභව ආදි සූත්‍ර දේශනාවලදි එන ගිහි විනය සම්බන්ධ ඉගැන්වීම් රාශියක් අශෝක ධර්මයෙහි ඇතුළත් ය.
- අශෝක අධිරාජයා සිය වැසියාගේ යහපත් පැවැත්ම සඳහා ඉදිරිපත් කළ අශෝක ධර්මය සිය රාජ්‍යයේ පිළිපැදිය යුතු විනය නීති මාලාවක් සේ ජනතාවට ඉදිරිපත් කර ඇත.
- මේවා සෙල්ලිපිවල ග්‍රීක්, කරෝෂ්ටි, බ්‍රාහ්මී ආදි භාෂාවන්ගෙන් ලියා ඇත.
- ධර්ම මහාමාත්‍රවරුන් මෙන් ම රාජ්‍ය නිලධාරීන් මඟින් දහම සිය රාජ්‍ය පුරා ව්‍යාප්ත කර ඇත.

- **අශෝක ධර්මයේ අන්තර්ගතය**

- සුශ්‍රැත (කීකරු භාවය)
  දෙමාපියන්ට, වැඩිහිටියන්ට, ගුරුවරුන්ට හා උසස් කුලීනයන්ට කීකරු වීම
- ආචිති (ගරුත්වය)
  සිසුන් ගුරුවරුන් කෙරෙහිත්, ගුරුවරුන් සිය ශාස්තෘන් කෙරෙහිත්, ගෞරවයක් දැක්වීම
- සම්ප්‍රතිපත්ති (නිරවද්‍ය සංග්‍රහය)
  බ්‍රාහ්මණයන්ට හා ශ්‍රමණයන්ට, ඥාතීන්ට, සේවකයන්ට හා යැපෙන්නන්ට, දිළින්දන්ට හා අසරණයන්ට, මිතුරන්ට හා සගයන්ට සංග්‍රහ කිරීම
- දාන (නිදහස)
  බ්‍රාහ්මණයන්ට, ශ්‍රමණයන්ට, මිතුරන්ට, ඥාතීන්ට සහ වයෝවෘද්ධ ජනයාට දාන දීම
- ප්‍රාණානම් අනාරම්භ (සතුන් ඝාතනයෙන් වැළකීම - සියලු ම පණ ඇති සත්වයන් ඝාතනය කිරීමෙන් හා ඔවුන්ට වධ හිංසා කිරීමෙන් වැළකීම
- සාමාන්‍ය ජීවිතයේ දී පුද්ගල සම්බන්ධතාවල සාර්ථකත්වයට හේතු වන කරුණු ද අශෝක ධර්ම ප්‍රතිපත්තියේ අන්තර්ගත වේ
  උදාහරණ :- සත්‍යගරුක වීම, කෘතවේදීත්වය, දැඩි කැපවීම, ත්‍යාගශීලීත්වය, ආදායම් වියදම් සමබර ව පවත්වාගෙන යාම

– අශෝක ධර්මයේ අංග ඔහු පිහිටවූ ඇතැම් සෙල්ලිපි ඇසුරෙන් හඳුනාගත හැකි ය. එම සෙල්ලිපි කිහිපයක් පහත දැක්වේ.

* දිල්ලි තෝප්‍රා ටැම් ලිපිය
''මාගේ ධර්මය යනු කුමක් ද? පැනයට පිළිතුරු ලෙස මෙය ලියා ඇත. එහි යහපත් දෑ බොහෝය. කරුණාව, දන් දීම, සත්‍යවාදී බව, පිරිසිදු බව යන ඒවා ය ...... අපා දෙපා සිවුපා බහුපා සතුන්ට ප්‍රාණ දානය හෙවත් අභයදානය දිය යුතු ය, මවුපියන්ට හා වැඩිහිටියන්ට කීකරු වීම, ඥාති සංග්‍රහය, සතුන්ට දයාව, දහමෙහි හැසිරීම, ගුරුවරුන්ට වතාවත් කිරීම, මහණ බමුණන්ට දන් දීම, අරපරෙස්සම, අල්පේච්ඡ බව සහ වෙනත් යහපත් දෑ බොහෝ ය''.



දිල්ලි තෝප්‍රා ටැම් ලිපිය

* හවන ගිරි ලිපිය

''මුළු ලොවෙහි වැඩ සැලසීම මට අයත් ක්‍රියාවක් කොට සලකමි. ඊට වඩා සේවයක් මට නැත. මා විසින් කරනු ලබන යම් ව්‍යායාමයක් වේ ද? ඒ සියල් සත්වයන්ගේ මෙලෝ පරලෝ දෙකෙහි යහපතට ඔවුන්ට මා ඇති ණයෙන් නිදහස් වීමට ය''.

* ධෞලී සුළු ගිරි ලිපිය ඃ ''සවේ මුනිසාවේ පජා මම'' - සියලු මනුෂ්‍යයෝ මාගේ දරුවෝය.

- **අශෝක අධිරාජයාගේ සමාජ සුභසාධන කටයුතු**

– අශෝක අධිරාජයාගේ දේශපාලන ප්‍රතිපත්තිවල සමාජ සුභසාධනය ඉහළින් ම කැපී පෙනිණි. එතුමාගේ ශිලා ලේඛන පරීක්ෂා කිරීමෙන් ඒ බව මනා ව අවබෝධ කරගත හැකිය.

  * හවන ගිරි ලිපිය
  ''මා ආහාර බුදින විට, සයනෙහි සරන විට, රථයේ ගමන් කරන විට, අන්තඃපුරයේ සිටින විට කවර මොහොතක හෝ වාර්තාකරුවෝ පැමිණ රටවැසියන් පිළිබඳ ව තොරතුරු දන්වත් වා''

* ධෞලි සුළු ගිරි ලිපිය - ''සවේ මුනිජාවේ පජා ඉම''

- සිය රාජ්‍ය තුළ මහාමාර්ග, ළිං, පොකුණු, අම්බලම් මඟින් ආරෝග්‍ය ශාලා, සෙවණ සඳහා ගස් සිටුවීම, උද්‍යාන ඇති කිරීම, බෙහෙත් උයන් සෑදවීම ආදිය සිදු කොට ඇත
- සුචරිතයෙන් පිරි යහපත් සමාජයක් ගොඩනැංවීම සඳහා ජනතාව දැනුවත් කිරීම. (අසෝක ධර්මය). ඒ සඳහා රාජ්‍යයෙහි සෑම තැනක ම කුලුනු පිහිටුවා එම කරුණු ජනතාව වෙත සමීප කරවීම සඳහා ලියවා තැබීම
- මේ සඳහා,
  * ධර්ම මහාමාත්‍රවරුන් පත් කිරීම
  * වසර පහකට වරක් යුත හා රජුක නම් නිලධාරීන් ධර්ම ප්‍රචාරයේ යෙදවීම
  * නාට්‍ය දර්ශන ආදිය පැවැත්වීම (සමජ්ජ) නිරර්ථක බව වටහා ගැනීම
- මිනිසුන්ට පමණක් නොව තිරිසන් සතුන්ට ද, කරුණාව දැක්වීම අශෝක සුහසාධනවාදී රාජ්‍යයේ සුවිශේෂ කරුණක් වීම

- **මෞර්ය පරිහානිය හා එයට හේතු**

  - අශෝක රජු මිය ගොස් දශක 4ක් යන්නට මත්තෙන් මෞර්ය අධිරාජ්‍යය කොටස් කිහිපයකට බෙදී ගොස් පරිහානිය ආරම්භ වීම
  - අශෝක විසින් ගෙන යන ලද ප්‍රතිපත්ති වක්‍රාකාර ව මෞර්ය පරිහානියට බලපෑ බවට පවතින මත
    * යාගය පිණිස සත්ත්ව ඝාතනය තහනම් කළ නිසා බමුණන්ගෙන් එල්ල වූ විරෝධය
    * ධර්ම මහාමාත්‍යවරුන් පත් කිරීම හා අධිකරණ පද්ධතියේ ඇති කළ සම නීතිය නිසා බමුණන්ගේ සමාජ පිළිගැනීම අඩු වී යාම
    * අවිහිංසාවාදී පිළිවෙත නිසා පරිපාලන තන්ත්‍රය හා හමුදා ශක්තිය දුර්වල වී යාම
    * බුදු දහමට විශේෂ සැලකිල්ලක් දැක්වීම නිසා බ්‍රාහ්මණ ආගමය යටපත් වීම
    * බුදු දහම වෙනුවෙන් විශාල ධනස්කන්ධයක් වැය කිරීම නිසා අර්බුදයකට ලක් වීම
  - අශෝකගෙන් පසු රාජ්‍යත්වය සම්බන්ධයෙන් ඇති වූ කුමන්ත්‍රණ හේතුවෙන් මතු වූ අභ්‍යන්තර අර්බුද හා ප්‍රාදේශික පාලකයන් ස්වාධීන වීම
  - ක්‍රි.පූ. 187 දී පමණ එල්ල වූ ඩිමෙට්‍රියස්ගේ බැක්ට්‍රියානු ග්‍රීක ආක්‍රමණ පරිහානිය වේගවත් කිරීම
  - අවසන් මෞර්ය පාලක බෘහද්රථ මරණයට පත් කරමින් පුෂ්‍යමිත්‍ර ශුංග ක්‍රි.පූ. 187 දී බලයට පත් වීම මෞර්ය රාජවංශයේ අවසානය වීම
  - එසේ එම හේතු බල නොපෑ බව ඉතිහාසය විමසීමේ දී පෙනී යාම
  - හමුදාව අඩපණ වූවා නම් සෙන්පති වූ ශුංග බලයට පත් වූයේ කෙසේ ද යන්න පෙන්වීම
  - අශෝක බුදු දහමට පමණක් නොව සෑම ආගමකටම සැළකීම වගකීමක් බව සෙල්ලිපිවල සඳහන් වීම
  - අශෝක පමණක් නොව පසු ව සිටි අය පවා බ්‍රාහ්මණයන්ට ලෙන් පූජා කිරීම
  - අධිකරණ බලතල ඉන්දියාවේ කිසිම බ්‍රාහ්මණයෙකුට ම අශෝකට පෙර හෝ පසු ව නොතිබීම පෙන්වා දීම
  - සිංහාසනය රැක ගැනීමට අසමත් වීම නිලධාරීන් බලයට පත්වීමෙන් අධිරාජ්‍ය පිරිහීම

- **මෞර්ය පාලන තන්ත්‍රය හා සංස්කෘතිය**

  - මෞර්ය අධිරාජ්‍යයේ පාලන රටාව ප්‍රධාන කොටස් තුනක් යටතේ සාකච්ඡා කළහැකිය.

    * මධ්‍ය පාලනය
    * ප්‍රාදේශික පාලනය
    * නගර පාලනය

**මධ්‍ය පාලනය**

- සමස්ත අධිරාජ්‍යයේ ම පාලනය මෙහෙය වන්නේ අධිරාජයා මඟින් වීම, එහි ප්‍රධානයා රජු වීම හා පරිපාලන නගරය පාටලීපුත්‍රය වීම
- රජු පරිපාලනයේ ප්‍රධානයා වූ රාජාණ්ඩු ක්‍රමයක් ක්‍රියාත්මක වීම. අධිකරණයේ ප්‍රධානියා රජු වීම මරණීය දණ්ඩනය, රටින් පිටුවහල් කිරීම, සිරගත කිරීම සහ දඩ ගැසීම දඬුවම් වශයෙන් පැවතීම
- රාජ්‍ය පාලනය හා සම්බන්ධ තීරණ ගැනීමේ දී රජුට අමාත්‍ය මණ්ඩලයක් සිටීම. ප්‍රධාන අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් 12 - 20 අතර ප්‍රමාණයක් වීම, මේ නිසා ම රජුගේ ඒකාධිපති බලතල සීමා වීම
- රජුගේ සහයට විශාල රාජ්‍ය නිලධාරීන් පිරිසක් සිටීම. අශෝක රජුගේ පළමු ටැම් ලිපියේ මොවුන් හඳුන්වා ඇත්තේ රාජ පුරුෂ ලෙස යි. ඔවුහු ඉහළ (උත්‍ය), මධ්‍යම (මජ්ඣිම), පහළ (හේවය) ලෙස ශ්‍රේණි තුනකට අයත් වූහ.
- යුවරජු, පුරෝහිත, සේනාපති හා මහ ඇමති රජුට සමීප ඉහළ ශ්‍රේණිවලට අයත් නිලධාරීන් වීම
- අමාත්‍යවරුන් යටතේ අධිකාරී නමින් හැඳින්වූ දෙපාර්තමේන්තු පැවතීම
- මෙම නිලධාරීන්ට අමතර ව වාර්ෂික ව කහවණු 24,000ක් ලබාගත් නිලධාරීන් රැසකගේ නම් සඳහන් වීම (සන්නිධාතාපාදමූලික පුරුෂ, සමාහර්තා, අන්තර්වංශික, දූර්ගපාල, අන්තපාල, නාගරික)
- මීට අමතර ව මහාමාත්‍ර නමින් හැඳින්වූ තනතුරු රැසක් පැවැති බව අශෝක ශිලා ලිපිවලින් පැහැදිලි වීම
- යුද්ධ හමුදාව පාරම්පරික/ශ්‍රේණි/අගම්පඩි යන අංශ තුනකින් යුක්ත වීම
- සමාජ සුභසාධනය අරමුණු කර ගනිමින් අශෝක විසින් ධර්මමහාමාත්‍ර නම් නව පරිපාලන තනතුරක් ඇති කිරීම
- මිත්‍ර රාජ්‍ය සමඟ ලිපි ගනුදෙනු කිරීම සඳහා දූත නම් තනතුරක් ඇති කිරීම
- රාජ්‍යය පුරා පරිපාලන කටයුතු සොයා බැලීම සඳහා යුතවරුන් නම් නිලධාරී පිරිසක් ඇති කිරීම
- අශෝක රාජ්‍ය සමය වන විට පරිපාලනය දැඩි ජනතා හිතකාමී පිළිවෙතකින් යුක්ත වීම

**ප්‍රාදේශික පාලනය**

- මෞර්ය අධිරාජ්‍යයේ මධ්‍යම ආණ්ඩුවෙන් පාලනය වූයේ අගනුවර අවට ප්‍රදේශ යි. සෙසු ප්‍රදේශ පාලනයේ පහසුව සඳහා ප්‍රත්‍යන්ත ජනපද හතරකට බෙදා තිබිණි.

    * ස්වර්ණගිරි
    * උදේනි
    * තෝසලී
    * තක්ෂිලා

- මෙම ප්‍රත්‍යන්ත ජනපද නැවත රාෂ්ට්‍ර හෙවත් දිස්ත්‍රික්ක වශයෙන් ද, රාෂ්ට්‍ර නැවත ගම් දහස, ගම් සියය, ගම් විස්ස, ගම් දහය හා පස්ගම් වශයෙන් කුඩා කුඩා ප්‍රාදේශීය ඒකක වශයෙන් ද වෙන් කර තිබිණි.
- මෞර්ය පරිපාලන තන්ත්‍රයේ කුඩා ම පරිපාලන ඒකකය වූයේ ගම යි. ග්‍රාමීය නඩු විසඳීම සඳහා ග්‍රාම කූථ නම් නිලධාරියෙකු පත් කොට තිබිණ.

**නගර පාලනය**

- පාටලීපුත්‍රයේ නාගරික පාලනය ප්‍රධාන මණ්ඩල 6 කින් යුක්ත වීම
    * කර්මාන්ත මණ්ඩලය

* විදේශ කටයුතු පිළිබඳ මණ්ඩලය
* වෙළෙඳ කටයුතු පිළිබඳ මණ්ඩලය
* ආදායම් බදු එකතු කිරීමේ මණ්ඩලය
* උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ මණ්ඩලය
* නිෂ්පාදන බෙදාහැරීමේ මණ්ඩලය

- රජයේ ආදායම වශයෙන් නිෂ්පාදනයෙන් 1/6ක් හෝ 1/4ක් බදු වශයෙන් අය කළ බව
- සමස්තයක් ලෙස මෞර්ය පාලනය විධිමත් ව පැවති බව

- **මෞර්ය සංස්කෘතිය**

- සුවිශේෂ වූ මහා පරිමාණ රාජකීය කලා කෘති බිහි වීම ආරම්භ වූයේ මෞර්ය යුගයේ වීම
- මෞර්ය අවධියේ සංස්කෘතිය හා කලාත්මක නිපුණත්වය නිරූපණය වන අංග කීපයකි.

  * ස්තූපය
  * බුද්ධගයාවේ බෝධිමණ්ඩලය
  * පාෂාණ ස්තම්භය
  * පර්වත හාරා නෙළූ ලෙන්
  * රාජ මාලිගා
- රාජ මාලිගාවේ නටබුන් පැට්නා නුවර ආසන්නයේ බුලන්දිබාග් නම් ස්ථානයෙන් සොයා ගෙන තිබීම
- චන්ද්‍රගුප්ත සිය රාජ මාලිගාවට පර්සියානු අලංකාරයන් එක් කොට තිබූ බව පර්සි බ්‍රවුන් සඳහන් කර තිබීම
- මාලිගාවේ කලුනු ලියවැල් රටා සත්ත්ව හා පක්ෂි රටා මෝස්තරවලින් කැටයම් කොට ඒ මත රිදී ආලේප කර තිබූ බව

රජ මාලිගාවේ නටබුන්



**ස්තූපය**

- අශෝක විසින් ඉදි කරන ලද ස්තූප කිහිපයක් ගැන වංශකථාවල සඳහන් ව ඇති අතර සාංචි හා භාර්හුත් ඒවායින් ප්‍රධාන වීම
- මෙයින් උසස් ම නිර්මාණයක් සේ කලා විචාරකයන්ගේ ප්‍රසාදයට ලක් වී ඇත්තේ සාංචි ස්තූපය බව
- සාංචියේ වැදගත් කලාත්මක නිර්මාණය වන්නේ දිශා හතරේ ඉදි කර ඇති කැටයම්වලින් යුත් තොරණ වීම
- තොරණවල කැටයම් කොට ඇත්තේ බුදු සිරිතට අදාළ කථා වස්තූන් හා ජාතක කථා වස්තූන් වීම
- බුදුන් වහන්සේ දක්වා ඇත්තේ ධර්ම චක්‍රය, බෝධි වෘක්ෂය සහ වජ්‍රාසනය යන සංකේත මඟින් වීම



සාංචි ස්ථූපය

**අශෝක ස්තම්භ**




- අශෝක රජු සමයේ නිර්මාණය වූ අපූර්වත ම කලා නිර්මාණ තනි ගලින් නිර්මිත ස්තම්භ වීම
- මෙම කුලුනු පිහිටුවා ඇත්තේ බෞද්ධ සිද්ධිවලට අදාළ ස්ථානවල හා බෞද්ධ ජනතාව වාසය කළ ස්ථානවල බව
- දැනට අශෝක ස්තම්භ 30ක් පමණ සොයා ගෙන ඇති නමුදු ඒ අතරින් වඩාත් අගනා කලා නිර්මාණය වන්නේ සාරානාත් ස්තම්භ ශීර්ෂය යි.
- කුලුනු ශීර්ෂවල ඇති ඇතා, අශ්වයා, ගවයා සහ සිංහයා යන සත්ත්ව රූපවලින් ප්‍රධාන දිශා හතර නිරූපණය වන බව පවතින මතය
- අශෝක සමයේ නිර්මාණය වූ ලෙන් වැදගත් ව වාස්තු විද්‍යාත්මක නිර්මාණයන් වීම




කැටයම්වලින් යුතු තොරණ (සාංචි)

- පිහිටි ගලෙන් ලෙන් නෙළීම ආරම්භ
  වන්නේ මෞර්ය යුගයේ වීම
- බරාබර්, නාගාර්ජුන සහ සීතාධර්හි යන කඳුගැටවල මෙම ලෙන් දක්නට ලැබීම
- මූර්ති ශිල්පය අතින් වැලිගල්වලින් නිර්මිත යක්ෂයක්ෂණී රූප මෙන් ම ටෙරාකොටා ප්‍රතිමා වැදගත් වීම
- මෙම යක්ෂ රූප පසුකාලීන ව නිර්මාණය වූ මථුරා බුදු පිළිම ආභාස කොට ගැනීම



බරාබර් කඳුගැටවල පිහිටි සුධාමා ගල් ලෙන



නාගාර්ජුන කඳුගැටවල පිහිටි ගෝපිකා ලෙන

ඇගයීම - 01

**අංක 01-02 ප්‍රශ්නවල නාම යුගල පහක් දක්වේ. ඒ අතර එකිනෙකට නොගැළපෙන නාම යුගලක් ඇත. නොගැළපෙන නාම යුගලය හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

1. i. මගධය - බිම්බිසාර ii. කෝසලය - ප්‍රසේනජිත් iii. උජ්ජේනී - චණ්ඩප්පජ්ජෝත
   iv. අංග - ශිශුනාග v. කාසි - බ්‍රහ්මදත්ත (..................)

2. i. බිම්බිසාර - හර්යංක ii. කාලාශෝක - සිසුනාග iii. ධනනන්ද - නන්ද
   iv. කුණාල - මෞර්ය v. පුෂ්‍යමිත්‍ර - කාන්ව (..................)

**අංක 03-04 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එම කරුණ තෝරා එහි අංකය ඉදිරියේ, ඇති තිත් ඉර මත ලියන්න.**

3. අශෝක සෙල්ලිපි
   i. ඉන්දියාවට සෙල්ලිපි ලිවීමේ කලාව මුලින් ම හඳුන්වා දුන්නේ අශෝක රජු ය.
   ii. අශෝක සෙල්ලිපි ඉන්දියාවේ පමණක් නොව ඇෆ්ගනිස්ථානයෙන් හා නේපාල ප්‍රදේශවලින් ද හමු වේ.
   iii. අසෝක සෙල්ලිපි බහුතරයක් බ්‍රාහ්මී අක්ෂරවලින් ලියා ඇත.
   iv. අසෝක රජුගේ ඇතැම් ලිපි ග්‍රීක හා ඇරමයික් භාෂාවලින් ද ලියවී ඇත.
   v. අසෝක රජු ලිපි පිහිටුවීම මඟින් සෘජුව ම මහජනතාවට ආමන්ත්‍රණය කර ඇත.
   (..................)

4. මගධ රාජ්‍යයේ නැඟීමට හා වර්ධනයට හේතු වූ සාධක
   i. අගනුවර හා රාජධානියේ භූගෝලීය පිහිටීම
   ii. කෘෂිකර්මයේ හා වෙළෙඳාමේ වර්ධනය
   iii. දක්ෂ පාලකයන් යටතේ හොඳින් සකස් වූ හමුදාව
   iv. සම්පත්වලින් ආඪ්‍ය වීම
   v. අසල්වැසි ගණ රාජ්‍යවලින් ලැබුණු සහාය

**අංක 07-08 ප්‍රශ්නවල X හා Y තීරු ගළපන්න**

5.

| X | Y |
|---|---|
| i. මගධය | A. බිම්බිසාර |
| ii. අවන්ති | B. උදය |
| iii. කෝසල | C. ප්‍රසේනජිත් |
| iv. වත්ස | D. පුක්කුසාති |
| v. ගන්ධාර | E. පජ්ජෝත |

1. ABCDE 2. ACBED 3. ADBCE 4. AECBD 5. ADECB (..................)

6.

| X | Y |
|---|---|
| i. ඉන්ද්‍රපස්ත | A. ගංගා - යමුනා දෙගංමැදියේ |
| ii. කෞශම්බි | B. යමුනා නිම්නයේ |
| iii. හරප්පා | C. සත්ලෙජ් හා රාවි නදී අතර |
| iv. නාසික් | D. ගෝධාවරී නිම්නයේ |
| v. භාරුකච්ඡ | E. නර්මදා මුවදොර |

1. ABCDE 2. ACBED 3. ADBCE 4. AECBD 5. ADECB (..................)

**අංක 07-10 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4 හා 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න**

| | | |
|---|---|---|
| 1. | නිවැරදි ය | නිවැරදි ය |
| 2. | නිවැරදි ය | වැරදි ය |
| 3. | වැරදි ය | වැරදි ය |
| 4. | වැරදි ය | නිවැරදි ය |
| 5. | නිවැරදි ය | නිවැරදි ය පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

| පළමු වන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
| --- | --- |
| 7. චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ මව නන්ද වංශික කුමරියකි. | නන්ද වංශයේ අවසාන පාලක වූ ධනනන්ද රජු මරා චන්ද්‍රගුප්ත මෞර්ය මගධයේ රජ විය. (............) |
| 8. මහා අලෙක්සැන්ඩර් වයඹදිග ඉන්දියාව අල්ලාගෙන එය ඔහුගේ ප්‍රාන්තයක් බවට පත් කර ගත්තේය. | එම ප්‍රදේශය පාලනයට සෙලියුකස් නිකේටර් පත් කරන ලදි. (............) |
| 9. පාටලීපුත්‍ර නගරයේ පාලනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙගස්තිනීස්ගේ ග්‍රන්ථයෙන් ලැබේ. | නගරය පාලනය වූයේ පස් දෙනෙකුගෙන් යුත් කමිටු හයක සාමාජිකයන් තිහකින් සමන්විත මණ්ඩලයක් මඟිනි. (............) |
| 10. අශෝක රජු යටතේ මහාමාත්‍රවරුන්ට පැවරී තිබුණු රාජකාරිය වූයේ වැසියන් අතර බුද්ධාගම ප්‍රචාරය කිරීමයි. | ධර්ම මහාමාත්‍රවරුන්ගේ වගකීම වූයේ අසෝක ධර්මය ප්‍රචාරය කිරීමයි. (............) |

**අංක 13 සිට 14 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A B C D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර යෝ තෝරා**

1. A **සහ** B **පමණක් නිවැරදි නම් 1 ද**
2. B **සහ** C **පමණක් නිවැරදි නම් 2 ද**
3. C **සහ** D **පමණක් නිවැරදි නම් 3 ද**
4. A **සහ** C **පමණක් නිවැරදි නම් 4 ද**
5. **ප්‍රතිචාර එකක් යෝ දෙකකට වැඩිනම් 5 ද, වරහන තුළ ලියන්න.**

13. මෞර්යයෝ

A. අශෝක සෙල්ලිපිවලින් බහුතරයක් ලියවී ඇත්තේ ඛරෝෂ්ඨී සහ බ්‍රාහ්මී අක්ෂරවලිනි

B. චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ පාලනය පිළිබඳ ව අගනා තොරතුරු ග්‍රීක ඉතිහාසඥයකු වූ හෙරඩෝටස් සපයයි

C. අශෝක සෙල්ලිපිවල සඳහන් ප්‍රියදර්ශන රජු අශෝක ලෙස හඳුනාගත්තේ දීපවංසය හා මහාවංසය ඇසුරෙනි

D. මෞර්යයන් කාසි භාවිත කළ බවට සාධක හමු වී නොමැත

(............)

14. මෙගස්තිනිස්
    A. මෙගස්තිනිස් වනාහි චන්ද්‍රගුප්ත මෞර්ය රාජ සභාවේ සිටි සෙලියුකස් නිකේටර් ගේ තානාපතිවරයා ය.
    B. ඔහු විසින් රචනා කරන ලද ඉන්ඩිකා ග්‍රන්ථයේ චන්ද්‍රගුප්ත මෞර්ය සමයේ ඉන්දියාවේ වැසියන් පාලන ක්‍රමය හා පාලන සංස්ථා පිළිබඳ තොරතුරු අඩංගු වේ.
    C. ඔහුගේ ග්‍රන්ථයේ අසෝක රජුගේ කාලිංග යුද්ධය පිළිබඳ වත් තොරතුරු අඩංගු වේ.
    D. අසෝක සිංහසනාරූඪ වන විට දී මෙගස්තිනිස් මෞර්ය රාජ සභාවේ සිටියේය

(............)

ඇගයීම - 02

1. '' චන්ද්‍රගුප්ත මෞර්ය ඉන්දියාවේ ප්‍රථම අධිරාජයා විය'' සාකච්ඡා කරන්න. (ලකුණු 14)

2. '' මෞර්ය අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨතම පාලකයා අශෝක රජතුමා ය. ''
   i මෞර්ය වංශයේ ආරම්භකයා කවරෙක්ද? (ලකුණු 01)
   i අශෝක රජු පිළිබඳ අධ්‍යයනයේ දී භාවිත කළ හැකි ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   iii අශෝක රජුගේ දේශපාලන හා සංස්කෘතික කාර්ය සිද්ධි කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 07)

3. '' අශෝක ධර්මය ආගමකට වඩා සදාචාරය පිළිබඳ නීති පද්ධතියකි '' මෙම ප්‍රකාශය පරීක්ෂා කරන්න. (ලකුණු 14)

4. ''අශෝක අධිරාජයාගේ අරමුණ වූයේ මහජන සුභසාධනය අරමුණු කොටගත් රාජ්‍යයක් ගොඩනැගීම යි'' සාකච්ඡා කරන්න. (ලකුණු 14)

ඇගයීම -03

- **පහත සඳහන් ස්ථාන ඉන්දියානු සිතියමක ලකුණු කර දෙකක් පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.**
  (පාටලිපුත්‍ර, සාංචි, කලිංග, රජගහනුවර, අලහබාද්, ශ්‍රාවස්ති, උදේනි, සාරානාත්)
  (ලකුණු 1)8


යුරෝපා ඉතිහාසය

# 12.1. නූතන යුරෝපා ශිෂ්ටාචාරයේ පදනම

යුරෝපා ශිෂ්ටාචාරයේ මූලයන් යුරෝපයේ මධ්‍යධරණී ප්‍රදේශ වලින් ආරම්භ වී ඇති බව පෙනේ. ප්‍රධාන වශයෙන් ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය ද ක්‍රිස්තියානි හා ඉස්ලාම් ශිෂ්ටාචාරය ද යුරෝපා ශිෂ්ටාචාරය පෝෂණය කිරීමට දායක වූ බව කිව හැකි ය. මෙම ශිෂ්ටාචාරවල පැවති දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික ලක්ෂණ යුරෝපා ශිෂ්ටාචාරය වෙත එල්ල කරන ලද බලපෑම සාකච්ඡා කිරීම මේ ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

භූගෝලීය වශයෙන් ගත් කළ යුරෝපා ශිෂ්ටාචාරය දකුණෙන් මධ්‍යධරණී මුහුදෙන් ද, උතුරෙන් උතුරු මුහුදෙන් ද, බටහිරින් අත්ලාන්තික් සාගරයෙන් ද, නැගෙනහිරින් ආසියා මහාද්වීපයෙන් ද සීමා වූ භූගෝලීය ප්‍රදේශය තුළ ආරම්භ විය. ග්‍රීක, රෝම, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් ශිෂ්ටාචාරවල ආරම්භය, වර්ධනය හා ව්‍යාප්තිය පිළිබඳ විමර්ශනය කරමින් නූතන ශිෂ්ටාචාරයේ පදනම සකස් වීමට එම ශිෂ්ටාචාර වල දේශපාලන, ආර්ථික, සාමාජික, ආගමික, සංස්කෘතික හා දාර්ශනික අංශවල බලපෑම් තුඩුදුන් ආකාරය මෙහි දී සාකච්ඡා කෙරේ.

**නිපුණතාව** : • විවිධ බලවේග මුල් කොට ගනිමින් ශිෂ්ටාචාර ගොඩනැගෙන ආකාරය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : 1.1 නූතන යුරෝපය උදා වූ ආකාරය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 25 යි.

**ඉගෙනුම් පල** :
- යුරෝපා ශිෂ්ටාචාරයේ පදනම විග්‍රහ කරයි.
- නූතන යුරෝපා ශිෂ්ටාචාරය හැඩ ගැස්වීමට ග්‍රීක, රෝම, ක්‍රිස්තියානි, ඉස්ලාම් ශිෂ්ටාචාර බල පෑ ආකාරය පෙන්වා දෙයි.
- ග්‍රීක, රෝම, ක්‍රිස්තියානි හා ඉස්ලාම් ශිෂ්ටාචාර ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි.
- නූතන යුරෝපයේ ආරම්භයට තුඩු දුන් හේතු පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**


## 1.1 ග්‍රීක, රෝම, ක්‍රිස්තියානි හා ඉස්ලාම් ප්‍රභවයෝ

### ග්‍රීක ශිෂ්ටාචාරය


ග්‍රීක ශිෂ්ටාචාරය ක්‍රි.පූ. 1000 දී පමණ මධ්‍යධරණී ප්‍රදේශවලින් ආරම්භ වූ බව සැලකේ. එය ඇති වීමට පෙර සිට ම මෙම ප්‍රදේශවල ජනතාව ශිෂ්ටාචාර වීමේ ලක්ෂණ පෙන්නුම් කරන අවස්ථා දක ගත හැකි ය. ක්‍රි.පූ. 2000 පමණ කැස්පියන් මුහුදට උතුරින් හා නැගෙනහිරින් පිහිටි ප්‍රදේශවල සිට පැමිණි මුල් ජනපද වාසීන් ග්‍රීසිය ආශ්‍රිත ප්‍රදේශවල පදිංචි වීමෙන් ග්‍රීක ප්‍රදේශ ශිෂ්ටාරවත් වීම ආරම්භ විය. ක්‍රීට දූපත කේන්ද්‍ර කොට ගනිමින් ක්‍රි.පූ. 2000 දී පමණ බිහි වන මිනෝවන් ශිෂ්ටාචාරයත් ක්‍රි.පූ. 1400 දී පමණ බිහි වූ බවට සාධක පවතින මයිසීනියානු ශිෂ්ටාචාරයත් යුරෝපය තුළ බිහි වූ පැරණිත ම ශිෂ්ටාචාර වේ. අවුරුදු 400 ක් පමණ පැවති මයිසීනියානු ශිෂ්ටාචාරය ක්‍රි.පූ. 1150 දී පමණ බිඳවැටී ග්‍රීක ප්‍රදේශවල අඳුරු යුගයක් උදාවිය. වසර 150 කට පමණ පසු ඩෝරියන් ග්‍රීකයන් යටතේ ග්‍රීක ප්‍රදේශවල නව ශිෂ්ටාචාරයක් ගොඩනැගුණු අතර එය ග්‍රීක ශිෂ්ටාචාරය නමින් හැඳින්වේ. පෙර පැවති ශිෂ්ටාචාරයන් ගෙන් ද පෝෂණය වෙමින් එමය වර්ධනය විය. යුරෝපා ශිෂ්ටාචරයට පදනම වන්නේ ක්‍රි.පූ. 1000 දී පමණ සිට වර්ධනය වූ මෙම ග්‍රීක ශිෂ්ටාචාරය යි.




මිනෝවන් ශිෂ්ටාචාරයට අයත් ගොඩනැගිල්ලක්



මයිසීනියානු ශිෂ්ටාචාරය


20°E
24°E
28°E
40°N
38°N
36°N
බෝල්කන් අර්ධද්වීපය
ත්‍රාස්
මැසිඩෝනියා
ඔලිම්පස් කන්ද
අතෝස් කන්ද
ට්‍රෝයි
ලෙම්නෝස්
පර්ගමුම්
එපිරස්
ග්‍රීසිය
කුඩා ආසියාව
සාඩිස්
ඩෙල්ෆි
අත්තිකා
ඔලිම්පියා
අයෝනියන් මුහුද
පෙලපොනීසියාව
ස්පාර්ටා
ලකෝනියා
එපීසස්
මිලේටස්
තෙරා
N
E
W
S
0
50
100
200

ග්‍රීසිය



ඇක්‍රොපොලිස්

**ග්‍රීක ශිෂ්ටාචාරයේ ප්‍රධාන ලක්ෂණ**

- **පාලන කටයුතු**

  - ග්‍රීසියට සංක්‍රමණය වූ මුල් ජනපද වාසීන් ප්‍රථමයෙන් ම ගම් පිහිටුවා ගැනීම
  - කල් යාමේ දී එම ගම් නගර බවට පත් වීම
  - එම නගර කේන්ද්‍ර කොට ගෙන ග්‍රීක ශිෂ්ටාචාරයේ පෞර රාජ්‍ය ක්‍රමය බිහි වීම
  - ෆිනිෂියාව, බැබිලෝනියාව වැනි ශිෂ්ටාචාරවල මීට පෙර නගර (පෞර) රාජ්‍ය පැවතියත් පෞර රාජ්‍ය පිළිබඳ වඩාත් පැහැදිලි සාක්ෂ්‍ය හමු වන්නේ ග්‍රීසියෙන් වීම

- **පෞර රාජ්‍යවල ප්‍රධාන ලක්ෂණ**

  - ඉතා කුඩා භූමි භාගයක් වීම
  - නගර කේන්ද්‍ර කොටගෙන පාලනය ගොඩනඟා තිබීම
  - ඇතැන්ස් සහ ස්පාර්ටා විශාල ම පෞර රාජ්‍ය වීම
  - ජනගහනය කොටස් හතරකින් සමන්විත වීම
    (පුරවැසියන්, ස්ත්‍රීන්, වහලුන් සහ විදේශිකයන් වශයෙනි)
  - ග්‍රීක පිරිමින් පුරවැසියන් ලෙස පමණක් සැලකීම
  - සමාජයේ උසස් ම කොටස පුරවැසියන් වූ අතර පුරවැසියන් නොවූ ස්ත්‍රීන්, වහලුන් හා විදේශිකයන් පහත් කොට සලකනු ලැබීම
  - අගනුවර ඇක්‍රොපොලිස් නමින් හැඳින්වීම සහ එය වෙළෙඳ මධ්‍යස්ථානයක් වීම
  - අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමටත් තම භාණ්ඩ අලෙවි කොට ගැනීමටත් පුරවැසියන් මෙම වෙළෙඳ මධ්‍යස්ථානයට පැමිණීම
  - සෑම පෞර රාජ්‍ය කට ම අධිපති දෙවියකු හෝ දෙවඟනක හෝ සිටීම
  - ඇක්‍රොපොලිස් හි උස ම ස්ථානයේ එම දෙවියා හෝ දෙවඟන වෙනුවෙන් දේවස්ථානයක් ඉදි කොට තිබීම. ඇතැන්ස් රාජ්‍යයට අධිපති ඇතීනා දෙවඟන හෝ වෙනුවෙන් පාතිනන් දේවස්ථානය ඉදි කොට තිබීම නිදසුන් ලෙස දැක්විය හැකි ය.



පාතිනන් දේවස්ථානය

- ග්‍රීක පෞර රාජ්‍යවල විවිධ ආණ්ඩුක්‍රම පැවතීම
- විශාල ම පෞර රාජ්‍ය දෙකෙන් එකක් වූ ස්පාටාවෙහි රාජාණ්ඩු ක්‍රමයක් පැවතීම සහ ඇතැන්ස් හි ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් පැවතීම
- නූතන ලෝකයේ ප්‍රසිද්ධ දේශපාලන මතවාදයක් වන ප්‍රජාතන්ත්‍රවාදයේ මුල් බිම ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යය වීම
  ඇරිස්ටෝටල් සිදු කළ පර්යේෂණයන් අනුව ග්‍රීක පෞර රාජ්‍යවල විවිධ ආණ්ඩුක්‍රම 250ක් පමණ වූ බව සොයා ගැනීම

- ආර්ථික කටයුතු

  - ග්‍රීසියේ ප්‍රධාන ජීවනෝපාය ගොවිතැන වීම
  - මධ්‍යධරණී දේශගුණ තත්ත්වයේ වගා කළ හැකි මිදි, ඔලිව්, එළවුළු වැනි දෑ වගා කිරීම
  - සමහර ප්‍රදේශවල පැවති නිසරු පස නිසා සැම ප්‍රදේශයක ම එක හා සමාන ලෙස කෘෂිකාර්මික කටයුතු කළ නොහැකි වීම
  - පෞර රාජ්‍ය සියල්ල මුහුදෙන් වට වී තිබූ බැවින් ධීවර කර්මාන්තයට ද ප්‍රධාන තැනක් හිමි වීම
  - විදේශ වෙළෙඳාමට ද යොමු වී සිටීම
  - මැටි කර්මාන්තය ද පැවතීම
  - වහල් සේවය ශ්‍රමය ලබා ගැනීමේ ප්‍රධාන මාර්ගය වීම
  - ස්වාභාවික සම්පතක් වශයෙන් රිදී බහුල ව පැවතීම සහ ඒවා ලබාගැනීම සඳහා පතල් කර්මාන්තය ක්‍රියාත්මක කිරීම

- අධ්‍යාපනය

  - පෞද්ගලික පාසල් හා පෞද්ගලික ගුරුවරුන් විසින් අධ්‍යාපනය ලබා දීම
  - ප්ලේටෝ ගේ 'ඇකඩමි' නම් ආයතනය හා ඇරිස්ටෝටල් ගේ 'ලයිසියම්' නම් ආයතනය ඒ අතර ප්‍රධාන වීම
  - උගත් තරුණයන් අතර බෙහෙවින් ජනප්‍රිය වූ 'සොෆිස්ට්' නමින් හැඳින්වූ ගුරුවරුන් පිරිසක් වීම
  - 'සොෆිස්ට්'වරුන් කථිකත්වය, ගණිතය තාරකා ශාස්ත්‍රය, ව්‍යාකරණය, සාහිත්‍යය වැනි විෂයයන් ඉගැන්වීම
  - ස්පාටා නම් පෞර රාජ්‍යයේ සැම පිරිමියකු ම යුධ පුහුණුව ලබා ගත යුතු වීම

- දාර්ශනික චින්තනය හා විද්‍යාව

  - තේලිස්, අනෙක්සිමිනිස්, එම්පරඩොලස් වැනි දාර්ශනිකයන් මුල් ම ග්‍රීක දාර්ශනිකයන් අතර වැදගත් අය වීම (පෘථිවියේ නිර්මාණය පිළිබඳ අදහස් දැක්වූ අයවීම)
  - සොක්‍රටීස් - ප්‍රශ්නෝත්තර තර්ක ක්‍රමය
  - ප්ලේටෝ - පරමාදර්ශී රාජ්‍යය
  - ඇරිස්ටෝටල් - දේශපාලන විද්‍යාවේ පියා
  - ඇරිස්ටාකස්, එරටෝතිනීස්, හෙරක්ලීටස් - පෘථිවිය හා ග්‍රහ වස්තූන් පිළිබඳ වැදගත් වූ ගණිතඥයෝ
  - පයිතගරස් - ශ්‍රේෂ්ඨ ගණිතඥයෙකි. පයිතගරස් න්‍යායය
  - ආකිමිඩීස් - ගණිතය පිළිබඳ නව සොයා ගැනීම් - ජලෝත්පීඩන න්‍යායය
  - හිපොක්‍රටීස් - බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා
  - හෙරඩෝටස් - ඉතිහාසයේ පියා

- **ආගමික විශ්වාස**
  - ග්‍රීක ආගම්, වන්දනා ක්‍රම හා චාරිත්‍ර විධි මත පදනම් ව තිබූ බව පෙනේ. ඔවුහු බහුදේවවාදීහු වූහ. ග්‍රීක දෙවිවරුන් අතර කිසියම් ආකාරයකට සකස් වූ අනුපිළිවෙළක් (ධූරාවලියක්) විය. එමෙන් ම මෙම දෙවිවරුන් ස්වාභාවික සංසිද්ධීන් පිළිබඳ ව කිසියම් බලයක් පැවති පිරිසක් ලෙස සැලකුණු අතර ඔවුන් අතර ඥාතිත්වයක් ද පැවති බව විශ්වාස කරන ලදි.

    * සියුස් - අහසට අධිපති, දෙවියන් අතර ප්‍රධානයා
    හෙරානා - සියුස් දෙවියාගේ බිරිය
    ඇතීනා - සියුස් දෙවියන්ගේ දියණියෝ
    ඒරස් - යුද්ධයට අධිපති - හෙරානාගේ පුත්‍රයා
    හර්කියුලිස් - ලෝකය උසුලාගෙන සිටින්නා - සියුස් දෙවියාගේ පුත්‍රයා
    ඇපලෝ - සූර්ය දෙවියා
    ප්‍රොසයිඩන් - සමුද්‍රයට අධිපති
    ඇෆ්‍රඩයටී - ආලයට අධිපති

  - දෙවිවරුන් පුර රාජ්‍යවල අධිපතින් ලෙස ද කටයුතු කොට ඇත.
    * සියුස් - ඔලිම්පියා
    * ඇතීනා - ඇතැන්ස්
    * ඇපලෝ - ඩෙල්පි
    * ඇෆ්‍රඩයිටී - කොරින්ත්
    * බිලි පූජා පැවැත්වීම ද ග්‍රීකයන්ගේ පූජා විධි ක්‍රමයක් වීම

  - හෝමර්ගේ 'ඉලියඩ් හා ඔඩෙසි' හෙසියඩ්ගේ 'වැඩ සහ දවස් ' යන කෘති ග්‍රීක ශිෂ්ටාචාරය ඉගෙනීමට ඇති වැදගත් කෘති වේ.

- **ක්‍රීඩාව**



ඇතැන්ස්හි පිහිටි පැරණි ඔලිම්පික් ක්‍රීඩාංගනය

සියුස් දෙවියන් මුල් කොට ගත් ආගමික උත්සවයක් ලෙස ඔලිම්පික් උලෙළ ග්‍රීකයන් අතර ආරම්භ විය. මෙය වසර හතරකට වරක් පැවැත්වූ උත්සවයක් විය. සියලු ම පුර රාජ්‍යවල ජනයා ඊට සහභාගි වූහ. මෙම ක්‍රීඩා උලෙළ පැවැත්වෙන කාලය තුළ පුර රාජ්‍යයන් අතර සියලු ම ගැටුම් නවතා ඔවුහු ඊට සහභාගි වූහ. ප්‍රධාන වශයෙන් මලල ක්‍රීඩා, බර ඉසිලීම, මල්ලව පොර, වීසි කිරීමේ ඉසව්, පිහිනීම, අශ්ව රථ පැදවීම, පංච ප්‍රයාම වැනි ක්‍රීඩා ඉසව් මෙම උලෙළට ඇතුළත් විය.

පර්සියානුවන් හා ග්‍රීකවරුන් අතර මැරතන්හිදී ඇති වූ සටනින් ජයග්‍රහණය ලබන ඇතැන්ස් හමුදා නායකයා ඔවුන්ගේ ජයග්‍රහණය ඇතැන්ස් ජනයාට දැනුම් දීම සඳහා යැවූ පණිවුඩ කරුවකු එම පණිවිඩය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ මැරතන් නම් ස්ථානයේ දී මරණයට පත් විය. එම අවස්ථාව සිහි කිරීම පිණිස ඔලිම්පික් උලෙළෙහි අවසන් ක්‍රීඩා ඉසව්ව ලෙස මැරතන් තරගය ඇතුළත් කොට ඇත.

- **කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය**

පෙරික්ලීස් යුගය ග්‍රීක කලාවේ දියුණුම යුගය විය. ග්‍රීක කලාව යුරෝපා ශිෂ්ටාචාරයට වඩාත් බලපෑම් එල්ල කළ ක්ෂේත්‍රයක් විය. මූර්ති ශිල්පය හා ගෘහ නිර්මාණ ශිල්පය ඒ අතරින් වඩාත් කැපී පෙනේ

- **මූර්ති කලාව**
  - ග්‍රීක කලාව පිළිබඳ විවිධ දක්ෂතා දැක්වූ ග්‍රීකයන් ඇත් දළින් හා රනින් ප්‍රතිමා නෙළීම
    උදාහරණ : ඇතීනාගේ ප්‍රතිමාව, සියුස් දෙවියන්ගේ ප්‍රතිමාව



ඇතීනා දෙවඟන

- ඇටසැකිල්ල මාංස පේශි ආදි ශරීරයේ සෑම අංගයක් ම ඉස්මතු ව පෙනෙන ආකාරයට ප්‍රතිමා නිර්මාණය කිරීම
  උදාහරණ : කවපෙත්ත විසි කරන්නා, බොක්සිං ක්‍රීඩකයා
- මනා ලෙස ඔප දැමූ හුනු ගල්වලින් හා කිරිගරුඬවලින් ගොඩනැඟිලි ඉදිකිරීම ග්‍රීක ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂ ලක්ෂණයකි
  උදාහරණ : ඇතැන්ස්හි ඇක්‍රොපොලිස් නම් ස්ථානයේ ඉදි කරන ලද පාතිනන් දෙවි මැදුර



කවපෙත්ත විසි කරන්නා



මල්ලව පොර




ඩයෝනීසියස් ගේ රඟ මඩල



ඩයෝනීසියස් ගේ රඟ මඩලෙ හි ආසනවල ඇති කලාත්මක නිර්මාණ

- ඩොරික් සම්ප්‍රදායයට අනුව නිම කරන ලද කුලුණුවල දේව කතා අලංකාර ලෙස කැටයමට නඟා තිබීම





- මැටි භාණ්ඩ නිර්මාණය කාසි හා මුද්‍රිකා නිර්මාණය. සිතුවම් සහිත බිත්ති නිර්මාණය වැනි අංශ ද වැදගත් වේ
- ග්‍රීකයන් සතු උසස් සාහිත්‍ය කලාවක් තිබීම
- හෝමර් ගේ ඉලියඩ් සහ ඔඩෙසි
- නාට්‍ය කලාවෙහිලා භාවිත වන සුඛාන්ත හා ශෝකාන්ත නාට්‍ය සම්ප්‍රදාය ග්‍රීසියෙන් ආරම්භ වීම
- ක්‍රි.පූ. 425 දී ජීවත් වූ ඇරිස්ටොපේනිස් ප්‍රථම සුඛාන්ත (Comedy) නාට්‍ය රචකයා ලෙස සැලකීම
- ඊස්කිලස්, යුරිපීඩීස්, සොෆොක්ලීස් සුප්‍රකට දෘශ්‍ය කාව්‍යකරුවන් වීම
- හෙරඩෝටස් - ඉතිහාසයේ පියා - ග්‍රීක පර්සියානු සටන් ගැන ලියවී ඇති කෘතිය
- තියුසිඩිසිස් - පෙලපොනීසියානු යුද්ධය




මැටි භාණ්ඩ

ග්‍රීසියේ පැවති විවිධ සංකේත වර්තමාන ලෝකයේ ද රාජ්‍ය ලාංඡන සඳහා භාවිත වී තිබීම උදාහරණ: ලෙස උකුස්සා රාජ්‍ය ලාංඡනය ලෙස යොදා ගැනීම
ග්‍රීක වෛද්‍ය ශාස්ත්‍රයේ දී භාවිත වූ සර්පයාගේ ලාංඡනය - වෛද්‍ය ක්ෂේත්‍රය හා අදාළ නොයෙක් සංවිධාන සඳහා යොදා ගෙන තිබීම. - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විවිධ වෛද්‍ය සංවිධාන




උකුස්සා හා ස

## රෝම ශිෂ්ටාචාරය


රෝමවරුන්ගේ ප්‍රභවය, ඉතාලියේ ටයිබර් නදිය අසල ජීවත් වූ ලතින් භාෂාව කථා කළ ජන කණ්ඩායමකින් සිදු වූ බව සාමාන්‍ය විශ්වාසය යි. රෝම ජනශ්‍රැතිවලින් කියවෙන අන්දමට ක්‍රි.පූ. 753 දී පමණ රෝමය ගොඩ නඟනු ලැබුවේ රොමියුලස් සහ රීමස් නම් නිවුන් සහෝදරයන් විසිනි. ක්‍රි.පූ. දෙවන සියවසේ සිට ක්‍රි.ව. පස් වන සියවස තෙක් කාලය රෝම ශිෂ්ටාචාරය ප්‍රබල ව පැවති යුගය ලෙස සැලකේ. රෝමවරු යුද්ධ කටයුතුවල හා දේශපාලන කාර්යයන්හි අතිදක්ෂයෝ වූහ. ක්‍රි.පූ. තුන්වෙනි සියවස වන විට ස්පාඤ්ඤය, දකුණු ප්‍රංශය, උතුරු අප්‍රිකානු ප්‍රදේශ, මිසරය, මැසිඩෝනියාව හා සිරියාව වැනි ප්‍රදේශවල බලය ව්‍යාප්ත කරමින් ජූලියස් සීසර්ගේ කාලයේ දී උතුරු දෙසට ව්‍යාප්ත වී එංගලන්තය ද යටත් කොට ගෙන විශාල අධිරාජයක් ගොඩනැඟීමට රෝමවරු සමත් වූහ.

ජූලියස් සීසර්, ඔගස්ටස් සීසර්, නීරෝ, කැරකැල්ලා, කොන්ස්ටන්ටයින්, ජස්ටිනියන්, මාකස් අවුරේලියස් යන අධිරාජවරු රෝම අධිරාජ්‍යය නඟා සිටුවීමෙහිලා දායක වූහ. රෝම අධිරාජ්‍යයේ උච්චතම අවස්ථා වන විට බටහිර යුරෝපය, මැදපෙරදිග හා නැඟෙනහිර යුරෝපයේ විශාල ප්‍රදේශයක රෝම අධිරාජ්‍යය ව්‍යාප්ත ව පැවතිණි. ක්‍රිස්තියානි ධර්මයේ උපත හා ව්‍යාප්තිය මේ යුගයේ සිදු වූ විශේෂ සිදුවීමක් ලෙස දැක්විය හැකි ය.

මාකස් අවුරේලියස්ගේ මරණින් පසු රෝම අධිරාජ්‍යයේ පරිහානිය ආරම්භ විය. ඩයොක්ලීශන් හා කොන්ස්ටන්ටයින් යන අධිරාජවරු රෝම අධිරාජ්‍යය බිඳී යාමට නොදී තවදුරටත් ආරක්ෂා කොට ගත්හ. ඩයොක්ලීශන් අධිරාජයාගේ කාලයේ නැඟෙනහිර හා බටහිර රෝම අධිරාජ්‍යය වශයෙන් රෝම අධිරාජ්‍යය කොටස් දෙකකට බෙදිණි. බටහිර අධිරාජ්‍යයේ අගනුවර රෝමය වූ අතර බයිසැන්තියම නැඟෙනහිර අධිරාජ්‍යයේ අගනුවර විය. කොන්ස්ටන්ටයින් අධිරාජයා විසින් නැවත අධිරාජ්‍යය එක්සත් කොට බයිසැන්තියම එහි අගනුවර බවට පත් කොට එය වැඩි දියුණු කොට එය කොන්ස්තන්තිනෝපල් නමින් නම් කරන ලදි. කොන්ස්ටන්ටයින් අධිරාජයාගේ මරණින් පසු රෝම අධිරාජ්‍යය නැවත කොටස් දෙකකට බෙදී ගයේ ය. ක්‍රි.ව. 5 වන සියවසේ දී එල්ල වූ ම්ලේච්ඡ ආක්‍රමණ හේතු කොටගෙන බටහිර රෝම අධිරාජ්‍යය බිඳවැටිණි. එසේම ඔටෝමන් තුර්කි වරුන්ගෙන් එල්ල වුණු ආක්‍රමණවල ප්‍රතිඵල වශයෙන් 1453 දී නැඟෙනහිර රෝම අධිරාජ්‍යය ද බිඳ වැටිණි.

**රෝමවරුන්ගෙන් ලද දායාද**

- **පාලන ක්‍රමය**
    - මුලින් ම ප්‍රධාන පුරවැසියන්ගෙන් සැදුම් ලත් සමූහාණ්ඩුවක් ලෙස පාලන කටයුතු ආරම්භ කිරීම. එම සමූහාණ්ඩ ව තුළ සෙනේට් සභාවට ප්‍රධාන තැනක් ලැබීම. වැඩිමහලු පුරවැසියන්ගෙන් එම සභාවට සාමාජිකයන් තෝරා ගැනීම
    - මුල් අවධියේ දී සෙනේට් සභාවෙන් පාලකයා ලෙස තෝරාගත් තැනැත්තා ප්‍රථමයා නමින් හැඳින්වූ අතර පසු ව ඔහු අධිරාජ්‍යයා වශයෙන් හැඳින්වීම
    - කොන්සල්වරුන් නමින් හැඳින්වූ නිලධාරීන් දෙදෙනෙකුට රෝම සමූහාණ්ඩු පාලන රටාව තුළ ප්‍රධානත්වයක් ලැබීම
    - රෝමවරුන් විශාල අධිරාජ්‍යයක් ගොඩ නැගූ අතර අධිරාජ්‍යය තුළ වාසය කළ සියලු ජන කොටස් සඳහා සාමය, සමාදානය සහතික වන ප්‍රාදේශීය හා පළාත් පාලන ආයතනයක් ක්‍රියාත්මක කිරීම
    - ජස්ටිනියන් අධිරාජයා විසින් ක්‍රියාත්මක කරන ලද නීති ක්‍රමය රෝමවරුන්ගෙන් ලෝකය ලද විශිෂ්ටත ම දායාදයක් වීම



- නඩු ඇසීම, සාක්ෂ්‍ය ඔප්පු කිරීම, ජූරි සභාව මගින් අවසාන තීන්දු ගැනීම, චූදිතයා වරදකරුවකු ලෙසඔප්පු වන තෙක් ඔහු නිවැරදි කරුවකු ලෙස පිළිගැනීම, නීතිය ඉදිරියේ සෑම පුරවැසියකු ම එක හා සමාන ලෙස සැලකීම ආදි අංග එම නීති පද්ධතියට තුළ ඇතුළත් විය. ප්‍රජාතන්ත්‍රවාදී බොහෝ ලක්ෂණ මෙම නීති පද්ධතියෙහි දක්නට විය.

- ආර්ථිකය

  - රෝම අධිරාජයාගේ ප්‍රධාන ආදායම් මාර්ගය වෙළෙඳාම වීම. යුරෝපා රටවල් සමඟ පමණක් නොව අරාබිය, චීනය, ඉන්දියාව, ලංකාව වැනි ආසියාතික රටවල් සමඟ ද වෙළෙඳ සම්බන්ධතා පැවැත්වීම
    මැටි බඳුන්, රෙදි පිළී, ලෝහ භාණ්ඩ හා වීදුරු නිෂ්පාදනය පුළුල් ලෙස පැවතීම
  - ආසියාතික රටවලින් රෝමයට ගෙන එන ලද සේද රෙදි, සුවඳ විලවුන්, විසිතුරු පිඟන් භාණ්ඩ, ඖෂධ වර්ග, මුතු මැණික්, ඇත් දළ, කුළු බඩු ආදිය යුරෝපා වෙළෙඳ පොළ වෙත අලෙවි කිරීම
  - මීට අමතර ව ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකර්මාන්තයට විශේෂ තැනක් ලැබීම

- අධ්‍යාපනය

  - සමූහාණ්ඩුවා දී මුල් යුගයේ දී ඉහළ ප්‍රභූ පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය දෙමාපියන් විසින් ම පවත්වාගෙන යන ලදි. එහි දී දැනුම දීමට වඩා පැරණි රෝම සිරිත් විරිත්, සම්ප්‍රදායයන් හා වීර චරිත පිළිබඳ ආදර්ශ බාල පරපුරට ලබා දීම සිදු විය.
  - ග්‍රීක බලපෑම්වලට ලක්වී පසු කාලයේ අධ්‍යාපනය ක්‍රමයෙන් ආයතන වශයෙන් හැඩගැසිණි. ග්‍රීක වහල්ලු හා නිදහස ලත් වහල්ලු රෝමයේ ගුරු වෘත්තියට එකතු වූහ. ස්පූරියස් කාවිලියම්ස් නමැති නිදහස ලත් වහලෙක් ක්‍රි.පූ. 250 දී පමණ මුදල් අය කරන පාසලක් ආරම්භ කළේය.
  - ලිවීම, කියවීම, ව්‍යාකරණ, තර්ක ශාස්ත්‍රය ආදිය එකල උගන්වනු ලැබූ ප්‍රධාන විෂයයන් විය.
  - ග්‍රීක සහ ලතින් කාව්‍ය, කථිකත්වය, නීතිය, වෛද්‍ය විද්‍යාව, යුද්ධ ශිල්පය වැනි විෂයයන් ද උගන්වනු ලැබීය.
  - තාරකා ශාස්ත්‍රය, ගණිතය. විද්‍යාව, වෛද්‍ය විද්‍යාව ආදි විෂයයන් උසස් අධ්‍යාපන ආයතන වල විෂය මාලාවට ඇතුළත් විය. ධනවතුන්ගේ දරුවන්ට පමණක් සීමා වූ උසස් අධ්‍යාපන ආයතන ඇතැන්ස්, රෝඩ්ස් වැනි ග්‍රීක මධ්‍යස්ථානවල පිහිටුවා තිබිණි.

- ආගම


  - රෝමය අධිරාජ්‍යය තත්ත්වයට පත් වන විටත් රෝමයේ සංවිධානාත්මක ආගමක් නොතිබිණි. අව්ව, වැස්ස, විදුලිය වැනි ස්වභාව ධර්මයේ විවිධ වස්තු දේවත්වයේ ලා සැලකීම ඔවුන්ගේ ප්‍රධාන වන්දනා මාන ක්‍රම විය
  - රෝම වරුන් අතර බහුදේව වාදය පැවතිණි
    * ජුපිටර් - අහසට අධිපති
    * මාර්ස් - යුද්ධයට අධිපති
    * වීනස් - ආලයට අධිපති
    * නෙප්චූන් - මුහුදට අධිපති
    * මිනර්වා - අත්කම්වලට අධිපති
    * සෙරෙස් - අස්වැන්නට අධිපති

  - භූතාත්ම වන්දනා කිරීම
  - මව් දෙවඟනට පුද පූජා පැවැත් වීම
  - මියගිය හා ජීවමාන අධිරාජවරුන් දේවත්වයේ ලා වන්දනා මාන කිරීම
    උදා : (සීසර් අභිවන්දනය) - ජුලියස් සීසර්, ඔගස්ටස් සීසර්, ඩයොක්ලීෂන්

- මුල දී රෝම අධිරාජවරුන් ක්‍රිස්තියානි ආගමට විරුද්ධ වුවත් කොන්ස්ටන්ටයින් අධිරාජයාගේ කාලයේ ක්‍රිස්තු ධර්මය නීත්‍යානුකූල ආගමක් ලෙස ප්‍රකාශ කිරීම
- තියඩෝසියස් අධිරාජයාගේ කාලයේ ක්‍රිස්තු ධර්මය රෝම අධිරාජ්‍යයේ එක ම නීත්‍යානුකූල ආගම හෙවත් රාජ්‍යාගම බවට පත් කිරීම

- **සාහිත්‍ය කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය**

  - සාහිත්‍ය කටයුතුවල දී හා අධිකරණ කටයුතුවල දී රෝම වරුන්ගේ ප්‍රධාන භාෂා මාධ්‍ය වූයේ ලතින් භාෂාව යි.
  - අධිරාජ්‍ය පාලන සමය (ඔගස්ටස් සීසර්) රෝම සාහිත්‍යයේ දියුණු යුගයක් විය
  - ජුලියස් සීසර්, සිසරෝ විසින් ද ග්‍රන්ථ රචනා කොට තිබිණි
  - ඔගස්ටස් අධිරාජයාගේ කාලයේ වර්ජිල්, හොරේස්, ලිවී, ඕවිඩ් යන අය ප්‍රසිද්ධ ලේඛකයෝ වූහ. වර්ජිල් කවියා විසින් රචිත ඊනිඩ් කෘතිය ලෝක සාහිත්‍යයේ ශ්‍රේෂ්ඨතම කෘතියක් ලෙස සැලකේ.
  - ටැසිටස්, ප්ලූටාක්, ජුවෙනෙල්, සෙනෙකා, මාකස් අවුරේලියස් වැනි අය ලතින් සාහිත්‍යය පෝෂණය කිරීමට දායක වූහ.
  - ප්ලිනි ස්වාභාවික ඉතිහාසය පිළිබඳ (Natural History) නවීන විශ්වකෝෂය සම්පාදනය කිරීම
  - පුවත්පත් මඟින් ජනතාවට තොරතුරු දැන්වීම රෝමවරුන් අනුගමනය කළ ක්‍රමවේදයකි. යුද්ධ ජයග්‍රහණ, ක්‍රීඩා හා මල්ලව පොර පිළිබඳ තොරතුරු, මරණ දැන්වීම් ආදිය මෙම පුවත්පත්වල දැක්විණි. (Daily acts) ඒවා යකඩ හෝ ගල්පුවරු මත කොටා සකස් කොට තිබිණි. පොත් බැඳීමේ ක්‍රම ඇරඹීම සිදු වූයේ ද රෝම ශිෂ්ටාචාරය තුළ ය.



ලෝකයේ ප්‍රථම පුවත්පත ක්‍රි.පූ 131



පොදු වැසිකිළි


- ජුලියස් සීසර් පැපිරස් පත්‍ර බැඳ සටහන් පොත් සැකසීමේ ක්‍රමය භාවිත කොට ඇති අතර පසු කාලීන ව බයිබලය සඳහා ද මෙම ක්‍රමවේදය යොදාගෙන ඇත
- පොදු ගොඩනැගිලි ඉදි කිරීම හා වඩාත් සැප පහසු නාන කාමර හා වැසිකිළි, කැසිකිළි පද්ධති නිර්මාණය රෝම ගෘහ නිර්මාණ ශිල්පයෙහි තුළ කැපී පෙනේ.
- විශාල ගොඩනැගිලි ආරුක්කු සහ ගොඩනැගිලි මුදුනෙහි ගෝලාකාර ශිඛර ඉදි කිරීම
- කොලෝසියම් ක්‍රීඩාගාරය, ඩයොක්ලීෂන් අධිරාජයාගේ මාලිගය, වාණිජ මධ්‍යස්ථානය වූ බැසිලිකා ගොඩනැගිලි රෝම වරුන්ගේ ගෘහ නිර්මාණ ශිල්පයට උදාහරණ වේ.
- ඔවුන් භාවිත කළ කොන්ක්‍රීට් ක්‍රමය ද ගොඩනැගිලි ඉදි කිරීමේ දී වැදගත් වේ.
- වර්ණ භාවිතය, චිත්‍ර සඳහා උචිත ආලෝකය, අඳුර යෙදීම සම්බන්ධයෙන් දක්ෂතා දැක්වූ අතර මැටි බඳුන් අලංකාර කිරීමේ කලාවද එකල ප්‍රචලිත වී තිබිණි
- චරිත ලක්ෂණ කැපී පෙනෙන ආකාරයට ප්‍රතිමා නිර්මාණය කිරීම ද රෝමවරුන්ගේ විශේෂ ලක්ෂණයකි. නිදසුන් ලෙස ඔගස්ටස්, ට්‍රාජන් හා ඩයොක්ලීෂන් වැනි අධිරාජයන්ගේ ප්‍රතිමාව දැක්විය හැකි ය.

- **මහාමාර්ග**

  - රෝම අධිරාජ්‍ය සමයේ ඉංජිනේරු ශිල්පය විශිෂ්ට මට්ටමක පැවතිණි. ක්‍රමවත් මහාමාර්ග තැනීම සම්බන්ධයෙන් ඔවුහු දක්ෂයෝ වූහ. සමස්ත අධිරාජ්‍යය ම මහාමාර්ග මඟින් ප්‍රධාන නගරයට (රෝමයට) සම්බන්ධ කොට තිබිණි. ගල් අතුරා සකස් කරන ලද මාර්ග තැනීම
  - විශාල ගංගාවල් හරහා පාලම් තැනීම (ඩැනියුබ් ගඟ හරහා) හා ක්‍රමානුකූල ජලාපවහන පද්ධති සැකසීම ද මේ යුගයේ දක්නට විය



රෝම පාලමක්




නගරයට ජලය ගෙන ගිය ආකාරය



පැරණි රෝමයේ මාර්ග

- **විද්‍යාත්මක චින්තනය**

- පෞද්ගලික සනීපාරක්ෂාව හා පිරිසිදු කම අගය කළ ඔවුන් ඒ සඳහා නාන තටාක ඉදි කිරීම
- රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා වෛද්‍යවරුන් යෙද වූ අතර නේවාසික රෝහල් ක්‍රමය ක්‍රියාත්මක කිරීම
- සියලු ම විද්‍යා විෂයයන් පිළිබඳ සංක්ෂිප්ත සංග්‍රහයක් ලෙස ප්ලිනි විසින් නැචුරාලිස් හිස්ටෝරියා (ස්වාභාවික ඉතිහාසය) නම් ග්‍රන්ථය සකස් කරනු ලැබීම
- සොසිගිනස් විසින් ජුලියස් දින දර්ශනය සම්පාදනය කරනු ලැබීම



රෝමයේ පිහිටි මහජන නාන තටාකය

## ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

ක්‍රිස්තු ධර්මය යුරෝපයේ ඇතිවූ ප්‍රථම සංවිධානාත්මක ආගමය ලෙස සැලකිය හැකි ය. යුරෝපා ශිෂ්ටාචාරය හැඩගැස්වීමේ ලා පදනම් වූ ආගමික සාධකය ක්‍රිස්තු ධර්මය යි. වර්තමාන ලොව පුරා භාවිත වන ක්‍රිස්තුන් වර්ෂ නමැති වර්ෂ ක්‍රමය ආරම්භ වූයේ ක්‍රිස්තුස් වහන්සේගේ උපන් දිනය මුල් කොටගෙනය. රෝම අධිරාජ්‍යයේ ඔගස්ටස් සීසර්ගේ පාලන සමයේ දී ජේසු තුමා උපත ලද අතර එතුමා උපන් ස්ථානය වූ ජෙරුසෙලම (බෙත්ලෙහෙම) එවකට රෝම අධිරාජ්‍යයට අයත් ප්‍රදේශයක් ව පැවතිණි. ක්‍රිස්තු ධර්මයේ ව්‍යාප්තිය ඇරඹෙන්නේ ජේසු තුමා කුරුසියේ තබා ඇණ ගැසීමෙන් පසු අපෝස්තුලුවරුන් වශයෙන් හැඳින්වුණු එතුමාගේ ගෝලයන් විසින් ධර්මය දේශනා කිරීම ආරම්භ කිරීමෙන් පසු ව ය.

- **ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයෙන් යුරෝපය ලද දායාද**

  - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය නූතන යුරෝපා ශිෂ්ටාචාරය බිහි වීමට පදනම සැකසූ එක් බලවේගයක් වීම
  - ක්‍රි.ව. තුන් වෙනි සියවස පමණ වන විට රෝම අධිරාජයාගේ සියලු ප්‍රදේශවල හා සුළු ආසියානු ප්‍රදේශවලට කිතු දහම පැතිරී තිබීම
  - කොන්ස්ටන්ටයින් අධිරාජයා කිතු දහම වැළඳගෙන ක්‍රි.ව. 313 දී මිලාන් ආඥාව මඟින් කිතු දහම රෝම අධිරාජ්‍යය තුළ නීත්‍යානුකූල ආගමයක් බවට පත් කිරීම
  - තියඩෝසියස් අධිරාජයා හතරවෙනි සියවස අග භාගයේ දී සෙසු සියලු ආගම් මිථ්‍යා දෘෂ්ටික ආගම් ලෙස නම් කොට ඒවා ඇදහීම තහනම් කර ක්‍රිස්තු ධර්මය (රෝම අධිරාජ්‍යයේ රාජ්‍යාගම බවට පත් කිරීම) රෝම අධිරාජ්‍යය පුරා පැවතිය යුතු එක ම ආගම බවට පත්කිරීම
  - රෝම අධිරාජ්‍යයට එල්ල වූ ම්ලේච්ඡ ආක්‍රමණවලින් පසු ගෝල් දේශය මුල් කොටගෙන තම රාජ්‍යය ගොඩනගාගත් ෆ්‍රැන්ක් ගෝත්‍රයේ ක්ලෝවිස් රජු කිතු දහම වැළඳ ගැනීම නිසා යුරෝපය තුළ කිතු  දහම ව්‍යාප්ත වීම
  - ඉන් පසු එම රාජ්‍යයේ සිහසුනට පත් චාලිමේන් අධිරාජයා එම රාජ්‍යය ශුද්ධ රෝම අධිරාජ්‍යය ලෙස නම් කොට එය ව්‍යාප්ත කිරීම
  - එමඟින් ශුද්ධ රෝම අධිරාජ තනතුර බිහි වීම
  - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ඇසුරෙන් යුරෝපා සමාජයට සංවිධානාත්මක ආගමයක් ලැබීම
  - ක්‍රි.ව. 590 දී පමණ මහා ග්‍රෙගරි පාප් වහන්සේ යටතේ පාප් තනතුර බිහි වීම හා එයට යුරෝපා සමාජයේ ආධිපත්‍යය හිමි වීම
  - එතුමා මිශනාරීන් යවා බ්‍රිතාන්‍ය හා ජර්මන් ප්‍රදේශවල ද කිතු දහම ව්‍යාප්ත කරවීම
  - ක්‍රිස්තු සභාව සමාජය මෙහෙයවන ප්‍රධාන බලවේගය බවට පත් වීම
  - ම්ලේච්ඡ ආක්‍රමණවලින් ජනතාව ආරක්ෂා කොට පැරණි සංස්කෘතිය ආරක්ෂා කිරීම ක්‍රිස්තු සභාව මඟින් සිදු කිරීම
  - ක්‍රිස්තු සභාව අධ්‍යාපන කටයුතු මෙහෙයවන ප්‍රධාන ආයතනය වීම
  - කලා නිර්මාණ කෙරෙහි නිරන්තරයෙන් කිතු දහමේ බලපෑම ඇති වූ අතර ආගමික අංශයට බර වූ නිර්මාණ බිහි වීම
  - කිතු දහමේ බලපෑමත් සමඟ දේශපාලන ක්ෂේත්‍රයේ ද වෙනස්කම් ඇති වීම. ඒ අනුව දේවවරම් වාදී  අදහස් ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීම



ආගමික අංශයට බර වූ කලා නිර්මාණ


**ඉස්ලාම් බල ව්‍යාප්තිය**

**ප්‍රධාන අවස්ථා**

ක්‍රි.ව. 570 දී අරාබියේ මක්කම නගරයේ දී උපත ලද මහම්මත් නබි තුමා දේශනා කළ ධර්මය ඉස්ලාම් ධර්මය නමින් හැඳින්වේ. එම දහමට අනුව ලොව ඇති එක ම දෙවියා 'අල්ලා' ය. මෙම නව ධර්මය ශුද්ධ වූ කුරාණයේ අන්තර්ගත වේ. ඉස්ලාම් ධර්මය වැලඳගත් අය මුස්ලිම්වරුන් නමින් හැඳින් වේ. කල් ගත වෙත් ම ඉස්ලාම් ධර්මය ලෝකයේ ප්‍රධාන ආගම් අතරට එක් විය.


මහම්මත් තුමාගේ නව ධර්මයට විරුද්ධ ව කාබා දේවස්ථානයේ පූජකවරුන් නැඟී සිටීම නිසා එතුමාගේ ජීවිතයට පවා තර්ජන එල්ල වූ බැවින් ක්‍රි.ව. 622 දී එතුමා මදීනා නුවරට පසුබැස්සේ ය. මදිනා නගරයේ දී එතුමා වටා විශාල ශ්‍රාවක පිරිසක් එක්වූ ක්‍රි.ව. 630 දී මක්කම නගරය ද අල්ලා ගනු ලැබී ය. මක්කම නගරයේ විසූ ජනතාව එතුමාගේ ධර්මය පිළිගත් අතර මහම්මත් තුමා අරාබිය පුරා නව ආගම පැතිරවීමට සමත් විය.

ක්‍රි.ව. 632 දී මහම්මත් තුමා මියයන විට අරාබිය පුරා ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත වී තිබිණි. අරාබියේ ප්‍රධානයන් විසින් මහම්මත් තුමාගේ අනුප්‍රාප්තිකයා ලෙස අබුබකර් (එතුමාගේ මිත්‍රයා) පත්කොට ගන්නා ලදි. මොහු පළමු වන කාලිෆ්වරයා ලෙස හැඳින්වේ. තමන්ගේ සුළු පාලන කාලය තුළ (632-634) අසල්වැසි රාජ්‍ය වූ සිරියාව තුළ ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත කිරීමට අබුබකර් සමත් විය. ඊළඟ කාලිෆ් වරයා වූ ඔමාර් (634-644) විශාල ඉස්ලාම් අධිරාජ්‍යය ගොඩනැංවී ය. රෝම අධිරාජයා වූ හෙරක්ලීටස් පරාජය කොට සිරියාව, ඩැමැස්කසය, පලස්තීනය හා ෆිනීෂියාව අල්ලාගෙන මෙසපොතේමියාව, ඊජිප්තුව හා පර්සියාව තෙක් ඉස්ලාම් අධිරාජ්‍යය ව්‍යාප්ත කරන ලදි. ඊළඟ සියවස තුළ දී උතුරු අප්‍රිකාව හා ස්පාඤ්ඤය ද ජය ගෙන පිරනීස් කඳුවැටිය තරණය කොට ප්‍රංශය ද අල්ලා ගැනීමට උත්සාහ කළ ද එය අසාර්ථක විය. 8 වන සියවස වන විට නැඟෙනහිරින් සින්ද් ප්‍රදේශය දක්වා තම බලය ව්‍යාප්ත කරගැනීමට ඔවුන්ට හැකි විය.



ක්‍රි.ව. 9 වන සියවස වනවිට සිසිලිය හා ඉතාලියේ දකුණු කොටස ද යටත් කොට ගෙන මධ්‍යධරණී මුහුදේ ආධිපත්‍ය දිනාගැනීමට මුස්ලිම් වරුන්ට හැකිවිය. වැඩිකල් යාමට පෙර නැගෙනහිර අප්‍රිකාව, මලයාව, ඉන්දුනීසියාව, බටහිර චීනයේ අතැම් ප්‍රදේශ සහ ඉන්දියාව යන රටවල ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත වී තිබිණි.

ක්‍රි.ව. 15 වන සියවස පමණ දක්වා ස්පාඤ්ඤයේ තම බලය රැක ගැනීමට මුස්ලිම් වරු සමත් වූහ. අරාබින් විසින් යටත් කොට ගන්නා ලද ප්‍රදේශ වල ජනයාට ඉස්ලාම් ධර්මය වැළඳ ගැනීමට බලකළ අතර එසේ නැතහොත් කප්පම් ගෙවීම හෝ මරණය තෝරාගැනීමට ඔවුන්ට සිදුවිය. ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් බවට පත්වන තුරුම ස්පාඤ්ඤයේ මුස්ලිම් බලය පැවතිණි. බොස්පරස් සමුද්‍ර සන්ධියේ සිට පිරනීස් කඳුවැටිය දක්වා ඔවුහු තම ආධිපත්‍යය පිහිටුවා ගත්හ.



කාලිෆ් වරු

අබුබකර් ගෙන් පසු කාලිෆ් තනතුරට පත් වූ ඔමාර් මරා දැමීමෙන් පසු ඔත්මාන් කාලිෆ් තනතුරට පත් වූ එකල ඇති වූ සිවිල් යුද්ධයක ප්‍රතිඵලයක් වශයෙන් ඔහු ව ද මරා දමනු ලැබී ය. ඉන්පසු මහම්මත් තුමාගේ දුව විවාහ කරගෙන සිටි අලී කාලිෆ් තනතුරට පත් විය. සිරියාවේ ආණ්ඩුකාර ධූරය දැරූ මුවාවියත් හා අලී අතර ඇතිවූ ගැටීමෙන් අලී ද මරණයට පත් විය. ඉන් පසු මුවාවියත් කාලිෆ් තනරට පත් විය. කාලිෆ් තනතුර සඳහා අලිගේ පුත් හුසේන් සහ මුවාවියත්ගේ පුත් සෙයිඩ් අතර ඇති වූ ගැටුමේ ප්‍රතිඵලයක් වශයෙන් හුසේන් මරණයට පත් විය. අනුප්‍රාප්තිකත්වය සඳහා ඇති වූ මතභේද මුල් කොට ගෙන මුස්ලිම්වරු සුන්නි හා ෂියා වරු වශයෙන් කොටස් දෙකකට බෙදී ගියහ. අබුබකර් හා ඔහුගේ අනුප්‍රාප්තිකයන් දෙදෙනා මහම්මත්ගේ නියම අනුප්‍රාප්තිකයන් ලෙස පිළිගන්නා අය සුන්නිවරුන් වශයෙනුත්, අලි මහම්මත් නියම අනුප්‍රාප්තිකයා ලෙස පිළිගන්නා අය ෂියාවරුන් වශයෙනුත් හැඳින්වූ හ.

- **ඉස්ලාම් ශිෂ්ටාචාරයෙන් යුරෝපය ලද දායාද**
  - ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත ව පැවති අරාබීන් අතර, උසස් අධ්‍යාපන ක්‍රමයක් පැවතීම. එම අධ්‍යාපන ක්‍රමයෙන් යුරෝපය ආභාසය ලැබීය.
  - ශ්‍රේෂ්ඨ අධ්‍යාපන ආයතන රැසක් තිබීම
    උදාහරණ ලෙස බැග්ඩෑඩ්, කයිරෝ, ඩැමැස්කස්, කොරඩෝවා, සෙවිල්ලේ සහ බාසිලෝනා විශ්ව විද්‍යාල දැක්විය හැකි ය.
  - අරාබි විද්වතුන් පැරණි ග්‍රීක සම්භාව්‍ය කෘති සහ ගණිත විද්‍යාව පිළිබඳ හින්දු කෘති අරාබි භාෂාවට පරිවර්තනය කිරීම
  - ප්‍රබුද්ධ පාලකයන් ඉගෙනීමේ කටයුතු වැඩි දියුණු කිරීමට අනුග්‍රහ දැක්වීම. ඒ සඳහා දක්ෂ සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම. මූලාශ්‍රය කෘති එක්රැස් කොට පුස්තකාලය පවත්වාගෙන යාම වැනි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම
  - ඉස්ලාම් ශිෂ්ටාචාරය මඟින් ලෝක සාහිත්‍යයට වැදගත් බලපෑමක් ඇති කළ සාහිත්‍ය කෘති රාශියක් බිහි වීම
    * ලෝකයේ ශ්‍රේෂ්ඨතම සම්භාව්‍ය කෘතියක් ලෙස සැලකෙන කුරාණය සම්පාදනය කිරීම
    * පෙර අපර දෙදිග ලේඛකයන්ට වටිනා වස්තුවක් වූ අරාබි නිසොල්ලාසය රචනා කිරීම
    * එක් දහස් එක් රැය (පසු කාලයේ මෙය විවිධ භාෂාවලට පරිවර්තනය විය)
    * යුරෝපා දෘශ්‍ය කාව්‍යයන්ට තදින් ම බලපෑම් ඇති කළ කෘති අතර ඕමාර් ඛයියාම්ගේ රුබයියාට්
    * අල් තබාරිගේ අපොස්තුලුවරුන්ගේ හා රජවරුන්ගේ වෘත්තාන්තමය චරිත කථා අතර ප්‍රමුඛස්ථානයක් ගනී

- **වෛද්‍ය විද්‍යාව හා විද්‍යා දැනුම**
  - අවිසින්නා - වෛද්‍ය විද්‍යාවේ විනය නීති සඳහා සියවස් ගණනක් තිස්සේ වෛද්‍යවරු මෙම කෘතිය අත්පොතක් ලෙස භාවිත කළහ.
  - රශේස්ගේ - වෛද්‍ය විද්‍යාවේ පරිචය (අල්හවි) කෘතිය
  - බස්රාවේ අල්හසන්ගේ - දෘෂ්ටි විද්‍යාව - බටහිර දෘෂ්ටි වෛද්‍යවරුන් කෙරෙහි ඉතා මත් බලපෑම් ඇති කළ මෙම කෘතිය පසු කාලයේ ලතින් භාෂාවට ද පරිවර්තනය කොට ඇත
  - අල්රාසි විසින් වසූරිය රෝගය හඳුනා ගැනීම
  - ආරෝග්‍යශාලා ක්‍රමය යුරෝපයට ලැබුණේ මුස්ලිම්වරුන්ගෙන් වීම
  - රෝම ඉලක්කම් වෙනුවට ඉන්දියාවේ සහ අරාබියේ භාවිත වූ ඉලක්කම් ක්‍රමය (0-9) භාවිත වීම ආරම්භ වීම
  - ඉන්දියානු විද්‍යාත්මක දැනුම අරාබීන් හරහා යුරෝපයට ලැබීම
    උදාහරණ: නිවැරදි මිනුම් ක්‍රම භාවිත කිරීම, දශම ක්‍රමය, භෞතික විද්‍යාවේ ලම්බක න්‍යායය
  - ත්‍රිකෝණ මිතික ක්‍රමය දියුණු කිරීම
  - අක්ෂාංශ දේශාංශ ඇඳීම සඳහා නිවැරදි මිනුම් ක්‍රම භාවිත කිරීම
  - චීනයේ භාවිත වූ කඩදාසි නිපදවීම, අච්චු මුද්‍රණ ක්‍රමය, මාලිමා යන්ත්‍රය යුරෝපයට හඳුන්වා දීම

- නයිට්‍රික් අම්ලය, සල්ෆියුරික් අම්ලය, බොරැක්ස් නයිට්‍රේට් වැනි රසායනික පදාර්ථ යුරෝපයට හඳුන්වා දීම

- **ආර්ථිකය**

  - විදේශ වෙළෙඳාම ඉස්ලාම් ශිෂ්ටාචාරයේ ප්‍රධාන ආර්ථික ක්‍රමය වීම
  - මුස්ලිම් අධිරාජ්‍යයේ ව්‍යාප්තියට හා ස්ථාවරත්වයට බලපෑ ප්‍රධාන සාධකය වූයේ විදේශ වෙළෙඳාමෙන් ත් ආදායම යි. (කාන්තාර බහුල වීම නිසා කෘෂිකාර්මික කටයුතු සඳහා සුදුසු පරිසරයක් නොවීම ඊට හේතු වන්නට ඇත.)
  - බැග්ඩෑඩ් නගරය මුස්ලිම් අධිරාජ්‍යයේ වැදගත් වෙළෙඳ මධ්‍යස්ථානය වීම
  - පෙරදිග රටවල් සමඟ මෙන් ම යුරෝපා රටවල් සමඟ ද වෙළෙඳාම පැවතීම
  - ආසියාවේ වෙළෙඳ ආධිපත්‍ය 16 වන සියවස දක්වා ම මුස්ලිම් වරුන් සතු වීම
  - මුස්ලිම් අධිරාජ්‍යය ලබා තිබූ දියුණුව හා ඔවුන්ගේ වෙළෙඳ ආධිපත්‍යය ක්‍රි.ව. 11 වෙනි සියවසේ සිට 15 වෙනි සියවස දක්වා පැවති කුරුස යුද්ධවල දී ක්‍රිස්තු භක්තිකයන් පරාජය කිරීමට බොහෝ දුරට උපකාරී වීම




බැග්ඩෑඩ් නගරය

- **කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය**

  - රෙදි සායම් කිරීමේ කලාව, චිත්‍ර කලාව, පර්සියානු බුමුතුරුණු ආදිය පිළිබඳ දැනුම අරාබින් හරහා යුරෝපයට ලැබීම
  - සංගීතය පිළිබඳ දැනුම (ගිටාරය වැනි භාණ්ඩ, තාල, රාග) අරාබින්ගෙන් යුරෝපයට ලැබුණු වැදගත් දායාදයක් වීම
  - ඉස්ලාම් ශිෂ්ටාචාරයේ විශිෂ්ට ගෘහ නිර්මාණ ශිල්පයක් පැවතීම. ස්පාඤ්ඤයේ ග්‍රැනඩාහි අල්හම්බ්‍රා මාලිගය, සෙවිල්හි අල්කසාර්, බැග්ඩෑඩ්හි මහා පල්ලිය, සමාරා පල්ලිය ඉස්ලාම් ශිෂ්ටාචාරයේ ශ්‍රේෂ්ඨ නිර්මාණවලට උදාහරණ ලෙස දැක්විය හැකි ය.
  - ඔවුන්ගේ ගෘහ නිර්මාණවල විශේෂාංග ලෙස අර්ධ ගෝලාකාර වහල, ආරුක්කු සහ උස් කොත් ආදිය ඇතුළත් වී තිබීම



අල්හම්බ්‍රා මාලිගය



i udr dm, ą ls



අරාබි ගෘහනිර්මාණ

වැඩවසම් ක්‍රමයේ පරිහානිය

- වැඩවසම් ක්‍රමයේ පරිහානියට හේතු
  - කුරුස යුද්ධය හඳුන්වා දීම
  - කුරුස යුද්ධය හා වෙළෙඳාමේ දියුණුව
  - කුරුස යුද්ධ අවධියේ පෙර අපර දෙදිග වෙළෙඳාම පුළුල් වීම
  - කොන්ස්තන්තිනෝපලය ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානයක් වීම
  - නව රාජාණ්ඩු වෙළෙඳාමට දිරි දීම
  - වෙළෙඳාම පුළුල් වත් ම වැඩවසම් ආර්ථික රටාව නූතන යුරෝපයට උචිත ලෙස හැඩගැසීම

- නගර වර්ධනය
  - ප්‍රවේණි පිරිහීමට පත් වෙද් දී නිදහස ලැබූ ඇතැම් අය විසින් කුඩා කුඩා වෙළෙඳ නගර බිහිකිරීම
  - යාබද ප්‍රදේශවල අමුද්‍රව්‍ය හා නිෂ්පාදිත භාණ්ඩ එම නගරවලට ගෙන ඒම
  - වෙළෙඳ කටයුතුවල යෙදුනු අයට ආරක්ෂාව අවශ්‍ය වූයෙන් ඔවුනොවුන් සමීප ව එක් මධ්‍යස්ථානයක පදිංචි වීම නිසා නගර බිහි වීම
  - වෙළෙඳම දියුණු වී මුදල් භාවිතය වැඩි වීමත් සමඟ බැංකු සහ අනිකුත් පහසුකම් සහිත ව නාගරීකරණය වර්ධනය වීම
  - දොළොස් වන සියවස වන විට වෙළෙඳ, වාණිජ හා විද්වද් ආදි විවිධ ක්ෂෙත්‍ර සඳහා නගර වර්ධනය
  - නගර වර්ධනය සමඟ යුරොපය නව මඟකට යොමු වීම

- **මධ්‍යම පංතියේ නැගීම**

  - වෙළෙඳම දියුණු වීමත් මුදල් පරිහරණය වැඩි වීමත් සමඟ එමගින් ධනය උපයාගත් නව මධ්‍යම පන්තියක් බිහිවීම
  - ඔවුන් මනා අධ්‍යාපනයක් ලබා සමාජයේ උසස් පිරිසක් බවට පත් වීම
  - රජවරුන් තම උපදේශකයන් හා පාලන නිලධාරීන් වශයෙන් රදලයන් නොව අලුතින් බිහි වූ මධ්‍යම පන්තිකයන් පත් කර ගැනීම
  - ප්‍රදේශීය පාලකයන් හා රජුගේ උපදේශකයන් ලෙස කටයුතු කළ වංශාධිපතිවරුන්ගේ බලය පිරිහී යාම
  - මධ්‍යතන යුගයේ වංශාධිපතින් ලබා තිබූ සමාජ තත්ත්වය මධ්‍යම පංතිය වෙත ලැබෙන්නට වීම
  - වංශාධිපතිවරුන් අබිබවා මධ්‍යම පන්තිය රටේ බලවත් පිරිසක් බවට පත් වීම

    මෙම වෙනස්වීම් යුරෝපය නූතන යුගයක් කරා ගෙනයාම



ප්ලෝරන්ස් නගරය



වෙළෙදාමේ දියුණුව හා නගර වර්ධනය දක්වෙන චිත්‍රයක්

ඇගයීම් - 01

**අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න සඳහා නාම පද පහ බැගින් දී ඇත. ඒවායින් එකක් කුමන හේතුවක් නිසා හෝ නොගැළපේ. නොගැළපෙන පිළිතුර තෝරන්න.**

1. 1. සොක්‍රටීස් 2. ප්ලේටෝ 3. සොසිගිනස් 4. පයිතගරස් 5. ඇනෙක්සිමීනස්

2. 1. ඊසිකිලස් 2. සොෆොක්ලීස් 3. යුරිපීඩ්ස් 4. හෝමර් 5. වර්ජිල්

3. 1. ඩයොක්ලීෂන් 2. කොන්ස්ටන්ටයින් 3. පෙරික්ලීස් 4. ක්ලෝඩියස් 5. මාර්කස් අවුරේලියස්

4. 1. බැග්ඩෑඩ් 2. බොලොඤ්ඤා 3. කයිරෝ 4. බාර්සිලෝනා 5. ඩැමැස්කස්

5. 1. අවිසින්නා 2. ඕමාර් ඛයියාම් 3. අල්හසන් 4. ෆීඩියාස් 5. අල්රාශි

ඇගයීම - 02

**පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

1. i. වැඩවසම් ක්‍රමය යනු කුමක් ද?
(ලකුණු 01)
   ii. වැඩවසම් ක්‍රමයේ දේශපාලන, ආර්ථික, සාමාජික ලක්ෂණ දෙක බැගින් ලියන්න.
(ලකුණු 06)
   iii. වැඩවසම් ක්‍රමය බිඳ වැටීමට හේතු වූ කරුණු කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 07)

2. ග්‍රීක, රෝම, ක්‍රිස්තියානි, ඉස්ලාම් ශිෂ්ටාචාර ව්‍යාප්තිය සිතියමක ලකුණු කරන්න.
(ලකුණු 14)
3. යුරෝපා ශිෂ්ටාචාරයේ පදනම කෙරෙහි ග්‍රීක, රෝම හා ඉස්ලාම් ශිෂ්ටාචාර බල පා ඇති ආකාරය විග්‍රහ කරන්න.
(ලකුණු 14)
4. නූතන යුරෝපයේ ආරම්භයට තුඩු දුන් හේතු විස්තර කරන්න.
(ලකුණු 14)

## 2. නූතන යුරෝපයේ ආරම්භය

යුරෝපා ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී එය ප්‍රධාන වශයෙන් ඓතිහාසික යුග තුනකට බෙදා දැක්විය හැකි ය. එනම්

- පුරාතන යුගය- ක්‍රි.පූ. 1000 පමණ සිට ක්‍රි.ව. 5 වන සියවස තෙක්
- මධ්‍යතන යුගය - ක්‍රි.ව. 5 වන සියවසේ සිට ක්‍රි.ව. 15 වන සියවස තෙක්
- නූතන යුගය - ක්‍රි.ව. 15 වන සියවසෙන් පසු කාලය

පෙර පාඩමේ දී පුරාතන හා මධ්‍යතන යුගවල යුරෝපා ඉතිහාසයේ පදනම සැකසුණ ආකාරය අවධානයට යොමු කර ඇත. මෙම ඒකකයේ දී පුනරුදය සමග ඇති වූ බුද්ධි ප්‍රබෝධය නව විද්‍යාත්මක සොයාගැනීම් ජාතික රාජ්‍යවල නැඟීම හා දේශ ගවේෂණ හරහා යුරෝපා බල ව්‍යාප්තිය මඟින් යුරෝපය නූතන යුගයට පරිවර්තනය වූ ආකාරය අධ්‍යයනය සඳහා යොමු කර ඇත.

**නිපුණතාව** : යුරෝපයේ සිදු වූ වෙනස්වීම් ලෝකය කෙරෙහි බල පෑ ආකාරය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : යුරෝපය නූතන යුගයට අවතීර්ණ වූ ආකාරය විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :
- පුනරුදය විග්‍රහ කරයි.
- නව ප්‍රවණතා මඟින් යුරෝපය නූතන යුගයට පැමිණි ආකාරය පෙන්වා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.**

**නූතන යුරෝපයේ ආරම්භය**

- **පුනරුදය හා බුද්ධි ප්‍රබෝධය**

  - ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල යළි පිබිදීමක් පමණක් නොව සමකාලීන යුරෝපයේ දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතික අංශවල පුළුල් ප්‍රබෝධයක් ඇති කිරීම පුනරුදය ලෙස හැඳින්වේ

  - පුනරුදයේ උච්චතම අවධිය 15 වන සියවස වුවත් ශාස්ත්‍රීය පුනරුදය ඇති වීමේ ලක්ෂණ 12 වෙනි සියවසේ විශ්වවිද්‍යාල බිහිවීමත් සමග දක්නට ලැබීම

- **විශ්ව විද්‍යාලයවල විෂය ක්ෂේත්‍ර වෙනස් වීම**

  - ක්‍රි.ව. 1453 ඔටෝමන් තුර්කීන් කොන්ස්තන්තිනෝපලය යටත් කරගැනීම පුනරුදයට බලපෑ ප්‍රධාන හේතුවක් වීම
  - පුනරුදය මුලින් ම ඇති වූයේ ඉතාලිය මුල් කරගෙන බව හඳුනා ගැනීම

- **පුනරුදය හා බුද්ධි ප්‍රබෝධය**

  - වෙළෙඳාමේ දියුණුව හා ධනවත් වෙළෙඳ පන්තියේ අනුග්‍රහය ලැබීම
  - ඉතාලිය තුළ වැඩවසම් ක්‍රමය පිරිහීම
  - ඉතාලි ප්‍රදේශීය පාලකයන් වූ කුමාරවරුන්ගේ සහය ලැබීම
  - මානවවාදී පාප්වහන්සේලාගේ අනුග්‍රහය ලැබීම
  - ඉතාලිය තුළ ග්‍රීක, රෝම සංස්කෘතික අංගවල ශේෂයන් පැවතීම

- **පුනරුදයේ බලපෑම් නිසා ප්‍රබෝධයට ලක් වූ ක්ෂේත්‍ර**

  - භාෂාව, කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය
  - ග්‍රීක ලතින් භාෂාවල ප්‍රබෝධය
  - මානවාදය නැඟී ඒම
  - චිත්‍ර කලාව, ප්‍රතිමා කලාව ග්‍රීක රෝම සම්ප්‍රදායයන්ට නැඹුරු වීම
  - පුනරුද කලාව ස්වාභාවිකත්වයට හා ලෞකිකත්වයට වඩාත් නැඹුරු වීම
  - ගොතික් සම්ප්‍රදායයෙන් බැහැර වූ ගෘහ නිර්මාණ ශිල්පයක් බිහි වීම
  - ඉතාලියෙන් ආරම්භ වූ පුනරුදය යුරෝපයේ සෙසු රටවල් කරා ව්‍යාප්ත වීම
  - පුනරුදයේ ඉහත දක්වෙන ලක්ෂණවල බලපෑම හේතුකොටගෙන යුරෝපයේ දේශපාලන, ආර්ථික, සමාජ, ආගමික, සංස්කෘතික සහ අධ්‍යාපන ආදි සියලු ක්ෂේත්‍රවල පුළුල් විපර්යාසයක් ඇති විය.
    - * වැඩවසම් දේශපාලන සංස්ථා බිඳවැටී රජුගේ බලය සංකේන්ද්‍රගත වීම, රදල බලය අඩු වීම, ඒකීය පද්ධතියක් බිහි වීම, දේශපාලන ස්ථාවරභාවය, රජුට ස්ථාවර හමුදාවක් ලැබීම, ජාතික රාජ්‍ය බිහිවීම දේශපාලන වශයෙන් සිදු වූ පරිවර්තනය වේ.
    - * ස්වයංපෝෂිත භාවය බිඳ වැටීම, වෙළෙඳම පුළුල් වීම, මුදල් භාවිතය සුලභ වීම, බැංකු ක්‍රම ආරම්භ වීම, පෞද්ගලික ව්‍යවසායකත්වය පුළුල් වීම, බද්ධ ව්‍යාපාර සමාගම් බිහි වීම ආර්ථික වශයෙන් සිදු වූ පරිවර්තනය යි.
    - * වැඩවසම් වහල් බැමි බිඳ වැටී උපතින් නොව ධනය හා උගත්කම මත සමාජ තරාතිරම තීරණය වීම, නාගරීකරණය, වෙළෙඳ නගර බිහි වීම, තරගකාරීත්වය, ලෞකිකත්වයට තැනක් හිමි වීම සමාජීය වශයෙන් සිදු වූ පරිවර්තන වේ.
    - * ක්‍රිස්තු සභාවේ සම්ප්‍රදායික මතවාද අභියෝගයට ලක් වීම හා නව නිකායන් බිහි වීම, පූජක සංස්ථාවේ බලය දුර්වල වීම ආගමික වශයෙන් වූ පරිවර්තනය යි.
    - * ලෝකෝත්තරවාදයෙන් මිදී ලෞකික රසාස්වාදයට නිර්මාණ බිහි වීම, ග්‍රීක රෝම ආභාසයෙන් නව ගෘහ නිර්මාණ බිහි වීම සංස්කෘතික පරිවර්තනය වේ.
    - * ග්‍රීක ලතින් භාෂාවල නව ප්‍රබෝධය, නව පොතපත මුද්‍රණය වීම ක්‍රිස්තු සභාවෙන් නිදහස් වූ අධ්‍යාපන රටාව, විශ්වවිද්‍යාලයීය විෂයමාලාවට නව විෂයයන් එකතු වීම, උගතුන්, බුද්ධිමතුන් බිහි වීම අධ්‍යාපන ක්ෂෙත්‍රයේ සිදු වූ පරිවර්තනය වේ.

    පුනරුදයෙන් වූ මෙම පරිවර්තන යුරෝපයේ නූතන යුගයේ උදාවට හේතු විය.

- **විද්‍යාත්මක සොයා ගැනීම්**

  - පෘථිවි කේන්ද්‍රීය මතය නිෂ්ප්‍රභ වී සූර්ය කේන්ද්‍රීය මතය තහවුරු වීම
  - විද්‍යාඥයන්ගේ නව සොයා ගැනීම්

    - * නිකලස් කොපර්නිකස් - පෘථිවිය ගෝලාකාර බව හා සියලු ග්‍රහයන් සූර්යයා වටා පරිභ්‍රමණය වන බව
    - * ජොහැන්නස් කෙප්ලර් - සෞරග්‍රහ මණ්ඩලයේ සියලු ග්‍රහලෝක සූර්යා වටා ඉලිප්සාකාර ව ගමන් කරන බව
    - * ගැලීලියෝ ගැලිලි - දුරදක්නය නිපදවීම මගින් විශ්වයේ මෙතෙක් නොදත් තොරතුරු දැන ගත හැකිවීම
    - * අයිසැක් නිව්ටන් - ගුරුත්වාකර්ෂණ නියමය
    - * මාලිමා යන්ත්‍රය, උතුරු තරු මාපකය නිපදවීම - ආරක්ෂා සහිත ව මුහුදු ගමන්වල යෙදිය හැකි වීම
    - * මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීම - ප්‍රකාශන වඩාත් ප්‍රචලිත වීම සහ වැඩි දෙනෙකුට කියවීමට අවස්ථාව ලැබීම

- **වෛද්‍ය විද්‍යාවේ ඇති වූ ප්‍රබෝධය**

  * පැරසල්සස් - ලෙඩරෝග වැළඳීමට හේතු සහ ඒවාට අදාළ ප්‍රතිකර්ම පිළිබඳ ව අත්හදා බැලීම
  * මයිකල් - රුධිර සංසරණ පද්ධතියේ ක්‍රියාදාමය සොයා ගැනීම සර්වේටස්
  * විලියම් හාර්වේ - රුධිර සංසරණ ක්‍රමය සම්පූර්ණයෙන් සොයා ගැනීම
  * විද්‍යාත්මක ක්ෂේත්‍රයේ වූ මෙම සොයා ගැනීම් සාම්ප්‍රදායික මත බිඳ දමා යුරෝපය නව යුගයක් වෙත ගෙනයාමට දායක විය.
  - යුරෝපයේ ඇති වූ මෙම විද්‍යාත්මක සොයාගැනීම් යුරෝපයේ නව යුගයක් වෙත ගෙනයාමට දායක විය

- **ජාතික රාජ්‍යයන්ගේ නැගීම**

**ජාතික රාජ්‍යය**

- නිශ්චිත දේශ සීමාවකින් සහ නිශ්චිත ජන සංඛ්‍යාවකින් සමන්විත වූ සමාන භාෂාවක් ව්‍යවහාර කරන පොදු වූ ජාතික අනන්‍යතාවකින් යුක්ත වූ දේශපාලන ඒකකය ජාතික රාජ්‍ය නමින් හැඳින්වේ.

**ජාතික රාජ්‍ය බිහි වීමේ පසුබිම**

- නැගී ආ මධ්‍යම පන්තියේ ක්‍රියාකාරිත්වය
- මකියාවලි, ජීන්බොඩැන් යන දාර්ශනිකයන්ගේ මතවාද
- පුනරුදයේ බලපෑම්
- වාණිජවාදය
- ජාතිමාමක අදහස් ප්‍රචලිත වීම

**ජාතික රාජ්‍යවල පොදු ලක්ෂණ**

- නිශ්චිත භූගෝලීය දේශ සීමාවකින් යුක්ත වීම
- ස්වෛරී රාජාණ්ඩුව
- ප්‍රදේශීය නායකයන්ගේ බලය සීමා වීම
- පෞද්ගලික නිලකාර හමුදා අහෝසි කිරීම
- රජු ස්ථිර හමුදාවක් පවත්වාගෙන යාම
- ජාතික නීති පද්ධතියක් බිහි වීම
- ජාතික බදු ප්‍රතිපත්තිය
- වැටුප් ලබන නිලධාරි පන්තියක් බිහි වීම

ප්‍රථමයෙන් ස්පාඤ්ඤය, එංගලන්තය, ප්‍රංශය මුල් කරගෙන ජාතික රාජ්‍ය බිහි වීම

**එංගලන්තය**

- යුරෝපයේ පැනනැගි මුල් ම ජාතික රාජ්‍ය එංගලන්තය විය.

- නොමැන්ඩියේ පාලකයා වූ විලියම් 1066 දී එංගලන්තය ජයගෙන බෙදී පැවති ප්‍රදේශ වරින් වර එක්සත් කිරීම
- සැලිස්බරි ගිවිසුම මඟින් වැඩවසම් ප්‍රධානය රජුට පක්ෂපාත ව හා යටත් ව තබා ගැනීම
- 1154 දී රජ බවට පත්වූ දෙවෙනි හෙන්රි පොදු නීති පද්ධතියක් ආරම්භ කිරීම, රට පුරා ක්‍රියාත්මක සංචාරක විනිශ්චය කරුවන් සහ ජූරි ක්‍රමය හඳුන්වා දීම
- 1485 බලයට පත්වූ හත්වෙනි හෙන්රි රජු ටියුඩර් නමින් නව රාජවංශයක් ආරම්භ කොට ප්‍රබල රාජාණ්ඩුවක් බිහි කිරීමට පියවර ගැනීම

- රදල බලය මෙල්ල කොට මධ්‍යම පාංතිකයන්ගේ සහායත්වය ලබා ගැනීම
- කැරලිකාර ප්‍රභූවරුන්ට විරුද්ධ ක්‍රියාකිරීම සඳහා 'ස්ටාර් චේම්බර්' නමැති විශේෂ උසාවියක් පිහිටුවීම
- ක්‍රිස්තු සභාවේ බලය දුර්වල කිරීමට පියවර ගැනීම
- ශක්තිමත් නාවික හමුදාවක් ගොඩනැඟීම
- 8 වෙනි හෙන්රි රජුගේ පාලන සමයේ පාර්ලිමේන්තුව ද සම්බන්ධ කරගෙන රෙපරමාදු ව්‍යාපාරය මෙහෙයවමින් එංගලන්තයේ සහ රෝමයේ ක්‍රිස්තු සභාව අතර තිබූ සබඳතා අවසන් කොට ඇංග්ලිකානු සභා සංවිධානය ආරම්භ කර රජු එංගලන්ත පල්ලි සංවිධානයේ නායකයා බවට පත් කිරීම
- ස්ටුවර්ට් වංශය රජවීමත් සමග රජු සහ පාර්ලිමේන්තුව අතර ආගමික මතභේද හේතු කොටගෙන ගැටුම් ඇති වීම
- 1688 උත්කෘෂ්ට විප්ලවය - අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය
- අයිතිවාසිකම් ප්‍රකාශය මඟින් රජු / රැජිනිගේ බලය පාර්ලිමේන්තුවේ බලයට යටත් කොට, පාර්ලිමේන්තුවේ ආධිපත්‍යය යටතේ ප්‍රොතෙස්තානු රාජ්‍යයක් පිහිටුවීමත් සමඟ එංගලන්තයේ ජාතික රාජ්‍යය ගොඩනැඟීම සම්පූර්ණත්වයට පත් විය.

**ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් ලෙස ගොඩනැඟීම**

- 1469 දී ඇරගන්හි ෆර්ඩිනන්ඩ් කුමාරයා සහ කැස්ටිල්හි ඉසබෙලා කුමරිය අතර ඇති වූ විවාහය.
- 1492 ග්‍රැනඩාවත් 1512 නවාරේ රාජ්‍යයත් ඈඳ ගැනීම
- දේශ ගවේෂණ මඟින් බාහිර ප්‍රදේශ ස්පාඤ්ඤයට ඈඳගෙන එහි ශක්තිය හා ශ්‍රේෂ්ඨත්වය වැඩි කිරීම.
- නේපල්ස්, සිසිලි, සාර්ඩිනියා ප්‍රදේශවල ස්පාඤ්ඤයේ ආධිපත්‍යය පිහිටුවීම
- ශුද්ධ රෝම අධිරාජයා සමඟ ඥාති සබඳතා ඇති කර ගැනීම
- ස්පාඤ්ඤය තුළ ප්‍රතිසංස්කරණ රාශියක් ඇති කිරීම. වංශාධිපති බලය දුර්වල කිරීම හා මධ්‍යම පංතියේ සහායත්වය ලබා ගැනීම
- පොදු නීති පද්ධතියක් රට තුළ ක්‍රියාත්මක කිරීම
- ආගමික ප්‍රතිසංස්කරණ මඟින් ජාතික හැඟීම ඇති කිරීම
- පළමුවන චාල්ස් රජුට ශුද්ධ රෝම අධිරාජ තනතුර ලැබීම
- ස්පාඤ්ඤය සතු යටත් විජිතවලින් යුක්ත අධිරාජ්‍යයක් ගොඩනැඟීම
- ස්පාඤ්ඤය යුරෝපයේ ධනවත් ම රට බවට පත් කිරීම හා අභ්‍යන්තර ප්‍රතිසංස්කරණ ඇති කිරීම.
- දෙවන පිලිප් රජු විවාහ සබඳතා ඇති කොට රාජත්වය ස්ථාවර කරගැනීම
- වැඩවසම් ප්‍රධානය දුර්වල කිරීමට උත්සාහ ගැනීම

**ප්‍රංශය**

- පිලිප් ඔගස්ටස්, නවවෙනි ලුවී, හතරවෙනි පිලිප් සහ 11 වෙනි ලුවී යන අනුප්‍රාප්තික රජවරු ප්‍රංශයේ ජාතික රාජ්‍ය ගොඩනැඟීමේ අඩිතාලම දැමීමට දායක වූහ.
- පිලිප් ඔගස්ටස් රජු ප්‍රංශය තුළ එංගලන්තයේ රජු සතු ව තිබූ බලය අවසන් කර ප්‍රංශය විදේශ ආධිපත්‍යයෙන් මුදවා ගැනීම
- නවවෙනි ලුවී රජු විවිධ ප්‍රතිපත්ති මඟින් රදල ප්‍රභූවරුන්ගේ බලතල මර්දනය කර එහි ආධිපත්‍යය පුළුල් කර ගත් අතර නීතිය සහ මුදල් අච්චු ගැසීම වැනි ක්ෂේත්‍රවල ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම
- පල්ලිය සතු දේපොලවලින් බදු අය කිරීම, නයිට්වරුන්ට අයිති ව තිබූ දේපොළ විශාල වශයෙන් රජු සතු කිරීම සහ රජුට අවනත ව ක්‍රියා කරන ලෙස ස්ටේට්ස් ජෙනරල් සභාවට බල කිරීම වැනි ක්‍රියාමාර්ග හතරවෙනි පිලිප් රජු ජාතික රාජ්‍යයක් ගොඩනැඟීමට දායක වූ ක්‍රියාමාර්ග විය.
- බ්‍රිටනි ප්‍රදේශය හැර සෙසු සමස්ත ප්‍රංශයේ ම විදේශීය හා දේශීය ප්‍රභූවරුන්ගේ බලතල පරාජය කොට රජුගේ පාලනය යටතට පත් කරගැනීම 11 වෙනි ලුවී රජු විසින් සිදු කරනු ලැබීම
- 16 වෙනි සියවසේ දී ප්‍රංශය තුළ කතෝලිකයන් හා හියුගනෝ නම් වූ ප්‍රංශ ප්‍රොතෙස්තන්තවරුන් අතර ඇති වූ ආගමික යුද්ධ නිසා අවුල් වූ ප්‍රංශයේ ප්‍රොතෙස්තන්තවාදී නවාරේ හෙන්රි කතෝලික ආගම වැලඳගෙන හතර වෙනි හෙන්රි ලෙස රජ වීම ප්‍රංශයේ ජාතික රාජ්‍යයක් ගොඩනැඟීමේ සන්ධිස්ථානයක් සලකුණු වීම

**හතරවෙනි හෙන්රි රජුගෙන් ඉටු වූ කාර්යභාරය**

- ආගම් ඉවසන සුලු පුද්ගලයකු වූ හතරවෙනි හෙන්රි නැන්ටීස් ආඥාව මඟින් හියුගනෝවරුන්ට ආගමික නිදහස ලබාදී ආගමික සමථයක් ඇති කිරීම
- මුදල් ඇමති සලීහි ආදිපාදවරයාගේ උපදෙස් පරිදි බදු ප්‍රතිසංස්කරණයක් හඳුන්වා දීම
- කෘෂිකර්මය හා පේෂ කර්මය දියුණු කොට රටේ ආර්ථික සමෘද්ධියක් ඇති කිරීම
- ප්‍රංශය සතු විදේශ අධිරාජ්‍යය ගොඩනැගීමේ අඩිතාලම දමමින් ප්‍රංශ ජාතික දේශ ගවේෂකයින්ට අනුග්‍රහ දක්වා නෝවාස්කෝෂියාවේ ප්‍රංශ ජනපද පිහිටු වීම
- හතර වෙනි හෙන්රි රජුගෙන් පසු ව රජු බවට පත්වූ 13 වෙනි ලුවී ලාබාල වයසේ පසු වූ බැවින් ඔහුගේ ප්‍රධාන ඇමති වරයා වූ රිචලියු ද ප්‍රංශය ජාතික රාජ්‍යයක් ලෙස නංවාලීමට විශාල කාර්යභාරයක් ඉටු කිරීම
- ප්‍රංශ සභ්‍යත්වය වැඩි දියුණු කිරීම
- තිස් අවුරුදු යුද්ධයේ දී ඔස්ට්‍රියාවේ පාලකයන් වූ හැබ්ස්බර්ග් වංශය පරාජය කොට ප්‍රංශ රාජ්‍යය යුරෝපයේ අද්විතීය තත්ත්වයට පත් කිරීම. ප්‍රංශයේ අභ්‍යන්තර වශයෙන් පැවති රදල ප්‍රභුවරුන්ගේ සහ හියගනෝ වරුන්ගේ බලය මෙල්ල කිරීම
- ප්‍රදේශීය පාලනය සඳහා රජු විසින් 'ඉන්ටෙන්ඩාන්ට' නම් වූ නිලධාරීන් පත් කිරීම

13 වෙනි ලුවී රජුගෙන් පසුව රජ බවට පත් වූ 14 වෙනි ලුවී රජුගේ කාර්යභාරය

- තම පාලනය සඳහා දේවවරම් වාදය උපයෝගී කර ගැනීම
- රජුගේ අභිමතය පරිදි නිලධාරීන් පත් කිරීම හා අස් කිරීම
- වාණිජවාදී ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම (වෙළෙඳ සමාගම් පිහිටුවීමට අනුග්‍රහය ලබා දීම)
- නැන්ටීස් ආඥාව අවලංගු කර හියුගනෝවරුන් භුක්ති විඳි බලතල සහ වරප්‍රසාද අහෝසි කිරීම
- ආගමික කටයුතු ස්වකීය පාලනය යටතට ගැනීම
- ප්‍රංශ බලය වර්ධනය කිරීමේ අරමුණින් විදේශීය යුද්ධවලට සම්බන්ධ වීම

පැරිස් නගරය ප්‍රංශ සභ්‍යත්වයේ අලංකාර මධ්‍යස්ථානය බවට පත් කිරීම

මෙසේ යුරෝපයේ ජාතික රාජ්‍යයන් බිහිවීම යුරෝපයේ නූතන යුගයක් උදාවීමට රුකුලක් වීම

ඇගයීම් - 01

* **අංක 01 සිට 05 තෙක් වූ ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් 5 බැගින් දක්වා ඇත. ඒවා අතුරින් එකක් පමණක් කවර හේතුවක් නිසා හෝ අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක් දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න.**

(1) (1) වාණිජවාදය
(2) රදල බලය දුර්වල කිරීම
(3) ඒකීය නීති පද්ධතිය
(4) පාප් වහන්සේගේ සහය ලබා ගැනීම
(5) නිශ්චිත භූගෝලීය දේශ සීමා තිබීම (..................)

(2) (1) කැස්ටීලය
(2) ඇරගනය
(3) නේපල්ස්
(4) නවාරේ
(5) ග්‍රැනඩාව (..................)

(3) (1) හතරවන හෙන්රි
(2) දෙවන පිලිප්
(3) රිචලියු
(4) මැසරින්
(5) දාහතර වන ලුවී (..................)

(4) (1) ග්‍රීක භාෂාව
(2) රෝම සම්ප්‍රදාය
(3) ලෞකිකත්වය
(4) ගොතික් කලාව
(5) මානව වාදය (..................)

(5) (1) බලය මධ්‍යගතවීම
(2) රජුගේ ස්ථාවර යුධ හමුදාව
(3) රදල බලය වැඩිවීම
(4) ජාතික රාජ්‍යය
(5) මුදල් භාවිතය (..................)

* **අංක 06 ප්‍රශ්නය සඳහා යුගල පහක් බැගින් දී ඇත. ඒවා අතරින් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක් දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

(6) (1) හතරවන හෙන්රි - නැන්ටීස් ආඥාව පැනවීම
(2) රිචලියු - හියුගනෝවරුන්ගේ දේශපාලන බලය අහෝසි කිරීම
(3) මැසරින් - තිස් අවුරුදු යුද්ධය ජය ගැනීම
(4) 13 වන ලුවී - හත් අවුරුදු යුද්ධය ජය ගැනීම
(5) දාහතර වන ලුවී - බිසෝවරුන්ගේ යුද්ධයට සම්බන්ධ වීම

(..................)

* **අංක 07 ප්‍රශ්නය සඳහා මාතෘකාවක් යටතේ කරුණු 05 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එසේ නොගැළපෙන කරුණ තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

07. ජාතික රාජ්‍ය ගොඩනැගීම සහ සම්බන්ධ රජවරු
- පර්ඩිනැන්ඩ් සහ ඉසබෙලා යුවළ
- 16 වෙනි ලුවී රජු
- පළමුවෙනි චාල්ස් රජු
- 7 වෙනි හෙන්රි රජු
- හතරවෙනි හෙන්රි රජු

**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

01. ඉතාලිය මුල්කරගෙන පුනරුදය ඇතිවීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 14)

02. පුනරුදයේ බලපෑම මත ප්‍රබෝධයට පත් ක්ෂේත්‍ර විග්‍රහ කරන්න. (ලකුණු 14)

03. පුනරුදය නූතන යුරෝපයේ උදාවට දායක වූ ආකාරය පහදන්න. (ලකුණු 14)

04.
(1) නව රාජාණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ මොනවා ද? (ලකුණු 06)
(2) පහත සඳහන් පුද්ගලයින් අතුරෙන් එක් අයෙකු තෝරාගෙන නව රාජාණ්ඩුවක් ගොඩනැගීමේ දී ඔහුගෙන් ඉටු වූ සේවය පරීක්ෂා කරන්න.
අ) ස්පාඤ්ඤයේ පර්ඩිනන්ඩ් ඉසබෙලා යුවළ
ආ) ප්‍රංශයේ කාඩිනල් රිචලියු
ඇ) එංගලන්තයේ හත්වෙනි හෙන්රි (ලකුණු 08)

05. '' නූතන යුරෝපා ඉතිහාසයේ මුල් අවධියේ මතු වූ සුවිශේෂී දේශපාලන සංවිධානය වූයේ ජාතික රාජ්‍ය යි'' පහත සඳහන් අංශ විග්‍රහ කරමින් ජාතික රාජ්‍යවල ප්‍රධාන අංග ලක්ෂණ පැහැදිලි කරන්න.
(1) නව රාජාණ්ඩු ක්‍රමය
(2) වාණිජවාදය
(3) ශක්තිමත් ස්ථාවර හමුදාව (ලකුණු 14)

**නිපුණතා මට්ටම** : 2.2. යුරෝපා රටවල් වෙනත් මහා ද්වීපවල අධිරාජ්‍ය ගොඩනැගූ ආකාරය පරීක්ෂා කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- දේශ ගවේෂණ විස්තර කරයි.
- යුරෝපයේ ව්‍යාප්තිය සෙසු රටවලට බලපෑ අයුරු විග්‍රහ කරයි.
- දේශ ගවේෂණ හා යුරෝපා ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න**

**දේශ ගවේෂණ හා යුරෝපා බල ව්‍යාප්තිය**
දේශ ගවේෂණ ඇතිවීමට බලපෑ හේතු උපකාරී වූ සාධක

- ආසන්න ම හේතුව 1453 ඔටෝමන් තුර්කිවරුන් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම
  - * එමගින් ආර්ථික ගැටලු මතුවීම
  - * අත්‍යවශ්‍ය භාණ්ඩ කලට වේලාවට ලබා නොදීම
  - * භාණ්ඩ මිල ඉහළ යාම
- තම ප්‍රධාන මධ්‍යස්ථානය වූ කොන්ස්තන්තිනෝපලය මුස්ලිම්වරුන් විසින් අත්පත්කර ගැනීම ක්‍රිස්තු භක්තිකයන්ට දැඩි අපකීර්තියක් වීම
- විද්‍යාවේ ප්‍රබෝධය මත නව උපකරණ රාශියක් නිපදවීම හා මතවාදයන් ඇති වීම උතුරු කුරු මාපකය, මාලිමා යන්ත්‍රය - ලෝකය ගෝලාකාර බවට පළ වූ මතවාදය
- ගවේෂණ කටයුතු සඳහා ජාතික රාජ්‍යයන්ගේ අනුග්‍රහය හා මධ්‍යම පාන්තිකයන්ගේ සහාය ලැබීම
- දුර ගමන් සඳහා භාවිත කළ හැකි ආරක්ෂා සහිත නැව් ඉදි කිරීම යුරෝපා ජාතීන් විසින් ආරම්භ කරනු ලැබීම
- සත්‍ය දැනගැනීමේ කුතුහලය, කතෝලික ආගම ප්‍රචාරය කිරීමේ හා ඉස්ලාම් ධර්මය විනාශ කිරීමේ අරමුණ, කීර්තිය ලබා ගැනීමේ අවශ්‍යතාව
- මුස්ලිම්වරුන් සතු තිබූ ඉන්දියානු සාගරයේ වෙළෙඳ අධිරාජ්‍යය අත්පත් කර ගැනීම
- පෘතුගාලයේ නාවික හෙන්රි (ක්‍රි.ව. 1394-1460) විසින් ආරම්භ කොට පවත්වා ගෙන යන ලද නාවික කටයුතු පිළිබඳ පර්යේෂණ ආයතනය ආරක්ෂා සහිත ව මුහුදු ගමන්වල යෙදීමට උපකාර වීම

**දේශ ගවේෂණ, මුල් වූ රටවල්, දේශ ගවේෂකයන් හා සොයා ගත් ප්‍රදේශ**

| | | |
|---|---|---|
| පෘතුගාලය | • බර්තලමියු දියෙස්<br>• වස්කෝද ගාමා | - 1488 අප්‍රිකාවේ දකුණු කෙළවරට ළඟාවීම (කුණාටු තුඩුව)<br>- 1498 ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණීම |
| ස්පාඤ්ඤය | • ක්‍රිස්ටෝපර් කොලොම්බස්<br>• අමෙරිගෝ වෙස්පුෂි<br>• වස්කෝ නියුනෙස් ද බැල්බෝවා<br>• පර්ඩිනන්ඩ් මැගලන්<br>• පර්නැන්ඩෝ කෝටෙස්<br>• ෆ්‍රැන්සිස්කෝ පිසරෝ | - 1492 කැරිබියන් (බටහිර ඉන්දියානු) දූපත් සමූහයේ හිස්පැනියෝලා දූපතට පැමිණීම<br>- අමෙරිකා මහද්වීපය සොයා ගැනීම<br>- 1513 පැනමා දේශ සන්ධියට පැමිණීම<br>- 1519-1522 ලෝකය වටා යාත්‍රා කිරීම<br>- 1519 මෙක්සිකෝව ගවේෂණය කිරීම<br>- 1553 පීරු දේශය |
| එංගලන්තය | • ජෝන් කැබෝ, සෙබස්තියන් කැබෝ<br>• ෆ්‍රැන්සිස් ඩ්‍රේක්<br>• ගිල්බර්ට්, වෝල්ටර්, රැලේ | - කේප් බ්‍රිටන් දිවයින<br>- ශාන්ත ලෝරන්ස් සිට ප්ලොරිඩා තෙක් ප්‍රදේශ |
| ප්‍රංශය | • ජැක්විස් කාටියර්<br>• ජොයිලට්<br>• ලා සලේ<br>• චෙම්ප්ලේන් මාක්විටේ | - 1535 උතුරු ඇමෙරිකාවේ ශාන්ත ලෝරන්ස් ගඟ ප්‍රදේශ<br>- 1573 මිසිසිපි ගංගා මිටියාවත<br>- මිසිසිපි ගංගා මුවදොර<br>- 1608 ක්විබෙක් ප්‍රදේශය |
| ඕලන්දය | • හෙන්රි හඩ්සන් | - හඩ්සන් ගංගාව හා හඩ්සන් බොක්ක |

- **දේශ ගවේෂණවල ප්‍රතිඵල**

- ආසියා, අප්‍රිකා, ලතින් අමෙරිකා යන මහාද්වීපවල යුරෝපා බලය ව්‍යාප්ත වීම
- ක්‍රිස්තු ධර්මය ආසියා, අප්‍රිකා, අමෙරිකා මහාද්වීපවල පැතිරීම
- කාර්මික විප්ලවයට මඟ පෑදීම
- යුරෝපානු සංස්කෘතිය හා තාක්ෂණය ලොව පුරා ව්‍යාප්ත වීම
- යුරෝපීය අධිරාජ්‍යය ගොඩනැඟීම
- නව වෙළෙඳ සම්බන්ධතා ඇති වීම

ඉහත සඳහන් දේශ ගවේෂණ ව්‍යාපාරය හා බලව්‍යාප්තිය යුරෝපයේ නව යුගයක් උදා වීමට බලපෑම

ඇගයීම් - 01

* **අංක 01 සහ 02 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X සහ Y තීරු වල දී ඇත. X තීරුවේ දක්වා ඇති නාම/ප්‍රකාශන/දින වකවානු Y තීරුවේ ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් මෙහි දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. X තීරුව Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගය අයත් අංකය තෝරා තිත් ඉර මත ලියන්න.**

| | X | Y |
|---|---|---|
| 1. | (i) පෘතුගාලය | A. ජැක්විස් කාටියර් |
| | (ii) ස්පාඤ්ඤය | B. හෙන්රි හඩ්සන් |
| | (iii) එංගලන්තය | C. වස්කෝද ගාමා |
| | (iv) ප්‍රංශය | D. පර්ඩිනන්ඩ් මැගලන් (මැගලන්) |
| | (v) ඕලන්දය | E. වෝල්ටර් රැලේ |

(1) ACBED (2) CABED (3) DECAB (4) CAEBD (5) CDEAB (..........)

| | X | Y |
|---|---|---|
| 2. | (i) ප්‍රැන්සිස්කෝ පිසරෝ | A. ඇමරිකා මහාද්වීපය |
| | (ii) ෆර්නැන්ඩෝ කෝටෙස් | B. ක්විබෙක් |
| | (iii) චැම්ප්ලේන් මාක්විටේ | C. මෙක්සිකෝව |
| | (iv) අමෙරිගෝ වෙස්පුචි | D. අප්‍රිකාවේ දකුණු කෙළවර |
| | (v) බර්තලමියු ඩයස් | E. පීරු දේශය |

(1) ACDEA (2) BADEC (3) ECBAD (4) EBCAD (5) BDACE (..........)

* **අංක 03 සිට 04 තෙක් සැම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු 05 බැගින් සපයා ඇත. එම කරුණු අතුරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. නොගැළපෙන කරුණු තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

3. දේශ ගවේෂණවලට උපකාරී වූ හේතු
   (1) ආසියානු භාණ්ඩ යුරෝපයට ලබාගැනීමේ දුෂ්කරතා මතු වීම නිසා ඇති වූ ගැටලු
   (2) විද්‍යාවේ ප්‍රබෝධය නිසා උපකරණ නිපදවීම
   (3) ජාතික රාජ්‍යවල පාලකයන්ගේ අනුග්‍රහය
   (4) 1453 දී මුස්ලිම්වරුන්ට පරාජය වීමෙන් යුරෝපයේ ක්‍රිස්තු භක්තිකයන්ට ඇති වූ අවමානය මකාගැනීමේ අධිෂ්ඨානය
   (5) ඉතාලිය හා ජර්මනිය එක්සේසත් කිරීම නිසා ඇතිවූ දේශපාලන ස්ථාවර භාවය

(..............)

4. දේශ ගවේශණවල ප්‍රතිඵල
   (1) ආසියා, අප්‍රිකා, ලතින් අමෙරිකා මහාද්වීප යුරෝපා රටවලට යටත් වීම
   (2) ක්‍රිස්තු ධර්මය ලෝකය පුරා ව්‍යාප්ත වීම
   (3) යුරෝපා සංස්කෘතිය හා තාක්ෂණය ලොව පුරා ව්‍යාප්ත වීම
   (4) ජාතික රාජ්‍ය බිහි වීම
   (5) කාර්මික විප්ලවයේ ව්‍යාප්තියට උපකාරී වීම

(.............)

**ඇගයීම - 02**

**පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1. පහළොස් වන හා දහසය වන සියවස්වල දී යුරෝපා ජාතීන් දේශ ගවේෂණවල නිරත වීම කෙරෙහි යොමු කළ ප්‍රධාන සාධක කවරේ ද?
(ලකුණු 07)

2. දේශ ගවේෂණවලින් උද්ගත වූ ප්‍රතිඵල විස්තර කරන්න.
(ලකුණු 07)

3. ''දේශ ගවේෂණ යුරෝපා රටවල් අතර බල තරගයක් ඇති කිරීමට හේතු විය''

   i. දේශ ගවේෂණය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 01)

   ii. දේශ ගවේෂණවලට සම්බන්ධ වූ යුරෝපා රටවල් දෙකක් නම් කරන්න (ලකුණු 02)

   iii. දේශ ගවේෂණවලට උපකාර වූ සාධක කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 04)

   iv. දේශ ගවේෂණවල ප්‍රතිඵල ඇසුරින් ඉහත සඳහන් ප්‍රකාශය විමසන්න (ලකුණු 07)

4. යුරෝපයේ නව යුගයක් ආරම්භ වීමට දේශ ගවේෂණ ව්‍යාපාරය හා යුරෝපා බල ව්‍යාප්තිය දායක වූ ආකාරය පරීක්ෂා කරන්න
(ලකුණු 14)

**ඇගයීම - 03**

ආදර්ශ ලෝක සිතියමේ පහත සඳහන් රටවල් නම් කොට ඒවායින් කවර හෝ දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

i. මෙක්සිකෝව
ii. පීරු දේශය
iii. කැනඩාව
iv. දකුණු අප්‍රිකාව
v. ඉන්දියාව
vi. ප්‍රංශය
vii. ස්පාඤ්ඤය
viii. එංගලන්තය

(ලකුණු 18)

## 3. ආගමික ප්‍රතිසංස්කරණ හා ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය

බටහිර යුරෝපයේ ඉතිහාසය මධ්‍යතන යුගයේ සිට නූතන යුගය තෙක් පරිවර්තනය වීමේ දී ඇති වූ වැදගත් විපරිණාමයක් වූයේ, ආගමික ප්‍රතිසංස්කරණ යි. 16 වන සියවසේ දී යුරෝපයේ ඇති වූ මෙම ආගමික ප්‍රතිසංස්කරණ මඟින් ක්‍රිස්තු සභාව බෙදී යාමක් සිදු විය. මෙම ව්‍යාපාරයේ මූලික අරමුණ වූයේ, රෝමානු කතෝලික සභාවේ සංශෝධනයක් ඇති කිරීම යි. මෙලෙස 1516 දී කතෝලික සභාවට එරෙහි ව ආරම්භ වූ විරෝධතා ව්‍යාපාරය රෙපරමාදු ව්‍යාපාරය හෙවත් ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරය නම් වේ.

මධ්‍යතන යුගයේ අවසාන භාගයේ සිට පාප් තුමා ප්‍රමුඛ පූජක සංස්ථාව දූෂණවලට ගොදුරු වීමත් සමඟ වැඩවසම් යුගයේ පැවති එක්සත් ක්‍රිස්තු සභාව නූතන යුගයේ උදාවත් සමඟ දෙදරා යාම සිදු විය. මෙලෙස රෙපරමාදු ව්‍යාපාරයෙන් රෝමානු කතෝලික ආගමට එරෙහි ව එල්ල වූ අභියෝග හමුවේ ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය ද බිහි විය. අවසානයේ දී මෙම ආගමික සංකල්ප මුල් කර ගනිමින් තිස් අවුරුදු යුද්ධය වැනි ආගමික යුද්ධ නිර්මාණය විය. මෙලෙස එක් සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස තවත් සිද්ධියක් නිර්මාණය වීම ඉතිහාසය දෙස හැරී බැලීමේ දී අවබෝධ කර ගත හැකි ය. මේ සියලු සිදුවීම්වලට අවධානය යොමු කරමින් ආගමික ක්ෂේත්‍රයේ සිදු වන වෙනස් වීම සමාජයේ සෙසු ක්ෂේත්‍ර කෙරෙහි අඩු වැඩි වශයෙන් බලපාන ආකාරය හඳුනාගෙන ඊට සුදුසු පරිදි වෙනස් වීම්වලට මුහුණ දීමට අවශ්‍ය ආකල්ප වර්ධනය කරවීම මෙම ඒකකය අධ්‍යයනය කිරීම මඟින් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : • ආගමික ක්ෂේත්‍රයේ සිදු වන වෙනස් වීම් සමාජයේ සෙසු ක්ෂේත්‍ර කෙරෙහි බලපාන ආකාරය හඳුනාගෙන වෙනස් වීම්වලට මුහුණ දීමේ ආකල්ප වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම** : 3.1. යුරෝපයේ ආගමික ප්‍රතිසංස්කරණ ඇති වීමට තුඩුදුන් හේතු විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල** :
- ආගමික ප්‍රතිසංස්කරණවල පසුබිම විස්තර කරයි
- ආගමික ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල පෙන්වා දෙයි.
- ආගමික ප්‍රතිසංස්කරණවලට සම්බන්ධ රටවල් සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න**

**3. ආගමික ප්‍රතිසංස්කරණ**

- පාප්තුමාගේ සහ ක්‍රිස්තු සභාවේ පැවති දූෂිත ක්‍රියාකලාපයට එරෙහි ව පැන නැගුණු මතවාද හා ක්‍රියාමාර්ග ආගමික ප්‍රතිසංස්කරණ ලෙස හැඳින්වේ.

**ආගමික ප්‍රතිසංස්කරණවල පසුබිම**
ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාප්තියට විවිධ හේතු රැසක් බලපා ඇත

- **ආගමික හේතු**
  - ක්‍රිස්තු සභාව දූෂිත මෙන් ම ධනවත් ආයතනයක් වීම
  - මධ්‍යකාලීන අවධිය වන විට කතෝලික සභාව විශාල ඉඩම් හා දේපළ සම්භාරයක් අයිති කරගෙන සිටීම, සැම ක්‍රිස්තු භක්තික පවුලකින් ම පීටර්ස් පෙන්ස් නම් බද්දක් මෙන් ම පවුලේ ආදායමින් 1/10ක ටයිත් නම් බද්දක් අය කිරීම
  - කතෝලික පූජකවරුන් සුඛෝපභෝගී ජීවිත ගත කරමින් ලෞකිකත්වයට නැඹුරු වීම
  - බල අධිකාරිය පවත්වා ගැනීම සඳහා ක්‍රිස්තු සභාව විවිධ ක්‍රියාමාර්ග ගැනීම

- ක්‍රිස්තු ලෝකයේ යහපත් පැවැත්මට බාධාකාරී වේ නම්, ලෞකික පාලකයන්ගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වීමේ අධිකාරිය පාප්තුමාට ඇති බවත් පාප් තුමා, දෙවියන්ට වඩා පහළ නමුත් මනුෂ්‍යයාට වඩා ඉහළ බවත් සියලු දෙනාම විනිශ්චය කරන එතුමා විනිශ්චයට කිසිවකු නොමැති බවත් ප්‍රකාශ කිරීම

    * තුන් වන ඉනසන්ට් පාප් තුමා කතෝලික සභාවේ දූෂණ කටයුතුවලට පහර ගැසූ අය මරා දැමීම
    උදාහරණ:- බොහිමියානු ජාතික ජෝන් හස් (ක්‍රි.ව. 1369 - 1415)
    සවන රෝලා (ක්‍රි.ව. 1452 - 1498)

- පාප් ධූරය සඳහා තිබූ ගෞරවය පිරිහී යාම

    * පාප්තුමා යුරෝපයේ දේශපාලන කටයුතු සඳහා වැඩි වැඩියෙන් මැදිහත් වීම නිසා දෙවියන්ගේ නියෝජිතයකුට වඩා ලෞකික පාලකයකු ලෙස කටයුතු කරන බව ක්‍රිස්තු භක්තිකයන්ට පෙනීගිය අතර එහි දී පාප් තනතුරට හිමි වී තිබූ කීර්තිය හා ගෞරවය පිරිහීම පටන් ගැනීම

- පාප්වරුන් කිහිප දෙනෙකු එක වර පත් වීම

    * අටවෙනි බොනිපස් පාප්තුමාගේ මරණයත් සමඟ 1305 දී ප්‍රංශ ජාතික බිෂොප්වරයකු හය වෙනි ක්ලෙමන්ට් නමින් පාප් ධූරයට පත් වූහ. එතුමා පාප්වරුන්ගේ පාරම්පරික මධ්‍යස්ථානය වූ රෝමයට නොගොස් රෝන් නදිය අසබඩ ඇවිනොන් නගරයේ පදිංචි වීම
    * එතැන් සිට පාප් තනතුරට පත් වු බොහෝ දෙනා ප්‍රංශ ජාතිකයන් වීම
    * එම පාප්වරුන් රෝමයේ නොව ප්‍රංශයේ වාසය කළ අතර 1309 - 1377 තෙක් වූ එම කාලය 'බැබිලෝනියානු අත්අඩංගුව' නමින් හැඳින්වේ.
    * 1377 න් පසු පාප් තනතුරට පත් වූ එකොළොස්වෙනි ග්‍රැගරි පාප්වහන්සේ රෝම වැසියන්ගේ ඉල්ලීම පරිදි රෝමයේ වාසයට යාම
    * එකොළොස් වෙනි ග්‍රැගරි පාප්තුමාගේන් පසු ව සවන අර්බන් බිෂොප්වරයා එම තනතුරට පත් වීම ප්‍රංශයේ කාදිනල්වරුන් එතුමාගේ පත්වීම නොපිළිගෙන දහතුන්වෙනි ක්ලෙමන්ට් පාපතුමා පත් කිරීම
    * ක්‍රිස්තු සභාව බේරාගැනීමේ අරමුණින් උගත් බුද්ධිමතුන්ගෙන් සමන්විත ව පිහිටුවා ගත් සංහිඳියා ව්‍යාපාරය මගින් සවන අර්බන් සහ දහතුන්වෙනි ක්ලෙමන්ට් යන පාප්වරුන් වෙනුවට පස්වෙනි ඇලෙක්සැන්ඩර් නමින් තවත් පාප්වවරයකු පත් කිරීම.
    * එපරිද්දෙන් පාප් ධූරය සඳහා තිබූ ගැටුම අවසන් නොවීම නිසා ශුද්ධ රෝම අධිරාජයාගේ මැදිහත් වීමෙන් මෙම මහා භේදය අවසන් කර ඉහත කී පාප්වරුන් තිදෙනාම වෙනුවට නව පාප්වරයකු පත් කිරීම
    * මෙම ගැටුම හේතු කොට පාප් තනතුරට හිමි වී තිබූ ගෞරවය පිරිහී යාම
    * මීට අමතර ව පාප්වරුන් මෙන් ම සෙසු බිෂොප්වරුන් ප්‍රධාන කොටගත් පූජකවරුන් ලෞකික සැප සම්පත්වල ගැලී කතෝලික සභාවේ ඉගැන්වෙන ආධ්‍යාත්මික සහ සදාචාරාත්මක වගකීම පැහැර හැරීම

- **ආර්ථික හේතු**

    - පල්ලියට ගෙවීමට නියමිත බදු පිළිබඳ ව ජනතාවගේ අප්‍රසාදය
    - විවිධ රටවලින් පල්ලිය අය කළ බදු රෝමයට යැවිය යුතු වීම. එපරිද්දෙන් තම රටවලින් වාර්ෂික ව විශාල ධනයක් රෝමයට ඇදී යාම ගැන නැගී එමින් සිටි නව රාජාණ්ඩුවල රජවරුන් සහ මධ්‍යම පන්තික ජනතාව විරුද්ධ වීම
    - ක්‍රිස්තු සභාව සතු ධන සම්භාරය තමන් සතු කර ගැනීම සඳහා රාජාණ්ඩු පාලකයන් හා වෙළෙඳ පන්ති උත්සාහ ගැනීම

- ධනය උපයා ගැනීම සඳහා ක්‍රිස්තු සභාව විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම
- නව බදු පැනවීම, පැරණි බදු වඩාත් කාර්යක්ෂම ලෙස එකතු කිරීම හා මූල්‍ය කටයුතු සංකේන්ද්‍රගත කිරීම
- කතෝලික සභාවේ උසස් තනතුරු මුදලට අලෙවි කිරීම
- පුණ්‍ය එල පත්‍රිකා විකිණීම දූෂිත තත්ත්වයකට පත් වී තිබීම

- **දේශපාලන හේතු**

- ජාතික රාජ්‍ය සංකල්පය මඟින් රජු හා පාප්තුමා අතර බලයේ ආධිපත්‍ය සඳහා ගැටුම් ඇති වීම.

  උදාහරණ: ප්‍රංශයේ සවුවන පිලිප් රජු හා එංගලන්තයේ පළමු වන එඩ්වඩ් යන රජවරුන් කතෝලික සභාවේ ඉඩම්වලින් බදු අය කිරීම

  පාප්තුමාගේ විරෝධය නොතකා බිෂොප්වරුන් අත්අඩංගුවට ගැනීම, ඇතැම් අවස්ථාවල පාප් ධුරය ඇතුළු පූජක තනතුරුවලට පත් කිරීම, රජවරුන් විසින් සිදු කරනු ලැබීම

- ශුද්ධ රෝම අධිරාජයා හා ජර්මන් ප්‍රදේශීය කුමාරවරුන් අතර ගැටුම් ඇති වීම

- **බුද්ධිමය හේතු**

- ලතින් භාෂාවෙන් ලියවුණු බයිබලය ජර්මන් හා ඉංග්‍රීසි භාෂාවලට පරිවර්තනය කිරීම
  - * ජෝන් වයික්ලිෆ් - ඉංග්‍රීසි බසට
  - * මාර්ටින් ලූතර් - ජර්මන් බසට

- පුනරුදයේ ආභාසය මඟින් ඇති වූ විද්‍යාත්මක ප්‍රබෝධයත් සමග මුද්‍රණ යන්ත්‍රය බිහි වීමෙන් බයිබලයේ පිටපත් වැඩි සංඛ්‍යාවක් ජනතාව අතට පත් වීම

- අධ්‍යාපන ප්‍රබෝධයත් සමග ගොඩනැගුණු නිදහස් චින්තනය නිසා ක්‍රිස්තු සභාවේ මතවාද බිඳවැටීම

- ඉතා දිගු කාලයක් යුරෝපයේ පැවති කතෝල්ක ආගම බිඳීයාමට ඉහත කී හේතු පසුබිම් වී ඇත.

ඇගයීම - 01

**පහත සඳහන් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තෝරා එහි අංකය තිත් ඉරමත ලියන්න.**

1. ආගමික ප්‍රතිසංස්කරණ ඇතිවීමට තුඩු දුන් හේතුවක් නොවන්නේ මින් කුමක් ද?
   1. කතෝලික පල්ලියේ දූෂණ
   2. මාර්ටින් ලූතර්ගේ නායකත්වය
   3. පුන්‍යපල පත්‍රිකා විකිනීම
   4. කැල්වින් හා පාප්තුමා අතර තිබූ සමීප සම්බන්ධතා
   5. කතෝලික පල්ලිය සතු ව තිබූ ධනය රාජ සන්තක කිරීමට පාලකයින් තුළ තිබූ අභිලාසය

(.............)

2. පාප්වරුන්ගේ පාරම්පරික මධ්‍යස්ථානය පිහිටියේ කොහේ ද?
   1. අවිනොන් 2. ලන්ඩන් 3. මාසෙල්ස් 4. ජිනෝවා 5. රෝමය

(.............)

3. 'බැබිලෝනියානු අත්අඩංගුව' නමින් හඳුන්වන්නේ කුමක් ද?
   1. බැබිලෝනියාව රෝමයට අයත් වීම
   2. පාප්වරුන් ප්‍රංශයේ වාසය කල කාලය
   3. තුර්කිවරුන් යුරෝපයේ ආධිපත්‍ය පැතිරවීම
   4. කතෝලික සභාවේ බලය ව්‍යාප්තවීම
   5. රජවරුන් පාප් රාජ්‍ය අත්පත් කරගැනීම (.............)

ඇගයීම - 02

1. ආගමික ප්‍රතිසංස්කරණ සඳහා බලපෑ හේතු පහදන්න. (ලකුණු 14)

2. පාප්වරුන්ගේ ක්‍රියාකලාපය ආගමික ප්‍රතිසංස්කරණ සඳහා බලපෑ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 14)

**නිපුණතා මට්ටම** : 3.2. රෙපරමාදු හා ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරවල ප්‍රතිඵල පිරික්සයි.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල** :
- රෙපරමාදු හා ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය පැහැදිලි කරයි.
- ප්‍රතිරෙපරමාදු ව්‍යාප්තියේ ප්‍රතිඵල විග්‍රහ කරයි.
- රෝමානු කතෝලික හා රෙපරමාදු ආගම්වල ව්‍යාප්තිය යුරෝපයේ සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න**

**3.2. රෙපරමාදු ව්‍යාපාරය සහ ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය**

- රෝමානු කතෝලික සභාවට එරෙහි ව ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ව්‍යාපාරය ආරම්භ වූයේ ජර්මනියෙනි. මෙලෙස ජර්මනියෙන් රෙපරමාදු ව්‍යාපාරය ආරම්භ වීමට තුඩු දුන් හේතු කිහිපයකි
  - යුරෝපයේ ජාතික රාජ්‍ය බිහි වූ නමුත් ජර්මන් ප්‍රදේශවල එවැනි වර්ධනයක් ඇති නොවීම
  - ජර්මන් ප්‍රදේශීය කුමාරවරුන් හා ශුද්ධ රෝම අධිරාජයා අතර ගැටුම් ඇති වීම
  - ශක්තිමත් සංකේන්ද්‍රගත පාලන රටාවක් ජර්මනිය තුළ නොවීම
  - යුරෝපයේ අනෙකුත් රටවලට වඩා ජර්මනියෙන් විශාල ධනයක් රෝමයට ඇදී යාම
  - ජර්මන් ප්‍රදේශවල ක්‍රිස්තු සභාව විශාල ලෙස දූෂණය වී තිබීම

- ජර්මනියෙන් ආරම්භ වූ රෙපරමාදු ව්‍යාපාරයේ මූලිකත්වය ගන්නේ ජර්මනියේ මාර්ටින් ලූතර් ය. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ දී ඔහුගේ කාර්ය භාරය පහත සඳහන් පරිදි සාරාංශ කළ හැකිය.
  - ජර්මනියේ එර්ෆට් විශ්වවිද්‍යාලයයෙන් නීතිය හදාරා පසුව දේව ධර්මය හා දර්ශනය අධ්‍යයනයට සිත යොමු කිරීම
  - විටෙන්බර්ග් විශ්වවිද්‍යාලයයේ කථිකාචාර්යවරයකු වූ ඔහු 1511 දී දේව ධර්මය පිළිබඳ ව මහාචාර්ය පදවිය ලැබී ය.
  - බයිබලය පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනය ලූතර් ගේ විෂය ක්ෂේත්‍රය වීම
  - ක්‍රිස්තු සභාවේ ඉගැන්වීම් පිළිබඳ ඔහු ප්‍රශ්න කිරීමට පෙළ ඹීම. ඔහු පල්ලියේ ඉගැන්වීම් පිළිබඳ ව මතු කළ ප්‍රශ්න දෙකකි.
    - * උපතින් ම පාපකාරී වූ මිනිසා ගැලවීම ලබන්නේ කෙසේ ද?
    - * මිනිසාට ගැලවීම ලබා ගත හැකි එක ම ආයතනය නම් පල්ලිය ද? යන්න එම ප්‍රශ්න දෙක යි.

  - 1517 ටෙට්සල් පුණ්‍යඵල විකිණීම පිළිබඳ දැඩි විවේචනයක් කළ ලූතර් ඊට එරෙහි ව 1517 ඔක්තෝබර් 31 වෙනි දින විටෙන්බර්ග් දේවස්ථානයේ වගන්ති 95කින් යුක්ත ලියවිල්ලක් දොරේ ඇලවී ය.
  - ලූතර්ගේ මූලිකම ඉගැන්වීම වූයේ සහජයෙන් ම පාපකාරී වූ මිනිසාට ගැලවීම ලබා ගත හැක්කේ දේව කරුණාව හා දෙවියන් කෙරෙහි ඇති කරගත් භක්තිය මගින් බව යි.
  - පුද්ගලයා හා දෙවියන් අතර අතරමැදි පූජකයන් අවශ්‍ය බව කියන කතෝලික සභාවේ ඉගැන්වීම් ලූතර් ප්‍රතික්ෂේප කරයි.
  - සාමාන්‍ය පූජකයන්ට මෙන්ම පාප්තුමාට ද වරදින්නට පුළුවන් බව ප්‍රකාශ කිරීම
  - පුද්ගලයකුට සිය ආත්ම විශ්වාස ගොඩනැගීමට ඇති එක ම අධිකාරිය බයිබලයේ සත්‍ය බව ප්‍රකාශ කිරීමයි.
  - ලූතර් බයිබලය ජර්මන් බසට පරිවර්තනය කිරීම

- ජර්මනිය කේන්ද්‍ර කර ගනිමින් ආරම්භ වූ රෙපරමාදු ව්‍යාපාරය පසු ව යුරෝපයේ සෙසු රටවලට ද ව්‍යාප්ත විය. එහි දී වැදගත් වූ පුද්ගලයන් කිහිප දෙනෙකි.

  * ස්විට්සර්ලන්තයේ - උල්රිච් ස්විංග්ලි
  * ප්‍රංශයේ - ජෝන් කැල්වින්
  * එංගලන්තයේ - ජෝන් වෙක්ලිප්, 8 වන හේරි

මෙම රටවල් හැරුණු කොට යුරෝපයේ සෙසු රටවල හා යුරෝපයෙන් බාහිර රටවලට ද රෙපරමාදු ව්‍යාපාරය ව්‍යාප්ත විය.

- **ආගමික ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල**

  - රෝමානු කතෝලික හා රෙපරමාදු ක්‍රිස්තියානි ලෙස එක්සත් ක්‍රිස්තු සභාව භේද වීම
  - යුරෝපය ආගමික වශයෙන් දෙකඩ වීම
  - පාපතුමාගේ බලය පිරිහීම
  - ආගමික නායකත්වය රාජ්‍ය පාලනයට යටත් වීම
  - ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය ආරම්භ වීම සහ එමගින් කතෝලික සභාව තුළ විවිධ කොටස් බිහි වීම
  - මිශනාරී ව්‍යාපාරය ආරම්භ වීම
  - ආගමික යුද්ධ හා ගැටුම් ඇති වීම

- **ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය**

  - රෙපරමාදු ව්‍යාපාරයෙන් කතෝලික සභාවට එල්ල වූ අභියෝගවලට ප්‍රතිචාර වශයෙන් කතෝලික සභාව විසින් මෙහෙයවන ලද ක්‍රියාමාර්ග ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය නම් වේ.
  - ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් තිබූ මහජන අප්‍රසාදයට ප්‍රතිකර්ම යෙදීම සඳහා රෝමානු කතෝලික සභාව විසින් ක්‍රියාමාර්ග කිහිපයක් අනුගමනය කරන ලදි. ඒ අනුව ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරයේ අරමුණු කිහිපයකි.
  - රෙපරමාදු හෙවත් ප්‍රොතේස්තන්තවාදයෙන් ඉදිරිපත් වූ මිථ්‍යා දෘෂ්ටික ලෙස සලකන ලද අදහස් බිඳ දැමීම
  - ප්‍රොතෙස්තන්තවාදය ව්‍යාප්ත වීම නවතාලීම
  - ආගමික එක්සත් බව ඇති කිරීම

මෙසේ ආරම්භ වූ ප්‍රතිසංස්කරණ අංශ කිහිපයකින් යුක්ත විය

- **ජේසු සංගමය පිහිටුවීම (1534)**
  ස්පාඤ්ඤ ජාතික ඉග්නේෂස් ලොයෙලා (1491-1556) විසින් මෙය පිහිටුවනු ලැබීම. මොහු විසින් රචනා කරන ලද 'ආධ්‍යාත්මික අභ්‍යාස' ජේසුයිට්වරුන්ගේ අත්පොත වීම. කතෝලික ප්‍රතිසංස්කරණ ව්‍යාපාර අතර මෙය වඩාත් සටන්කාමී ව්‍යාපාරය වීම හා එම සංවිධානය යුද්ධ හමුදාවක ස්වරූපයකින් සංවිධානය වී තිබීම
  මෙම සංවිධානය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කිහිපයකි
  * දේශන පැවැත්වීම
  * රෝමානු කතෝලික ආගම පිළිබඳ අධ්‍යාපනය ලබා දීම
  * අවශ්‍ය අවස්ථාවලදී බලය යොදා ගැනීම

- **ට්‍රෙන්ට් සම්මේලනය කැඳවීම (1545-1563)**
  * 1545 දී තුන්වෙනි පාවුලු පාපතුමා ට්‍රෙන්ට් නම් ස්ථානයේ දී මෙම සම්මේලනය කැඳවීය.
  * කිහිප වරක් ම රැස් වූ මෙම සම්මේලනයේ මූලික ම අරමුණ වූයේ, එවකට මුළුමනින් ම පාහේ විනාශ වී ගිය කතෝලික සභාවේ ප්‍රතිරූපය නැවත ගොඩනැගීම සහ අහිමි වී ගිය අධිකාරීත්වය නැවත ලබා දීම යි.

මෙම අරමුණ ඉටු කරගැනීමට සම්මේලනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග

- පිරිසිදු කතෝලික ධර්මය බයිබලය මත පදනම් වී ඇති බවත් බයිබලය අර්ථකථනය කිරීමේ ආධිපත්‍යය කතෝලික සභාවට පමණක් ඇති බවත් තීරණය කිරීම
- ගැලවීම සඳහා දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය මෙන් ම යහපත් ක්‍රියා ද අවශ්‍ය බව අවධාරණය කිරීම
- කතෝලික සභාව තුළ පාප්තුමා සතු අධිකාරිත්වය මෙන් ම නායකත්වය දැඩි ලෙස අවධාරණය කිරීම
- රෙපරමාදු වාදීන්ගේ දැඩි විවේචනයට ලක් වූ පුන්‍යඵල පත්‍රිකා විකිණීම තහනම් කිරීම
- බිෂොප්වරුන්ට සහ පූජකවරුන්ට පල්ලි වසම් එකකට වඩා දැරීම තහනම් කිරීම සහ පදිංචි වීම සහ බ්‍රහ්මචාරී වීම අනිවාර්ය කිරීම
- පූජකවරුන් පුහුණු කිරීම සඳහා සෑම දියෝකිසියක ම සෙමනේරි පිහිටු වීමට තීරණය කිරීම
- මිථ්‍යා දෘෂ්ටිකයන් ව්‍යාප්ත වීම වැළැක් වීම සඳහා 'අධර්ම මර්දනාධිකරණය' පිහිටු වීම
- ආගමික මෙහෙය පොදු ජනතාව අතර භාවිත වන භාෂාවන්ගෙන් පැවැත් වීම
- කතෝලික ආගමයට විරුද්ධ යැයි සැලකුණ බිෂොප් පූජකවරුන් වරණය කිරීමට පියවර ගැනීම
- සම්ප්‍රදායානුකූල ලතින් බයිබලය ලෙස පිළිගැනීම
    - රෙපරමාදු ආගම වැළඳගත් අය යළි රෝමානු කතෝලික ආගමට හරවා ගැනීම සඳහා අධර්ම මර්දනාධිකරණය ක්‍රියාත්මක කිරීම
    - රෙපරමාදු ආගමය පිළිගැනීමට විරුද්ධ වූ අයව පුලුස්සා මැරීම වැනි දැඩි දඬුවම් පැමිණ වීම

  * විශේෂයෙන් ස්පාඤ්ඤය, පෘතුගාලය යන රටවල මිසදිටුවන් සේ සැලකුණ බොහෝ දෙනා මරණයට හෝ සිර දඬුවම්වලට හෝ ලක් කළහ.

ඇගයීම - 01

**පහත ප්‍රශ්න සඳහා නොගැළපෙන පිළිතුර තෝරා එහි අංකය තිත් ඉරමත ලියන්න**

1. 1. මාටින් ලූතර්　2. ජෝන් කැල්වින්　3. උල්රිච් සිවිංගල්　4. ජෝන් හස්
   5. පැරසෙල්සස්　(...........)

2. 1. ජේසුයිට්වරු　2. ඇංග්ලිකන්වරු　3. ලූතර්වාදීන්
   4. රෝමානු කතෝලික　5. කැල්වින්වාදීන්　(...........)

3. 1. මාටින් ලූතර් - ජර්මනිය　2. උල්රිච් ස්විංගල් - ස්විට්සර්ලන්තය
   3. ජෝන් කැල්වින් - ප්‍රංශය　4. ලියනාඩෝ ඩාවිංචි - ඉතාලිය
   5. ජෝන් වෙක්ලිප් - එංගලන්තය

   (...........)

4. ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය යනු කුමක් ද?
   1. කතෝලික සභාව කොටස්වලට බිඳී යාමයි
   2. නව නිකායන් විසින් ආගමික ප්‍රතිසංස්කරණ සිදුකිරීමයි
   3. නව නිකායන්ගෙන් කතෝලික සභාවට එල්ල වූ අභියෝගවලට ගත් ක්‍රියාමාර්ග
   4. රෙපරමාදු ආගම් නව ව්‍යවස්ථා සකස් කිරීමයි
   5. කතෝලික සභාවට එරෙහි රෙපරමාදු ආගම් විසින් ගත් ක්‍රියාමාර්ගයි

ඇගයීම - 02

1. ආගමික ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල පැහැදිලි කරන්න.　(ලකුණු 14)

2. ප්‍රතිරෙපරමාදු ව්‍යාපාර මඟින් ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.　(ලකුණු 07)

3. ආගමික ප්‍රතිසංස්කරණවලට සම්බන්ධ පහත රටවල් හා ප්‍රදේශ සිතියමක ලකුණු කරන්න.
   ජර්මනිය, ස්වීඩනය, ප්‍රංශය, ස්පාඤ්ඤය, ස්විට්සර්ලන්තය, නෙදර්ලන්තය, බෝල්ටික් මුහුද, ඩෙන්මාර්කය, රයින් ගඟ, එංගලන්තය

**නිපුණතා මට්ටම :** 3.3. ආගම මුල්කරගෙන යුරෝපයේ ඇති වූ ගැටුම් විමර්ශනය කරයි.

**කාලච්ඡේද :** **05යි.**

**ඉගෙනුම් පල :**
- තිස් අවුරුදු යුද්ධය පැහැදිලි කරයි.
- තිස් අවුරුදු යුද්ධයේ ප්‍රතිඵල පෙන්වා දෙයි.
- තිස් අවුරුදු යුද්ධය අවසානයේ යුරෝපය සිතියමක ලකුණු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

**3.3 තිස් අවුරුදු යුද්ධය**

ක්‍රි.ව. 1618 - 1648 දක්වා වූ කාලය තුල ජර්මනිය කේන්ද්‍රකොටගෙන ආරම්භ වී වෙනත් යුරෝපීය රටවල්ද සම්බන්ධ වී ප්‍රධාන වශයෙන් රෝමානු කතෝලික සහ රෙපරමාදු භක්තිකයන් දෙපිලකට බෙදී සිදු කළ යුද්ධ මාලාව තිස් අවුරුදු යුද්ධය ලෙස හැඳින්වේ.

- **තිස් අවුරුදු යුද්ධයට තුඩුදුන් හේතු**

  - තිස් අවුරුදු යුද්ධයට දේශපාලන, ආර්ථික මෙන් ම ආගමික හේතු බලපෑ බව
  - ඒ අතරින් ආගමික හේතු ප්‍රධාන වූ බවත් එනිසා එය ආගමික යුද්ධයක් ලෙස හැඳින්වීම

  **ආගමික හේතු**

  - ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයෙන් පසු ව ජර්මනියේ කතෝලිකයන් සහ ප්‍රොතෙස්තන්තවාදීන් අතර ඇතිවූ ගැටුම් සමථයකට පත් කර ගැනීම සඳහා ඔග්ස්බර්ග් සමථය ඇති කරගෙන තිබීම
  - එම ගිවිසුමේ අඩුපාඩු තිබීම නිසා ගිවිසුමේ වගන්ති නිසි ලෙස ක්‍රියාත්මක නොවීම නිසා යළිත් කතෝලික - ප්‍රොතෙස්තන්ත්‍ර දෙපාර්ශ්වය අතර මතභේද උත්සන්න වීම.
  - ඔග්ස්බර්ග් ගිවිසුම පරිදි 1552න් පසු ව ප්‍රොතෙස්තන්තවාදය වැලඳගත් පූජකවරුන් එතෙක් කතෝලිකයන් වශයෙන් ඔවුන් භුක්ති විඳි ඉඩම් අත්හැර දැමිය යුතු වුව ද හරිහැටි ක්‍රියාත්මක නොවීම. 1552න් පසු ව ද ලූතර් වාදය වැලඳගත් පූජකවරුන් කතෝලික සභාවට අයත් ඉඩම් බලෙන් අල්ලාගෙන සිටි අතර 1552ට පෙර ප්‍රොතෙස්තන්තවාදය වැලඳගත් පූජකවරුන්ගේ ඉඩම් ද උදුරාගැනීමට ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරයෙන් ප්‍රාණවත් වී සිටි කතෝලිකයන් ක්‍රියාත්මක වීම
  - එපරිද්දෙන් කතෝලික සභාව සතු ව පැවති දේපල සම්බන්ධයෙන් ඔගස්බර්ග් සමගියේ කොන්දේසි දෙපාර්ශ්වය විසින් ම කඩ කිරීම
  - ඔග්ස්බර්ග් සමථය පරිදි ජර්මන් රාජ්‍යවල රාජ්‍ය ආගමය ලෙස පිළිගත යුතු ආගම තෝරා ගැනීමේ බලය එම රාජ්‍යවල පාලකයන්ට ලබා දී තිබීම. පාලකයන්ගේ ආගමය පාලිත ජනතාවගේ ද ආගම විය යුතු බව
  - එහෙත් එම සමථය අනුව කිසියම් රටක ආගම් ලෙස පිළිගත හැකි වූයේ කතෝලික දහම සහ ලූතර්වාදය පමණි. මේ කාලය වන විට කැල්වින්වාදය ද පුළුල් ලෙස ජර්මන් රාජ්‍ය පුරා ව්‍යාප්ත ව පැවති අතර එය අලුත් බලවේගයක් බවට පත් වී තිබිණි. එම ආගම ඇදහූ අයට ආගමය රාජ්‍ය ආගමක් බවට පත් කරගැනීමට තිබූ බාධාවට එරෙහි ව නැඟී සිටීම (පැලටයින්, බ්‍රැඩන්බර්ග් රාජ්‍යවල පාලකයෝ ද කැල්වින්වාදය වැලඳගෙන සිටියහ.

- බොහෝ රටවල රෙපරමාදුවාදය වැලඳගත් අය ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරයේ ප්‍රතිඵල වශයෙන් යළි කතෝලික ආගමට හරවාගෙන තිබීම සහ රෙපරමාදු ව්‍යාපාරයේ ව්‍යාප්තිය මැඩපවත්වා තිබීම නිසා යුරෝපය පුරා ම දෙපාර්ශ්වය අතර මතභේද පැන නැඟීම
- දෙපාර්ශ්වය ම තම පාර්ශ්වයේ ශක්තිය වර්ධනය කරගැනීම සඳහා සංවිධාන පිහිටුවා ගැනීම උදාහරණ:
    * පැලටයින් රාජ්‍යයේ කැල්වින්වාදි පාලකයාගේ නායකත්වයෙන් ජර්මන් ප්‍රදේශවල ප්‍රොතෙස්තන්ත කුමාරවරුන් 'යූනියන් නමැති සංගමය පිහිටුවා ගැනීම
    * කාතෝලික පාලකයන් බැවේරියාවේ මැක්සිමිලියන් නායකත්වය යටතේ කතෝලික සංගමය නමැති සංවිධානය පිහිටුවා ගැනීම
    * ප්‍රොතෙස්තන්ත බලවේග කඳවුරු දෙකකට බෙදී යාම

**දේශපාලන හේතු**

- බොහිමියානු පැලටයින් සිද්ධිය
- ශුද්ධ රෝම අධිරාජයා හා ජර්මන් ස්වාධීන ආදිපාදවරුන් අතර තම බලය පවත්වා ගැනීමට තිබූ අවශ්‍යතාව නිසා ගැටුම් ඇති වීම
- ප්‍රංශයේ බූර්බෝන් හා ජර්මනියේ හැප්ස්බර්ග් රාජවංශ අතර ගැටුම් ඇති වීම
- ජර්මනියේ ස්වාධීන පාලකයන් අතර ගැටුම් ඇති වීම

**ආර්ථික හේතු**

- ජර්මනියේ ස්වාධීන අදිපාදවරුන් සමඟ වෙළෙඳ සබඳතා ඇති කර ගැනීමට ඩෙන්මාක් රජුට අවශ්‍ය වීම
- ස්වීඩනයට බෝල්ටික් මුහුදේ වෙළෙඳ ආධිපත්‍ය ලබා ගැනීමට අවශ්‍ය වීම

- **තිස් අවුරුදු යුද්ධයේ ව්‍යාප්තිය**

    - ජර්මනිය කේන්ද්‍ර කර ගනිමින් ඇරඹුණු මෙම යුද්ධය ජර්මන් රාජ්‍යවලට පමණක් සීමා නොවී වෙනත් යුරෝපීය රටවල් ද සම්බන්ධ වී වසර 30ක් තරම් දීර්ඝ කාලයක් පැවතීම සඳහා ඉහතින් සඳහන් කළ ආර්ථික, දේශපාලන හා ආගමික හේතු බලපෑවේ ය.

    - තිස් අවුරුදු යුද්ධයේ ප්‍රධාන අවස්ථා 04කි.

        * බොහිමියානු පැලටයින් අවධිය (ක්‍රි. ව. 1618 - 1620)
        * ඩෙන්මාර්ක් අවධිය (ක්‍රි. ව. 1625 - 1629)
        * ස්වීඩන් අවධිය (ක්‍රි. ව. 1630 - 1635)
        * ප්‍රංශ අවධිය (ක්‍රි. ව. 1635 - 1648)

- **වෙස්ට්ෆේලියා ගිවිසුම**

වසර 30ක් පුරා පැවති යුද්ධය අවසන් වන්නේ 1648 දී අස්සන් කරන ලද වෙස්ට්ෆේලියා සාම ගිවිසුම මඟිනි. මෙම ගිවිසුම අස්සන් කිරීම යුරෝපය නව මඟක යොමු කළ අවස්ථාවක් ලෙස දැක්විය හැකි ය. එංගලන්තය, රුසියාව යන රටවල් හැරෙන්නට යුරෝපයේ පැවති ලොකු කුඩා රාජ්‍ය සියල්ල ම වාගේ සහභාගී වීම දක්නට ලැබේ. මෙම ගිවිසුමෙහි තුළ අඩංගු වැදගත් කරුණු කිහිපයකි.

* 1555 ඇති කළ ඔග්ස්බර්ග් සාම සම්මේලනයේ මූල ධර්මය වූ පාලකයාගේ ආගම පාලිතයාගේ ආගම විය යුතුය යන්න තහවුරු වීම
* රෝමානු කතෝලික ආගම ලූතර් ආගම මෙන් ම කැල්වින්වාදය නීත්‍යානුකූල ව පිළිගැනීම
* ජර්මනියේ ප්‍රදේශීය කුමාරවරුන්හට ස්වාධීන බව හිමි වීම

* ස්වීඩනයට තමන් බලාපොරොත්තු වූ ලෙස ම බෝල්ටික් මුහුදේ වෙළෙඳ අයිතිය ලැබීම
* ශුද්ධ රෝම අධිරාජ තනතුර නාම මාත්‍රික වීම
* අධිරාජයාගේ උපදේශක සභාවට රෙපරමාදු ආගමෙන් නියෝජිතයකු යැවීමට අවස්ථාව හිමි වීම
* යුද්ධයෙන් ජයග්‍රහණය කළ රට වලට සිය සහභාගිත්වයට ප්‍රධාන වශයෙන් අතිරේක ප්‍රදේශ හිමි වීම

    උදාහරණ:- ප්‍රංශයට - මෙට්ස්, ටූල්, වරඩුන්, ඇල්සාස් ලෝරේන්
    ස්වීඩනයට - බෝල්ටික් මුහුදට මුහුණ ලා ඇති ප්‍රදේශ, උතුරු මුහුදට මුහුණ ලා ඇති ප්‍රදේශ

- **තිස් අවුරුදු යුද්ධයේ ප්‍රතිඵල**

    - ශුද්ධ රෝම අධිරාජයා තිස් අවුරුදු යුද්ධයෙන් පරාජයට පත් වීම නිසා ඔහු නාම මාත්‍රික තත්වයට පත් වීම
    - පාප් වහන්සේ සතු බලය රෝමානු කතෝලික ආගම තුළ නැවත තහවුරු විම
    - යුරෝපය තුළ මෙතෙක් පැවති ආගමික ගැටුම් සමථයකට පත් වීම
    - බූර්බෝන් රාජ වංශය යුරෝපය තුළ බලවත් වීම තුළින් ප්‍රංශය යුරෝපයේ බලවත් රාජ්‍ය බවට පත් වීම
    - ජර්මනියේ ප්‍රදේශීය කුමාරවරුන් ස්වාධීන වීම තුළ ජර්මනිය එක්සත් වීම තව දුරටත් ප්‍රමාද වීම
    - ස්විට්සර්ලන්තය සහ නෙදර්ලන්තය ස්වාධීන රාජ්‍යයක් බවට පත් වීම
    - ස්වීඩනයට බෝල්ටික් මුහුදේ වෙළෙඳ අයිතිය ලැබීම

ඇගයීම - 01

**පහත සඳහන් බහුවරණ ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න. නොගැළපෙන පිළිතුර තෝරන්න.**

1. 1. බොහිමියානු අවධිය 2. ප්‍රංශ අවධිය 3. ඩෙන්මාර්ක් අවධිය 4. ඉතාලි අවධිය
   5. ස්වීඩන් අවධිය (...................)
2. 1. මතියාස් 2. මැක්ස්මිලියන් 3. ගුස්ටාවුස් 4. වොලන්ස්ටයින් 5. නෙකර් (...................)
3. 1. විටෙන්බර්ග් 2. බ්‍රැන්ඩර්න්බර්ග් 3. වර්ටෙම්බර්ග් 4. හැප්ස්බර්ග් 5. ඔග්ස්බර්ග්

   (...................)
4. තිස් අවුරුදු යුද්ධයට අදාළ නොවන කරුණ තෝරන්න
   1. ඔග්ස්බර්ග් සාම සමථයේ අඩු පාඩු නිසා ඇති වීම
   2. යුද්ධයෙන් ප්‍රංශය ජය ගැනීම
   3. ශුද්ධ රෝම අධිරාජයා පරාජය වීම
   4. වෙස්ට්ෆේලියා සාම ගිවිසුමෙන් ආගමික යුද්ධ අවසන් වීම.
   5. චාල්ස් අධිරාජයා යුද්ධයට සහභාගි වීම (...................)
5. තිස් අවුරුදු යුද්ධය
   1. 1618 ජර්මනිය කේන්ද්‍ර කරගෙන ආරම්භ වීම
   2. කතෝලිකයන් හා ප්‍රොතෙස්තන්තවාදීන් අතර ඇති වීම
   3. ප්‍රොතෙස්තන්තවාදීන් ජයග්‍රහණය කිරීමෙන් යුද්ධය අවසන් වීම
   4. ප්‍රංශය කතෝලිකයන්ට ආධාර වීම
   5. තිස් අවුරුදු යුද්ධය යුරෝපයේ ආගමික යුද්ධවල අවසානය වීම (...................)
6. තිස් අවුරුදු යුද්ධයට සහභාගි වූ රටවල්
   1. ඩෙන්මාර්කය 2. රුසියාව 3. ප්‍රංශය 4. පෝලන්තය 5. එංගලන්තය

   (...................)
7. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ හා තිස් අවුරුදු යුද්ධ සමයේ ඇති කර ගත් සාම ගිවිසුම්
   1. ඔග්ස්බර්ග් ගිවිසුම
   2. ලුබෙක් ගිවිසුම
   3. වෙස්ට්ෆේලියා ගිවිසුම
   4. ප්‍රාග් ගිවිසුම
   5. ඒමියන්ස් ගිවිසුම

   (....................)

ඇගයීම - 02

**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1

i. තිස් අවුරුදු යුද්ධය යනු කුමක් ද?
ii. තිස් අවුරුදු යුද්ධයට බලපෑ හේතු මොනවා ද?
iii. තිස් අවුරුදු යුද්ධයේ ප්‍රතිඵල පහදන්න

## 4. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය

වර්තමාන එංගලන්ත පාර්ලිමේන්තුව තෙක් එංගලන්ත පාර්ලිමේන්තු ක්‍රමය විකාශනය වූ ආකාරය හා එංගලන්ත පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වූ විශේෂ අවස්ථා සාකච්ඡා කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ.

මධ්‍යතන අවධියේ රජුගේ කැමැත්ත අනුව පත් වූ වංශාධිපතිවරුන්ගෙන් සමන්විත වූ 'මහාසභාව' නම් ආයතනය වර්තමානයේ ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන බලතලවලින් සමන්විත උත්තරීතර වන පාර්ලිමේන්තුවේ තත්ත්වයට වර්ධනය වී ඇත. 1215 මහාධිකාර පත්‍රය මඟින් ප්‍රථම වරට බලය සීමා වූ අතර ටියුඩර් යුගයේ දී රජු හා පාර්ලිමේන්තුව එක් වී පාලන කටයුතු ගෙන යනු ලැබී ය. එසේ වුවත් 1688 උත්කෘෂ්ට විප්ලවයෙන් පසු එංගලන්ත රජුගේ බලය සීමා වී පාර්ලිමේන්තුව ක්‍රමානුකූල ව බලවත් වූ ආකාරය සහ පාර්ලිමේන්තු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කිරීම මේ යටතේ සිදුවේ. පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය මානව සංහතියේ ප්‍රගමනයට දායක වන බව මෙම ඓතිහාසික සිදුවීම් ඇසුරෙන් විග්‍රහ කිරීම ද මෙහි දී අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : • පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය මානව සංහතියේ ප්‍රගමනයට දායක වූ ආකාරය විග්‍රහ කරයි.

**නිපුණතා මට්ටම** : 4.1 බ්‍රිතාන්‍ය සමාජයේ ඇති වූ වෙනස් වීම්වලට අනුරූප ව දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රවණතා විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : 10යි.

**ඉගෙනුම් පල** :
- ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල ඇති වූ වෙනස් වීම්වලට අනුරූප ව දේශපාලන ක්ෂේත්‍රයේ වූ ප්‍රවණතා පෙන්වා දෙයි.
- බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ආකාරය විස්තර කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

4. **බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය**
   - **පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීම**

     - මධ්‍යතන යුගයේ රජුගේ කැමැත්ත පරිදි රැස් කළ වංශාධිපතිවරුන්ගෙන් සමන්විත වූ 'මහා සභාව' වර්තමාන පාර්ලිමේන්තුවේ මූලාරම්භ අවස්ථාව ලෙස සැලකීම
     - දක්ෂ පාලකයන් වූ දෙවෙනි හෙන්රි සහ පළමුවෙනි රිචඩ් රජු සමඟ මතභේදයකින් තොර ව වංශාධිපතිවරුන් කටයුතු කිරීම
     - අදක්ෂ පාලකයකු වූ තුන්වෙනි ජෝන් රජුගේ කාලයේ වංශාධිපතිවරුන් (මහා සභාව) තම නැතිවී ගිය බලතල ලබාගැනීම සඳහා රජු ලවා 1215 දී මහා ප්‍රඥප්තිය (මැග්නාකාර්ටා) අස්සන් කරවා ගැනීම පාර්ලිමේන්තුවේ බල වර්ධනයේ වැදගත් අවස්ථාවක් වීම
     - එමඟින් රජුගේ බලය සීමා වීම
     - බදු ගෙවන්නන්ගෙන් සමන්විත මහාසභාවේ අනුමතිය නොමැති ව රජුට බදු අයකිරීමට බලයක් නොමැති වීම
     - රටේ පවතින නීතිය අනුව නඩු විසඳීමකින් තොර ව නිදහස් වැසියකුට දඬුවම් කිරීමට රජුට කිසි ම බලයක් නොමැති වීම
     - රජු මෙම වගන්ති කඩ කළ හොත් මහා සභාවේ විසිපස් දෙනෙකුගෙන් සමන්විත බැරන් වරුන්ගෙන් සමන්විත මණ්ඩලයට රජුට දඬුවම් දිය හැකි වීම
     - තුන්වන වන හෙන්රි රජුගේ කාලයේ දී (1216 - 1272) එනම් 1265 දී මහා සභාව පාර්ලිමේන්තුව

නමින් හැඳින්වීම. මේ වන විට පාර්ලිමේන්තුව බලවත් වී තිබූ අතර රජවරුන් බලයෙන් පහකොට දැමීම පවා එයට කළ හැකි වීම

උදාහරණ ඃ තුන් වන හෙන්රි රජුට විරුද්ධ ව කැරලි ගසා ඔහු සිරභාරයට ගෙන 1258 දී සයිමන් ඩී මොන්ට්පර්ඩ් යටතේ බැරන් වරුන්ගේ ආණ්ඩුවක් පිහිටුවීම දැක්විය හැකි ය.

- පළමු වන වන එඩ්වඩ් රජුගේ කාලය (1272-1307)පාර්ලිමේන්තුවේ පියා ලෙස ඔහු හඳුන්වන අතර 1295 කැඳවූ ආදර්ශ පාර්ලිමේන්තුව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු වර්ධනයේ වැදගත් අවස්ථාවක් වීම

**සංයුතිය**

- පාර්ලිමේන්තුව මණ්ඩල දෙකකින් සමන්විත වීම. සාමි මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

**බලතල**

- මහජන නියෝජිත මණ්ඩලයට කථානායකවරයා පත් කොට ගැනීමට බලය ලැබීම
- දෙවන එඩ්වර්ඩ් රජුගේ කාලයේ දී (1307-1327) පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක විධායක බලතල ක්‍රමයෙන් වැඩිවීමක් දක්නට ලැබීම. උදාඃ 1727 දී පාර්ලිමේන්තුව දෝෂාභියෝගයකින් දෙවෙනි එඩ්වර්ඩ් රජු බලයෙන් පහ කොට ඔහුගේ පුත් තුන්වෙනි එඩ්වර්ඩ් පාලකයා වශයෙන් පත් කොට ගැනීම
- අලුතෙන් දේශීය බදු පැනවීමේ බලය පාර්ලිම්න්තුවට පවරා තිබුණත් විදේශීය වෙළෙඳුන්ගෙන් බදු අය කිරීමේ බලය දිගට ම රජවෙත පැවරී තිබිණි. එහෙත් තුන්වෙනි එඩ්වර්ඩ් රජුගේ පාලන සමයේ දී (1327-1377) එම බලය ද පාර්ලිමේනතුව වෙත පවරා ගැනීම
- රජු මුදල් බලතල සීමා කොට ඒවා පාර්ලිමේන්තුව වෙත ලබාගත් අතර රජු නිසි ලෙස පාර්ලිමේන්තු කොන්දේසි පිළිපදින්නේදැයි සොයා බැලීමට ක්‍රි.ව. 1377 දී සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත පාර්ලිමේන්තු කමිටුවක් පත් කිරීම
- දෙවෙනි රිචර්ඩ් රජුගේ කාලයේ දී (1377-1399) රට තුළ ඇති වූ අර්බුද නිසා රජුගේ බලය දුර්වල වී පාර්ලිමේන්තු බලය වර්ධනය වීම. සියක් අවුරුදු යුද්ධය, ගොවි කැරලි, මහාමාරිය වසංගතය (Black Death) වැනි අර්බුද
- හතරවෙනි හෙන්රි (1399-1413) පාර්ලිමේන්තුවේ සහය ඇති ව දෙවෙනි රිචර්ඩ් රජු නෙරපා බලයට පත්වීම
- පාර්ලිමේන්තුවේ සහායෙන් බලයට පත් වීම නිසා හතරවෙනි හෙන්රිට පාර්ලිමේන්තුව අභිබවා යාමට නොහැකිවීම නිසා පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීම.
- සියක් අවුරුදු යුද්ධය සඳහා අවශ්‍ය මුදල් ලබා ගැනීම. පාර්ලිමේන්තුවේ විවාද පැවැත්වීමේ නිදහස, මුදල් පාලනයේ අයිතිය පාර්ලිමේන්තුවට ලැබීම. පාර්ලිමේන්තු නියෝජිතයන් අත්අඩංගුවට නොගැනීමේ වරප්‍රසාද මඟින් මේ යුගයේ දී පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීම.

- **ටියුඩර් යුගය (1485-1603)**

  - රෝස යුද්ධවලින් පසු හත් වන හෙන්රි (1485-1509) බලයට පත්වීම. ඔහු පාර්ලිමේන්තුව යටපත් කොට පාර්ලිමේන්තුව සතු ව තිබූ බොහෝ බලතල යළි රජු වෙත ලබාගෙන ප්‍රබල රාජාණ්ඩුවක් ගොඩනැඟීම
  - අටවෙනි හෙන්රි රජුගේ කාලයේ රෝමානු කතෝලික සභාව සමඟ ගැටුම් ඇති කොට ගැනීම කැතරින් බිසව දික්කසාද කොට ඈන් බොලීන් විවාහ කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ සහය ලබා ගැනීම. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රෙපරමාදු පාර්ලිමේන්තුව ඇති වීම. අටවෙනි හෙන්රි රජුගේ පාලන (1509-1547) කාලය පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමේ තවත් අවස්ථාවක් වීම
  - පළමුවෙනි එලිසබෙත් රැජිනිගේ කාලයේ දී (1547-1603) පාර්ලිමේන්තුවේ කටයුතු මඟින් ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවක් බිහි වීම. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට බාධා ඇති නොවීම

- ස්ටුවර්ට් යුගය

  - පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමේ වැදගත් අවධියක් වීම
  - රජු හා පාර්ලිමේන්තුව අතර මුළු ස්ටුවර්ට් යුගය පුරා ම ගැටුම් ඇති විම
  - රජු දැඩි කතෝලිකයකු වූ අතර පාර්ලිමේන්තුවේ බහුතරය රෙපරමාදු අදහස් දරූ අය වීම. රජ වරුන් දේවවරම්වාදය පිලිගත් අතර පාර්ලිමේන්තුව සමාජ සම්මුතිවාදය පිළිගැනීම. නීතියේ උල්පත රජු විය යුතු යයි ස්ටුවර්ට්වරුන් පිළිගත් අතර රජු වුව ද නීතියට යටත් විය යුතු ය යන්න පාර්ලිමේන්තුවේ අදහස වීම. මේ කරුණු මුල්කොටගෙන ස්ටුවර්ට් වරුන් හා පාර්ලිමේන්තුව අතර දිගටම ගැටුම් ඇති වීම
  - පාර්ලිමේන්තුවේ අනුමතිය නොමැති ව බදු අය කිරීම. නඩු විභාගයකින් තොර ව පුද්ගලයින් සිරගත කිරීම වැනි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම නිසා පාර්ලිමේන්තුව රජුට විරුද්ධ ව කටයුතු කිරීම.
  - පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තේරීම පිළිබඳ ව ඇති වූ විවාදයේ දී මන්ත්‍රීවරුන් තේරීම පිළිබඳ ප්‍රශ්න විසඳීමේ බලය ඇත්තේ පාර්ලිමේන්තුවට පමණක් බව පිළිගැනීම පළමුවෙනි ජේම්ස් රජු ලැබූ පරාජයක් විය. මේ අවස්ථාව පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමට වැටුණු අඩිතාලමක් වීම.
  - පාර්ලිමේන්තුව හා රජු අතර නිරන්තර ගැටීම් ඇති වීමට බලපෑ හේතු රාශියක් වීම. රජුගේ අත්තනෝමතික කටයුතු නැවැත්වීම, රාජ්‍ය නිලධාරීන්ට දෝෂාරෝපණය කිරීමේ අයිතිය, බදු පැනවීමේ අයිතිය, කතා කිරීමේ නිදහස, සාමි මන්ත්‍රී මණ්ඩලය සමඟ එක් ව නීති පැනවීමේ අයිතිය, අත් අඩංගුවට නොගැනීමේ වරප්‍රසාදය රජු තමන්ට අභිමත පරිදි බදු පැනවීම වැනි කරුණු ඒ අතර ප්‍රධාන වීම
  - අර්බුද අවස්ථාවල දී මුදල් ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුව කැඳවීම. (උදාහරණ: ලෙස 1624 දී ස්පාඤ්ඤ යුද්ධය සඳහා මුදල් ලබා ගැනීම)
  - ෆ්‍රැන්සිස් බේකන්ට එරෙහි ව පාර්ලිමේන්තුව දෝෂාභියෝගයක් ඉදිරිපත් කිරීම නිසා රජු හා පාර්ලිමේන්තුව අතර ගැටුම් වර්ධනය වීම. රජුට නීතියෙන් බැහැර ව කටයුතු කළ නොහැකි බවට අදහස් ප්‍රචාරය වීම
  - පළමුවෙනි චාර්ල්ස් රජුගේ කාලයේ රජු හා පාර්ලිමේන්තුව අතර ගැටුම් ඇතිවීම. රජුගේ වැය ඇස්තමේන්තු අනුමත නොකරන විට පාර්ලිමේන්තුව විසුරුවා හැරීම. රජුට අභිමත පරිදි බදු අය කිරීම. රජු විටින් විට පාර්ලිමේන්තුවේ සහය ලබා ගැනීම.
  - පළමුවෙනි චාර්ල්ස් රජුගේ කාලයේ 1628 අයිතිවාසිකම් පිළිබඳ පෙත්සම එංගලන්ත පාර්ලිමේන්තු බලය වර්ධනයේ වැදගත් අවස්ථාවක් වීම. එම පෙත්සමට අනුව
  - පාර්ලිමේන්තු අනුමතිය නොමැති ව කිසිම බද්දක් හෝ ණය මුදලක් අයකිරීම නීති විරෝධී විය.
  - සාධාරණ නඩු විභාගයකින් තොර ව මිනිසුන් බන්ධනාගාර ගත කළ නොහැකි විය.
  - බදු නොගෙවූ පුද්ගලයන්ගේ නිවෙස්වල සොල්දාදුවන් නතර කිරීම තහනම් කෙරිණි.
  - සාමකාමී කාලවල දී යුද්ධ නීතිය භාවිත කිරීම තහනම් විය.
  - ස්කොට්ලන්ත යුද්ධය සඳහා මුදල් ලබා ගැනීම පිණිස පළමුවෙනි චාර්ල්ස් රජුගේ කාලයේ 1640 දී පාර්ලිමේන්තුව කැඳවන ලද අතර එම පාර්ලිමේන්තු සැසි වාරය සති තුනකට පමණ සීමා වූ බැවින් එය කෙටි කාලීන පාර්ලිමේන්තුව නමින් හැඳින්වීම. එම වසරේ ම රජු විසින් කැඳවන ලද පාර්ලිමේන්තුව අඛණ්ඩ ව දීර්ඝ කාලයක් රැස්වූ බැවින් එය දීර්ඝ කාලීන පාර්ලිමේන්තුව නමින් හැඳින්වීම
  - පළමුවෙනි චාර්ල්ස් රජුගේ කාලයේ දී 1648 දී ඔලිවර් ක්‍රොම්වෙල් ගේ නායකත්වයෙන් පාර්ලිමේන්තුව හා රජු අතර සිවිල් යුද්ධයක් ඇති වීම. පාර්ලිමේන්තුව ජයගත් අතර ක්‍රොම්වෙල්ගේ ප්‍රධානත්වයෙන් සමූහාණ්ඩුවක් පිහිටුවීම. පාර්ලිමේන්තුවේ අනුමතිය ඇති ව පළමුවෙනි චාර්ල්ස් රජු මරා දැමීම.
  - ක්‍රොම්වෙල්ගෙන් පසු නැවත රාජාණ්ඩුව ප්‍රතිෂ්ඨාපනය වී පළමුවෙනි චාර්ල්ස් රජුගේ පුත් දෙවෙනි චාර්ල්ස් රජ වීම
  - දෙවෙනි චාර්ල්ස් ගේ කාලයේ දී (1660-1685)පාර්ලිමේන්තුව සමඟ ගැටීම් ඇති වී තවදුරටත් පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීම. පාර්ලිමේන්තුව තුළ රජුට පක්ෂ (ටෝරි) හා විපක්ෂ (විග්) කණ්ඩායම් දෙකක් බිහි වීම

ඇගයීම-01

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉරමත ලියන්න**

1. මැග්නාකාර්ටා ප්‍රඥප්තිය අස්සන් කරන ලද්දේ කවර රජුගේ කාලයේ ද?
   1. දෙවෙනි හෙන්රි
   2. තුන්වෙනි හෙන්රි
   3. තුන්වෙනි ජෝන්
   4. පළමුවෙනි එඩ්වර්ඩ්
   5. දෙවෙනි එඩ්වර්ඩ්

(.................)

2. A හා B තීරු නිවැරදි ව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 1. මහාධිකාර පත්‍රය අත්සන් තැබීම | A. පළමුවෙනි චාර්ල්ස් රජු |
| 2. පාර්ලිමේන්තුවේ පියා | B. දෙවෙනි ජේම්ස් රජු |
| 3. ට්‍යුඩර් පෙළපතේ පළමු පාලකයා | C. පළමුවෙනි එඩ්වර්ඩ් රජු |
| 4. ඔලිවර් ක්‍රොම්වෙල් අතින් ඝාතනය වූ එංගලන්ත රජු | D. තුන්වෙනි ජෝන් රජු |
| 5. උත්කෘෂ්ට විප්ලව සමයේ සිටි එංගලන්ත පාලකයා | E. හත්වෙනි හෙන්රි රජු |

(1) DABCE (2) ACBED (3) CEABD (4) EABDC (5) DCEAB (................)

3. එංගලන්ත පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය සම්බන්ධයෙන් නොගැළපෙන පිළිතුර තෝරන්න.

   A. මහ සභාව
   B. මහාප්‍රඥප්තිය
   C. බැරන්වරුනගේ මණ්ඩලය
   D. ඩූමා සභාව
   E. මහජන මන්ත්‍රී මණ්ඩලය

(................)

4. පාර්ලිමේන්තුවේ බලය වර්ධනය සම්බන්ධයෙන් ටියුඩර් යුගයේ සිදු වූ ක්‍රියාවලියක් වන්නේ,

   A. හත්වෙනි හෙන්රි රජු රෝස යුද්ධය ජයගැනීම
   B. අටවෙනි හෙන්රි රජු 'රෙපරමාදු පාර්ලිමේන්තුව' පිහිටුවීම
   C. මහ සභාව පත්කිරීම
   D. මැග්නාකාර්ටා ගිවිසුම අත්සන් කිරීම
   E. ද්වීමණ්ඩල පාර්ලිමේන්තුවක් සැකසීම

(................)

5. එංගලන්ත පාර්ලිමේන්තුව හා ස්ටුවර්ට් යුගයේ රජවරුන් අතර වූ ගැටුමක් නොවන්නේ මින් කුමක්ද?

   A. රජු දේවවරම්වාදය පිළිගැනීම හා පාර්ලිමේන්තුව සමාජ සම්මුතිවාදය පිළිගැනීම
   B. පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තේරීම
   C. පාර්ලිමේන්තුව රැස් කිරීම හා විසුරුවා හැරීම
   D. නීති පැනවීම හා ක්‍රියාත්මක කිරීම
   E. වැය ඇස්තමේන්තු අනුමත කිරීම

(................)

**ඇගයීම-02**

**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

1. 1215 සිට 1688 තෙක් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය සිදුවූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 14)

2. ස්ටුවර්ට් රාජවංශය සමයේ රජු හා පාර්ලිමේන්තුව අතර ඇති වූ ගැටීම් විස්තර කරන්න.

(ලකුණු 14)

3. ''1688 උතකෘෂ්ට විප්ලවයෙන් එංගලන්ත රජුගේ බලය සීමා විය''

I. උත්කෘෂ්ට විප්ලවය නිසා එංගලන්තය හැර පලාගිය රජු කවරෙක් ද? (ලකුණු 01)

II. උත්කෘෂ්ට විප්ලවයෙන් පසු එංගලන්තයේ බලයට පත්වූයේ කවරෙක් ද? (ලකුණු 02)

III. උත්කෘෂ්ට විප්ලවයට බලපෑ ආසන්න හේතුව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

IV. උත්කෘෂ්ට විප්ලවයේ ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 08)

**නිපුණතා මට්ටම:** 4.2. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ඇසුරින් පාර්ලිමේනතු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ විග්‍රහ කරන්න.

**කාලච්ඡේද** : 05යි.

**ඉගෙනුම් පල** :
- නියෝජන පාර්ලිමේන්තු ක්‍රමය මානව සංහතියේ ප්‍රගමනයට දායක වන ආකාරය පෙන්වා දෙයි
- නියෝජන ක්‍රමය, පක්ෂ ක්‍රමය හා කැබිනට් ක්‍රමය බ්‍රිතාන්‍ය පාර්මේන්තුව ඇසුරින් විග්‍රහ කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

4.2 **පාර්ලිමේන්තු ක්‍රමයේ ලක්ෂණ**
- නියෝජන ක්‍රමය
- එංගලන්ත පාර්ලිමේන්තුව මහජන නියෝජිත ආයතනයක් බවට පත්වීම නිසා
  - ජනතාවට ඡන්ද බලය හිමි වීම
  - ඡන්ද කොට්ඨාස ක්‍රමය ආරම්භ වීම
  - මැතිවරණ ක්‍රම ක්‍රියාත්මක වීම ආදි ලක්ෂණ බිහි වීම
  - රජුගේ අභිමතය පරිදි කැඳවන ලද බදුකරුවන් ආරම්භයේ දි පාර්ලිමේන්තුව නියෝජනය කළ නමුත් 14 වන සියවසේ සිට එය ජනතාව නියෝජනය කරන ආයතනයක් බවට පත් වීම
  - ප්‍රදේශීය පාලන ඒකකයක් වූ කෝරළ (ෂයර්) සහ රජුගේ නිර්දේශ හිමි වූ නගර පමණක් ආරම්භයේ දී ඡන්ද කොට්ඨාස ලෙස පිළිගැනිණි. ඒ සෑම ඡන්ද කොට්ඨාසයකින් ම පාර්ලිමේන්තුවට නියෝජිතයන් දෙදෙනෙකු බැගින් තෝරා ගැනීම
  - පුද්ගලයා ලබන ආදායම අනුව ඡන්ද බලය හිමි වීම
  - 1832 ප්‍රතිසංස්කරණ පනත නියෝජන ක්‍රමයේ සන්ධිස්ථානයක් වීම
    එම පනත අනුව,
    * ඡන්ද කොට්ඨාස නැවත බෙදා වෙන් කිරීම සිදු වූ අතර ඡන්ද බලය පුළුල් වීම එය ජනගහනයෙන් 24%ට පමණක් සීමා වීම
    * ඉඩම් හිමියන්ට පමණක් සීමා වූ ඡන්ද බලය මෙම පනතින් මධ්‍යම පාන්තිකයන්ට ද හිමි වීම
  - ඡන්ද බලය ලබා ගැනීමට බලාපොරොත්තු වූ කම්කරුවන් තමන්ට ඡන්ද බලය ලබා ගැනීම සඳහා සංවිධානය වීම
  - එම ව්‍යාපාරය චාටිස්ට් ව්‍යාපාරය නමින් හැඳින්විම
  - ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීම්
    * සියලු වැඩිහිටි පිරිමින්ට ඡන්ද බලය ලබා දීම
    * රහස් ඡන්දය හඳුන්වා දීම
    * පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වැටුප් ගෙවීම
    * ඡන්ද අපේක්ෂකයන් සඳහා නියම කොට තිබූ දේපළ සුදුසුකම් අවලංගු කිරීම
    * සමාන ජන සංඛ්‍යාවකින් යුක්ත ඡන්ද කොට්ඨාස ඇති කිරීම
    * වාර්ෂික පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වීම යන ඒවාය
  - 1858 දී සම්මත කරන ලද පනතක් අනුව අපේක්ෂකයන්ට තිබිය යුතු වූ ඉඩම් අයිතිය පිළිබඳ සුදුසුකම අවලංගු කෙරිණි. එසේ ම ඕනෑම ආගමක් අදහන අයකුට පාර්ලිමේන්තුවේ අසුනක් දැරීමේ අවස්ථාව හිමි විය
  - 1867 පනතකින් ඡන්ද දායකයන් සඳහා තිබිය යුතු දේපල සුදුසුකම් ලිහිල් කිරීම නිසා කම්කරුවන්ට ඡන්ද බලය හිමි වීම
  - රහස් ඡන්දයෙන් නියෝජිතයින් තේරීම 1872 සම්මත කළ පනතක් මගින් ආරම්භ වීම.
  - මැතිවරණ වඩාත් විධිමත් තත්ත්වයකට පත් කිරීම සඳහා 1883 දී දූෂණ හා නීති විරෝධී ක්‍රියා පනත පැනවීම

- 1918 දී ස්ත්‍රීන්ට ඡන්ද බලය හිමි වීම. මෙහි දී ගෘහ මූලික කාන්තාවන්ට හා ගෘහ මූලිකයන්ගේ භාර්යාවන් වූ වයස අවු. 30 සම්පූර්ණ කළ කාන්තාවන්ට ද ඡන්ද බලය හිමි විය.
- 1928 දී අගමැති ස්ටැන්ලි බොල්ඩ්වින් ඉදිරිපත් කළ පනතකින් අවු. 21ට වැඩි සියලු කාන්තාවන්ට ඡන්ද බලය හිමි වීම. ඒ අනුව 1928 දී එංගලන්තයේ සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක වීම ආරම්භ වීම

- **පක්ෂ ක්‍රමය**

- ස්ටුවර්ට් රාජ වංශය ආරම්භයේ සිට රජු හා පාර්ලිමේන්තුව අතර පැවති ආගමික මතභේදය පදනම් කොට ගෙන එංගලන්තයේ දේශපාලන පක්ෂ ක්‍රමය ආරම්භ විය. දෙවෙනි චාල්ස්ගෙන් පසු උග්‍ර කතෝලික බැතිමතකු වූ ඔහුගේ සහෝදරයා වන ජේම්ස් කුමරුට සිහසුන අහිමි කොට රෙපරමාදු භක්තික මොන්මත් හි ආදිපාදවරයාට සිහසුන ලබාදීමට මහජන මන්ත්‍රී මණ්ඩලය කටයුතු කළ අවස්ථාවේ මහජන මන්ත්‍රී මණ්ඩලය ප්‍රතිවිරුද්ධ පක්ෂ දෙකකට බෙදී යාම
- මොන්මත් ආදිපාදවරයාට පක්ෂ අය පෙත්සම් කරුවන් වශයෙනුත් ස්ටුවර්ට් වාංශිකයන්ගෙන් සිහසුන පැහැර ගැනීමට බිය වූ අය බියගුල්ලන් වශයෙනුත් හැඳින්වීම
- කල් යාමේ දී ඔවුන් විග් හා ටෝරි යනුවෙන් හැඳින්වීම
- රජුට පක්ෂ අය ටෝරි වශයෙනුත් රජුට විරුද්ධ අය විග් වශයෙනුත් මහජන මන්ත්‍රී මණ්ඩලය තුළ දේශපාලන පක්ෂ ලෙස ගොඩනැඟීම
- ඒ අනුව එංගලන්තය තුළ ද්වි පක්ෂ ක්‍රමයක් බිහි වීම
- මෙම පක්ෂ දෙක 1832න් පසු ලිබරල් සහ කොන්සවේටිව් නමින් හැඳින්වීම
- 1900 දී කම්කරු පක්ෂය ආරම්භ වීම
- 1906 මැතිවරණයෙන් කම්කරු පක්ෂය වැඩි ආසන ගණනක් දිනාගත් අතර ලිබරල් පක්ෂය සමඟ එක්වී ප්‍රථම වරට සභාග රජයක් පිහිටුවීම
- 1924 දී රැම්සේ මැක්ඩොනල්ඩ් යටතේ ප්‍රථම වරට කම්කරු පක්ෂ ආණ්ඩුවක් පිහිටු වීම
- 1929න් පසු ඇති වූ ආර්ථික පරිහානිය සමඟ ප්‍රධාන පක්ෂ තුනම එක් වී මැක්ඩොනල්ඩ් යටතේ ජාතික ආණ්ඩුවක් පිහිටුවීම
- දෙවෙනි ලෝක යුද්ධ සමයේ ඇතිවූ ජාතික ආපදාව සැලකිල්ලට ගෙන ප්‍රධාන පක්ෂ තුන වූ ලිබරල්, කොන්සවේටිව් සහ කම්කරු පක්ෂ එක් වී ජාතික ආණ්ඩුවක් පිහිටුවීම
- දෙවෙනි ලෝක යුද්ධ අවසානයේ 1945 දී පවත්වන ලද මැතිවරණයෙන් වින්ස්ටන් චර්චිල් පරදවා ක්ලේමන්ට් ඇට්ලි කම්කරු පක්ෂ රජයක් පිහිටුවීම
- ලිබරල් පක්ෂය 1945 මැතිවරණයෙන් පසු ක්‍රමයෙන් දුර්වල වී කොන්සවේටිව් හා කම්කරු පක්ෂ වඩාත් ප්‍රබල ව නැඟී සිටීම

- **කැබිනට් ක්‍රමය**

- කැබිනට් ක්‍රමය තුන්වෙනි හෙන්රි රජු සමයේ ආරම්භ වීම
- තුන්වෙනි හෙන්රි රජු මුදල් කටයුතු සඳහා රැස් කළ ප්‍රිවි කවුන්සලයේ විශේෂ කමිටුව කැබිනට් මණ්ඩලයේ මූලාරම්භය ලෙස සැලකීම
- දෙවෙනි චාල්ස් රජු විසින් පිහිටුවන ලද ඇමතිවරුන් පස් දෙනෙකුගෙන් සමන්විත 'කබාල්' නම් ඇමැති මණ්ඩලය නූතන කැබිනට් මණ්ඩලයට බොහෝ දුරට සමාන වීම
- 1688 විප්ලවයෙන් පසු නියම වශයෙන් නූතන කැබිනට් මණ්ඩලය ආරම්භ වීම
- රජයේ බලතලවලින් විශාල කොටසක් තමන් අතට පත් කොට ගැනීම සඳහා පාර්ලිමේන්තුව අනුගමනය කළ ක්‍රියා කලාපය කැබිනට් මණ්ඩලයේ වර්ධනයට හේතු වීම
- හැනෝවර් පෙළපතේ පළමු වන හා දෙවන ජෝර්ජ් රජවරුන් ඉංග්‍රීසි භාෂාව කථාකළ නොහැකි බැවින් ඇමති මණ්ඩල රැස්වීම්වල මුලසුන ගැනීමෙන් වැළකී සිටි බැවින් ඇමති මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨයකු මුලසුන ගැනීමේ සිරිත ආරම්භ වීම
- එමඟින් අගමැති තනතුර ආරම්භ වීම
- රොබට් වෝල්පෝල් පළමුවෙනි අගමැති ලෙස සැලකීම

- රජවරුන් ඇමති මණ්ඩලයෙන් ඉවත් වීම නිසා ඇමතිවරුන් රැස් වී ගනු ලබන තීරණ රජුට දැන්වීමටත් රජු ඒවා අනුමත කිරීමට ත් පුරුදු වීමත් සමග කැබිනට් මණ්ඩල ක්‍රමය ශීඝ්‍රයෙන් වර්ධනය වීම
- මුල් වරට 1715 දී එක ම දේශපාලන පක්ෂයකින් කැබිනට් මණ්ඩලය සඳහා ඇමැතිවරුන් තෝරාපත් කොට ගැනීම ආරම්භ වීම
- රොබට් වෝල්පොල විසින් එය ආරම්භ කරන ලද අතර එමගින් කැබිනට් මණ්ඩලයේ සාමුහික වගකීම නමති මූලධර්මය ක්‍රියාත්මක වීම



එංගලන්ත පාර්ලිමේන්තුව



THE SIXTH ANNUAL CONFERENCE OF THE LABOUR PARTY.

පාර්ලිමේන්තු රැස්වීමක්

ඇගයීම් - 01

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නාම පද පහ බැගින් දී ඇත. ඉන් එකක් කුමන හේතුවක් නිසා හෝ නොගැලපේ. එම නොගැළපෙන පිළිතුර තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න**

1. 1) රැම්සේ මැක්ඩොනල්ඩ් 2) වින්ස්ටන් චර්චිල් 3) ජෝන් රසල්
   4) ඔලිවර් ක්‍රොම්වෙල් 5) ක්ලෙමන්ට් ඇට්ලි

   (...............)

2. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ බලය වර්ධනය සම්බන්ධයෙන් වැදගත් රජවරුන් කිහිප දෙනෙකුගේ නම් පහත දැක්වේ. ඒ අතරින් පාර්ලිමේන්තුවේ බලය වර්ධනයට දායක නොවූ රජු කවරෙක් ද?
   1) තුන්වෙනි ජෝර්ජ් 2) හතරවෙනි හෙන්රි 3) හත්වෙනි හෙන්රි
   4) අටවෙනි හෙන්රි 5) දෙවෙනි ජේම්ස්

   (...............)

3. දෙවන ලෝක යුද්ධ සමයේ බ්‍රිතාන්‍යයේ පිහිටුවන ලද ජාතික ආණ්ඩුවේ නායකත්වය හිමිවූයේ කවුරුන් හට ද?
   1) වින්ස්ටන් චර්චිල් 2) ජෝන් රසල් 3) ක්ලෙමන්ට් ඇට්ලි
   4) රැම්සේ මැක්ඩෝවල් 5) ස්ටැන්ලි බෝල්ඩ්වින්

   (...............)

**පහත ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

4. 1832 ප්‍රතිසංස්කරණ පනත අනුව සිදුවූ වෙනස් වීම් අයත් පිළිතුර වන්නේ,
   A. මධ්‍යම පාන්තිකයන්ට ඡන්ද බලය ලැබීම
   B. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වැටුප් ගෙවීම
   C. ජනගහනයෙන් 24%කට පමණ ඡන්ද බලය හිමි වීම
   D. රහස් ඡන්දය හඳුන්වා දීම

1) A හා C ය 2) B හා D ය 3) C හා E ය 4) C පමණි 5) සියල්ල ම ය

(...............)

5. එංගලන්තයේ සර්වජන ඡන්දබලය ක්‍රියාත්මක වූයේ,
   1) 1833 දීය 2) 1858 දීය 3) 1872 දීය 4) 1918 දීය 5) 1928 දීය

   (...............)

ඇගයීම් - 02

1. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පහත සඳහන් මාතෘකා ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.
   1. නියෝජන ක්‍රමය 2. පක්ෂ ක්‍රමය 3. කැබිනට් ක්‍රමය

   (ලකුණු 14)

2. දහ අට වන හා දහ නව වන සියවස්වල දී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයක් ලෙස විකාශනය වූ ආකාරය විස්තර කරන්න.

   (ලකුණු 14)

3. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය යටතේ අද දක්වා පක්ෂ ක්‍රමය විකාශනය වූ ආකාරය විස්තර කරන්න.

   (ලකුණු 14)

# 5. කාර්මික විප්ලවය

මිනිසා සිය දෑතේ සවියෙන් සුළු පරිමාණයෙන් ගෘහස්ථ ව පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම වෙනුවට යන්ත්‍ර සූත්‍ර භාවිතා කොට මහා පරිමාණයෙන් අලෙවිය සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමෙන් ඇති කළ පුළුල් වෙනස කාර්මික විප්ලවය නමින් හඳුන්වයි. කාර්මික විප්ලවය මඟින් ඇති වූ ආර්ථික, සමාජීය, දේශපාලන, සංස්කෘතික වෙනස්කම් යුරෝපයටත් පසු ව සෙසු මහද්වීපවලටත් බලපෑ ආකාරය අවබෝධ කිරීම මෙම ඒකකයේ මූලික අරමුණ යි.

**නිපුණතාව** : • ස්වාභාවික අභියෝගවලට මුහුණදීමේ දී මිනිසා අත්පත් කරගත් ජයග්‍රහණ තුලනාත්මක ව අවබෝධ කරගෙන ඒ අනුව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 5.1. ලෝකයේ ගමන් මඟ වෙනස් කිරීමට කාර්මක විප්ලවය බලපෑ ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.

**කාලච්ඡේද** : 20යි.

**ඉගෙනුම් පල** :
- කාර්මක විප්ලවය ඇති වීමට තුඩුදුන් පසුබිම සහ නව සොයාගැනීම් පිළිබඳ ව විග්‍රහ කරයි.
- කාර්මික විප්ලවයේ ප්‍රතිඵල පැහැදිලි කරයි.
- කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

5. කාර්මික විප්ලවය

- **කාර්මික විප්ලවයේ ආරම්භය**
  - කාර්මික විප්ලවය හඳුන්වාදීම
  - ජාතික රාජ්‍යවල පාලකයන් අනුගමනය කළ ප්‍රතිපත්ති කාර්මික විප්ලවයට අවශ්‍ය පසුබිම සකස් කිරීම
  - 16 වන සියවසේ සිට එංගලන්තයේ වෙළෙඳාම පුළුල් වීම කාර්මික විප්ලවයට හේතු වූ ආකාරය පෙන්වා දීම
  - කාර්මික විප්ලවය ඇතිවීමට ජන සංඛ්‍යාවේ ඇති වූ වර්ධනය මූලික හේතුවක් වීම

- **එංගලන්තය තුළ කාර්මික විප්ලවය ඇතිවීමට හේතු**
  - එංගලන්තය තුළ වැඩවසම් ක්‍රමය බිඳවැටී තිබීම හා දේශපාලන ස්ථාවර භාවය
  - ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමට පැවති නිෂ්පාදන ශිල්ප ක්‍රම ප්‍රමාණවත් නොවීම
  - රට තුළ ස්වාභාවික සම්පත් බහුල වීම
  - සම්පත් පුද්ගලයින් සිටීම හා ඔවුන්ට අනුග්‍රහ දැක්විය හැකි ධනවත් ව්‍යාවසායික පන්තියක් සිටීම
  - භූගෝලීය වශයෙන් රට කුඩා වීම, දිවයිනක් වීම හා රට අභ්‍යන්තරයේ දියුණු ප්‍රවාහණ පද්ධතියක් තිබීම
  - ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය නිසා රැකියා සොයා නගරයට ජනයා පැමිණීම හරහා මිනිස් ශ්‍රමය පහසුවෙන් ගත හැකි වීම
  - දියුණු බැංකු හා මූල්‍ය සමාගම් වර්ධනය වීම

- එංගලන්ත ආණ්ඩුව අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්ති
- අමුද්‍රව්‍ය හා අලෙවිය සඳහා විශාල වෙළෙඳපොලක් ලබා ගතහැකි වූ යටත්විජිතවලින් යුක්ත අධිරාජ්‍යයක් ගොඩ නැගීම
- එංගලන්තයේ කාර්මික විප්ලවය ප්‍රධාන වශයෙන් කර්මාන්ත තුනක් ඇසුරින් සිදුවිය

**පේෂ කර්මාන්තය**

ගෘහ ආශ්‍රිත කර්මාන්තයක් වශයෙන් පැවති පේෂ කර්මාන්තය යන්ත්‍ර සූත්‍ර හා වාෂ්ප බලය, වෙනත් ඉන්ධන වර්ග යොදා දියුණු වීම කාර්මික විප්ලවයේ දී සිදු විය. ඒ ඒ අවස්ථාවල ඇති වූ විවිධ දුෂ්කරතා ජය ගැනීම සඳහා නව සොයා ගැනීම් රාශියක් බිහි විය.

- ජෝන් කේ - දුවන නඩාව
- ජේම්ස් හාග්‍රිවුස් - ස්පිනිං ජෙනිය
- රිචඩ් ආක්‍රයිට් - ජල රාමුව
- සැමුවෙල් කොම්ප්ටන් - මියුල් යන්ත්‍රය
- එලී විට්නි - කොට්න් ජින්
- එලියස් හාවේ - රෙදි විවීමේ යන්ත්‍රය
- එඩ්මන්ඩ් කාට්රයිට් - බලවේග රෙදි වියන යන්ත්‍රය (පවර්ලූම්)

**යකඩ හා වානේ කර්මාන්තය**

එංගලන්තය තුළ කාර්මික විප්ලවය වේගවත් කිරීමට යකඩ හා වානේ කර්මාන්තයේ ඇති වූ දියුණුව බෙහෙවින් බලපෑවේ ය. ඒ සඳහා නව යන්ත්‍ර සූත්‍ර රාශියක් නිපදවනු ලැබී ය.

- ඒබ්‍රහම් ඩර්බි - 1709 ගල් අඟුරු යොදා යපස් උණු කිරීමෙන් වාත්තු කළ යකඩ නිපදවා ගැනීමේ ක්‍රමය
- හෙන්රි කෝට් - 1784 රෝලර් නම් යන්ත්‍රය
- හෙන්රි බෙසමර් - පහසුවෙන් යකඩ නිපදවීමේ ක්‍රමය
- විලියම් සීමන්ස් - එමලි සහ පෙරී මාටින්ස් යුවළ විවෘත උදුන් ක්‍රමය
- විලියම් සීමන්ස් - විදුලි උඳුන


**ගල් අඟුරු කර්මාන්තය**


යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්ධනයක් වශයෙන් ගල් අඟුරු යොදා ගැනීම කාර්මික විප්ලවයේ දියුණුවට බෙහෙවින් බලපෑවේ ය.

- තෝමස් නිව්කොමන් - 1712 වාෂ්ප එන්ජිම
- ජේම්ස් වොට් - වාෂ්ප එන්ජිම වැඩිදියුණු කිරීම
- හම්ප්‍රි ඩේවි - 1815 ආරක්ෂක ලාම්පුව
- 1835 යකඩ කේබල් කම්බි ක්‍රමය

- **කාර්මික විප්ලවය පැතිරුණු වෙනත් ක්ෂේත්‍ර**

  **කෘෂි කර්මාන්තය**
  - ඉඩම් කොටු කිරීම මගින් මහා පරිමාණ ගොවි බිම් බිහි වීම
  - යන්ත්‍ර සූත්‍ර කෘෂි කාර්මික ක්ෂේත්‍රයට යොදා ගැනීම
  - බෝග මාරු කිරීමේ ක්‍රමය (ශෂ්‍ය මාරු ක්‍රමය)
  - නව වගා ක්‍රම (පේළි වැපිරීමේ ක්‍රමය)
  - නව පොහොර වර්ග





වාෂ්ප එන්ජිම ආරක්ෂක ලාම්පුව

**ප්‍රවාහනය**

- රොබට් පුල්ටන් - 1807 දුම් බෝට්ටුව
- ජෝන් මැකඩම් - 1811 මැකඩම් ක්‍රමය
- හෙන්රි බෙල් - 1811 දුම් නැව
- ජෝර්ජ් ස්ටීවන්සන් - දුම්රිය එංජිම
- ඩේම්ලර් - 1885 මෝටර් රථය
- රයිට් සහෝදරයින් - 1903 ගුවන් යානය

**සන්නිවේදනය**

- 1840 - එංගලන්තය පෙනී තැපැල් සේවය
- 1844 - සැමුවෙල් මෝස් - විදුලි පණිවිඩ ක්‍රමය
- 1866 - සයිරස් ඩබ්ලිව් ෆීල්ඩ් - කේබල් ක්‍රමය
- 1876 - ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් - දුරකථනය
- 1899 - මාර්කෝනි - ගුවන් විදුලිය
  - ජෝන් ලොගී බෙයාඩ් - රූපවාහිනිය

- **කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය**

18 වන සියවසේ එංගලන්තය මුල් කරගෙන ඇති වූ කාර්මික විප්ලවය වැඩි කාලයක් යාමට පෙර යුරෝපා මහාද්වීපයටත් අමෙරිකා එක්සත් ජනපදයටත් ව්‍යාප්ත විය. ඉන් පසු ව ජපානය ඇතුළු ආසියා මහාද්වීපයේ සෙසු රටවලටත්, දකුණු ඇමෙරිකා, අප්‍රිකා මහාද්වීප කරාත් ව්‍යාප්ත විණි.

- කාර්මික විප්ලවයේ ප්‍රතිඵල

  - ගෘහාශ්‍රිත ව පැවති සුළු කර්මාන්ත බිඳ වැටී මහා පරිමාණ කර්මාන්ත බිහි වීම
  - කෘෂි කර්මාන්තය මත පැවති ආර්ථික ක්‍රමය කර්මාන්ත හා වෙළෙඳාම මත පදනම් වීම
    * මුදල් ආයෝජනය කළ හැකි විශාල ව්‍යාපාරික සංවිධාන බිහි වීම
    * ධනවාදී අර්ථ ක්‍රමය ස්ථාපිත වීම
    * නව අධිරාජ්‍යවාදයට මඟ පෑදීම

**සමාජීය**

- සමාජය තුළ ධනය ආයෝජනය කළ හැකි ධනපති පන්තිය හා ශ්‍රමය විකුණා ජීවත් වන නිර්ධන පන්තිය වශයෙන් පන්ති දෙකක් බිහි වීම හා එම පන්ති අතර අරගල ඇති වීම
- නාගරීකරණය
- පරිසර දූෂණය
- ගම් පාළු වීම, ඉඩම් අහිමි පුද්ගලයින් බිහි වීම හා සාම්ප්‍රදායික සමාජ සංස්ථා අවුල් වීම

**දේශපාලන**

- ප්‍රබල මධ්‍යම පනිතියක් බිහි වීම
- විවිධ දේශපාලන ආර්ථික දර්ශන බිහි වීම
  - රෝබට් ඕවන්ගේ සමාජවාදී ව්‍යාපාරය හා චාටිස්ට් ව්‍යාපාරය
  - මාක්ස්වාදී ව්‍යාපාරය සහ ජෙරමි බෙන්තම්ගේ උපයෝගිතා වාදය
  - ඇඩම්ස්මිත්ගේ රාජ්‍ය නිර්බාධවාදය
- වෘත්තීය සංගම් බිහි වීම
- අධිරාජ්‍යවාදය පුළුල් වීම



මහා පරිමාන කර්මාන්ත ශාලා

ඇගයීම - 01

**අංක 01 සිට 02 තෙක් ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතුරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් ඒවා සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම හඳුනාගෙන එහි අංකය තිත් ඉරි මත ලියන්න.**

1. 1. හෙන්රි ඩර්බි 2. හෙන්රි කෝට් 3. හෙන්රි බෙසමර් 4. මයිකල් සර්වේටස්
   5. විලියම් සීමන්ස්

(.................)

2. 1. හෙන්රි බෙල් 2. රොබට් පුල්ටන් 3. ඩෙම්ලර් 4. ජෝන් කැල්වින්
   5. ජෝන් මැකඩම්

(.................)

**අංක 03 ප්‍රශ්නය සඳහා යුගල පද පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක් දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**

3. 1. ජෝන් කේ - දුවන නඩාව
   2. ජේම්ස් හාග්‍රිම්ස් - රෙදි මැසීමේ යන්ත්‍රය
   3. රිචඩ් ආක්රයිට් - ජල රාමුව
   4. සැමුවෙල් ක්‍රොම්ප්ටන් - ස්පිනිං මියුල්
   5. එඩ්මන්ඩ් කාට්රයිට් - පවර්ලූම් යන්ත්‍රය

(.................)

**අංක 04 සහ 05 තෙක් සැම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු 05 බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

4. එංගලන්තය තුළ කාර්මික විප්ලවය ඇති වීමට හේතු
   1. එංගලන්තය තුළ වැඩවසම් ක්‍රමය බිඳවැටීම
   2. රට තුළ ස්වාභාවික සම්පත් තිබීම
   3. යටත්විජිතවලින් අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකි වීම
   4. භූගෝලීය වශයෙන් රට කුඩා වීම දූපතක් වීම
   5. ප්‍රංශ විප්ලවයේ බලපෑම් එංගලන්තයට පැමිණීම

(.................)

5. කාර්මික විප්ලවයේ වාසි
   1. නිෂ්පාදන අතිරික්ත විදේශ වෙළෙඳ පොළට යවා විශාල ලාභ ලැබීම
   2. රැකියා අවස්ථා බහුල වීම
   3. එංගලන්තයට විදේශ රටවලින් අධාර ගලා ඒම
   4. බැංකු මූල්‍ය ආයතනවල වර්ධනය
   5. ධනවාදී ආර්ථික ක්‍රමය ස්ථාපිත වීම

(.................)

ඇගයීම - 02

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර සපයන්න**

7. '' කාර්මික විප්ලවය හේතු කොටගෙන යුරෝපයේ තාක්ෂණ, ආර්ථික හා සමාජය යන ක්ෂේත්‍රවල මූලික පරිවර්තනයක් ඇති විය''.

i. කාර්මික විප්ලවය ආරම්භ වූ රට නම් කරන්න.

(ලකුණු 01)

ii. එය එම රටේ ඇති වීමට තුඩුදුන් හේතු තුනක් දක්වන්න.

(ලකුණු 03)

iii. පේෂ කර්මාන්තය හා සම්බන්ධ නව නිපැයුම් තුනක් නම් කරන්න.

(ලකුණු 03)

iv. ඉහත ප්‍රකාශයේ සඳහන් ක්ෂේත්‍රවල මූලික පරිවර්තනයක් ඇති කිරීමට කාර්මික විප්ලවය බලපෑ ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

8. පහත සඳහන් මාතෘකා යටතේ එංගලන්තයේ ඇති වූ කාර්මික විප්ලවය පිළිබඳව විස්තරයක් ලියන්න.

i. එංගලන්තයේ කාර්මික විප්ලවය ඇති වීමට ඉවහල් වූ පසුබිම
ii. කාර්මික විප්ලවය හා සම්බන්ධ ප්‍රධාන උත්පාදක
iii. එහි ආර්ථික හා සාමාජික ප්‍රතිඵල

(ලකුණු 14)

9. ආදර්ශ බ්‍රිතාන්‍ය සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම් කර ස්ථාන දෙකක ඓතිහාසික වැදගත්කම ලියන්න.

| | |
|---|---|
| 1. ලිවර්පූල් | 5. ස්කොට්ලන්තය |
| 2. මැන්චෙස්ටර් | 6. වේල්සය |
| 3. ලන්ඩන් | 7. උතුරු මුහුද |
| 4. තේම්ස් නදිය | 8. ඉංග්‍රීසි ඕඩය |

(ලකුණු 14)

## 6. අමෙරිකානු නිදහස් සටන

ස්වදේශික ගෝත්‍රිකයන් පලවා හරිමින් උතුරු අමෙරිකාවට සංක්‍රමණය වූ යුරෝපා ජාතීහු එහි ජනපද පිහිටුවා ගත්හ. ඒ අනුව අමෙරිකා මහාද්වීපය සොයා ගැනීමෙන් පසු ප්‍රධාන වශයෙන් ස්පාඤ්ඤය, එංගලන්තය, ප්‍රංශය නෙදර්ලන්තය, යන රටවල් උතුරු අමෙරිකාවෙහි තුළ ජනපද ගොඩනැඟීය.

උදාහරණ:- ස්පාඤ්ඤය - ප්ලොරිඩාව
ප්‍රංශය - නිව් ප්‍රාන්ස් (කැනඩා) හා ලුවිසියානා
බ්‍රිතාන්‍ය - ජනපද 13කි

වන්දනාකාර පියවරුන් නමින් හැඳින්වූ බ්‍රිතාන්‍ය සාංක්‍රමණික කණ්ඩායම උතුරු අමෙරිකාවට ගොස් එහි ජනපද පිහිටුවා ගත්හ. සිවිල් හා ආගමික වශයෙන් ස්වකීය මවු රජයෙන් ස්වාධීන ව සිටීමට බලාපොරොත්තු වූ ඔවුහු තමන් විසින් ගොඩනගන ලද ජනපද පාලනය සඳහා මේෆලවර් ගිවිසුම පදනම් කර ගනිමින් නව ආණ්ඩුක්‍රමයක් සැකසූහ. එංගලන්ත රජය අමෙරිකාවේ ඉංග්‍රීසි ජනපද වැසියන්ගෙන් අයබදු එකතු කිරීමට පියවර ගනු ගති. ඊට එරෙහි ව සටන් වැදුණු අමෙරිකානු ජනපද වැසියන් ''නියෝජිතයන් නැත්නම් බදුත් නැත'' යන සටන් පාඨය ඔස්සේ ජෝර්ජ් වොෂිංටන්ගේ නායකත්වයෙන් සටන් වැද එංගලන්තය පරදා 1776 අමෙරිකා එක්සත් ජනපදය නම් ස්වාධීන රාජ්‍ය පිහිටුවා ගත් ආකාරය පිළිබඳ අවබෝධය ලබා දීම මෙම පාඩම් ඒකකය මඟින් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව : ගනිමින්**
- සාමුහික ව ක්‍රියා කිරීමෙන් ජයග්‍රහණය අත්පත් කරගත හැකි බව අවබෝධ කර කටයුතු කරයි.

**නිපුණතා මට්ටම :**
6.1. අමෙරිකා මහාද්වීපයේ යුරෝපා ශිෂ්ටාචාරය පැතිර ගිය ආකාරය පරීක්ෂා කරයි.
6.2. අමෙරිකානු නිදහස් සටන ලෝක ඉතිහාසයේ වැදගත් වන ආකාරය විග්‍රහ කරයි.

**කාලච්ඡේද ගණන :-** 20

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

**අමෙරිකානු නිදහස් සටන**


- අමෙරිකා මහද්වීපය ජනාවාස වීම පිළිබඳ සාමාන්‍ය පිළිගැනීම වන්නේ 15 වන සියවසේ දී පමණ යුරෝප ජාතීන් එය සිදු කළ බවයි. අමෙරිකාවට සංක්‍රමණය වූ යුරෝප ජාතීන් එහි එවකට ගොඩනැගෙමින් තිබූ ශිෂ්ටාචාර සම්පූර්ණයෙන් ම පාහේ විනාශ කොට යුරෝපා ශිෂ්ටාචාරය කට අනුරූපී ව නව ශිෂ්ටාචාරයක් අමෙරිකානු ප්‍රදේශවල ගොඩනැඟීම
- කෙසේ නමුත් යුරෝප ජාතීන් අමෙරිකාව තුළ ජනාවාස පිහිටුවා ගත් අවධිය වන විට එම ප්‍රදේශවල ශිෂ්ටාචාරගත වූ මිනිසුන් සිටි බවට සාක්ෂ්‍ය ලැබීම
- පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් අමෙරිකාවේ මුල් පදිංචිකරුවන් පිළිබඳ ව තොරතුරු ලැබෙන අතර ඔවුන් බොහෝ සෙයින් පරිසර හිතකාමී පිරිසක් වීම. ඔවුන් උතුරු, දකුණු හා මධ්‍යම අමෙරිකා ප්‍රදේශවල ව්‍යාප්ත වී සිටීම
- යුරෝප ජාතීන් 15 වන සියවසේ දී අමෙරිකාවට ගොඩ බසින විට එහි සිටි ස්වදේශ ගෝත්‍ර ජනතාව පොදුවේ රතු ඉන්දියානුවන් ලෙස හැඳින්වීම
- මෙම රතු ඉන්දියානුවන් හෙවත් අමෙරිකානු මහාද්වීපවල ස්වාද්ශ ගෝත්‍ර ජනතාව විසින් ගොඩ නැගූ වැදගත් ශිෂ්ටාචාර කිහිපයක් තිබීම

- හෝප්වෙල් ගෝත්‍ර ශිෂ්ටාචාරය
- ඉරොක්කොයිස් ගෝත්‍ර ශිෂ්ටාචාරය
- පියුබ්ලෝ ගෝත්‍ර ශිෂ්ටාචාරය
- මායා ශිෂ්ටාචාරය
- ඉන්කා ශිෂ්ටාචාරය
- ඇස්ටෙක් ශිෂ්ටාචාරය

- මේ අතරින් මායා, ඉන්කා, ඇස්ටෙක්ස් ශිෂ්ටාචාර ඉතා ම දියුණු ශිෂ්ටාචාර වීම
- කෘෂිකර්මාන්තය දියුණු තත්ත්වයක පැවතීම
- මංමාවත්, විවිධ ශිලා නිර්මාණ හා ගෘහ නිර්මාණ පැවතීම



අන්දීස් කඳු ආශ්‍රිත ව ගොඩනඟා ඇති ඉන්කා ශිෂ්ටාචාරය සහ මාර්ග



වගා බිම් හා වගා කළ ආකාරය



වගා බිම් අත්හදා බලන ලද ස්ථානයක්



පාලමක්

**යුරෝපා ජාතීන් අමෙරිකාවට සංක්‍රමණයවීමට හේතු**

- ක්‍රි.ව. 1453 ඔටෝමන් තුර්කිවරුන් විසින් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීමත් සමඟ යුරෝපා ජාතීන්ට පෙරදිග සමඟ තිබුණු වෙළෙඳ සබඳතා මඟහැරීයාම නිසා ඔවුහු පෙරදිගට පැමිණීමට නව මාර්ග සොයා ගියහ. එහි ප්‍රතිඵලයක් ලෙස ඇමරිකාවට සංක්‍රමණය විය. ඒ අනුව බටහිර ජාතීන් ඇමෙරිකාවෙහි ජනපද පිහිටුවීම සඳහා තුඩුදුන් හේතු කිහිපයක් ඇත.

**දේශපාලන හේතු**

- යුරෝපයේ ජාතික රාජ්‍ය බිහි වීම
- ජාතික රාජ්‍යවල මධ්‍යම පන්තිය බලවත් වීම
- ජාතික රාජ්‍යවල පාලකයන් දේශගවේශකයන්ට අනුග්‍රහ දක්වීම
  - ස්පාඤ්ඤ - පර්ඩිනඩ් ඉසබෙලා යුවළ
  - ප්‍රංශය - හතර වන හෙන්රි
  - පෘතුගාලය - නාවික හෙන්රි
  - එංගලන්තය - 7 වන හෙන්රි රජවරු, 1 වන එලිසබෙත් රැජිනි, 1 වෙනි සහ 8 වෙනි හෙන්රි

**ආර්ථික හේතු**

- වාණිජවාදී අදහස් ව්‍යාප්ත වීම
- රටට හිතකර වෙළෙඳ ශේෂයක් පවත්වාගෙන යාම ගනරන්වාදය වැනි ලක්ෂණ වාණිජවාදයේ ප්‍රධාන ලක්ෂණ විය.
- මේ කරුණු ඉටු කර ගැනීම සඳහා රටවල් අල්ලා ගැනීමට පෙලඹවීම
  උදා:- 16 සියවසේ දී ස්පාඤ්ඤය, දකුණු හා මධ්‍යම ඇමරිකානු ප්‍රදේශ අල්ලා ගන්නේ ඒවායේ රන් රිදී බහුල ව තිබීම නිසා ය.

**ආගමික හේතු**

- 16 වන සියවසේ ඇති වූ ආගමික විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් විවිධ ආගමික නිකාය අතර ගැටීම් ඇති වීම
- එයින් පීඩාවට පත් ජනතාව නිදහස පතා ඇමෙරිකානු ප්‍රදේශවලට යාම
  උදාහරණ:
- එංගලන්තයේ 8 වන හෙන්රි රජු රෙපරමාදු ආගමය වැලඳ ගැනීම
- කතෝලික භක්තික මේරි ටියුඩර් රෙපරමාදුවාදීන්ට හිරිහැර කිරීම වැනි කරුණු නිසා එංගලන්ත ජනතාව ආගමික නිදහස පතා ඇමෙරිකාවට යාම
- රෝමානු කතෝලික ආගමය පිළිගත් රාජ්‍යයක් වූ ස්පාඤ්ඤය ආගමය ආරක්ෂා කිරීමට හා ව්‍යාප්ත කිරීමට මහත් වෙහෙසක් දැරූ අතර නව ලෝකයේ ප්‍රදේශවල රෝමානු කතෝලික ආගමය ව්‍යාප්ත කිරීමේ අභිලාසය

**ඇමෙරිකාවෙහි ජනපද පිහිටුවා ගත් යුරෝපා ජාතීහු**

**ස්පාඤ්ඤය**

- 1942 සිට කැරිබියානු දූපත් යටත් කරමින් ඇමරිකාවේ ජනපද පිහිටුවීම ආරම්භ කළ ස්පාඤ්ඤ ජාතිකයන් ඇමරිකාවේ විශාල අධිරාජ්‍යයක් ගොඩනැගීම
- වර්තමාන ඇමරිකා එක්සත් ජනපදයේ ප්ලොරිඩා, ටෙක්සාස්, කැලිෆෝනියා, නිව් මෙක්සිකෝ, ඇරිසෝනා, ඔක්ලහෝමා ආදි ප්‍රාන්තවලට අයත් ප්‍රදේශ ස්පාඤ්ඤය විසින් යටත් කරනු ලැබීම
- දකුණු ඇමරිකාවේ පීරු, මෙක්සිකෝ, ආදි ප්‍රදේශ ස්පාඤ්ඤ අධිරාජ්‍යයට යටත් වීම

ප්‍රංශය

- ලෝම වෙළෙඳාම සඳහා උතුරු ඇමෙරිකාවේ ජනපද ආරම්භ කළ ප්‍රංශ ජාතිකයන් 1500-1700 අතර කාලයේ ජනපද පිහිටුවා ගැනීම
- ශාන්ත ලෝරන්ස් ගංගාවේ සිට මිසිසිපි ගංගා මුවදොර දක්වා ප්‍රදේශ ප්‍රංශ ජාතිකයන් සතු වීම

- **එංගලන්තය යටතේ ජනපද පාලනය වූ ආකාරය**

- බ්‍රිතාන්‍ය කිරීටයට හා පාර්ලිමේන්තුවට ජනපද පාලනය කිරීම සඳහා විශාල බලයක් තිබීම
- එංගලන්තයේ මහ රජු විසින් පත් කරන ලද ආණ්ඩුකාරයකු හා උපදේශක මණ්ඩලයක් මඟින් පාලනය වීම
- පාලන කටයුතු සම්බන්ධයෙන් යටත් විජිත වාසීන් සැහෙන ස්වාධීනත්වයක් භුක්ති විඳීම
- ආර්ථික වශයෙන් ජනපද වාසීන්ට ස්වාධීනත්වයක් නොතිබීම.
- බ්‍රිතාන්‍යයන් උතුරු ඇමෙරිකාවේ ජනපද තම නිෂ්පාදන සඳහා අමු ද්‍රව්‍ය ලබා දෙන ප්‍රදේශ වශයෙන් හා තම කාර්මික නිෂ්පාදන අලෙවි කොට ලාභ ලබාගත හැකි හොඳ වෙළෙඳ පොළක් වශයෙන් සැලකීම

  උදාः- බ්‍රිතාන්‍යයේ රෙදිපිළි නිපදවීමට අවශ්‍ය කපු වැවීමට සහ සිගරට් නිෂ්පාදනයට අවශ්‍ය දුම්කොළ වැවීමට අනුබල දුන් නමුත් එම ද්‍රව්‍ය යොදා කර්මාන්ත ආරම්භ කිරීම තහනම් කිරීම. ඒවා යොදා කර්මාන්ත ආරම්භ කළේ එංගලන්තයේ ය.
- එම අමු ද්‍රව්‍ය සියල්ල එංගලන්තයට අලෙවි කළ යුතු වීම සහ එංගලන්තය ඒවායේ මිල නියම කිරීම
- නාවික නීති, තීරු බදු ආදිය මඟින් ජනපදවල ආර්ථික ස්වාධීනත්වය සීමා කිරීමට බ්‍රිතාන්‍යයන් කටයුතු කිරීම
- ජනපදවාසීන් භාණ්ඩ ප්‍රවාහණය කිරීමේ දී බ්‍රිතාන්‍යට අයිති නැව් පමණක් භාවිත කිරීම නාවික නීති මඟින් නියම කර තිබිණි.
- නැව් මඟින් භාණ්ඩ ප්‍රවාහණයේ දී එම නීති රීති දැඩි ලෙස ක්‍රියාත්මක නොවීම

- **ඇමරිකානු නිදහස් සටන**

- උතුරු අමෙරිකාවේ අත්ලන්තික් වෙරළ බඩ ප්‍රදේශවල පිහිටා තිබූ බ්‍රිතාන්‍ය ජනපද දහතුන එක්ව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලබා ගැනීම සඳහා ගෙන ගිය සටන් ව්‍යාපාරය අමෙරිකානු නිදහස් සටන නම් වේ.
- උතුරු දේශසීමාවේ පිහිටි ප්‍රංශ ජාතිකයන්ගෙන් හා බටහිර දෙසින් සිටි රතු ඉන්දියානුවන්ගෙන් ද නිරන්තර තර්ජන එල්ල විය. එම තර්ජනවලින් ජනපද වාසීන් ආරක්ෂා වූයේ, බ්‍රිතාන්‍ය මවුරජයෙන් ලැබුණු ආධාරවලිනි. බ්‍රිතාන්‍ය යටත් විජිත ප්‍රතිපත්තියේ වෙනසක් සිදුවූයේ, 1756-1763 දක්වා ප්‍රංශය සමඟ පැවති සත් අවුරුදු යුද්ධයෙනි. ප්‍රංශය පරාජය කර ජය ගැනීමත් සමඟ 1763 සිට බ්‍රිතාන්‍ය යටත් විජිත ප්‍රතිපත්තිය වඩාත් දැඩි කරන ලදි.

- **ඇමෙරිකානු නිදහස් සටනට හේතු**
  **බ්‍රිතාන්‍ය වාණිජවාදී ප්‍රතිපත්ති**

- බ්‍රිතාන්‍ය රජය විසින් ජනපද පාලනය සඳහා ආණ්ඩුකාරවරුන් පත් කරනු ලැබ තිබිණි. එම ආණ්ඩුකාරවරුන්ට වේතන ගෙවිය යුතු වූයේ, ජනපදවල භාණ්ඩාගාරයෙනි. බ්‍රිතාන්‍ය වෙළෙඳුන්ට මෙන් ම බ්‍රිතාන්‍ය රජයට ද ලාභ ලැබෙන අන්දමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සිය අභිමතය පරිදි සකස් කළ ප්‍රතිපත්තියක් ඇමෙරිකාවේ ජනපදවල ක්‍රියාත්මක විය. ඇමෙරිකාවේ ජනපදවල ආනයන හා අපනයන කටයුතු බෙහෙවින් සීමා කළ නීති රීති මාලාවක් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබීය.

  උදහරණඃ විදේශීය භාණ්ඩ මිලදී ගැනීමේ දී පවා පළමු ව එංගලන්තයේ වරායකට ගෙන ගොස් එහි දී තීරු බදු ගෙවා නැවත ඇමෙරිකානු ජනපද කරා ගෙනයාමට නියම කිරීම

එංගලන්තයේ නිෂ්පාදනවලට තරගයක් එල්ල වන අන්දමේ භාණ්ඩ ඇමෙරිකාවේ නිපදවීම තහනම් කිරීම
අමෙරිකානු ජනපදවල වෙළෙඳ ද්‍රව්‍ය ඉංග්‍රීසීන්ට පමණක් අලෙවි කළ යුතු බවට නියම වීම

- ප්‍රංශය හා එංගලන්තය අතර පැවති සත් අවුරුදු යුද්ධයට අධික වියදමක් දැරීම හේතුවෙන් බ්‍රිතාන්‍ය භාණ්ඩාගාරය බෙහෙවින් සිඳීගොස් තිබිණි. එමෙන් ම අලුතින් එකතු වූ ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ පාලනය කිරීම සඳහා අතිරේක වශයෙන් අධික වියදමක් දැරිය යුතු නිසා බ්‍රිතාන්‍යට අලුත් ආදායම් මාර්ග සලසා ගත යුතු විය. ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග කිහිපයකි.
  * තීරු බදු වැඩි කිරීම
  * නාවික අණපණත් දැඩි ව ක්‍රියාත්මක කිරීම

- සත් අවුරුදු යුද්ධයේ ජයග්‍රහණයෙන් පසු 1763 එංගලන්ත පාර්ලිමේන්තුව ජනපදවල පාලනය ක්‍රමවත් කිරීම
- යුද්ධය සඳහා ගිය වියදම්වලින් කොටසක් ජනපද වාසීන්ගෙන් අය කළ යුතු බව බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ අදහස විය. ඒ වන විටත් මහාද්වීපයේ දී සිදුවන යුධ කටයුතු සඳහා වියදම් ද, හමුදාව ද ජනපදවාසීන් සපයන නිසා තව දුරටත් ඔවුන්ගෙන් බදු අය නොකළ යුතු බව යටත් විජිත වාසීන්ගේ මතය විය.
- කෙසේ වෙතත් මෙතෙක් කල් දැඩි ව ක්‍රියාත්මක නොකළ වාණිජවාදී නීති රීති දැඩිව ක්‍රියාත්මක කිරීමට බ්‍රිතාන්‍ය රජය පියවර ගැනීම. තුන්වෙනි ජෝර්ජ් රජු ඇමෙරිකානු ජනපදවලින් බදු අය කර ගැනීමට පාර්ලිමේන්තු අනුමතිය ලබා ගැනීම. ඒ අනුව ගත් ක්‍රියාමාර්ග කිහිපයකි
  * ජනපදවාසීන් මර්දනය කිරීමට බ්‍රිතාන්‍ය නිලධාරීන්ට උපදෙස් දීම
  * ජනපද 13න් හෝ බටහිර දේශ සීමාවෙන් හෝ ඔබ්බට ව්‍යාප්ත වීම ජනපදවාසීන්ට තහනම් කිරීම
  * ජනපදවල ආරක්ෂාවට බව කියමින් ඇමෙරිකාවට යුද්ධ හමුදා යැවීම සහ ඒවායේ වියදම දැරීම යටත් විජිත විසින් කළ යුතු බව නියම කිරීම

- මෙම නීති රීති පැනවූයේ ජනපදවාසීන් බටහිර දෙසට ව්‍යාප්ත වීමෙන් රතු ඉන්දියානුවන් කුපිත වීමට ඉඩ ඇති බැවිනි. මෙම තහනම කුඩා ඉඩම් හිමියන්ට හා ලෝම වෙළඳුන්ට අවාසියක් වූ බැවින් ඔවුන් බ්‍රිතාන්‍ය පාලනය සමඟ අමනාප වීම

- ජනපදවාසීන් විසින් ආනයනය කරනු ලබන උක් පැණි වෙනුවෙන් බද්දක් ගෙවීමට නියම කිරීමට පනතක් ගෙන එන ලදි . 1764 පනවන ලද මෙම පනත සීනි පනත නම් විය. එම පනත දැඩි ව ක්‍රියාත්මක කිරීමනිසා ජනතාව එයට විරුද්ධ ව නැඟී සිටීම
  * ජනපද ප්‍රදේශවල නවතා තිබූ බ්‍රිතාන්‍ය හමුදාවේ නඩත්තුව සඳහා යන වියදම් දරණ ලෙස බ්‍රිතාන්‍ය ආණ්ඩුව ජනපද වලට බල කර සිටීම නිසා ද ජනපද වාසීන්ගේ සේවය තව දුරටත් වැඩි වීම

- 1765 දී බ්‍රිතාන්‍ය අගමැති වූ ජෝර්ජ් ග්‍රෙන්විල් මුද්දර පනත මඟින් අලුත් බදු ක්‍රමයක් හඳුන්වා දෙන ලදි.
  - එමඟින් ඔප්පු, පුවත්පත් හා අනෙකුත් නීත්‍යානුකූල ලියකියවිලි වෙනුවෙන් ගෙවිය යුතු මුද්දර බද්දක් පැනවීම
  - ඇමෙරිකාවේ ජනපදවලින් බදු අය කිරීමට එංගලන්ත පාර්ලිමේන්තුවට ඇති අයිතිය පිළිබඳ ව ජනපද වාසීන් ප්‍රශ්න කිරීම
  - ''නියෝජිතයෝ නැත්නම් බදුත් නැත'' යන සටන් පාඨය මුල් කරගෙන බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධ ව සටන් කිරීමට තීරණය කිරීම
  - විරෝධතා නිසා 1776 දී මුද්දර පනත අවලංගු කිරීම

- 1767 ටවුන්ඩ්සෙන්ඩ් පනත

  - විලියම් පිට් අගමැති ප්‍රමුඛ ඇමති මණ්ඩලයේ භාණ්ඩාගාර ලේකම් ධුරයට පත් චාල්ස් ටවුන්ඩ්සෙන්ඩ් නව බදු අය කිරීමට තීරණය කිරීම
  - බ්‍රිතාන්‍ය පාර්ලිමේනතුව ජනපද වාසීන්ගෙන් වීදුරු, ටින්, සායම් වර්ග, කඩදාසි, තේ වෙනුවෙන් බදු අය කිරීමට යෝජනා කිරීම
  - ජනපදවාසීන් එකතු  වී එම බදුවලට විරුද්ධ වීම
  - ජනපදවාසීන් අතර ගොඩනැගෙමින් තිබූ එක්සත්කම බිඳ හෙළීම සඳහා තේ බද්ද හැර අනෙකුත් සියල බදු අවලංගු කිරීම. (මේ බද්ද ඉතිරි කළේ, ජනපද වාසීන්ගෙන් බදු අය කිරීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට නීත්‍යානුකූල අයිතියක් ඇති බව දක්වීමේ සංකේතයක් වශයෙනි.
  - බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය කොට දේශීය භාණ්ඩ නිපදවා ගැනීමේ උද්‍යෝගයක් ජනපද වාසීන් තුළ ගොඩනැගීම
  - නිව්යෝර්ක් ජනපදයේ ව්‍යවස්ථාදායක මණ්ඩලය අත්හිටුවීමට තීරණය කිරීම

- බොස්ටන් තේ සාදය (1773 දෙසැම්බර් 16)



බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව තේ බද්ද අවලංගු නොකිරීම නිසා විරුද්ධ වූ ජනපද වාසීන් බොස්ටන් වරායේ දී පෙරදිග ඉන්දියානු වෙළෙඳ සමාගමේ නැව්වලට නැඟුණු සැමුවෙල් ඇඩම්ස් ඇතුළු පිරිස් ඒවායේ තිබූ තේ පෙට්ටි මුහුදට විසි කිරීම. මෙම සිද්ධිය ආරංචි වූ වහාම සෙසු වරායවල තිබූ තේ තොගවලට ද මෙම ඉරණම ම අත් වූ  අතර මෙය යුද්ධය ආරම්භ වීමට සමීපත ම හේතුව විය.

මෙයට ප්‍රතිචාර වශයෙන් තුන්වන ජෝර්ජ් රජු හා ඔහුගේ උපදේශක නොර්ත් සාමි විසින් ක්‍රියාමාර්ග කීපයක් ගනු ලැබී ය.

- බ්‍රිතාන්‍ය රජය විසින් බොස්ටන් වරාය වසා දැමීම හා ජනපදය තුළ ප්‍රසිද්ධ රැස්වීම් තහනම් කිරීම
- අපරාධ චෝදනා ලැබූ ජනපද වාසීන්ගේ නඩු එංගලන්තයේ දී විසඳීම
- මැසචුසෙට්ස් ජනපදයට ලබා දී තිබූ වරදාන පත්‍රය අවලංගු කිරීම

- **ප්‍රථම මහාද්වීපික සම්මේලනය (1774)**

බ්‍රිතාන්‍ය පාලකයන්ගේ දැඩි ක්‍රියාමාර්ගයට විරුද්ධ ව තීරණයක් ගැනීම සඳහා වර්ජිනියාවේ ව්‍යවස්ථාදායක මණ්ඩලය මහාද්වීපික සම්මේලනයක් කැඳවීම සඳහා ප්‍රථම පියවර ගත්තේය. පළමු මහාද්වීප සම්මේලනය 1774 දී සැප්තැම්බර් ෆිලඩෙල්ෆියාවේ රැස් විය. ජෝර්ජියාව හැර සෙසු සියලු ජනපදවල නියෝජිතයෝ එයට සහභාගි වූහ. ජොර්ජ් වොෂිංටන්, ජොර්ජ් ඇඩම්ස්, සැමුවෙල් ඇඩම්ස්, ජෝන් ජේ ආදී ඇමෙරිකානු ජනපද ඉතිහාසයේ කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටු කළ නායකයෝ කීප දෙනෙක් මේ සඳහා සහභාගී වූහ. එහි දී

- ජනපදවාසීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයක් සම්මත කර ගැනීම
- මහාද්වීපික සංගමය නම් සංවිධානයක් පිහිටුවීම
- නායකයා ලෙස ජෝර්ජ් වොෂිංටන් පත් කර ගැනීම
- මහද්විපික සම්මේලනයේ තීරණ අනුව ජනපදවාසීන් සටනට සූදානම් වීම
  ඒ අනුව,
- බ්‍රිතාන්‍යයන් හා ජනපදවාසීන් අතර 1775 දී ලෙක්සින්ටන් නම් ස්ථානයේ දී ප්‍රථම සටන ආරම්භ විම
- 1775 ජනපද සියල්ලේ නියෝජිතයන් රැස් වී මුදල් අච්චු ගැසීමටත් ජෝර්ජ් වොෂින්ටන් යටතේ යුද්ධ හමුදාවක් සංවිධානය කිරීමටත් තීරණය කිරීම

- **නිදහස ප්‍රකාශ කිරීම (1776 ජූලි 04)**

- 1776 ජූලි 4 ඇමෙරිකානුවන් නිදහස් ප්‍රකාශනය නමින් ප්‍රකාශනයක් නිකුත් කිරීම
  * මෙයින් ඇමෙරිකානුවන් නිදහස් ජාතිකයන් ලෙස පිළිගැනීම ආරම්භ වීම
  * ජෝර්ජ් වොෂිංටන්ගේ නායකත්වය යටතේ යුද්ධය ආරම්භ වීම
  * ශ්‍රීමත් විලියම් හාවේගේ හමුදා අතින් රෝඩ් අයිලන්ඩ් නම් ස්ථානයේ දී ජනපද හමුදා පරාජය වීම හා නිව්යෝක් නගරය බ්‍රිතාන්‍යන් සතු වීම
  * ෆිලඩෙල්ෆියා ප්‍රදේශය ද බ්‍රිතාන්‍යයන් සතු වීම

- දෙවන සම්මේලනයේ දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස් වීමට තීරණය කිරීම
- සත් අවුරුදු යුද්ධයෙන් පරාජය වූ ප්‍රංශය බ්‍රිතාන්‍යයෙන් පළිගැනීමේ අරමුණ ඇති ව 1778 දී ජනපද වාසීන්ට අධාර ලබා දීම
- ප්‍රංශයෙන් මුදල් ආධාර, ස්වේච්ඡා හමුදා ආධාර හා නාවික ආධාර දී ලැබීම නිසා ජනපද වාසීන් ශක්තිමත් වීම
- 1779 දී ස්පාඤ්ඤය හා ඕලන්දය ද බ්‍රිතාන්‍යයට විරුද්ධ ව සටනට මැදිහත් වීම
- 1781 දී බ්‍රිතාන්‍ය හමුදා මෙහෙයවූ කොන්වෝලිස්යෝර්ක් ටවුන් හි දී වොෂිංටන් හමුදාවට යටත් වීම

- **ජනපදිකයන්ගේ ජයග්‍රහණයට හේතු**

- ඇමෙරිකාව හා එංගලන්තය අතර දුර ප්‍රමාණය විශාල වීම
- ජෝර්ජ් වොෂිංටන්ගේ දක්ෂ නායකත්වය
- ජනපදවාසීන් ගරිල්ලා සටන්වල දක්ෂයන් වීම හා ඉංග්‍රීසි යුද්ධ සෙනෙවියන්ට එම සටන් ක්‍රම පිළිබඳ දක්ෂතා නොතිබීම
- ප්‍රංශය, ස්පාඤ්ඤය වැනි රටවල් එංගලන්තයට විරුද්ධ ව ජනපදවාසීන්ට අධාර දීම
- රුසියාව, ස්වීඩනය අදි අනෙකුත් යුරෝපීය රටවල් ද එංගලන්තට විරුද්ධ ව මධ්‍යස්ථ බල මණ්ඩලයක් ඇරඹීම
- බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අනෙක් ප්‍රදේශවල ද ආණ්ඩු විරෝධී සටන් ඇරඹීම

- **නිදහස ලැබීම හා නව ආණ්ඩුක්‍රමයක් සම්මත කර ගැනිම**

  - 1783 දී බ්‍රිතාන්‍ය ජනපද දහතුන නිදහස නීත්‍යානුකූල ව පිළිගනිමින් පැරිස් ගිවිසුම අස්සන් කිරීම.
  - කැනඩාවේ දකුණු සීමාවේ සිට ප්ලොරිඩාවේ උතුරු සීමාව තෙක් ද අත්ලාන්තික් සාගරයේ සිට රට අභ්‍යන්තරයේ මිසිසිපි ගඟ තෙක් ද පැතිර පවතින ප්‍රදේශය අමෙරිකා එක්සත් ජනපදය නමින් හැඳින්වීම
  - 1787 දී නිදහස් වූ අමෙරිකානුවන් පිලඩෙල්ෆියා සම්මේලනයේ දී නව ආණ්ඩුක්‍රමයක් සකස් කිරීම
  - රාජාණ්ඩු ක්‍රමයට සහ පාර්ලිමේන්තු ක්‍රමයට වෙනස් වූ ක්‍රමයක් තෝරාගෙන විධායක ජනාධිපති ක්‍රමය නමින් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ගොඩ නැන්වීම.
  - අමෙරිකානු නිදහස් සටන නූතන යුගයේ සිදු වූ ප්‍රථම ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය ලෙස ලෝක ඉතිහාසයේ ස්ථානයක් හිමි වීම
  - ලෝකයේ බලසම්පන්න රාජ්‍යයක් වන අමෙරිකා එක්සත් ජනපදයේ උපත සිදු වීම



අමෙරිකා එක්සත් ජනපදය



ඇගයීම - 01

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න**

1. අමෙරිකා මහද්වීපයේ ජනපද පිහිටුවූ යුරෝපා ජාතීන් නොවන්නේ,
   1. ස්පාඤ්ඤය 2. පෘතුගීසි 3. ඉංග්‍රීසි 4. ප්‍රංශ 5. ස්විට්සර්ලන්තය

(...............)

2. අමෙරිකානු මුල් ජනපද දහතුනට අයත් නොවන්නේ
   1. ජෝර්ජියා 2. නිව් ජර්සි 3. ඩෙලවෙයාර් 4. වර්ජිනියා 5. කැලිෆෝනියා

(...............)

3. අමෙරිකානුවන් නිදහස් ප්‍රකාශනය නිකුත් කළ වර්ෂය
   1. 1776 2. 1774 3. 1765 4. 1779 5. 1781

(...............)

4. බ්‍රිතාන්‍ය ජනපද දහතුන නිදහස නීත්‍යානුකූල ව පිළිගනිමින් අස්සන් කළ ගිවිසුම
   1. ප්‍රාග් ගිවිසුම 2. ලුබෙක් සාම ගිවිසුම 3. පැරිස් සාම ගිවිසුම
   4. වෙස්ට්ෆේලියා ගිවිසුම 5. එමියන්ස් ගිවිසුම

(...............)

5. අමෙරිකානු නිදහස් සටනට නායකත්වය සැපයූවේ,
   1. ලින්කන් 2. මොන්රෝ 3. වොෂිංටන් 4. ජෙෆර්සන් 5. ජැක්සන්

(...............)

6. පහත ප්‍රකාශ අතරින් එංගලන්තය යටතේ අමෙරිකානු ජනපද පාලනය වූ ආකාරය පිළිබඳ නිවැරදි පිළිතුර වන්නේ මින් කුමක් ද?
   A. බ්‍රිතාන්‍ය කිරීටයට හා පාර්ලිමේන්තුවට ජනපද පාලනය කිරීම සඳහා විශාල බලයක් තිබීම
   B. ජනපද වාසීන් පාලන කටයුතු සම්බන්ධයෙන් ස්වාධීනත්වයක් ලැබීම
   C. ජනපද පාලනය සඳහා පත් කරන ලද උපදේශක මණ්ඩලයට අමෙරිකානුවන් ඇතුළත් වීම
   D. ජනපද වාසීන්ට ආර්ථිකය වශයෙන් ස්වාධීනතාවයක් නොතිබීම

   1) A, B හා C 2) B, C හා D 3) A, B හා D 4) සියල්ල ම (................)

7. පහත ප්‍රකාශ අතරින් අමෙරිකාව තුළ ක්‍රියාත්මක බ්‍රිතාන්‍ය වාණිජවාදී ප්‍රතිපත්ති ඇතුළත් පිළිතුර කුමක් ද?

   A. අමෙරිකානු ජනපදවල වෙළෙඳ ද්‍රව්‍ය බ්‍රිතාන්‍යයට පමණක් අලෙවි කළයුතු වීම
   B. බ්‍රිතාන්‍ය නිෂ්පාදනවලට තරගකාරී ව කිසි ම භාණ්ඩයක් අමෙරිකාව තුළ නිෂ්පාදනය නොකළ යුතු වීම
   C. අමෙරිකාවට ගෙන්වන ලද බ්‍රිතාන්‍ය භාණ්ඩවලට හැර වෙනත් රටවලින් භාණ්ඩ සඳහා අධික තීරු බදු ගැනීම
   D. නව බදු පැනවීම

   1) A, B හා C 2) B, C හා D 3) A, B හා D 4) D, B හා C 5) සියල්ල ම

(................)

ඇගයීම - 02

**පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

1. අමෙරිකානු නිදහස් සටන ඇති වීමට තුඩු දුන් ප්‍රධාන සාධක පැහැදිලි කොට එම සටනේ වැදගත්කම සැකෙවින් විමසන්න.
(ලකුණු 14)

2. ''අමෙරිකානු නිදහස් සටන අමෙරිකාව සම්බන්ධයෙන් පමණක් නොව යුරෝපය සම්බන්ධයෙන් ද දැඩි බලපෑමක් ඇති කළේ ය''.
   (i) අමෙරිකානු නිදහස් සටනේ නායකයා නම් කරන්න (ලකුණු0 1)
   (ii) අමෙරිකානු නිදහස් සටනේ ප්‍රධාන පාඨය වූයේ කුමක්ද? (ලකුණු 01)
   (iii) අමෙරිකානු නිදහස් සටනට තුඩු දුන් ආර්ථික හා දේශපාලන සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 04)
   (iv) ඇමරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත ප්‍රකාශය පරීක්ෂා කරන්න (ලකුණු 08)

3. ''අමෙරිකානු නිදහස් සටනට දේශපාලන හා ආර්ථික යන සාධක හේතු විය''
   (i). එංගලන්ත රජුගේ අනුග්‍රහය යටතේ 1497 දී නිව්ෆවුන්ඩ්ලන්තයට පැමිණි යාත්‍රිකයා නම් කරන්න. (ලකුණු 01)
   (ii). එංගලන්ත ජනයා උතුරු අමෙරිකාවට සංක්‍රමණය වීමට හේතු වූ කරුණු දෙකක් දක්වන්න. (ලකුණු 02)
   (iii). උතුරු අමෙරිකාවේ නැගෙනහිර වෙරළබඩ පිහිටුවන ලද ඉංග්‍රීසි ජනපද තුනක් නම් කරන්න. (ලකුණු 03)
   (iv). ඉංග්‍රීසි ආණ්ඩුව විසින් උතුරු ඇමරිකාවේ අනුගමනය කරන ලද යටත් විජිත ප්‍රතිපත්තිය කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මක ව විමසන්න. (ලකුණු 08)

4. (i). අමරිකානු නිදහස් සටන ඇති වීමට තුඩුදුන් ප්‍රධාන සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 08)
   (ii). අමරිකානුවන්ගේ ජයග්‍රහණයන්ට බලපෑ හේතු විස්තර කරන්න. (ලකුණු 06)

5. ලෝක සිතියමක යුරෝපා ජාතීන් විසින් අමෙරිකාවේ පිහිටුවා ගන්නා ලද ජනපද ලකුණු කරන්න.
(ලකුණු 18)

# 7. ප්‍රංශ විප්ලවය

1789 දී ප්‍රංශයේ දූෂිත පාලනයට එරෙහි ප්‍රංශ වැසියන් විසින් කළ සටන ප්‍රංශ විප්ලවය ලෙස හඳුන්වයි. එම විප්ලවය දෙස බැලීමේ දී එය එක්වර ම පැන නැඟුණක් නොව වසර ගණනාවක් පුරා වර්ධනය වූවක් ලෙස සැලකිය හැකි ය. එය ප්‍රංශයේ දේශපාලන, ආර්ථික, සමාජ යන සෑම අංශයක ම පිරිහීම හේතුවෙන් හටගත්තකි. නිදහස, සමාත්මතාව, සහෝදරත්වය, යන සටන් පාඨ ඔස්සේ සංවිධානය වූ මෙම විප්ලවය මඟින් දහසය වන ලුවී රජුගේ ඒකාධිපති රාජාණ්ඩුව බිඳ දමා ඇති කර ගත් ජනතා ජයග්‍රහණයකි. ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල ලෙස බිහි වූ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය පසුකාලීන ව ලෝකයේ බොහෝ රටවල් ආදර්ශයට ගැනීම මඟින් මෙම විප්ලවය ලෝක ඉතිහාසයේ සුවිශේෂ සිදු වීමක් බව ශපථ කරයි. ඒ පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂිත ය.

**නිපුණතාව:** • නිදහස සහ මානව අයිතිවාසිකම් මහජන අරගලවල ප්‍රතිඵල බව අවබෝධ කරගෙන ඒවා ආරක්‍ෂා කර ගැනීමට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** ： 7.1 මානව අයිතීන් සුරැකීම සම්බන්ධයෙන් ප්‍රංශ විප්ලවයේ වැදගත්කම විග්‍රහ කරයි

.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 08 යි

**ඉගෙනුම් පල**
- ප්‍රංශ විප්ලවය ඇතිවීමට තුඩු දුන් හේතු විග්‍රහ කරයි.
- ප්‍රංශ විප්ලවයෙන් දිනාගත් මූලික මිනිස් අයිතිවාසිකම් පෙන්වා දෙයි.
- මානව අයිතීන් සුරැකීම නූතන ලෝකය පිළිගත් සංකල්පයක් බව පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

**ප්‍රංශ විප්ලවය**

- **ප්‍රංශ විප්ලවයට බලපෑ හේතු**
  - දේශපාලන හේතු
    - * රටේ සියලු බලතල රජු වෙත සංකේන්ද්‍රගත වී තිබීම
    - * පාලකයන් අකාර්යක්ෂම වීම
      උදාහරණ: පහළොස් වැනි ලුවී හා දාසය වැනි ලුවී රජවරු
    - * අනවශ්‍ය යුද්ධවලට සහභාගි වීම
      උදාහරණ ： දහහතර වෙනි ලුවී රජු ස්පාඤ්ඤ රාජ්‍ය ප්‍රාප්ති යුද්ධයට සම්බන්ධ වීම
      එංගලන්තයට විරුද්ධ ව ගෙනගිය යුද්ධ
      පහළොස් වෙනි ලුවී රජු හත් අවුරුදු යුද්ධයට හා අමරිකානු නිදහස් සටනට සහභාගි වීම
    - * දාසයවෙනි ලුවී රජුගේ අදූරදර්ශී ක්‍රියාකලාපය
      උදාහරණ ： ටර්ගෝ, නෙකර් වැනි දක්ෂ ඇමතිවරුන් ඉවත් කොට රදලයන්ගේ ඉල්ලීම
      පරිදි අදක්ෂ ඇමතිවරුන් පත් කිරීම
      මාරි ඇන්ටොයිනට් බිසවගේ උපදෙස් අනුව කටයුතු කිරීම
      රාජාණ්ඩුව දුර්වල වීම



රජුගේ නිදන කාමරයක් (රන් ආලේපිත)



වර්සේල්ස් මාලිගාව

- ආර්ථික හේතු
  * සාමාන්‍ය ජනතාව මත ඔරොත්තු නොදෙන තරම් බදු පනවා තිබීම
  * රදළයන් බදු කිසිවක් නොගෙවා අධික වරප්‍රසාද භුක්ති විඳිමින් සිටීම
  * මධ්‍යම පන්තියේ දියුණුවට පැවති බාධක
  * බදු ප්‍රතිපත්තියේ අක්‍රමිකතා
  * ඉඩම් කොටු කිරීම නිසා ඇති වූ ප්‍රතිඵල
  * අධික යුද වියදම් නිසා රාජ්‍ය භාණ්ඩාගාර බංකොලොත් වීම
  * රජ පවුලේ සුඛෝපභෝගී ජීවිත නඩත්තුව සඳහා රටේ ආදායමෙන් විශාල ප්‍රමාණයක් වැය වීම
  * ඊඩින් වෙළෙඳ ගිවිසුම හා එහි ප්‍රතිඵල

- සමාජීයීය හේතු
  * සාමාන්‍ය ජනතාව මුහුණ පෑ දුෂ්කරතා
  * උත්පත්තිය මත සමාජ තරාතිරම තීරණය කිරීම හා පන්ති විෂමතා
  * ප්‍රභූ පන්තියට පමණක් සියලු වරප්‍රසාද හිමි වීම

- බාහිර හේතු
  * දාර්ශනිකයන්ගේ බලපෑම
    (හොබ්ස්, ලොක්, රූසෝ, වෝල්ටෙයර්, මොන්ටෙස්ක්‍යු වැනි අය)
  * හත් අවුරුදු යුද්ධය හා අමෙරිකානු නිදහස් සටන
  * ප්‍රංශයට බලපෑ දේශගුණ තත්ත්වය (අධික ශීත ඍතුව, දුර්භික්ෂ, නියඟ)


- **ප්‍රංශ විප්ලවයේ ආරම්භය හා ව්‍යාප්තිය**

  - ප්‍රංශය පුරා නොසන්සුන්තාව පැතිරයාම නිසා රදළයන්ගේ ඉල්ලීම පරිදි දාසයවෙනි ලුවී රජු ස්ටේට්ස් ජෙනරල් සභාව කැඳවීම
  - ටෙනිස් පිටියේ දිවුරුම හා ජාතික සභාව ක්‍රියාත්මක කිරීම
  - මධ්‍යම පාන්තිකයන් ප්‍රංශ විප්ලවයේ නායකත්වය ගැනීම
  - බැස්ටීලයට පහර දීමෙන් විප්ලවය ආරම්භ වීම, විප්ලවය ප්‍රචණ්ඩ ස්වරූපයක් ගැනීම (1789.07.14)
  - මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය එළිදැක්වීම (1789.08.29)
  - ප්‍රභූ පන්තියේ වරප්‍රසාද අහෝසි කරීම
  - ක්‍රි.ව. 1791 දී දාසය වැනි ලුවී රජු පලායාම හා ඕස්ට්‍රියාවෙන් ආධාර ඉල්ලීම

- **ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා**
  - ප්‍රංශ සමූහාණ්ඩුව බිහි වීම - 1792
  - දාසයවෙනි ලුවී රජු සහ මාරි ඇන්ටොයිනට් බිසව මරා දැමීම (1793)
  - ප්‍රංශ සමූහාණ්ඩුවට එරෙහි ව යුද්ධ ඇති වීම
    (එංගලන්තය, ස්පාඤ්ඤය, ඕස්ට්‍රියාව)

- **භීම සමය ඇරඹීම - 1793 - 1795**

  - ඩැන්ටන්, මැරට්, රොබෙස්පියර් වැනි ජැකොබින් පාක්ෂිකයන් අතට පාලන බලය හිමි වීම
  - කලක් බලයේ සිටි ජිරොන්ඩින් නායකයින් ජැකොබින්වරුන් විසින් ඝාතනය කරනු ලැබීම
  - ජැකොබින්වරුන් අතර මතභේද ඇතිවීම සහ නායකයන් ඔවුනොවුන් ඝාතනය කරනු ලැබීම රොබෙස්පියර් විසින් ඩැන්ටන් ඝාතනය කිරීම
  - භීම සමයේ අවසානය සහ තර්මිඩෝරියානු ප්‍රතිවිප්ලවය (ජැකොබින්වරුන්ගේ භීෂණය තුරන් කිරීම සඳහා ගෙන ගිය ව්‍යාපාරය තර්මිඩෝරියන් ප්‍රතිවිප්ලවය ලෙස හැඳින්වේ)
  - අධ්‍යක්ෂ මණ්ඩලය බලයට පත්වීම (1795 ඔක්තෝම්බර්)
  - කොන්සල් ක්‍රමය ආරම්භ වීම
  - නැපෝලියන් බොනපාට් බලයට පත් වීම



දහසයවෙනි ලුවී රජු ගිලටීනය මඟින් මරණයට පත් කිරීම දැක්වෙන චිත්‍රයක්



ගිලටීනය



නැපෝලියන් බොනපාට්

- **ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල**

  - ක්‍රි.ව. 1791 දී මානව හිමිකම් ප්‍රකාශනය එළි දැක්වීම
  - වැඩවසම් ක්‍රමය බිඳ වැටී ධනවාදී ආර්ථික රටාවක් බිහි වීම
  - මධ්‍යම පාන්තික නායකත්වය යටතේ බලවත් ආණ්ඩුවක් පිහිටුවීම
  - මධ්‍යම පංතියට දේශපාලන හමිකම් ලැබීම
  - රදල හා පූජක පාන්තිය සතු වූ ඉඩම් අහිමි වීම
  - රදල හා පූජක පාන්තිය සතු වූ ඉඩම් ගොවි ජනතාව අතර බෙදා දීම නිසා ප්‍රංශයේ සුලු ඉඩම් හිමි ගොවි පංතියක් බිහි වීම
  - සමාන බදු ක්‍රමයක් ඇති කිරීම
  - නිදහස, සමානාත්මතාවය, සහෝදරත්වය යන අදහස් යුරෝපය පුරා පැතිර යාම
  - නැපෝලියන් වැනි සාමාන්‍ය පාන්තියේ අයකුට ප්‍රංශයේ බලයට පත්වීමට අවස්ථාව ලැබීම
  - අසාර්ථක, දූෂිත රාජ්‍ය පෙරළා දැමීමට විප්ලව ප්‍රයෝජනයට ගත හැකි බව අවබෝධ වීම

- **ප්‍රංශ විප්ලවයේ වැදගත්කම**
  - යුරෝපය මධ්‍යකාලීන වැඩවසම් ක්‍රමයේ සිට නූතන ක්‍රමයට අවතීර්ණ වීම.
  - ප්‍රංශය ඒකාධිපති රාජාණ්ඩු ක්‍රමයේ සිට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තෙක් පරිවර්තනය වීම
  - ප්‍රංශ වැසියා අපේක්ෂා කළ නිදහස, සමානාත්මතාව වැනි මූලික මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශයට පත් වීම
  - මූලික අයිතිවාසිකම් පදනම් කරගත් ලිබරල්වාදය, ජාතිකවාදය වැනි මතවාද සපුරා ගැනීම සඳහා යුරෝපය පුරා විවිධ රටවල විප්ලව රැසක් ඇති වීම
  - එකී මතවාද පදනම් කරගෙන ඉතාලිය එක්සත් වීම, ජර්මනිය එක්සත් වීම මඟින් යුරෝපයේ ජාතික රාජ්‍ය පුළුල් වීම

ඇගයීම - 01

**පහත ප්‍රශ්න සඳහා එක් එක් ප්‍රශ්නයට නම් පහ බැගින් දී ඇත. ඒවායින් එකක් කවර හෝ හේතුවක් නිසා සෙසු නම්වලට නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

1) 1. ලෆායට් 2. නෙකර් 3. මැරට් 4. ඩැන්ටන් 5. මිරාබෝ (.........)

2) 1. මොන්ටෙස්ක්‍යු 2. වෝල්ටෙයාර් 3. රූසෝ 4. ජෝන් ලොක් 5. මැකියාවෙලි (.........)

3) 1. නෙකර් 2. ටර්ගෝ 3. රිචලියු 4. කැලෝන් 5. බ්‍රියේන් (.........)

4) 1. දාහතරවෙනි ලුවී 2. අටවෙනි හෙන්රි 3. රිචලියු 4. මැසරින් 5. නෙකර් (.........)

5) 1. ගැරිබෝල්ඩ් 2. මැරට් 3. රොබෙස්පියර් 4. ඩැන්ටන් 5. මිරාබෝ (.........)

**පහත ප්‍රශ්න සඳහා එක් එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එයින් එකක් මාතෘකාවට නොගැළපේ. නොගැළපෙන කරුණ තෝරන්න.**

6) ප්‍රංශ විප්ලවය
   1. දාහතර වැනි ලුවීගේ රාජ්‍ය පාලන සමයේ ආරම්භ විය.
   2. රජුගේ මුදල් ඇමතිවරයා වූ නෙකර් බදු ප්‍රතිසංස්කරණ කීපයක් යෝජනා කළේය.
   3. ප්‍රංශ විප්ලවයට ආසන්න හේතුව වූයේ ප්‍රංශයේ පැවති මුදල් බංකොලොත්භාව යි.
   4. 1789 ජූලි 14 වන දින බැස්ටීලයට පහර දීම ප්‍රංශ විප්ලවයේ තීරණාත්මක අවස්ථාවක් විය.
   5. නිදහස, සහෝදරත්වය, සමානාත්මතාව ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන තේමාව විය.

(.........)

7) ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා
   1. ජාතික මන්ත්‍රණ සභාව ඇති කිරීම
   2. සමූහාණ්ඩුව පිහිටුවීම
   3. දහතුන්වෙනි ලුවී යටතේ ප්‍රංශ රාජාණ්ඩුව ප්‍රතිෂ්ඨාපනය කිරීම
   4. භීම සමය
   5. අධ්‍යක්ෂ මණ්ඩලය බලයට පත් වීම

(.........)

8) ප්‍රංශ විප්ලවය
   1. පැරණි රාජාණ්ඩුක්‍රමයේ දුර්වලතා ප්‍රංශ විප්ලවයට තුඩු දුන් හේතුවක් විය.
   2. මොන්ටෙස්ක්‍යු ප්‍රංශ විප්ලවයට බලපෑ දාර්ශනිකයෙක් විය.
   3. 1789 මැයි මාසයේ ස්ටේට්ස් ජෙනරල් සභාව කැඳවීම
   4. 1789 ජූලි බැස්ටීලයට පහරදීම
   5. 1793 ජනවාරි මාසයේ දී දහසය වැනි ලුවී රජු ඔටුනු පැලඳීම

(.........)

9) ප්‍රංශ විප්ලවය
   1. ස්ටේට්ස් ජෙනරල් සභාව කැඳවීම
   2. බැස්ටීලය බිඳ වැටීම
   3. දහසයවෙනි වන ලුවී රජුගේ හිස ගසා දැමීම
   4. දහඅටවෙනි ලුවී රජ වීම
   5. භීම සමය (.........)

10) ප්‍රංශ විප්ලවය
1. ටෙනිස් පිටියේ දිවුරුම ප්‍රංශ විප්ලවයේ ආරම්භය සලකුණු කළේ ය.
2. දාහත්වෙනි ලුවී ව්‍යවස්ථානුකූල රජකු ලෙස ඔටුනු පළඳවනු ලැබී ය.
3. මාරි ඇන්ටොයිනට් බිසවගේ හිස ගසා දමනු ලැබී ය.
4. ජාතික සභාව විසින් මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශය නිකුත් කරන ලදි.
5. ප්‍රංශ විප්ලවයෙන් මධ්‍යම පාන්තිකයන්ගේ අදහස් බොහෝ දුරට ඉටු විණි.

(.........)

**පහත ප්‍රශ්න සඳහා දක්වා ඇති A B C හා D යන ප්‍රතිචාර අතරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර තෝරා, A හා B පමණක් නිවැරදි නම් (1) ද B හා C පමණක් නිවැරදි නම් (2) ද C හා D පමණක් නිවැරදි නම් (3) ද A හා D පමණක් නිවැරදි නම් (4) ද ප්‍රතිචාර එකකට හෝ දෙකකට හෝ වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් (5) ද වරහන් තුළ ලියන්න.**

11. ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි ද?
A ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන සටන් පාඨය වූයේ නිදහස, සහෝදරත්වය හා සමානාත්මතාවයයි.
B ප්‍රංශ විප්ලවයෙන් රදලයන්ගේ වරප්‍රසාද තහවුරු විය.
C රොබෙස්පියර්ගේ නායකත්වයෙන් ප්‍රංශයේ සමූහාණ්ඩුවක් පිහිටුවන ලදි.
D ප්‍රංශ විප්ලවය මධ්‍යම පාන්තිකයන්ගේ විප්ලවයක් ලෙස සලකනු ලැබේ.

(.........)

12. පහත සඳහන් අය අතරින් ප්‍රංශ විප්ලවයට සහභාගී වූවෝ කවරහු ද?
A ලෆායෙට් B රොබෙස්පියර්
C රිචලියු D ලුවී නැපෝලියන් (.........)

13. පහත සඳහන් ඒවා අතරින් විප්ලවයේ ප්‍රතිඵල මොනවා ද ?
A වැඩවසම් ක්‍රමය බිඳ වැටීම B මධ්‍යම පාන්තියට දේශපාලන හිමිකම් ලැබීම
C රාජාණ්ඩු ශක්තිමත් වීම D නැපෝලියන් බොනපාට් බලයට පත් වීම (.........)

**ඇගයීම - 02**
**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

1. පහත සඳහන් සියලු ජන කොටස් ප්‍රංශ විප්ලවයට දායක වී ඇත. ඔවුන්ගේ දායකත්වය විස්තර කරන්න.
(i) රජවරු (ii) රදල ප්‍රභූවරු (iii) මධ්‍යම පාන්තිය (iv) සාමාන්‍ය ජනතාව (ලකුණු 14)

2. ''ප්‍රංශ විප්ලවය ආරම්භ කරන ලද්දේ මධ්‍යම පාන්තිය විසිනි''
(i) ප්‍රංශ විප්ලවය ඇති වීමට ආසන්නත ම හේතුව කුමක් ද?
(ලකුණු 02)
(ii) ප්‍රංශයේ මධ්‍යම පාන්තිය මුහුණ දුන් දුක්ගැනවිලි කවරේ ද ? (ලකුණු 04)
(iii) ප්‍රංශ විප්ලවය ඇති වීමට තුඩු දුන් හේතු කෙරෙහි අවධානය යොමු කරමින් විප්ලවය ආරම්භ කිරීමෙහි ලා මධ්‍යම පාන්තිය විසින් ඉටු කරන ලද කාර්යභාරය විවේචනාත්මක ව විමසන්න.
(ලකුණු 08)

3. (i) 18 වෙනි සියවසේ ප්‍රංශයේ පැවති ප්‍රාක්තන පටිපාටියේ (පැරණි රාජාණ්ඩු ක්‍රමයේ) ප්‍රධාන ලක්ෂණ හඳුන්වා දෙන්න. (ලකුණු 07 )
(ii) 1789 ප්‍රංශ විප්ලවය ආරම්භ වීමෙහි ලා ඒවායෙහි බලපෑම පරීක්ෂා කරන්න. (ලකුණු 07)

4. ප්‍රංශ විප්ලවය කෙරේ අවධානය යොමු කරමින් එය ප්‍රංශය සම්බන්ධයෙන් පමණක් නොව යුරෝපයේ අනෙකුත් රටවල් සම්බන්ධයෙන් ඇතිකළ බලපෑම පරීක්ෂා කරන්න.

(ලකුණු 14)

5. ''ප්‍රංශ විප්ලවය ආරම්භ කරන ලද්දේ රදල ප්‍රභූ පාන්තිය විසිනි'' මේ කියමන විවේචනාත්මක ව විමසන්න.

(ලකුණු 14)

6. ''ප්‍රංශ විප්ලවය වර්තමාන යුරෝපයේ විකාශනය හැඩගැස්වූ ඉතා මත් වැදගත් සිදුවීමකි''

(i) ප්‍රංශ විප්ලවය ඇති කිරීමට තුඩු දුන් ආසන්නත ම හේතුව කුමක් ද?

(ලකුණු 01)


(ii) විප්ලවය ඇති වීමට පෙර ප්‍රංශයේ පැවති සමාජ ව්‍යුහය සැකෙවින් දක්වන්න. (ලකුණු 02)

(iii) ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා කවරේ ද?

(ලකුණු 03)

(iv) ප්‍රංශ විප්ලවය කෙරෙහි අවධානය යොමු කරමින් එය ප්‍රංශය සම්බන්ධයෙන් පමණක් නොව යුරෝපයේ අනෙකුත් රටවල් සම්බන්ධයෙන් ඇති කළ බලපෑම පරීක්ෂා කරන්න.

(ලකුණු 08)


නූතන ලෝක ඉතිහාසය

# 1. නූතන ලෝකයේ උදාව

ලෝකයේ නූතන යුගය උදා වන්නේ 15 වෙනි සියවස සහ ඉන්පසු කාලයේ දී ය. එහි පදනම සැකසුණේ යුරෝපයේ දී ය.

ඉගෙනීමේ පහසුව සඳහා යුරෝපා ඉතිහාසය පැරණි, මධ්‍යම සහ නූතන වශයෙන් අවධි තුනකට බෙදා ඇත. යුරෝපා ශිෂ්ටාචාරයට පදනම සැපයූ උසස් මට්ටමක පැවති ග්‍රීක රෝම ශිෂ්ටාචාර අවධිය යුරෝපා ඉතිහාසයේ පැරණි අවධිය ලෙස සැලැකේ. 15වෙනි සියවසෙන් පසු අවධිය නූතන යුගය ලෙස සලකනු ලැබේ. පැරණි ග්‍රීක, රෝම වැනි ශිෂ්ටාචාර අවධියටත් ක්‍රි.පූ 15වෙනි සියවසෙන් ඇරඹෙන නූතන අවධියටත් අතර මැද කාලපරිච්ඡේදය මධ්‍යකාලීන අවධිය ලෙස හැඳින්වේ.

මධ්‍යතන යුගය ලෙස හැඳින්වෙන මෙම අවධියේ ප්‍රධානත ම ලක්ෂණය වූයේ ප්‍රවේණිය කේන්ද්‍ර කොටගත් වැඩවසම් ක්‍රමය යි. වසර දහසක් පමණ කාලයක් තිස්සේ යුරෝපයේ සියලු ම පාහේ රටවල අඩු වැඩි වශයෙන් ක්‍රියාත්මක වූ වැඩවසම් ක්‍රමය අධ්‍යාපනයේ දියුණුව, වෙළෙඳාම පුළුල් වීම, වාණිජ ධනවාදයේ නැඟීම, දේශ ගවේෂණ, ජාතික රාජ්‍ය බිහි වීම, කාර්මික විප්ලවය වැනි හේතු හමුවේ පරිහානියට පත් විය. යුරෝපයේ මධ්‍යතන අවධිය නූතන අවධිය බවට පත් කළ මෙම විවිධ බලවේග ක්‍රියාත්මක වූ 13වෙනි සියවසේ සිට 15වෙනි දාසය වෙනි සියවස පමණ තෙක් කාලපරිච්ඡේදය පුනරුද අවධිය ලෙස හැඳින්වේ. පුනරුදයේ ප්‍රතිඵල වශයෙන් යුරෝපයේ බිහි වූ නව යුගයේ ලක්ෂණ, විශේෂයෙන් දේශගවේෂණ, යටත්විජිතවාදය, ජාත්‍යන්තර වෙළෙඳාම, ක්‍රිස්තු ධර්මය ආසියා, අප්‍රිකා සහ අමෙරිකා මහද්වීපවලට ව්‍යාප්තවීමත් සමග නූතන ලෝකය බිහිවීමට මග පෑදුණි. එපරිද්දෙන් යුරෝපය පදනම් කරගෙන ලොව පුරා මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ ආර්ථික, දේශපාලන, ආගමික හා සංස්කෘතික ආදී සියලු ක්ෂේත්‍රවල සිදු වූ පුළුල් වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කරමින් නූතන ලෝකයේ උදාව පිළිබඳ ව අවබෝධයක් ලබා දීම මෙම ඒකකයේ අරමුණ වේ.

**නිපුණතාව** : • නූතන ලෝකයේ උදාවට බලපෑ ඓතිහාසික බලවේග පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම**: 1.1. වාණිජ ධනවාදයේ නැඟීම නූතන ලෝකයේ උදාවට බලපෑ ආකාරය විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :
- වාණිජ ධනවාදය විග්‍රහ කරයි.
- යුරෝපයේ වාණිජ ධනවාදයේ නැඟීම විස්තර කරයි.
- වාණිජ ධනවාදයේ නැඟීම නූතන ලෝකයේ උදාවට කළ බලපෑම පෙන්වා දෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

**1.1. වැඩවසම් ක්‍රමයේ පරිහානිය හා වාණිජවාදයේ නැඟීම**

- වැඩවසම් ක්‍රමය යනු ඉඩම් භුක්තිය හා බැඳුණු සේවය මුල් කරගත් ආර්ථික, දේශපාලන සහ සමාජ සංස්කෘතික රටාවකි
- එය රෝම අධිරාජ්‍යය බිඳ වැටීමත් සමඟ බිහි වූ ව්‍යාකූල තත්ත්වය හමුවේ යුරෝපයේ විවිධ රාජ්‍යවල වර්ධනය වූ ක්‍රමයකි. රෝම අධිරාජ්‍යය බිඳ දැමූ ජර්මන් ජාතික ගෝත්‍ර ජනකොටස් විසින් ගොඩනඟන ලද විවිධ රාජ්‍යවල නිර්මාණය වූ වැඩවසම් ක්‍රමය බොහෝ දුරට එක හා සමාන ලක්ෂණවලින් යුක්ත විය.

- **ප්‍රධාන ලක්ෂණ**

  - දේශපාලන වශයෙන් බලවත් රාජාණ්ඩු නොපැවතීම සහ බලතල විකේන්ද්‍රගත වූ ප්‍රදේශීය රාජ්‍ය බලවත් වංශාධිපතිවරුන් යටතේ පාලනය වීම
  - නිෂ්පාදන කටයුතු ප්‍රවේණිය පදනම් කර ගෙන පැවති අතර නින්දගම ස්වයංපෝෂිත ඒකකයක් වීම
  - වංශාධිපති ප්‍රවේණි හිමියා යටතේ වගා කටයුතු කළ ප්‍රවේණි දාසයන්ගේ ජීවන රටාව අන්‍යෝන්‍ය සහයෝගය මත පදනම් වී තිබීම
  - කතෝලික සභාව ආධිපත්‍ය දැරූ මේ අවධියේ ප්‍රවේණිය තුළ පූජකවරයාට ද විශේෂ තත්ත්වයක් හිමි වී තිබීම

- **වැඩවසම් ක්‍රමය බිඳවැටීමට හේතු**

  - අධ්‍යාපනය සහ විද්‍යාත්මක ප්‍රබෝධය
  - මානව වාදය සංකල්පයක් ලෙස වර්ධනය වීම
  - කතෝලික පල්ලියේ ආධිපත්‍ය අභියෝගයට ලක් වීම
  - පුනරුදය
  - වෙළෙඳාම පුළුල් වීම, නව ධනපති පංතියක් බිහි වීම සහ මුදල් භාවිතය වැඩි වීම
  - වෙළෙඳ නගර බිහි වීම
  - ජාතික රාජ්‍ය බිහි වීම
  - දේශගවේෂණ
  - කාර්මික විප්ලවය

- **පුනරුදය**

  - යුරෝපයේ මධ්‍යකාලීන යුගය නූතන යුගය බවට පරිවර්තනය කළ ප්‍රධාන බලවේගය පුනරුදය විය.
  - පුනරුද සමයේ දී
    * ආර්ථික වශයෙන් වෙළඳාම පුළුල් වී වාණිජ ධනවාදය ගොඩ නැගීම
    * දේශපාලන වශයෙන් නව රාජාණ්ඩු සංකල්පය මත ගොඩනැගුණ ජාතික රාජ්‍ය බිහිවීම
    * ආගමික වශයෙන් කතෝලික සභාවේ පැවති ඒකාධිකාරී බලතල බිඳ දැමූ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාප්තියක් සිදු වීම
    * ග්‍රීක රෝම ශිෂ්ටාචාරයන්හි ඇතැම් ලක්ෂණවල පුනර්ජීවයක් ඇති වීම

- **වාණිජ ධනවාදයේ නැගීම**

  - වාණිජ ධනවාදය යනු ඃ
    වෙළෙඳ කටයුතු මගින් මුදල් උපයාගත් ධනපති පන්තියක් බිහි වීම සහ මුදල් පරිහරණය ප්‍රධාන කොටගත් සමාජ, ආර්ථික සම්බන්ධතා ගොඩනැගුණ ක්‍රමයකි. මෙම ක්‍රමය යටතේ කිසියම් රටක ධනවත්කම මනිනු ලබන මිණුම් දණ්ඩ වූයේ එරට එක්රැස් වී ඇති ගන රන්, රිදී, මුතු, මැණික් වැනි වස්තු සම්භාරය යි.

  - ඉඩම භුක්තිය මත පදනම් වූ වැඩවසම් ස්වයපෝෂිත ආර්ථික ක්‍රමය බිඳවැටී වාණිජ ධනවාදය බිහිවීමෙන් පසු ව එම ක්‍රමය ක්‍රියාත්මක කිරිමට අත්‍යවශ්‍ය භාණ්ඩ විකිණීමේ සහ මිලට ගැනීමේ ක්‍රම, මුදල් භාවිතය සහ විනිමය ක්‍රම මෙන් ම බැංකු ක්‍රම ආරම්භ වී වර්ධනය වීම වාණිජ ධනවාදයේ ව්‍යාපෘතියට රුකුල් දුන් සාධක විය. එලෙස යුරෝපයේ ආරම්භ වී වර්ධනය වූ වාණිජ ධනවාදය යුරෝපයට නව යුගයක් උදා කිරීමට ද ඒ හරහා නූතන ලෝකය බිහි කිරීමට ද දායක වූ ආකාරය දැකිය හැකි ය.

- **වැඩවසම් ක්‍රමයේ පරිහාණිය**

  - 11 වෙනි සියවසේ සිට 13 වෙනි සියවස පමණ තෙක් පැවති කුරුස යුද්ධ යුරෝපයේ වැඩවසම් ක්‍රමයේ පරිහානියට කිහිප ආකාරයකින් බලපෑවේය.
  - ඒ හේතුවෙන්
    * පෙර අපර දෙදිග වෙළෙඳාම පුළුල් වීම
    * ප්‍රවේණි ක්‍රමයේ බිඳ වැටීම
    * මුදල් පරිහරණය පුළුල් වීම
    * වෙළෙඳ නගර බිහි වීම
    * වංශාධිපති සහ ප්‍රවේණි දාස යන සමාජ ස්තර බිඳ වැටීම

  - පශ්චාත් මධ්‍යතන අවධියේ ගොඩනැගුණ නව රාජාණ්ඩු ක්‍රමය යටතේ යුරෝපා රටවල ජාතික වෙළෙඳ ප්‍රතිපත්ති සහ නව බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
  - දේශ ගවේෂණ ව්‍යාපාරය මත යටත් විජිත අධිරාජ්‍යය ගොඩනැඟීම සහ එමඟින් වෙළෙඳ කටයුතු යුරෝපයෙන් පිටත සෙසු මහාද්වීපවලට ව්‍යාප්ත වීම
  - වෙළෙඳාම පුළුල් වීමත් සමඟ වෙළෙඳාමෙන් ධනය උපයාගත් ධනවතුන් බිහි වීම සහ ඔවුන් ප්‍රධානත්වය දරූ වාණිජ ධනවාදය ක්‍රමයෙන් වර්ධනය වීම
  - වෙළෙඳ කටයුතු පුළුල් වීමට සමගාමී ව
    * නව නගර බිහි වීම
    * බැංකු ක්‍රම සහ විනිමය මාධ්‍ය බිහි වීම
    * වෙළෙඳ සමාගම් බිහි වීම (බද්ධ ව්‍යාපාර සමාගම්)
  - එපරිද්දෙන් 11වෙනි සියවසේ පමණ සිට යුරෝපයේ වාණිජ ධනවාදය ආරම්භ වී සියවස් කිහිපයක් තිස්සේ ක්‍රමයෙන් වර්ධනය වී අධිරාජ්‍ය ව්‍යාප්තියත් සමග සෙසු ලෝකයට ද ව්‍යාප්ත වී නූතන ලෝකයේ උදාවට බෙහෙවින් දායක වී ඇති ආකාරය සාකච්ඡා විය යුතු ය.



නව වෙළෙඳ නගර දැක්වෙන සිතුවමක්




ෆ්ලෝරන්ස් නගරය



පුනරුද කලා නිර්මාණ

ඇගයීම 01

**අංක 01 සිට 04 දක්වා ඇති ප්‍රශ්න සඳහා (A), (B), (C), (D) , (E) යන ප්‍රතිචාර අතුරින් එකක් හෝ කිහිපයක් නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා**

A සහ B පමණක් නිවැරදි නම් ........... 1 ද,
B සහ C පමණක් නිවැරදි නම් ........... 2 ද,
C සහ D පමණක් නිවැරදි නම් ........... 3 ද,
D සහ E පමණක් නිවැරදි නම් ........... 4 ද,
ප්‍රතිචාර එකකට හෝ දෙකකට හෝ වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් 5 ද තිත් ඉර මත ලියන්න.

(1) පහත දැක්වෙන කරුණු අතරින් වැඩවසම් ක්‍රමයේ පොදු ලක්ෂණ කවරේ ද?
A. බලවත් රාජාණ්ඩු නොපැවතීම
B. පූජකවරුන්ට විශේෂත්වයක් හිමි වීම
C. අන්තර් වෙළෙඳ සම්බන්ධතා පැවතීම
D. ප්‍රවේණි දාසයන් වෙළෙඳාමට සම්බන්ධ වීම
E. ප්‍රවේණි දාසයන්ගේ තත්ත්වය යහපත් වීම

(...............)

(2) පහත සඳහන් කරුණු අතරින් වැඩවසම් ක්‍රමය බිඳ වැටීමට හේතු කවරේ ද?
A. වංශාධිපතිවරු අතර වූ බල අරගලය
B. ප්‍රවේණි දාසයන්ගේ උද්සෝෂණ
C. අධ්‍යාපන හා විද්‍යාත්මක ප්‍රබෝධය
D. මුදල් භාවිතය වැඩි වීම
E. බලය මධ්‍යගත වීම (...............)

(3) පහත සඳහන් කරුණු අතුරින් වාණිජ ධනවාදයේ ලක්ෂණ මොනවා ද?
A. සංවෘත ආර්ථිකය
B. කෘෂිකාර්මික දියුණුව
C. ගෘහ කර්මාන්ත දියුණුව
D. මුදල් භාවිතය
E. ධනපති පන්තිය බිහි වීම

(...............)

(4) පහත සඳහන් කරුණු අතුරින් පුනරුදයේ ලක්ෂණ මොනවා ද?
A. ආගමික ප්‍රතිසංස්කරණ ඇති වීම
B. ලෝකෝත්තරවාදය ඉස්මතු වීම
C. ජාතික රාජ්‍ය බිහි වීම
D. ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල පුනර්ජීවනය
E. පැරණි සමාජ ස්ථර බිඳ වැටීම

(...............)

(5) වැඩවසම් ක්‍රමයේ බිඳවැටීම හා වාණිජ ධනවාදයේ නැගීම නූතන ලෝකයේ උදාවට බලපෑ ආකාරය සාකච්ඡා කරන්න.

**නිපුණතා මට්ටම:** 1.2. ජාතික රාජ්‍යයන්ගේ නැඟීම නූතන ලෝකයේ උදාව කෙරෙහි බලපෑ ආකාරය විග්‍රහ කරයි.

**කාලච්ඡේද:** 10 යි.

**ඉගෙනුම් පල:**
- ජාතික රාජ්‍යයන් බිහි වීමට හේතු පැහැදිලි කරයි.
- යුරෝපයේ බිහි වූ ජාතික රාජ්‍යයන් පිළිබඳ විස්තර කරයි.
- යුරෝපයේ බිහි වූ ජාතික රාජ්‍යයන් සිතියමක ලකුණු කරයි.
- ජාතික රාජ්‍ය බිහි වීම නූතන ලෝකයේ උදාව කෙරෙහි බලපෑ ආකාරය පෙන්වා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

1.2. ජාතික රාජ්‍ය

- **ජාතික රාජ්‍ය හැඳින්වීම**
  - නිශ්චිත දේශසීමාවකින් සහ නිශ්චිත ජන සංඛ්‍යාවකින් සමන්විත වූ සමාන භාෂාවක් ව්‍යවහාර කරන පොදු ජාතික අනන්‍යතාවකින් යුක්ත වූ සහ රජුගේ බලය ස්ථාවර වූ ස්වාධිපති බලය සහිත දේශපාලන ඒකකය ජාතික රාජ්‍ය ලෙස හැඳින්වේ.

- **ජාතික රාජ්‍යවල ලක්ෂණ**
  - නිශ්චිත භූගෝලීය දේශ සීමාවකින් යුක්ත වීම
  - වංශාධිපතිවරුන්ගේ බලය දුර්වල වීම සහ මධ්‍යම පාන්තිය බලවත් වීම
  - වේතන ලබන නිලධාරී පාන්තියක් බිහි වීම
  - ස්වෛරී රාජාණ්ඩුව
  - ඒකීය නීති පද්ධතිය
  - වාණිජවාදය
  - පෞද්ගලික නිලකාර හමුදා අහෝසි වීම හා රජු ස්ථිර යුද්ධ හමුදාවක් ගොඩනඟා ගැනීම
  - ඒකීය බදු ක්‍රමය
  - ආගමික නායකත්වයේ ඇති වූ වෙනස්කම්

  - මෙම ලක්ෂණවලින් යුක්ත ආණ්ඩු ක්‍රමය 'නව ආණ්ඩු ක්‍රමය' ලෙස හැඳින්වේ

- **ජාතික රාජ්‍යවල ව්‍යාප්තිය**
  - යුරෝපයේ බිහි වූ මුල් ම ජාතික රාජ්‍ය වූයේ,
  - එංගලන්තය
  - ස්පාඤ්ඤය
  - ප්‍රංශය

- **එංගලන්තය ජාතික රාජ්‍යයක් ලෙස වර්ධනය වීම**
  - එංගලන්තය ජාතික රාජ්‍යයක් ලෙස වර්ධනය කිරීමේ දී සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කළ නායකයෝ කීප දෙනෙකි.

- **නෝර්මැන්ඩියේ විලියම් ආදිපාදවරයා**

  - ප්‍රංශයේ ප්‍රදේශීය ඒකකයක් වූ නෝර්මැන්ඩියේ විලියම් ආදිපාදවරයා 1066 දී එංගලන්තය ජය ගැනීමත් සමඟ ජාතික රාජ්‍යයකට අවශ්‍ය මූලික පදනම දැමීම
  - 1086 දී සැලිස්බරි දිවිරුම මඟින් වැඩවසම් රදළ ප්‍රධානය රජුට පක්ෂපාත බව තහවුරු කර ගැනීම
  - රටේ සියලු ඉඩම් පිළිබඳ ව සංඛ්‍යාලේඛන සහිත 'ඩූම්ස්ඩේ බුක්' නමින් වාර්තාවක් සැකසීම

- **හත් වෙනි හෙන්රි රජුගේ පාලන සමය**

  - ලැන්කැස්ටර් සහ යෝර්ක්වරු අතර ඇති වූ රෝස යුද්ධයෙන් (1453 - 1485) පසු ව ලැන්කැස්ටර් වංශයේ හත් වෙනි හෙන්රි ජය ගැනීම
  - යෝර්ක්හි එලිසබෙත් විවාහ කර ගැනීමෙන් රාජ්‍ය උරුමය තිබූ වංශවත් පවුල් දෙක එකතු කරමින් ටියුඩර් නම් නව රාජ වංශයක් ඇරඹීම
    * එංගලන්තය ජාතික රාජ්‍යයක් බවට පත් කිරීමේ දී හත් වන හෙන්රි රජුගේ කාර්යභාරය
    * සේවා නමැති නීතිය පනවමින් වංශාධිපතිවරුන්ගේ පෞද්ගලික හමුදා තහනම් කිරීම
    * වංශාධිපතිවරුන්ගේ ධර්ම යුද්ධ තර්ජන අහෝසි කර පිළිසරණ නීතිය ඇති කිරීම
    * ස්ටාර් චේම්බර් නම් උසාවි ක්‍රමයක් ඇති කිරීම
    * අලුතින් ගොඩනැඟෙමින් සිටි මධ්‍යම පන්තියට රජයේ උසස් තනතුරු ලබා දීම
    * රජුගේ ස්ථිර යුද්ධ හමුදාවක් ආරම්භ කොට පවත්වා ගැනීම
    * වෙඩි බෙහෙත්වල තනි අයිතිය රජුට ලබා ගැනීම
    * ලොම් වෙළෙඳාම දියුණු කිරීම සඳහා බර්ගන්ඩිය සමඟ 'මාලුස් ඉන්ටර් කුර්සූස්' නම් වෙළෙඳ ගිවිසුම ඇති කිරීම
    * ජෝන් කැබෝ සහ සෙබෙස්තියන් කැබෝ යන අයට දේශගවේෂණ සඳහා අනුග්‍රහ ලබා දීම
    * ශාස්ත්‍රීය හා ආගමික නවෝදය සඳහා කටයුතු කිරීම

- **අට වෙනි හෙන්රි රජුගේ පාලන සමය**

  - එංගලන්තය ජාතික රාජ්‍යයක් ලෙස වර්ධනය වීමට අවශ්‍ය ආගමික ස්වාධීනත්වය ඇති කිරීම
  - අට වෙනි හෙන්රි රජු විවාහ සබඳතා ගැටලුවක් මුල් කොට පාර්ලිමේන්තුවේ සහය ලබාගෙන රෝමානු කතෝලික සභාවෙන් සහ පාප්තුමාගෙන් නිදහස් වීම එංගලන්තයේ ජාතික රාජ්‍යයේ බලය විකාශනය වීමට හේතු වීම
  - රෝමානු කතෝලික සභාවට ඇදී ගිය ආදායම් මාර්ග වළකාලමින් ඒවා ජාතික රාජ්‍යයේ උන්නතියට යොදා ගැනීම

- **ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් ලෙස වර්ධනය වීම**

  - ජාතික රාජ්‍යයක් ලෙස එක්සත් වී යුරෝපයේ බලගතු රාජ්‍යයක් ලෙස මුල් අදියරේ නැඟී සිටි රාජ්‍ය අතර ස්පාඤ්ඤය ද විය. රෝම අධිරාජ්‍ය සමයේ සිට ම හිස්පැනික් නම් මනුෂ්‍ය වර්ගය ජීවත් වූ එම විශාල ප්‍රදේශය අයිබීරියන් අර්ධද්වීපයේ වැදගත් කොටසක් විය. ක්‍රි.ව. 1450 පමණ වන විට අයිබීරියන් අර්ධද්වීපයේ ප්‍රධාන රාජ්‍ය 5 ක් තිබිණි.
    * කැස්ටීලය - ඉසබෙලා රැජිණ
    * ඇරගන් - ෆර්ඩිනන්ඩ් රජු
    * ග්‍රැනඩාව - මුස්ලිම් පාලකයෝ
    * නවාරේ - ස්වාධීන පාලකයෝ
    * පෘතුගාලය - ස්වාධීන පාලකයෝ

- **ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් ලෙස ගොඩනැගීමේදී එහි පාලකයන් ඉටු කළ කාර්යභාරය**

  - ෆර්ඩිනන්ඩ් සහ ඉසබෙලා යුවළගෙන් ඉටු වූ සේවාව (1469 - 1516)
  - ඇරගන්හි ෆර්ඩිනන්ඩ් රජු හා කැසිටීල්හි ඉසබෙලා රැජිනිය විවාහ වීමෙන් ස්පාඤ්ඤයේ නව රාජාණ්ඩු ක්‍රමයට හා පාදේශීය එක්සත් බවට මුල් ම අඩිතාලම දැමීම
  - පර්ඩිනන්ඩ් - ඉසබෙලා යුවළ විසින් 1492 මුස්ලිම්වරුන් පරාජයට පත් කර ග්‍රැනඩාවත් 1512 ස්වාධීන පාලකයන් පරාජය කර නවාරේ රාජ්‍යයත් ඈඳා ගැනීම
  - නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා පොලිසිය ප්‍රතිසංවිධානය කර ස්ථිර යුද්ධ හමුදාවක් ගොඩනැගීම
  - රජුගේ උපදේශක සහ අනෙකුත් නිලතල සඳහා මධ්‍යම පාන්තිකයන් පත් කිරීම
  - පොදු නීති පද්ධතියක් සැකසීම
  - මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ බලය රජු වෙත පවරා ගැනීම
  - අභ්‍යන්තර වෙළෙඳාමට තිබූ බාධා ඉවත් කිරීම
  - රජුගේ උපදේශක සභාව වූ කෝටේස් සභාවේ බලතල සීමා කිරීම
  - දේශ ගවේෂණ සඳහා අනුග්‍රහ දැක්වීම
    උදාහරණඃ
    * කොලොම්බස්
    * මැගලන්
  - විවාහ සම්බන්ධතා මගින් අධිරාජ්‍යයක් දක්වා ස්පාඤ්ඤය බල ව්‍යාප්තියට කටයුතු කිරීම
    උදාහරණඃ
    * ෆර්ඩිනන්ඩ් හා ඉසබෙලාගේ දියණි වූ ජුවානා ශුද්ධ රෝම අධිරාජයා වූ මැක්සිමිලියන්ගේ පුත් පිලිප්හට විවාහ කර දීම

- **පළමු වන චාල්ස්/පස් වන චාල්ස් අධිරාජයාගේ පාලන සමය**

  - පර්ඩිනන්ඩ් හා ඉසබෙලා යුවළගේ මුනුබුරා (ජුවානාගේ සහ පිලිප්ගේ පුත්‍රයා) වූ පළමු වෙනි චාල්ස්ගේ රාජ්‍ය සමය ස්පාඤ්ඤයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වීම
  - ඔහුට විවාහ සබඳතා මගින් පිය පාර්ශ්වයෙන් හා මවු පාර්ශවයෙන් ප්‍රදේශ ගණනාවක හිමිකාරිත්වය ලැබීම
    උදාහරණඃ
    * මවගේ උරුමයෙන් - ස්පාඤ්ඤ, නේපල්ස්, සිසිලි, සාර්ඩිනියා
    * පිය පාර්ශ්වයෙන් - ජර්මන් ප්‍රදේශ, ෆ්ලාන්ඩර්ස්, නෙදර්ලන්ත ප්‍රදේශ, ප්‍රංශයේ ප්‍රදේශ, ලක්සම්බර්ග්
  - ස්පාඤ්ඤයේ පළමුවෙනි චාල්ස්ට 1519 දී තම සීයා වූ මැක්සිමිලියන් අධිරාජයාගේ මරණයත් සමග ශුද්ධ රෝම අධිරාජ්‍ය තනතුර හිමි වීය. ඔහු පස්වෙනි චාල්ස් නමින් එම තනතුරට පත් විය.
  - වාණිජවාදී ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
  - දේශ ගවේෂණ ව්‍යාපාරයට අනුග්‍රහ දැක්වීම
  - රාජ්‍යත්වයට පත් වීමේ දී තමාට තිබූ අභ්‍යන්තර අරගල ජය ගැනීම

- **දෙවන පිලිප් රජුගේ පාලන සමය**
  - උග්‍ර කතෝලිකයකු වූ පිලිප් රජුට ප්‍රබල රෙපරමාදු රටවලින් එල්ල වූ අභියෝගවලට මුහුණ දීමට සිදු වූ ඒවා ජය ගැනීම
  - රාජ්‍යත්වය ස්ථාවර කර ගැනීමට විවාහ සබඳතා ඇති කර ගැනීම
    උදාහරණ
    * පෘතුගාලයේ කුමරියක් විවාහ කර ගැනීම
    * එංගලන්තයේ මේරි රැජිනිය සමඟ විවාහ වීම
    * ප්‍රංශ රජ පවුලේ එලිසබෙත් කුමරිය සමඟ විවාහ වීම
    * ඔස්ට්‍රියාවේ හැප්ස්බර්ග් පෙළපතේ ඈන් කුමරිය විවාහ කර ගැනීම
    * අයිබීරියන් අර්ධද්වීපයේ සම්පූර්ණ බලය ලබා ගැනීම
    * දේශ ගවේෂණ කටයුතු සඳහා අනුග්‍රහ දැක්වීම

- **ප්‍රංශය ජාතික රාජ්‍යයක් ලෙස වර්ධනය වීම**

16වෙනි සියවස ස්පාඤ්ඤයේ ස්වර්ණමය යුගය වූවා සේ ම 17 වන සියවස ප්‍රංශයේ ස්වර්ණමය යුගය විය. ප්‍රංශය හා එංගලන්තය අතර පැවති සිය අවුරුදු යුද්ධයෙන් (1338 - 1453) ජය ගැනීමත් සමඟ ප්‍රංශය ජාතික රාජ්‍යයක් ලෙස වර්ධනය වීමේ අඩිතාලම දමන ලදි. ප්‍රංශය ජාතික රාජ්‍යයක් කරා ගෙනයාමේ දී වැදගත් කාර්ය භාරයක් ඉටු කළ නායකයෝ කිහිපදෙනෙකු පහත දැක්වෙති.

- **හතර වෙනි හෙන්රි (1589 - 1610)**

  - යහපත් හෙන්රි යන නමින් හැඳින්වූ මොහු ප්‍රංශයට ආගමික සමගිය උදා කිරීම
  - නැන්ටීස් ආඥාව මඟින් හියුගනෝවරුන්ට සිවිල්, දේශපාලනික සහ ආගමික නිදහස දීම
  - ජාතික බදු ප්‍රතිපත්තියක් සකස් කිරීම
  - වාණිජවාදී ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
  - දේශගවේෂණ කටයුතු සඳහා අනුග්‍රහ දක්වීම
  - අලුත් වගා ක්‍රම, ඇළමාර්ග හා ප්‍රවාහණ ක්‍රම දියුණු කරමින් කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීම

- **රිචලියුගේ සේවය**

  - රදළ බලය යටපත් කර රජුගේ බලය තහවුරු කිරීමට කටයුතු කිරීම
  - ප්‍රාදේශීය පාලනය සඳහා ඉන්ටෙන්ඩාන්ට්වරුන් පත් කිරීම
  - නැන්ටීස් ආඥාවෙන් හියුගනෝවරුන්ට ලබා දී තිබූ දේශපාලන බලතල අහෝසි කිරීම
  - රදළවරුන් අතර පැවතුණු ද්වන්ද්ව සටන් තහනම් කිරීම
  - තිස් අවුරුදු යුද්ධය ජයග්‍රහණය කිරීමට පදනම සැකසීම
  - අධිකරණ මණ්ඩලය සතු බලතල අඩු කිරීම

- **14 වෙනි ලුවී රජුගේ සේවාව (1643 - 1715)**

  - ආර්ථික දියුණුවට පියවර ගැනීම
  - නැන්ටීස් ආඥාව සම්පූර්ණයෙන් අහෝසි කිරීම
  - දේවවරම්වාදී අදහස් රාජ්‍යත්වය තහවුරු කිරිමට යොදා ගැනීම
    උදාහරණ **''රාජ්‍ය නම් මමයි''**
  - බල ව්‍යාප්තිය සඳහා විදේශීය යුද්ධවලට සහභාගි වීම (බිසවගේ යුද්ධය, ඕලන්ද යුද්ධය, ඔගස්බර්ග් සංගම් යුද්ධය, ස්පාඤ්ඤය කිරීටය පිළිබඳ යුද්ධය)

- **යටත්විජිත අධිරාජ්‍යය ගොඩනැඟීමට කටයුතු කිරීම**

  - ප්‍රංශ බටහිර ඉන්දියා වෙළෙඳ සමාගම, උතුරේ සමාගම, ලෙවාන්ට් සමාගම, ප්‍රංශ පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම ආදි පෞද්ගලික ව්‍යවසායක ව්‍යාපාර පිහිටුවා ගැනීමට අනුග්‍රහය දැක්වීම. එමඟින් ඉන්දියාව, කැනඩාව, බටහිර ඉන්දියා දූපත් යන ප්‍රදේශවල ප්‍රංශ යටත් විජිත අධිරාජ්‍ය ගොඩනැඟීමට ද අනුග්‍රහය දක් වීම

- **ජාතික රාජ්‍යයන්ගේ බිහිවීම නූතන ලෝකයේ උදාවට බලපෑම**

  - පැරණි වැඩවසම් ක්‍රමය පරිහානියට පත්විමේ දී කේන්ද්‍රගත පාලන ක්‍රමයක් බිහි කර ගනි මින් සිදු කළ වෙනස නූතන යුගයේ ආරම්භයට දායක වූ ආකාරය සාකච්ඡා කළ යුතු යි.

ඇගයීම 01

**අංක 1 සහ 3 තෙක් ඇති සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

(1) ජාතික රාජ්‍ය
- (1) බලය රජුවෙත සංකේන්ද්‍රගත කරන ලද ශක්තිමත් රාජාණ්ඩුව
- (2) බලවත් වැඩවසම් රදළ පන්තිය
- (3) ශක්තිමත් ස්ථාවර හමුදාව
- (4) වෙළෙඳාමේ ව්‍යාප්තියට රාජ්‍ය අනුග්‍රහය ලැබීම
- (5) රජවරුන් විසින් මධ්‍යම පන්තියේ ආධාර ලබා ගැනීම

(.................)

(2) එංගලන්තය ජාතික රාජ්‍යයක් ලෙස වර්ධනය වීම
- (1) ටියුඩර් නම් නව රාජවංශයක් ආරම්භ කිරීම
- (2) වංශාධිපතිවරුන්ගේ පෞද්ගලික හමුදා තහනම් කිරීම
- (3) මධ්‍යම පන්තියට රජයේ උසස් තනතුරු ලබා දීම
- (4) පාර්ලිමේන්තුවේ සහය ලබාගෙන ක්‍රිස්තු සභාවෙන් නිදහස් වීම
- (5) දේවවරම්වාදී අදහස් රාජ්‍යත්වය තහවුරු කිරීමට යොදා ගැනීම

(.................)

(3) ප්‍රංශය ජාතික රාජ්‍යයක් බවට පත් වීමේ දී දාහතර වෙනි ලුවී රජුගෙන් ඉටු වූ සේවය
- (1) ආර්ථික දියුණුවට පියවර ගැනීම
- (2) නැන්ටිස් ආඥාව අහෝසි කිරීම
- (3) තිස් අවුරුදු යුද්ධය ජය ගැනීම
- (4) යටත් විජිත අධිරාජ්‍ය ගොඩනගාගැනීම
- (5) විදේශීය යුද්ධවලට සහභාගි වීම

(.................)

ඇගයීම 02

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු තෝරන්න**

(4) ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් බවට පත් වීමේ මුල් අඩිතාලම දැමූයේ කවුරුන් විසින් ද?
- (1) විලියම් ආදිපාදවරයා
- (2) පර්ඩිනන්ඩ් හා ඉසබෙලා යුවළ
- (3) පළමු වෙනි චාල්ස්
- (4) දෙවෙනි පිලිප් හා මේරි යුවළ
- (5) රිචලියු (.................)

(5) බලය කේන්ද්‍රගත කරගනිමින් ගොඩනැගූ ජාතික රාජ්‍ය නව යුගයේ ආරම්භයට දායක වූ ආකාරය පැහැදිලි කරන්න.

(6) එංගලන්තය, කැස්ටීලය, ග්‍රැනඩා, ඇරගන්, නවාරේ, පෘතුගාලය, රෝමය, ස්පාඤ්ඤය, නේපල්ස්, සිසිලිය, සාර්ඩිනියාව, ඔස්ට්‍රියාව, ප්‍රංශය, කැනඩාව, ඉන්දියාව හා බටහිර ඉන්දියා දූපත් ආකෘති සිතියමක ලකුණු කරන්න.

**නිපුණතා මට්ටම :** 1.3. හුදෙකලා ව පැවති රටවල් ලෝකයට විවර වූ ආකාරය දේශ ගවේෂණ මගින් පෙන්වා දෙයි.

**කාලච්ඡේද** : 10 යි

**ඉගෙනුම් පල** :
- යුරෝපයේ දේශ ගවේෂණ ව්‍යාපාරයට පෙර ආසියා අප්‍රිකා හා අමෙරිකානු මහාද්වීපවල පැවති තත්ත්වය පැහැදිලි කරයි.
- යුරෝපයේ දේශ ගවේෂණ ඇති වීමට හේතු පැහැදිලි කරයි.
- දේශ ගවේෂණ ව්‍යාපාරය හා එහි ප්‍රතිඵල පෙන්වා දෙයි.
- දේශගවේෂණ ව්‍යාපාරය සිතියමක ලකුණු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

## 1.3. දේශ ගවේෂණ ව්‍යාපාරය

### දේශ ගවේෂණවලට පෙර ආසියා - අප්‍රිකා හා අමෙරිකා මහාද්වීපවල තත්ත්වය

යුරෝපා දේශ ගවේෂණවලට පෙර ආසියා, අප්‍රිකා හා අමෙරිකා මහාද්වීපවල තත්ත්වය ගැන අධ්‍යයනය කිරීම අවශ්‍ය වේ. විශේෂයෙන් ම 15වෙනි සියවසේ දේශ ගවේෂණ ව්‍යාපාර ආරම්භ වීමට සමගාමී ව ආසියාව තුළ ඉතා දියුණු ආර්ථික, දේශපාලන හා සමාජීය වටපිටාවක් පැවතිණ. විශේෂයෙන් ම ඉන්දියාව සුවිශේෂ වූ ශිෂ්ටාචාරයක උරුමය හිමි කර ගෙන සිටි අතර චීනය ද ඒ වන විට ආසියාවේ අධිරාජ්‍ය තත්ත්වයට පත් වී සිටියේ ය. ශ්‍රී ලංකාව සහ ඇතැම් අග්නිදිග ආසියාතික රටවල් අතර අතිශය වැදගත් ආර්ථික, ආගමික හා දේශපාලන සබඳතා මනා ලෙස ගොඩනැඟී තිබිණි. බටහිර ජාතීන් අමෙරිකාවට සංක්‍රමණය වීමට පෙර එම ප්‍රදේශවල ස්වදේශී ජන කණ්ඩායම් ව්‍යාප්ත වී සිටියහ. විශේෂයෙන් ඉන්කා, මායා සහ ඇස්ටෙක්වරුන්ගේ ශිෂ්ටාචාර අතිශය දියුණු මට්ටමක පැවති බවට පුරා විද්‍යාත්මක සාක්ෂ මගින් තොරතුරු ලැබේ. මෙම ප්‍රදේශ දෙකට ම වඩා අප්‍රිකා මහාද්වීපය තුළ පැවතුණේ වෙනස් ම තත්ත්වයකි. අඳුරු මහාද්වීපය ලෙස සැලකුණ අප්‍රිකා මහාද්වීපය තුළ ආර්ථික, දේශපාලන හා සමාජ මට්ටම එතරම් ඉහළ අගයක නොතිබිණ.

- **දේශ ගවේෂණ ව්‍යාපාරය ඇති වීමට තුඩුදුන් හේතු**
  - 1453 දී පෙර - අපර දෙදිග වෙළෙඳ මධ්‍යස්ථානය වූ කොන්ස්තන්තිනෝපලය තුර්කීන්ට අයත් වීම නිසාඑතෙක් යුරෝපා ජාතීන් භාවිතා කල වෙළෙඳ මාර්ග අවහිර වීම
  - ලෝකය පිළිබඳ ඇති වූ කුතුහලය
  - විද්‍යාත්මක සොයා ගැනීම්
  - අධිරාජ්‍ය ගොඩනගා ගැනීම
  - වෙළෙඳපොළ සොයා යාමේ අරමුණ
  - ආගම ප්‍රචාරය කිරීමේ අරමුණ
  - රාජ්‍ය අනුග්‍රහය ලැබීම
  - ත්‍රාසජනක අත්දැකීම් ලැබීමේ ආශාව
  - මුස්ලිම්වරුන් හා පැවැති තරගය

- **දේශ ගවේෂකයන් හා ඔවුන්ගේ සොයා ගැනීම්**
  - වස්කෝද ගාමා - කැලිකට් වරායට පැමිණීම
  - බර්තලොමිය දියස් - ශුභ පැතීමේ තුඩුව (කේප් තුඩුව

- ක්‍රිස්ටෝපර් කොලොම්බස් - බටහිර ඉන්දීය දූපත්, කියුබා හයිටි, හිස්පැනියෝලා යන කැරිබියන් දූපත්වලට කීහි පවරක් ගමන් කිරීම. එහි ප්‍රතිඵලයක් වශයෙන් අමරිකා මහාද්වීපය සොයා ගැනීම
- ෆර්ඩිනන්ඩ් මැගලන් - ප්‍රථම වරට ලෝකය වටා ගමන් කිරීම
- අමෙරිගෝ වෙස්පුචි - උතුරු අමෙරිකාවට ගොඩ බැසීම
- කබ්රාල් - දකුණු අමෙරිකාවේ බ්‍රසීලයට ගොඩ බැසීම
- මාක්විටේ - ක්විබෙක් ප්‍රදේශය සොයා ගැනීම
- කැබෝ සොයුරෝ - නිව්ෆවුන්ඩ්ලන්තය සොයා ගැනීම
- ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ - පීරු ප්‍රදේශ සොයා ගැනීම
- ෆර්ඩිනැන්ඩෝ කෝටේස් - මෙක්සිකෝ ප්‍රදේශ සොයා ගැනීම
- ජොයිලට් - මිසිසිපි ගංගා මිටියාවත සොයා ගැනීම
- ජැක්විස් කාටියර් - ශාන්ත ලෝරන්ස් ගංගාව හා ඒ අවට ප්‍රදේශ සොයා ගැනීම



මිසිසිපි ගංගා මිටියාවත

- **දේශ ගවේෂණවල ප්‍රතිඵල**

  - ආසියා, අප්‍රිකා සහ අමෙරිකා මහාද්වීපවල යුරෝපා බලය පැතිරීම
  - නව වෙළෙඳ නගර බිහි වීම
  - කාර්මික විප්ලවය පුළුල් විම
  - ආගමික ප්‍රචාරක කටයුතු
  - යුරෝපා ශිෂ්ටාචාරය ලොව පුරා ව්‍යාප්ත වීම
  - ලෝකයේ රටවල් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් ලෙස වර්ගීකරණය කෙරෙන තත්ත්වයක් උදා වීම
  - පෙර අපරදිග වෙළඳාම පුළුල් වීම
  - නව වෙළෙඳ නගර බිහි වීම
    උදා: ලිස්බන්, කේඩීස්, ලන්ඩන්
  - නව වෙළෙඳ භාණ්ඩ රාශියක් යුරෝපයට හඳුන්වා දීම
    උදාහරණ : අර්තාපල්, උක්, කොකෝවා, දුම්කොළ, සායම් වර්ග, ඉන්ඩිගෝ, තේ, කෝපි, පිඟන්භාණ්ඩ, තල්මස් තෙල්

- දේශ ගවේෂණය නිසා ඇති වූ වෙනස් වීම් නව ලෝකයේ උදාව කෙරෙහි බලපෑම
    * හුදකලාවපැවති රටවල් විවෘත වීම
    * රටවල පාලන ක්‍රමවල ඇති වූ වෙනස් වීම
    * බටහිරකරණය, නවීකරණය
    * ජාත්‍යන්තර වෙළෙඳාම




ඉන්ඩිගෝ වගාව



ඉන්ඩිගෝ සායම්



උක් වගාව



ඇගයීම -01

**පහත ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයන්න**
**නොගැලපෙන පිළිතුර තෝරන්න.**

1. (1) රොබට් ක්ලයිව්
   (2) වස්කෝ ද ගාමා
   (3) වස්කෝ ද බැල්බෝවා
   (4) හෙන්රි හඩ්සන්
   (5) ජැක්වීස් කාටියර්

(......................)

2. දේශ ගවේෂණ ව්‍යාපාරය ඇති වීමට බලපෑ සාධක
   (1) ලෝකය පිළිබඳ ඇති වූ කුතුහලය
   (2) අධිරාජ්‍ය ගොඩනගා ගැනීම
   (3) නව වෙළෙඳ නගර බිහි වීම
   (4) රාජ්‍ය අනුග්‍රහය ලැබීම
   (5) ත්‍රාසජනක අත්දැකීම් ලැබීමේ ආශාව

(......................)

x හා y තීරු නිවැරදිව ගලපන්න

| | x | y |
|---|---|---|
| 3. | 1. ස්පාඤ්ඤය | A. නිශ්ශබ්ද විලියම් |
| | 2. එංගලන්තය | B. හය වෙනි චාල්ස් |
| | 3. ප්‍රංශය | C. හත් වෙනි හෙන්රි |
| | 4. නෙදර්ලන්තය | D. ෆර්ඩිනන්ඩ් හා ඉසබෙලා |
| | 5. ඔස්ට්‍රියාව | E. හතරවන වෙනි හෙන්රි |

(1) BEACD (2) DABCE (3) DEACB (4)DCEAB (5) DACED (......................)

ඇගයීම -02

1. දේශ ගවේෂණ ව්‍යාපාරය නව ලෝකයේ උදාව බලපෑ ආකාරය පැහැදිලි කරන්න.

ඇගයීම -03

1. දේශගවේෂණ ව්‍යාපාරයේදී වැදගත් වූ රටවල් සිතියමක ලකුණු කරන්න.

## 2. යුරෝප බල ව්‍යාප්තිය හා අධිරාජ්‍ය ගොඩනැගීම

ක්‍රිස්තු භක්තික යුරෝපීයයන්ගේ අගනුවර මෙන් ම පෙර අපර දෙදිග වෙළෙඳ කටයුතුවල මධ්‍යස්ථානය වූ කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් යටතට පත්වීම නිසා යුරෝපා ජාතීන් පෙරදිග සමඟ කළ වෙළෙඳාමට බාධා එල්ල වීම, ජාතික රාජ්‍යයන්ගේ අනුග්‍රහය මත පෙරදිග රටවල් සමඟ සබඳතා පවත්වා ගැනීම පිණිස පෙරදිගට නව වෙළෙඳ මාර්ග සොයා යාම හා දේශ ගවේෂණ ව්‍යාපාරය ආරම්භ වීම පිළිබඳ පසුගිය පාඩමෙන් ඔබේ අවධානයට යොමු කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආසියා, අප්‍රිකා, අමෙරිකා මහාද්වීපවල යටත් විජිත පිහිටුවා ගැනීමට යුරෝපා ජාතීහු සමත් වූහ. මේ ආකාරයට යුරෝපා රටවල බලය යුරෝපා මහාද්වීපයෙන් පිටත වෙනත් රටවල් කරා පැතිර යාම යුරෝපා බල ව්‍යාප්තිය ලෙස හැඳින්වේ. මෙය අධිරාජ්‍යවාදී ක්‍රියාවලියකි.

කිසියම් දේශසීමාවක් තුළ පිහිටි රාජ්‍යයක් ස්වකීය ආධිපත්‍යය තවත් දේශ සීමාවක පිහිටි රාජ්‍යයක් කෙරෙහි පැතිර වීම අධිරාජ්‍යවාදය ලෙස හඳුන්වයි.

මෙසේ බටහිර ආධිපත්‍යයට යටත් වූ රාජ්‍ය එයින් පසු යටත් විජිත බවට පත් විය.එම රාජ්‍යයන් තුළ යටත් විජිත බවට පත් වීමට පෙර ක්‍රියාත්මක වෙමින් පැවති පාලන, ආර්ථික හා සමාජ ව්‍යුහයන් වෙනස් කොට අධිරාජ්‍යවාදීන්ට අවශ්‍ය පරිදි හැඩගස්වා ගැනීම යටත් විජිතවාදය ලෙස හඳුන්වයි.

- 1850න් පසු ව, විශේෂයෙන් ම කාර්මික විප්ලවයෙන් පසු ව මෙම ක්‍රියාවලියේ ස්වරූපය වෙනස් විය. එතැන් පටන් එය ''නව අධිරාජ්‍යවාදය'' ලෙස හැඳින්වි ය.
- යටත් විජිත අත්පත් කර ගැනීම අධිරාජ්‍ය ගොඩනැගීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ වන බැවින් අධිරාජ්‍යවාදය සහ යටත් විජිතවාදය අතර සම්බන්ධයක් පවතී.

දේශ ගවේෂණ ව්‍යාපාරයත් සමඟ යුරෝපීය රටවල් වෙනත් මහාද්වීප කරා අවධානය යොමු කරමින් යටත් විජිත පිහිටුවා ගැනීම හා අධිරාජ්‍ය ගොඩනගා ගැනීම මඟින් තම බලය ව්‍යාප්ත කිරීම මෙම ඒකකය තුළින් ඔබගේ අවධානයට යොමු කර ඇත.

**නිපුණතාව** : • නූතන ලෝකයේ උදාවට බලපෑ බලවේග පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 2.1 යුරෝපයේ බලවත් රාජ්‍යය ලෝකය පුරා තම බලය ව්‍යාප්ත කළ ආකාරය විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : **20 යි.**

**ඉගෙනුම් පල** :
- යුරෝප රටවල් සෙසු මහාද්වීප කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු පැහැදිලි කරයි.
- යුරෝප රටවල් ලෝකයේ වෙනත් රටවල තම බලය ව්‍යාප්ත කළ ආකාරය පෙන්වා දෙයි.
- යුරෝප බල ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

**2. යුරෝප බල ව්‍යාප්තිය හා අධිරාජ්‍ය ගොඩනැගීම**

**යුරෝප බල ව්‍යාප්තියට පසුබිම් වූ හේතු :-**
- පෘතුගාලය, ස්පාඤ්ඤය, ඕලන්දය, එංගලන්තය හා ප්‍රංශය යන යුරෝපීය රටවල් ඒ සඳහා දායක වීම

- **ආගම් ප්‍රචාරය කිරීම**

  - පෙරදිග ඉස්ලාම් බලය දුර්වල කිරීම සහ එමගින් ඔවුන්ගේ ආර්ථික ශක්තිය දුර්වල කර පෙරදිග වෙළෙඳ බලය ක්‍රිස්තු භක්තිකයන් අතට ලබා ගැනීම

- රෝමානු කතෝලික හා රෙපරමාදු යන අංශ දෙක ම ආගම ප්‍රචාරය කෙරෙහි උනන්දු වීම
- යුරෝප රටවල හටගත් අභ්‍යන්තර ආගමික ගැටුම් හා කැරලි
- එහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් ජන කණ්ඩායම් ආගමික නිදහස පතා වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීමට කැමැත්තෙන් සිටීම
  උදාහරණ : - එංගලන්තයේ පියුරිටන්වාදී පිරිස් අමෙරිකානු ජනපදවල පදිංචියට යාමට කැමැත්තක් දක්වීම

- **ආර්ථික අභිමතාර්ථ**
  - ජාතික රාජ්‍ය බිහි වීමත් සමඟ යුරෝපයේ හටගත් ආර්ථික තරගය

- **වාණිජවාදය**
  - පෞද්ගලික ව්‍යවසාය දිරිගැන්වීම
  - එමඟින් බද්ධ ව්‍යාපාර සමාගම් බිහි වීම
    උදාහරණ :- ලන්දේසි පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම, ප්‍රංශ පෙරදිග වෙළෙඳ සමාගම, බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම
  - මෙම සමාගම් යුරෝපයෙන් පිටත දී ලාභ ඉපයීමට අවස්ථාව සෙවීම

- **ගන රන්වාදය**
  - යුරෝපා රටවල් රන්, රිදී වැනි වටිනා ලෝහ සංචිතතම රටවල පවත්වා ගෙනයාමේ තරගයක නිරත වීම
    උදාහරණ :- ලතින් අමෙරිකාවේ රන්, රිදී නිධි පිහිටි ප්‍රදේශ ස්පාඤ්ඤය විසින් අත්පත් කර ගනු ලැබීම

- **වැඩවසම් ක්‍රමය බිඳවැටීමත් සමග ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය හා නගර බිහි වීම හේතුවෙන් යුරෝප රටවල හටගත් තත්ත්වය**
  - නගරවලට ජනයා ඇදී ඒම වැඩි වීම
  - ඒ සමඟ ම විරැකියාව, ආහාර හිගය, නිවාස ප්‍රශ්න, සෞඛ්‍ය හා සමාජ ගැටලු උග්‍ර වීම
  - මේ තත්ත්වය ඒ රටවල ආර්ථික වර්ධනයට අහිතකර වීම
  - යුරෝපයෙන් බැහැර ප්‍රදේශවල ජනයා පදිංචි කිරීමට කටයුතු කිරීම
    උදාහරණ :- අමෙරිකාවේ ජනපද පිහිටුවා මෙබඳු පිරිස් ඒවායේ පදිංචි කිරීමට එංගලන්තය යොමු වීම

**යටත් විජිත ව්‍යාප්ත කිරීම සඳහා අනුගමනය කළ ප්‍රතිපත්තිය**

- **ජනපද පිහිටුවීම**
  - යුරෝප රටවල ජනතාව ස්වකීය රටවල් අත්පත් කරගත් ප්‍රදේශවලට සංක්‍රමණය වී ඒවායේ ජනාවාස ඇති කර ගැනීම
  - බොහෝ විට එම ප්‍රදේශවල සිටි ස්වදේශිය ජනතාව පලවා හැරීම
    උදාහරණ :- එංගලන්තයෙන් අමෙරිකාවට සංක්‍රමණය වූ ජානපදිකයන් විසින් ස්වදේශික රතු ඉන්දියානු ප්‍රජාව අවතැන් කරනු ලැබීම, අප්‍රිකානු මහාද්වීපයේ විවිධ ප්‍රදේශ යුරෝපීය රටවල් අත්පත් කර ගැනීමත් සමඟ එහි සිටි ගෝත්‍රික ජනයා විවිධ ප්‍රදේශවලට සීමා වීම

- **ස්වදේශික ජනතාව යටත් කර ගැනීම**

  - යටත් කර ගත් ප්‍රදේශවල ක්‍රියාත්මක වෙමින් පැවති ඇතැම් ස්වදේශීය පාලන හා පරිපාලන යාන්ත්‍රණ එපරිදි ම ක්‍රියාත්මක කිරීම
    උදාහරණ :- ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසීන් හා ලන්දේසීන් අනුගමනය කළ පාලනය යටතේ ස්වදේශීය රාජකාරී ක්‍රමය එසේ ම පවත්වා ගැනීම
  - යටත් ප්‍රදේශවල බලය තහවුරු කර ගැනීම සඳහා බලවත් අධිරාජ්‍යවාදී රාජ්‍යවල ක්‍රියාත්මක වූ පාලන හා පරිපාලන ව්‍යුහයන් යටත් විජිතවලට හඳුන්වා දීම
    උදාහරණ :- බ්‍රසීලයේ පෘතුගීසි පාලනය

- **අඩු වියදමකින් වැඩි ම ලාභ ලැබීමේ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම**

  - යටත් විජිතවල පැවති වෙළෙඳ ද්‍රව්‍ය හා සම්පත් ලබාගෙන මවු රටට යැවීම
    උදාහරණ :- පෙරදිගින් කුළුබඩු හා ලතින් අමෙරිකාවෙන් රත්‍රං, අප්‍රිකාවෙන් වහලුන්
  - පසුව යටත් විජිත ආර්ථික ව්‍යුහය වෙනස් කරමින් අධිරාජ්‍යවාදී රටවලට අවශ්‍ය දෑ නිෂ්පාදනය හා අපනයනය සඳහා යොමු වීම
  - උපයන ලාභය යටත් විජිතයේ සංවර්ධනය උදෙසා ආයෝජනය නොකොට මවු රටට ගෙන යාම

- **ස්වදේශිකයන්ගේ අවනත භාවය තහවුරු කර ගැනීමට උපක්‍රම යෙදීම**

  - ආගම ප්‍රචාරය, අධ්‍යාපන ක්‍රමය, විවිධ ලහ ප්‍රයෝජන ලබා දීම හා විවිධ සංස්කෘතික ලක්ෂණ හඳුන්වා දීම
  - ''ශිෂ්ටත්වයට පත් කිරීම'' යන මූලධර්මය ක්‍රියාත්මක කිරීමේ මුවාවෙන් රෝමානු කතෝලික හා රෙපරමාදු වැනි ක්‍රිස්තු භක්තික ආගම් ව්‍යාප්ත කිරීම

- **අධිරාජ්‍යවාදී රටවලට වාසිදායක යටත් විජිත ප්‍රතිපත්ති හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම**

  - නව පනත් හඳුන්වා දෙමින් යටත් විජිත සමඟ කෙරෙන ආර්ථික කටයුතු වර්ධනය කිරීම
    නිදර්ශන :- 1850 දී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව හඳුන්වා දුන් යකඩ පනත (Iron Act) යටතේ යටත් විජිතවලින් බදු රහිත ව යපස්, ආනයනය කිරීමට පහසුකම් සලස්වා දීම මගින් බ්‍රිතාන්‍ය ව්‍යාපාරිකයන්ට අලුත් ජනපදවල ව්‍යාපාර ආරම්භ කිරීමට අවස්ථාව සැලසීම

- **අධිරාජ්‍ය ගොඩනැගීම**

  යුරෝපා බලව්‍යාප්තියත් සමග අධිරාජ්‍ය ගොඩනැගීම ප්‍රධාන භූගෝලීය කලාප තුනක් ආශ්‍රිත ව සිදු විය. එනම් උතුරු අමෙරිකාව, ආසියාව හා අප්‍රිකාව යන ප්‍රදේශවල ය.

  1492 දී කොලොම්බස් විසින් ස්පාඤ්ඤයෙන් ආරම්භ කරන ලද දේශ ගවේෂණ හරහා කැරිබියානු දූපත්, අමෙරිකානු ප්‍රදේශ, දකුණු අමෙරිකාව හා ආසියාවට ගමන් කළ හැකි නව මුහුදු මාර්ගයක් සොයා ගන්නා ලදි. උතුරු හා දකුණු අමෙරිකානු ප්‍රදේශ 'නව ලෝකය' ලෙස හැඳින්වූ අතර ඒවාට 'අමෙරිකාව' යන නාමය හිමි වූයේ ඉතාලියානු ජාතික දේශගවේෂක අමෙරිගෝ වෙස්පූචිට ගෞරවයක් ලෙසිනි.

**ස්පාඤ්ඤ බල ව්‍යාප්තිය**

- ආගම ප්‍රචාරය හා වෙළෙඳාම සඳහා යටත් විජිත සොයා ගවේෂණවල යෙදුණු ස්පාඤ්ඤවරුන් ක්‍රි.ව. 1600 පමණවන විට විශාල අධිරාජ්‍යක් ගොඩනඟා ගැනීම
- ලතින් අමෙරිකානු ප්‍රදේශවල ස්පාඤ්ඤවරුන් ගේ ප්‍රධානත ම යටත් විජිත පිහිටුවීම
  ක්‍රි.ව. 16 හා 17 වෙනි සියවස් වන විට මධ්‍යම හා ලතින් අමෙරිකානු භූමියෙන් 3/5 ක පමණ ප්‍රදේශයක අධිරාජ්‍ය ව්‍යාප්ත කර තිබීම

- වර්තමාන අමෙරිකා එක්සත් ජනපදයට අයත් ෆ්ලොරිඩා, මෙක්සිකෝ සහ පැනමා සිට ට්‍රිනිඩෑඩ් තෙක් බටහිර ඉන්දියා දූපත් සහ ආසියාවේ පිලිපීනය, ඕෂිනියාව හා ඒ අවට දූපත් ඒ අතර විය
- මවු රටට හැකිතාක් ධනය රැගෙන යාමේ අරමුණු ඇති ව වෙළෙඳ ඒකාධිකාරය හා ගන රන්වාදය ක්‍රියාත්මක කිරීම
- කතෝලික ආගම යටත් විජිතවලට බලහත්කාරයෙන් ම හඳුන්වා දීම
- 19 වන සියවසේ මුල් භාගයේ දී අධිරාජ්‍ය බිඳ වැටීම
- අධිරාජ්‍ය පිහිටුවීම නිසා හටගත් ප්‍රතිඵල
  - ස්වදේශීය ශිෂ්ටාචාර බිඳ වැටීම
  - 16 වන සියවසේ ස්පාඤ්ඤය යුරෝපයේ ධනවත් ම රට බවට පත් වීම

**පෘතුගාල බල ව්‍යාප්තිය**

- ලොව පුරා තැනින් තැන යටත් විජිත ඇති කර ගැනීම
  - දකුණු අමෙරිකාව, ආසියාව හා අප්‍රිකානු මහාද්වීප ඊට අයත් වීම
  - දකුණු අමෙරිකාවේ බ්‍රසීලය, දකුණු ආසියාවේ ඉන්දියාව හා ශ්‍රී ලංකාව, අග්නිදිග ආසියාවේ මලක්කා, ටිමෝර් වැනි ප්‍රදේශ
- යටත් විජිත ඇති කර ගැනීමට බලපෑ හේතු
  - දකුණු අමෙරිකාව - වටිනා ලෝහ ලබාගැනීම සහ වතු වගාව
  - ආසියානු ප්‍රදේශ - වෙළෙඳාම, ආගම ප්‍රචාරය හා සංග්‍රාමීය වැදගත්කම
  - අප්‍රිකානු ප්‍රදේශ - වහල් වෙළෙඳාම සහ වටිනා ලෝහ ලබාගැනීම
- 17 වෙනි සියවස වන විට අධිරාජ්‍යය බිඳවැටීම ආරම්භ වීම

**ඕලන්ද බල ව්‍යාප්තිය**

- වෙළෙඳාම, නාවික බලය, ජාතිකවාදී හැඟීම් හා රාජ්‍ය අනුග්‍රහය අධිරාජ්‍ය ව්‍යාප්තියට ආධාර වීම
- 17 වෙනි සියවසේ දෙවන භාගය වන විට ඕලන්ද බල ව්‍යාප්තියේ ස්වර්ණමය යුගය උදා වීම
- ආසියාව, අප්‍රිකාවේ නැගෙනහිර කොටස් හා උතුරු අමෙරිකාවේ අත්ලාන්තික් සාගර ප්‍රදේශවල යටත් විජිත බිහි කර ගැනීම
- අධිරාජ්‍යය බිඳවැටීම
  - ආසියාවේ අධිරාජ්‍යයට බ්‍රිතාන්‍ය තර්ජනයක් වීම
  - 1670 පමණ වන විට අමෙරිකාවේ ඕලන්ද බලය බිඳවැටීම

**බ්‍රිතාන්‍යය අධිරාජ්‍යය ව්‍යාප්ත වීම**

- 19 වෙනි සියවස වන විට ලොව විශාලත ම හා ප්‍රබල ම අධිරාජ්‍යය පිහිටුවීම
  - ලෝක භූමි ප්‍රමාණයෙන් 1/4 පමණ ඊට අයත් වීම
  - **'හිරු නොබසින අධිරාජ්‍යය'** නම් විරුදාවලිය ලැබීම
  - 1815 සිට 1914 අතර කාලය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය සියවස ලෙස හැඳින්වීම
  - ජැමෙයිකාව, බහාමා දූපත්, බාර්බඩෝස් ඇතුළත් බටහිර ඉන්දීය දූපත්, උතුරු අමෙරිකානු ප්‍රදේශ, ඉන්දියාව, ශ්‍රී ලංකාව, මලයාසියාව ඇතුළත් ආසියානු ප්‍රදේශ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට අයත් වීම මෙම ප්‍රදේශවල උක්, කපු, කෝපි, තේ, රබර් වැනි වාණිජ බෝග හා ස්වභාවික ඛනිජ ද්‍රව්‍ය (රන්, මිනිරන්, මැණික්, රිදී) වල වෙළෙඳ බලය ලබා ගැනීම
  - ත්‍රිකෝණ වෙළෙඳාම (Triangular Trade)
    - * යුරෝපය, අප්‍රිකාව හා අමෙරිකාව අතර ක්‍රියාත්මක වූ වෙළෙඳාම මෙ නමින් හැඳින්වීම
    - * බ්‍රිතාන්‍යයන් තම ආධිපත්‍යට යටත් අප්‍රිකානු ප්‍රදේශවලින් අල්ලාගත් නීග්‍රෝ ජාතිකයින් අමෙරිකාවේ යටත් විජිතවලට වහලුන් ලෙස විකුණා ඒ වෙනුවට සීනි, කපු, දුම්කොළ වැනි ද්‍රව්‍ය ලබාගෙන නැවත යුරෝපා ප්‍රදේශවලට ගෙනයාම. ඒ අනුව
    යුරෝපය, අමෙරිකාව හා අප්‍රිකාව අතර ත්‍රිකෝණ වෙළෙඳාම සිදු වීම

- 16 හා 17වෙනි සියවස්වල සිට ම අධිරාජ්‍ය ව්‍යාප්තිය සිදු වීම
  - දේශ ගවේෂණ, වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවීම හා යටත් විජිත පිහිටු වීම මඟින් අධිරාජ්‍ය ව්‍යාප්තිය සිදු කිරීම
- යටත් විජිත පිහිටු වීම හා වෙළෙඳ කටයුතු සඳහා වෙළෙඳ සමාගම් පිහිටු වීම
- කල් යත් ම විශාල අධිරාජ්‍යයක් පවත්වා ගෙන යාම දුෂ්කර වීම
  - යටත් විජිත අත්පත් කරගන්නා විට තවත් තැනක යටත් විජිත නිදහස් වීම
  - ප්‍රංශය වැනි විරුද්ධ බලවේගවල සහ යටත් විජිතවලට හිමි වීම
    උදාහරණ: අමෙරිකානු නිදහස් සටනට ප්‍රංශ ආධාර ලැබීම
  - ලෝක යුද්ධවලට සම්බන්ධ වීම හා යටත් විජිතවලට නිදහස ලැබීම

- යුරෝපා බල ව්‍යාප්තියත් සමඟ ලෝකයේ සිදු වූ පරිවර්තන

  - දේශපාලන
    * යටත් විජිතවල පාලන හා පරිපාලන ව්‍යුහ බිඳවැටීම
    * විවිධ වාර්ගික හා දේශපාලන අර්බුද නිර්මාණය වීම

  - ආර්ථික
    * යටත් විජිතවල පැවති දේශීය ආර්ථික ක්‍රම බිඳ වැටීම
    * බොහෝ ප්‍රදේශවල ආර්ථික ක්‍රම ද්විත්ව ස්වරූපයක් ගැනීම
      - අධිරාජ්‍යවාදී අවශ්‍යතා මත හඳුන්වා දුන් වාණිජ බෝග ආර්ථිකය
        උදාහරණ: ශ්‍රී ලංකාවේ වතු වගා ආර්ථිකය ආරම්භය හා ව්‍යාප්තිය
      - දේශීය යැපුම් ආර්ථිකය පරිහානියට පත් වීම
    * සම්පත් සූරාකෑම
    * යටත් විජිත බලවතුන් ලෝක ආර්ථික බලවතුන් බවට පත් වීම

  - සමාජයීය
    * යටත් විජිතවල පැවති සමාජ සංවිධාන බිඳවැටීම
    * බටහිර ආභාසය සහිත මිශ්‍ර සමාජයීය ලක්ෂණ ඇති වීම
    * නව ජන කණ්ඩායම් බිහි වීම
      උදාහරණ: ශ්‍රී ලංකාවේ බර්ගර්වරු, ඉන්දියාවේ ඇංග්ලෝ ඉන්දියානුවෝ, ලතින් අමෙරිකාවේ හිස්පැනික්වරු
    * පන්ති සහිත සමාජ ක්‍රමයක් බිහි වීම

  - සංස්කෘතික
    * බටහිර සිරිත් විරිත් එකතු වීම
    * භාෂාවලට නව වචන හා සංකල්ප එකතු වීම
    * කතෝලික ආගමේ බලපෑම
    * නව කලා අංග හඳුන්වා දීම
    * දේශීය සංස්කෘතියේ ඇතැම් අංග අභාවයට යාම

ඇගයීම - 01

යුරෝප බලව්‍යාප්තියට සම්බන්ධ රටවල් හා යටත් විජිත ලෝක සිතියමක ලකුණු කරන්න

ඇගයීම - 02

**පහත ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු තෝරා තිත් ඉර මත ලියන්න**

1. අධිරාජ්‍යවාදය යනු
   (1) යුරෝප රටවල් පෙර අපර දෙදිග රටවල බලය පැතිරවීම හා එම රටවල් තමන්ට නතු කර ගැනීම යි.
   (2)ආසියා, අප්‍රිකා හා අමෙරිකානු රටවල් යටත් විජිත බවට පත් කර ගනිමින් ස්වකීය බලය පැතිරවීම යි.
   (3) කිසියම් දේශසීමාවක පිහිටි රාජ්‍යයක් තවත් දේශසීමාවක පිහිටි රාජ්‍යයක් මත බලය පැතිරවීම යි.
   (4) කිසියම් රාජ්‍යයක ක්‍රියාත්මක දේශපාලන, සමාජ, ආර්ථික ක්‍රියාවලිය වෙනස් කර ස්වකීය බලය පැතිරවීම යි.

(.................)

2. යුරෝපීයයන් තම බලය විවිධ රටවල තම බලය ව්‍යාප්ත කිරීමේ දී ඒවායේ ස්වදේශිකයන්ගේ අවනත භාවය තහවුරු කිරිමට යෙදූ උපක්‍රමයක් වන්නේ,
   (1) ස්වදේශිකයන්ගේ නිෂ්පාදන මිලයට ගැනීම
   (2) ස්වදේශික පාලකයන්ගේ දුර්වලතා පෙන්වා දීම
   (3) පාසල් ආරම්භ කර අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සලසා දීම
   (4) යුරෝපා රටවල දියුණු ව පෙන්වා දෙමින් යටත් රටවල් යහපත් කරන බව ප්‍රචාරය කිරීම

(.................)

3. ත්‍රිකෝණ වෙළෙඳාම මෙහෙය වූ ජාතිකයින් කව්රුන් ද?
   (1) අමෙරිකානු ජාතිකයෝ
   (2) ස්පාඤ්ඤ ජාතිකයෝ
   (3) ඕලන්ද ජාතිකයෝ
   (4) බ්‍රිතාන්‍ය ජාතිකයෝ

(.................)

4. ඕලන්ද බලව්‍යාප්තිය දුර්වල වීමට බලපෑ සාධකයක් වූයේ,
   (1) බ්‍රිතාන්‍ය බල ව්‍යාප්තිය යි.
   (2) ප්‍රංශ බල ව්‍යාප්තිය යි.
   (3) ඕලන්ද පාලකයන්ගේ දුර්වලතාවය යි.
   (4) යටත් විජිත පවත්වා ගෙනයාමට විශාල මුදලක් වැය වීම යි.

(.................)

(5) X **තීරුව** Y **තීරුව සමග ගැලපෙන නිවැරදි සංයෝගය තෝරන්න**

| X | | Y |
|---|---|---|
| (i) වාණිජ වාදය | (A) | වටිනා ලෝහ රැස් කර තබා ගැනීමේ තරගය |
| (ii) ගන රන්වාදය | (B) | රටක පාලන, ආර්ථික, සමාජ ව්‍යුහයන් වෙනස් කර අධිරාජ්‍යවාදීන්ට අවශ්‍ය පරිදි හැඩගැස්වා ගැනීම |
| (iii) දේශ ගවේෂණය | (C) | වඩාත් ලාභ ලබා ගැනීම අරමුණ විය |
| (iv) අධිරාජ්‍යවාදය | (D) | කාර්මික විප්ලවයෙන් පසු ඇති විය |
| (iv) නව අධිරාජ්‍යවාදය | (E) | නව රටවල් සොයා ගැනීම |

(1) BACED (2) CAEBD (3) ACDBE (4) DEABC (5) ECADB

- අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4, සහ 5 යන කවර ප්‍රකාශ යුගල දැයි තෝරා අදාළ අංකය තිත් ඉර මත ලියන්න.

පළමුවන ප්‍රකාශය දෙවන ප්‍රකාශය

| | | |
|---|---|---|
| 1. | නිවැරදි ය | නිවැරදි ය |
| 2. | නිවැරදි ය | වැරදි ය |
| 3. | වැරදි ය | වැරදි ය |
| 4. | වැරදි ය | නිවැරදි ය |
| 5. | නිවැරදි ය | නිවැරදි ය පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි |

| පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|
| 6. යුරෝපයේ වැඩවසම් ක්‍රමය බිඳවැටීමත් සමඟ ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය ආරම්භ විය | ඉඩම් අහිමි ජනතාව නගරවලට ඇදී ඒමත් සමඟ සමාජ හා සෞඛ්‍ය ගැටලු රැසක් ඇති විය (.................) |
| 7. අමෙරිකාවේ ජනපද පිහිටුවා ඒවායේ ජනතාව පදිංචි කිරීමට එංගලන්තය යොමු විය | යටත් විජිතවලින් උපයන ලාභය එහි සංවර්ධනය උදෙසා වැය කොට ඉතිරිය පමණක් තම මව් රටට ගෙනයාමට අධිරාජ්‍යවාදීහු ක්‍රියා කළහ (.................) |
| 8. ස්පාඤ්ඤවරුන් ක්‍රි.ව. 1600 පමණ වන විට ආසියා මහාද්වීපයේ විශාල අධිරාජ්‍යයක් ගොඩනඟා තිබුණි | ක්‍රි.ව. 1800 ඔලන්ද බලව්‍යාප්තියේ ස්වර්ණමය යුගය යි (.................) |
| 9. 19වෙනි සියවස වන විට විශාලත ම හා ප්‍රබල ම අධිරාජ්‍ය වූ බ්‍රිතාන්‍යයට ලෝක භූමි ප්‍රමාණයෙන් 3/4 ක් ම අයත් විය | නැගෙනහිර ඉන්දියා දූපත් වල බලව්‍යාප්තියේ දී බ්‍රිතාන්‍යයේ ප්‍රධාන ම තරඟකරු වූ ඕලන්දය බ්‍රිතාන්‍යයට තර්ජනයක්ද විය (.................) |
| 10. ද්විත්ව ආර්ථික ක්‍රමය යනු ආනයන හා අපනයන වෙළෙඳාම් කටයුතු වලින් සමන්විත ආර්ථික ක්‍රමයකි | ශ්‍රී ලංකාවේ බර්ගර්වරුන්, ඉන්දියාවේ ඇංග්ලෝ ඉන්දියානුවන් යුරෝප බල ව්‍යාප්තියත් සමග සිදු වූ පරිවර්තනයකි (.................) |

ඇගයීම - 03

**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

1. යුරෝප බල ව්‍යාප්තියට පසුබිම් වූ හේතු, උදාහරණ සපයමින් පැහැදිලි කරන්න
2. යුරෝපීයයන් යටත් විජිත ව්‍යාප්ත කිරීම සඳහා අනුගමනය කළ ප්‍රතිපත්ති උදාහරණ සපයමින් පැහැදිලි කරන්න
3. ගනරන්වාදය, අධිරාජ්‍යවාදය සහ නව අධිරාජ්‍යවාදය යන යෙදුම්වල අර්ථ පැහැදිලි කෙරෙන කෙට සටහන් ලියන්න.

## 3. නූතන ලෝකය හැඩගැස්වූ විප්ලව

1215 දී මහාධිකාර පත්‍රය මැග්නා කාර්ටා මඟින් පළමු වරට රජුගේ බලය සීමා වූ අතර 1688 ඉංග්‍රීසි විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් රජුගේ බලය අඩු වී පාර්ලිමේන්තු බලය ප්‍රමුඛස්ථානයට පත් විය. 1689 අයිතිවාසිකම් ප්‍රකාශනය පරිදි රජුගේ බලය සීමා වී නීත්‍යානුකූල ව ම පාර්ලිමේනතුව උත්තරීතර තත්ත්වයට පත් විය. මෙම වෙනස්කම් ව්‍යවස්ථානුකූල අණපනත් මඟින් සිදු වීම හා දේශපාලන වශයෙන් ක්‍රමානුකූල ව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව බලවත් වූ ආකාරය සාකච්ඡා කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ.

ඉන්කා, මායා, ඇස්ටෙක්ස් ආදී ශිෂ්ටාචාර විනාශ කරමින් ස්පාඤ්ඤය දකුණු අමෙරිකාවේ ජනපද පිහිටුවා ගත් අතර ඉංග්‍රීසීහු උතුරු අමෙරිකාවේ වෙරළබඩ ප්‍රදේශවල ජනපද 13 ක් පිහිටුවා ගත්හ. එංගලන්ත මවු රජය යටතේ පාලනය වූ මෙම ජනපදවාසීහු එංගලන්ත රජය විසින් පනවන ලද පනත්වලට එරෙහි ව ''**නියෝජිතයන් නැත්නම් බදුත් නොමැත**'' යන සටන් පාඨය තේමා කොට ගනිමින් මවු රජයට විරුද්ධ ව සටනක් ඇරඹූ හ. ජෝර්ජ් වොෂිංටන්ගේ නායකත්වයෙන් සටන් කොට ඉංග්‍රීසින් පරාජය කළ ඔවුහු 1776 දී ප්‍රකාශයට පත්කළ නිදහස් ප්‍රකාශයක් මගින් අමෙරිකා එක්සත් ජනපදය නම් ස්වාධීන රාජ්‍යයක් බිහි කර ගත් ආකාරය ද මෙම පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරේ.

''නිදහස, සහෝදරත්වය, සමානනාත්මතාවය'' යන සටන් පාඨ තේමා කර ගනිමින් ප්‍රංශයේ දූෂිත පාලනයට විරුද්ධ ව 1789 දී ප්‍රංශ වැසියන් විසින් ආරම්භ කරන ලද සටන ''ප්‍රංශ විප්ලවය'' වශයෙන් හැඳින්විණි. වසර ගණනාවක් තිස්සේ ප්‍රංශයේ පැවති දේශපාලන, ආර්ථික, සමාජීය ආදී විවිධ හේතූන් ප්‍රංශ විප්ලවයට බලපෑ ආකාරයත් එවකට පැවති 16වෙනි ලුවී රජුගේ ඒකාධිපති රාජාණ්ඩුව බිඳ දමා ජනතා ජයග්‍රහණයක් ලබාගත් ආකාරයත්, ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල වශයෙන් බිහි වූ **මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය** ලෝක ඉතිහාසයේ සුවිශේෂ සිදුවීමක් බවත් ප්‍රංශ විප්ලවය යටතේ සාකච්ඡා කෙරේ. 1688 ඉංග්‍රීසි විප්ලවය, 1766 අමෙරිකානු නිදහස් සටන සහ 1789 ප්‍රංශ විප්ලවය යන විප්ලව තුන නූතන ලෝකය හැඩ ගැස්වීම කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳ ව අවධානය යොමු කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : • නූතන ලෝකයේ උදාවට බල පෑ බලවේග පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 3.1.පාර්ලිමේන්තුවේ බලය ගොඩනැගීම සඳහා ඉංග්‍රීසි විප්ලවයේ දායකත්වය පරීක්ෂා කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :
- ඉංග්‍රීසි විප්ලවයට හේතු පහදයි
- ඉංග්‍රීසි විප්ලවයේ ආරම්භය හා වර්ධනය විස්තර කරයි.
- අධිරාජ්‍යවාදයට එරෙහි ව යටත් විජිත නිදහස පතා සටන් කළ ආකාරය අමෙරිකානු විප්ලවය ඇසුරෙන් පැහැදිලි කරයි.
- නූතන ලෝකයේ හැඩ ගැසීම කෙරෙහි ප්‍රංශ විප්ලවයේ දායකත්වය පෙන්වා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

### 3.1 1688 ඉංග්‍රීසි විප්ලවය

- **විප්ලවයේ පසුබිම**
  - එංගලන්ත පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය කාලාන්තරයක් තිස්සේ වර්ධනය වූවකි
  - 1215 මහා අධිකාර (මැග්නාකාර්ටා) පත්‍රයෙන් රජුගේ බලය සීමා වීම. එම පත්‍රයට අනුව,
    * මහා සභාවේ අනුමතිය නොමැති ව රජුට බදු අය කිරීමට බලයක් නොමැති වීම
    * නඩු විසඳීමකින් තොර ව නිදහස් වැසියෙකුට දඬුවම් කිරීමට බලයක් නොමැති වීම
    * රජු මෙම වගන්ති කඩ කළ හොත් (රජුට දඬුවම් කිරීමේ බලය) මහා සභාවේ බැරන්වරුන්ගේ මණ්ඩලයට හිමි වීම

- පළමුවෙනි එඩ්වර්ඩ් රජුගේ කාලයේ දී (1272 - 1307) බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය වර්ධනයේ වැදගත් අවස්ථාවක් වීම
- දෙවෙනි එඩ්වර්ඩ් රජුගේ කාලයේ දී (1307 - 1327) පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සහ විධායක බලතල ක්‍රමයෙන් වර්ධනය වීම
- දෙවෙනි රිචර්ඩ් රජුගේ කාලයේ දී (1377 - 1399) රජුගේ බලය දුර්වල වී පාරලිමේන්තු බලය වර්ධනය වීම
- හතරවෙනි හෙන්රි රජුගේ කාලයේ පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීම
- කතෝලික පල්ලිය සමඟ ඇති කොටගත් ගැටුම් නිසා අටවෙනි හෙන්රි රජු පාර්ලිමේන්තුවේ ආධාර ලබාගැනීම හේතුකොට පාර්ලිමේන්තු බලය වර්ධනය වීම (රෙපරමාදු පාර්ලිමේන්තුව)
- ස්ටුවර්ට් යුගයේ දී රජු හා පාර්ලිමේන්තුව අතර ඇති වූ ගැටුම් නිසා පාර්ලිමේන්තුව රජුට විරුද්ධ ව කටයුතු කිරීම හා එය පාර්ලිමේන්තුවේ බලය වර්ධනයට හේතු වීම
- පළමුවෙනි චාල්ස් රජු (1625 - 1649) අයිතිවාසිකම් පෙත්සම පිළිගැනීම, එමඟින් රජුගේ බලය අභිබවා පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීම
- එම පෙත්සමට අනුව,
  * පාර්ලිමේන්තු අනුමතිය නොමැති ව බදු අය කළ නොහැකි වීම
  * සාධාරණ නඩු විභාගයකින් තොරව මිනිසුන් බන්ධනාගාරගත කළ නොහැකි වීම
  * බදු නොගෙවූ පුද්ගලයන්ගේ නිවෙස්වල සොල්දාදුවන් නතර කිරීම තහනම් වීම
  * සාමකාමී අවස්ථාවල දී යුද්ධ නීතිය භාවිතා නොකළ යුතු වීම
- පළමුවෙනි චාල්ස් රජු පෙත්සම නොතකා අත්තනෝමතික ලෙස පාලනය ගෙනයාම
- 1648 දී අයිතිවාසිකම් පිළිබඳ පෙත්සම නිසා පාර්ලිමේන්තුව සහ රජු අතර නැවත ගැටුම් මතු වීම
- පළමුවෙනි චාල්ස් රජුගේ කාලයේ 1648 දී ඔලිවර් ක්‍රොම්වෙල්ගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුව හා රජු අතර සිවිල් යුද්ධයක් ඇති වීම. එහි දී පාර්ලිමේන්තුව ජය ගත් බැවින් ක්‍රොම්වෙල්ගේ නායකත්වයෙන් සමූහාණ්ඩුවක් බිහි වීම
- පාර්ලිමේන්තුව විසින් රජු වරදකරු කොට රජුගේ හිස ගසා දමනු ලැබීම
- ඔලිවර් ක්‍රොම්වෙල්ගේ නායකත්වය යටතේ සමූහාණ්ඩුව ක්‍රියාත්මක වීම
- දෙවෙනි චාල්ස් රජු බලයට පත් වීම සහ නැවත රාජාණ්ඩුව ක්‍රියාත්මක වීම (1660 - 1685)
- දෙවෙනි චාල්ස් රජුගේ කාලයේ නැවත පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීම
- මේ කාලයේ රජුට පක්ෂව ''ටෝරි'' සහ රජුට විපක්ෂව ''විග්'' යනුවෙන් දේශපාලන කණ්ඩායම් බිහි වීම
- පාර්ලිමේන්තුව සමඟ එකඟ වූ පරිදි කටයුතු නොකිරීම නිසා දෙවෙනි ජේම්ස් රජුගේ කාලයේ දී (1685 - 1688) රජු සහ පාර්ලිමේන්තුව අතර ගැටුම් වර්ධනය උග්‍ර වීම
- රජු සහ පාර්ලිමේන්තුව අතර ගැටුම් උග්‍ර වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1688 දී ඉංග්‍රීසි විප්ලවය ලේ නොසෙල්වුණු විප්ලවය) ඇති වීම
- දෙවෙනි ජේම්ස් රජු සිහසුන අතහැර පලා යාම
- පාර්ලිමේන්තුව විසින් සිහසුනට උරුමය තිබූ මේරි බිසව සහ විලියම් කුමරු (ඕලන්දයේ) ගෙන්වා ඔවුන්ට සිහසුන පවරනු ලැබීම
- ඉන්පසු අයිතිවාසිකම් පිළිබඳ පනත සම්මත කිරීම
- 1689 අයිතිවාසිකම් පිළිබඳ පනතට අනුව,
  * විලියම් සහ මේරි එංගලන්තයේ රජු සහ රැජිනිය ලෙස පිළිගැනීම
  * කතෝලික ආගම වැලඳගත් කිසිවෙකුට එංගලන්ත සිහසුන හිමි නොවිය යුතු බවට තීරණය වීම
  * පැවතුණු නීති වෙනස්කිරීමට හෝ අලුත් නීති පැනවීමට රජුට බලයක් නොමැති බව තීරණය වීම
  * පාර්ලිමේන්තුවේ අවසරය නෙලබා රජු විසින් අයබදු පැනවීම නොකළ යුතු වීම
  * පාර්ලිමේන්තුව සතු කතා කිරීමේ හා අදහස් පළකිරීමේ නිදහසට රජු බාධා නොකළ යුතු වීම
  * පාර්ලිමේන්තුවේ අවසරය නොමැති ව රජු විසින් ස්ථිර යුද හමුදාවක් තබා ගැනීම තහනම් වීම
  * 1689 අයිතිවාසිකම් පනතින් රජුගේ බලය අබිබවා පාර්ලිමේච්තුවේ බලය වර්ධනය වීම
  * අයිතිවාසිකම් පනත මගින් රජවරුන් පත්කිරීමේ බලය පාර්ලිමේන්තුවට ලැබුණු බැවින් දිගු කලක් තිස්සේ රජු සහ පාර්ලිමේන්තුව අතර පැවති අරගලය අවසන් වී පාර්ලිමේන්තුව ජයග්‍රහණය ලැබීම
  * 1689 අයිත්වාසිකම් පනත ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වීමට ද මඟ පෑදීම
  * රාජාණ්ඩු ක්‍රමය අබිබවා පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ස්ථාපිත කර ගැනීම

ඇගයීම - 01

**පහත දැක්වෙන එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවායින් එකක් කවර හෝ හේතුවක් නිසා සෙසු ඒවා සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම අඩංගු අක්ෂරය කඩ ඉරි මත ලියන්න.**

1. A. ලැන්කැස්ටර් B. ටියුඩර් C. බූර්බෝන් D. ස්ටුවර්ට් E. යෝර්ක්

(................)

2. A. පළමුවෙනි චාර්ල්ස් රජු B. දෙවෙනි එඩ්වර්ඩ් රජු C. තුන්වෙනි ජෝන් රජු
D. හත්වෙනි හෙන්රි රජු E. තුන්වෙනි විලියම් රජු

(................)

3. A. හත්වෙනි හෙන්රි රජු B. දෙවෙනි එලිසබෙත් රැජිනිය C. අටවෙනි හෙන්රි රජු
D. ඔලිවර් ක්‍රොම්වෙල් E. මේරි ටියුඩර්

(................)

4. **පහත ප්‍රශ්නවල X හා Y තීරු නිවැරදි ව ගළපා පිළිතුර තෝරන්න.**

| X | Y |
|---|---|
| 1. මහාධිකාර පත්‍රය | A. පළමුවෙනි චාල්ස් |
| 2. රෙපරමාදු පාර්ලිමේන්තුව | B. දෙවෙනි ජේම්ස් |
| 3. පුහු පාර්ලිමේන්තුව | C. පළමුවෙනි හා අටවෙනි හෙන්රි |
| 4. දීර්ඝ කාලීන පාර්ලිමේන්තුව | D. තුන්වෙනි ජෝන් |
| 5. උත්කෘෂ්ට විප්ලවය | E. පළමුවෙනි ජේම්ස් |

(1) CFABD (2) FABDC (3) DCEAB (4) ABDCE (5) BDCEA

(................)

5. එංගලන්තයේ පාර්ලිමේන්තු වර්ධනය සම්බන්ධයෙන් නොගැළපෙන පිළිතුර තෝරන්න.
   1. 1215 මහාධිකාර පත්‍රය අත්සන් කිරීම
   2. 1776 අමෙරිකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත නිදහස ප්‍රකාශ කිරීම
   3. 1628 දී පළමුවෙනි චාල්ස් රජු අයිතිවාසිකම් පිළිබඳ පෙත්සම පිළිගැනීම
   4. 1648 දී ඔලිවර් ක්‍රොම්වෙල්ගේ නායකත්වයෙන් සමූහාණ්ඩුවක් පිහිටුවීම
   5. 1689 අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය

(................)

ඇගයීම - 02

**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

1. 1688 ඉංග්‍රීසි විප්ලවයෙන් බ්‍රිතාන්‍ය රජුගේ බලය සීමා වූ ආකාරය පැහැදිලි කරන්න.

2. ස්ටුවර්ට් රාජවංශ යුගයේ දී රජු හා පාර්ලිමේන්තුව අතර ඇති වූ ගැටුම්වලට තුඩුදුන් හේතු පැහැදිලි කරන්න.

3. මහාධිකාර පත්‍රය අත්සන් කිරීමේ සිට 1689 තෙක් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය වර්ධනය වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

4. ඉංග්‍රීසි විප්ලවයට බලපෑ හේතු සාකච්ඡා කරන්න.

5. ඉංග්‍රීසි විප්ලවය නිසා ඇති වූ ප්‍රතිඵල පැහැදිලි කරන්න.

**නිපුණතා මට්ටම** : 3.2 ඇමරිකානු නිදහස් සටන ලෝක බලවේගයක් වූ ආකාරය විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : **07යි.**

**ඉගෙනුම් පල** :
- ඇමරිකානු නිදහස් සටන විස්තර කරයි.
- ඇමරිකාවේ බ්‍රිතාන්‍ය ජනපද සිතියමක ලකුණු කරයි.
- ඇමරිකානු නිදහස් සටන ලෝක ඉතිහාසය කෙරෙහි බලපෑම විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

3.2 අමෙරිකානු නිදහස් සටන

- **යුරෝපා ජාතීන් පැමිණෙනවිට අමෙරිකාවේ වාසය කළ මුල් පදිංචි කරුවන්**
  - යුරෝප ජාතීන් අමෙරිකාවට ගොඩබසින විට අමෙරිකාවේ සිට ස්වදේශික ජනතාව පොදුවේ රතු ඉන්දියානුවන් වශයෙන් හැඳින්වීම
  - 15වෙනි සියවස පමණ වන විට ඇමරිකාවට පා තැබූ යුරෝපීයයන් අමෙරිකාවේ විසූ දේශීයයනුත් හා ඔවුන්ගේ දියුණු ශිෂ්ටාචාරය විනාශ කොට යුරෝපා ශිෂ්ටාචාරයට අනුරූප වූ නව ශිෂ්ටාචාරයක් අමෙරිකානු ප්‍රදේශවල පිහිටු වීම

- **යුරෝප ජාතීන් අමෙරිකාවට සංක්‍රමණය වීමට හේතු**
  - ක්‍රි.ව. 1453 දී යුරෝපයේ ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය වූ කොන්ස්තන්තිනෝපලය මුස්ලිම්වරුන් විසින් අල්ලා ගනු ලැබීම නිසා පෙරදිගට යාමට තිබූ වෙළෙඳ මාර්ග අවහිර වූයෙන් යුරෝප ජාතීන් පෙරදිගට යාමට නව මුහුදු මාර්ගයක් සොයා යාමේ ප්‍රතිඵලයක් වශයෙන් අමෙරිකාවට ගොඩ බැසීම
  - එංගලන්තයේ ඇති වූ ආර්ථික හා සමාජයීය වෙනස්කම් නිසා පීඩාවට පත් ජනතාව ඔවුන්ට අවශ්‍ය රැකියා, වෙළෙඳ කටයුතු, ඉඩම් ආදී අවශ්‍යතාවන් සපුරා ගැනිමටත් වඩාත් යහපත් ජීවිතයක් ගත කිරීමේ අවස්ථාව උදා කොට ගැනීම සඳහාත් උතුරු අමෙරිකාවේ ජනපද පිහිටුවා ගැනීම
  - 16 හා 17වෙනි සියවස්වල යුරෝපයේ ඇති වූ ආගමික විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් ආගමික නිකායන් රාශියක් බිහි වීම හා ඒවා අතර ගැටීම් ඇති වීම
  - ඒවායින් පීඩාවට පත් ජනතාව ආගමික නිදහස පතා අමෙරිකානු ප්‍රදේශවලට යාම

- **ඉංග්‍රීසින් අමෙරිකාවේ ජනපද පිහිටුවීම**
  - පෘතුගීසීහු, ස්පාඤ්ඤවරු, ප්‍රංශයෝ හා ලන්දේසීහු අමෙරිකාවේ ජනපද පිහිටු වූ සෙසු යුරෝප ජාතීහු වෙති.
    - * ඉංග්‍රීසින් උතුරු ඇමරිකාවේ නැගෙනහිර වෙරළබඩ ජනපද 13ක් පිහිටු වීම.
    - * ජෝර්ජියා, දකුණු කැරොලිනා, උතුරු කැරොලිනා, වර්ජිනියා, මේරිලන්ඩ්, ඩෙලවෙයාර්, නිව් ජර්සි, පෙන්සිල්වේනියා, කනෙක්ටිකට්, රෝඩ් අයිලන්ඩ්, මැසචුසෙට්ස්, නිව් හැම්ප්ෂයර්, නිව්යෝර්ක් යන ජනපදවල බලය පිහිටුවාගත් ඉංග්‍රීසින් එම ජනපද මවු රාජ්‍යය යටතේ තබා ගැනීම

- **බ්‍රිතාන්‍යය යටතේ අමෙරිකානු ජනපද පාලනය වූ ආකාරය**
  - බ්‍රිතාන්‍යය රජු විසින් පත් කරන ලද ආණ්ඩුකාරයකු හා උපදේශක මණ්ඩලයක් මගින් අමෙරිකානු ජනපද පාලනය වීම

- ජනපද පාලනය සඳහා බ්‍රිතාන්‍යය කිරීටයට හා පාර්ලිමේන්තුවට විශාල බලයක් තිබීම
- ජනපද වාසීන් පාලන කටයුතු සම්බන්ධයෙන් ස්වාධීනත්වයක් භුක්ති විඳි බැවින් ජනපදවාසීන් එම පාලනයට විරුද්ධ නොවීම
- ආර්ථික වශයෙන් ජනපද වාසීන්ට එතරම් ස්වාධීනත්වයක් නොතිබීම.
- අමෙරිකානු ජනපදවල කාර්මික දියුණුවක් ඇති වීම පිළිබඳ බ්‍රිතාන්‍යයන් තුළ කැමැත්තක් නොතිබීම.
- උතුරු අමෙරිකාවේ ජනපද, තම නිෂ්පාදන සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබාගන්නා ප්‍රදේශ වශයෙන් හා තම කාර්මික නිෂ්පාදන අලෙවි කොට ලාභ ලබා ගත හැකි වෙළෙඳ පොළක් වශයෙන් පමණක් බ්‍රිතාන්‍යයන් විසින් සැලකීම

  උදාහරණ: බ්‍රිතාන්‍යයන්ගේ රෙදිපිළි නිපදවීමට අවශ්‍ය කපු වැවීමට සහ සිගරට් සඳහා අවශ්‍ය දුම්කොළ වැවීමට පමණක් ජනපද වාසීන්ට අනුබල දුන් අතර රෙදිපිළි නිපදවීම හා සිගරට් නිපදවීමේ කර්මාන්තයේ යෙදීම තහනම් කිරීම
- එම අමුද්‍රව්‍ය සියල්ල එංගලන්තයට අලෙවි කළ යුතු වීම සහ එංගලන්තය ඒවායේ මිල නියම කිරීම
- නාවික නීති, තීරුබදු ආදිය මඟින් ජනපදවල ආර්ථික කටයුතු සීමා කිරීමට බ්‍රිතාන්‍යයන් කටයුතු කිරීම
- සාමාන්‍ය නැව් සඳහා එම නීති රීති දැඩි ලෙස ක්‍රියාත්මක නොවීම



සිගරට් සඳහා අවශ්‍ය දුම්කොළ අමෙරිකාවේ දී වගා කිරීම



රෙදිපිළි කර්මාන්තය සඳහා අවශ්‍ය කපු අමෙරිකාවේ දී වගා කිරීම දැක්වෙන චිත්‍රයක්

- **අමරිකානු නිදහස් සටන**

  - උතුරු අමරිකාවේ නැගෙනහිර වෙරළෙහි පිහිටි බ්‍රිතාන්‍ය ජනපද දහතුන එක් ව බ්‍රිතාන්‍යය අධිරාජ්‍යයෙන් නිදහස් වීම සඳහා ගෙනගිය සටන අමෙරිකානු නිදහස් සටන නමින් හඳුන්වනු ලැබීම. එය අමෙරිකානු විප්ලවය ලෙසද භාවිත කෙරේ.
  - උතුරේ පැවති ප්‍රංශ ජනපදවලින් සහ බටහිර ප්‍රදේශයේ සිටි රතු ඉන්දියානුවන්ගෙන් එල්ල වූ තර්ජනවලින් ආරක්ෂා වීම සඳහා ජනපද වාසීන්ට මවු රජයේ ආරක්ෂාව අවශ්‍ය වීම
  - 1756-1763 තෙක් බ්‍රිතාන්‍යය හා ප්‍රංශය අතර පැවති හත් අවුරුදු යුද්ධයෙන් ප්‍රංශය පරාජය වීම
  - රතු ඉන්දියානුවන් ද පරාජය කිරීමට හැකි වීම
  - මේ නිසා උතුරෙන් සහ බටහිර ප්‍රදේශවලින් එල්ල වුණු තර්ජන අවසන් වූ බැවින් තව දුරටත් ජනපද වාසීන්ට මවු රජයේ ආරක්ෂාව අවශ්‍ය නොවීම

- **අමෙරිකානු නිදහස් සටනට හේතු**

  - බ්‍රිතාන්‍ය වාණිජවාදී ප්‍රතිපත්ති
  - අමෙරිකානු ජනපදවල වෙළෙඳ ද්‍රව්‍ය බ්‍රිතාන්‍යයට පමණක් අලෙවි කළ යුතු බවට නියම වීම හා බ්‍රිතාන්‍යය තම කැමැත්තට අනුව ඒවායේ මිල ගණන් නියම කිරීම
  - විදේශීය භාණ්ඩ මිලදී ගැනීමේ දී පවා පළමු ව ඉංග්‍රීසින්ට අයත් වරායකට ගෙන ගොස් එහි දී තීරු බදුගෙවා නැවත ජනපද කරා ගෙනයාමට නියම කිරීම.මේ නිසා භාණ්ඩවල මිල අධික වීම
  - එංගලන්ත නිෂ්පාදනවලට තරගයක් එල්ලවන කිසි ම භාණ්ඩයක් අමෙරිකාවේ නිපදවීම තහනම් කිරීම

    උදාහරණ: රෙදි පිළී, සිගරට්
  - හත් අවුරුදු යුද්ධයට අධික වියදමක් දැරීමට සිදු වීම නිසා බ්‍රිතාන්‍යයේ ආර්ථික පරිහානියක් ඇති වූ බැවින් එම ආර්ථිකය යළි ගොඩනගා ගැනීම සඳහා බ්‍රිතාන්‍ය රජය අමෙරිකානු ජනපදවලින් අධික මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම
    - * නාවික අණ පනත් දැඩි ව ක්‍රියාත්මක කිරීම
    - * අලුත් බදු පැනවීම
  - බදුවලට ජනපදවාසීන් විරුද්ධ වීම
  - 1763 න් පසු බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව අමෙරිකානු ජනපදවල පාලනය ක්‍රමවත් ව ගෙනයාමට කටයුතු කිරීම
  - පාර්ලිමේන්තුවේ එම කටයුතු තම ව්‍යවස්ථාදායක බලතලවලට බාධාවක් යයි සිතූ ජනපදවාසීන් එයට විරුද්ධ වීම
  - බ්‍රිතාන්‍ය ආණ්ඩුව එතෙක් දැඩි ව ක්‍රියාත්මක නොකළ වාණිජවාදී නීති රීති දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම
  - අමෙරිකාවට යුද හමුදා යැවීම
  - ජනපද වාසීන් මර්දනය කිරීමට බ්‍රිතාන්‍ය නිලධාරීන්ට උපදෙස් දීම
  - බටහිර දේශ සීමාවෙන් ඔබ්බට ව්‍යාප්ත වීමට ජනපද වාසීන්ට තහනම් කිරීම, ජනපදවාසීන් බටහිරට ව්‍යාප්ත වීමෙන් රතු ඉන්දියානුවන් කුපිත වේයයි සිතා මෙම නීතිය පැනවීම
  - මෙම තහනම කුඩා ඉඩම් හිමියන්ට හා ලෝම වෙළෙඳුන්ට අවාසිදායක වූ බැවින් බ්‍රිතාන්‍ය පාලනය සමඟ ඔවුන් අමනාප වීම

- **අමෙරිකාවට නව බදු හඳුන්වාදීම**


  - සීනි පනත (1764) - උක්පැණි වෙනුවෙන් බද්දක් අය කිරීමට තීරණය කිරීම
  - සීනි පනතට විරුද්ධ ව ජනතාව නැඟී සිටීම
  - ජනපදවල නවතා සිටි බ්‍රිතාන්‍ය හමුදා නඩත්තු සඳහා යන වියදම ද ගෙවන ලෙස ජනපදවලට බලකර සිටීම - මෙය ඔවුන්ගේ බලවත් කෝපයට හේතු විය.
  - 1765 මුද්දර බද්ද පැනවීම - ඔප්පු තිරප්පු පුවත්පත් හා නීතිමය ලියකියවිලි සඳහා විශාල ගාස්තුවක් ගෙවීමට ජනපද වාසීන්ට සිදුවීම
  - මුද්දර බද්දට එරෙහි ව ජනතා උද්ඝෝෂණ - විරෝධතා නිසා 1776 දී මුද්දර පනත අවලංගු කිරීම සහ ජනපද කෙරෙහි කවර හෝ පනතක් පැනවීමට බලය ඇති බව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව පැවසීම
  - අමෙරිකාවේ ජනපදවලින් බදු අය කිරීමට එංගලන්ත පාර්ලිමේන්තුවට ඇති අයිතිය පිළිබඳ ජනපදවාසීන් ප්‍රශ්න කිරීම
  - ' නියෝජිතයෝ නැත්නම් බදුත් නැත' සටන් පාඨය තේමා කොට ගෙන ජනපදවාසීන් බ්‍රිතන්‍ය පාලනයට විරුද්ධ වීම

- **ටවුන්සෙන්ඩ් පනත් (1767)**

  - අමෙරිකාවට ගෙන එනු ලැබූ තේ, වීදුරු, ටින්, කඩදාසි, සායම් වර්ග ආදිය සඳහා ජනපද වාසීන්ගෙන් තීරුබදු අය කිරීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව යෝජනා කිරීම
  - නිව්යෝර්ක් ජනපදයේ ව්‍යවස්ථාදායක මණ්ඩලය අහෝසි කිරීමට තීරණය කිරීම
  - මෙම පනත්වලට එරෙහි ව ජනපද වාසීන් නැඟී සිටීම
  - බොස්ටන්, ෆිලඩෙල්ෆියා, නිව්යෝර්ක් වැනි නගරවල වෙළෙඳුන් බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය කරමින් උද්ඝෝෂණ ව්‍යාපාර ආරම්භ කිරීම
  - බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය කොට දේශීය භාණ්ඩ නිපදවා ගැනීමේ උද්යෝගයක් ජනපද වාසීන් තුළ ගොඩනැගීම
  - ජනපදවාසීන් අතර ගොඩනැගෙමින් තිබූ එක්සත්කම බිඳ හෙළීම සඳහා තේ බද්ද හැර අනෙකුත් සියලු බදු අවලංගු කිරීම (ජනපද වාසීන්ගෙන් බදු අයකිරීමට බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තුවට නීත්‍යනුකූල අයිතියක් ඇති බව දැක්වීමේ සංකේතයක් වශයෙන් තේ සඳහා අය කළ බද්ද ඉතිරි කිරීම)
  - මේ කරුණු නිසා බ්‍රිතාන්‍යය පාලනයෙන් නිදහස් වීමට ජනපදවාසීන් තීරණය කිරීම
  - සැමුවෙල් ඇඩම්ස්ගේ නායකත්වයෙන් බ්‍රිතාන්‍ය තීරුබදු නිලධාරීන්ට විරුද්ධව උද්ඝෝෂණ ඇති වූ අතර උද්ඝෝෂණ දරුණු ලෙස මර්දනය කිරීම

- **බොස්ටන් තේ සාදය (1773)**

  - තේ බද්දට එරෙහි වූ අමෙරිකාවේ කැරලිකාර පිරිස් බොස්ටන් වරායේ නවතා තිබූ නැවකට පැන තේ පෙට්ටි තොගයක් මුහුදට වීසි කිරීම. මෙය බොස්ටන් තේ සාදය නමින් හඳුන්වයි. සිදුවීමයි
  - අමරිකානු නිදහස් සටන ආරම්භ වීමට ආසන්න හේතුව මෙය වීම
  - සෙසු වරායන්හි තේ පෙට්ටිවලට ද එම ඉරණම අත් වීම
  - බ්‍රිතාන්‍යය රජය විසින් බොස්ටන් වරාය වසා දැමීම හා ප්‍රසිද්ධ රැස්වීම් තහනම් කිරීම
  - මැසචුසෙට්ස් ජනපදයට ලබා දී තිබූ වරදාන පත්‍රය අවලංගු කිරීම හා අමතර හමුදා මැසචුසෙට්ස් වෙත යැවීම
  - අපරාධ චෝදනා ලැබූ අයගේ නඩු බ්‍රිතාන්‍යයේ දී විමසීමට තීරණය කිරීම
  - බ්‍රිතාන්‍යය පාලකයින්ගේ දැඩි ක්‍රියාකලාපයට විරුද්ධ ව ජනපද වාසීන් කටයුතු කිරීමට පෙලැඹීම



බොස්ටන් තේ සාදය (1773) දැක්වෙන චිත්‍රයක්

- **ප්‍රථම මහාද්වීපික සම්මේලනය 1774**

  - ජෝර්ජියාව හැර අමෙරිකානු සෙසු ජනපද දොළහේ නියෝජිතයන් රැස් වී බ්‍රිතාන්‍ය පාලකයින්ගේ දැඩි ක්‍රියාකලාපයට විරුද්ධ ව ෆිලඩෙල්ෆියාහි සම්මේලනයක් පැවැත් වීම. මෙය ප්‍රථම මහාද්වීපික සම්මේලනය නමින් හැඳින්වේ.
  - ජෝර්ජ් වොෂිංටන්, ජෝන් ඇඩම්ස්, සැමුවෙල් ඇඩම්ස්, ජෝන් ජේ වැනි අය එහි නායකත්වය ගැනීම
  - ''මහාද්වීපික සංගමය'' නම් සංවිධානයක් පිහිටු වීම
  - ජනපදවාසීන් වෙත පනවා තිබූ දුෂ්කරතා ඉවත් කරන ලෙස ඉල්ලමින් තුන්වෙනි ජෝර්ජ් රජු වෙත සංදේශයක් යැවීම
  - බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය කිරීම
  - ජනපද වාසීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශයක් සම්මත කොට ගැනීම
  - මහාද්වීපික සම්මේලනයේ තීරණ අනුව ජනපදවාසීන් සටනට සූදානම් වීම
  - ජෝර්ජ් වොෂිංටන් නායකයා ලෙස පත්කොට ගැනීම
  - බ්‍රිතාන්‍යය හමුදා සහ ජනපදවාසීන් අතර 1775 ලෙක්සින්ටන් නම් ස්ථානයේ දී ප්‍රථම වරට සටන් ඇරඹීම
  - බ්‍රිතාන්‍ය හමුදා විසින් ජනපදවාසීන් පරාජය කර ඔවුන් රැස්කර තිබූ අවිආයුධ විනාශ කිරීම
  - බ්‍රිතාන්‍ය හමුදා වල දාමරික ක්‍රියා පිළිබඳ තොරතුරු පැතිර යාමත් සමඟ යුද්ධය ආරම්භ වීම
  - 1775 සියලු ම ජනපදවල නියෝජිතයන් එක් වී සංගමයක් පවත්වා මුදල් අච්චු ගැසීමටත් ජෝර්ජ් වොෂිංටන්ගේ නායකත්වයෙන් යුද හමුදාවක් සංවිධානය කිරීමටත් තීරණය කිරීම

- **1776 නිදහස ප්‍රකාශ කිරීම**

  - දෙවන මහාද්වීපික සම්මේලනයේ දී ජෝර්ජියා හැර සෙසු ජනපද දොළහේ නියෝජිතයන් සියලු දෙනා ම යුද්ධයට සහාය දක් වීම
  - එසේම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස් වීමට තීරණය කිරීම
  - 1776 ජූලි 4 වන දින තෝමස් ජෙෆර්සන් ගේ නායකත්වයෙන් අමෙරිකානුවන් 'නිදහස් ප්‍රකාශනය' නමින් ප්‍රකාශනයක් නිකුත් කිරීම
  - මෙයින් අමෙරිකානුවන් නිදහස් ජාතියක් ලෙස පිළිගැනීම ආරම්භ වීම
  - ජෝර්ජ් වොෂිංටන්ගේ නායකත්වය යටතේ යුද්ධය ආරම්භ වීම
  - හත් අවුරුදු යුද්ධයේ පරාජය නිසා බ්‍රිතාන්‍යයන්ගෙන් පළිගැනීමට බලා සිටි ප්‍රංශය බ්‍රිතාන්‍යයන්ට

එරෙහිව ජනපදවාසීන්ට ආධාර දීම (1778 දී)

- ප්‍රංශයෙන් මුදල් ආධාර, හමුදා ආධාර හා නාවික ආධාර ලැබීම නිසා ජනපද වාසීන් ශක්තිමත් වීම
- ඕලන්දය හා ස්පාඤ්ඤය ද ප්‍රංශයේ මිතුරන් ලෙස බ්‍රිතාන්‍යට විරුද්ධ ව යුද්ධයට සහභාගි වීම.
- රුසියාව, ඩෙන්මාර්කය, ස්වීඩනය යන රටවලින් සමන්විත ආයුධ සන්නද්ධ මධ්‍යස්ථ සංගමය ද බ්‍රිතාන්‍යයට විරුද්ධ ව කටයුතු කිරීම
- සන්නිවේදන ක්‍රමයේ අඩුපාඩු බ්‍රිතාන්‍යයෙන් දුරස්ථ ව යුද පිටිය පිහිටීම හා යුද්ධයට අවශ්‍ය දෑ සම්පාදනය කිරීමේ අපහසුතාව හේතුවෙන් බ්‍රිතාන්‍ය පක්ෂය දුර්වල වීම
- සටනින් පැරදුණු බ්‍රිතාන්‍යය 1783 දී අමෙරිකන් ජනපද සමඟ පැරිස් සාම ගිවිසුම අත්සන් කිරීමෙන් යුද්ධය අවසන් වීම
- 1783 දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් වෙන් වී ජෝර්ජ් වොෂිංටන් යටතේ අමෙරිකා එක්සත් ජනපදය නමැති නව රාජ්‍යයක් පිහිටුවා ගැනීම

- **ජනපදවාසින්ගේ ජයග්‍රහණයට හේතු**

  - අමෙරිකාව හා එංගලන්තය අතර දුර ප්‍රමාණය විශාල වීම
  - අමෙරිකාවේ භූගෝලීය පිහිටීම පිළිබඳ බ්‍රිතාන්‍ය හමුදා නොදැන සිටීම
  - ජනපදවාසීන් ගරිල්ලා සටන්වල දක්ෂයන් වීම හා බ්‍රිතාන්‍ය හමුදා එම ගරිල්ලා සටන්වලට මුහුණ දීමට අපොහොසත් වීම
  - ජෝර්ජ් වොෂිංටන්ගේ දක්ෂ නායකත්වය සහ ඔහුට සම කළ හැකි එක ද සෙනෙවියෙක් හෝ බ්‍රිතාන්‍ය හමුදාවේ නොවීම
  - ප්‍රංශය, ස්පාඤ්ඤය, ඕලන්දය වැනි රටවල් එංගලන්තයට විරුද්ධ ව ජනපද වාසීන්ට ආධාර දීම
  - රුසියාව, ස්වීඩනය, ඩෙන්මාර්කය, ප්‍රශියාව ආදී යුරෝපා රටවල් ද එංගලන්තයට විරුද්ධ මධ්‍යස්ථ බල මණ්ඩලයක් ඇරඹීම
  - බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අනෙක් ප්‍රදේශවල ද බ්‍රිතාන්‍ය විරෝධී සටන් ඇරඹීම
    උදාහරණ: අයර්ලන්තය, ඉන්දියාව
  - බ්‍රිතාන්‍යය තුළ ම බ්‍රිතාන්‍යය කටයුතු හෙළා දකිමින් ජනපදවාසීන්ගේ පක්ෂය ගෙන කටයුතු කළ නිදහස් වාදී දේශපාලනඥයන් සිටීම

- **නිදහස ලැබීම හා නව ආණ්ඩුක්‍රමයක් සම්මත කර ගැනීම**

  - 1783 දී බ්‍රිතාන්‍ය ජනපද දහතුනේ නිදහස නීත්‍යානුකූල ව පිළිගනිමින් පැරිස් ගිවිසුම අත්සන් කිරීම
  - කැනඩාවේ දකුණු සීමාවේ සිට මෙක්සිකෝ බොක්ක තෙක් ද අත්ලන්තික් සාගරයේ සිට මිසිසිපි ගඟ තෙක් ද පැතිර පැවති ප්‍රදේශය අමෙරිකා එක්සත් ජනපදය නමින් හැඳින් වීම
  - 1787 දී නිදහස් වූ අමෙරිකානුන් ෆිලඩෙල්ෆියා සම්මේලනයේ දී නව ආණ්ඩු ක්‍රමයක් සකස් කිරීම
  - රාජාණ්ඩු ක්‍රමය වෙනුවට සමූහාණ්ඩු ක්‍රමයක් තෝරාගෙන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ගොඩ නැංවීම
  - අමෙරිකානු නිදහස් සටන නූතන යුගයේ සිදු වූ ප්‍රථම ජාතිකවාදී ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය ලෙස ලෝක ඉතිහාසයේ වැදගත් තැනක් හිමි වීම
  - වර්තමාන ලෝකයේ බලසම්පන්න රාජ්‍යයක්වන අමෙරිකා එක්සත් ජනපදයේ උපත සිදු වීම

ඇගයීම - 01

1. X හා Y තීරු ගළපා නිවැරදි පිළිතුර තෝරන්න

| X | Y |
|---|---|
| 1. පෘතුගාලය | A ක්විබෙක් |
| 2. ස්පාඤ්ඤය | B හඩ්සන් බොක්ක |
| 3. එංගලන්තය | C මෙක්සිකෝ |
| 4. ප්‍රංශය | D බ්‍රසීලය |
| 5. ඕලන්දය | E පෙන්සිල්වේනියා |

(1) BDCEA (2) ABDCE (3) EABDC (4) DCEAB (5) CEABD

(................)

පහත සඳහන් නම් අතුරින් නොගැලපෙන නාමය තෝරන්න

2. A. ජෝර්ජ් වොෂිංටන් B. ජෝන් ඇඩම්ස් C. තෝමස් ජෙෆර්සන්
D. ජෝර්ජ් ග්‍රැන්විල් E. සැමුවෙල් ඇඩම්ස් (................)

3. A. ලෙක්සින්ටන් B. ලැන්කෂයර් C. කොන්කෝඩ්
D. බොස්ටන් E. ෆිලඩෙල්ෆියා (................)

4. අමෙරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල කීපයක් පහත දැක්වේ. සාවi පිළිතුර තෝරන්න.
1. ප්‍රංශ විප්ලවයට ආදර්ශයක් විය.
2. ඉංග්‍රීසි විප්ලවය අමෙරිකානු නිදහස් සටනේ ප්‍රතිඵලයකි.
3. අමෙරිකා එක්සත් ජනපදය නමින් නිදහස් රාජ්‍යයක් බිහි විය.
4. බ්‍රිතාන්‍ය යටත් විජිත රාජ්‍යයන්ට නිදහස් වීමට මඟ පෑදිණි
5. රාජාණ්ඩු ක්‍රමය වෙනුවට අමෙරිකාවේ සමූහාණ්ඩු ක්‍රමයක් බිහි විය. (................)

ඇගයීම - 02
පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

1. අමෙරිකානු නිදහස් සටන ඇතිවීමට තුඩුදුන් ප්‍රධාන සාධක පැහැදිලි කොට එම සටනේ වැදගත්කම සැකෙවින් විමසන්න. (ලකුණු 14)

2. ''අමෙරිකානු නිදහස් සටන අමෙරිකාව සම්බන්ධයෙන් පමණක් නොව යුරෝපය සම්බන්ධයෙන්ද දැඩි බලපෑමක් ඇති කළේය''
(i)අමෙරිකානු නිදහස් සටනේ නායකයා නම් කරන්න (ලකුණු 01)

(ii) අමෙරිකානු නිදහස් සටනේ ප්‍රධාන පාඨය වූයේ කුමක්ද?
(ලකුණු 01)

(iii) උතුරු අමෙරිකාවේ තිබූ ඉංග්‍රීසි ජනපද හතරක් නම් කරන්න (ලකුණු 02)

(iv) අමෙරිකානු නිදහස් සටනට තුඩුදුන් ආර්ථික හා දේශපාලන සාධක සැකෙවින් දක්වන්න.
(ලකුණු. 04)
(v) ඇමරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත ප්‍රකාශය පරීක්ෂා කරන්න (ලකුණු 08)

3. ''අමෙරිකානු නිදහස් සටනට දේශපාලන හා ආර්ථික යන සාධක හේතු විය''
   (i). එංගලන්ත රජුගේ අනුග්‍රහය යටතේ 1497 දී නිව්ෆවුන්ඩ්ලන්තයට පැමිණි යාත්‍රිකයා නම් කරන්න. (ලකුණු 01)

   (ii). එංගලන්ත ජනයා උතුරු අමෙරිකාවට සංක්‍රමණය වීමට හේතු වූ කරුණු දෙකක් දක්වන්න. (ලකුණු 02)

   (iii). උතුරු අමෙරිකාවේ නැගෙනහිර වෙරළබඩ පිහිටුවන ලද ඉංග්‍රීසි ජනපද තුනක් නම් කරන්න. (ලකුණු 03)

   (ii). එංගලන්ත ජනයා උතුරු අමෙරිකාවට සංක්‍රමණය වීමට හේතු වූ කරුණු දෙකක් දක්වන්න. (ලකුණු 02)

   (iii). උතුරු අමෙරිකාවේ නැගෙනහිර වෙරළබඩ පිහිටුවන ලද ඉංග්‍රීසි ජනපද තුනක් නම් කරන්න. (ලකුණු 03)

   (iv). ඉංග්‍රීසි ආණ්ඩුව විසින් උතුරු ඇමරිකාවේ අනුගමනය කරන ලද යටත් විජිත ප්‍රතිපත්තිය කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මක ව විමසන්න. (ලකුණු 08)

4. (i). අමරිකානු නිදහස් සටන ඇතිවීමට තුඩුදුන් ප්‍රධාන සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 08)

   (ii). අමරිකානුවන්ගේ ජයග්‍රහණයන්ට බලපෑ හේතු විස්තර කරන්න. (ලකුණු 06)

5. ලෝක සිතියමක යුරෝපා ජාතීන් විසින් අමෙරිකාවේ පිහිටුවා ගන්නා ලද ජනපද ලකුණු කරන්න.

**නිපුණතා මට්ටම:** 3.3. මානව අයිතීන් සුරැකීම සම්බන්ධයෙන් ප්‍රංශ විප්ලවයේ වැදගත්කම විග්‍රහ කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව:** 08 යි

**ඉගෙනුම් පල:**
- ප්‍රංශ විප්ලවය ඇති වීමට තුඩුදුන් හේතු විග්‍රහ කරයි.
- ප්‍රංශ විප්ලවයෙන් දිනාගත් මූලික මිනිස් අයිතිවාසිකම් පෙන්වා දෙයි.
- මානව අයිතීන් සුරැකීම නූතන ලෝකය පිළිගත් සංකල්පයක් බව පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

3.3 ප්‍රංශ විප්ලවය

- **ප්‍රංශ විප්ලවයට බලපෑ හේතු**
  - දේශපාලන හේතු
    - * රටේ සියලු බලතල රජු වෙත සංකේන්ද්‍රගත වී තිබීම
    - * පාලකයන් අකාර්යක්ෂම වීම
      උදාහරණ: පහළොස් වැනි ලුවී හා දාසය වැනි ලුවී රජවරු
    - * අනවශ්‍ය යුද්ධවලට සහභාගි වීම
      උදාහරණ : - දහහතර වෙනි ලුවී රජු ස්පාඤ්ඤ රාජ්‍ය ප්‍රාප්ති යුද්ධයට සම්බන්ධ වීම
      එංගලන්තයට විරුද්ධ ව ගෙනගිය යුද්ධ
      පහළොස් වෙනි ලුවී රජු හත් අවුරුදු යුද්ධයට හා අමරිකානු නිදහස් සටනට සහභාගි වීම
    - * දාසයවෙනි ලුවී රජුගේ අදූරදර්ශී ක්‍රියාකලාපය
      උදාහරණ - ටර්ගෝ, නෙකර් වැනි දක්ෂ ඇමතිවරුන් ඉවත් කොට රදලයන්ගේ ඉල්ලීම පරිදි අදක්ෂ ඇමතිවරුන් පත් කිරීම
      මාරි ඇන්ටොයිනට් බිසවගේ උපදෙස් අනුව කටයුතු කිරීම
      රාජාණ්ඩුව දුර්වල වීම
      ලෙත්‍රේ දි කැචි නම් වරෙන්තු ක්‍රමය
      ස්ටේට්ස් ජනරල් සභාව රැස් නොකිරීම

  - ආර්ථික හේතු
    - * සාමාන්‍ය ජනතාව මත ඔරොත්තු නොදෙන තරම් බදු පනවා තිබීම
    - * රදලයන් බදු කිසිවක් නොගෙවා අධික වරප්‍රසාද භුක්ති විඳිමින් සිටීම
    - * මධ්‍යම පන්තියේ දියුණුවට පැවති බාධක
    - * බදු ප්‍රතිපත්තියේ අක්‍රමිකතා
    - * ඉඩම් කොටු කිරීම නිසා ඇති වූ ප්‍රතිඵල
    - * අධික යුද වියදම් නිසා රාජ්‍ය භාණ්ඩාගාර බංකොලොත් වීම
    - * රජ පවුලේ සුඛෝපභෝගී ජීවිත නඩත්තුව සඳහා රටේ ආදායමෙන් විශාල ප්‍රමාණයක් වැය වීම
    - * ඊඩන් වෙළෙඳ ගිවිසුම හා එහි ප්‍රතිඵල

  - සමාජීයීය හේතු
    - * සාමාන්‍ය ජනතාව මුහුණ පෑ දුෂ්කරතා
    - * උත්පත්තිය මත සමාජ තරාතිරම තීරණය කිරීම හා පන්ති විෂමතා
    - * ප්‍රභූ පන්තියට පමණක් සියලු වරප්‍රසාද හිමි වීම



රජුගේ නිදන කාමරයක් (රන් ආලේපිත)



වර්සේල්ස් මාලිගාව

- බාහිර හේතු
    * දාර්ශනිකයන්ගේ බලපෑම
      (හොබ්ස්, ලොක්, රූසෝ, වෝල්ටෙයර්, මොන්ටෙස්ක්‍යු වැනි අය)
    * හත් අවුරුදු යුද්ධය හා අමෙරිකානු නිදහස් සටන
    * ප්‍රංශයට බලපෑ දේශගුණය (අධික ශීත සෘතුව, දුර්භික්ෂ, නියඟ)

- **ප්‍රංශ විප්ලවයේ ආරම්භය හා ව්‍යාප්තිය**

    - ප්‍රංශය පුරා නොසන්සුන්තාව පැතිරයාම නිසා රදළයන්ගේ ඉල්ලීම පරිදි දාසයවෙනි ලුවී රජු ස්ටේට්ස් ජෙනරල් සභාව කැඳවීම
    - ටෙනිස් පිටියේ දිවුරුම හා ජාතික සභාව ක්‍රියාත්මක කිරීම
    - මධ්‍යම පන්තිකයන් ප්‍රංශ විප්ලවයේ නායකත්වය ගැනීම
    - බැස්ටීලයට පහර දීමෙන් විප්ලවය ආරම්භ වීම, විප්ලවය ප්‍රචණ්ඩ ස්වරූපයක් ගැනීම (1789.07.14)
    - මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය එළිදැක්වීම (1789.08.29)
    - ප්‍රභූ පන්තියේ වරප්‍රසාද අහෝසි කිරීම
    - ක්‍රි.ව. 1791 දී දාසය වැනි ලුවී රජු පලායාම හා ඕස්ට්‍රියාවෙන් ආධාර ඉල්ලීම

- **ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා**

    - ප්‍රංශ සමූහාණ්ඩුව බිහි වීම - 1792
    - දාසයවෙනි ලුවී රජු සහ මාරිඇන්ටොයිනට් බිසව මරා දැමීම (1793)
    - ප්‍රංශ සමූහාණ්ඩුවට එරෙහි ව යුද්ධ ඇති වීම (එංගලන්තය, ස්පාඤ්ඤය, ඕස්ට්‍රියාව)




ගිලටීනය

- **භීම සමය ඇරඹීම - 1793 - 1795**


    - ඩැන්ටන්, මැරට්, රොබෙස්පියර් වැනි ජැකොබින් පාක්ෂිකයන් අතට පාලන බලය හිමි වීම
    - කලක් බලයේ සිටි ජිරොන්ඩින් නායකයන් ජැකොබින්වරුන් විසින් ඝාතනය කරනු ලැබීම
    - ජැකොබින්වරුන් අතර මතභේද ඇති වීම සහ නායකයන් ඔවුනොවුන් ඝාතනය කිරීම රොබෙස්පියර් විසින් ඩැන්ටන් ඝාතනය කරනු ලැබීම
    - භීම සමයේ අවසානය සහ කර්මිඩෝරියානු ප්‍රතිවිප්ලවය (ජැකොබින් වරුන්ගේ භීෂණය තුරන් කිරීම සඳහා ගෙනගිය ව්‍යාපාරය කර්මිඩෝරියානු ප්‍රතිවිප්ලවය ලෙස හැඳින්වේ)
    - අධ්‍යක්ෂ මණ්ඩලය බලයට පත්වීම (1795 ඔක්තෝම්බර්)
    - කොන්සල් ක්‍රමය ආරම්භ වීම
    - නැපෝලියන් බොනපාට් බලයට පත් වීම



නැපෝලියන් බොනපාට්



දහසයවෙනි ලුවී රජු ගිලටීනයේ දී මරණයට පත් කිරීම දැක්වෙන චිත්‍රයක්



මාරිඇන්ටොයිනට් බිසව ගිලටීනයේ දී මරණයට පත් කිරීම දැක්වෙන චිත්‍රයක්

- **ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල**

  - ක්‍රි.ව. 1791 දී මානව හිමිකම් ප්‍රකාශනය එළි දැක්වීම
  - වැඩවසම් ක්‍රමය බිඳ වැටී ධනවාදී ආර්ථික රටාවක් බිහි වීම
  - මධ්‍යම පන්තික නායකත්වය යටතේ බලවත් ආණ්ඩුවක් පිහිටු වීම
  - මධ්‍යම පන්තියට දේශපාලන හිමිකම් ලැබීම
  - රදල හා පූජක පන්තිය සතු වූ ඉඩම් අහිමි වීම
  - රදල හා පූජක පන්තිය සතු වූ ඉඩම් ගොවි ජනතාව අතර බෙදා දීම නිසා ප්‍රංශයේ සුලු ඉඩම් හිමි ගොවි පන්තියක් බිහි වීම
  - සමාන බදු ක්‍රමයක් ඇති කිරීම
  - නිදහස, සමානාත්මතාවය, සහෝදරත්වය යන අදහස් යුරෝපය පුරා පැතිර යාම
  - නැපොලියන් වැනි සාමාන්‍ය පංතියේ අයෙකුට ප්‍රංශයේ බලයට පත් වීමට අවස්ථාව ලැබීම
  - අසාර්ථක, දූෂිත රාජ්‍යයෝ පෙරළා දැමීමට විප්ලව ප්‍රයෝජනයට ගත හැකි බව අවබෝධ වීම

- **ප්‍රංශ විප්ලවයේ වැදගත්කම**
  - යුරෝපය මධ්‍යකාලීන වැඩවසම් ක්‍රමයේ සිට නූතන ක්‍රමයට අවතීර්ණ වීම.
  - ප්‍රංශය ඒකාධිපති රාජාණ්ඩු ක්‍රමයේ සිට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තෙක් පරිවර්තනය වීම
  - ප්‍රංශ වැසියා අපේක්ෂා කළ නිදහස, සමානාත්මතාව වැනි මූලික මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශයට පත් විම
  - මූලික අයිතිවාසිකම් පදනම් කරගත් ලිබරල්වාදය, ජාතිකවාදය වැනි මතවාද සපුරා ගැනීම සඳහා යුරෝපය පුරා විවිධ රටවල විප්ලව රැසක් ඇති වීම
  - එකී මතවාද පදනම් කරගෙන ඉතාලිය එක්සත් වීම, ජර්මනිය එක්සත් වීම මගින් යුරෝපයේ ජාතික රාජ්‍ය පුළුල් වීම

**පහත ප්‍රශ්න සඳහා එක් එක් ප්‍රශ්නයට නම් පහ බැගින් දී ඇත. ඒවායින් එකක් කවර හෝ හේතුවක් නිසා සෙසු නම් වලට නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

1) 1. ලෆායට් 2. නෙකර් 3. මැරට් 4. ඩැන්ටන් 5. මිරාබෝ (.........)
2) 1. මොන්ටෙස්කියු 2. වෝල්ටෙයාර් 3. රූසෝ 4. ජෝන් ලොක් 5. මැකියාවෙල්ලි (.........)
3) 1. නෙකර් 2. ටර්ගෝ 3. රිචලියු 4. කැලෝන් 5. බ්‍රියේන් (.........)
4) 1. දාහතරවෙනි ලුවී 2. අටවෙනි හෙන්රි 3. රිචලියු 4. මැසරින් 5. නෙකර් (.........)
5) 1. ගැරිබෝල්ඩ් 2. මැරට් 3. රොබෙස්පියර් 4. ඩැන්ටන් 5. මිරාබෝ (.........)

**පහත ප්‍රශ්න සඳහා එක් එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එයින් එකක් මාතෘකාවට නොගැළපේ. නොගැළපෙන කරුණ තෝරන්න.**

6) ප්‍රංශ විප්ලවය
1. දාහතර වෙනි ලුවීගේ රාජ්‍ය පාලන සමයේ ආරම්භ විය.
2. රජුගේ මුදල් ඇමතිවරයා වූ නෙකර් බදු ප්‍රතිසංස්කරණ කීපයක් යෝජනා කළේය.
3. ප්‍රංශ විප්ලවයට ආසන්න හේතු ව වූයේ ප්‍රංශයේ පැවති මුදල් බංකොළොත් භාවයයි.
4. 1789 ජූලි 14 වන දින බැස්ටීලයට පහර දීම ප්‍රංශ විප්ලවයේ තීරණාත්මක අවස්ථාවක් විය.
5. නිදහස, සහෝදරත්වය, සමානාත්මතාවය ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන තේමාව විය.
(.........)

7) ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා
1. ජාතික මන්ත්‍රණ සභාව ඇති කිරීම
2. සමූහාණ්ඩුව පිහිටු වීම
3. දහතුන්වෙනි ලුවී යටතේ ප්‍රංශ රාජාණ්ඩුව ප්‍රතිෂ්ඨාපනය කිරීම
4. භීම සමය
5. අධ්‍යක්ෂ මණ්ඩලය බලයට පත් වීම (.........)

8) ප්‍රංශ විප්ලවය
1. පැරණි රාජාණ්ඩුක්‍රමයේ දුර්වලතා ප්‍රංශ විප්ලවයට තුඩුදුන් හේතුවක් විය.
2. මොන්ටෙස්කියු ප්‍රංශ විප්ලවයට බලපෑ දාර්ශනිකයෙක් විය.
3. 1789 මැයි මාසයේ ස්ටේට්ස් ජෙනරල් සභාව කැඳවීම
4. 1789 ජූලි බැස්ටීලයට පහර දීම
5. 1793 ජනවාරි මාසයේ දී දහසය වෙනි ලුවී රජු ඔටුනු පැලඳීම (.........)

9) ප්‍රංශ විප්ලවය
1. ස්ටේට්ස් ජෙනරල් සභාව කැඳවීම
2. බැස්ටීලය බිඳ වැටීම
3. දහසය වෙනි ලුවී රජුගේ හිස ගසා දැමීම
4. දහඅට වෙනි ලුවී රජ වීම
5. භීම සමය (.........)

10) ප්‍රංශ විප්ලවය
1. ටෙනිස් පිටියේ දිවුරුම ප්‍රංශ විප්ලවයේ ආරම්භය සලකුණු කළේ ය.
2. දාහත් වෙනි ලුවී ව්‍යවස්ථානුකූල රජකු ලෙස ඔටුනු පලඳවනු ලැබී ය.
3. මාරි ඇන්ටොයිනට් බිසවගේ හිස ගසා දමනු ලැබී ය.
4. ජාතික සභාව විසින් මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශය නිකුත් කරන ලදි.
5. ප්‍රංශ විප්ලවයෙන් මධ්‍යම පන්තිකයන්ගේ අදහස් බොහෝ දුරට ඉටු විණි.
(.........)

**පහත ප්‍රශ්න සඳහා දක්වා ඇති A B C හා D යන ප්‍රතිචාර අතරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර තෝරා, A හා B පමණක් නිවැරදි නම් (1) ද B හා C පමණක් නිවැරදි නම් (2) ද C හා D පමණක් නිවැරදි නම් (3) ද A හා D පමණක් නිවැරදි නම් (4) ද ප්‍රතිචාර එක හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් (5) ද වරහන් තුළ ලියන්න.**

11. ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි ද?
    A ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන සටන් පාඨය වූයේ නිදහස, සහෝදරත්වය හා සමානාත්මතාව යි.
    B ප්‍රංශ විප්ලවයෙන් රදලයන්ගේ වරප්‍රසාද තහවුරු විය.
    C රොබෙස්පියර්ගේ නායකත්වයෙන් ප්‍රංශයේ සමූහාණ්ඩුවක් පිහිටවන ලදී.
    D ප්‍රංශ විප්ලවය මධ්‍යම පන්තිකයන්ගේ විප්ලවයක් ලෙස සලකනු ලැබේ.
    (.........)

12. පහත සඳහන් අය අතරින් ප්‍රංශ විප්ලවයට සහභාගී වූවෝ කවරහු ද?
    A ලෆායෙට් B රොබෙස්පියර්
    C රිච්ලියු D ලුවී නැපෝලියන් (.........)

13. පහත සඳහන් ඒවා අතරින් විප්ලවයේ ප්‍රතිඵල මොනවා ද ?
    A වැඩවසම් ක්‍රමය බිඳ වැටීම B මධ්‍යම පන්තියට දේශපාලන අයිතීන් ලැබීම
    C රාජාණ්ඩු ශක්තිමත් වීම D නැපෝලියන් බොනපාට් බලයට පත් වීම (.........)

ඇගයීම - 02
**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

1. පහත සඳහන් සියලු ජන කොටස් ප්‍රංශ විප්ලවයට දායක වී ඇත. ඔවුන්ගේ දායකත්වය විස්තර කරන්න.
(i) රජවරු (ii) රදල ප්‍රභුවරු (iii) මධ්‍යම පන්තිය (iv) සාමාන්‍ය ජනතාව (ලකුණු 14)

2. ''ප්‍රංශ විප්ලවය ආරම්භ කරන ලද්දේ මධ්‍යම පන්තිය විසිනි''
   (i) ප්‍රංශ විප්ලවය ඇති වීමට ආසන්නතම හේතුව කුමක් ද? (ලකුණු 02)
   (ii) ප්‍රංශයේ මධ්‍යම පන්තිය මුහුණ දුන් ගැටලු මොනවා ද ? (ලකුණු 04)
   (iii) ප්‍රංශ විප්ලවය ඇති වීමට තුඩුදුන් හේතු කෙරෙහි අවධානය යොමු කරමින් විප්ලවය ආරම්භ කිරීමෙහි ලා මධ්‍යම පන්තිය විසින් ඉටු කරන ලද කාර්යභාරය විවේචනාත්මක ව විමසන්න. (ලකුණු 08)

3. (i) 18 වෙනි සියවසේ ප්‍රංශයේ පැවති ප්‍රාක්තන පටිපාටියේ (පැරණි රාජාණ්ඩු ක්‍රමයේ) ප්‍රධාන ලක්ෂණ හඳුන්වා දෙන්න. (ලකුණු 07)
   (ii) 1789 ප්‍රංශ විප්ලවය ආරම්භ වීමෙහි ලා ඒවායෙහි බලපෑම පරීක්ෂා කරන්න. (ලකුණු 07)

4. ප්‍රංශ විප්ලවයට බලපෑ දේශපාලනික, ආර්ථික හා සමාජයීය හේතු විග්‍රහ කරන්න. (ලකුණු 14)

5. ''ප්‍රංශ විප්ලවය ආරම්භ කරන ලද්දේ රදළ ප්‍රභු පන්තිය විසිනි'' මේ කියමන විවේචනාත්මක ව විමසන්න. (ලකුණු 14)

6. ''ප්‍රංශ විප්ලවය වර්තමාන යුරෝපයේ විකාශනය හැඩගැස් වූ ඉතා ම වැදගත් සිදු වීමකි''
   (i) ප්‍රංශ විප්ලවය ඇති කිරීමට තුඩු දුන් ආසන්නත ම හේතුව කුමක් ද? (ලකුණු 01)
   (ii) විප්ලවය ඇති වීමට පෙර ප්‍රංශයේ පැවති සමාජ ව්‍යුහය සැකෙවින් දක්වන්න (ලකුණු 02)
   (iii) ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා කවරේ ද? (ලකුණු 03)
   (iv) ප්‍රංශ විප්ලවය කෙරෙහි අවධානය යොමු කරමින් එය ප්‍රංශය සම්බන්ධයෙන් පමණක් නොව යුරෝපයේ අනෙකුත් රටවල් සම්බන්ධයෙන් ද ඇති කළ බලපෑම පරීක්ෂා කරන්න. (ලකුණු 08

# 4. කාර්මික විප්ලවය

මිනිසා සිය දැතේ සවියෙන් සුළු පරිමාණයෙන් ගෘහස්ථ ව පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම වෙනුවට යන්ත්‍ර සූත්‍ර භාවිතා කොට මහා පරිමාණයෙන් අලෙවිය සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමෙන් ඇති කළ පුළුල් වෙනස කාර්මික විප්ලවය නමින් හඳුන්ව යි. කාර්මික විප්ලවය තුළින් ඇති වූ ආර්ථික, සමාජීය, දේශපාලන, සංස්කෘතික වෙනස්කම් යුරෝපයටත් පසු ව සෙසු මහාද්වීපවලටත් බලපෑ ආකාරය අවබෝධ කිරීම මෙම ඒකකයේ මූලික අරමුණ යි.

**නිපුණතාව** : • ස්වාභාවික අභියෝගවලට මුහුණ දීමේ දී මිනිසා අත්පත් කරගත් ජයග්‍රහණ තුලනාත්මක ව අවබෝධ කරගෙන ඒ අනුව කටයුතු කරයි

**නිපුණතා මට්ටම** : 5.1. ලෝකයේ ගමන් මඟ වෙනස් කිරීමට කාර්මක විප්ලවය බලපෑ ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි

**කාලච්ඡේද ගණන** : 20යි.

**ඉගෙනුම් පල** :
- කාර්මක විප්ලවය ඇති වීමට තුඩුදුන් පසුබිම සහ නව සොයාගැනීම් පිළිබඳ ව විග්‍රහ කරයි
- කාර්මික විප්ලවයේ ප්‍රතිඵල පැහැදිලි කරයි
- කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

4. කාර්මික විප්ලවය
- **කාර්මික විප්ලවයේ ආරම්භය**
  - කාර්මික විප්ලවය හඳුන්වා දීම
  - ජාතික රාජ්‍යවල පාලකයන් අනුගමනය කළ ප්‍රතිපත්ති කාර්මික විප්ලවයට අවශ්‍ය පසුබිම සකස් කිරීම
  - 16 වන සියවසේ සිට එංගලන්තයේ වෙළෙඳාම පුළුල් වීම කාර්මික විප්ලවයට හේතු වූ ආකාරය පෙන්වා දීම
  - කාර්මික විප්ලවය ඇතිවීමට ජන සංඛ්‍යාවේ ඇති වූ වර්ධනය මූලික හේතුවක් වීම

- **එංගලන්තය තුළ කාර්මික විප්ලවය ඇති වීමට හේතු**
  - එංගලන්තය තුළ වැඩවසම් ක්‍රමය බිඳවැටී තිබීම හා දේශපාලන ස්ථාවර භාවය
  - ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමට පැවති නිෂ්පාදන ශිල්ප ක්‍රම ප්‍රමාණවත් නොවීම
  - රට තුළ ස්වාභාවික සම්පත් බහුල වීම
  - සම්පත් පුද්ගලයන් සිටීම හා ඔවුන්ට අනුග්‍රහ දැක්විය හැකි ධනවත් ව්‍යාවසායික පන්තියක් සිටීම
  - භූගෝලීය වශයෙන් රට කුඩා වීම, දිවයිනක් වීම හා රට අභ්‍යන්තරයේ දියුණු ප්‍රවාහණ පද්ධතියක් තිබීම
  - ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය තුළ රැකියා සොයා නගරයට ජනයා පැමිණීම හරහා මිනිස් ශ්‍රමය පහසුවෙන් ගත හැකි වීම
  - දියුණු බැංකු හා මූල්‍ය සමාගම් වර්ධනය වීම
  - එංගලන්ත ආණ්ඩුව අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්ති
  - අමුද්‍රව්‍ය හා අලෙවිය සඳහා විශාල වෙළෙඳපොලක් ලබා ගතහැකි වූ යටත් විජිතවලින් යුක්ත අධිරාජ්‍යයක් ගොඩ නැගීම

**එංගලන්තයේ කාර්මික විප්ලවය ප්‍රධාන වශයෙන් කර්මාන්ත තුනක් ඇසුරින් සිදු විය**

**පේෂ කර්මාන්තය**

ගෘහ ආශ්‍රිත කර්මාන්තයක් වශයෙන් පැවති පේෂ කර්මාන්තය යන්ත්‍ර සූත්‍ර හා වාෂ්ප බලය, වෙනත් ඉන්ධන වර්ග යොදා දියුණු වීම කාර්මික විප්ලවයේ දී සිදු විය. ඒ ඒ අවස්ථාවල ඇති වූ විවිධ දුෂ්කරතා ජය ගැනීම සඳහා නව සොයා ගැනීම් රාශියක් බිහි විය.

- ජෝන් කේ - දුවන නඩාව
- ජේම්ස් හාග්‍රිවුස් - ස්පිනිං ජෙනිය
- රිචඩ් ආක්‍රයිට් - ජල රාමුව
- සැමුවෙල් කොම්ප්ටන් - මියුල් යන්ත්‍රය
- එලී විට්නි - කොට්න් ජින්
- එලියස් හාවේ - රෙදි විවීමේ යන්ත්‍රය
- එඩ්මන්ඩ් කාට්රයිට් - බලවේග රෙදි වියන යන්ත්‍රය (පවර්ලූම්)

**යකඩ හා වානේ කර්මාන්තය**

එංගලන්තය තුළ කාර්මික විප්ලවය වේගවත් කිරීමට යකඩ හා වානේ කර්මාන්තයේ ඇති වූ දියුණුව බෙහෙවින් බලපෑවේ ය. ඒ සඳහා නව යන්ත්‍ර සූත්‍ර රාශියක් නිපදවනු ලැබී ය.

- ඒබ්‍රහම් ඩර්බි - 1709 ගල් අඟුරු යොදා යපස් උණු කිරීමෙන් වාත්තු කළ යකඩ නිපදවා ගැනීමේ ක්‍රමය
- හෙන්රි කෝට් - 1784 රෝලර් නම් යන්ත්‍රය
- හෙන්රි බෙසමර් - පහසුවෙන් යකඩ නිපදවීමේ ක්‍රමය
- විලියම් සීමන්ස් - එමලි සහ පෙරී මාටින්ස් යුවළ විවෘත උදුන් ක්‍රමය
- විලියම් සීමන්ස් - විදුලි උදුන


**ගල් අඟුරු කර්මාන්තය**

යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්ධනයක් වශයෙන් ගල් අඟුරු යොදා ගැනීම කාර්මික විප්ලවයේ දියුණුවට බෙහෙවින් බලපෑවේ ය.

- තෝමස් නිව්කොමන් - 1712 වාෂ්ප එන්ජිම
- ජේම්ස් වොට් - වාෂ්ප එන්ජිම වැඩි දියුණු කිරීම
- හම්ෆ්‍රි ඩේවි - 1815 ආරක්ෂක ලාම්පුව
- 1835 යකඩ කේබල් කම්බි ක්‍රමය

- **කාර්මික විප්ලවය පැතිරුණු වෙනත් ක්ෂේත්‍ර**

  **කෘෂි කර්මාන්තය**
  - ඉඩම් කොටු කිරීම මගින් මහා පරිමාණ ගොවි බිම් බිහි වීම
  - යන්ත්‍ර සූත්‍ර කෘෂි කාර්මික ක්ෂේත්‍රයට යොදා ගැනීම
  - බෝග මාරු කිරීමේ ක්‍රමය (ශෂ්‍ය මාරු ක්‍රමය)
  - නව වගා ක්‍රම (පේළි වැපිරීමේ ක්‍රමය)
  - නව පොහොර වර්ග



වාෂ්ප එන්ජිම



ආරක්ෂක ලාම්පුව

**ප්‍රවාහනය**

- රොබට් පුල්ටන් - 1807 දුම් බෝට්ටුව
- ජෝන් මැකඩම් - 1811 මැකඩම් ක්‍රමය
- හෙන්රි බෙල් - 1811 දුම් නැව
- ජෝර්ජ් ස්ටීවන්සන් - දුම්රිය එංජිම
- ඩේම්ලර් - 1885 මෝටර් රථය
- රයිට් සහෝදරයින් - 1903 ගුවන් යානය

**සන්නිවේදනය**

- 1840 - එංගලන්තය පෙනී තැපැල් සේවය
- 1844 - සැමුවෙල් මෝස් - විදුලි පණිවිඩ ක්‍රමය
- 1866 - සයිරස් ඩබ්ලිව් ෆීල්ඩ් - කේබල් ක්‍රමය
- 1876 - ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් - දුරකථනය
- 1899 - මාර්කෝනි - ගුවන් විදුලිය
  - ජෝන් ලොගී බෙයාඩ් - රූපවාහිනිය

- **කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය**

18 වන සියවසේ එංගලන්තය මුල්කරගෙන ඇති වූ කාර්මික විප්ලවය වැඩි කාලයක් යාමට පෙර යුරෝපා මහාද්වීපයටත් අමෙරිකා එක්සත් ජනපදයටත් ව්‍යාප්ත විය. ඉන් පසු ව ජපානය ඇතුළු ආසියා මහාද්වීපයේ සෙසු රටවලටත්, දකුණු ඇමෙරිකා, අප්‍රිකා මහාද්වීප කරාත් ව්‍යාප්ත විණි.

- **කාර්මික විප්ලවයේ ප්‍රතිඵල**

- ගෘහාශ්‍රිත ව පැවති සුළු කර්මාන්ත බිඳ වැටී මහා පරිමාන කර්මාන්ත බිහි වීම
- කෘෂි කර්මාන්තය මත පැවති ආර්ථික ක්‍රමය කර්මාන්ත හා වෙළෙඳාම මත පදනම් වීම
  * මුදල් ආයෝජනය කළ හැකි විශාල ව්‍යාපාරික සංවිධාන බිහි වීම
  * ධනවාදී අර්ථ ක්‍රමය ස්ථාපිත වීම
  * නව අධිරාජ්‍යවාදයට මඟ පෑදීම

**සමාජීය**

- සමාජය තුළ ධනය ආයෝජනය කළ හැකි ධනපති පන්තිය හා ශ්‍රමය විකුණා ජීවත්වන නිර්ධන පන්තිය වශයෙන් පන්ති දෙකක් බිහි වීම හා එම පන්ති අතර අරගල ඇති වීම
- නාගරීකරණය
- පරිසර දූෂණය
- ගම් පාළු වීම, ඉඩම් අහිමි පුද්ගලයින් බිහි වීම හා සාම්ප්‍රදායික සමාජ සංස්ථා අවුල් වීම

**දේශපාලන**

- ප්‍රබල මධ්‍යම පනිතියක් බිහි වීම
- විවිධ දේශපාලන, ආර්ථික දර්ශන බිහි වීම
    - රෝබට් ඕවන්ගේ සමාජවාදී ව්‍යාපාරය හා චාටිස්ට් ව්‍යාපාරය
    - මාක්ස්වාදී ව්‍යාපාරය සහ ජෙරමි බෙන්තම්ගේ උපයෝගිතා වාදය
    - ඇඩම්ස්මිත්ගේ රාජ්‍ය නිර්බාධ වාදය
- වෘත්තීය සංගම් බිහි වීම
- අධිරාජ්‍යවාදය පුළුල් වීම

ඇගයීම - 01

**අංක 01 සිට 02 දක්වා ප්‍රශ්නවල එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතුරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් ඒවා සමග නොගැළපේ. එම නොගැළපෙන නම හඳුනාගෙන එහි අංකය තිත් ඉරි මත ලියන්න.**

1. 1. හෙන්රි ඩර්බි 2. හෙන්රි කෝට් 3. හෙන්රි බෙසමර් 4. මයිකල් සර්වේටස්
   5. විලියම් සීමන්ස් (.................)

2. 1. හෙන්රි බෙල් 2. රොබට් පුල්ටන් 3. ඩෙම්ලර් 4. ජෝන් කැල්වින්
   5. ජෝන් මැකඩම් (.................)

**අංක 04 ප්‍රශ්නය සඳහා යුගල පද පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක් දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**

4. 1. ජෝන් කේ - දුවන නඩාව
   2. ජේම්ස් හාග්‍රිම්ස් - රෙදි මැසීමේ යන්ත්‍රය
   3. රිචඩ් ආක්රයිට් - ජල රාමුව
   4. සැමුවෙල් ක්‍රොම්ප්ටන් - ස්පිනිං මියුල්
   5. එඩ්මන්ඩ් කාට්රයිට් - පවර්ලූම් යන්ත්‍රය (.................)

**අංක 05 සහ 06 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු 05 බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

5. එංගලන්තය තුළ කාර්මික විප්ලවය ඇති වීමට හේතු
   1. එංගලන්තය තුළ වැඩවසම් ක්‍රමය බිඳ වැටීම
   2. රට තුළ ස්වාභාවික සම්පත් තිබීම
   3. යටත් විජිතවලින් අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකි වීම
   4. භූගෝලීය වශයෙන් රට කුඩා වීම දූපතක් වීම
   5. ප්‍රංශ විප්ලවයේ බලපෑම් එංගලන්තයට පැමිණීම

   (.................)

6. කාර්මික විප්ලවයේ වාසි
   1. නිෂ්පාදන අතිරික්ත විදේශ වෙළෙඳ පොළට යවා විශාල ලාභ ලැබීම
   2. රැකියා අවස්ථා බහුල වීම
   3. එංගලන්තයට විදේශ රටවලින් අධාර ගලා ඒම
   4. බැංකු මූල්‍ය ආයතනවල වර්ධනය
   5. ධනවාදී ආර්ථික ක්‍රමය ස්ථාපිත වීම

   (.................)

ඇගයීම - 02

**පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර සපයන්න**

7. '' කාර්මික විප්ලවය හේතු කොටගෙන යුරෝපයේ තාක්ෂණ, ආර්ථික හා සමාජය යන ක්ෂේත්‍රවල මූලික පරිවර්තනයක් ඇති විය''.

i. කාර්මික විප්ලවය ආරම්භ වූ රට නම් කරන්න.

(ලකුණු 01)

ii. එය එම රටේ ඇති වීමට තුඩුදුන් හේතු තුනක් දක්වන්න.

(ලකුණු 03)

iii. පේෂ කර්මාන්තය හා සම්බන්ධ නව නිපැයුම් තුනක් නම් කරන්න.

(ලකුණු 03)

iv. ඉහත ප්‍රකාශයේ සඳහන් ක්ෂේත්‍රවල මූලික පරිවර්තනයක් ඇති කිරීමට කාර්මික විප්ලවය බලපෑ ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

8. පහත සඳහන් මාතෘකා යටතේ එංගලන්තයේ ඇති වූ කාර්මික විප්ලවය පිළිබඳව විස්තරයක් ලියන්න.

i. එංගලන්තයේ කාර්මික විප්ලවය ඇති වීමට ඉවහල් වූ පසුබිම
ii. කාර්මික විප්ලවය හා සම්බන්ධ ප්‍රධාන උත්පාදක
iii. එහි ආර්ථික හා සාමාජික ප්‍රතිඵල

(ලකුණු 14)

9. ආදර්ශ බ්‍රිතාන්‍ය සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම් කර ස්ථාන දෙකක ඓතිහාසික වැදගත්කම ලියන්න.

| | |
|---|---|
| 1. ලිවර්පූල් | 5. ස්කොට්ලන්තය |
| 2. මැන්චෙස්ටර් | 6. වේල්සය |
| 3. ලන්ඩන් | 7. උතුරු මුහුද |
| 4. තේම්ස් නදිය | 8. ඉංග්‍රීසි ඕඩය |

(ලකුණු 14)

## 5. ලිබරල්වාදී සහ ජාතිකවාදී සංකල්පවල වර්ධනය

නිදහස හා දේශප්‍රේමය මුල් කරගනිමින් දහනවවෙනි සියවසේ ලිබරල්වාදය හා ජාතිවාදය යන බලවේග යුරෝප දේශපාලන කටයුතු කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑවේ ය. කුඩා රාජ්‍යවලට කැඩී තිබූ යුරෝපා රටවල් රැසක් මෙම සංකල්ප දෙකෙහි ආභාසයෙන් විශාල හා බලවත් රාජ්‍ය බවට පත් විය. ඉතාලිය හා ජර්මනිය මේ අතරින් ප්‍රධාන වේ. ලිබරල්වාදය හා ජාතිවාදය යන බලවේගවල වර්ධනය හා එම බලවේග ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක වූ ආකාරය කෙරෙහි මෙම ඒකකයේ දී අවධානය යොමු කරනු ලැබේ.

**නිපුණතාව** : • විවිධ දේශපාලන චින්තන ප්‍රායෝගික ලෙස ක්‍රියාවට පරිවර්තනය කළ ආකාරය පරීක්ෂා කරයි.

**නිපුණතා මට්ටම**: 5.1 ලිබරල්වාදී හා ජාතිකවාදී චින්තනවල වර්ධනය සහ ඒවා ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක වූ ආකාරය පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 25 යි

**ඉගෙනුම් පල** :
- දේශපාලන චින්තනවල වර්ධනයත් සමඟ විප්ලවීය බලවේග ඉස්මතු වූ ආකාරය විස්තර කරයි.
- ලිබරල්වාදී හා ජාතිකවාදී දේශපාලන චින්තන ප්‍රායෝගික ව භාවිත වූ ආකාරය පෙන්වා දෙයි.
- ඉතාලිය හා ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාර සිතියම් මගින් පෙන්වා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

5' , sr, ;jd§ i y cd;sjd§ i xl , ;aj , j¾Ok h

- ලිබරල්වාදය
  - දහනව වන සියවසේ යුරෝපයෙහි ක්‍රියාත්මක වූ ප්‍රධාන මතවාදයකි.
  - මහජන නියෝජිතයන්ගෙන් යුක්ත මණ්ඩලයක සහය ඇති ව සකස් වූ ව්‍යවස්ථානුකූල ආණ්ඩු ක්‍රමයක් මඟින් ජනතාවට සතුටුදායක පාලන ක්‍රමයක් ඇති කිරීම මෙහි දේශපාලන අරමුණ යි.
  - සාර්ථක ව්‍යාපාර රජයේ මැදිහත් වීමකින් තොර ව ක්‍රියාත්මක කෙරෙන නිදහස් ආර්ථික හා සමාජ රටාවක් ගොඩනැගීම මෙම මතවාදයේ ප්‍රධාන ලක්ෂණයකි.

- ජාතිකවාදය
  - කිසියම් භූගෝලීය ප්‍රදේශයක් තුළ වෙසෙන්නා වූ ජන කොටස් සිය පොදු භාවය පදනම් කරගෙන ස්වකීය අනන්‍යතාව ගොඩනැගීමේ දී ඔවුන් සියලු දෙනා ම එක ම ජාතිකත්වයක් තුළට ගැනීම අරමුණ වීම
  - වාර්ගික, භාෂාමය, ආගමික හා චාරිත්‍ර-වාරිත්‍රීය පොදු බව පොදු උරුමය ලෙස හැඳින්වේ. එකී පොදු හැඟීම නිසා ජනතාවගේ නිදහස වර්ධනය කරගැනීමට හැකි වීම

- 1815 න් පසු යුරෝපයේ ලිබරල්වාදී හා ජාතිකවාදී ව්‍යාපාරවල වර්ධනය
  - ස්පාඤ්ඤයේ ජාතිකවාදී ලිබරල්වාදී බලවේගවල නැගීම හා ඒවා මර්දනය
  - රුසියාවේ ලිබරල්වාදී ඉල්ලීම් හා ඒවා මර්දනය
  - 1820-21 ඉතාලියේ නේපල්ස් හා පීඩ්මොන්ට් ප්‍රදේශවල ඇති වූ කැරලි
  - 1821-1829 තෙක් තුර්කි ආධිපත්‍යයෙන් නිදහස් වීම සඳහා ග්‍රීසිය නැගී සිටීම සහ 1829 ආද්‍රියානෝපල් ගිවිසුම මඟින් ග්‍රීසියට නිදහස ලැබීම

- ග්‍රීසියට ස්වාධීනත්වය ලැබීම ජාතිකත්වවාදය ලැබූ ජයග්‍රහණයක් වීම
- 1814 - 1848 තෙක් ප්‍රංශය තුළ දේශපාලන සමතුලිතතාවක් ඇති කර ගැනීමට දැරූ උත්සාහය සහ ඊට එල්ල වූ අභියෝග.
- ඒ හා සමකාලීන ව යුරෝපා රටවල ජාතිකවාදී විප්ලව ඇති වීම (ඕලන්දය, බෙල්ජියම, ඉතාලිය, ජර්මනිය)
- මෙලෙස යුරෝපා සමාජයේ 1815 සිට 1848 තෙක් දක්නට ලැබුණ ප්‍රධාන ලක්ෂණයක් වූයේ ප්‍රතිගාමී රදළවාදී ආණ්ඩුක්‍රම නියෝජනය කරමින් පැවති තත්ත්වය රැක ගැනීමට අදහස් කළ කණ්ඩායමත්, මධ්‍යම හා කම්කරු පන්ති නියෝජනය කරමින් පැරණි යුරෝපය වෙනස් කර ලිබරල් හා ජාතිවාදී ප්‍රවණතා ප්‍රතිසංස්කරණ මඟින් ඉදිරියට ගෙන යාමට තැත් කළ කණ්ඩායමක් ගෙන ගිය දැවැන්ත අරගලය යි.

- 1848 විප්ලව
  - 1848 වන විට යුරෝපය පුරා කැරළිකාර පසුබිමක් නිර්මාණය වීම
  - ප්‍රංශයේ ඇති වූ අරගලයේ ප්‍රතිඵලයක් ලෙස ලුවී නැපෝලියන් බලයට පත් වීම
  - ඉතාලියේ ජාතිකවාදී, ලිබරල්වාදී ක්‍රියාමාර්ග
  - 1848 වර්ෂයේ ජර්මනියේ ක්‍රියාත්මක වූ ජාතිමාමක හා ලිබරල්වාදී බලවේග
  - ප්‍රංශය, ඉතාලිය, ජර්මනිය හැර යුරෝපයේ බොහෝ රටවල ජාතිකවාදී ලිබරල්වාදී ව්‍යාපාර අසාර්ථක වීම
  - බ්‍රිතාන්‍ය පමණක් විප්ලවකාරී ක්‍රියාමාර්ගවලින් තොර ව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම

- බලවේග
- **ඉතාලිය එක්සත් කිරීම**
  - ඉතාලිය එක්සත් කිරීමට පෙර ඉතාලියේ පැවැති තත්ත්වය
  - ඉතාලියේ පැවැති දේශපාලන බෙදීම්
    - * නේපල්ස් සහ සිසිලි දූපත්, ස්පාඤ්ඤයේ බූර්බෝන් රාජවංශය යටතේ පාලනය වීම.
    - * රෝමය සහ මධ්‍යම ඉතාලිය පාප්තුමා යටතේ පාලනය වීම.
    - * පාර්මා, මොඩිනා සහ ටස්කිනි, ඔස්ට්‍රියානු රජ පෙළපත් යටතේ පාලනය වීම.
    - * වෙනිස්, ලොම්බාඩි ආදි ප්‍රදේශ ඔස්ට්‍රියානු අධිරාජ්‍ය යටතේ ද පාලනය වීම.
    - * පීඩ්මොන්ට් හා සාර්ඩිනියා ඇතුළු ප්‍රදේශ ඉතාලි ජාතික සැවෝයි රජ පෙළපත යටතේ පැවැතීම
  - නැපෝලියන්ගේ පාලනයේ ප්‍රතිඵලයක් වශයෙන් ඉතාලි ජනතාව තුළ එක්සත් භාවය පිළිබඳ හැඟීමක් ඇති වීම
  - ජාතිවාදී හැඟීම් වර්ධනය

  - **ඉතාලිය එක්සත් කිරීමට දරන ලද ප්‍රයත්න හා ඊට සම්බන්ධ ව්‍යාපාර**
    - ඉතාලියේ ජාතිකානුරාගය නැඟීම
    - කාබොනාරි ව්‍යාපාරය
      - * කාබොනාරි සංගමයේ මෙහෙයවීමෙන් ඔස්ට්‍රියානු ආධිපත්‍යයට විරුද්ධ ව නිදහස් සටන් ව්‍යාපාර ආරම්භ වීම
    - මැසිනිගේ තරුණ ඉතාලි ව්‍යාපාර
    - ජියෝබර්ටිගේ නායකත්වය යටතේ නව ගුවේල්ෆ් ව්‍යාපාරය ආරම්භ වීම
    - නව වෙනි පියුස් පාප්තුමා ලිබරල්වාදී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කිරීම
    - 1848 ඉතාලි විමුක්ති සටන
    - ප්‍රතිගාමීත්වය හිස එසවීම හා මේ ව්‍යාපාර අසාර්ථක වීම

- **ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයට දායක වූවෝ**
  - කවුන්ට් කැවුර් පීඩ්මොන්ට් රාජ්‍යයේ අගමැති තනතුරට පත්වීම
  - ඉතාලිය ආර්ථික අතින් සංවර්ධනය වීම
  - ලිබරල්වාදීන්ගේ සහයත්වය ලබා ඉතාලියේ ප්‍රතිසංස්කරණ සිදු කිරීම

- ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ නායකත්වය පීඩ්මොන්ට් රාජ්‍යයට හිමි වීම
- ක්‍රිමියානු යුද්ධයට සම්බන්ධ වීම
- ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයට ප්‍රංශය හා බ්‍රිතාන්‍යයේ සහය ලබා ගැනීම
- කවුන්ට කැවූර් හා ප්‍රංශය තුන්වෙනි නැපෝලියන් ප්ලොම්බියර්ස් ගිවිසුම අත්සන් කිරීම

- ගැරිබෝල්ඩි

  - ඉතාලි වැසියන් තුළ ජාතික හැඟීම් වර්ධනය කිරීම
  - ගැරිබෝල්ඩිගේ රතු කමිස හමුදාව දකුණු ඉතාලියේ ප්‍රදේශ යටත්කොට පීඩ්මොන්ට් රජුට පැවරීම
    * රෝමය හැර පාප් රාජ්‍යයේ සියලු ප්‍රදේශ යටත් කර ගැනීම
    * 1866 වෙනීසිය ඈඳා ගැනීම
    * 1870 රෝමය ඈඳා ගැනීමෙන් ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරය සම්පූර්ණ වීම

**ජර්මනිය එක්සත් කිරීම**


- **ජර්මනිය එක්සත් වීමට පෙර පැවති දේශපාලන තත්ත්වය**
  - 1648 වෙස්ට්ෆේලියා ගිවිසුමේ ප්‍රතිඵල වශයෙන් ජර්මනිය රාජ්‍ය ගණනාවකට වෙන් වී යාම
  - නැපෝලියන් බොනපාට් ජර්මන් ප්‍රදේශ ආක්‍රමණය කර රයින් සංගමය පිහිටු වීම
  - වියානා සමුළුවෙන් පසු නැපෝලියන්ගේ ප්‍රයත්නය බිඳ දැමීම
  - සොල්වරයින් සංගමය යටතේ ජර්මනියේ ආර්ථික එක්සත් භාවය ඇති වීම
  - ඔස්ට්‍රියාවේ චාන්සලර් මෙටර්නික් විසින් ලිබරල්වාදී අදහස් මර්දනය කිරීම

    උදාහරණඃ කාල්ස්බාඩ් ආඥාව
  - 1830 හා 1848 කැරළි හා ඒවා අසාර්ථක වීම
  - 1848 ෆ්‍රැන්ක්පර්ට් පාර්ලිමේන්තුව හා 1848 විප්ලවය අසාර්ථක වීම


- **ජර්මනිය එක්සත් කිරීමෙහි ලා බිස්මාර්ක්ගේ දායකත්වය**

  - ඔටෝෆොන් බිස්මාර්ක් පිළිබඳ හැඳින්වීමක්
  - ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ නායකත්වය දැරීමට සුදුසු පරිදි ප්‍රසියාව ආර්ථික හා දේශපාලන වශයෙන් ශක්තිමත් කිරීමට ක්‍රියා කළ ආකාරය
  - බිස්මාක්ගේ රාජතන්ත්‍රික උපාය මාර්ගය වූ ''ලේ සහ යකඩ ප්‍රතිපත්තිය'' ප්‍රශියාවේ යුධ හමුදාව ශක්තිමත් කිරීම
  - ෂෙල්ස්විග් හෝල්ස්ටයින් ප්‍රශ්නයේදී ෂෙල්විග් ඈඳා ගැනීම
  - 1866 යුද්ධයෙන් ඔස්ට්‍රියාව පරාජයට පත්වීම
  - 1871 ප්‍රංශය පරාජය කිරීමෙන් ප්‍රශියාවේ නායකත්වය යටතේ එක්සත් ජර්මනිය බිහිවීම වශයෙන් ශක්තිමත් කිරීමට ක්‍රියාකල ආකාරය.
    * බිස්මාර්ගේ රාජතන්ත්‍රික උපාය මාර්ග ''ලේ සහ යකඩ ප්‍රතිපත්තිය'' ප්‍රෂියාවේ යුධ හමුදාව ශක්තිමත් කිරීම
    * ෂෙල්ස්විග් හෝල්ස්ටයින් ප්‍රශ්නය, ෂෙල්විග් ඈඳා ගැනීම
    * 1866 යුද්ධයෙන් ඔස්ට්‍රියාව පරාජයට පත් වීම
    * 1871 ප්‍රංශය පරාජය කිරීමෙන් ප්‍රසියාවේ නායකත්වය යටතේ එක්සත් ජර්මනිය බිහි වීම

## ඉතාලිය එක්සත් කිරීම



## ජර්මනිය එක්සත් කිරීම



ඇගයීම - 01

**නොගැළපෙන වචනය තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

(1) 1. ජාතිකවාදය 2. කෝර්සිකාව 3. ස්පාඤ්ඤය 4. ග්‍රීසිය 5. රොඩේෂියාව ( ........... )

(2) 1. කාබොනාරී ව්‍යාපාරය 2. තරුණ ඉතාලි ව්‍යාපාරය 3. නව ගුවෙල්ප් ව්‍යාපාරය
4. දාස් කැපිටාල් ව්‍යාපාරය 5. ජාතිකවාදී ව්‍යාපාරය ( ........... )

(3) 1. ලුවී නැපෝලියන් 2. ඔටෝවෝන් ගැරිබොල්ඩි 3. ජෝසෆ් මැසිනි
4. කැමිලෝ කැවුර් 5. ගුසෙප් ගැරිබෝල්ඩි

(4) 1. ලොම්බාර්ඩි 2. ටස්කනි 3. වයිමාර් 4. පීඩ්මොන්ට් 5. නේපල්ස් ( ........... )

(5) 1. ජර්මන් සංයුක්තය 2. රයින් සංගමය 3. සොල්වරයින් සංගමය 4. ගැස්ටියන් සම්මුතිය
5. ෆිලඩෙල්පියා සම්මුතිය ( ........... )

(6) **නොගැළපෙන යුගලය තෝරන්න**

1. මැසිනි - තරුණ ඉතාලිය
2. ගැරිබෝල්ඩි - රතු කමිස හමුදාව
3. සාර්ඩිනියාව - සැවෝයි රජ පෙළපත
4. කෙරන්ස්කි - රතු කමිස හමුදාව
5. සොල්වරයින් ගිවිසුම - ආර්ථික සංගමයකි ( ........... )

(7) **පහත x තීරුව y තීරුව හා ගැළපූ විට අනුපිළිවෙළ අනුව නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා තිත් ඉර මත ලියන්න**

| x | y |
|---|---|
| (1) මෙටර්නික් | A. ලිබරල් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම |
| (2) බිස්මාක් | B. දකුණු ඉතාලි ප්‍රදේශ අත්පත් කර ගැනීම |
| (3) නව වැනි පියුස් පාප්තුමා | C. එක්සත් ඉතාලියේ රජු ලෙස ඔටුනු පැලඳීම |
| (4) ගැරිබෝල්ඩි | D. ලේ සහ යකඩ ප්‍රතිපත්තිය |
| (5) වික්ටර් ඉමානුවෙල් | E. ලිබරල් අදහස් මර්දනය කිරීම |

1. EDABC 2. ACDBE 3. DECBA 4. ADBCE 5. EABDC ( ........... )

**මාතෘකාවට අදාළ ව නොගැළපෙන කරුණ තෝරා තිත් ඉර මත එහි අංකය සඳහන් කරන්න.**

(8) ඉතාලිය එක්සත් කිරීම

1. නැපෝලියන් බොනපාට්ගේ ඉතාලි ප්‍රතිපත්තිය ඉතාලි ජාතිමාමකත්වය අවධි කිරීමට වැදගත් සාධකයක් විය.
2. ඉතාලියේ තිබූ ඔස්ට්‍රියානු ආධිපත්‍යය හා බලපෑම ඉතාලිය එක්සත් කිරීමට තිබූ ප්‍රධාන බාධකයක් විය.
3. ඉතාලිය එක්සත් කිරීමේ ප්‍රධාන නිර්මාපකයා කැවුර් ය.
4. සාර්ඩිනියා නායකත්වය යටතේ සෙල්වරීනය පිහිටුවනු ලැබී ය.
5. ඉතාලි එක්සත් බව 1870 දී සාක්ෂාත් කරගනු ලැබීය. ( ........... )

(9) ජර්මනිය එක්සත් කිරීම
1. කවුන්ට්ස් කැවූර් ප්ලොම්බියර්ස් ගිවිසුම අත්සන් කිරීම.
2. බිස්මාක්ගේ රාජ්‍යතාන්ත්‍රික උපාය මාර්ග අනුගමනය කිරීම.
3. ප්‍රසියාවේ නායකත්වයෙන් එක්සත් ජර්මනියක් බිහි කිරීම.
4. ෂෙල්විග් ඈඳා ගැනීම.
5. සෙල්වරයින් සංගමය යටතේ ආර්ථික එක්සත් භාවයක් ඇති වීම. ( .......... )

(10) ජර්මනිය එක්සත් කිරීමට පෙර
1. ජර්මනිය ප්‍රධාන ඒකක තුනකට බෙදී තිබීම.
2. රයින් සංගමය පිහිටුවීම
3. සෙල්වරයින් සංගමය යටතේ ආර්ථික එක්සත් බව ඇති වීම.
4. කාල්ස්බාඩ් ආඥාව
5. ෆ්රැන්ක්පර්ට් පාර්ලිමේන්තුව අසාර්ථක වීම. ( .......... )

**ඇගයීම - 02**
**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

1. (i) ලිබරල්වාදය හා ජාතිකවාදය පැහැදිලි කරන්න.
   (ii) යුරෝපය තුළ ලිබරල්වාදී හා ජාතිකවාදී ව්‍යාපාර වර්ධනය පැහැදිලි කරන්න

2. ''ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ දී ලිබරල්වාදී හා ජාතිකවාදී බලවේග ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක වීම දක්නට ලැබේ.'' මේ කියමන පරීක්ෂා කරන්න.

3. ''ජර්මනිය එක්සත් කළ හැක්කේ ලේ සහ යකඩ ප්‍රතිපත්තියකින් පමණක් බව බිස්මාක්ගේ විශ්වාසය විය''. ජර්මනිය එක්සත් කිරීමට බිස්මාර්ක් අනුගමනය කළ ක්‍රියාමාර්ගය මේ කියමනට කොතෙක් දුරට එකඟ වන්නේ දැයි පරීක්ෂා කරන්න.

4. පහත සඳහන් ස්ථාන යුරෝපා සිතියමක ලකුණු කරන්න.
   මිලාන්, ජිනෝවා, වෙනීසිය, බොලොඤ්ඤා, රෝමය, නේපල්ස්, ආද්‍රියාතික් මුහුද, සාර්ඩිනියා, කෝෂිකා, සිසිලිය, ටයිරේනියන් මුහුද, රයින් ගඟ, එල්බ් ගඟ, ඩැනියුබ් ගඟ, පෝ ගඟ, විස්ටුලා ගඟ, බෝල්ටික් මුහුද, බෙල්ජියම, ලක්ෂම්බර්ග්, බවේරියා, සයිලේෂියා, බර්ලින්, ඩැන්සිග්, බ්‍රැන්ඩන්බර්ග්

## 6. පළමුවෙනි ලෝක යුද්ධය

1871 දී ජර්මනිය එක්සත් වීමෙන් පසු එතෙක් යුරෝපයේ ප්‍රංශයට හිමි වී තිබූ ප්‍රධාන ස්ථානය අහිමි වී ජර්මනිය එම ස්ථානයට පත් විය. ඉන් පසු ජර්මනිය ක්‍රමයෙන් යුරෝපා ජාතීන් අතර ප්‍රමුඛස්ථානයට පත් විය. මේ කාලයේදීම ප්‍රංශය හා ජර්මනිය අතර තරගකාරීත්වයක් ඇති විය. බලවත් රටවල් සමඟ මිත්‍ර සම්බන්ධතා තර කර ගනිමින් හැකිතාක් දුරට ප්‍රංශය යුරෝපයේ හුදෙකලා කිරීමේ ප්‍රතිපත්තියක් ජර්මනිය අනුගමනය කළේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් යුරෝපය ක්‍රමයෙන් පිල් දෙකකට බෙදී ගියේ ය. එම පිල් බෙදීමට අමතර ව දශක කිහිපයක් මුළුල්ලේ යුරෝපයේ ඇති වෙමින් පැවති විවිධ හේතු සාධක මුල් කොට ගනිමින් 1914 දී පළමුවෙනි ලෝක සංග්‍රාමය ආරම්භ විය. අති විශාල මිනිස් ජීවිත සහ දේපල ප්‍රමාණයක් විනාශ කරමින් ලොව පුරා ව්‍යාප්ත වුණු මෙම බිහිසුණු යුද්ධයට බලපෑ හේතු, යුද්ධයේ ප්‍රධාන අවස්ථා සහ පළමු ලෝක යුද්ධයේ ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරමින්, යුද්ධයේ අතිබිහිසුණු බව හා සාමය රැක ගැනීමේ වැදගත්කම පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : • බලය පිළිබඳ ව ඇතිවන ගැටුම්වල විනාශකාරී බව තේරුම් ගෙන සාමය රැක ගැනීමට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 පළමුවෙනි ලෝක යුද්ධයේ විනාශකාරී බව පෙන්වා දෙයි

**කාලච්ඡේද** : **20යි.**

**ඉගෙනුම් පල** :
- ලෝක යුද්ධය සිදු වූ ආකාරය පැහැදිලි කරයි.
- ලෝක යුද්ධයේ ප්‍රතිඵල පෙන්වා දෙයි.
- ලෝක යුද්ධය හා සම්බන්ධ ස්ථාන, රටවල්, සිතියමක ලකුණු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

### 6.1 පළමුවෙනි ලෝක යුද්ධය

- 1914 - 1919 තෙක් ලෝකය පුරා පැවති යුද්ධ මාලාව පළමුවෙනි ලෝක යුද්ධය වශයෙන් හැඳින්වේ.

- **යුද්ධය ඇති වීමට බලපෑ ඓතිහාසික පසුබිම**

  - ආර්ථික , සංග්‍රාමික වශයෙන් හා නාවික බලයෙන් යුරෝපයේ අනෙක් සියලු රටවල් අබිබවා බ්‍රිතාන්‍යය ප්‍රබල ස්ථානයක සිටීම
  - මෙතෙක් යුරෝපයේ බලවතා වී සිටි බ්‍රිතාන්‍යයත් මධ්‍යම යුරෝපයේ බලවතා ලෙස නැඟී සිටිමින් සිටි ජර්මනියත් අතර පැවති මිත්‍ර සම්බන්ධතා පළුදු වෙමින් දෙරට අතර තරගකාරී තත්ත්වයක් මතු වීම(නාවික බලය සම්බන්ධ වේ)
  - යටත් විජිතකරණයේ ප්‍රධාන බලවතා වූ බ්‍රිතාන්‍යය අබිබවා එරට තරගකරුවා වූ ප්‍රංශය උතුරු, නැඟෙනහිර හා බටහිර අප්‍රිකා ප්‍රදේශවලත් අග්නිදිග ආසියාවේත් විශාල ප්‍රදේශයක තම බලය තහවුරු කර ගැනීම
  - 20 වන සියවස වන විට ජපානය උතුරු පැසිපික් කලාපයේ බලවතා ලෙස නැඟී සිටිමින් ආසියාවේ ප්‍රදේශ රාශියක තම බලය පතුරුවා ගෙන සිටිම
  - බටහිර බලවතුන් මෙන් ම ජපානය හා රුසියාව ද චීනය කෙරෙහි අවධානය යොමු කරමින් නොසිටි අතර චීනය රුසියානු ජපාන හා බටහිර ජාතීන්ගේ බලපෑම් වලට නතු වීම
  - කෘෂිකාර්මික හා කාර්මික වශයෙන් සංවර්ධනය වෙමින් අමෙරිකා එක්සත් ජනපදය බටහිර අර්ධගෝලයේ බලවතා බවට පත් වීම

- **පළමුවෙනි ලෝක යුද්ධයට බලපෑ හේතු**

**නව අධිරාජ්‍යවාදය**

- ජර්මනිය, ඉතාලිය යන රටවල් යුරෝපයේ නව බලවතුන් ලෙස නැගී සිටීම
- කාර්මීකරණය නිසා ප්‍රධාන යුරෝපා රටවල ආර්ථික වර්ධනයක් ඇති වීම
- පුළුල් වූ නිෂ්පාදන සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීම. මහා පරිමාණ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා සහ අතිරික්ත මූලධනය ආයෝජනය කිරීම සඳහා වෙළෙඳ පොළවල් ලබාගැනීම නව අධිරාජ්‍ය වාදයේ අරමුණ වීම
- ප්‍රංශය, බ්‍රිතාන්‍ය, පෘතුගාලය, ස්පාඤ්ඤය, ඕලන්දය, ඉතාලිය බෙල්ජියම, ජර්මනිය ආදී රටවල් යටත් විජිත තරගයක නිරත වීම

**අප්‍රිකාව සඳහා වූ තරගය**

- 19 වන සියවස අගභාගය වනවිට යුරෝපා ජාතීන් අප්‍රිකාව කෙරෙහි අවධානය යොමු කිරීම
- අප්‍රිකාව සතු වටිනා ඛනිජ සම්පත් සූරාකෑම යුරෝපීයයන්ගේ අරමුණ වීම
- බ්‍රිතාන්‍ය, ප්‍රංශය, ඕලන්දය, ස්පාඤ්ඤය, පෘතුගාලය, ඉතාලිය, බෙල්ජියම ආදී රටවල් අප්‍රිකාව මහාද්වීපය බෙදා ගැනීම

**බෝල්කන් ප්‍රශ්නය**

- 19 වන සියවස අවසන් වන විට තුර්කි අධිරාජ්‍යය පරිහානියට පත්වෙමින් පැවති තුර්කි අධිරාජ්‍යයේ යටත් වැසියන් වූ ක්‍රිස්තු භක්තිකයන් තුර්කි අධිරාජ්‍යයට විරුද්ධව නැගී සිටීම
- රුසියාව තුර්කි අධිරාජ්‍යය බිඳදමා එම ප්‍රදේශවල නව ආධිපත්‍යය පැතිරවීමට අපේක්ෂා කිරීම
- බ්‍රිතාන්‍යය, ප්‍රංශය වැනි යුරෝපා රටවල් ඊට විරුද්ධව තුර්කි අධිරාජ්‍යය තවදුරටත් ආරක්ෂා කොට ගැනීමට කටයුතු කිරීම
- තුර්කි අධිරාජ්‍යය සතුව පැවති බොස්නියා-හර්සිගොවීනා ප්‍රදේශ ඕස්ට්‍රියාව විසින් ඈඳ ගැනීම
- පළමුවෙනි ලෝක යුද්ධයට ආසන්නතම හේතුව බොල්කන් අර්බුදය තුළින් හටගැනීම - සරයේවෝ සිද්ධිය



ෆර්ඩිනන්ඩ් යුවළ සරයේවෝ නුවර දී ඝාතනය කිරීමට මොහොතකට පෙර

### යුරෝපය දෙපිලකට බෙදීම

- ප්‍රංශය සතු ව පැවති ස්වභාවික සම්පත් පොහොසත් ඇල්සාස්-ලොරේන් ප්‍රදේශ 1871 දී ජර්මනිය විසින් අල්ලා ගැනීම නිසා දෙරට අතර විරුද්ධත්වයක් හටගැනීම
- නව ජර්මන් අධිරාජ්‍යයේ ආරක්ෂාව සඳහා ප්‍රංශය හුදෙකලා කොට තැබීම අරමුණු කර ගෙන බිස්මාක් විසින් යුරෝපයේ මිත්‍ර සන්ධාන ක්‍රමය ආරම්භ කරනු ලැබීම
- බිස්මාක්ගෙන් පසු ජර්මන් විදේශ ප්‍රතිපත්තිය වෙනස් වී යාම
- යුරෝපයේ රටවල් එකිනෙකට විරුද්ධ බල කඳවුරු දෙකකට බෙදී යාම
- මුල දී පැවති ප්‍රංශ - එංගලන්ත මිත්‍රත්වය හා ප්‍රංශ රුසියානු මිත්‍රත්වය ජර්මනියට විරුද්ධ ව 1907 දී ඒකාබද්ධ වීම
- 1908 වන විට ජර්මනිය - ඔස්ට්‍රියාව හා ඉතාලිය සන්ධාන ගත වීම (අවසාන මොහොතේ ඉතාලිය ජර්මනියෙන් ඉවත් වී එංගලන්තය දෙසට හැරිණි.)
- බ්‍රිතාන්‍ය, ප්‍රංශය, රුසියාව, ඉතාලිය සහ අමෙරිකා එක්සත් ජනපදය 'මිත්‍ර පිල' නමින් හා ජර්මනිය, ඔස්ට්‍රියාව, හංගේරියාව, තුර්කිය හා බල්ගේරියාව 'මධ්‍යම බලවතුන්ගේ පිල' නමින් හැඳින් වීම

- **යුද්ධයේ ප්‍රධාන අවස්ථා**

- 1914 ජුනි 28 වන දින ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි ෆ්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් හා ඔහුගේ බිරිද ඉසබෙලා කුමරිය සරයේවෝ හි දී සර්බියන් ජාතිකයකු විසින් ඝාතනය කිරීම නිසා සර්බියාවට විරුද්ධ ව ඔස්ට්‍රියාව යුද්ධ ප්‍රකාශ කිරිම
- රුසියාව සර්බියාවට ආධාර දීමට ඉදිරිපත් වීම නිසා ජර්මනිය රුසියාවට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කිරීම
- එංගලන්තය, ප්‍රංශය, ඉතාලිය යනාදී රටවල් ඔස්ට්‍රියාවට එරෙහි ව පෙළ ගැසෙන්නට වූ අතර තුර්කිය, බල්ගේරියාව, හංගේරියාව ආදී රටවල් ඔස්ට්‍රියාවට පක්ෂ ව යුද්ධයට සහභාගි වීම.
- සටන් සිදු වූ පෙරමුණුඃ
  - * බටහිර පෙරමුණ
  - * නැගෙනහිර පෙරමුණ
  - * අග්නිදිග යුරෝපීය පෙරමුණ
  - * අප්‍රිකානු පෙරමුණ
  - * නාවික සටන් (මුහුදු සටන්)
  - * අමෙරිකා එක්සත් ජනපදය යුද්ධයට සහභාගි වීම



යුද්ධයේ විනාශය

- යුද්ධයේ ප්‍රතිඵල

  - විශාල වශයෙන් දේපළ හා ජීවිත විනාශ වීම
  - දූෂිත ඒකාධිපති රාජාණ්ඩු බිඳවැටීම
    උදාහරණ: ඔස්ට්‍රියානු අධිරාජ්‍යය, හංගේරියානු අධිරජ්‍යය, තුර්කි අධිරාජ්‍යය
  - අමෙරිකාව ලෝක බලවතකු ලෙස නැඟී සිටීම

**වර්සායි ගිවිසුම**

- වරදකරුවා වශයෙන් සලකා ජර්මනියට වර්සායි ගිවිසුමෙන් දැඩි දඬුවම් පැමිණවීම
- ඇල්සේස් - ලොරේන් ප්‍රදේශ සහ සාර් නිම්නය ප්‍රංශයට ද ෂෙල්ස්විග් ප්‍රදේශය ඩෙන්මාර්කයට ද පවරා දීම
- ජර්මනිය සතු සියලු ම යටත් විජිත ජයග්‍රාහී පිළට ලබාදීම
- ජර්මනියේ යුද හමුදාව සෙබළුන් ලක්ෂයකට සීමා කිරීම සහ අනිවාර්ය යුද සේවය තහනම් කිරීම
- ජර්මනියේ නාවික ශක්තිය දුර්වල කොට යුද නැව්, සබ්මැරීන් ඉදි කිරීම සපුරා තහනම් කිරීම
- ජයග්‍රාහී පිල වෙත විශාල වන්දියක් ගෙවීමට ජර්මනියට නියම කිරීම

**යුරෝපා සිතියම වෙනස් කිරීම**

- තුර්කි අධිරාජ්‍යය යටතේ පැවති රාජ්‍ය කිහිපයක් එක් කොට යුගොස්ලෝවියාව නමින් නව රාජ්‍යයක් නිර්මාණය කිරීම
- මොරේවියාව, සුඩෙන්ටන්ලන්තය ආදි රාජ්‍ය එකතුකොට චෙකොස්ලෝවැකියාව නිර්මාණය කිරීම
- පෝලන්තයට ඩැන්සිග් වරාය සහ ඒ වෙත පිවිසීම සඳහා බිම් තීරුව ලබා දී නිදහස් රාජ්‍යයක් බවට පත් කිරීම. මේ නිසා නැගෙනහිර සහ බටහිර වශයෙන් ජර්මනිය දෙකඩ වීම
- රුමේනියාව, බල්ගේරියාව, නව රාජ්‍ය ලෙස බිහි වූ අතර තුර්කිය යුරෝපයෙන් ඉවතට තල්ලු වී යාම
- ෆින්ලන්තය, ලැට්වියාව ආදි රාජ්‍යවල ස්වාධීනත්වය පිළිගැනීම
- පැරණි රාජ්‍ය නාම වෙනුවට නව නම් යෙදවීම
  උදාහරණ ඃ කොන්ස්තන්තිනෝපල් - ඉස්තාන්බුල්



- **ජාතීන්ගේ සංගමය පිහිටුවීම**

  - ලෝක සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා ජාතීන්ගේ සංගමය පිහිටුවා ගැනීම
  - පළමුවෙනි ලෝක යුද්ධයෙන් පසු අමෙරිකානු ජනාධිපති වුඩ්රෝ විල්සන්ගේ සංකල්පයක් අනුව ජාතීන්ගේ සංගමය ආරම්භ වීම

  **ආරම්භය**
  - ජාතීන් අතර ආරවුල් සාකච්ඡා මඟින් සාමකාමී ව විසඳා ගැනීම
  - කුඩා රාජ්‍යයන්හි නිදහස හා ස්වෛරීභාවය ආරක්ෂා කර දීම
  - විශ්ව සාමූහිකත්වය මඟින් ලෝක සාමය ආරක්ෂා කොට ගැනීම
  - ජාතීන් අතර අවබෝධය හා සහයෝගීතාව වර්ධනය කිරීම
  - මානව වර්ගයාගේ සාමකාමී පැවැත්ම සඳහා අවශ්‍ය වෙනත් පියවර ගැනීම

- **ජාතීන්ගේ සංගමයේ යහපත් ලක්ෂණ**

  * ජගත් සංවිධාන සංකල්පය ඇති වීම
  * ජාත්‍යන්තර සංවිධාන ගොඩනැඟීම
    උදාහරණ: අධිකරණ, සෞඛ්‍ය, කම්කරු සංවිධාන
  - ජාත්‍යන්තර ගැටුම් නිරාකරණය කිරීම
    උදාහරණ: 1921 ජර්මනිය හා නේපල්ස් අතර සයිලීෂියාව සම්බන්ධයෙන් ඇති වූ ගැටුම නිරාකරණය කිරීම
    1925 ග්‍රීසිය හා බල්ගේරියාව අතර ඇති වූ අර්බුදය
    1926 මෝඩල් තෙල්බිම සම්බන්ධයෙන් ඉරාකය හා තුර්කිය අතර ඇති වූ අර්බුදය
  - මානව අයිතීන් තහවුරු කිරීම
    උදාහරණ: සරණාගතයින් පුනරුත්ථාපනය කිරීම, වහල් වෙළෙඳාම හා මත් ද්‍රව්‍ය වෙළෙඳාම තහනම් කිරීම
    ලෙඩ රෝග මර්දනය කිරීම

- **ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට හේතු**

  - බලවත් ජාතීන් ඉවත්වීම. උදාහරණ: අමෙරිකා එක්සත් ජනපදය
  - පරාජිත ජාතීන් නොසලකා හැරීම.
    උදාහරණ: පළමුවෙනි ලෝක යුද්ධයේ වරදකරුවා වූ ජර්මනියට සහ රුසියාවට ජාතීන්ගේ සංගමයේ අසුනක් නොලැබීම
  - මහා බලවතුන් අතර එකඟතාවක් නොමැති වීම
  - සංගමය සතු ජාත්‍යන්තර යුද හමුදාවක් නොතිබීම
  - නිරායුධ ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු යැයි යෝජනා වුව ද ඒ සඳහා නිරායුධ කොමිසමක් පත් නොකිරීම
  - ලෝක සාමය පවත්වාගෙන යාමේ අරමුණ බිඳවැටීම
    උදාහරණ:
    * 1931 ජපානය මැංචූරියාව ආක්‍රමණය කිරීම
    * 1935 ඉතාලිය ඇබිසීනියාව ආක්‍රමණය කිරීම
    * 1938 දී ජර්මන් රයින්ලන්තය, චෙකොකස්ලෝවැකියාව ඇඳා ගැනීම වැනි අවස්ථාවලදී ජාතීන්ගේ සංගමය ඒවා වැළැක්වීමට අපොහොසත් වීම
    * 1933 - 1938 අතර කාලයේ ජර්මනිය, ඉතාලිය හා ජපානය ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වීම

ඇගයීම් - 01

**අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නාම පහ බැගින් දී ඇත. කවර හේතුවක් නිසා හෝ ඒවායින් එකක් නොගැළපේ. නොගැළපෙන නාමය තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න**

01.) 1. ජර්මනිය 2. ඔස්ට්‍රියාව 3. එංගලන්තය 4. තුර්කිය 5. බල්ගේරියාව (........)

02.) 1. ලොයිඩ් ජෝර්ජ් 2. වින්සන්ට් චර්චිල් 3. ඕලැන්ඩෝ 4. ක්ලෙමන්සෝ 5. වුඩ්රෝ විල්සන් (........)

03.) 1. වර්සේල්ස් 2. සෙන්ට් ජර්මේන් 3. නියුලි 4. ෂෙල්ස්විග් 5. ලොසන්තේ (........)

04.) x හා y තීරු නිවැරදි ව ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| x | | y | |
|---|---|---|---|
| 1. | යුගොස්ලෝවියාව | A | වෝර්සෝ |
| 2. | චෙකොස්ලෝවැකියාව | B | බුකාරෙස්ට් |
| 3. | පෝලන්තය | C | බෙල්ග්‍රේඩ් |
| 4. | රුමේනියාව | D | සොෆියා |
| 5. | බල්ගේරියාව | E | ප්‍රාග් |

1) BACDE 2) EDCBA 3) CEABD 4) DECAB 5) EDACB (........)

05.) ජාතීන්ගේ සංගමය සම්බන්ධයෙන් නොගැළපෙන පිළිතුර තෝරන්න.
1. පළමුවෙනි ලෝක යුද්ධයෙන් පසු සාමය ආරක්ෂා කර ගැනීම සඳහා පිහිටුවන ලදි
2. එය වුඩ්රෝ විල්සන්ගේ යෝජනාවක් මත පදනම් විය
3. ප්‍රංශය, එංගලන්තය, ඉතාලිය, රුසියාව සහ ජර්මනිය එහි ආරම්භක සාමාජිකයෝ වූහ
4. අනාගත ලෝක යුද්ධයක් වළක්වා ගැනීමට ජාතීන්ගේ සංගමය සමත් විය
5. ජාතීන්ගේ සංගමය ආරම්භ කිරීමට පුරෝගාමී වුව ද අමෙරිකාව එයට සහභාගී වූයේ නැත

(........)

ඇගයීම් - 02

**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

01. පළමුවෙනි ලෝක යුද්ධයට හේතු වූ කරුණු සාකච්ඡා කරන්න.

02. පළමුවෙනි ලෝක යුද්ධයේ ප්‍රතිඵල විස්තර කරන්න.

03. ''1919 වර්සායි ගිවිසුම පළි ගැනීමේ චේතනාව මුල් කොට ගෙන ඇති කරන ලද ප්‍රඥප්තියකි.''
i. පළමුවෙනි ලෝක යුද්ධයට බලපෑ ආසන්නතම හේතුව කුමක් ද?
ii. පළමුවෙනි ලෝක යුද්ධයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහන් කරන්න.
iii. පළමුවෙනි ලෝක යුද්ධයට බලපෑ හේතු තුනක් කෙටියෙන් විස්තර කරන්න.
iv. වර්සායි ගිවිසුමේ වගන්ති පදනම් කොට ගෙන ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

04. ජාතීන්ගේ සංගමයේ සාර්ථක - අසාර්ථක භාවය සාකච්ඡා කරන්න.

05. පළමුවෙනි ලෝක යුද්ධය හා සම්බන්ධ රටවල් සිතියමක ලකුණු කරන්න.

## 7. රුසියන් විප්ලවය

විසිවෙනි සියවසේ මුල් දශක දෙක තුළ රුසියාවේ පැවති ඒකාධිපති වැඩවසම් සාර් පාලනයට එරෙහි ව ගොවි කම්කරු හා මධ්‍යම පන්තිවල නැගී සිටීම හා අවසානයේ රුසියාව තුළ සමාජවාදී පාලන ක්‍රමයක් ඇති වීම රුසියානු විප්ලවය නමින් හැඳින්වේ. මෙම විප්ලවය මගින් රුසියාවේ දේශපාලන ආර්ථික මෙන් ම සමාජීය අංශවල සිදු වූ පුළුල් වෙනස්කම්, එම වෙනස්කම් සෙසු රටවල් කරා ව්‍යාප්ත වූ ආකාරය මෙන් ම සමාජවාදය නව බලවේගයක් වශයෙන් ක්‍රියාත්මක වූ ආකාරය පෙන්වා දීම මෙම පාඩමේ මූලික අරමුණු වේ.

**නිපුණතාව** : • නූතන ලෝකය තුළ විවිධ දේශපාලන චින්තන ප්‍රායෝගික ලෙස ක්‍රියාවට පරිවර්ථනය කළ ආකාරය පරීක්ෂා කරයි.

**නිපුණතා මට්ටම**: 7.1 රුසියානු විප්ලවය ලෝක බලවේගයක් වූ අයුරු පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 15යි.

**ඉගෙනුම් පල**:
- රුසියානු විප්ලවය විස්තර කරයි.
- විප්ලවයෙන් දිනාගත් සමාජවාදී සංකල්ප පැහැදිලි කරයි.
- සමාජවාදය ලෝක බලවේගයක් වූ ආකාරය පෙන්වා දෙයි.
- සමාජවාදය ව්‍යාප්ත වූ රටවල් සිතියමක ලකුණු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

7.1 රුසියානු විප්ලවය

- **රුසියානු විප්ලවය හඳුන්වා දීම**
  - විප්ලවය අවස්ථා තුනක දී ක්‍රියාත්මක වීම
    * 1905 විප්ලවය
    * 1917 මාර්තු විප්ලවය
    * 1917 ඔක්තෝබර් විප්ලවය

- **රුසියානු විප්ලවයට බලපෑ හේතු**
  - බටහිර යුරෝපයේ එංගලන්තය, ප්‍රංශය ආදි රටවල් හා සසඳන කල රුසියාව සැම අංශයකින් ම පසුගාමී ව පැවතීම
  - 19 වන සියවසට පා තබන විට රුසියාව තුළ වෙනස්කම් රාශියක් සිදු වීම
    මහාපීටර්ගේ හා මහා කැතරින්ගේ පාලන අවධි
  - සමාජ සංස්කෘතික විෂමතාවලින් යුක්ත විශාල රාජ්‍යයක් පාලනය කිරීම අපහසු වීම නිසා සාර් පාලකයන් ඒකාධිපතිත්වයට යොමු වීම
  - ඒකාධිපති පාලකයන්ට පක්ෂපාත ගැති නිලධාරී පිරිසගේ පරිපාලන කටයුතු අතිශයින් දූෂිත වීම
  - ප්‍රවේණි දාසයන් මෙන් ම ගොවීන් ද බරපතළ ලෙස සමාජ අසාධාරණයට ලක් වීම
  - වෙළෙඳාම හා වාණිජ කටයුතු මුල් කරගෙන නගර රාශියක් වර්ධනය වීම හා විදේශ ආයෝජන වැඩි වීම
  - රටේ ආදායමෙන් විශාල ප්‍රමාණයක් ඉහළ නිලධාරීන්ගේ ප්‍රයෝජනයට යොදා ගැනීම
  - 19 වන සියවසේ ප්‍රතිසංස්කරණ ව්‍යාපාර - ප්‍රවේණිදාස විමුක්ති පනත
  - රුසියාව තුළ සමාජ ප්‍රතිසංස්කරණ ව්‍යාපාර ක්‍රමයෙන් ශක්තිමත් වීම
  - සමාජවාදී චින්තනයේ වර්ධනය
  - සමාජවාදී පක්ෂවල වර්ධනය

**විප්ලවය ආසන්න සමයේ රුසියාවේ පැවැති දේශපාලන, ආර්ථික හා සමාජ තත්ත්වය**

- **දේශපාලන**

  - දෙවන නිකලස් සාර් රජුගේ දූෂිත රාජාණ්ඩුව
  - 1905 රුසියානු - ජපන් යුද්ධයෙන් රුසියාව පරාජය වීම
  - 1905 මහා වැඩ වර්ජනය
  - 1906 සිට පත් කළ ඩූමාව අසාර්ථක වීම



වැඩවර්ජන

- **ආර්ථික**

  - වැඩවසම් ආර්ථික ක්‍රමය දුර්වල වීම
  - ජනගහනය වැඩි වීම විරැකියාව හා දිළිඳු බව වැඩි වීම
  - විදේශ ආයෝජන මඟින් ශ්‍රමය සූරා කෑම
  - ගොවි කම්කරු මධ්‍යම පන්තිවල බහුතරය පීඩාවට පත්වීම
  - රුසියානු භාණ්ඩාගාරය පිරිහීම

- **සමාජීය**

  - ප්‍රබල මධ්‍යම පන්තියක් නොවීම
  - ආහාර අර්බුදය වර්ධනය වීම හා භාණ්ඩාගාරවල මිල ඉහළ යාම

- **විප්ලවය සිදු වූ ආකාරය**

  - 1917 මාර්තු විප්ලවය
  - කෙරෙන්සිගේ මෙන්ෂෙවික් රජය අසාර්ථක වීම
  - 1917 ඔක්තෝබර් විප්ලවය
  - බොල්ෂෙවික්වරුන් බලයට පත් වීම හා සෝවියට් සමාජවාදී ආණ්ඩුව පිහිටුවීම




වීථිවලට බැසි රුසියානුවෝ



උද්ඝෝෂණ මර්දනය කිරීම

- **විප්ලවයේ ජයග්‍රහණ හා එහි බලපෑම්**

    - ඒකාධිපති වැඩවසම් සාර් පාලනය බිඳ වැටීම
    - ලෙනින්ගේ මූලිකත්වයෙන් නව ආර්ථික ප්‍රතිපත්තියක් හඳුන්වාදීම
    - සාමාන්‍ය ජනතාවට ද පාලනයට සම්බන්ධ වීමට අවස්ථාව සැලසීම
    - ජෝසප් ස්ටාලින්ගේ පාලන අවධියේ සෝවියට් දේශය ප්‍රබලතම රටක් බවට පත් වීම
    - සමාජවාදී අදහස් හා පාලනය නැගෙනහිර යුරෝපයටත් සෙසු මහාද්වීපවලටත් පැතිරීම
        - * සමාජවාදී රටවල් - චීනය, කියුබාව, උතුරු කොරියාව, වියට්නාමය



සාර් රජ පවුළ



බලයට පත් ලෙනින්

ඇගයීම් - 01

**අංක 01 සහ 02 ප්‍රශ්නවලට එක් මාතෘකාවක් යටතේ කරුණු 05 බැගින් සපයා ඇත. එම කරුණු අතුරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

1. රුසියානු විප්ලවය ඇති වීමට හේතු
   1. සාර් පාලකයන් ඒකාධිපති පාලනයක් ගෙනයාම
   2. පරිපාලන කටයුතු කළ නිලධාරීන් අතිශයින් දූෂිත වීම
   3. වැඩවසම් සමාජ ආර්ථික වැඩපිළිවෙළ තව දුරටත් ක්‍රියාත්මක වීම
   4. කාර්මික විප්ලවයේ බලපෑම් රට පුරා ක්‍රියාත්මක වීම
   5. සමාජවාදී චින්තනයේ වර්ධනයක් දක්නට ලැබීම ( ..................)

2. රුසියාව පාලනය කළ පාලකයන් වන්නේ
   1. පළමුවෙනි ඇලෙක්සැන්ඩර් සාර්
   2. දෙවෙනි ඇලෙක්සැන්ඩර් සාර්
   3. මහ පීටර් රජු
   4. හත් වැනි හෙන්රි රජු
   5. පළමුවෙනි නිකලස් රජු

(...............)

**අංක 3 හා 4 ප්‍රශ්නවලට පද යුගල එක බැගින් දී ඇත. ඒවා අතරින් එක් යුගලයක් නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි තෝරා එහි අංකය තිත් ඉරි මත ලියන්න.**

3. 1. දෙවෙනි ඇලෙක්සැන්ඩර් සාර් - ප්‍රවේණි දාසයන් නිදහස් කිරීම
   2. දෙවෙනි නිකලස් සාර් - ජපානය සමඟ යුද්ධයෙන් පරාජය වීම
   3. කෙරෙන්ස්කි - මෙන්ෂෙවික් පක්ෂය
   4. වී.අයි. ලෙනින් - බොල්ෂෙවික් පක්ෂය
   5. ජෝසප් ස්ටාලින් - ට්‍රොට්ස්කි සමඟ ගැටුමෙන් පරාජයට පත් විය (...............)

4. 1. රුසියානු යුද්ධය - 1905
   2. බෝල්ෂෙවික් විප්ලවය - 1917 ඔක්තෝබර්
   3. නිදහස සමානාත්මතාව හා සහෝදරත්වය - රුසියානු විප්ලවය
   4. වී. අයි. ලෙනින් මියයාම - 1924
   5. ජෝසප් ස්ටාලින් - පස් අවුරුදු සැලසුම්

(...............)

ඇගයීම් - 02

**පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

(1) ''බෝල්ෂෙවික් විප්ලවය සමාජවාදී චින්තනයේ සුවිශේෂී ජයග්‍රහණයකි''

i. බෝල්ෂෙවික් විප්ලවය ඇති වූ වර්ෂය සඳහන් කරන්න (ලකුණු 01)
ii. මෙම විප්ලවයට නායකත්වය දුන් දෙදෙනෙකුගේ නම් ලියන්න (ලකුණු 02)
iii. විප්ලව අවධියේ ජනතාවගේ ඉල්ලීම් වූයේ මොනවා ද ? (ලකුණු 03)
iv. ඉහත සඳහන් ප්‍රකාශය බොල්ෂෙවික් විප්ලවයේ ප්‍රතිඵල ඇසුරින් සාකච්ඡා කරන්න (ලකුණු 08)

(2) i. 1917 බෝල්ෂේක් විප්ලවය ඇති වීමට තුඩු දුන් සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 06)
ii. එම විප්ලවයෙන් උද්ගත වූ ප්‍රතිඵල විග්‍රහ කරන්න. (ලකුණු 08)

(3) ආදර්ශ ලෝක සිතියමක පහත සඳහන් සමාජවාදී රාජ්‍යයන් ලකුණු කර නම් කොට ඒවායින් කැමති රටවල් දෙකක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

| | |
|---|---|
| 1. රුසියාව | 5. කියුබාව |
| 2. පෝලන්තය | 6. චීනය |
| 3. හංගේරියාව | 7. වියට්නාමය |
| 4. බල්ගේරියාව | 8. උතුරු කොරියාව |

(නිවැරදි ව ලකුණු කිරීමට ලකුණු 01 බැගින් හා කෙටි ඓතිහාසික සටහන්වලට ලකුණු 05 බැගින්)

## ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය

### ශ්‍රී ලංකාව


1. මහාවංසය - හික්කඩුවේ සුමංගල හිමි
2. ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය I කාණ්ඩය, පළමුවන වෙළුම, හේම් චන්ද්‍ර රාය
3. ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය I කාණ්ඩය, දෙවන වෙළුම
4. අනුරාධපුර යුගය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
5. ශ්‍රී ලංකාවේ ඉතිහාසය - දෙවන කොටස, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
6. ශ්‍රී ලංකාවේ ඉතිහාසය - තෙවන කොටස, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
7. ශ්‍රී ලංකාවේ ඉතිහාසය - සිව්වන කොටස, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
8. පුලතිසි වංශය - සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය
9. ඉතිහාසය අත්පොත - මහාචාර්ය මංගල ඉලංගසිංහ
10. ඉතිහාසය යනු කුමක්ද - ඊ.එච්. කාර්, පරිවර්තනය - චරිතා විජේරත්න
11. ඉතිහාසය ඉගැන්වීම - විමලා රත්නායක
12. බ්‍රෝහියර් දුටු ශ්‍රී ලංකාව
13. දීප වංසය - කිරිඇල්ලේ ඥාණවිමල හිමි
14. මහාවංස ටීකාව - අකුරැටියේ අමරවංස හිමි
15. සංශිප්ත ලංකා ඉතිහාසය - ඇස්.බී. හෙට්ටිආරච්චි
16. ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය - ඇස්.බී. හෙට්ටිආරච්චි
17. පුරාතන ශ්‍රී ලංකාවේ සමාජ ඉතිහාසය - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
18. රාජ්‍යත්වය, රාජ්‍ය සහ ආගම - හඟුරන්කෙත ධීරානන්ද හිමි
19. රජරට ශිෂ්ටාචාරය හා නිරිත දිග රාජධානි - ඉන්ද්‍ර කීර්ති සිරිවීර
20. ශ්‍රී ලංකාවේ කෘෂි ඉතිහාසය - ඉන්ද්‍ර කීර්ති සිරිවීර
21. ලක්දිව සෙල්ලිපි - කොත්මලේ අමරවංශ
22. පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තර ය ( සිංහල පරිවර්තනය)
23. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශනය හා ජාතික ව්‍යාපාරය - එම්.යූ. ද සිල්වා
24. සිංහල සමාජ සංවිධානය, රැල්ෆ් පීරිස්
25. ලංකාව පෘතුගීසි යුගය කාණ්ඩ 1, පොල් ඊ පීරිස්, අභය හේවාවසම් (පරිවර්තනය)
26. යාපනයේ ඓතිහාසික අරුමය, අයි.ඩී.එම් විජේබණ්ඩාර
27. ඩොයිලිගේ දිනපොත, අනුවාදනය ධර්ම ශ්‍රී ගුණපාල
28. එදා හෙළදිව, ඩේවිඩ් කරුණාරත්න
29. Continuities and transformatrons - Senaka Bandaranayaka
30. Pre Historic Sri Lanka - Prof'. Shiran Daraniyagala
31. Daraniyagala Filicitaion Volume - I
32. University of Ceylon History of Ceylon Vol. II
33. University of Ceylon History of Ceylon Vol. III, K.M. De Silva
34. Ceylon Under the British Rule, L.A. Mills
35. Jaffna kingdom, Prof. S.Pathmanadan
36. Kandian Kingdom, Prof. Lona devaraja

**ඉන්දියාව**

1. ඉන්දියාවේ ඉතිහාසය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
2. ඉතිහාස ධාරා - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
3. අසිරිමත් ඉන්දියාව - බෂාම්
4. ඉන්දියාවේ ඉතිහාසය - රෙමිලා තාපර්
5. ආන්ධ්‍ර සාතවාහන අධිරාජ්‍යයේ ඉතිහාසය - හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, ගොඩගේ 2015
6. ඉන්දියාවේ බෞද්ධ කලාශිල්ප - ඊ. බස්නායක, ගොඩගේ, 2014
7. ඉන්දු නිම්න අධිරාජ්‍යය - මංගල ඉලංගසිංහ, ගොඩගේ 2003
8. දකුණු ඉන්දියා ඉතිහාසය - නීලකණ්ඨ ශාස්ත්‍රී
9. දකුණු ඉන්දීයාවේ ඉතිහාසය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
10. India's Ancient Past - R.S.Sharma, Oxferd - New Delli, 2005
11. Early India - A Consists History - D.N Jha, Manohar, New Delli, 2005

**යුරෝපය හා නූතන ලෝකය**

1. ලෝක ඉතිහාසය - බී.වී. රාවෝ, පරිවර්තනය මාලනී ඇඳගම, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
2. යුරෝපයේ ඉතිහාසය (ක්‍රි.ව. 1500 -1950 දක්වා) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
3. පැරණි ලෝක ශිෂ්ටාචාර -අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2016
4. ආසියාව හා බටහිර ආධිපත්‍ය, පනික්කාර්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 2005
5. අග්නිදිග ආසියාව
6. 19 වන සහ 20 වන ශතවර්ශවල යුරෝපය - ඊ. ලිප්සන්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
7. www history.com.uk
8. www history.com/news/history
9. http llen.wikipedia.org
10. http llen.wikipedia.org/wiki/Ancient Greek religion
11. www.religionfacts.com/Greek religion
12. www.history.co.uk/shows/ancient../5 thiná - the romans gave us
13. http: llen.wikipedia.org/wiki/Legacy - of - the Roman Empire